# පෙම්වන්තියේ 2

සොයන ඔබයි මා සදා සෙවූ......

kathapothak.blogspot.com



සුරංගි
අතුකෝරල

kathapothak.blogspot.com

kathapothak.blogspot.com

# 18

දරුවා ඉපදී දින දෙකකින් රිද්මිවද නිවසට කැඳවා ආ බැවින් නිවසේ කටයුතු තවත් කාර්ය බහුල විය. රිද්මිගේ නිවසේ සිටින ගෘහ සේවිකාවක් පැමිණ තිබුණද සියලුම කටයුතු බලා සොයමින් කරන්නට වූයේ මවට හා සඳරුවටය. නිවසේ අයට කාර්යාලයට ගෙන යාමට ආහාර සැකසීම, පියාගේ ව්‍යාපාර කටයුතු වලට හවුල් වීම, දේශන......... නෙත්න බලා ගැනීම......... රිද්මි හා දරුවා බලාගැනීම ආදී දහසකුත් ප්‍රශ්න ඇය හමුවේ විය. එහෙත් ඇය ඒ සියල්ල තම වගකීම් යුතුකම් ලෙස ගෙන ඉටු කලාය. සියල්ල නිමාකොට නෙත්තන ළඟ එක මොහොතක් ගත කරන්නටද ඇය කාලය සොයා ගත්තාය. දවසේම වැඩ කිරීමේ මහන්සිය නිවී ගියේ ඔහු දකින මොහොතේය. මේ සෙනෙහසට දීමට නමක් නැති වුවද තම සිත ඔහු දකිද්දී නිවී සැනසෙන වග නම් තමා ඉත්තෙරුවෙන්ම දන්නා දෙයකි. තම හදවත තුළ සඟවාගෙන මේ රහස සුරැකෙන්නට ඇය හදවතට ප්‍රතිඥා දී ඇත්තේ තමා ඒ තරමට ඔහු කෙරෙහි බැඳී ඇති බව දැනගැනීම ඔහුට වත් අන් කවරෙකුටවත් ඵලක් නැති බැවිනි. විවාහය නම් රැහැණෙන් බැඳී මේ නිවසට ආවද විවාහය යනු කුමක්ද යන්න පවා තවම තමා දන්නේ නැත. ආදරය ප්‍රේමය තමා ඊට පෙරද අත්දැක නොතිබුණේය. මේ නිවසට ආවාට පසු කොහේදෝ සිට තම ලෝකයට ආ ඒ නාඳුනන මායාකාරයා තම සිතද සිතුවිලි රාජධානියද අනෙක් පස පෙරළා ඇත. ශාන්තව නිහඬව භාරගත් උරුමයට දෛවයට වඩා යමක් මේ ජීවිතය තුළ ඇතැයි සිතන්නට මේ පෙරළිකාරයා අත්තටු නම් දුන්නේමය. ඒත් ඒ සිහිනය වෙත පියාඹන්නට තමාට නොහැක. අවකාශය තුළ හඳුනාගත් ලෝකයේ තමාට තනිව හෝ පියාඹා යන්නට හැක........ මන්ද කූඩුව විවරව ඇති හෙයිනි. ඒනිසාම හිතන්නට, ආදරය යැයි දෙයක් ලොව ඇති බව වටහාගන්නට අකුරු කියාදුන් ඔහු ගැන අදටද හෙටටද මතුවටද ඇත්තේ සෙනෙහස බව ඔහු නමින් උපන්

දයාබර මුදු හැඟීම බව දැන් ඉතිං තමාටද නොපිළිගෙන නොහැකි විය.

රිද්මි නිවසට ආපසු ඥාතීන් නිවසට එන්නට ගත්තේ අක්කාත් මල්ලීත් දෙදෙනාම දැක බලා යන අටියෙනි. මෙසේ එක් දිනක් රිද්මි නිවසට ආ පවුලේ කිසිවෙකු රිද්මි හා කථා බහ කොට මව හා රිද්මි සමග නෙත්නගේ කාමරයට ආවාය. ඒ මොහොතේ සඳරු මිදුලෙන් කඩා ගත් මල් පොකුරක් ද රැගෙන එහි ආවාය.

“ශ්‍රියන්තගේ දෙවෙනි ලේලි හරි ලස්සනයි නේ......... දැන් මෙයාත් බැඳලා අවුරුද්දකට වැඩි නේද......... මොකද තාම ළමයි නැත්තේ......... ලස්සන නැතිවෙනවා බයටද......... එහෙම නැතිනම්.........” ආගන්තුක කාන්තාව එක් වරම කියද්දී සඳරු අතින් මල් බඳුන බිම වැටුණේ නොදැනිමය. මන්ද ඒතරම්ම තිගැස්මක් කම්පනයක් ඒ වදන් පෙළ ඇය හදේ ඇති කළේය. මෙතෙක් කිසි දිනක තමාට සිහිපත්ව නොතිබූ දෙයක් එක්වරම සිහියට නැගුවා වැනි විය.

ඥාතියාගේ කථාවෙන් සඳරු පත් තත්ත්වය අන් තිදෙනාටම ඉතාමත් හොඳින් වැටහිණ. එයින් වඩාත් වැඩි අපහසුවක් දැනුණේ නෙත්නටය. ඥාතියා සමග ඔහුට ඇති වූයේ ඇඩි කෝපයකි......... මඩියොක්කා ගලවන්න ඇවිත් මායිම හොයනවා......... ඔහු මව දෙස රවා බැලීය. මව එක් වරම සඳරු දෙස බලා සිනාසී.

“ආ.........පෝ.........එයා තව කොහෙ ළමයි හදන්නද. ඩිග්‍රි එක ඉවර වෙන්නත් තව අවුරුදු දෙකක් තියනවා. තාම ඉතිං ඔය ඉගෙනගන්නවනෙ. අවුරුදු විසිතුන ඒ හැටි වයසක් නෑ.........”

“අපේ සඳී දැන්ම ළමයි හදලා කොහෙද......... මගෙ ළමයි බලන්න තියනවා......... තවම මෙයා තියා මනුම්වත් ළමයි හදන්න හිතුවෙ නැති කොට”

“මනුම්ට නම් ළමයි ඕන නැද්ද මොකක්ද කියනවානෙ”

“අද කාලෙ ගෑනු, ළමයි හදන්න හරි බයයි නේ රූපෙ නැතිවෙනවට. ඒත් ඉතිං ළමයි හැදුවත් නැහැදුවත් ළමයි නැති උණාම රටේ ලෝකෙ අය කියන්නේ වඳ ගෑනු කියලනේ.........” ඇය තව දුරටත් කියද්දී සඳරුගේ දෙකොපුල් රතු වී ගියේ අන් අය බලා ඉද්දීමය. ඇයට මේ කථා බහ තවත් ඉවසනු නොහැකි බව දැනුණ නෙත්න අක්කාට ඉඟි කළේය.

“සරලා පුංචි......... අපි යමු පහළට......... බබා අඩනවද දන්නෑ......... අම්මි ඔයා එනවද.........?”





“හා යමු......... සඳී......... අනේ දූව ඔයා දැන් කාමරේට ආපු එකේ නෙත්නගේ බෙහෙත් ටිකත් දෙන්න......... අනෙක් එක ඇඳේ සීට මාරු කරලා දාන්න.........”

පිටුපස හරවා හුන් සඳී හිස වැනුවා පමනය. ඇයගේ දෙනෙතේ කඳුළු එනු දුටු මව හා සොයුරිය ඉක්මනින්ම කාන්තාව හා පිටව ගියෝය. ඔවුන් ගිය විගසම එතැන දණගසා හිඳගත් ඇය මුව තදකොට ගෙන හඬන්නට වූවාය. ඇඳේ ඇලවී හුන් නෙත්න සඳරුගේ සද්දයක් නැති බව ඇනි කෙළින් වී බලද්දී ඇය හඬනු දුටුවේය. ඔහුට ඇති වූයේ හද පැලී යන දුකකි. මේ අහිංසක, යුවතිය තාමත් නොපිඳුල් මලක් මෙනි. එවන් වූ ඇය වඳ එකියක සේ සලකාගෙන ඒ කාන්තාව කී වදන් නෙත්නගේ හදවත ගැඹුරට පැරුවේය. ඔහු හෙමිහිට නැගිට ඇය වෙත ඇවිද ආවේය. ඔහු එනු දුටු සඳරු ඉක්මනින් නැගිට ඔහුව වත්තන් කොට ගත්තීය.

“ඇයි ආවේ......... තුවාලෙ පැරෙනවා දන්නැද්ද?”

“ඊට වැඩිය හිත පැරෙනවා මෙහෙම අඬන කොට”

“මම ඇඬුවෙ නෑ.........”

“මේ වතුරද.........” ඔහු කඳුළක් ඇඟිල්ලට ගෙන ඇසීය.

“මූණ හොදන්න ඕන......... ඇඳට යන්න මම වතුර ගේන්නම්.........”

“නැහැ බාත්රූම් එකට යමු.........” ඔහු කීවේ ඇය දෙස බලමිනි.

“ඒ මොකද?”

“මෙහෙම අල්ලගෙන ඉන්න කොට ටවුන් එකට හරි යන්න හිතෙනවනේ.........” ඔහු කියද්දී සඳරු දිගු සුසුමක් හෙළුවාය.

“මා ගාව ඉද්දි හූල්ලන්න බෑ.........”

“එහෙම නම් ඉතිං පැය විසි තුන හමාරක් විතර මට නිදහස තියනවා”

“මොනවටද?”

“හූල්ලන්න.........” සඳරු තුවාය තෙමා ඔහුගේ මුහුණ, ගෙල, අත් ආදිය පිස දැමුවාය. නෙත්න ඇය දෙස බලා උන්නේ ඇයට උවමනා දෙයක් කරන්නට ඉඩ හරිමිනි.

“මගේ ළඟ ආඩිය ගඳ ඇති”

“ඇයි කුඹුරු කෙටුවද.........”

“නෑ මෝඩියේ......... නෑවේ නැති නිසා.........”

“ඉතිං ඔහොමම ඔළුව අල්ලන්න සින්ක් එකට මම හෝදන්නම්.........” සඳරු කියද්දී නෙත්න හිස සින්ක් එක දෙසට

නැමීය. සඳරූ පෑම්පු අා ඔළුව යළි සෝදා තුවායෙන් හෙමිහිට පිස දැමූවාය. නෙත්න මේ සියල්ල බලා සිටියේ ද දරා සිටියේ ද සංවේගයෙනි. නෙත්නගේ ඇප උපස්ථාන නිමා කොට පහළට ගිය සඳරූ රිද්මී නාන කාමරයට කැඳවා ගොස් ඇයටද නාගන්නට සැලැස්වූවාය.

"අක්කි මේ කොළ තම්බපු වතුර එක තාම ටිකක් රස්නෙයි. ඒක අන්තිමට නාන්න........" සඳරූ කියද්දී රිද්මී ඇය දෙස බලා සිටියේ කරුණාවෙන් බර වූ හදවතිනි.

"ඇයි අක්කි?"

"මට හරි දුකයි සඳී......... ඔයා හරියට දුක් විඳිනවා අපි නිසා. එහෙත් තමන්ගේ වයිෆ් වගේ සුදු මල්ලිගෙ වැඩ කරනවා. මෙහෙත් ඔයා මට මගෙ අම්මි වගේ......... නංගි කෙනෙක් නැති අඩුව මේ වතාවේ නම් මට තේරුණේ නෑ සඳී ඔයා නිසා. ඇත්තටම ඔයා විතරක් නෙවි මේ වැඩ කරන්න ඕන. නියති දැන් මේ පවුලට එන්න ඉන්න කෙනා......... එයා එපැයි හොයලා බලලා මල්ලිගෙ වැඩ කරන්න. අම්මිත් ඔහේ පොඩි එකාගෙන් කියලා බලා ඉන්නවා......... මේක හරියන්නෙ නම් නෑ......... අම්ම එක්ක මේ ගැන කථා කරනවා මිස. ඔයාම නැහෙනවා මිස එයා මොනාද කරන්නේ........ මැරි කරපු දවසක නෙත්නට ඔහොම දෙයක් උණොත් සර්වන්ට්ලාගෙ පිහිට තමයි........."

"නියතිට තාම ඕවා තේරෙන්නෙ නෑ අක්කි. එයාලා හැදුන පරිසරයේ ඒවා තිබුණෙ නෑ. ලෙඩෙකුට බැරි කෙනෙකුට සලකන්න දෙමව්පියන්ට සලකන්න......... ඒ විදිය දෙයක් බටහිර සමාජෙ නෑ. ලෙඩ උණාම හොස්පිට්ල් දැම්මා. සල්ලි ගෙව්වම ඒ සෙරම හරියට කෙරෙනවා. ඉතිං ඒ වගේ වටපිටාවක හැදිච්ච ළමයෙක්ගෙන් ඒවාගේ දේවල් බලාපොරොත්තු වෙන්න හොඳ නෑ. මොකද ඒක නියතිගෙ වරදක් නොවෙන නිසා......... ඒක එයා හැදිච්ච පසුබිම. අනෙක් දැනට ප්‍රශ්නයක් නැනේ. මට පුළුවන් මේ වැඩ කරන අතරේ ඔයාලා දෙන්නව බලාගන්න.........ඒ නිසා නියතිගෙ හිත රිදවන්න එපා......... ආ රිද්මී අක්කි නෙත්න කීවා බබාව ගෙනත් එයාගෙ ඇඳෙන් තියන්න කියලා. අරන් යන්නද?" සඳරූ අසද්දී නැඟී ආ නොරිස්සුම සඳරූගේ වදන් වලින් පහව ගොස් සිටි රිද්මී සිනාසුණාය.





"දැන් ඔය හරි පිස්සුවෙ ඉන්නෙ පහලට එන්න බැරුව බබා වඩන්න......... මේ සැරේ සුදු මල්ලිට හරි සතුටුයි මට දුවෙක් හම්බ උණාට. ගිය සැරෙත් දුකෙන් හිටියෙ පුතෙක් හම්බ උණා කියලා"

"හ්ම්......... නෙත්න දුවලට කැමතියි වගේ තමයි........" එසේ කියා කාමරයට ආ සඳරූ බබා රැගෙන යළි උඩුමහලට ගියාය.

"ඔන්න මාමි දූ පැටියා ගෙනාවා........"

"බලන්න මට බබාව වඩා ගන්න බෑනේ........"

"ඉතිං ප්ලාස්ටර් එක ගැලෙව්වාම බැරියැ......... ඔහ තරම් තලවන්න" සඳරූ කීවේ දියණියගේ නළලත සිපගන්නා නෙත්න දෙස බලමිනි. නෙත්නටද ඒ මොහොතේ බැලුණේ සඳරූ දෙසය.

"ඇ.........යි........." ඇය හෙමිහිට ඇසුවාය.

"මොකුත් නෑ......... නිකං........."

"බබාව ඉඹින ගමන් ඇයි මා දිහා බැලුවේ"

"පොඩි දෙයක් හිතුණා......... පස්සෙ කියන්නම්........" නෙත්න පවසද්දී සඳරූ දෙනෙත් කුඩා කොට මොහොතක් ඔහු දෙස බලා හිඳ යන්නට හැරුණාය.

"ඇයි හදිසි?"

"හවස ලෙක්චර්ස්......... මම යන්නැද්ද?"

"දෙකටනේ......... තව කොච්චර වෙලා තියනවද?"

"ඒ උණාට ගෙයි වැඩ තියනවා......... බබා එක්ක ඉන්න. මම යන්නම්"

"තව ටික දවසක් ඉවසගෙන ඉන්න......... යන දිහාවල මට එක්ක යන්න පුළුවන් නේ එනකොට"

"ආ......... තව ලෙඩ හොඳ වෙලත් නෑ......... ආයෙම ඩ්‍රයිව් කරන්න කථාව"

"මට දැන් ගෙයි ඉඳලා ඇති වෙලා......... එහෙන් බිස්නස් වලට මොනා උණාද දන්නෑ"

"බයවෙන්න එපා......... ඒවා මමයි තාත්තයි ගානට හැන්ඩ්ල් කරනවා"

"එක අතකට ඔච්චර හොඳ බිස්නස් මොළයක් තමයි සැගෙන කාලයක් නිරපරාදෙ නිකම් තිබුණෙ ප්‍රයෝජනයක් නැතිව"

"කොහොම හරි මේ කරන දේවල් හරියට මට නිකම් වල [illegible]කල් හම්බ වෙනවා වගේ. ඒකයි ආසාවෙන් කරන්නේ. ඕ...... ප්‍රැක්[illegible] දවල් වෙලා......... මම යනවා........" එසේ කියමින් සඳරූ මහාද[illegible]ද්දී නෙත්න කුඩා දියණිය අසල ඇලවුණේය. ඇය පෙතින් යන්නට [illegible]

ඵන කිරි සුවඳ දිගේ ඔහු බොහෝ දුර ඈත් ගියේය. ගැබ්බර වූ සඳරු......... එය ජීවිතයේ එකම සිහිනය සේ ඔහු මුවග ආදරණීය සිනාවක් කැඳවීය.

එදින සතියේ අවසන් දිනය වූයෙන් සඳරු අවදි වූයේ මදක් පමා විය. රොෂාන් ද මේ දිනවල නිවසේ සිටින බැවින් ඔහු වෙනුවෙන් කිරි සාදා රැගෙන ආ යුතු බැවින් ඇය කුස්සියට යන්නට සූදානම් වී රොෂාන් කොහිදැයි බැලුවේ උදයේම ඔහු ගියාවත් ඇයි සිතමිනි ......... නැත වාහනයේ යතුර හා ලයිටරය තාමත් ටීපෝව මත තිබේ......... බාත්රූම් එකේ වෙන්නැති......... එසේ සිතූ ඇය කොණ්ඩය ගැට ගසමින් නැගී සිට සෙරෙප්පු පය ලා ගනිත්ම නාන කාමරය දෙසින් ඇසුණු හඬින් හැරී බැලුවාය......... රොෂාන්......... වමනේ දානවද......... එකවරම සිතට ඇනුණු බිය හේතුවෙන් ඇය නාන කාමරයට දිව ගියාය.

"රොෂාන්......... රොෂාන්........." ඇය දොරට ගැසුවද වමනෙ කරන හඬ මිස ඔහු දොර හරින පාටක් නොවීය.

"අනේ රොෂාන්......... ප්ලීස් දොර අරින්න......... මාව බය නොකර........." සඳරු හයියෙන් දොරට ගසද්දී එක්වරම දොර හැරී ගියේය. එහෙත් රොෂාන් වමනය දමමින් සින්ක් එක මත හිස ගසාගෙන සිටිනු දුටු සඳරු එක් වරම පැන රොෂාන් අල්ලා ගත්තාය.

"රොෂාන්......... ඇයි මේ......... අනේ කථා කරන්න" සඳරු කියද්දී ඔහු ඇයට අතින් යන්නට යයි කිවද එය ප්‍රතික්ෂේප කළ සඳරු,

"ඔයාට පිස්සුද රොෂාන්......... ඇයි මාව යවන්නේ......... ඇයි මට කියන්න බැරි......... කියන්න......... ඔහොම ඉන්න මූණ හෝදන කල්........." එසේ කී ඇය ඔහුව අසීරුවෙන් වත්තන් කොට ගෙන මුහුණත් කටත් වතුර ගා සෝදා ඔහුව කාමරයට රැගෙන එන්නට සූදානම් විය.

"බෑ......... සඳරු.........මට යන්න බෑ......... මට අමාරුයි" ඔහු කිවේ එක් අතකින් සින්ක් එක ද, අනික් අතින් යටිබඩද අල්ලාගෙන නැමෙමිනි. ඔහුගේ විලාසය දුටු සඳරුට හැඬුම් ආවාය.

"අනේ රොෂාන් ප්ලීස් මට කියන්න දෙයියනේ......... මොකද වෙන්නෙ ඔයාට"

"මට යූරින් පාස් වෙන්නෙ නෑ සඳරු......... ඊ ඉදලම ටික දීදී තිබුණා. දැන් හොඳට වැඩී" ඔහු කීවේ යළිත් සින්ක් එක ම ගි ...ක ...න හිස තබමිනි.





"දෙයියනේ......... මම මැරිලද රොෂාන්......... ඇයි ඔයාට මට කියන්න බැරි. ඒ තරම් වත් දෙයක් ඇහගන්න තරමට මම ඔයාගෙ නෙවිද?" සඳරු හඬමින් අසද්දී කෑලි කැඩී ගියේ රොෂාන්ගේ හදවතය. ඇය වෙනුවෙන් උපන් කඳුළද තම අමාරුවේ ම කඳුළ යයි ඇයට සිතන්නට ඉඩ දෙමින් රොෂාන් ගේ දෙනෙතින් කඳුළ ගලා යන්නට විය.

"එන්න හොඳ ළමයා වගේ මම කියන දේ අහන්න......... තව වුට්ටක් දරාගෙන ඉන්න" එසේ කියමින් ඇය ඉතාම අසීරුවෙන් රොෂාන් කැඳවාගෙන විත් ඇඳට දමා කාමරයෙන් එළියට දිව විත් පියුමිට කෑ ගැසුවාය.

"පියුමි......... පියුමි........." වැඩට යාමට සූදානම් වෙමින් සිටි ඇය දිව ආවේ බියපත්වය.

"මොකද......... සඳී.........ඇයි........."

"අනේ බලපං.........රොෂාන්ට යූරින් පාස් වෙන්නෙ නැතුව......... එයාට හරි අමාරුයි. වමනෙත් කරා හරියට. බලපං......... ඊ ඉඳලා තිබිලා......... මට කියලා නැනේ"

"දෙයියනේ......... කෝ......... ඇං"

"කාමරේ......... උඹ මේ හරියෙ ඉඳපං......... කාමරේට යන්න එපා......... මට කිවේ නැති මිනිහා උඹ ගියොත් ලැජ්ජා හිතෙයි......... මම පහලට දුවලා එන්නම්........." එසේ කියා සඳරු පහලට දිව යද්දී පියුමි සඳරුගේ කාමරය දෙසට ගොස් දොරකඩ සිටියාය. විනාඩි කිපයකින් සඳරු යළි උඩට දිව ආවා. යළිත් රොෂාන් වෙත් ගොස් ඔහුගේ හිස පිරිමදින්නට වූවාය. සම්පූර්ණයෙන්ම දහඩියෙන් තෙමී ගිය රොෂාන්ගේ සිරුර දුටු සඳරුගේ ශරීරය පණ නැති වූවා බඳු විය.

.........දෙයියනේ.........එයාට අමාරුවක් වෙන්න එපා......... ඇය දෙවියන්ට කෙඳිරුවාය.

"අයියෝ මේ ප්‍රේමක්කා තාම නෑ........." එසේ කියමින් ඇය යළිත් එළියට දුවනු රොෂාන් දුටුවේ සිහිනයෙන් මෙනි.........

ඒහාම යළිත් ප්‍රේමා හා පියුමි සමග ලඟි ලඟියේ ගෙට දිව ආ සඳරු.........

"පියුමි.........කෝ ඕක ආපං මේ මගේ එකට" යයි කියා යමක් වත් කොට ගෙන තම ළයට රොෂාන්ගේ හිස හේත්තු කොට ගෙන,

“රොෂාන්........ මේක බොන්න........ තිත්ත උණත්........ පැණිරහ උණත් ඉක්මනට බොන්න........” රොෂාන් ටිකක් බී හිස හරවන විට බලෙන්ම මෙන් ඔහුගේ හිස තද කොට ගත් ඇය,

“පියුමි සේරම එක් කරන්න මග් එකට” යයි කියා තවත් ලොකු ජෝගුවක් යම් යූෂ පානයක් ඔහුට පෙව්වේය.

“පියුමි උඹ දුවලා බලපං ජෙලි ටික ඇසිලින් නැන්දා ප්‍රිසරේට ඇම්මද කියලා........ ආ........ එන ගමන් දුම් කබල අරන් වරෙන්........” එසේ කියා කාමරයේ ගසා තිබූ විදුලි කේතලය විසන්ධි වූවා දැක,

“ප්‍රේමක්කා අන්න වතුර නැටුවා මට බාත්රූම් එකේ පොඩි බේසමයි ටවල් කෑල්ලයි දෙන්න........” ප්‍රේමා ඒවා ගන්නට යද්දී බලෙන් බලෙන්ම රොෂාන්ට බීම ජෝගුවක් පොවා තිම කළ සඳරු,

“ප්‍රේමක්කා ඔයා යන්න දොර වහගෙන” යයි කීවාය. ප්‍රේමා ගිය පසු නටන වතුරෙන් තුවාය පොගවා ගත් සඳරු.

“රොෂාන්........ මා ගැන මොකුත් හිතන්න එපා........ මම ඔයාගේ වයිෆ් නෙමෙ නම් යාළුවෙක් හරි........ අම්මා හරි හිතන්න. මට ඔයාගෙ බඩ තවන්න දෙන්න” යි කියද්දී රොෂාන් එපා යයි හිස වැනුවේය.

“රොෂාන් අපි දෙන්නා මේ කාමරේ දැන් කාලයක් ඉන්නවා........ අඩුගානෙ අපි දෙන්නා අපි දෙන්නව දන්නවනේ. ප්ලීස් මේ වෙලාවෙ මම නිකම් නර්ස් කෙනෙක් කියලා හිතන්න........ මට දෙන්න තවන්න මේකෙ රස්නෙ යන්න කලින්........ ප්ලීස්” ඇය හඬමින් කියද්දී ඇය දෙස අසීරුවෙන් දෙනෙත් හැර බැලූ ඔහු අත ඉවතට ගත්තේය.

රොෂාන් හැඳ සිටි කලිසම යටි බඩ ප්‍රදේශය දක්වාම පහත්කළ සඳරු ඉතා මෘදු ලෙස ඔහුගේ යටි බඩ උණු වතුරෙන් තවන්නට වූවාය. වතුර නිවෙන තරම් ඇය එසේ කරද්දී රොෂාන් යළිත් වමනය කරන්නට විය. වහාම පැන දිය සහිත බඳුන එතැනට තැබූ ඇය ඔහුට පහසු වනසේ ඔහුගේ ලය අතගාන්නට විය. රොෂාන් යළිත් ඇඳට ඇල උණේය.

ඒ අතරේ කිසිවෙකු දොරට තට්ටු කලෙන් එහි දිව ගිය සඳරු දොර හැරියාය.

“පුංචි නෝනා........ මෙන්න දුම් කබලයි, පොල්ලෙලියි. ආ මෙන්න ආඩතෝඩා කොළ” ඇසිලින් ගෙනැවිත් දුන් දුම් කබල හා කොළ මිටිය ගත් සඳරු යළිත් දොර වසන්නට සූදානම් වෙද්දී පියුමි සිටිනු දැක,





“පියුමි........ උඹ ගිහින් ලෑස්ති වෙයන්........ ඕන උණොත් මම කථා කරන්නම්” යයි කියා යළිත් දොර වැසුවාය. වහාම යළිත් රොෂාන් වෙත ආ සඳරු ගිනි අඟුරු කබල උඩට කොළ පැහැති අමු පොල් ලෙල්ල තැම්බෙන්නට දැම්මාය. එය මදක් මැලි වූ පසු උඩට ගත් ඇය තම පිටි අල්ලේ තබා රස්නය බලා රස්නය වැඩි බැවින්දෝ තෙත රෙදි කඩින් පිසදමා අවශ්‍ය පමණ රස්නය ඉතුරු කළාය. ඉන්පසු අනෙක් පොල් ලෙල්ලද ආඩතෝඩා කොළ මිටියද රත් වෙන්න දමා සකසා ගත් පොල් ලෙල්ලෙන් රොෂාන්ගේ බඩ තවන්නට වූවාය.

එසේ කරද්දී රොෂාන් ඇඹරෙන්නටත්, කෙඳිරි ගාන්නටත් වූයේ ඉතාම අසීරුවෙනි. “අනේ රොෂාන්........ ඔහොම ඉන්න........ තව ටිකක් ඉන්න........”

“සඳරු මට බාත්රූම් යන්න ඕන වගේ........”

“ආ........හා........හා........ ඔහොම ඉන්න මම බාත් රූම් එකේ ෂවර් එක ඇරලා එන්න........” එසේ කියූ සඳරු වහා දිව ගොස් වතුර ෂවරය විවර කොට පැමිණ රොෂාන්ව නාන කාමරයට කැඳවා ගියාය. අනතුරුව දොර වැසූ ඇය දොර අසළට වී උන්නාය.

ටික වෙලාවක් එසේ සිටියදී යතුර කරකැවෙන හඬ ඇසුණු ඇය වහාම යළිත් දොර විවර කළාය. රොෂාන්ගේ මුහුණේ වූයේ වේදනාව පහව ගිය බවකි.

“යූරින් පාස් උණාද රොෂාන්........?” ඔහු හිස සැළුවේ ඉවත බලාගෙනය. ඔහු ලජ්ජාවෙන් පසුවන වග ඇයට නොවැටහුණා නොවේ.

“ඕ........ දෙයියන්ට පින් සිද්ධ වෙච්චාවේ” සඳරු හෙමිහිට කීවාය........ රොෂාන් හෙමින් අඩි තියමින් නාන කාමරයෙන් එද්දී යළිත් ඔහුව වක්කම් කරගත සඳරු ඔහුව ඇඳට කැඳවා ගියේ “දොර ඇරිලා තිබ්බචදෙන් ඔයාට ෂවර් එකේ සද්දෙ ඇහෙන්න........” යයි කියමිනි.

යළිත් රොෂාන්ව සයනයේ ඇලකළ සඳරු ආඩතෝඩා කොළ වලින්ද අමු පොල් ලෙල්ලෙන්ද තව දුරටත් ඔහුගේ යටිබඩ ප්‍රදේශය හොඳින් තැවුවාය. ඒ වන විට වතුර ගලන්නාසේ වූ දහඩිය ඇමීම නතර වූවා සේ පෙනෙන්නට විය.

“හ්ම්........ ආඩිය පිට උණු එකත් අඩු උණා........ ඔයා ටිකක් ඔහොම ඉන්න මම තෙල්ලි ගේන්න යැවුවා ඩ්‍රයිවර්........ අරන් ඇවිත් නම් හදන්න කියලා එන්නම්........” එසේ කියූ සඳරු පිටව යනු බලා සිටි රොෂාන් නැගෙන්න ආ ඉකිය මැඩගත්තේය.

සඳරු පහළ සිට තෙල්ලි යුෂ වීදුරුවක් සාදාගෙන ආපසු එන විට රොෂාන් යළිත් නාන කාමරයේ සිට එනු පෙනුණු සඳරුට හිනාවක් නැඟිණ.

"දැන් මේකත් පෙච්චම කියයිද දන්නෑ සඳරු යූරින් නවතින්නෑ ........ඒකට මොනා හරි කරන්න කියලා........" සඳරු කියද්දී රොෂාන් සිනාසුණේ හිස වනමිනි.

"අම්මේ........ මගේ පණ තුන් කාලක්ම ගියා........මේ බලන්න........ තාමත් ඇඟට පණ නෑ වගේ......... ඔයාගෙ හිනාව දැකලා තමයි දැන් මේ ඇඟට ලේ උනන්නේ" සඳරු කියද්දී රොෂාන්ගේ හදවත මත මහා ගල් කුට්ටියක් දැම්මා සේ බරක් වැටිණ......... සැබවින්ම එය වේදනාව විය.

"රොෂාන්........ මේකත් බොන්න හොඳ ළමයා වගේ" සඳරු ඇඳ මත ඔහු අසල වාඩි වී තෙල්ලි වීදුරුව ඔහු අතට දෙද්දී ඔහු එය රැගෙන බීවේ ඇය අතින් ලැබේ නම් කෙතරම් තිත්ත වුවද කම් නැතැයි සිතමිනි.

ඔහුට සුවය ලැබුණා යයි වැටහෙනකල්ම ඇය ඔහු අසළට වී සිටියාය.

"අර තරම් ආඩිය දැම්මේ ඇයිද මන්දා. මම හිතුවේ මාව ෆේන්ට් වෙයි කියලා." රොෂාන් කීවේ පුදුමයෙන් මෙනි.

"යූරින් කියන්නේ බහිස්‍රාවිය ද්‍රව්‍යයක්......... ඒක හරි විදියට පිට නොවුණම තවත් බහිස්‍රාවීය අවයවයක් විදියට තියන සමේ සිදුරු වලින් ඒක ආඩිය විදියට පිට කරනවා......... හොඳින් වතුර නොබොන, යූරින් පාස් නොවෙන අයගෙ ආඩිය, ගඳත් ඒකයි. ඔයාට නම් ඉතිං හේතු ගොඩක් තියෙනවනේ......... ලිකර් ගන්නවා......... වතුර පෙවෙන්නේ නෑ........"

"හ්ම්........ අද ඉඳලා මම මතක් කරලම වතුර බොන්නම්. නැතිනම් තව ටික දවසකින් ඔයාට මාවත් ගඳ ගහයි"

"අනේ එහෙම නෑ රොෂාන්........"

"මම ජෝක් එකක් කළේ" රොෂාන් කියද්දී සඳරු සිනාසුණේ ඔහු තමාට විහිළුවක් කිරීමට සිතීම ගැනය.

"ඒක නෙවි........ ඔයා ඇයි අර ෂවර් එක ඇරියේ"

"නිතරම යූරින් තද වෙලා තියන කොට වතුර වැටෙන සද්දෙ ඇහෙන කොට අපිට ෆීල් එකක් එනවා ඒක පාස් වෙයි කියලා........ එතකොට ඒක වෙනවා"





"ඔයා කොහොමද මේ ගොඩ වෙදකම් මේ තරම් දන්නේ?"

"මට එහෙ අපේ මාමා කෙනෙක් ඉගැන්නුවා"

"අපරාදෙ ඔයා අපේ ගෙදරට ඇවිත් මේ බිස්නස්වලට පැටළුණේ......... ඔයා වගේ අය හොඳ සාත්තු සේවයට......... කොහොමත් ඔයාව දැක්කත් ලෙඩ්ඩුන්ගෙ ලෙඩ සනීප වෙනවා"

"ඒ උණාට ඔයාට උණේ නැතේ........." සඳරු කීවේ මුත්‍රා අමාරුව ගැන වුවද එය ඇසූ රොෂාන්ගේ මුහුණ වෙනස් වී ගියේය.

"අනේ ඔයා මොකුත් හිතන්න එපා රොෂාන්......... මමත් විහිළුවට කිව්වේ මේ ලෙඩේ ගැන"

"මම දන්නවා සඳරු......... ඒත් අපි දෙන්නට හිත හොඳින් ඉන්න බැරි නිසයි මට දුක හිතුණේ........." රොෂාන් කියද්දී සඳරු බිම බලා ගත්තාය.

"ඒ ගැන හිතන්න එපා........ඔයා සනීප වෙන්න........" ඇය කියද්දී කථාව වෙස් කළ රොෂාන්,

"ඒක නෙවි, මොනවද ඔයා මට අර දුන්න අභිරහස් පානෙ?"

"ආ......... පැණිකොමඩුයි වෙලිච්ච මිදියි භාගෙට භාගෙ වතුර අලා බ්ලෙන්ඩ් කරපු ජූස් එක"

"ඒක නම් රාජකීයයි......... ඕ. කේ......... මම යනවා ටොයිලට්........."

රොෂාන් ආපසු යද්දී සඳරු හඬ නඟා සිනාසුණාය. රොෂාන්ට ඇය ගේ සිනා හඬ ඇසුණේ රිදී සීනු හඬක් ලෙසිනි.

"දුකේදී හැඬුමට - සැපේදී - සිනාසෙන්නට ළඟ ඉඳන්
තවත් අම්මා කෙනෙකු ඇත්නම්
නුඹයි ඒ අම්මා......... සොඳුරියේ
නුඹයි ඒ අම්මා.
අහස මෙන් ලත් චෝදනා
පොළව මෙන් දුක් උහුලනා//
සඳ ටජ් මහලක් පිවිතුරු සෙනෙහෙ ගංතීරේ
සොඳුරියේ ඔබෙ රුව මවා ගම් මහද මන්දිරේ
සිතක සැනසුම් කල්පනා
ගෙන පාදා වාසනා//
මැණියන්ගේ සෙනෙහසින් මුල් වරට ඉපදීලා
සොඳුරියේ ඔබෙ සෙනෙහසින් ඉම් ලොවෙහි රජවීලා........

එදින රාත්‍රී වේලාසනින් නිවසට ආ රොෂාන් කෑම කා සඳරු කාමරයට එනතුරු බලා උන්නේය. මුළුතැන්ගෙයි කටයුතු නිමා

කළ සඳරු පියුමි හා කථා කරමින් පැමිණ කාමරයට එද්දී ඇඳෙහි ඇල වී සිගරට් එකක් බොමින් සිටි රොෂාන් ඇය දැක සිගරට එක නිවා දැමුවේය.

“රොෂාන්........ උදේ අච්චර අමාරුත් වෙලා ඇයි මේ තරම සිගරට් බොන්නේ”

“සිගරට් වලින් කිඩනි වලට ප්‍රශ්නයක් නෑ ළමයෝ පෙනහළුවලට මිස” ඔහු කීවේ සිනාසෙමිනි.

“ඔයා නම් කියන එකක් අහන්නෙම නෑ........”

“ඒක නෙවි........ මම අද ඔයාට බඩුවක් ගෙනාවා........ හැබැයි ඒක මමම දාන්න ඕන” රොෂාන් කියද්දී සඳරු පුදුමයෙන් මෙන් ඔහු දෙස බැලුවේ ඔහු එවන් කථා නොකියන බැවිනි.

“මොකද පුදුමවෙලා බැළුවේ. මම අමුතු දෙයක් කිව නිසාද. ටිකක් අමුතු නම් තමයි. එත් ඉතිං අපි දෙන්නා හොඳ යාළුවො කියලා හිතලා හා කියන්න........”

“මොනාද රොෂාන්........” ඇය ඇසුවේ සිනාසෙමින් නමුත් කුතුහලයෙනි.

“කියන්නම්........ හා ද බෑ ද කියන්න”

“හා........ ඉතිං කියන්න මොනවද කියලා” සඳරු කියද්දී නැගිට ගිය රොෂාන් අල්මාරිය ඇර ආභරණ පෙට්ටියක් එළියට ගෙන යළිත් පැමිණ ඇඳ මත වාඩිවී පෙට්ටිය ඇය අත තැබුවේය. සඳරු එය දිග හැර බලා,

“ආනේ........ මෙකෙ ලස්සන........ හරිම ලස්සනයි රොෂාන්” යයි කීවේ එහි වූ සුන්දරත්වයෙන් වශී වෙමිනි.

“දැක්ක ගමන් මටත් හිතුණා ලස්සනයි කියලා........ ඒකයි ගත්තේ........ හැබැයි අද මමයි මේක අද ඔයාගෙ කකුලෙ දාන්නේ........” රොෂාන් කියද්දී සඳරුට ඔහු මුහුණ බැලිණ.

“ලොකු විශේෂයක් නෑ........ ඔයාගෙයි මගෙයි යාළුකමට........ ඔයා මම ගැන හොයා බලනවට” රොෂාන් ඉක්මනින් කීවේ සඳරු තමා දෙස අමුතු ලෙස බලනු දුටු බැවිනි. තවත් කිසිවක් කථා නොකළ සඳරු ඇඳ මත වාඩි වී කකුල ඔහු ඉදිරිපිට තැබුවාය.

“ගොඩක් දේවල් අමතක වෙලා යද්දී........ මාවත් අමතක වෙලා යද්දී මේ පායල් දෙක ඔයාට මතක තියේවි.” රොෂාන් කියද්දී නොතපුරා නැගුණු කඳුළු නෙතින් පිට පැන සඳරුගේ කොපුල් තල මත බේරී ගියේ රොෂාන් ගැනද තම ජීවිතය ගැනද කෙළවරක් නැති කල්පනා ඇය සිත අරක් ගනිද්දීය.



සඳරු දිනක් පන්ති නිම වී බස් නැවතුමට ආවේ ගිම්හාන සමගිනි. ඇය ඔහු හා යම්කිසි නිබන්ධන කිපයක් බලමින් කථා කරමින් සිටිද්දී එක්වරම එහි ආ නවීන පන්නයේ කැබ්රථයක් ඇය අසල නැවතිය........ වීදුරුව පහත් කොට ඇයගේ යයි සිතිය හැකි ඡායාරූපයක් ගත් එම රථය යන්නට ගියේය. සඳරුට දැනුණේ අධික බියකි.

“සඳරු........ අර මොකක්ද උන් කළේ........ ඔයාගෙ ෆොටෝ එකක් ගත්තේ........”

“අනේ මන්දා ගිම්හාන........ මට බයේ බෑ........ මහ දාමරික පාට මිනිස්සු”

“කොහොමත් ඔයා පරෙස්සමෙන්. අර නඩුවෙ දින ළඟයි නේද දැන්”

“ඔව් ඒකෙ ප්‍රධානම සාක්ෂිය අපි දැන් ප්‍රවේසම් තැනක ඉන්දලා ඉන්නේ”

“සමහර විට ඔයාව බ්ලැක්මේල් කරන්නද දන්නෑ........”

“වෙන්නත් පුළුවන්........ මට හරි බයයි ගිම්හාන........ ඒත් බය පෙන්නලත් බෑ”

“ඔයා බයවෙන්න එපා........ මම ඉන්නම් හැමදාම ඔයාට වාහනේ එනකල්........”

“ඔයා ප්‍රශ්නවලට පැටලෙන්න එපා මා නිසා. මම බලාගන්නම් ඒ ගැන”

“මහලොකු චන්ඩියනේ. මොනා හරි උණ වෙලාවට තමා”

“මට මොනා වෙන්නද?”

“උන් කරදරයක් කළොත්........ ඒක නිසා බලාගෙන වැඩ කරන්න........ මම නම් කැමති නෑ ඔයා රෑ වෙලා යනවට”

“එහෙම කියලා මම ලෙක්චර්ස් වලට නැවිත් ඉන්නයැ. ජීවිතේ කියන්නේ අන්ධකාරෙ ආලෝක දෙකම එන දෙයක් ප්‍රශ්න සතුට දෙකම එන දෙයක්........ ඒත් මේ එකක් වත් ආවා කියලා කාලය අපට ඕනවට නැවතිලා තියෙන්නෙ වත් අපට එපාවට ඉක්මනට යන්නෙ වත් නෑ ගිම්හාන. ජීවිතේ කියන්නේ නිතරම මේ අවස්ථාවල් පහු කරන එක ගමන් කරන එක........ සමහර වි අද කරදර තිබුණත් හෙට හොඳ පැහැපත් දවසක් වෙන්න පුළුවන්........”

“ඒත් ඒවට ඔයාට තනියමයි මූණ දෙන්න වෙලා තියෙන්නේ........ මේ ඔයාගෙ හස්බන්ඩ් කොයි වෙලාවෙ වත් ඔයා ළඟ නෑ........

කියලා කෙනෙක් කියාවි. වගේ දේවල් වලින් පන්නරය ලබනවා කියලා කෙනෙක් කියාවි. ඒත් ඒ පන්නරය ලබන්න නම් ඔයා ඔයාගෙ ගෑනු කම පැත්තක තියලා ඒවා එක්ක ඔට්ටු වෙන්න වෙනවා. ඒකෙදි සමහර වෙලාවක ජය ලැබුණත් සමහර විට පරාජය වෙන්න උණොත් ජීවිතෙන් පවා වන්දි ගෙවන්න වෙනවා. අන්න එදාට ඔයාට කව්ද ඉන්නේ. අනෙත් එක මේ පුංචි වයසෙදි මේ වගේ ප්‍රශ්නවලට මූණදීලා ඔයා යකඩ ගෑනියක් වෙනවට මම ආසා නෑ........ මම ඔයා ළඟින් දැක්ක මෘදු කම, ලස්සන ගෑනු කම හැමදාම ඔයා ළඟ තියෙන්න ඕන. වැල ගහක් වෙන්න ගියොත් වැලේ අනන්‍යතාවෙ නැතිවෙනවා. වැල වැලක් විදියට තියන කල් හරි ලස්සනයි. වැලක ප්‍රධානම කාර්යය තමයි ගහක් වටේ එතිලා ඉහල යන එක. ගහත් එක්කම ලස්සන වෙන්න මල් පුබුදුවන එක. දකින කෙනෙකුට ආසා හිතෙන්නේ එතකොට........"

"ඔව් නේ, ගහට උණත් නිකං ආදරණීය කරදරයක් වෙලා මාංචුවක් දාගෙන ඉන්න එක ගහට වෙන කොහේට වත් හෙල්ලෙන් බැරි වෙන්න........"

"අන්න හරි........ හොඳට තේරෙනවා........ එහෙම නැතුව වැලක් කියලා නමට විතරක් වෙලා ගහක් සයිස් එකට මෝරන එක නෙවී. හරියට අර සිංහරාජ වනාන්තරේ අවුරුදු සිය ගණන් වෙච්ච මහ පත පුස්වැල් වගේ" ගිම්හාන ඉඟි කරමින් කියද්දී සඳරුට නැඟුණේ ලොකු හිනාවකි. ඇය මහ හඬින් සිනාසුණාය.

"ගිම්හාන........ ඔයා නම්........ දාර්ශනිකයෙක් වෙන්න තව පොඩ්ඩයි අඩු" ඇය සිනාසෙමින් කියද්දී ගිම්හාන ඇය දෙස ආදරයෙන් බලා සිටියේය.

"ඔයාගෙ ඔය හිනාව........ කවදාවත් නැති වෙන්න දෙන්න එපා. ඒක තව ගොඩක් අයට ජීවත් වෙන් ශක්තිය ගේනවා........" ඔහු කියද්දී සඳරු බලා සිටියාය.

"විශේෂයෙන් මට........" ඔහු අවසානයේ හෙමිහිට පවසද්දී සඳරුගේ මුව ගොළුවිණ.

"අන්න ඔයාගේ බස් එක එනවා........ ඔයා යන්න" මොහොතකට පසු ඔහුගේ බසය දැක ඈ කීවාය.

"පිස්සුද........ ඔයාගෙ වාහනේ එනකල් මම යන්නේ නෑ........ මම කිව්වේ........ මට පුළුවන් තාක් කල් මම ඔයාව ආරක්ෂා





කරන්නම........" ගිම්හාන කියද්දී ඔහුගේ දයාබර බව ඉවසාගනු නොහී සඳරුගේ දෙනෙතට කඳුළු ඉනිය.

"මම හරිම පව්කාරියක් කියලා හිතෙනවා වෙලාවකට"

"ඇයි ඒ?"

"මට ලැබෙන්නෙ නැති ආදරයක් ළඟ මම හිරවෙලා ඉඳගෙන අනිත් අයට දුක් දෙවනවා මම"

"තමන් ගැන එහෙම බාල්දුවට හිතන්න එපා........එතකොට තමන්ට වත් තමන්ගෙ වටිනාකම පේන්නෙ නැතුව යනවා අනුන්ට තියා. කාට වටින්නෙ නැති උණත් තමන්ට තමන් වටින්න ඕන. මොකද තමන්කේ දක්ෂකම, හැඟීම, තමන් කව්ද කියන එක හරියටම දන්නෙත් තමන් නිසා"

"ගිම්හාන ඔයා එක්ක කථා කරන කොට හරියට පුස්තකාලයකට ගියා වගේ."

"වෙන්න ඇති. මම ඉතිං වැඩිපුර ඉන්නෙ එහෙනේ. ආ........ අන්න වාහනේ ආවා........ යන්න ඉතිං" ගිම්හාන සිනාසෙමින් කියද්දී ඔහුට අත වැනූ ඇය යන්නට ගියාය.

# 19

මනුෂිගේ හදවතේ සඳරු ගැන වෛරය එන්න එන්නම වැඩිවූයේ ඇය මෙ නිවසේ සිටින්නට සිටින්නට තමාගේ තත්ත්වය පහළ යන බව වැටහුණ බැවිනි.

........හැමෝගෙම වැඩ කරලා දීලා හැමෝවම රවටා ගෙන ඉන්නෙ ........නෙත්ගේ වැඩ නම් ඉතිං කොහොමත් පැනලනේ කරන්නේ........ මේකිව වැඩි දවසක් මෙහේ තියන් හිටියොත් මට වෙන්නෙ ලොකු ප්‍රශ්නයක්........ මනුෂි මෙසේ සිතමින් සිටියේ ඇය යද්දී සඳරු රිදීම්ගේ දරුවාව මව සමග සුරතල් කරමින් සිටිනු දුටු බැවිනි. කාමරයට ගිය ඇය තම සොයුරාට ඇමතුමක් ගත්තාය.

"හලෝ........ අයියා........ ඔයාලා තාම මොනාද කරන්නේ........ ඇන් නඩුව ලබන සතියේ. තාම මේකි මෙහෙ හොඳින් ඉන්නවා........ මොනවා හරි හිතලා වත් තියනවද?"

"හරි හරි බය නැතිව ඉන්න........අපි ඒක කට්ටියකට භාර දීලා තියෙන්නේ. අද හෙට බලන්නකෝ........ ඔය ගෙදර ජනසවිය කාඩ්වලින් ඔය නම අයින් කරලා දෙන්නම්"

"ඔයා විකාර කියවනවා........ කරන දෙයක් පරෙස්සමෙන්........ අපි අහු නොවී........ මතකනේ"

"හරි නංගි හරි."

නියතිට බොහෝ දිනකින් ලද නිවාඩුව නිසා ඇය නිවසේ පසු වෙමින් නෙත්නගේ කටයුතු සොයා බැලුවාය. නෙත්නගේ මව ඇයට පසුගිය දිනක කරුණු වටහා දෙමින්........ මේ විදියට ඇය කටයුතු කළහොත් ඇයගේ අතින් නෙත්න ගිලිහී යාමට ඉඩ ඇති බවට අනතුරු ඇඟවූවාය.

"එදාට මටත් මොකුත් කරන්න බැරි වේවි නියති. කොච්චර මගෙ පුතා උණත්. මම ඔයාගෙ නැන්දා උණත්........ මොකද නෙත්න හරිම ස්වාධීන තීරණ ගන්න කෙනෙක්. අපිට බැරි වේවි එයාගේ





තීරණේට විරුද්ධව මොකුත් කරන්න. ඒක නිසා එයාගෙ හිත වෙනස් වෙන්න නොදී තියාගන්න එක ඔයාගෙ වගකීමක්. මට දැනටත් නිකං හිත කියනවා අර නස්රිනා කියන ගර්ල් එක්ක මෙයා ලොකු සම්බන්ධයක් තියනවා කියලා. මොකද ඊයෙ රෑ මම කාමරේට යද්දිත් දෙන්නා ෆෝන් එකෙන් කථාව........ මම ගියා විතරයි නැවතුවා........ නෙත්න කොච්චර Open විදියට වැඩ කළත් නස්රිනා ඉන්නේ ඇතක........ ඒ දෙන්නට ඕන විදියකට මූණ ගැහෙන්න පුළුවන්. කථා කරන්න පුළුවන්. දැන් ඔයා පොඩි නෑ........ නෙත්න කියන්නේ ඔයා බඳින්න ඉන්න කෙනා. ඉතිං එයාගෙ හිත ඔයා ළඟ තියාගන්න ඔයා දැනගන්න ඕන. දූ තරහ වෙන්න එපා මම මේව කීවම. ඔයා මගේ ලේලි කරගන්න ඕන නිසයි මේවා කිව්වේ........"

........ඇය නැන්දා කියූ දේවල් සිහිපත් කරමින් නෙත්නගේ කාමරයට ගියාය. ඇය යද්දී නෙත්න සිටියේ රූපවාහිනිය නරඹමිනි.

"සුදු අයියා........ දැන් ඇති ගෙදර හිටියා........ යමුකෝ ටිකක් ඇවිදින්න"

"කොහේද?"

"කොහේ හරි........ හිඟින් කාලා........ චූට්ටක් එන්ජෝයි වෙලා එමු........ දැන් කකුලෙ තුවාලෙත් වේලිලානේ"

"හ්ම........ ඒක නම් ඇත්ත. ඒත් මගේ අත රිදෙනවා නියති තාම"

"ඉතිං අපි යමුකො ඩොක්ට ළඟට"

"මම හිතන්නෙ නෑ මේකට ඊට වැඩිය දෙයක් එයාලා කරයි කියලා" නෙත්න එසේ කියද්දී සඳරු හා නෙත්නගේ මවද ඔවුන් වෙත ආවේ නෙත්නගේ අතේ ගෑමට වින්ටොජිනෝ එකද රැගෙනය.

"මට නම් හිතෙන්නේ අම්මී මෙක වින්ටොජිනෝ ගාලා හරියන එකක් නෙවි. අපේ ගමේ නම් ඉන්නවා කැඩුම බිඳුම්වලට හරි හොඳ වෙද මහත්තයෙක්........"

"ගෙවල් හරියෙමද සඳී දුව"

"නෑ........ ටිකක් එහා........ රඹෑව කියන අහ"

"මාත් කැමතියි දැන් සිංහල බේත් ටිකක් මේ අතට කරනවා නම්........ මොකද ඉක්මනට සනීප වෙන්න නම් තෙල් බේත් සාත්තුවක් දෙන්නම වේවි"

"ඊයා. නැන්දි........ තෙල්........? තෙල් ගාගෙන කොහොමද නෙත්නයියා ඉන්නේ. ඔෆිස් යන්නේ........ ගඳේ බැරි වේවි. ඊට හොඳයි පිසියොතෙරපිස්ට් කෙනෙක් වැනල් කරා නම්........"

“ඒවත් හරි ඇණ වැඩ. ඩෙලි යන්න බේවි එක්සයිසස්වලට........ ඊට හොඳා නිකම ඉන්නවා. කවුරු හරි........ ඕක ගාන්න මගෙ අතේ”

“කෝ දෙන්න සඳී අක්කි මම ගාන්න........” නියති බෝතලය අතට ගෙන ඉන් බාම ස්වල්පයක් ගා අතුල්ලද්දී නෙත්නට මහත් සේ රිදිණ........

“ආ........වුව්”

“ඇයි රිදුණද?”

“නෑ හරි සනීපයි........ බැරි වැඩ නොකර ඉන්න ඔයා........” එසේ කියූ නෙත්න වේදනා ගෙන දෙන තම අත පිරිමදිද්දී එහි ගිය සඳරු බාම ස්වල්පයක් යළි අතට රැගෙන ඔහුගේ අතේ ගා හෙමිහිට ඇඟිල තුඩුවලින් උඩු අතට පොඩි කරමින් පිරිමදින්නට විය. නෙත්නට දැනුණේ සුවයකි........ ඔහු හෙමිහිට දෙනෙත් පියා ගත්තේය.

“දඩිබිඩි ගාලා රැප් කරපු සිංදුවක් නෙවි ජීවිතේ........ ලෙඩෙක්........ ලෙඩක්........ ජීවිතේ........ ඒවා ඔයාගේ ඔය සරුංගල් ලයිෆ් එකට වැඩිය වෙනස්........ try to understand ........” නෙත්න කීවේ තරහෙන් බව මව සේම සඳරුටද වැටහිණ. නියති ඇසේ කඳුළු පුරවාගෙන බිම බලාගෙන ටයිල් පොළව මත පයේ මහපටැඟිල්ල දිවවූවාය.

“දැන් ටිකක් අඩුවෙවි........ පුතා නිදාගන්න........ අපි යමු නියති........” ලේලියගේ සිතරිදී ඇතිබව දුටු මව නියති කැටුව පහලට ගියාය. ඔවුන් යනු බලා සිටි සඳරු,

“හරිම නපුරුයි ඔයානම්” යි අත පිරිමදින අතරේම නෙත්නට පැවසීය.

“ඇයි ඒ........” ඔහු ඇය දෙසට හැරෙන අතරේ පැවසීය.

“ඇයි අර ළමයට බැන්නෙ?”

“යකාගෙ කථාවක්. මගෙ අත පෙන්නුවට වැඩිය ගොඩ රිදුණා........ ඇඟට නිකං කලන්තෙ වගේ ආවා. නොදන්න බම්බු කරන්න එනවා........”

“ඒ ළමයා කොහොමද මේවා දන්නේ........ ඔයාට ආදරේ නිසානේ අතගාන්න ගත්තේ”

“එයයි එයාගෙ ආදරෙයි. දැන් මේ මාසයක් විතර එක තැනකට වෙලා හිටියට මම හැමෝම ගැන හැම දේ ගැනම ලොකු අවබෝධයක් ගත්තා........ අම්මිත් මට නියති මැරි කරන්න කිවොත්





රොෂාන් අයියා කරපු එකේ අනිත් එක කරනවා මම” ඔහු තරහෙන් කීය.

“අම්මෝ මූණෙ හැටි තරහ ගියාම........ මම දන්නවා ඇයි කියලා ඔයා ඕකට දැන්මම විරුධවෙන්න හදන්නේ”

“කියන්නකෝ?”

“හස්ටිනාව මැරි කරන්න පූජවන් වෙන්න පාර හදාගන්නද දැන්මම මේ බාධක ඉවත් කරන්නේ”

“ම්........ ළඟදි ධාරනි කිව්වද? මොලේ හොඳට වැඩ කරනවා........” නෙත්න කීවේ මනමාල සිනාවක් මුව රඳවාගෙනය.

“මොකද ඔහොම හිනාවෙන්නේ?”

“හිනාවෙන්නෙද........ පස්සෙ කියන්නම්........”

“මොකද මේ සේරම පස්සට දාන්නේ?”

“කාම නැකැත් නෑ........ සංක්‍රාන්ති කාලයක් මේක........ ඒකයි........”

“තේරවිලි වැඩියි........ හරියට........ මම යනවා........ මට පරක්කු වෙනවා”

“අද මගෙ හිතට හරි අමුත්තක් දැනෙනවා........ පරෙස්සමින්”

“ඇයි එහෙම කිව්වේ?”

“දන්නෑ........ නිකං මට හිතෙන දේ වෙන්නැති. ඒත් ඔයා පරෙස්සම් වෙන්න ඕන........ නඩුවට තව දවස් කීයද?”

නෙත්නගේ සමුගෙන කාමරයට ගිය සඳරු නෙත්න කී දේවල් සිහි කළාය. ඔහුගේ දයාබර බව කැටි වූ වදන්වල පවා ඇත්තේ නොමද ආරක්ෂාවකි. තමාගේ කමක් අයිතියක් ඇතිවා සේ ඔහු කියනා යමක් කරන්නට සිතට සිතෙයි.

........හරියට හස්බන්ඩ් වගේ........ කියන කරන ඒවා වෙලාවකට ........ ඒත් ඇයි එයා කිවේ අද හිතට හරි නෑ කියලා........ එදා මගේ ෆොටෝ එකක් ගත්ත බව වත් මම එයාට කිවේ නෑ. මට යන්නවත් නොදෙන නිසා........ කොයි එකටත් අද කලිසමක් ඇඳගෙන යනවා........ මොනා හරි උණොත් දුවන්න හරි ඕනනේ........ සඳරු එසේ සිතමින් හැඳගත්තාය.

සේමිනි මග බලා සිටියේ සඳරු එනතුරුය. දෙදෙනා කථාකරමින් සරසවි බිමේ වැවී ගිය ඇහැල ගස් දෙපේලිය අතරින් ඇවිද ගියෝය. විශ්වවිද්‍යාල සිසුන් අතර සඳරු ඉතාමත් ජනප්‍රිය චරිතයක් වූයේ ඇයගේ රූමත් කම නිසාවෙනි. ගැහැනු ළමුන් පවා ඇය දෙස බැලුවේ ආශාවෙනි. කෙනෙකු ඇයට ඊර්ෂ්‍යා කළ අතර තවකෙකු

ඇයට සැබෑවටම හිතවත් වූහ. මෙදිනද සඳරූ සේමිනි හා ගියේ මගදී හමුවන නොයෙක් දෙනා හා වදනක් දොඩමිනි. සිනාසෙමිනි.

"ඒයි ලෙක්චර්ස් ඉවර වෙලා ටවුන් යමුද? මට බඩු වගයක් ගන්න තියනවා"

"උඹට නම් වෙලා තියනවා රෝන්දෙ යන්න. මට ගෙදර කොච්චර වැඩද........?"

"අනේ සදී......... මොනාද යමං

"හැබැයි වෙනදා වගේ වෙලා යන්න බෑ. ගියා ගත්තා"

"හරි හරි අම්මේ......... හරි........."

"ඒක නෙවි......... උඹ ගිම්හාන මීට වෙන්න ලයිබ්‍රරි ගියාද?"

"ගියා තමයි......... වෙන මොනවත් නෑ......... දෙන්නා එක්ක පාඩම් කරලා ආවා........." සේමිනි කීවේ සිනාසෙමිනි.

"ඔහොම බෑ බං......... ටිකක් උඹ එක් ෆෝවඩ් වෙයන්"

"ඔය කොයි එක කරත් ගිම්හානට මාව යාළුවෙක් විතරයි සඳරූ........

"ඔය කොයි එක කරත් ගිම්හානට මාව යාළුවෙක් විතරයි සඳරූ........ එයා ආදරේ උඹට. ඒක මට හොඳටම දැනෙන කොට මටත් හිත නෑ ඕවා කථා කරන්න." සේමිනි කීවේ ගැඹුරු හඬිනි. මන්ද යථාර්ථය පතුලටම ඇය දැක ඇති හෙයිනි. මිතුරිය කියද්දී සඳරූ සුසුමක් හෙළුවාය.

"මමත් ගොඩ ට්‍රයි කරනවා බං......... ඒත් ගිම්හාන හරි පුදුම ළමයෙක්......... කොටින්ම එයාගෙ තියෙන උතුම් ගතිගුණ නිසා මට එයාව ආශ්‍රය නොකර ඉන්නත් බෑ......... එයා මට ළංවෙන්න ළංවෙන්න දුක් විඳින නිසා ආශ්‍රය කරන්නත් මම කැමති නෑ........."

"මට තේරෙනවා" සේමිනි හෙමිහිට කීවාය.

දේශන හමාර වී සේමිනි, සඳරූ හා ගිම්හාන කතා බහ කරමින් බස් නැවතුමට ආවා පමණි. එක්වරම එහි පැමිණි වාහනයකින් බැස ආ තිදෙනෙකු සඳරූගේ අතින් ඇද ඇය වාහනයට දමා ගන්නට උත්සාහ කළෝය.

"නැගපං වාහනේට......... නැත්නං වෙඩි තියනවා" එකෙකු කියද්දී සඳරූ ඔහු තල්ලු කරමින් කෑ ගැසුවාය. වහාම ගිම්හාන එතැනට පනිමින් සඳරූ අතින් ඇද සේමිනි දෙසට තල්ලු කොට මැරයාට පහරක් ගැසුවේය. ඒ හාම අනෙක් දෙදෙනාද ගිම්හානට පහර දීමට ආවද ගිම්හාන ඔවුන්ටද පහර කිපයක් එල්ල කළේය. එහෙත් ගිම්හානගේ පැත්තෙන් පැමිණි පළමු මැරයා ඔහුට කිනිස්සකින් අනිද්දී ඉන් වැලකෙන්නට ගිම්හාන උත්සාහ දැරුවද පිහිපාර ඔහුගේ දකුණු උරහිස හරහා ගියෙන් ඔහු වේදනාවෙන් ඇඹරිණ.





ඒ අතරේ මේ සිදුවීම දකිමින් සරසවි භූමිය තුළ සිටි ඔවුනගේ මිතුරන් මෙදෙසට දිව එමින් සිටියහ. ගිම්හානට පිහි පාර ගැසූ අමරිකයා යළිත් සඳරූ අතින් ඇදගෙන යද්දී අසල තිබූ පොලු කැබැල්ලක් ගත් සේමිනි අමරිකයාට ඉන් පහරක් ගැසීය. ඔහුට සඳරූව අතින් අතහැරිණ.

"ඒයි ඕකිව අතහැරලා වරෙන් කට්ටිය එනවා......... මිසින් වෙමු ......... මිසින් වෙමු" රථය පණගන්වමින් එකකු කෑ ගසද්දී අන් දෙදෙනාද රියට ගොඩ වූහ. සඳරූ කෑ ගසාගෙන දිව ගියේ ගිම්හාන වෙතය. ගිම්හාන එවෙලේ බිම වැටී සිටියේය. තුවාලයෙන් ලේ ගලමින් තිබිණ. ඒ හාම එහි ආ පිරිස වාහනයක් නතර කොට ගිම්හාන හා සඳරූව එහි නැංවූ අතර තවත් වාහනයක් රැගෙන සේමිනි හා ගිම්හානගේ මිතුරන් කිප දෙනෙකුද රෝහල වෙත ගියහ.

සඳරූ සිටියේ හඬමිනි. ගිම්හානගේ තුවාලයෙන් ගලන ලේයින් ඇයගේ ඇඟ තෙත් වෙමින් පවතියි. ඔහුගේ දෙනෙතද පියවී ඇත.

"ගිම්හාන......... ගිම්හාන......... අනේ මොකද.........?" සඳරූ ඔහුගේ මුහුණ අතගාමින් අසද්දී ගිම්හාන අසීරුවෙන් දෙනෙත හැරියේය.

"ම.........ට.........ටික.........ක් අ.........මාරු.........යි සඳ.........රූ" ඔහු කියද්දී ඇය හිතියෙන් ඇවී ගියාය.

"බයවෙන්න එපා.........ඔයා ඉක්මනට සනීප වේවි.........අනේ මම නිසානේ සේරම. ඇයි ඔයා මැද්දට පැන්නේ" ඇය අසද්දී ඔහු කිසිවක් නොකීවේය.

රෝහල වෙත වහ වහා ගිය පිරිස ගිම්හානව රෝහලට ඇතුළත් කළෙන් ඔහුව ශල්‍යාගාරය වෙත ගෙන යන ලදි. රෝහලේ පොලිසියේ නිලධාරීන් එතැනට විත් සඳරූ ගෙන් හා සේමිනි ගෙන් වෙන වෙනම කට උත්තර ලියා ගන්නා ලදී.

"අඳුරනවද ඒ මිනිස්සු?"

"නෑ......... අද ආපු අය වෙනස්......... මේ එදා මගේ ෆොටෝ ගත් අය නෙවි"

"ඔයාගෙ ෆොටෝ ගත්තා නම්......... කවුරු හරි ගැන සැක තිබුණා නම් ඒ ගැන ඇයි පොලිසියට නොකීවේ?"

"එහෙම සැක කළේ නෑ සර්" ඇය බොරුවක් පැවසුවාය.

මූලික කටයුතු සිදු කිරීමෙන් අනතුරුව නිවසට ඇමතුමක් ගත් සඳරූ මවට සිද්ධිය පැවසුවද ඇය රැගෙන ඒමට ගිය රියදුරා ඒ වන

විට සිද්ධිය නිවසට පවසා තිබිණ. නෙත්න හා රසාංග ඒවනට විටද රෝහලට එමින් සිටින බව මව කිවාය.

"ඔයාට කරදරයක් නෑ නේද දූ?"

"නෑ අම්මි......... ඒත් මගේ යාළුවට හොඳටම තුවාල වෙලා"

"දෙයියන්ගෙ පිහිටෙන් එයාට කරදරයක් වෙන එකක් නෑ.........

දැන් නෙත්නලා ඒවි. බය නැතිව ඉන්න........."

මද වේලාවකින් නෙත්න හා රසාංග කාට කාට හෝ කථා කරන අතරේම රෝහල තුළට කලබලයෙන් දිව ආවෝය. නෙත්නගේ කකුල තාමත් නිට්ටාවට සුව නොවූවද ඔහු කොර ගසමින් එනු දුටු සඳරු සිටි තැනින් නැගිට්ටාය. එහෙත් සඳරුගේ ලෙයින් පෙඟී ගිය ඇඳුම දුටු නෙත්න සිහි මුලා වූවා බඳු විය. ඔහු අඩියට දෙකට ඇය වෙත පැමිණ ඇයගේ දෙවුරහිසින් අල්ලා ගත්තේය. සඳරු කෑ ගසා හඬමින් ඔහු වැළඳගත්තාය.

"ඔයාට මොකද උණේ......... කථා කරන්න......... ඔයාට කරදරයක් නෑ නේද........." නෙත්න ඇයගේ දෙවුරහිසින් සොලවමින් අසද්දී ඇය හිසවනා නැතැයි කිවාය. ඒ අතරේ රසාංග වහ වහා දිවයමින් ඉදිරියෙන් යන වෛද්‍යවරයා වෙත ගියේ ගිම්හාන ගැන දැනගැනීමටය.

"කාටද තුවාල උණේ.........?" නෙත්න අසද්දී,

"ගිම්හානට........." යි සඳරු හඬ හඬා පැවසුවාය. ඒ නම සමගම නෙත්නගේ අත සඳරුගේ උරහිසින් මෑත් වී පහලට වැටිණ. එහෙත් මෙ ඒ කිසිත් සිතන්නට වෙලාව නොවේ. මොනවා වුවද ඔහු තුවාල ලබා ඇත්තේ සඳරු ආරක්ෂා කරන්න ගොසිනි. නෙත්න ඉක්මනටම පියවී තත්ත්වයට ආවේය.

"අඬන්න එපා......... එයාට මොකුත් වෙන්නෙ නෑ........." නෙත්න එසේ පවසා ඇයගේ හිස අතගා ඇයව සෙමිනිට බලා ගන්නට පවසා රසාංග ගිය දෙසට ගියේය.

ගිම්හානගේ උරහිසට වැදුණ පිහිපාර ඉතා භයානක ලෙස ගැඹුරට කැපී තිබිණ. ශල්‍යකර්මයක් කිරීමෙන් අනතුරුව ඔහුව රෝහල් වාට්ටුවට ගෙන එන ලදී. ඒවන විටද ඔහුට සිහි නැති වූයෙන් ඔහු සිහි ලබන තුරු එහි සිටි නෙත්න ඇතුළු පිරිස ගිම්හානගේ මිතුරෙකු එහි නවත්වා ඔහුගේ නිවසට සිදුවීම පිළිබඳව දැන්විය. සෙමිනි නිවසට හැරලවා ආපසු එන අතරේ පවා සඳරු සිටියේ නැතිගත් ස්වරූපයෙනි. රසාංග සඳරුගේ ස්වභාවය නෙත්නට ඉඟිකොට



දැක්වූයේ ඇයගේ තත්ත්වය ගැන කල්පනාවෙන් සිටිය යුතු බවටද ඉඟි කරමිනි.

නෙත්න සඳරු දෙස බලද්දී ඇය දෙනෙත පියාගෙන සිටියාය. නෙත්න හෙමිහිට ඇයගේ අත අල්ලා ගත්තද......... ඇය බොහෝ දුරක දුර ඈතක ගියාසේ, හැඟීමක් නැතිවාසේ සිටියාය. වෙන දිනක නම් තමා මෙ අත අල්ලා ගත්තා නම් ඇය දිගු දෙනෙත හරවා තමා දෙස බලනු ඇත. ගිම්හාන ගේ අනතුර ඇයව බොහෝ දුරක ගෙන ගොස් ඇති බව දැනෙද්දී නෙත්නගේ හදවත තමා ගැන උපන් දුකින් වේදනාවකින් පෑරී ගියේය.

සඳරු දුටු නිවසේ සියල්ලෝම පුදුමයටත් බියටත් පත්විය. ප්‍රේමා වහ වහාම ඇය කැටුව කාමරයට ගොස් ඇයගේ ඇඳුම් මාරු කර ඇඟ සෝදා ගැනීමට සැලැස්විය. ඒ අතරේ සාලයේ සිටි පවුලේ අය කථා බහ කරමින් සිට රොෂාන්ට මේ බව දැන්විය යුතු වග තීරණය කළෝය. රසාංග ඒ මොහොතේම ඉන්දියාවේ සිටින රොෂාන් වෙත කථා කොට සැන්දෑවේ සිදුව ඇතිදේ පැවසුවේය.

රොෂාන් එන්නට කැමැත්ත පලකළත් එය අවැසි නැති බව පැවසූ රසාංග ඇය ගැන මීට වඩා අවධානයකින් සිටින්නේයැයි රොෂාන්ට සපත විය. සාලයෙන් නැගී සිටි නෙත්න හෙමිහිට පඩිපෙළ නැග සඳරු සොයා කාමරයට යද්දී ඇය පියුමිගේ උකුලේ පෙරළී මහ හඬින් හඬමින් සිටියාය.

"මට දුක ගිම්හාන ගැන......... මම නිසා අද ඒ අහිංසකයා පිහි ඇණුම් කාලා" ඇය ඉකිගසමින් කියද්දී නෙත්න ඒ අසන අතරේ උළුවස්ස ළඟ නතර විය. යන්නට ගිය ගමන නතර කොට ආපසු හැරෙද්දී පියුමි ඔහු යනු දුටුවෙන්.

"නෙත්න......... එන්න ඇයි එන්න ඇවිත් යන්නේ........." යි ඇසුවාය. සඳරුද ඉක්මනින් නැගිට දෙනෙත පිසදමා ගත්තාය.

"ඔයාලට ඩිස්ටර්බ් වෙනවනේ......... ඒකයි යන්න හැදුවේ"

"මොකක්ද ඔක......... අපි කථා කළේ වෙච්ච දේ ගැන........."

ඔවුන් මෙසේ කාමරය තුළ කථා වෙද්දී මව හා පියාද එහි ආවෙන් පියුමි නැගිට ඔවුනට හිඳගන්නට සැලැස්විය. මේ අතරේ වික්‍රමසේකර මහතා නැගිට ගොස් සඳරුගේ හිස මත අත තැබීය.

"දූ.........සඳී, අපි හිතුවට වඩා මෙ ප්‍රශ්නෙ බරපතළයි වගේ......... මම හිතන්නේ ඔයා නඩුවට සාක්ෂි නොදුන්නොත් හොඳයි වගේ........."

"එහෙම කොහොමද තාත්ති......... ඒක නිකං හොරකම අනුමත කරනවා වගේනේ" නෙත්න කේන්තියෙන් පැවසීය.

"ඔයා කිවට බෑ සුදු පුතා......... සේරටම වැඩිය මෙ ළමයගෙ ජීවිතේ ආරක්ෂාව බලන්න ඕන. අද ඉතිං සඳරුව උන්ට අහු උණානම් ......... මොනවා නොවේවිද, හොඳ වෙලාවට අර පිරිමි ළමයා මෙයාලා එක්ක හිටියේ" මව කියද්දී නෙත්නගේ ඇඟ හිරි වැටී ගියේ ඇමරිකයන්ට සඳරූ පැහැර ගන්නට ලැබුණා නම් ඇයට යන කල දවස ගැනය. එසේ බලන කල සඳරූ තාමත් පිවිතුරු යුවතියක් ලෙස ඉන්නේ ගිම්හානට ස්තූති වෙන්නටය. තමා ආදරය කරන යුවතියගේ පිවිතුරු බව ආරක්ෂා කරන්නට නොදැන හෝ ඉදිරිපත් වූ ගිම්හාන ගැන පළමු වතාවට යම්කිසි මිතුරු හැඟීමක් නෙත්නගේ සිතේ පහළ විය.

.........එයාගෙ ආදරේ, කැමැත්ත එතනට නම්......... මම කේන්ති ගත්තා කියලා ඇති වැඩේ මොකක්ද......... එයා කැමති දෙයක් උණාවේ......... ඒත් මට පුළුවන්ද හිත හදාගන්න.........

මව හා පියා ඇයට කථා කොට ගිය පසු නෙත්නට ඉඟිකල පියුමිද ඇයගේ කාමරයට ගියාය. තාමත් සඳරූ සිටියේ කඳුළු සලමිනි. ඇය නොහැඬුවද ඒ දෙනෙතින් බොහෝම හෙමිහිට ගලා යන කඳුළු කැට නෙත්නට පෙනිණ. ඔහු ඇය අසල වාඩි වී ඒ කඳුළු කැට පිස දැමීය. සඳරූ ඔහු දෙස බැළුවාය.

"ගිම්හාන ගැන නේද දුක්වෙන්නේ........." ඔහු අසද්දී සඳරූ සීතල වී ගියාය. ඒ කටහඬේ වූ සඟවා ගත් බිඳුන බව ඇයට වැටහිණ. එහෙත් ඇත්තම කිවොත් තමා හඬන්නේ ගිම්හානට වූ දේ ගැන නොවේද?

"එයා පිහිපාර කෑවේ මම නිසා" ඇය හෙමිහිට කොඳුළාය.

"ඒක තමයි........" ඔහු කියද්දී ඒ කටහඬේ වූ වේදනාබර ස්වරූපය සඳරූ බියපත් කළාය.

දෙවියනේ......... මෙයා මොනා හිතවනවද මන්දා.........අපි දෙන්නා යාළුයි කියලා හිතනවා ඇති. ඇයි එයා කැමති නැතේ මම ගිම්හාන එක්ක හිතවත්ව ඉන්නවට......... එසේ සිතමින් ඇය ඔහු දෙස බලද්දී ඔහු නැගිටිමින් සිටියේය. සඳරූ එක්වරම ඔහුගේ අත අල්ලා ගත්තාය.

"කොහේද යන්නේ.........ඔහොම ඉන්න"

"මට මහන්සියි වගේ......... අතත් කැක්කුමයි. කකුලෙ තුවාලෙත් රිදෙනවා. මම යන්නම්"





"යමු මම එන්නම් කාමරේට"

"එපා ඔයා ටයඩ් වෙලා ඉන්නේ......... නිදාගන්න......... අමාරුව ඇරේවි නින්ද ගියාම"

"හිතේද......... අතේද........." සඳරූ ඇසුවේ ඔහු දෙස එක එල්ලේ බලමිනි. නෙත්න ඇයගේ දෙනෙත මග හැරියේය. සිනාසුණු ඔහු,

"ඒ මොකද හිත කැක්කුම......... ටික දවසකට කලින් එක්සිඩන්ට් උණේ අත් කකුල් නේ........."

"ඒකත් ඇත්ත......... හිත එක්සිඩන්ට් උණේ ගොඩාක් ඉස්සර කොළඹදි නේ......... නේද........." නෙත්න දෙස හැරී බලමින් ඇය යමින් ගමනේ විමසද්දී නෙත්න සිනාසුණේය. කාමරයට ගිය සඳරූ නෙත්නගේ අත ගෙන තෙල් ගල්වා පිරිමැද්දේය. හදවත රිදී උතුරා එන දුක කඳුළු වී ගලා යද්දී නෙත්න නිහඬවම ඇඳෙහි ඇලවී කල්පනා කරමින් සිටියේය. නෙත්නගේ නිහඬ බව දරාගනු නොහී ඔහු දෙස බැලූ සඳරූට ඒ දෙනෙතේ තෙත් බව හැඳිනිය හැකි විය.

"ඇයි මේ......... තරහ වෙලා........." ඇය අසද්දී නැතැයි කියන්නාව මෙන් නෙත්න හිස වැනුවේය.

"දැන් ඇති......... ඔයා නිදාගන්න........."

තමාට නොකියන යමක් හදවතේ සිරකොටගෙන නෙත්න වද විඳින බව සඳරූට වැටහිණ......... මවගේ අසනීප තත්ත්වය නිසා නැගණිය කෝල් කළද සඳරූ බලා සිටියේ විශ්වවිද්‍යාල නිවාඩුව එළඹෙන තුරුය. දැන් නිවසට දුරකථන පහසුකම් ඇති නිසා නිතර කථා කළද අනිද්දා නිවාඩු ලැබුණ විට නිවසට ගොස් ඒමට ඇය සිතා ගත්තාය. ඒ බව මවටද පැවසූ ඇය පසුගිය දින ටිකේම ගිම්හාන බැලීමට රෝහලට ගියාය. නිවසේ ආහාර සකසා ගන්නා ඇය එයද රැගෙන රෝහලට ගොස් ඔහුගේ සුවදුක් බලා දේශන සඳහා ගියාය. යළි නිවසට එන ඇය ගිම්හාන වෙනුවෙන්ද සටහන් ලියා තැබුවාය. සතියක් පමණ යද්දී ගිම්හාන සුව ලැබුවෙන් සිතේ බරක් නැතිව ගමේ යාමට වාතාවරණය සැකසී තිබිණ.

තමා ගමේ යන බව නෙත්නට පැවසූ වෙලේ ඔහු ඒ ගැන කිසිවක්ම නොපැවසී සඳරූගේ නොමඳ පුදුමයට හේතුවිය. එහෙත් ඒ ගැන වැඩිදුර නොවිමසන්නට ගිය ඇය තනිවම කල්පනා කරන්නට වූවාය.

......... හරි පුදුමයි......... මම ගමේ යනවා කියලා වෙනදා කියද්දී රංඩු.........අද.........? එක අතකට මම ගියා......... හිටියා කියලා එයාට

මොකක්ද ඇති ලාබෙ වත් පාඩුව වත්........ අනෙක ඇත් ඉතිං ඔෆිසුත් යන එකේ........ ඔළුවටත් උඩින් වැඩ ගොඩ ගැහිලනේ ඇත්තේ........ ඒවා මිස පාලුවෙ ඉන්නවා කියලා එකක් නැතේ........ පියුමිත් ඉන්න එක හොඳයි උදව්වට හරි........ කොහොමත් මට හිතේ බරක් නැතුව ගිහින් ටික දවසක් ඉඳලා එන්න පුළුවන්........

ගිම්හාන සතිප උණු එකත් කොච්චර දෙයක්ද........ එයාට ඉතිං නෝට්ස් ලියන්නත් දෙයක් නෑ. නිවාඩු දවස්වල පාඩම් කරනවා ඇමරන්න........ පව් දෙයියනේ අහිංසකයා........ මේ දවස් දෙකෙත් නෝට් ටික ලියලා හෙට හවස ගිහින් දෙන්න ඕන........ ඇදේ ඉඳන් පාඩම් කරන්න හැකිනේ........ සඳරු මෙසේ සියල්ල නිසි පරිදි සැලසුම් කළාය.

සඳරු ගමේ යාම නෙත්නට ඉවසුම් නොදෙන්නක් විය. එහෙත් ඇය අමතක කිරීමට ඇය නොදැක සිටිද්දී ලෙහෙසි වනු ඇත........ ඇයගේ බැලීමක් පවා තම හදවත නිවා සනසන මල් වැස්සක් සේ නම් ඇය නැති මේ බිම නිරුදක කතරක් සේ වනු ඇත........ එහෙත් මේ ඇත්ත තමා පිළිගත යුතුය. ගිම්හානට ආදරය කරන ඇය තමාගේ වන්නේ කෙසේද........

කාර්යාලයට ආවද වැඩක් කළ හැකි නිරවුල් මානසිකත්වයක් නෙත්නට නොවීය........ ඔහු වැඩ කටයුතු කළයුතු ආකාරය ප්‍රියලාල්ට පැවරුවේය.

"සර්........ සර් ආපහු ආවට සර්ගෙ මූඩ් එක හරි නෑ........ මොකද යාළු කෙල්ල වලිද?"

"පණ්ඩිතයා නොවී වැඩ ටික කරනවා........" හිනවත් සේවකයාගේ හිසට තට්ටුවක් ඇමූ නෙත්න යන්නට හැරුණේය.

"සර්........ අඳුරන කෙනෙක් එනවා........" ප්‍රියලාල් කීවේ ගේට්ටුව දෙස බලමිනි.

"සඳරු........" නෙත්නගේ මුහුණේ ඇඳී ගියේ සතුටකි........ තමා මෙතෙක් වේලා සිතමින් සිටියේද ඇය ගැනම නොවේද........ ප්‍රියලාල් තම ප්‍රධානියාගේ මුහුණ නිරීක්ෂණ කළේය. මීට පෙරද කිප වතාවකම ම දෙදෙන මෙහි පැමිණ ඇත. ඒ ආ හැම විටකම නෙත්නගේ හුණ සඳක් සේ බැබළෙනු ඔහු දකියි........ ඒකට හේතුව කුමක්ද........

"ඇයි මේ එළියට වෙලා"

"මම ගමනක් යන්න කියලා"



"එහෙනම් ඔයා යන්න........ මම මේ එකවුන්ට්ස් වගයක් බලාගෙන යන්න ආවේ........ මම ඒ ටික බලාගෙන යන්නම්........"

"නෑ කමක් නෑ........ හදිසි වැඩක් නෙවි........ මම ඉන්නම්........" නෙත්න කියද්දී ප්‍රියලාල් නැගුණ සිනාව වළකාගෙන ඉවත ගියේය.

"උදේට කෑවද?"

"තාම නෑ"

"ඇයි ඒ........?"

"බඩගිනි නෑ........"

"හරි හොඳයි බෙහෙත් බොන ගමන් බඩගින්නේ තමයි ඉන්න ඕන........ යමු ඇතුළට. මගේ ටිෆින් එකේ කිරිබත් තියනවා........ දෙන්නම කමු........"

"මට එපා........ ඔයා කන්න........ මම ඉන්නම් ඔයාගෙ වැඩේ ඉවර වෙනකල්"

"මොකද මේ........ මා එක්ක තරහෙන් වගේ........ අද උදේ මොකාවද දැක්කේ?"

"මොකෙක්වත් දැක්කෙ නෑ........"

"ඒක තමයි වරද........ මොකෙක් හරි දැක්කානම් තමයි හොඳ" සඳරු කීවේ සිනාව සඟවාගෙනය. එහෙත් නෙත්න සිටියේ බුම්මාගත් ගමන්මය.

........දකිනවානම් මට දකින්න ඕන තමුසෙ තමයි........ ඔහු සිතින් පැවසීය.

සඳරු හිස ඔසවා බලා, "ඔයා මොනවා හරි කිව්ද........?" ඇසුවාය.

"නෑ........"

"මට ඒ වගේ ඇහුණා........ එන්න කන්න........ආ........" කිරිබත් කෑබලි දෙකක් හා සීනි සම්බෝල ටිකක් disposible පිගානකට ඇමූ සඳරු ඔහු අසල හිඳ ගත්තාය.

"මම කිව්වනේ මට කන්න බෑ කියලා........ මට එපා........ මට ඔළුව රිදෙනවා" නෙත්න කුමකට හෝ තරහෙන් වග දැනුණ සඳරුට දුක දැනිණ. තමා මෙතරම් පෙරැත්ත කොටද එය එපා කියනවා නම්, ඔහු නොකා තමාටද කෑ නොහැක........ ඇය නෙත්නගේ කොටස ඒගෙන කුණු කූඩයට දමා ඇයගේද කෑම පෙට්ටියේ වූ කොටස ඒගෙන ගොස් එහි ඇමුවාය. නෙත්න මේ සියල්ල බලා උන්නේ සංවේගයෙනි. තමා මේ යුවතියට රිද්දන්නේ ඇයි. එහෙත් ........ ඇය තමාගේය........ තමාගේ වන ඇය අද වෙනකෙනෙකුගේ

බිරිඳය......... ඒ මදිවාට ඇය වෙනත් තරුණයෙකුට පෙම් කරයි......... මේ සියල්ල තමා බලාගෙන ඉන්නේ කෙලෙසකද......... ඔහුට එතැන ඉන්නට සිතක් නොවීය.

"මම යනවා"

"කොහේද යන්නේ.........?"

"කොහේ හරි......... ස්ටියරින් එක කැපෙන අහක" කියූ ඔහු යතුර රැගෙන නැගිට්ටේය. යන්නට එපායයි කියූවද ඔහු දැන් යන බව සඳරු දැන සිටියෙන් ඇය නිහඬ වූවාය.

.........නිකමට කිව්වේ නෑ ඉන්න කියලා......... නෙත්නට සිතිණ. ඔහු යන්නට ගියේය. මොහොතක් මේ සියල්ල බලමින් කල්පනා කළ සඳරු ගිණුම් පොත ගෙන එහි වූ ගිණුම් කීපයක් පිටපත් කරගන්නට විය.

උදේ පාන්දරම පිටත් වූ බැවින් දහවල් වීමටපෙර නිවසට ඒමට සැදරුට හැකිවිය. අක්කා එන බව දන්වා තිබුණෙන් කස්තූරි උදැසන සිටම බලා සිටියාය. නෙත්නද ඇය හා එනු ඇතැයි කස්තූරි සිතුවද අක්කා පමණක් දුටු ඇයට දැනුණේ දුකකි.

"අක්කා කෝ නෙත්නයියා?"

"නෙත්නයියා......... ඇයි එයා එන්නේ......... මාසයකටත් වඩා ගෙදර හිටි නිසා ඔළුවටත් ඉහළට වැඩ ගිරවෙලා එයා ඉන්නෙත් අනෙක"

"ඒ උණාට දවසකට හරි අයියව එක්ක එන්න ඔයාට තිබුණානේ"

"ළමයෝ ඒ මගේ හස්බන්ඩ් ද මට ඕනෙ ඕනෙ වෙලාවට ඇදන් එහෙ මෙහෙ යන්න......... අනෙක මෙයාට දැන් මම ආවා මදි වෙලා වගේ නෙත්නයියා නැතිව......... ඉන්නකෝ හෙටම යනවා මම ආපසු" සඳරු කීවේ නැගණියට තරවටු කරන හඬිනි.

"Sometime........" කස්තූරි ඉඟි කළාය. "යන්න වේවි සමහර විට......... ඉඳලා බලන්නකෝ" ඇය සිනාවක් පවා නැතිව කියමින් අක්කාගේ බෑගය ගෙන ගොස් ගෙතුළට දැම්මාය.

"කෝ නංගි අම්මා......... අම්මට දැන් අඩුද?"

"අම්මට හොර ලෙඩ අක්කා......... ඔයා බලන්නෙ නැතුව......... ඔන්න දැන් පොඩි මාමලගෙ ගෙදරට ගියා පිට්ටුවෙ සල්ලි දීලා එන්න......... මට ගෙයින් හෙල්ලෙන්න එපා කියලා ගියේ ලොකු දූ ඒවි කියලා" නැගණිය ඉගි කරමින් කියද්දි සඳරුට සිනා නැගිණ.

"බඩගිනියි. මොනවද උදේට හැදුවේ.........?"





"පිට්ටු හැදුවා......... හවසට හැලප හදමු කියලා අම්මා කිව්වේ" නැගණිය කියද්දි සඳරුගේ හදවත හෝස් ගා පත්තු වී ගියා බඳු විය.

.........හැලප පෙරේතයා නුවර තියලනේ මම ආවේ......... හැලප එපා කියලා අම්මට කියන්න ඕන.........

"මොකද කල්පනාව?"

"මොකුත් නෑ........."

"හැලප කිව්වම වෙන කවුරු හරි මතක් උණා නේද.........?"

"මොනවද මේ කියන්නේ......... කෝ පිට්ටු......... ඉක්මනට ගන්න......... මට බඩගිනියි"

"මොකද මෙච්චර කෑදරකම......... තමුසෙගෙ නැන්දම්මා කන්න දෙන්නැද්ද?"

"නැන්දම්මලා අවුලක් නෑ......... නැන්දම්මගෙ පුතා තමයි අවුල"

"නැන්දම්මගේ කොයි පුතාද?"

"කොයි පුතාද......... රොෂාන් ඇරෙන්න වෙන කවුද?" එසේ කියූ සඳරු පිට්ටුවලට පොල් කිරි ටිකක් වත් කොටගෙන කුඩා භාග පුටුව ගෙන කුස්සියේ මිදුලට ආවාය.

"ගිම්හානයියට කොහොමද අක්කේ.........?"

"දෙයියන්ගෙ පිහිටෙන් දැන් හොඳයි......... අයියෝ එදා මාව පිස්සු වැටුණා එයා ලේ පෙරන් වැටුණ හැටි දැකලා......... අපරාදෙ මම නිසා ගිම්හානගෙ ජීවිතේට එදා මොනා හරි උණානම්......... ඒ අම්මලා තාත්තලා මට සාප කරාවී........."

"ඒත් ඉතිං......... අක්කා මොනා කරන්නද?"

"එහෙම කියන්න එපා නංගී......... ගිම්හාන තරම් හොඳ කොල්ලො මේ ලෝකෙ හරි අඩුයි......... රොෂාන්ලා වගේ මිනිස්සු දැකපු මට ගිම්හාන දකිද්දී හිතෙනවා මෙහෙම පිරිමිත් ඉන්නවා කියලා........."

"ඇයි අක්කට නෙත්නයියා දකිද්දී එහෙම හිතෙන්නැද්ද?"

"එයා ගැන හිතන්න දෙයක් නෑ......... එයාව මම දන්නවා නංගී........." සඳරු කීවේ කල්පනාකාරීවය.

"ඇත්තටම එහෙ වෙච්ච දේවල් අහද්දී අපේ ඇඟ හිරි වැටිලා ගියේ......... ඇත්තටම තාත්තා අමාරුවෙන් එකතු කරගත්ත සල්ලි වලින් හරි ගෙදරට ටෙලිෆෝන් ගත්ත එක හොඳයි කියලා මට වැඩිපුරම හිතුණේ අක්කට ඔය කරදරේ උණු දවසේ"

"මට එදා මොනවද නොවෙන්න තිබුණේ ගිම්හාන නොහිටියානම් .........?"

"අම්මෝ හිතන කොටත් බය හිතෙනවා......... අම්මා ඔහොමවත් ලෙඩ නොවී හිටියේ ඔයාගෙ මොබයිල් එකට නිතර කෝල් කරපු නිසා......... ඒක අතකට නෙත්නයියා ඔයාට මොබයිල් එක දීලා තිබ්බ එකත් ලොකු දෙයක්. නැතිනම් මෙච්චර දුර අපි කොහොමද හිතුණ වෙලාවට හිතුණ දෙයක් ඔයාට කියන්නේ........."

"ඒ උණාට ඒ ප්‍රශ්නෙ තාම ඉවර නෑ නංගි. ඔන්න ඔයා ඕවා ගෙදර කියනවා නෙවී........."

"හරි......... හරි......... ඔන හොර කථාවක් කියනවා......... මම ඒක ඩිපොසිට් ආත්නම්"

"මේ වෙන හොර කථා මට නෑ......... හරිද.........?"

"ඇත්තටම......... ඕ. කේ......... ඕ. කේ මැඩම්........."

කාලෙකට පසු හමු වූ සොයුරියන් දෙදෙන මෙසේ කථා කරමින් උයන්නට සූදානම් වෙද්දී මවද එහි පැමිණියාය.



# 20

සඳරු ගමට ගියේ සතියක් පමණ නවතින්නට බව දැන සිටි නෙත්න ඇය යන්නට පෙරම මනා සැලසුමක් තම සිතේ ඇඳ ගත්තේය. ඇය ගම් යන දිනට පෙර දින සිටම අතේ කැක්කුම උත්සන්න බව පැවසූ නෙත්න එදින සවස් වරුවේද ඇඳට වී නිදාගත්තේය. සවස සොයුරියගේ කාමරයට ඔහු ගියේ අත පුරා වෙළුමක් ද දමා ගනිමිනි.

"මොකද සුදු මල්ලි මේ.........?"

"ඉන්න බෑ අක්කි......... අත කැක්කුමයි හරියට"

"මේක නම් හරියන්නෙ නෑ......... කොහෙද ෆිසියොතෙරපිස්ට කෙනෙකුට පෙන්නන්න කිවට අහන්නෙත් නෑ"

"ඔයාට විකාර මාස ගණන් අනිවාර්ය ටයිම ටේබල් එකකට ඔවගෙ බඩගාන්න මට පුළුවන්ද?"

"ඉතිං ඔයා දැන් ඔය අත මොනා කරනහද හිතා ඉන්නේ......... බලන්න ඉතිං......... හෙට අනිද්දා වෙන කොට ඔයාට ඉන්න පුළුවන් වේද........." එසේ කියමින් සොයුරිය නෙත්නගේ අත හෙමිහිට ඇල්ලුවාය.

"ඌ.........ඌ.........ය් අක්කි......... අල්ලන්න එපා......... අල්ලනකොට රිදෙනවා"

"මෙච්චර අමාරුවක් තියාගෙන ඉතිං ඩ්‍රයිව් කරනවනේ"

"ඩ්‍රයිව් කරනකොට අත උඩට හැරිලනේ තියෙන්නේ......... අනේ මන්දා එතකොට රිදෙන්නේ නෑ......... මෙහෙම කෙළින් තියනකොට තමා කැක්කුම එන්නේ" කියන අමාරුව ඔහු අක්කාට රඟපා පෙන්වූයේය. මන්ද මතු බලාපොරොත්තු ඇති බැවිනි.

"ඔ.........ඔය.........ඔය ඌ.........යි"

"අයියෝ මට පේන්නෙ මේක තව ඉස්සරහට හරි අමාරු වෙවී වගේ......... අම්මී......... අම්මී........." රිද්මි මවට කථා කලෙන් මව සාලයේ සිට එහි ආවාය.

"මොකද ලොකු........?"

"අම්මී........ සුදු මල්ලිගෙ අතට නම් මෙහෙම සෙල්ලම් කරලා හරියන්නෙ නෑ........ බලන්න අත ඔතා ගෙන තනියෙන්ම........"

"ඇයි පුතා........ අත කැක්කුම්ද?"

"ඔව් අම්මී........"

"මොකක්ද අම්මි මේකට කරන්නේ........?"

"මේ ළමයා කියන එක අහනවා යැ........ අර සැඳී මේ ළඟදිත් කීවා එහේ ගමේ හොඳ වෙද මහත්තයෙක් ඉන්නවා........ කැඩුම් බිඳුම්වලට කියලා........"

"ඉතිං........?"

"ඉතිං මෙයාට යන්න කීවාම අහනවද........ තෙල් ගඳයිලුනේ........ නියතිලා මෙයාලා ඉතිං ඇමරිකන් කාරයො වෙලානේ"

"මේ සුදු මල්ලි නියපොත්තෙන් කඩන දේ පොරොවෙන් කපන්නද ඔයාට ඕන. ඔයාට එක්සයිසස් වලටත් යන්න බැරි නම් මේක වැඩිවෙන්න ඉස්සර සිංහල වෙදකම වත් ගන්න........"

"මට පේන්නේ කොහේ හරි ස්නායු තද වීමක් වෙලා ඇති........ අත කෙළින් තියන කොට කැක්කුම එන්නේ ඒකයි" මව කීවේ නෙත්නගේ අත හෙමිහිට අතගාමිනි. නෙත්න මවගේ සිරසට හිස හේත්තු කොට ගෙන සිටියේය.

"ඔය වෙද්දු ළඟට ගියාම පත්තු බඳින්න කියයි. මට බෑ ඔව බඳින්න........"

"පත්තු බඳින්නෙ කැඩුණ ගමන් ළමයා. දැන් ගියාම හොඳ තෙල් මොනවා හරි දේවි........ ගාලා අතගාන්න තදවෙලා තියේනම් ලිහිල් වෙන්න........ අම්මි මෙයාගෙ විකාර අහන්නෙ නැතුව හෙට සඳරූ එක්ක මෙයාවත් යවන්න"

"නෑ........ නෑ එපා එපා........ මට හෙට වැඩ කෝටියයි. මීටින් දෙකකට යන්න තියනවා. චෙක්ස් වගයක් බැන්ක් කරන්න තියනවා. එයාට කියන්න ඕන නෑ........ මට පුළුවන් උණොත් වැඩ අඩු උණොත් අනිද්දා විතර යන්නම්........"

"ඔකනේ........ මෙයාට තමන්ගෙ අතට වැඩිය ලොකුයි බිස්නස් ........ අම්මා තමා මේ මැට්ටව නරක් කරන්නේ........ දෙකක් දීලා වෙදෙක් ළඟට අරන් නොයා"

"ආපෝ........ මම යනවා........ ඔබා බලලා යන්න මම ආවෙ. තමුසෙත් එක්ක රණ්ඩු වෙන්න නෙවි" එසේ කියූ නෙත්න අනෙක්



අතින් සොයුරියගේ කොණ්ඩය ඇද පිටව යද්දී මව හා සොයුරිය ඔහු දෙස බලා සිටියේ ආදරයෙනි.

ඊට පසු දින සඳරූ යද්දී ද නෙත්න ඇය දකින්නට හෝ එළියට නොආවේය. තම කාර්යාලයට ගිය ඔහු දින කීපයක් ඉදිරියට තිබූ වැඩ ප්‍රියලාල් හා එකතුව පිළිවෙළක් කළේය. අදාළ චෙක්පත් මුදල් සමග බැංකුවට යැවූ ඔහු ලැබිය යුතු බඩු තොග අදාළ දිනට ගෙන්වන්නටත් තේ හා රබර් පැටවීමේ කටයුතු නිසි පරිදි කිරීමටත් ප්‍රියලාල්ට අවශ්‍ය උපදෙස් දුන්නේය.

"මොකද මේ ඉස්සරහ දවස්වල වැඩ ඉවර කළේ........?"

"මට යන්න තියනවා විමුක්තිය හොයාගෙන........"

"ඉතිං සර් දවස් හතර ඇති වේවිද........?" ප්‍රියලාල් ඇසුවේ ඔහු දෙස බලමිනි.

"ට්‍රයි කරලා බලන්න ඕන ප්‍රියලාල්........ මදි උණොත් මම ඔයාට කෝල් කරන්නම්........"

"සර් හම්බ උණොත් මට කෝල් කරලා කියන්න........"

"මට ෂුවර් නෑ........ ඒත් ඉතිං උට්ඨාන වීරිය........ අපේ කාලේ භාෂාවෙන් ට්‍රයි කරන්න එපැයි........"

"මම හිතන්නේ සර් යන්නෙ ටිකක් දුර වගේ........"

"නෑ........එච්චර නෑ........ වැඩිම කිලෝමීටර් එකසිය පණහක් ඇති........" ඔහු කීවේ අනුමානයෙනි.

"විමුක්තිය ඔච්චර ළඟ තිබුණා නම් ඇයි සර් කලින්ම හොයා නොගත්තේ........"

"ප්‍රියලාල් මොනවද මේ කියන්නේ........ ඒක තිබුණේ ඔන්න මෙන්න දුර........ ඒත් එතකොට හරි අමාරුයි. බලමු ටිකක් දුරින් තියන කොට........" එසේ කියූ ඔහු තව මිතුරෙකු තරමට සමීප තම සේවකයා පුටුවේ එහාට තල්ලු කොට දමා නැගී සිටියේය.

"හ්ම්........ දැන් සේරම හරිනේ........මම යනවා"

"සර්........ Best of luck" ප්‍රියලාල් කීවේ ඉඟිකරමිනි. නෙත්නට නැඟුණේ ලොකු හිනාවකි. ඔහුද එය පිළිගත්තා සේ ඉඟිකොට කාර්යාලයෙන් පිටවිය. සාක්කුවෙන් තම ජංගම දුරකතනය ගත් නෙත්න එහි වූ අංකයක් එබුවේය.

දහවල් කෑම සකස් කොට නිමාකළ සඳරූ මව සමග වත්ත පහළ කොරටුවට ගියේ ඒ සමගම දිය නා ගැනුමටත් සමගිනි.

සෙල්ලමට ගිය කසුන් තාමත් ගෙදරට ආවේ නැති බැවින් ඔහුට කථා කරන්නට සිතූ කස්තුරි මිදුලට යාමට සූදානම් වෙද්දී නිවසේ දුරකතනය නාදවනු ඇසී කස්තුරි ආපසු ගොස් රිසීවරය අතට ගත්තාය.

"හලෝ........"

"ඕ........තැන්ක් ගෝඩ්........ චූටි මම නෙත්නයියා"

"ආ........නේ නෙත්........නයියා........" කස්තුරි සතුටින් කෑ ගැසුවාය.

"කෑ ගහන්න එපා යෝදියේ........ ඔයාගෙ වට්ටක්කාට ඇහෙයි"

"මේ වෙලේ ගෙදර රන් කරන්නේ මම........ වට්ටක්කෙ කොරටුවේ........ ඉතිං ඉතිං"

"හොඳ වෙලාවට ඔයා ෆෝන් එක ගත්තේ........ මම හිතුවේ මේජර් නෝනා උස්සයි කියලා........ එයාගත්තා නම් තියන්න තිබ්බේ"

"අයියෝ........ කථා කරන්න එපා........ මොකද ආවේ නැත්තේ........ මම අක්කටත් බැන්නා ඔයා එක්ක නාවට"

"ඔයාගෙ අක්කා මට කථා කරන්නේ නෑ කියලා දන්නවනේ........ මේ ඒක නෙවි........ මම දැන් මෙහෙන් පිටත් වෙනවා........ හවසට ඔහේ........ මොකද අපේ ගෙදරින් සෑහෙන වදේ........ මගේ අතට තෙල් බඳින්න කියලා"

"එහෙනම් ඔයාට සෑහෙන්න රගපාන්න වෙන්න ඇති........" කස්තුරි සිනාසෙමින් කියද්දී නෙත්නට ද සිනානැගිණ.

"බලාගෙන යනකොට චූටි ඔයාගෙ අක්කට වැඩිය ඔය මොළේ වැඩ කරනවා වගේ"

"නෑ නෑ නෙත්නයියා........ හේතුව මෙකයි. අක්කා දන්නෙ නැති උණාට මම ඔයාගේ හොර වැඩ ගැන දන්නවනේ........"

"ඒකත් ඇත්ත. ඒක නෙවි........ මොනවද ගේන්න ඕන?"

"ම........ අයිස්ක්‍රීම්........ චොකලට්........ඔවා තමා. අපේ අක්ක ආවට ඔව ගේනවයැ. ඔයා ඉන්න දවස් ගාන තුනෙන් වැඩිකරලා ඒ ගාණට ගේන්න"

"අපි තුන්දෙනාට විතරද?"

"නෑ ඉතිං........ ඔයාගෙ එකෙන් භාගයක් අක්කටත් හම්බවෙව්නේ........"

"හරි........ එහෙනම් බායි........ මම එනවග කියන්න එපා" රිසීවරය තැබූ කස්තුරි කසුන් සොයා ගියේ නෙත්න එන පණිවුඩය ඔහුට කීමටය.



සඳරු මව හා ආගිය විස්තර කථා කරමින් එළවළු කඩද්දී මව ද අසල වූ කැන්ද ගසේ කොළ කඩනු දුටු ඇය කඩන්නට එපායැයි මවට කීවාය.

"ඕන නෑ අම්මේ........ වෙන දවසක හදන්න බැරියැ"

"අයියෝ මම හාලුත් දියට දැම්මා........ ලා පොල් ගෙඩියකුත් කඩලා ඇත්තේ" මව කියද්දී කසුන් සමග එහි ආ කස්තුරි,

"ආ........ මෙයාට එපා නම් තිකා ඉන්න කියන්න අම්මා........ අද හැලප හදන්නම ඕන........ මම ගාලා දෙන්නම් පොල්" යැයි කීවේ සොයුරිය දෙස බලමිනි. සඳරු නැගණියට රවා නැගිට ගියේ අත වූ බණ්ඩක්කා ටික බෑගයට දමන්නටය.

"මෙයාලට දවස ගානෙ කඩචෝරු හදල දෙන්න එපා අම්මා"

"අනේ අපේ අම්මා හදන කඩචෝරු........ ඔයා ආ නිසා තමා........ ඉතිං........" කස්තුරි කීවේ මව තරහ ගස්සන්නට මෙනි.

"අනේ අනේ........ පෙරේදත් ඉඳුල් කිරිබත් ඕන කීවම හදා දුන්නා........" මව කියද්දී සඳරුට සුසුමක් හෙළුණේ නෙත්න සිහිවීමෙනි. මේ කාන්සිය කිසිවිටෙක ඔහු නැති තැන හදවතට දැනෙන පාළුව........ එසේ දැනුණ එකම කාලය ඔහු ජපානයේ නුවරදි නොදැනෙයි........ එසේ දැනුණ එකම කාලය ඔහු ජපානයේ සිටි කාලය පමණි. එහෙත් මේ තමාගේ ගෙදර දෙමාපිය සොයුරු සෙයුරියන් අතරේත් මහ තනිකමක් මෙසේ දැනෙන්නේ මන්ද........ නෙත් නගන හැම අතම ඔහු හා බැඳුණු සිහිවටනය. කන කෑමක් ගැන වුව කියවෙන්නේ ඔහු කැමති දෙයක් ගැනය. මේ තරමටම ඔහු ගැන මතකය සිත පාරවන්නේ ඇයි........

"මෙ චූටි........ හැලප ඕන නෑ හලෝ........ පස්සේ කමු"

"නෑ අම්මා........ අපි හදමු හවස් වෙලා........ නේද කසුන්?"

"ඒකනේ........ කවුද දන්නේ කවුරු එයිද කියලා........ ඔයා ආවට ඔය අහල පහළ අය එන්න පුළුවන් බලන්න........ තේ එකක් වත් දෙන්න එපැයි"

"අප්පා........ කවදා ඉඳලද මහ පරිමාණෙන් තෑගබෑගිලි උණේ........ බලන්නකෝ අම්මා" සඳරු කීවේ තම සොයුරාගේ කථාවටය.

"හ්ම යමු........ යමු........ ලොකු දූ නානවනම් නාගෙන්න"

"බෑ අම්මා........ දැන් යමු........ හවස එනවා නාන්න........ මෙදී තියෙද්දි යමු........" සඳරු ආපසු නිවසට ගියේ නෙත්නව සිහි වීමෙන් හදවතේ ඇති වූ පාළු දුක්බර හැඟීම හේතුවෙනි. ගිය වතාවේ නම් තමා නිවසේ අය හා තරහෙන් ආ නිසා ඉන්නට හේතුවක් තිබුණද මේ වතාවේ නම් දින තුන හතරක් ඔහු නොදැක නිවසට වී සිටීම

කළ නොහැකි දෙයකැයි ඇයට සිතිණ. පාඩම් කිරීමට ගෙනා පොතක්ද රැගෙන කාමරයට ගිය ඇය ඇඳෙහි ඇලවුණාය.

කස්තූරි පැමිණ කාමරයට එබී බලද්දී අක්කා නිදි වග දැනගත් ඇය සද්ද බද්ද නැසෙන සේ දොර වසා ඇමුවාය. මව සොයා ගිය ඇය අතේ අමාරුවට රඹුවේ වෙද ගෙදර යාමට නෙත්නයියා එන බව මවට කිවෙන් මවට දැනුණේ සතුටකි.

"ආ......... ඒ දරුවා එනවද......... අප්පේ ඒ අත නාම හොඳ නැතුවද.........?"

"අම්මා අක්කා දන්නේ නෑ නෙත්නයියා එන බව......... අක්කා නිදි......... මම කාමරේ වැහුවා......... අපි සද්ද නැතිව හැලප හදන්න ගමු. හැලප නෙත්නයියගේ ෆේවරිට් නේ........."

"ආ......... අක්කා එපා කියද්දී මේ දෙන්න හදන්න කිවේ ඒකයි......... එහෙනම් තාත්තට කියන්න ඕන මස් මාළු ටිකක් වත් ගේන්න......... මොකද තෙල් බඳිනවා නම් දවස් තුන හතරක් ඉන්න වෙව්........."

නගරයෙන් නිවසට ඇවසි සියලුම දේවල් මිලට ගත් නෙත්න සවස පහ පමණ වන විට සඳරුගේ නිවසට පැමිණියේය. පියා වහ වහා පැමිණ ඔහු පිළිගෙන ගෙට කැඳවා ගෙන යද්දී,

"තාත්තා......... පොඩි බඩු වගයක් ඇති වාහනේ......... මගේ බෑගේප් එකයි......... චූටිට වත් කථා කළා නම්" එවෙලෙහි එහි ආ කසුන් නෙත්නගේ ගමන් බෑගය බිමට ගත්දී අනෙක් බඩු බාහිරාදිය සඳරුගේ පියා එළියට ගත්තේ නෙත්නට දොස් නගමිනි.

"ඇයි පුතා මෙහෙම එන එන දවසට මාසෙකට විතර කන්න අරන් එන්නේ......... පිට ගෙදරකටද එන්නේ........."

"මම කියලා වෙන කාට ගෙනියන්නද තාත්තා. ආසාවකට හරි මොනා හරි දෙයක් අරගෙන නෑ ගෙදරක එනවා කියලා ඇවිත් තියෙන්නෙ මෙහෙ විතරයි. මොකද අනිත් එක නෑ ගෙදරකට වත් මෙහෙම ගෙනියන්න දෙයක් නෑ......... නිකම් අත වන වනා ගිහින් පැයක් දෙකක් ඉඳලා එනවා මිස........." නෙත්න කිවේ ගැඹුරු ලෙසය. ඔහුගේ හදවත වැටහුණ රණසිංහ මහතා හිස වනා ඔහු කී දෙය වටහා ගත් බව ඇඟවීය.

"මගේ හිතේ ආසාවට මම කරන දේවල්......... තාත්තලා කරදරයක් කරගන්න එපා......... මම මේවා අරන් එන්නේ පිට ගෙදරක එනවා කියලා නෙවි. මගේම ගෙදරට එනවා කියලා හිතලා........." නෙත්න කියද්දී එය අසා සිටි සඳරුගේ මවගේ ඇසට කඳුළු නැඟිණ.





"විනිතා......... මේ දරුවා ගෙට එක්ක යන්න......... ඩ්‍රයිව් කරන් ඇවිත් අතත් අමාරු ඇති"

"යමු පුතේ.........ගෙට. ඇයි දරුවෝ ඩ්‍රයිවර් එක්ක නාවේ?"

"එහෙම ආවා නම් ඒ මනුස්සයා ආයෙ යන්න එපැයි අම්මා........."

"ඒකත් ඇත්ත......... පොඩි දූ......... අක්කා නාම නිදිද?"

"ඔව්......... ගමන් මහන්සියටද කොහෙද නිදි"

"එපා චූටි ඇහැරවන්න......... නිදියපුදෙන්........." එසේ කියූ නෙත්න ගෙට ගොස් සාලයේ අසුන් ගත්තේය. පියා නෙත්න හා කථාවට වැටෙද්දී කස්තූරි මව හා තේ පිළියෙළ කිරීමට ගියාය.

කවුරුන් හෝ අල්මාරිය අරිනු ඇසී සඳරු ඇස් ඇර බැලුවාය. තමා බොහෝ වෙලා නිදාගත් බව ඇයට සිහිවිය. කාමරයට කළුවර වැටී ඇත......... අල්මාරියෙන් නැඟුණ කිරි කිරි හඬ නිසා ඒදෙස බැලූ ඇයට කවුරුන් හෝ එතැන සිටිනු පෙනී දෙනෙත් පිස දමා බැලුවාය. තමාට දැන් හැම තැනම එකම රුවක් පෙනෙන්නට පටන් ගෙන ඇතැයි ඇයට සිතිණ......... මොහොතකට පෙර සිහිනයේද ඔහු සිටියේය. ඒ ගමන ඇහැරී බලද්දී කාමරයේ ඔහු සිටී. නාමත් තමා නිදි විය යුතුය.

"මගේ ෂෝට කෝ.........?" සිටි තැනැත්තා අසද්දී සඳරු තිගැස්සිණ. ඒ කට හඬ......... නෙත්න අසල වූ ස්විචය ඔන් කළෙන් කාමරයේ අඳුරු බව මැකිණ. මෙතෙක් සිහිනයේ සිටි ඔහු තුවායද කරේ දාගෙන එතැන සිට ගෙන සිටිනු දුටු සඳරු මෙය සිහිනයක්ද සිතාගත නොහැකිවා සේ මොහොතක් බලා උන්නාය.

"නෙත්නයියා......... රෑ වෙන්න කලින් නාගෙන එන්න........." කාමරයට එමින් කස්තූරි කිවේ සඳරු දෙස නොබලමිනි. එහෙත් ඒ වදන් සමගම සඳරු එක්වරම ඇඳෙන් නැගිට ගත්තාය.

"ඔයා......... මෙහෙ.........මෙවෙලේ.........?"

"ඇයි......... පුදුමයි වගේද.........?"

"ගණන් ගන්න එපා නෙත්නයියා......... අක්කා නාම නිදිමතේ......... අපි අන්න උණුවෙන් හැලප තියනවා......... ඕන නම් නෙත්න......... අපි නම් කෑවා බඩ පැලෙන්න නේද අයියේ"

"ඒකනේ......... අද චූටි නැත්තම් මට නව ටිකෙන් හැලපත් නෑ ......... සමහර කට්ටිය කියලනේ හදන්න එපා කියලා" නෙත්න කියද්දී සඳරු යටිතොල සපා ගත්තාය.

"අයියා ඔන්න එහෙනම් ඔයා එන්න රෙදිත් ඉල්ලගෙන......... මම

"අයියා ඔන්න එහෙනම ඔයා එන්න රෙදිත් ඉල්ලගෙන......... මම යනවා" කස්තුරි එළියට යද්දී ඇඳෙන් නැගිට ගත් සඳරු නෙත්න අසලට ගියේ තාමත් මේ පුදුමය අදහාගන්නට ඇයට නොහැකිවා මෙනි.

"ඔයා කෙහෙද මෙහෙ.........?" ඇය අසද්දී තාමත් ස්විචය මත වූ ඇඟිල්ලෙන් විදුලිය නිවා ඇමූ නෙත්න මදක් ඇය වෙතට නැවී,

"ඇයි මේ තරම ළඟ ඉන්න කොට වත් විශ්වාස නැද්ද?" යි ඇසුවේය.

"ඇයි මට කිවෙ වත් නැතේ"

"කිවා නම් මම එනවට අකමැති වෙනවනේ. ඒක නිසා මම ඔහේ තනියම ආවා......... ආවට පස්සෙ ඉතිං එලවන එකක් නැහෙ ......... " ඔහු කීවේ යළිත් විදුලි පහන දල්වමිනි.

"ඇයි මට පිස්සුනේ ඔයා එලවන්න........."

"නෑ ඉතිං මම කිවේ......... මම දන්නෙ නැහේ......... අමුත්තෙක් ඉන්න එක කරදරයක්ද නැද්ද කියලා"

"ආපෝ අමුත්තා......... අමුත්තා නෙවී......... මුත්තා......... දැන් ඉතිං අපේ ගෙදර අයට මාව නමා අමුත්තා......... සාදරයෙන් පිළිගනිමු බෝඩ් එක ඔල්රෙඩි නේ ඔයාට"

"ඒ ඉතිං එයාලනේ......... ඔයා කොහොමද.........?"

"මට......... මට ඇයි ඔයා කරදරයක් වෙන්නේ.........?"

"එහෙනම් කමක් නෑ......... මගේ ෂෝට දෙන්න......... අන්න අර බෑග් එකේ මගේ ඇඳුම් ඇති. ඒකත් අල්මාරියට දාන්න........." නෙත්න කියද්දී,

"මාසයක් වත් ඉන්නද ආවේ.........?" සඳරු ඇසුවේ බෑගය දෙස බලමිනි.

"අම්මයි අක්කියි දෙන්නම කිව්වා රඹෑවෙ ගිහින් අත හොඳ කරගෙන මිස ආයේ එයෙ නාවට කමක් නෑ කියලා......... අවශ්‍ය ඔනම දෙයක් නැතට කියලා කරවා ගන්න කිව්වා"

"ඇත්තට......... හොඳ උපදෙස් ටිකක් ලැබිලා තියනවා. ඔයාට ඔනම කරල තිබ්බච........." එසේ කියූ ඇය කලිසම ගෙන ඔහු අතට දුන්නාය.

සඳරු නෙත්න හා ළිඳට ගියේ ලා අඳුර මැදිනි......... ළිං පඩිය මත වාඩි වූ නෙත්න වතුර අදින සඳරු දෙස බලා උන්නේය. අනතුරුව හෙම්හිට ඇවිදගෙන ඇය අසලට ගියේය.



"ඇත්ත කියන්න......... නිකමට වත් හිතුවෙ නැද්ද මම එවි කියලා" නෙත්න කියද්දී සඳරුගේ බැල්ම බිමට නැවිණ.

"ඇයි මම හිතන්නෙ"

"හ්ම්......... ඒ උණාට ඇස් කියන්නෙ නම් වෙන එකක්........." ඔහු කීවේ සරදම් සිනාවක් නගාගෙන ඇත බලමිනි.

"අත පෙන්නන්න ගිය ගමන් ඇහැත් පෙන්නන්න ඕන රඹෑවෙ වෙද මහත්තයට"

"ආපෝ......... ඇයි ඒ......... මගේ ඇහැ කැඩිලා නැහේ......... අනෙත් එක මේ පෙනෙන පෙනිල්ල පේන්න තියන්න. ඇත්තක් උණත්, බොරුවක් උණත් මට මෙහෙම පේනවට මම කැමතියි. ඒත් සමහර විට ඇත්ත වෙන දෙයක් උණොත් හිත කැඩෙන්න පුළුවන්......... අන්න එතකොට නම් ඔයාට පුළුවනි වෙද මහත්තයට බිස්නස් එකක් හොයලා දෙන්න......... ඒත්........." එසේ කියූ නෙත්න වතුර බාල්දිය බැරලයට පුරවා හැරෙන සඳරුගේ අත වූ බාල්දිය අල්ලා ගන්නා අතරේ ඇය දෙස බලා,

"ඒත් රඹෑවෙ වෙදමහත්තයා ළඟ ඒකට බෙහෙත් තියේද දන්නෑ........." යි පැවසුවේ දෙනෙත් කුඩා කරමින් ඇය දෙස තියුණු බැල්මක් හෙළමිනි.

"ළඟදිද ලෝ කොලේජ් එකෙන් අවුට් උණේ.........? කථා කරල බේරෙන්න බෑ......... ඉක්මනට නාගන්න. මටත් නාන්න තියනවා"

"දෙන්නම නාමු........."

"හොඳට තියෙයි........." එසේ කියූ සඳරු නිවෙස දෙසට එන්නට ආවාය.........

සඳරු උදේ නිවසෙන් ගියවිට නෙත්නද හවස ගොස් ඇති බව දැනගත් මනුෂිට නැඟුණේ සරදම් සිනාවකි. ඉන්න මිනිහා මදිවෙලා......... කොල්ලෙක්වත් අල්ලගෙන......... මෙකිට ගමේදි මොකා හරි කරන්න ඇත්නම්. එතකොට අපි කියලා අනුවෙන්නෙ නෑ......... අයියට කෝල් කරන්න ඕන......... කොහොමද දැනගන්නෙත් කොච්චර දවස් එහෙ ඉන්නවද කියලා......... ගෙදරින් ෂෙප් එකේ අහගන්න ඕන......... ඒත් කියයිද......... මනුෂි මෙසේ කල්පනා කරමින් සිටින තැනට පැමිණි නියති මනුෂි ඇමතුවාය.

"මනුෂි අක්කි......... මොකද එළියට වෙලා......... කල්පනා කරන්නෙ?"

"මොකුත් නෑ නියති......... ඒක නෙවී......... මොකෝ අද එළියට ගියේ නැද්ද?"

“නෑ අක්කි........ මට අද ඇඟට හරි නෑ........ උණ වගේ........ ගෙදර ආවා ඕෆ් වෙලා”

“ඒකනේ........ අද නෙත්නත් නැනේ”

“නෙත්නයියගෙ අත ඉදිමිලනේ........ තෙල් සාත්තුවට ගියා” නියති කියද්දී ‘සාත්තුකරලම ගනියි........’ මනුෂි සිතුවාය.

“ඒක ඉතිං දවසෙන් දෙකෙන් බැනේ........”

“ඔව් මම හිතන්නේ දවස් දෙක තුනක් වෙද මහත්තයට කියලා අතගාව ගන්න වේවි........”

“එහෙනම් මේ ටිකේම නියතිට ඉන්න වෙන්නෙ පාළුවෙ තමා”

“නෑ මනුෂි අක්කා........ අනිද්දා අපි කට්ටිය නුවර එළි යනවා........ ට්‍රිප් එකක්........ ඒක නිසා ගානක් නෑ”

“එහෙනම් මම යනවා නියති ගෙට........ නිදාගන්න........ ගුඩ්නයිට්”

“ගුඩ් නයිට් මනුෂි අක්කා........”

නෙත්නගේ ආගමනයෙන් මුළු නිවසම සතුටෙන් ආලෝකයෙන් පිරී ඇතැයි සඳරුට සිතිණ. නෙත්න පියා සමග සාලයට වී පරණ තොරතුරු කථා කරද්දී කසුන් නෙත්නගේ උකුලේ ඇලවී සිටියාය. නෙත්න සිටියේ ඔහු හිස අතගාමිනි. මේ සෙනෙහස මේ නිවසට ලැබිය යුතුම දෙයකි. දුව පිට ගෙයකට දීග දෙද්දී මාපියන් බැනා කෙනෙකුගෙන් පුතෙක් බලාපොරොත්තු වෙති........ මන්ද එයට හිලව්වට තම දියණිය ඔහුට රැගෙන යාමට දෙන බැවිනි. එහෙත් තමාව රොෂාන්ට දීමෙන් තම දෙමාපියන්ට නම් ඒ කිසිවක් නොලැබුණ බව සඳරු දැන සිටියාය. බැනා ගෙදර ආවිට කටට රසට යමක් තනා දෙන්නට, තමන්ගේ ප්‍රශ්නයක් කථා කරන්නට පවුලට ශක්තියක් වෙන්නට තම බාල දරුවන්ගේ අනාගතය ගැන කථා කරන්නට........ මේ හැමදේම ගැන ඔවුන් බලාපොරොත්තු පොදි බඳින්නේ හැදීගෙන එන තම පවුලට ආරක්ෂාවක් රැකවරණයක් තම තරුණ බැනා සපයාවි යයි සිතමිනි.

එහෙත් තම දෙමාපියන්ට නම් ඒ කිසිත් ඉටු නොවිණ. ඔවුන්ගේ සිහින ලත් තැනම ලොප් විය. විවාහයෙන් පසු ඔවුන් බැනා දුටුවේද එක් වරකි. ඔහු මේ නිවසට ආවේද එක් වරකි. එවන් වාතාවරණයක් යටතේ නෙත්න වෙතින් මේ ඇනෙන පුත් කම, දරුකම, හිතකරු බව ඔවුනගේ සිත් අමන්දානන්දයට පත් කොට තිබිණ. තමා කියනා යමක් සතුටු සිතින් අසන්නට කෙනෙකු ලැබෙන කල එය කෙතරම් සතුටක් වනු ඇද්ද........



තම කුඩා සොයුරාට පවා මේ ඇනෙන්නේ අයියා කෙනෙකුගේ සෙනෙහස නේද........ ඔවුන්ගේ හදවත්වල සිහිනයක් සේ කොටුවී තිබූ දෙය ඇවසි පමණටත් වඩා නෙත්න අතින් ඉටුවෙයි. එකම වරද ඔහු නිතර මෙහි නොඑමය. එහෙත් ආ දිනයට ඔහු රොෂාන්ගේ අඩුව නිසි ලෙස ඕනැවටත් වඩා ලෙසින් සපුරාලයි........ යමක් කමක් තේරෙන නැගණිය ගේ කටින් අදටත් රොෂාන් අයියා යැයි කියවන්නට තමාට නොහැකිවූයේ ඔහු මොවුනට අමුත්තකු වූ බැවිනි. එහෙත් නෙත්න දුටු මොහොතේ සිට කටපුරා නෙත්නයියා කියමින් ඇය ඔහු පිළිගෙන ඇත්තේ හදවතිනි.

මේ සියල්ල බලමින් සඳරු කුස්සියේ උළුවස්ස උඩ වාඩි වී වැව් මාලූන් බැදීම සඳහා තුනපහ අතුල්ලමින් සිටියාය.

“ඒක නෙවි චූටී........ ඔයා ඔය බෑග් එක බැලුවද........ ඔන්න මම ඔයා කියපු පොත් ටික ගෙනාවා. මට අමතක උණා කියන්න”

“ආනේ........ අයියා ගෙනාවද?”

“මොන පොත්ද පොඩි දූ?”

“නෑ තාත්තා........ බයෝවලටයි බොටනි වලටයි ඕන පොත් වගයක්. අනුරාධපුරේ තිබුණේ නෑ........”

“ඉතිං දරුවො මට කිව්වනම් මම කොළඹින් ගේනවනේ. අයියට කරදර කළේ”

“ආ........ මරු වැඩේ........ තාත්තා තකහනියෙ කොළඹ යන්න ඕන මෙයාට පොත් ගේන්න. වෙන වැඩ නැති නම් හොඳයි.”

“ඒ උණාට පුතා ඔය පොත් ටිකට සෑහෙන ගානක් යන්න ඇති”

“චූටි මයාගෙ තාත්තට කියන්න සල්ලි ගැන කථා කරොත් මම රෑට කන්නෙ නෑ කියලා”

“තාත්තා........ එන්න එපා ඔව කියන්න. මෙයා අපේ අයියා........ මෙයා නැත්නම් කවුද මේවා කරන්නේ නැද්ද නෙත්නයියා?”

“අනේද කියන්නේ”

“හරි හරි මගෙනුයි වරද උණේ........ වෙරි සොරි........” පියා කියද්දී සැම දෙනම සිනාසුණේය. සඳරු හා මවද මුහුණෙන් මුහුණ බලාගෙන සිනාසුණේ සාලයේ කථා බහ අසා සිටිමිනි. මව මේ සියල්ල බලා හිඳ සුසුමක් හෙළනු තමාට ඇසුනා යයි සඳරුට දැනිණ. කෙතරම් සඟවාගෙන සිටියද තමා සිටින්නේ දුකින් බව ඔවුන් වටහා ගෙන ඇතුවා වද්ද........

# 21

උදෑසන පිරිත් හඬින් අවදි වූ නෙත්න කමිසයද අමාගෙන එළියට බැස්සේ වත්තේ මදක් ඇවිදින අටියෙනි. තාමත් ලා හිරු කිරණ හරිහැටි පොළවට නොවැටුණ නිසා පිපී ඇති පිනි මුතුපළඟ දිගේ නිරුවත් දෙපා ඇවිද්දවමින් ඔහු වෙල්යාය දෙසට ඇවිද ගියේ දත් මදිමිනි. අසල වූ තේක්ක ගසක කැපූ කඳක් මත වාඩි වූ නෙත්න දත් මදින අතරේ ගලා යන දිය පහරේ පිහිනමින් සිටි මාලු දෙස බලා සිටින්නට වූහ. සුදු වැලි බේරී නිල්කැටයක් සේ පෙනුණ දිය පහරේ වූ සුන්දර බව ඔහු බලා සිටියේය. දිය පාර දෙපස වැවුණු නාගස් ගොල්ලේ පිපුණු සුදුමල් පියලි මද සුළඟට ගැලවී පාව විත් වතුරෙ වැටෙද්දී කෑමක් යයි සිතමින් මාලුන් ඒවාට කොටන අයුරු ඔහු ආසාවෙන් බලා සිටියේය.

"අද මොකද මේ කුකුලගෙ කට ගැට ගහගෙන මෙතනට ආවේ ........?" කටහඬ ඇසී බලද්දී සඳරු ලොකු වතුර ජෝගුවක්ද කිරි වීදුරුවද රැගෙන මෙදෙසට එනු පෙනිණ.

"දත් මැද මැද ආවා කී නිසා කට හෝදගන්න වතුර ගෙනාවා........ ආ........" ඇය නෙත්නට වතුර ජෝගුව දී ඔහු කට සෝදා ගත් පසු බුරුසුව හා ජෝගුව අතට ගෙන කිරි එක ඔහු අතට දුන්නාය.

"නිවෙන්න කලින් බොන්න........" ඇය කියද්දී නෙත්න ඇය දෙස දෙනෙත කුඩා කොට බැලුවේය. සඳරුට දැනුනේ ලජ්ජාවකි.

"ඒක තමයි මම මේ කරන්න හදන්නේ........" එසේ කියූ ඔහු, "ඇත්තටම ඇයි නිවෙන්න කලින් බොන්න කියන්නේ?"

"රස්නෙට තමා කිරි එක රස........" යි කිවාය.

"ඒ උණාට මම නම් ආසා ටිකක් නිවුණම බොන්න........" ඔහු කීවේ මහ වල් තාලයට යැයි ඇයට සිතිණ. ඒ දෙනෙත දෙස බලන්නට අපහසු බව වැටහුණ සඳරු ඉවත බලනු දුටු නෙත්නට සිනා නැඟිණ.

"ඇයි හොඳ නැද්ද........" අසල වූ කුඩා ගල් කැටයකින් ඇයට ගසමින් ඔහු ඇසුවේය.



"මම දන්නේ කොහොමද? මට බෑ ඔය අංඩර දෙමලවලට උත්තර දෙන්න........ මම යනවා"

"ඒයි........" ඔහුගේ ඇමතුමින් ඇයගේ දෙපා නවතා විය.

"ඇයි මේ පාර ආවාම මගේ තේ භාගෙ බොන්න එපා කියලා කවුරු හරි කිවද?" ඔහු ඇසුවේ ඇය වෙත කිරි ජෝගුව පාමිනි. ඇය නෝක්කාඩු බැල්මක් ඔහු වෙත හෙලා ජෝගුව අතට ගෙන එය බොන්නට වූවාය.

"රසද?"

"ම්........ ඔව්........ සීනි ගානට තියනවා අම්මා ඇලා"

"සීනි නිසා නෙවී මැට්ටියේ........"

"නෑ මට වෙන රහක් එන්නේ නෑ........" ඇය දඟකාර සිනාවක් පා කීවාය. නෙත්න වශී වූවා සේ ඒ සිනාව දෙස මොහොතක් බලා සිටියේය. යළිත් යමක් සිහි වූවා සේ එක්වරම සිටි ඉරියව්ව වෙනස් කළේය.

"ඒක නෙවී........ කුමාරිහාමි........ ඊයෙ මොනවද ගෙදර ඇලා ආවේ........?"

"මොනාද?"

"බෙහෙත් ටික අරගෙන ආවේ........?"

"ආනේ........"

"ආනේ තමයි........ මම ඊයෙ උදේ හිකම් කාමරේට ගියා........ බෙහෙත් ජාති තුනම මේසෙ උඩ. අන්න මගෙ බෑග් එකේ පොකට් එකේ........"

"තැන්ක්ස්........" ඇය කීවේ වරදක් කළ එකකුගේ ස්වරයෙනි.

"තැන්ක්ස් නෙවී........ දැන් ගිහින් උදේ බෙත් ටික බොන්න........ ඉක්මනට ලෑස්ති වෙන්න රඹෑවෙ යන්න........"

"නංගිලත් යනවද?" සඳරු අසද්දී,

"නැතිව ඉතිං කාලෙකට පස්සෙ ගෙදර ඇවිදින් උන් දෙන්නා ගෙදර තියලා රවුම් ගහන්නයෑ" නෙත්න කීවේ යළිත් ඇයට හිඳිකුම්බා මලකින් ගසමිනි.

"ඉපදෙන කොට නංගියි මල්ලියි අපේ එල්ලන් ඇවිත් වගේ"

"හැම නෑකමක්ම ඉපදෙන කොට ගේන්නෙ නෑ........ සමහර නෑකම් ඉපදෙන්නත් කලින් ඒවා........ ගිය ආත්මේ වෙන්න පුළුවන් ........ සමහරවිට ඊටත් කලින් වෙන්න පුළුවන්........ ඒ නෑකම් මේ ආත්මෙ හම්බ උණාම අපි හිතන්නේ අහම්බෙන් කියලා........ ඒත්

.........ඒ සසර පුරුද්ද බව තේරෙන්නේ බොහෝම දිග දුරට හිතුවම ......... ඒ නැකම්වල තියෙන සමීප බව දැක්ක ගමන් හිත අඳුනගන්නවා ........." ඔහු කීවේ සඳරුගේ දෙනෙතට එබෙමිනි. නෙත්නගේ කථාවෙන් හිතට දැනුණු හැඟීමෙන් දෝ සඳරුගේ නෙතට කඳුලක් උණා ආවේය. ඒ දුටු නෙත්න ඉතා මෘදු ලෙස ඇයගේ නෙතු අගට ඇඟිල්ල තබා ඒ කඳුළ අතට ගත්තේය. අතට ගත් ඔහු එය මුතු ඇටයක් ගෙන බලන්නාසේ බලා සිනාවක් පෑවේ ඇය සිත හඳුනාගත්තා මෙනි. "මට හිතෙන්නේ මේ කඳුළු දන්නවා......... තමන්ගේ අය කවුද කියලා........." එසේ කී ඔහු වඩාත් ඇය දෙසට කිට්ටු වී......... "සමහර අයට අඳුනගන්න බැරි උණාට........." යි කියා පෙරකී සිනාවම පෑවේය.

අනුරාධපුර නගරයේ සඳරුලාගේ නිවස තිබුණු ඉසව්වේ සිට මිහින්තලයට ගොස් එතැනින් මහකනදරා වැව පසු කොට රඹෑවට ගොස් එතැනින් මද දුරක් යද්දී වෙද මහත්තයාගේ නිවස හමුවෙයි. ඔවුන් යන විටද ලෙඩුන් කිප දෙනෙකුම වූයෙන් නෙත්නලා මදක් එහි වූ බංකුවක වාඩි වී පසු වූහ.

"නෙත්නයියා......... මේ දවස් ටිකේ මට ඩ්‍රයිවින් පුරුදු කරන්නකෝ"

"හරි......... දැන් යනකොටම පටන්ගන්න........."

"චූටි......... විකාර නැතුව ඉන්න......... අයියගේ අත ලෙඩ වෙලා පේන්නෙ නැද්ද.........?"

"අයියගෙ අත ලෙඩ උණාට මට ලෙඩක් නැනේ අක්කා"

"ඔයාට පිස්සුද.........?"

"නෑ......... නෑ චූටි......... මේ පේන්නෙ නැද්ද......... වාහන පහක් ගෙදර......... ඒත් නෑ තාම ස්ටියරින් වීල් එකට අත තිබ්බෙ. දැන් ඉතිං ඩ්‍රයිවර්ලා එක්ක ගියා ඇති. හදිසියකටවත් වාහනේ ගෙනියන්න ඔයත් පුරුදු වෙන්න ඕන......... චූටි විතරක් නෙවි. යන්න කලින් ඔයත් වාහනේ ගෙනියන්න පුරුදු වෙන්න........."

"නෙත්නයියා ඔයා මොනවද කියන්නේ......... අපෙ අක්කා ඕන නම් ඔයාටත් උගන්නයි. මෙයාට හොඳට ඩ්‍රයිවින් පුළුවන්" කසුන් කෑ ගසද්දී නෙත්න ඇය දෙස බැලුවේ පුදුම වූවා මෙනි.

"ඔව් නෙත්නයියා ඔයා දන්නෙ නැද්ද, මෙයාට ඩ්‍රයිවින් පුළුවන්. හැබැයි ලයිසන් නෑ. ඒ දවස්වල තාත්තගෙ යාළුවෙක් හිටියා බන්දු මාමා කියලා. අපේ ගෙදර නැවතිලා හිටියේ. බන්දු මාමා මෙයාට හොඳට පුරුදු කළා. මටත් පුරුදු කළා. ඒ උණාට මට හරියට බෑ තාම........."

"මම දන්නේ ඇත්තේ ඒ ගැන......... එහෙනම් අපි දෙමු අපේ ඩ්‍රයිවර් නෝනට වාහනේ........."

"එනකොට දෙමු"

"අනේ......... අනේ......... මේ......... මට බෑ"

"ආ......... ඒවා කොහෙද......... දැන් මගෙ අනේ තෙල් ගෑවාම ඔයා අරන් එන්න......... නැත්නම් ඉතිං ගුටි තමයි" ඔහු කීවේ සිනාසෙමින් ඇය දෙස බලන අතරේය.

"අන්න හරි නෙත්නයියා, දැන්ම හිටලා ගහලා හදාගන්න" කස්තුරි කියද්දී සඳරු ඇය දෙස බැලුවේ එම කථාවේ අරුත කුමක්දැයි සොයන්නට මෙනි. නංගාගෙන් වචනයක් වැරදී පිටවූ බව කස්තුරිට වැටහුණේ නෙත්නද ඇය දෙස බැලූ බැවිනි.

"මම කිව්වේ ඩ්‍රයිවින් කරන්න බෑ කියනවා නම් දැන්මම මට්ටු කරලා තිබ්බම එනකොට ගනීවි කියලා"

"නෙත්නයියා ඔයා මේ සැරේ චූටි අක්කිට උගන්නන්න. Next time වලට මම දැන්මම Reservation දානවා........." කසුන් කියද්දී හැමදෙනාම ඔහුගේ කථාවට සිනාසුණහ.

මවටද සොයුරියටද පෙනෙන්නට රඟපෑවද තමාගේ අත සැබෑවටම රිදෙන බව නෙත්නට දැනුණේ වෙදමහතා තීල බලමින් අත හෙමිහිට අදිමින් අතගාද්දීය. එක වරක් වේදනාව තදින් දැනෙද්දී නෙත්න "ආ.........චූව්" යයි කියමින් සඳරුගේ අත අල්ලා ගත්තේය. ඒ මොහොතේ දැනුණ බියට සඳරු නෙත්නගේ හිස තම කුස පෙදෙසට හේත්තු කොටගෙන ඔහුගේ අනෙක් අත අල්ලා ගත්තාය. කස්තුරි සොයුරාගේ අතගෙන එළියට ගියේ ඔවුන් මග හරිමිනි.

පුරා වසරකටත් වැඩි කාලයක් තමා ඇය සමීපයේ සිටියද මේ තරම් හොඳින් මේ තරම් ළඟින් සමීපව ඇයගේ සුවඳ විඳගත්තේ අද බව නෙත්නට සිහිවිය. ඇයගේ සිරුරෙන් වහනය වන විලවුන් සුවඳ මුසු ඇයටම ආවේණික වූ සුවඳක් ඔහුගේ නාසය දිගේ ගොස් පෙණහළු පුරා පැතිරී රැඳිණ. ඒ සුවඳ නෙත්නගේ මතකයේ නැවතුනේ විය.

වෙද මහත්තයා නෙත්නට වන රිදීම අමතක කරන්නට මෙන් නොයෙක් දේ කථා කළද ඔහුගේ අත රිදෙන බව අමතක කරන්නට නොහැකි විය.

"ආ.........ආ.........ඌ.........යි........." එසේ කී ඔහු හිස ඔසවා සඳරුගේ මුහුණ බලා,

"මට බෑ........." යි කීවේය.

"අනේ එහෙම බෑ......... ඔහොම ඉන්න......... ඔයා බලන්න එපා.

"අනේ එහෙම බෑ......... ඔහොම ඉන්න" එසේ කී ඇය ඔහුගේ හිස ගෙන තම ඇඟට ඔළුව ගහගෙන ඉන්න" එසේ කී ඇය ඔහුගේ හිස ගෙන තම ඇඟට හේත්තු කොට ගත්තාය.

"දෙන්නා දෙමාල්ලෝ උණාම ඔන්න ඔහොම ඉන්න ඕන.........

"දෙන්නා දෙමල්ලො උණාම ඔන්න ඔහොම ඉන්න ඕන......... අනෙක් කෙනාට කරදරයක් දුකක් වෙනකොට ඒ අමාරුව දුක බෙදා හදාගෙන. නෝන නම් මහත්තයට බොහොම ආදරේ පාටයි........." වෙද මහතා සිනාසෙමින් කියද්දී සඳරු සීතල වී ගියාය.

වෙද මහතා කී දෙයින් සසල වූ සිත් ඇති නෙත්නද තමාටම යමක් පසක් කරවන්නට මෙන් හිස දෙපැත්තට වනා හිස ඔසවන්නට උත්සාහ කරද්දී එය වළකා ඔහු හිස තිබෙන අයුරුම තිබෙන්නට සැලැස්වූවාය.

"මේකයි නෝනා......... මේ අත හරි ගිහින් නෑ ප්ලාස්ටර් වලට......... නාම ඇටේ බිඳිච්ච තැන හරියට නියම විදියට හයිවෙලා නෑ......... ටික දොහක් යනකල් පත්තුවක් බඳින්න එන්ට වේවි......... දැන් මම පත්තුව බඳිනවා......... ඒක පැය දොළහකින් ලිහලා මෙන්න මේ තෙල දැන් මම ගෑවා වගේ හොඳට ගාලා අතගාන්න ඕන......... හරියට බෙහෙත් ටික වැටුණොත් ටික දොහක් යනකොට, රත්තත්රේ පිහිටෙන් කැක්කුම ඇරිලා යාවි" යි කියමින් වෙද මහතා බුලත් කෙළ පහරක් පඩික්කමට ගැසුවේය.

"හැබැයි දැන් අද ටිකක් කැක්කුම ඒවි මේක බැන්දම......... ඒකට කාරියක් නෑ......... ඒ වෙලාවට නෝනා මහත්තයව අඬ ගහගෙන අත මෙන්න මෙහෙම ටිකක් උඩකින් තියාගෙන වැලමිටෙන් ඉහළ කොටස අතගාව ගන්න........." වෙද මහතා කියද්දී නෙත්න රහසෙන් මෙන් සඳරු දෙස බැලුවේය. ඔහු එසේ බැලූ බව ඇයගේ නෙතින් මග හැරී නොගියෙන් ඇය වෙද මහතාට හොරෙන් ඔහුට රැව්වාය.

වෙද මහතාගේ නිවසින් හකුරු සමග බෙලිමල් ද පානය කළ ඔවුන් ආපසු එන්නට පිටත් වූහ.........

"නෙත්නයියා......... ඔයාට අරන් යන්න අමාරුද වාහනේ........."

"නෑ චූටි අවුලක් නෑ. ඒත් මම කියන්නද......... දෙන්නගෙන් කවුරු හරි ගන්න වාහනේ......... එතකොට ගෙදරත් යැවෙනවා. ඩ්‍රයිවිනුත් කෙරෙනවා. මම කියලා දෙන්නම්........." එසේ කී නෙත්න කස්තුරිට කථා කොට වාහනය දුන්නේය.





"ඒ දවස්වල නම් ටිකක් පුළුවන් නේද අක්කා......... බන්දු මාමගෙ කාරෙක තිබුණ කාලෙ.........අපි අරන් එහෙ මෙහෙ යනවා"

"හරි පුළුවන් නිසා දැන් තියෙන්නෙ අත හුරුවෙන එක විතරයි......... ආ......... ආ......... සෙකන්ඩ් එකේ ගොඩක් දුර යන්න එපා......... හරි දැන් තර්ඩ් එකට......... හතළිහට යන්න එපා......... තව ටිකක් අඩු කරන්න........."

නෙත්නගේ උපදෙස් අනුව කස්තූරි රථය දුගෙන ගියාය. කිප වරක් වැරදී ගියද ඇය ඉක්මනට ඉගෙන ගනිවි යැයි නෙත්න පැවසුවේය.

"ආ......... මීගින්නලේට ආවා......... දැන් අක්කගෙ වාරේ......... අක්කට නම් මට වඩා පුළුවන්......... අක්කා එන්න........." සඳරු ඉදිරිපස අසුනේ වාඩි වී ගෙම්බිට නිවැරැදි අයුරින් රථය පදවනු දුටු නෙත්නට සිනා නැගිණ.

"ආ......... චූටි......... හොඳ ඩ්‍රයිවර් කෙනෙක් මේ මෙච්චර දවස් හොරා පොලිස් සෙල්ලම කරලා තියෙන්නෙ"

"ආ......... ඉතිං ඔයා කියන්නේ......... ලයිසන් නැති මම අර හද්ද නුවර වාහන අරන් එහෙ මෙහෙ යන්න කියලද? අනෙක ඉතිං කවදාවත් මගෙන් ඇහුවෙ නෑනේ ඩ්‍රයිවින් දන්නවද කියලා........."

"අහන්න මතක නැති උණා......... බලාගෙන යනකොට චූටි. ඕල් රවුන්ඩර් කෙනෙක්......... කැලේ කටු ඇනුනම වෙදකම් දන්නවා......... ඩ්‍රයිවර්ගෙ අත කැඩුනම වාහනේ ගෙනියන්න දන්නවා......... සෙකට්‍රිලා නැති උණාම ඔෆිස් වැඩ දන්නවා......... වෙන් නැති උණාම හොරු අල්ලන්න දන්නවා......... ආ......... දියුණුයි දියුණුයි........."

"ආ......... තව මතක නැද්ද නෙත්නයියා......... රතිඤ්ඤයක් දැම්මම දුවන්නත් දන්නවා" කසුන් කියද්දී වාහනයේ බ්‍රේක් තද කළ සඳරු පිටුපස හැරුණේ සොයුරාට ගසන්නට මෙනි. අනෙක් තිදෙන හයියෙන් සිනාසෙද්දී තරහෙන් මුණ රතු කරගත සඳරු එතැන් පටන් වාහනය වේගයෙන් දුගෙන ආවාය.

නිවසට පැමිණි පසු නෙත්නගේ අතේ තතු මව හා පියාට කීවෙන් ඉන්පසු ඔවුන් වඩ වඩාත් නෙත්න ගැන අවධානය යොමු කළේ නෙත්නට සිදුවූ අනතුරේ ස්වභාවය ඔවුන් හොඳ හැටි දැන සිටි බැවිනි.

“ලොකු දූ........ මෙ දරුවට අත නම තෙමාගන්න දෙන්න එපා කොයි වෙලේවත්........ මූණ හෝදන නාන කොට උණත් අපි කවුරු හරි කරානම හරි”

“නෑ........ තාත්තා........ මට ඒවා කරගන්න බැරි නෑ”

“ඒක හරි පුතා........ ඉංග්‍රීසි බෙහෙත් වගේ නෙවී සිංහල ආයුර්වේද........ ඒකෙදි මෙ වගේ දෙයක් හොඳ කරන්නේ බොහොම සෞම්‍ය මෘදු විදියට........ කොච්චර තෙල් බෙහෙත් බැන්දත් ඇල් වතුර අගුණයි. අනෙත් එක ටිකක් හරි එහෙ මෙහෙ උණොත් ඇදුණොත් එහෙම ලේසියට හොඳ වෙන්නෙ නෑ........ මොකද බොහොම හෙමිහිට තමා මෙකෙදි නියමිත සෛල වර්ධනය වෙලා යථා තත්ත්වෙට එන්නේ........ ඒ නිසා බොහොම පරෙස්සමෙන්”

“නේද මහත්තයා........ හොඳ වෙලාවට සඳරු වාහනේ ගෙනියන්නත් ඇනත් උන්නේ........ මේ හරියෙ නම් ඉතිං ලයිසන් නැති උණාට ප්‍රශ්නයක් නෑනේ ඒ හැටි”

“ඔව් ඒ උණත් විනිතා........ කොච්චර හොඳට ඩ්‍රයිව් කළත් ලයිසන් නැත්නම් එයා ආධුනිකයෙක්. ඒ නිසා ලොකු දූ යද්දි එද්දි කල්පනාවෙන්”

“ඔයා බයවෙන්න එපා නෙත්නයියා මට තව දවස් දෙකක් වාහනේ දෙන්න........ ඊට පස්සෙ මම ඔයා එක්ක යන්නම්” කස්තුරි කියද්දී,

“ඔන්න ඉන්නවා බර වාහන රියදුරු තුමී” මව කිවෙන් සෑම දෙනාටම සිනා නැඟිණ.

තමාට නොපෙන්නුවද නෙත්නගේ අත අමාරු බව සඳරුට වැටහිණ. ඇයට ඇනුණේ දැඩි දුකකි........ බාත්රූම් එකක්ද නැති බැවින් ඔහුට නෑම ඇඟ සේදීම අසීරු බව ඇය දැන සිටියාය. තමාට ඔහු නැහැවිය හැක. එහෙත් ඔහු තරුණයෙකි........ තමා ලවා ඒ කිසිත් කරගන්නට ඔහු අකමැති වනවා සේම නිවසේ කාන්තාවන්ගෙන් කිසිවෙකුටත් ඔහු නාන තැන සිටිය නොහැක.

ඒනිසාම සඳරු පියාට කථාකොට ඔහු ළිඳවෙත කැටුව යන්නට කිවාය. මන්ද සෑම රාත්‍රියකම ඔහුට නෑමට හෝ ඇඟ සේදීමට ඇවසි බව ඇය දන්නා බැවිනි. ඇඟ සෝදාගෙන ඔවුන් පැමිණි පසු ඔහුට ආහාර ගන්නට සලස්වා නිදාගන්නට කිවේ අත රිදුම් දෙනු ඇති බැවිනි.





“ලොකු දූ........ අර අල්මාරිය උඩ ඇති හයිය කොට්ටයක්........ ඒක දෙන්න නෙත්න පුතාට අත තියාගන්න........” තෙල් බෝතලය රැගෙන කාමරයට යද්දී පියා පැවසීය.

නෙත්න ඇල වී සිටිද්දී කොට්ටය මත තබාගත් කෙසෙල් කොළයක් තැබූ සඳරු අත ඒ මත තැබුවාය.

“හරි ඔහොම තියාගෙන ඉන්න........ පුළුවන් නේද?”

“පුළුවන්” ඇය තෙල් ටිකක් අතට ගෙන හෙමිහිට ඔහුගේ අතමත ගා එය හෙමිහිට පිරිමදින්නට විය.

“ඊයෙ රෑ මොකද මේ ඇඳ රෙදි මාරු කරන්න නොදුන්නේ........ අද මාරු කරන්නම්”

“පිස්සුද........ ඒක ඒ තියන හැටියට තමා මට ඕන........”

“ඇයි ඒ........?”

“නිකං........” ඔහු ඇය දෙස බලමින් කීවේ සිනාසෙමිනි. “මෙ ඒක නෙවී........ මම අහන්නම හිටියේ ඔයාගේ බඩේ කැක්කුම ළඟදි ආවද?” නෙත්න ඇසුවේ එය ඔහුට හදිසියේ සිහි වූ බැවිනි.

“ළඟදි නෙවී........ ඔයා එක්සිඩන්ට් වෙන්න කලින් ආවා”

“ඒක මට පියුමි කීවා........ ඇයි නොකා නොබී හිටියේ”

“නිකං” සඳරු සිනාසෙමින් පවසද්දී නෙත්න ඇය දෙස රවා බැලුවේය.

“ආයෙ එහෙම ඒ වගේ මැටි වැඩ කරන්න එපා........ අනෙක් එක මතක් වෙලා වෙලාවට බේත් ටික බොන්න........ නැතිනම් ඉතිං 18 වෙනිදා මතක තියාගත්තා වගේ උදේ හවස මතක් කරන්න වේවි”

“චික්........ කියන කථා........” ඇය ලජ්ජාවෙන් කීවාය.

“මොකක්ද වරද........ මම මතක් කරදෙන එක හොඳයිනේ. තව කවුරු හරි දැන ගන්නට වඩා........” ඔහු කීවේ ඇයට ඇසකින් ඉඟිකරමිනි.

“ඊයා........ මොනවද මේ වෙලා තියෙන්නේ........ මම යනවා ඔය පාරනම්”

“යන්න ඉතිං........” ඔහු කීවද ඇය නොගියාය. “ඇයි ඉතිං නොයන්නේ?”

“කොහෙද ලෙඩ වෙලානේ”

“ඒ නැතත් ඔයා යන්නෙ නෑ කියලා මම දන්නවා........” ඔහු කීවේ ඇයව තම දෙනෙත් පටලා ගනිමිනි.

මලක් වෙලා ඔබ පිපෙන්න
ආදරේ සුවඳ දෙන්න
ගඟක් වගේ ඔබ ගලන්න
සෙනෙහසින් පිරී යන්න.........

ප්‍රේමයේ රස කල්පනා
හදවතේ තව මවාලන්න
නැවුම් සඳක් වී මල් මාවතේ
මුතු සලා ඔබ සිනාසෙන්න.........

මා නෙතේ සුව සිහිනයේ
මේ ලෙසේ ඔබ රැඳී ඉන්න
පවන් රොදක් සේ මා ලඟ රැඳී
ජීවිතේ දුක නිවාලන්න.........

ස්වාධීන රූපවාහිනියේ ගලා යන සුනිල් එදිරිසිංහයන්ගේ ගීතය සාලය දෙසට දෙනෙතින් ඉඟිකොට සඳරුට දැක්වූ නෙත්න "ඇහෙනවද?" යන්නද ඇසුවේ එසේම ගිසින් ඉඟි කරමිනි. සඳරුගේ ඇතුලාන්තය සීතල වී ගියේ ඔහුගේ ඒ ඇසීමෙනි. නොවැටහුණා සේ සිටින්නට කෙතරම් උත්සාහ කළද මේ සෙනෙහස තමන් වටා නොපෙනෙන පවුරක් සාදා ඇතැයි ඇයට සිතිණ. ඇයගේ හදවත හුරු පුරුදු වේගයට වඩා දෙගුණයක් වේගයෙන් ගැහෙමින් තිබිණ .........

"නිදාගන්න........." ඇය වෙර ලැබුණු ඇසිල්ලේ මිමිණුවාය. යන්න එපා යයි කියන්නට මෙන් නෙත්න බොහෝ ආදරණීය ලෙස හිස සොලවමින් දෙනෙත පියවූයේය. සඳරු එයට කීකරු වූයේ තවත් වදනක් හෝ නොදොඩමිනි.

පසුදින උදයේ සොයුරාත් සොයුරියත් දහම්පාසල් ගියෙන් සඳරු නෙත්නද කැටුව මුලින් වෙද ගෙදර ගියේ අද ඉරිදා පොළ බැවින් පොළටද ගොස් බඩු රැගෙන එන අදහසිනි. නෙත්නගේ අතේ බෙහෙත් බැඳ ඔවුන් එතැනින් පිටත් වෙද්දී තවත් කිසිවෙකුගේ නෙත් කීපයක් ඔවුන් වෙත යොමු වී තිබිණ. නෙත්නලා ගමන් කරමින් සිටි වාහනයට ඉදිරියෙන් යන්නට දුන් පිටුපස සිටියවුන් සෑහෙන දුරක් තබා වාහනය පදවාගෙන ගියේය.





නගරයේ මධ්‍යයේ වූ පොළ වෙත ගිය සඳරු සුදුසු තැනක වාහනය නවතා නෙත්නගේ මුහුණ බැලුවාය.

"ඔයා ඉන්නවද මම එළවළු මාළු අරන් එනකල්"

"ඇයි බයද කවුරු හරි මම කවුද කියලා අහයි කියලා?"

"එහෙම එකක්ද......... ඔයාට සනීප නැති නිසානේ........."

"මට අසනීපයි.........කවුද කියන්නේ......... මගෙ අත රිදුණට මට කකුල් අමාරුවක් නෑ......... ඔයා අකමැති නම් මිස........."

"මම ඇයි අකමැති වෙන්නේ......... මම කොයි තරම් ආසයිද ඒ දවස්වලත් මාකට් ඇවිල්ල බඩු අරන් යන්න......... බැන්දට පස්සෙත් මම ආසා උණේ මේ ඉන්නවා වගේ ගෙට කොටුවෙලා ඉන්න නෙවි, මම හරි ආසයි කඩේට ගිහින් බඩු ගේන්න......... පොළට යන්න......... බඩු තෝරන්න......... කවදාහරි බැන්ද දවසක හස්බන්ඩ් එක්කත් ඒ වගේ ජීවිතේ ගෙවන්න මම හිතා උන්නේ......... ඒත්......... මට අයිති උණේ හරිම අමුතු ජීවිතයක්. මම මේ කිසිම දෙයක් පතලා තිබුණේ නෑ......... ඔෆිස්......... යානවාහන......... ලොකු ෆැමිලි එකක්......... මේ කලබලකාරී ජීවිතේ........."

"ඒ කියන්නෙ ඔයා ඉන්නේ සතුටෙන් නෙවි........." සියල්ල දන්නා මුත් නෙත්න නොදන්නා බවක් ඇඟවීය. "අනිත් එක රොෂාන්අයියා වැඩිපුර ගෙදර නැති කම මිස ඉතිං වෙන මොකක්ද......... ඔයාලගේ ෆැමිලි ලයිෆ් එක එන්ජෝයි කරන්න වෙන්නෙ ඉදහිට......... මම ඒක පිළිගන්නවා" සාක්කු දෙකේ දැත රුවාගෙන ගමන් කරන අතරේ නෙත්න කීවේ සඳරුගේ මුහුණේ ඇතිවන හැඟීම එකකට වත් තමාගේ ඇහැට නොපෙනී සැඟව යන්නට නොදී නිරීක්ෂණය කරමිනි. නෙත්න එදේ කියද්දී සඳරුගේ දෙකොපුල් රෝස පැහැවනු ඔහු බලා සිටියේය.

"මොකද ලජ්ජා හිතුණේ......... ෆැමිලි ලයිෆ් එක ගැන අහපු හින්දද?" එසේ ඇසූ නෙත්න තනිවම දුක් වූවේය. 'මට සමාවෙන්න සඳරු ඇත්ත දැන දැනත් මට ඔයාට රිද්දන්න වෙලා......... මේකෙ හේතුව හොයාගන්න.........'

"වැඩක් නැති දේවල් කථා නොකර අපි යමු බඩු ටික ගන්න........." නෙත්න හා සඳරු පොළ තුළ ඇවිද යද්දී නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකුද ඔවුනට පිටුපසින් ඔවුන් ගැන විපරමින් පසු පස එන්නට විය. මේ ගැන නොදත් නෙත්න හා සඳරු එකිනෙකා හා කථා වෙමින් සිනාසෙමින් ඇවිද යන අතරේ බඩු මිලදී ගනිමින් සිටියෝය.

"ආනේ......... ලොවී......... කප්පාට වෙලා......... කාලෙකින් කෑවෙත් නෑ......... ඔයා ඉන්න......... මම අරන් එන්නම්........."

"යමු දෙන්නම"

"ලොවි මිලදී ගත් පසු ඔවුන් පොලේ නොයෙක් තැන ඇවිද අනෙක් අවශ්‍ය ඇද රැගෙන එන්නට වූහ. සඳරූ අමාරුවෙන් ගෙනියනු දුටු නෙත්න,

"කෝ දෙන්න එක බෑග් එකක් මට"

"දෙන්න තිබුණා ලෙඩ නැති උණානම්"

"ආයෙ ලෙඩ වූ......... එක අතයි ලෙඩ අතිකෙන් ගෙනියන්න හැකි........."

"නෑ......... නෑ......... අපිට තව බඩු ගන්න තියනවානේ......... මම මෙක වාහනේට ආලා එන්නම්......... ඔයා මෙහාම ඉන්න" එසේ කියූ සඳරූ නෙත්න එතැන නවතා බඩු බෑග් දෙක ද රැගෙන සෙනග අතරින් වාහනය වෙත ගියාය. කලිසමේ සාක්කුවෙන් යතුර ගත් ඇය පිටුපස විවෘත කර බඩු දමනවාත් සමගම එහි ආ මැරයන් දෙදෙනෙකු සඳරූගේ අතින් ඇදගෙන වෙනත් වාහනයක් කරා ගෙනයන්නට විය.

"මෙ මොකද? කව්ද තමුසෙලා?"

"කට වහගෙන යමං......... අපි කව්ද කියලා පෙන්නන්නම්........." එසේ කියා සඳරූගේ මූණට පහරක් ගැසූ එකෙකු සඳරූ දගලද්දීම ඇය ඇදගෙන යන්නට වූහ......... සඳරූ ගැලවීමට දඟලුවද බැරි තැන ඇය මහ හඬින් නෙත්නගේ නම කියා කෑ ගැසුවාය. මෙතෙක් වෙලා නෙත්න සිටියේ මදක් ඈත සඳරූ ගිය දෙසට පිටුපා ගසක වූ රිලවකු දෙස බලමිනි.

එකවරම සෙනග එක් තැනකට දුවනුද සඳරූගේ කට හඬද ඇසුණු නෙත්න වහ වහා එදෙසට දිව යද්දී නාඳුනන කිප දෙනෙකු සඳරූ වාහනයට දමා ගනු පෙනුණෙන් ඔහු සෙනග අතරින් කඩා වැදී එක් වරම පිහියක් සෙනගට දික් කරමින් සිටි එකාගේ පැත්තෙන් ගොස් ඔහුගේ පිටට පහරක් ගැසිය. සිදු වූ දේ සිතාගත නොහැකිව ඔහු වැටෙද්දී තව මැරයන් දෙදෙනෙකු ඔහු වෙත කඩා පැන්න අතර ඔවුනටද පයින්ම පහර එල්ල කරද්දී සඳරූ එක් වරම මෙදෙසට වාහනයෙන් බැස දිව එන්නට ආවාය. බිම වැටුණු එකා යළි සඳරූ අල්ලා ගනිද්දී ඔහුට වමතින් මරු පහරක් ගැසූ නෙත්න අනෙක් දෙදෙනාගේ ඔළුවටද නැගිටින්නට පෙර පහර ගැසුවේ හෙණගහන්නා මෙනි. මෙතෙක් මෙය බලා හුන් තරබාරු ගැහැනියක්,





"ඈ බොල බල්ලො මෙ ඇරිව් ගෙනියන්නද හැදුවේ?" අසමින් අසල වූ පොලු කැබැල්ලක් ගෙන එකෙකුට ගසද්දී අනෙක් පිරිසද වට වී තිදෙනාටම පහර දෙන්නට විය. සඳරූ කෑ ගසාගෙන දිව විත් නෙත්නව බදා වැළඳ ගත්තාය. නෙත්නද සිටියේ කේන්තිය හා බිය යන දෙක නිසාම වෙව්ලමිනි. බිය ඇති වූයේ සඳරූ ගැන බැවින් ඔහුද එකවරම සඳරූව තරයේ වැළඳ ගත්තේය......... සඳරූ කෑගසමින් හඬන්නිය. ඇයව නැලවීම කිසිවෙකුටත් කළ නොහැකියයි ඔහුට සිතිණ......... ඔහු එක්වරම ඇයගේ මුහුණ උඩට හරවා,

"ප්ලීස්......... අඬන්න එපා......... දැන් හරි........." යි කියමින් ඇයගේ නළලත සිප ගත්තේය. සඳරූ එවර නම් වෙව්ලා ගියේ බියෙන් නොවන බව ඒ දෙනෙත නෙත්නට කියද්දී නෙත්න පමා වී තිබිණ. පත් අවස්ථාව අනුව තම ආවේග සඟවා ගන්නට තමාට නොහැකි වූ බව ඔහුගේ සිත ඔහුට දොස් පැවරිය. ඒත් මේ සිතන්නට කාලය නොවේ. සඳරූ රැගෙන මෙතනින් යා යුතු බව ඔහු සිත තිය. ඒ අතරේ එහි ආ කව්දෝ පුද්ගලයකු,

"සඳරූ......... දූවා......... මොකද පුතේ......... මේ.........?"

"හාන්දිරිස් මාමේ......... අනේ මන්දා කවුදෝ මාව අරන් යන්න හැදුවා" යි කියද්දී එතැන සිටි වෙනත් අයකු,

"මොන අරන් යන්නද, ඔයාගෙ මහත්තයා උන්ට සැලකුවා හොඳට ......... ආන් කට්ටිය උන්ව ගැට ගැහුවා පොලිසියට දෙන්න" යැයි කියද්දී සඳරූ නෙත්න දෙස බැලුවාය.

"පුතේ......... මේ ඇරිව් අරන් යන්න.........අපි බලාගන්නම්........." සඳරූ හඳුනන තැනැත්තා නෙත්නට කියද්දී එය හොඳ අදහසක් බව සිතූ නෙත්න තාමත් හඬමින් තමාගේ කමිසය බදාගෙන සිටින සඳරූ වටා අත යවමින් ඇයව කැඳවාගෙන වාහනය වෙත ගියේය. ඒවන විටද වාහනයේ පිටුපස දොරේ එල්ලෙමින් තිබූ යතුර ගත් නෙත්න ඉදිරිපස අගුල හැර වාහනයේ පිටුපසට සඳරූ හා ගොඩ වූයේ මේ විලස ඇයව කැඳවා යා නොහැකි බැවිනි.

වාහනයට ගොඩ වූ සඳරූ ඇතින් මූණ වහගෙන හඬන්නට වූවාය. ඇයගේ බියද දුකද පහව යන තුරු නෙත්න නිහඬව සිටි වුවද ඔහු නිතර සිටියේ අවට ගැන විමසිල්ලෙනි. ඒ හැම සිතුවේ මේ පැමිණි මැරයන් කවුද යන්නය. මොවුන් මෙවේලේම

සඳරූ ඇක රැගෙන යන්න හැදුවද......... නැතිනම් දිගටම තමන් පසු පස ආවද......... එසේ පිටුපස ආවා නම් තත්ත්වය මීන් නොනවතිනු ඇති බව ඔහුට වැටහිණ.

"දැන් ඇති......... ඔක නවත්තන්න......... ගෙදර යමු........." එසේ කියූ නෙත්න පිටුපසින්ම ඉදිරිපස අසුනට නැග වාහනය පණ ගැන්විය. රථය ඉදිරියට ගත් ඔහු තමා පිටුපස වාහනයක් එන්නේ දැයි බලන අතරේම රථය රැගෙන ගියේය.

සඳරූ නිවෙසට යන්නට පෙර තමාගේ ආවේගකාරී ස්වරූපය සමහන් කොට ගත්තාය. මන්ද නිවැසියන් මෙය දැනගත්තොත් බිය වන බැවිනි. නිවසට ආ සඳරූ හිස රිදෙන බව කියා කෙළින්ම කාමරයට ගොස් ඇලවෙද්දී කස්තූරි නෙත්නට ඉඟිකළේ දෙමදන තරහ වූවා දැයි දැන ගැනීමටය. නෙත්න කස්තූරිව පසෙකට කැඳවා සිදු වූ සියලු දේ පැවසුවෙන් කස්තූරි ඉතාමත් බියට පත් විය.

"ඔයාලා ෆලෝ කරන් කවුරු හරි ගිහින්......... ඒක නුවර්......... ඒ කියන්නේ අක්කගෙ හතුරා තාම ක්‍රියාමක වෙනවා......... හරි වැඩේ අයියේ"

"ගෙදරත් දැන ගනීවිද මන්දා ඔයාලගෙ කවුද එතන හිටියා"

"හ......... හරි වැඩේ........."

සඳරූගේ පියා රණසිංහ මහතා වේගයෙන් නිවස දෙසට දිව ආවේ සඳරූට කථා කරමිනි.

"ලොකු දූ......... ලොකු දූ......... මොකද මේ උණා කියන්නේ......... මට දැන් අන්දිරිස් අයියා කිවේ. ඊටපස්සෙ දෙතුන් දෙනෙක්ම කිවා ......... මොකද පුතේ උණේ........." ඔහු නෙත්නගෙන් ඇසුවෙන් තවත් සඟවනු නොහී නෙත්න සියලු සත්‍ය පැවසුවේය. මවද පියාද අසා සිටියේ දෙනෙත් අයාගෙනය. ඒ අතරේ මව හඬන්නට වූවාය. මම කිව්වා මහත්තයා ඔයාට......... මම මේ හීන දැක්කෙ හොඳකට නෙවි ......... අනේ දෙයියනේ එක පාරක් නුවරදී. දැන් ඉතිං......... මේ උපන් ගමේතේ. දැන් ඉතිං කොහොමද ඔළුව නිදහසේ ඉන්නේ......... අනේ නෙත්න පුතා ඔයාවත් කියන්න මේකෙ තේරුම?"

"අම්මා බය වෙන්න එපා......... මම ඉන්නවනේ එයාට මොකුත් වෙන්න දෙන්නෙ නෑ........." නෙත්න කියද්දී සඳරූ හිස ඔසවා ඔහු දෙස බැලුවාය. මේ කථා බහ නිමාවේ තම දුරකථනය රැගෙන වත්ත පහළට ගිය නෙත්න තම මවට කථා කළේය.





"සුදු පුතා......... මම මේ කෝල් එකක් ගන්න උන්නේ"

"ගන්න කොට තව ටිකෙන් අම්මට තව තව දේවල් අහන්න තිබුණා"

"ඇයි......... මොකුත් උණාද......... ඔයා හොඳින් නේද?"

"මම නම් හොඳින් අම්මා......... ඒත් ඔයාගෙ ලොකු ලේලි එක්ක නම් මේ විදියට ජීවත් වෙන්න බැරි වේවි වගේ......... අද දවල් ටවුන් එකේදී ආයෙමත් කට්ටියක් සඳරූ අරන් යන්න වාහනේකට දාගත්තා......... පොළේදී. කට්ටිය ගහලා උන්ට සඳරූ නම් බේරගත්තා ........."

"මොනවා සුදු පුතා......... ආයිමත්.........?"

"ආයිමත් කොහොම වෙතත් තුන්වෙනි හතරවෙනි වතාවට උණත් මේකෙ කෙළවරක් නැති වේවි. සඳරූම ඔය නඩුවට ලේස් නොකරවන්න මුත් හදන්නේ........."

"මම කීවනේ සුදු පුතා......... ඔය දරුවගේ ජීවිතේ අනතුරේ ඔය වැඩෙන්......... ඔයාවත් කියන්න සඳීට ඔය නඩුවෙන් ඉල්ලා අස්වෙන්න කියලා"

"මේ ගෙදර මළගේ වගේ. අම්මලා තාත්තලා අඬනවා......... මම මේ ඒ අයට මග ඇරලා ඇවිත් කතා කළේ. අපේ ගෙදරින්ම මේවා කරවනවා කියලා දන්නවා නම් ඒ මිනිස්සු පුදුමවෙලා මැරේවි"

"දැන් කෝ සඳරූ.........?"

"මම හිතන්නෙ ගෙයි. අඬ අඬා ඉන්නවා. මගේ අතේ ඊයෙයි තෙල් බැන්දේ......... ඒ තෙල් බැඳගෙන පොළට යද්දී අපිව ෆලෝ කරලා මම හිතන්නේ........."

"දැන් ඉතිං මේ ළමයට ගමේ ඉන්න එකත් හරිම භයානකයි නේ"

"මම බලාගන්නම් ඒක......... ඒත් මට හිතෙනවා අම්මි රොෂාන් අයියට කථා කරන්න"

"අපෝ එපා පුතා......... මම දැන් තාත්තිලා එක්කත් මේ ගැන කථා කරන්නම්......... රොෂාන්ට ගන්න එපා. ගිය වතාවෙ මතකනෙ ........."

"ඒ උණාට එයාගෙ ගැනි නම් අම්මා එයා දැනගන්න ඕන මොනවද වෙන්නෙ කියලා"

"අපි ඒවා හිතලා බලලා කියමු. ඔයා දැනට සඳරු ගැන බලන්න පොඩ්ඩක්"

"ඒ මොනවා කළත් මේ අයගෙ බය අරින්න බැරි වෙයි අම්මි.........

"ඒ මොනවා කළත් මේ අයගෙ බය අරින්න බැරි වෙයි අම්මි......... 



# 22

දූරකතනය වසා ඇමූ නෙත්න සිදු වී සිදුවීම සිහිපත් කළේය. මනූෂි මෙතරම් පළියක් සඳරුගෙන් ගන්නට හේතුව වෙක් එකේ ප්‍රශ්නය පමණද......... සඳරු ආදා සිට නිවසේ අවධානය වැඩිපුරම යොමු වූයේ ඇයටය. මන්ද ඇය සෑම දෙනාගේම සිත් දිනාගෙන කටයුතු කරන බැවිනි. මනූෂිට පවුලේ කවුරුත් සලකන්නේ ලොකු ලේලිය වශයෙන් පමණි. ඒ හැර නිවසේ කිසිදු වැඩක් වගකීමක් ඇයට භාර නොදෙයි. කිසිදු වැඩකදී ඇයට මූලිකත්වය නොලැබෙයි. සමහර විටෙක ලොකු අයියා පවා සඳරුගේ නම කියා කෑ ගසමින් එක එක දේ ඉල්ලා ගනු ඔහුට ඇසෙයි. මේ සියල්ල සිදු වූයේ මනූෂිගේ වරදින් මිස සඳරුගේ වරදකින් නොවේ. සඳරු නිවසට ආ කාලයේ සිටම ඇය සඳරුට කළේද කෙණෙහෙළි කම් වුව ඇය ඒ සියල්ල නිහඬව විඳ දරා ගත්තාය. එහෙත් ව්‍යාපාර පරිපාලනය ඇයට භාරදීම මනූෂිට ඉවසුම් නොදෙන්නක් වෙද්දී ඇය සඳරුට කරන අරියාදුකම්වල වැඩි දියුණුව ඇති විය.

......... මම සඳරුට ආදරේ කරන විත්තියක් මම හිතන්නේ ගෑනිට තේරිලා තියෙන්නේ......... ඒ ගැන වැටහුණු නොයෙකුත් අවස්ථා ඔහුට සිහිපත් විය. රොෂාන් ගෙන් අතෑරිලා මාව මැරි කරොත් සඳරුට මිට වැඩිය පවර්ස් එනවා කියලා ගෑනි දන්නවා......... සඳරුගේ උගත්කම, ලස්සන ගැන ගෑනි කොහොමත් තරහෙන්නේ ඉන්නේ ......... මම දැන් මොකද මේකට කරන්නේ......... මෙයාගෙ ජීවිතේ නම් හරිම අවධානම්.........

අමතක වීමකින් වාඩි වී සිටි පස් කන්ඩියට වාරු වූයේ තුවාල අතිනි. එයින් එක්වරම ඇඩි වේදනාවක් දැනුණෙන් නෙත්න තමා වෙත අත යළි රැගෙන අතගාන්නට විය. ඒ මොහොතේ යම් කිසිවෙකු සුසුම් හෙලනු ඇසුණා යයි සිතී ඔහු හිස හරවා බලද්දී කඳුළු පිරි ඇසින් ඔහුගේ මදක් පිටුපසට වී තමා දෙස බලා සිටින සඳරු දුටුවේය. ඔහු ඇයට කථා කළේ හිසෙනි. ඇය හෙමිහිට ඔහු වෙත ආවේද කඳුළු බේරෙන දෙනෙතිනි.

“ඇයි මේ......... ඇන් ඒ ප්‍රශ්නෙ ඉවරයි......... නාඩා ඉන්න” ඔහු කියද්දී තෙල් බැඳි අත ගත් සඳරු හෙමිහිට එය තම අත උඩ තබාගෙන අත ගෑවාය.

“අද මම නිසා අත ආයෙම අමාරු උණා නේද?”

“ඔයා වෙනුවෙන් මොනවා උණත් මට ඒක දරාගන්න වෙනවා” ඔහු කිවේ ඇත බලමිනි. සඳරු ඔහු දෙස බැලුවේ එහි අරුත ඇනගන්නට මෙනි......... එහෙත් ඔහු ඈත බලාගෙන උන්නේය.

“යමු ගෙට මම අතගාන්නම්”

“ඔයා යන්න......... මම එන්නම්......... මගේ හිත හරි නෑ පොඩ්ඩක් .........”

“හිතෙන්නෙ නැද්ද ගෙට ගියාම මාත් තනියම කල්පනා කරයි කියලා.........” සඳරු අසද්දී නෙත්න ඇය දෙස බැලුවේ ඔහු හදවත තිගැස්සෙද්දීය.

“මොනවද මම කරන්න ඕන.........” ඔහු ඇසුවේ ඇය දෙනෙතට එබෙමිනි. කිසිවක් නැතැයි කියන්නට මෙන් ඇය හිස වැනුවාය. යමක් කියන්නට මෙන් ගිය ඔහු එය නොකියාම ගිලගෙන සඳරුගේ අත අතැර අනෙක් පස හැරී එතැන වූ ගසේ කඳට වමතින් ගැසුවේ “damn it” කියමිනි. තමාගේ හදවතේ වූ හැඟුම් සඳරුගෙන් සඟවා ගන්නට ඔහුට වුවමනා වූවා වැනි විය. සඳරු හඬද්දී මෙලෙස ඇතින් හිඳ බලා හිඳින්නට තම දෛවය දී ඇති කුරිරු තීරණයට ඔහු වෛර කළේය. ඇයට ලොකු කථාවක් තමා හා කියන්නට ඕනෑ කම ඇතද ඇය නොකියන බව, තමාටද තම සිතේ ඇති දේ කිව නොහැකි බව ඔහුට ගෙන දුන්නේ ඇඩි නොවිස්සුනි. දුකකි.

“ඔයා යන්න කෝ......... ගෙට......... මම එන්නම්.........”

මේ අතර නුවර නිවසේ අය සඳරුගේ ප්‍රශ්නය ගැන කළයුතු යමක් කථා කරමින් සිටිද්දී පියුමි වෙතින් හිමිහාත ද මේ සියලු තොරතුරු ඇනගෙන තිබිණ. සඳරුගේ ජීවිතය ගැන ඔහුට ඇති වූයේ ඇඩි බියකි. කවදා හෝ ඇය තමාගේ ආදරය පිළිගනිවි යයි යන්න නිරතුරුවම අපේක්ෂා කළ ඔහු හැම විටම ක්‍රියා කළේ ඇයගේ යහපත වෙනුවෙනි. ඇය දුටු දින සිට තම සිත ඇය ගැන කෙතරම් ආදරයකින් පිරුණාද......... ඇය නිසා තමා තුවාල ලැබීම ගැන ඔහු සිතේ කිසි ලෙසකින් වත් දුකක් නොවිය. එය තම පෙම්වතිය වෙනුවෙන් වන තමාගේ යුතුකම වගකීම ලෙස ඔහු සැලකුවේය.





එහෙත් ඇය කවදාවත් තමාගේ නොවනු ඇත......... ඇය තමාට හමුවන විට විවාහ වී තිබුණේ ඇයි......... තමා ගේ ජීවිතය එළිය කළ යුතු වූ සඳ වෙන තැනක පායා ඇත......... ඇය කිසි දිනෙක වත් තමාට නොලැබෙනු ඇත......... ඒත්......... ඒත් තමාට ඇය අමතක කල හැකිද......... ඇයට කරදරයක් වීම.........තමාට ඉවසා සිටිය නොහැකි දෙයකි.........

.........දෙයියනේ එච්චර ලස්සන කෙල්ලක්......... මරන්න විනාශ කරන්න......... මුන් කොහොම හිතනවද දන්නේ නෑ......... සඳරුට කෝල් එකක් ගන්න ඕන......... එසේ සිතූ ගිම්හාන ඇයගේ ජංගම දුරකතනයට ඇමතුමක් ගත්තේයත

සවස් වන විට යළිත් යථා තත්ත්වයට පත්ව සිටි සඳරු දිය නාන්නට ගොස් තිබිණ. නිදාගෙන සිටි නෙත්න ඇහැරුණේ ඇයගේ දුරකතනය නාද වනු ඇසීමෙනි. නොගෙන ඉන්නට සිතාද යළි නැගිට ගොස් එය අතට ගත් නෙත්න එහි වූ අංකය දැක මොහොතක් සිටියේය. යළිත් එය රැගෙන ඔන් කළ ඔහු,

“හලෝ”

“හලෝ මම ගිම්හාන......... සඳරු ඉන්නවද?”

“එයා නාන්න ගිහින්......... මොනවා හරි පණිවුඩයක්ද?”

“නෑ......... කවුද මේ කථා කරන්නේ?”

“එයාගෙ Brother in law නෙත්න.........”

“හායි නෙත්න......... මම මේ දැන් පියුමිගෙන් දැනගත්තේ......... මගෙ ඔළුව කුණු උනා ඇහුවම......... එයාට මොකුත් කරදරයක් නෑ නේද?”

“නෑ......... නෑ......... එයා හොඳින්”

“ඔ......... තැන්ක් ගෝඩ්......... මට පියුමි කිවත් මම ම කථා කරලා දැනගන්න කල් මට හිතට හරි නෑ. කොහොම උණත් එයාව බලාගන්න නෙත්න......... සඳරුට කියන්න මම පස්සෙ ගන්නම් කියලා” එසේ කියූ ඔහු දුරකතනය විසන්ධි කළේය.

හදවත වසා පැතිරෙන මේ දුක, මේ නොසන්සුන් තම, මේ බිය කුමක්දැයි නෙත්න සිතුවේය. ගිම්හාන සඳරුට ආදරේ කරන බව ඔහුට දැනී තිබුණේ බොහෝ කලකට පෙරය. එහෙත් මීට පෙර දින සඳරු පැහැර ගැනීමට උත්සාහ කිරීමේදී ඇයව බේරාගන්නට ගොස් තුවාල ලැබීමෙන් පසුව ඒ සැකය විශ්වාසයක් බවට පත්විය. එහෙත් දැන් එය නිගමනය කරන්නට තරම් කරුණු එළඹ තිබේ. කරුණු

මෙසේ නම් සඳරු තමාට නොලැබෙනු ඇත. තමා ගැන කෙතරම් බැඳීමකින් සිටියද ආදරය කරන්නට තමා නොසුදුසු බව ඇයට සිතෙනු ඇත. මන්ද තමා සැමියාගේ සොයුරා වන බැවිනි. රොෂාන්ගේ අදරය නොලැබෙන කළ ඇය පිටතින් ආදරයක් සොයාගත යුතුව තිබෙන්නට ඇත......... ඔහු ගිම්හාන මිස තමා නොවේ. නෙත්තට ඇති වූයේ තමා ගැනම ඇඩි කලකිරීමකි......... දුකකි......... තමා මෙතරම් බලාපොරොත්තු සහගතව උන්නේ උදාවෙන ඒ දවස ගැන නොවේද......... එහෙත් එය කිසිදිනක උදා නොවෙනු ඇත.........

කල්පනා කරමින්ම වත්ත පහළ කොරටුව දෙසට ගිය නෙත්ත පාත්ති අතර ඇවිදින්නට විය. සවස කසුනුත් කස්තුරිත් ටියුෂන් ගොස් ඇති නිසා පාලු බවක් ඇඩිව දැනෙන්නට වුයෙන් ඔහු එතැනින් ඉවත් වී ඔහුට හුරු පුරුදු කජු ගස් යටට ගියේ එතැන මුල වාඩි වී කල්පනා කරන්නට විය.

නාගෙන පැමිණි සඳරු මවගෙන් නෙත්ත ගැන ඇසුවද ඔහු දුටුවේ නැති බව මව කීමෙන් සඳරු මිදුලේද ඇවිද ඔහු සෙවුවාය.

"කෝ අම්මෙ......... නෑනේ........."

"එහෙනම් නිදාගෙන නැගිටලා කවුරුත් පේන්න නැති නිසා පහලට යන්න ඇති. අන්න මම තලගුලි ටිකකුත් හදලා තේ දාලා ඇති බෝතලේට"

"නෙත්ත ඉන්නෙ කල්පනාවෙ වගේ දවාලෙ වෙච්ච දේට........."

"නැතැයි ඉතිං......... ඔයාට මොනවා හරි උණානම්......... උන් ඔයාව අරන් ගියානම්......... අද අපි මෙහෙම ඉන්නද? ඒ දරුවා අර අතකුත් කැඩිලා තියෙද්දී ඔයාව බේර නොගන්න අද මේ වෙනකොට ඔයාට මොනවා නොවී තියේවිද?"

"මට නම් ඒ ගැන මතක් කරන්නත් බයයි අම්මා......... එක වෙලාවකට නුවර නොගිහින් ගෙදර ඉන්න හිතයි"

"එහෙම කොහොමද......... ඔයාට එහෙ ආරක්ෂාවයි මෙහෙට වැඩිය. කට්ටිය ඉන්නවා. වාහන තියනවා. එකම දේ ඔය නඩුවෙන් අස්වෙන්න ගිය ගමන්......... අපට බෑ රට හදන්න"

"උන් හිතයි අපි බයේ කියලා අම්මා"

"හිතපු දෙන්......... කාටවත් අභියෝග කරනවට වඩා අපට ඔයාගෙ ජීවිතේ ලොකුයි දරුවො......... මට ඇහුණා නෙත්තත් දවාලෙ කියනවා නම අස්කරවන කථාවක්"





'.........බලපල්ලකෝ වැඩේ......... එයාමයි කිය කියා හිටියෙ අස්වෙන්න හොඳ නෑ......... නඩුවට සාක්කි දෙන්නම ඕන කියලා......... ඒ පාර නම අයින් කරනවලු......... අද දවල් හොඳටම බය වෙලා......... දෙයියනේ......... මාව ඉඟපු හැටි......... මට අහස පොළව මතක නැති උණා. ඒ උණාට එයා හිතලා කරා නෙවි......... එයාට නිකම්ම කෙරුණා ඒක. එතන හිටපු හැමෝම හිතුවෙ මගෙ හස්බන්ඩ් කියලා......... ඇයි ඉතිං ආම් ලෙෆ්ටිනන්ට් වගේ ඉන්න උස මහත දැක්කම මට වඩා බාලයි කියලා හිතේයැ.........

මා ගැන මොනවා හිතා ඉන්නවද මන්දා......... වෙලාවකට මට හිතෙනවා මගෙ හිතට එයා හරි ළඟයි කියලා. දැන් දැන් මොනා හරි කියන්න හදනවා කියලා......... ඒත් වෙලාවකට හරි ඈතයි......... ගව් ගණන් ඈතයි......... එවෙලෙට තමයි තේරෙන්නෙ එයා අනුන්ගෙ වග......... එයා කොච්චර නස්රිනා ගැන හිතුවත් එයාව නියති බඳින්න වෙවි. ඒ වෙඩින් එක සමහර විට ළඟදිම තියේවි.........

මේ ආ ටිකට දැන් නියති දෙතුන් ගමනක් කථා කළේ......... ගිය සැරේ වගේ ඒවිද දන්නෑ එක්ක යන්න......... ඒ උණත් එයා වෙලාවකට නියතිටත් වඩා මා එක්ක ගොඩක් කිට්ටුවෙන් ඉන්නවා කියලා මට හිතෙනවා. ඒ බැල්ම......... ඒ කථාබහ......... එයාගෙ හැසිරීම......... ඇත්තටම මොනවද එයා මට කියන්න හදන්නේ......... මට එහෙම හිතෙන්නේ ඇයි......... එයා මට මොනවා හරි කියන්න හදනවා කියලා.........

මම උණත් එයාගේ හිතවත්කමට, සෙනෙහසට එයා ළඟට නිකම්ම ඇදිලා යනවා. රොෂාන් ගෙන් මට නොලැබෙන ආදරේ මම නෙත්තගෙන් හොයනවද......... නෑ.........නෑ......... මම එහෙම කරන්නේ නෑ. මට එහෙම කරනවා නම් ගිම්හාන උණත් මට කොච්චර ආදරේ කරනවද......... ගිම්හානයි මමයි ගැලපුණත් නෙත්තයි මමයි ගැලපෙන්නේ නෑ......... අපිට එහෙම හිතන්න බෑ......... දෙයියනේ ......... මම මේ මොනවද හිතන විකාර.........'

නෙත්ත පහළ ඇති. තේ ටික දෙන්න ඕන......... එසේ සිතූ සඳරු තේ හා තලගුලි ද කෝලිකුට්ටු ද බෑගයක දමාගෙන වත්ත පහළට යද්දී නෙත්ත කජු ගහ මුල වාඩිවී කල්පනා කරමින් සිටි දුක්බර විලාසය දුටු සඳරුගේ හදවත මහා ගින්නකින් දුක් ගින්නකින් දැවී ගියා වැනි විය. ඔහු එතැන සිටියේ ඔහුගේ සමාජ තත්ත්වයට අවුල් තත්ත්යට කිසිම සමානකමක් නැතියකු ලෙසය. ඇයගේ දෑසට කඳුළු

ඉණුවේ නිතැතිනි. දවාලේ සිට ඔහු මෙතරම් කල්පනා කරන්නේ මොනවාද.........

සඳරු හෙමි හෙමින් නෙත්න අසලට ඇවිද ගියාය. ඇය එහි ගියද ඒ බවක් නොදැනුණා සේ......... සමහරවිට ඇනීද නොදැනුණා සේ ඔහු පළමු ඉරියව්වෙන්ම සිටියේය. සඳරු වේවැල් බැගය පසෙක තබා ඔහු අසල වාඩි වූවාය.

"ම්......... මොකද මේ.........?" සඳරු මදක් ඔහු වෙත ළංවෙමින් අසද්දී දිය නැමෙන් නැවුම් වූ සබන් සුවඳ ඇය වෙතින් විහිදෙය වූයෙන් නෙත්න සුසුමක් හෙළුවේය. අනතුරුව ඇය දෙස බැලූ ඔහු යළි ඉවත බලා ගත්තේය.

"මුහ්......... නිකං........."

"නිකං......... නම් ඉඳියි මෙහෙම......... දැන් අවුරුද්දක් විතර මම දන්නවනේ ළමයගෙ තරම" ඇය කීවේ ඔහු දෙස නෙත් කොනින් බලමිනි......... ඇයගේ දිගැටි ඇස්, නෙත් කොන් බැල්ම......... මුල සිටම නෙත්නගෙ හදවත ඇඩිව ඇය කෙරෙහි බැඳී ගිය හේතු විය. ඔහු ඇය දෙස බලා සිටියේ තමා ඉතාම ප්‍රිය කරන දෙයක් නොලැබෙන කුඩාවකු මෙනි.

"ඇයි මේ......... කතා නෑ......... බුම්මාගෙන......... කතා කරන්නෙ නැත්නම් මම යනවා යන්න"

"ගිම්හාන ළඟටද?" නෙත්න ඇසුවේ තියුණු ලෙස ඇය දෙනෙත තම දෙනෙතින් අල්ලාගනිමිනි. එසේ අසද්දී සඳරු තිගැස්සෙනු නෙත්නටද පෙනිණ.

".........මො.........මොනවද.........මේ.........අහන්නේ.........?"

"අපි ගොඩක් වෙලාවට ආසා අපි ආදරේ කරන කෙනෙක් ළඟට හරි අපිව ආදරේ කරන කෙනෙක් ළඟට හරි යන්නනේ........."

"ඉහිං එහෙම නම් මම යන්න ඕන රොෂාන් ළඟට මිස වෙන කා ගාවටවත් යෑ" සඳරු කීවේ ඉවත බලාගෙනය.

"හිතට විරුද්ධව බොරු කියන නිසාද මූණ බලන් නොකියන්නේ" නෙත්න අසද්දී සඳරු ඔහු දෙස බැලුවාය.

"ඔයත් දන්නවා මාත් දන්නවා රොෂාන් ඔයාට ආදරේ නෑ කියලා........." එසේ කී නෙත්න මද වේලාවක් නිහඬව සිට "ඔයත් රොෂාන්ට ආදරේ නෑ කියලා......... ඔයා දන්නෙ නැති උණාට......... මම දන්නවා" නෙත්න කියද්දී ඇය දෙනෙත් විදහා ඔහු දෙස බැලුවාය.



"ඇයි බලන්නේ......... මම දන්නෙ කොහොමද කියලද හිතන්නේ ......... කැම්පස් නොගියට මාත් ඉගෙන ගෙන තියනවා........."

"ඔයා හිතලූ කියනවා. ඒකයි බැලුවේ........."

"මම එහෙම කියනවා ඇති......... ඒත් අන්න ආදරවන්තයා කතා කළා"

"ඒ කවද.........?"

"ගිම්හාන........."

"ගිම්හාන කතා කළා......... ඇයි ඒ.........?" සඳරු අසද්දී නෙත්න සිනාසුණේ සමච්චලයටය.

"සමහරවිට මම ඔයාගෙන් අහන්න ඕන දෙයක් වැරදිලා ඔය මගෙන් අහනවාද......... මන්දා........."

"ඔය විකාර කථා එපා......... ආ......... තේ බොන්න ඕන්න අම්මා හදලා ඔයාට" කථාව වෙනතකට යවන්නට සඳරු උත්සාහ කළේ තම සිත පැහැදූවද ඔහු නොපිළිගන්නා බව දත් බැවිනි.

"කථාව නවත්තන්න ඕනි නම් ඒක කියන්න......... තේ ඒකක් මැද්දට දාන්නෙ නැතුව"

"අම්මෝ ඔයා නම් හරිම චස වෙලා......... මට වෙලාවකට කතා කරන්න බයත් හිතෙනවා......... ඇයි මට මෙහෙම ඇණුම් පද කියන්නේ ......... මම ඔයාට මොනාද කළේ?"

"මොකුත් නෑ......... මම උදේ ආපහු යන්න ඕන........."

"මොනවා......... ඔයාට පිස්සුද......... තාම මේ තෙල් බඳින්න ගත්තා විතරයි"

"මට ඕන ඇති තෙලක් නෑ......... මම ආවෙ තෙල් බඳින්න නෙවි........."

"එහෙනම්.........?" සඳරු ඇසුවේ ශබ්දයෙනි. මන්ද ඔහුගේ මේ හැසිරීම ඇයටද ගෙනාවේ තරහකි.

"ආවෙද......... ආවෙ ඇයි කියලා දැන් කියලා වැඩක් නෑ......... ඒක නිසා යනවා" නෙත්නගේ ඇසේ තිබූ නෙත් බව දුටු සඳරුට තමා ඔහුට තරහෙන් කතා කළා වැරදි බව වැටහිණ......... එයා මොකක් හරි දෙයක් හිතේ තියාගෙන දුක් විඳිනවා......... එසේ සිතූ ඇය ඔහුගේ අත හෙමිහිට අල්ලා ගත්තාය. නෙත්නගේ නෙතින් කඳුලක් වැටුණේ ඔහුටද රහසේ මෙනි.

"I am sorry .........මම ඔයාට රිදෙව්වා"

"රිදෙන එක මට රිදුණේ ආ දවස්වලම...... මම ඔයාට කම්මුලට ගහපු දවසෙත් මම කිව්වෙ මගෙ හිතෙ ඕල්රෙඩි රිදිලා තව රිද්දන්න එපා කියලා...... ඒත් එදා හිට අද වෙනකල් මගේ හිත රිදෙනවා"

"මම නිසා......?"

"ඔව්...... කිව්වොත් විශ්වාස කරනවද......?"

"මට හිතාගන්න බෑ......"

"ඒක තමයි කරුමෙ......" ඔහු කෙලින් වී වාඩිවෙන අතරේ ගලක් ඈතට විසි කරමින් කීවේය.

"හෙට යනවා නම් මාත් එනවා"

"ඇයි ඒ...... මොනවටද...... මෙ ඔයාගෙ ගෙදර...... ඔයා ආවේ සතියක් විතර ඉන්නනේ...... ඔයා ඉඳලා එන්න......"

"ඉතිං මම එහෙම ආවම ඇයි ඔයා ආවේ" ඇය ඇසුවේ විහිළුවටය.

"ඉතිං මම එහෙම ආවම ඇයි ඔයා ආවේ" ඇය ඇසුවේ විහිළුවටය. ඔහු හිස වැනුවේ යමක් එහෙත් එයින් නෙත්නගෙ සිත රිදිණ. ඔහු හිස වැනුවේ යමක් අවබෝධ වූවා මෙනි.

"ඒකනේ...... පස්සෙ කල්පනා කරන කොට තමා වැටහෙන්නේ ආ එක වැරදි බව. වරද තේරුණ ගමන් ඒක හදාගන්න කියලනේ අපට කියලා දීලා තියෙන්නේ...... ඉතිං ඒ වරද මම මේ හදාගන්නවා......"

"වැරදියි...... හදාගන්න විදිය සම්පූර්ණයෙන්ම වැරදියි......"

"කරන්න දෙයක් නෑ...... මම සිය ගුණයක් විවෘත වෙනකොට අනිත් අය එක ගුණයක් වත් විවෘත නැත්නම ඒ වගේ වැරදි කරන්න වෙනවා. වැරදි බව නොහිතා. පිළිගන්නවද අපි දෙන්නා ගොඩක් ළංවෙලා බව" නෙත්න ඇසුවේ ඇය දෙසට හැරෙමිනි. සඳරු බිම බැලුවාය.

"එච්චර ළඟින් ඉඳිද්දිත් ඔයා විවෘත නෑ මට...... ඇයි ඒ......මාව විශ්වාස නෑ...... මගේ ඒ තරම් වැදගත්කමක් ඔයාට නෑ කියන එකනේ......ඒකෙන් කියන්නේ...... මම දන්නවා ඔයා හිනාවෙලා හිටියට ඔයාගෙ හිතේ ප්‍රශ්න ගොඩක් තියනවා...... සමහර විට ඒ ප්‍රශ්න වලට උත්තරත් ඇති...... ඒත් තමන්ගේ ළඟින්ම ඉන්න කෙනෙකුට වත් ඒ ප්‍රශ්න කියන්නේ නැත්නම් කොහොමද උත්තර හොයන්නේ...... කියලා බලන්න...... විවෘතව කථා කරන කොට තමයි අලුත් දෙයක් උපදින්නේ...... තද කරගෙන ඉන්න හැඟීම් වලින් වත් තද කරගෙන ඉන්න ප්‍රශ්න වලින්වත් මිනිහෙක් කවදාවත් සැනසීමක් ලබන්නේ නෑ......



ඔයා කවියක් කථාවක් ලියන්න ගන්න...... ඒක ලියලා ඉවර උණාට පස්සෙ හිතෙනවා ඒක කොහෙද මෙච්චර කල් තිබුණෙ කියලා...... නවල් එකක් ලියන්න...... ලියලා ඉවර වෙනකල් හිතාගන්න බෑ ඒ කථාව අතරමැදදි කොහේ යනවද කියලා. මොකද අපිවත් දන්නෙ නෑ වෙලාවකට අපේ හිතේ හැංගිලා තියෙන දේ. ඒක දැනගන්න නම් විවෘත වෙන්න ඕන.

නවකථා කාරයෙකුට පුළුවන් එයාගෙ පොතට විවෘත වෙන්න. ඒත් අපි......? අපි විවෘතවෙන්න වෙන්නෙ අපේ හිතට සමීප අයෙකුට ...... හිත ළඟ ඉන්න කෙනෙකුට...... එහෙම කෙනෙක් එක්ක ඉන්නකොට කථා කරන කොට අපට දැනෙනවා අපේ හිත...... සිතුවිලි ක්‍රියාකරන හැටි...... ඒකෙන් අලුත් අදහසක් උපදිනවා...... තීරණ ගන්න ශක්තියක් එනවා......

මොකද අනෙක් කෙනාගෙ තීරණ හොඳට හරි, නරකට හරි ඔයාට ලැබෙනවා...... ඔයාගෙ හිත ළඟම කෙනෙක් කවදාවත් ඔයාට නරකක් කරන්නේ නෑ...... ඔයාට තනිවෙන්න දෙන්නෙ නෑ...... සමහර විට අදට උණත් ඔයා ඔය හිතේ හංගගෙන ඉන්න ප්‍රශ්න පත්තරේ එහෙම තියාගෙන ඉන්නේ ඔයාට කවුරුත් නැති වේවි, ඔයා අසරණ වේවි කියන බයට. ඒත් ඔයා එක පියවරක් තියනවා නම් ඔයා එක්ක ගමනක් යන්න උණත් ලැස්ති අය ඉන්න බව අමතක කරන්න එපා" ඔහු කීවේ තුත්තිරි මලක් ගෙන එයින් ඇය හිස ඔසවමිනි.

මෙතෙක් වේලා ගලා ගිය කඳුළු වැල්වලින් ඒ දෙකොපුල් සේදී ඇති අයුරු ඔහුට පෙනිණ. ඔහු සුසුමක් හෙළුවේය.

"බලන්න දැන් උණත් ඔයාගෙ තද ගතිය. එක වචනයක් කථා නොකර තනියම අඬන්නේ ඔයාම පිළිගන්නවා මාව ඔයාට ඒ තරම් වැදගත් කෙනෙක් නොවන බව. ඉතිං එහෙව් එකේ මෙහෙම බොරුවට මූනිච්චාවට ලොකු බැඳීමක් යාළුකමක් මාවගෙන මේ කරන රඟපෑම වැඩක් නෑ...... හ්ම්...... ඔයා බොරුවට අඬන්න එපා...... මම මේ නිකං කටට එනවට කියන ඒවට...... අපි යමු......"

"මට කියන්න එක පාරටම ඔයාට මේ මොකද උණේ...... මේ තරම් දේවල් කියන්න"

"මම කිවේ...... ඔයාගෙ ඇටෑක් එක දැනගෙන [illegible] කෙනෙක් කථා කලා කියලා"

"ඉතිං දෙයියනේ ඒක වැරදිද...... [illegible] ඔයා මාව දැක්කෙ නැද්ද. මම උණත් එහෙමයි. තමන්ට [illegible]

කෙනෙකුට එහෙම දෙයක් උණාම අපේ පණ බාගෙන ඒනවා තමා" සඳරු කීවේ සරල සත්‍යයක් ලෙසය. නෙත්නගේ මුහුණේ ඇඹුණේ සමච්චල් සිනාවකි.

........ඔය ආවේ ඇත්ත එළියට........ තවත් මම එයාට වදයක් වෙන්න ඕන නෑ........ එයාට රොෂාන් ඉන්නවා........ ගිම්හාන ඉන්නවා ........එතනට තුන්වෙනි කෙනෙක් අවශ්‍ය නෑ........ තනිව සිතූ නෙත්න නැගිට ගත්තේ මේ තත්ත්වය යටතේ තමාට මෙහි තව දුරටත් රැඳී සිටිය නොහැකි බැවින් ආපසු යාමටය.

එහෙත් නෙත්නගේ මුහුණ දුටු සඳරු ඔහු සිතන දේ අනුමානයෙන් වැටහිණ........ එතැනින් ඉවත්ව එන්නට ආ නෙත්න ගේ අත එක්වරම අල්ලා ගත් සඳරු ඔහු අතටම වාරු ගෙන නැගිට්ටාය. ඇය ඔහු දෙස බලද්දී ඔහු ඉවත බලාගත්තේය.

"ඔයාට හිතෙන්නෙ නැද්ද........ මේ තිරයේ හරි තද වැඩියි කියලා ........ මෙහෙ වෙන් උණොත් අපි දෙන්නා හරි ඈතකට ඈතකට යාවි කියලා........ මට බයයි ඒක ගැන හිතන්න........ මොකද මම ආස නෑ ඔයා මගෙන් ඈත් වෙනවට........"

"එතකොට ඔයා කාගෙ චරිතෙද මට රඟපාන්න කියන්නේ........?"

"ප්‍රධාන චරිත තුනට පිටතින් තියන වෙනස් චරිතයක්........ මගේ හිත ළඟම ඉන්න චරිතේ........"

"හිත රවටගෙන ඒක රඟපාන්න ලේසි නෑ........ හිතක් නැතිව ඉන්න රූකඩයක් වගේ ඒක රඟපාන්න බෑ" ඔහු කීවේ අරුත් දෙකක් ඇති වචනයක් බව වැටහුණද සඳරු නිහඬ වූවාය.

"කොහොම උණත් මම දැන් යන්න ඕන"

"දෙන්නම යමු"

"එපා........"

"එහෙනම් ඔයාවත් යන්න බෑ........ ආවෙ මම ආ නිසා බව මම දන්නවා........" ඇය කීවේ ඔහු නවතාගත හැකි වෙන ක්‍රමයක් නැති බැවිනි. නෙත්න ඇයගේ මුහුණ බලා සරදම් ලෙස සිනාසුණේය.

"පුදුමයි ඒක වත් දැනගත්තා........ ඒත් දැන් නිසා ඔයා නිසාම ගියා කියලත් පොතේ ලියාගන්න"

"නෑ........ මට එහෙම ලියවෙන එකක් නෑ........ මොකද මගෙ හිත කියන්නේ තියකී නිසා යනවා කියලා" සඳරු කීවේ මෙතෙක් ඇයගේද හද පෙළූ දෙයකි. එය සැබෑවටම සඳරුට ප්‍රතිඵල රැගෙන ආවේය. නෙත්න එක්වරම නිහඬ විය. මන්ද සැබැවටම ඇය මිස තම සිතේ කවුරුත් හෝ නැති බැවිනි.





"මාව දාල යන්න නම් ඇයි මාව අර මිනිස්සුන්ගෙන් බේරා ගත්තේ........ මැරෙන්න දුන්නා නම් ඉවරනේ"

"බේරගත්තේ මට තමුසෙ නැතිව........" කියන්න ගිය දේ ගිලගත් නෙත්න දෙනෙත් පියාගෙන තම සිත හා සිතුවිලි පාලනය කරගත්තේය. කඳුළු පිරි දෙනෙතින්ම සඳරු සිනාසුණාය. නෙත්න ද් සිනාවට වශී වූවා සේ ඇය දෙස බලා සිට ඇයගේ අතින් ඇද තමා වෙත ළංකොට ගත්තේය.

"ප්ලීස්........ මට........ රිද්දන්න එපා........" ඔහු කීවේ රහසෙනි. සඳරුගේ ආත්මය එයින් කම්පා වී ගියේ නොදැනීමය. මන්ද ඔහුට රිදවන්නට ඇයද සිහිනෙන් හෝ නොපතන බැවිනි. "මට පිස්සු හැදෙයි........ I don't know what to do ........" ඔහු කීවේ ඇය අත අතහරිමිනි. "අම්මා බලන් ඇති........ ඔයා යන්න........" ඔහු නැවත පැවසීය.

"අම්මා තමා මාව එව්වේ තේත් දීලා........ පුතංඩියව හොයලා කවලා පොවලා එන්න කියලා" සඳරු කියද්දී නෙත්න සිනාසී ඇය දෙස බැලුවේය.

"අම්මෝ........ කළු වලාකුල් ගියේ දැනුයි........ දන්නවද........ ඔයා ලස්සන වැඩියි. හැන්ඩසම් වැඩියි. කෙල්ලො පිස්සු වැටෙන්නෙ ඒකයි........" සඳරු කීවේ තලගුලියක් ඔහු වෙත පාමිනි.

"වෙන එවුන් පිස්සු වැටිලා මොකටද........ ඕන එකී පිස්සු නටන කොට........ඒක නෙවි අම්මා කිව්වේ කවන්න, පොවන්න කියලා ........ දැන් ඉතිං........ time to feed"

"හොරා........" එසේ කියූ ඇය එක ගුලියකින් භාගයක් කඩා ඔහුට කැව්වාය.

පසුදිනයේ සිව් දෙනම ගොස් තෙල් බැඳගෙන ආපසු නෙත්න සඳරු නිවසේ දමා කස්තුරි හා කසුන් සමග ගියේ කස්තුරිට රිය පැදවීමට උගැන්වීමටය.

"තාම නැද්ද නෙත්නයියේ හොඳ ප්‍රතිඵලයක්........"

"ඔයාගෙ අක්කගෙන් වචනයක් ගන්න ඉබ්බාගෙන් පිහාටු ගන්නවා වගේ"

"ඉබ්බගෙන් නිකම් ගන්න බැරිනම් ඉබ්බා තම්බලා හරි පිහාටු වල ඇලා බුරුල් කරලා හරි, ගන්න ඕන මිනිහා පිහාටු ගන්නවා අයියේ. ඒ වගෙ ඔයාටත් අක්කා එක්ක ඔය විදියට [illegible]

වැඩ කරලා කරන්න බැරි නම් රන් එකේ කරන්න." නෙත්න පිටුපස හැරී බැලුවේ කසුන් කුමක් කරන්නේදැයි දැන ගැනීමටය. ඔහු තමා ගෙන දුන් කුඩා ප්ලේයරය ඔන් කොට ඉයර්ෆෝන් වලින් ගීතයක් අසනු දුටු නෙත්න කස්තූරි දිහා බැලුවේය.

"මම චූටිට දෙයක් කියන්න උන්නේ........."

"මොකක්ද අයියේ?"

"ඔයාගෙ අක්කා නාම ගෙදරින් ගිය විදියම තමා......... එයා වර්ජින් කෙනෙක්"

"මොනවා.........?" හිස සිට දෙපතුල සීතල වෙමින් කස්තූරි පිටි වනම වේගයෙන් බ්‍රේක් ගැසීය. ඒ පහරට කසුන්ද ඉදිරියට තල්ලු වී ඇවිත් නෙත්නගෙන් සිදු වූ දේ කුමක්දැයි අතින් ගොලු බසින් ඇසීය. ඔහු අස් වැසූ නෙත්න,

"චූටී......... බලාගෙන......... හෙමින් යමු......... මට තේරෙන්නෙ නෑ ඔයාගෙ අක්කා මොනවා හිතේ තියන් ඉන්නවද කියලා. මමත් ඒක දැනගත්තේ ඩොක්ටගෙන්" එසේ කියූ ඔහු ඇයට සිදු වූ දේ කීවේය.

"අනේ දෙයියනේ......... අම්මලා බලා ඉන්නෙ මෙහෙ, අක්කා ප්‍රෙග්නට් වෙනකල්......... ඊයෙ පෙරේදත් තාත්තට කිවා දැනගත්ත ගමන් ගෙදර එක්කන් එන්න ඕන කියලා" කස්තූරි කියද්දී නෙත්නාගේ හදවත රිදී ගියේ අසරණ දෙමාපියන්ගේ අභිලාෂක බලාපොරොත්තු ගැනය.

"ඔහොම හිටියොත් හොස්පිටල් එකෙන් බබෙක් අරන් දීලා තමා එවන්න වෙන්නේ........."

"අයියේ දැන් ඔයා හිටියා ඇති......... ඔයා මෙහෙන් යන්න කලින් ඔයාගෙ හිත ගැන අක්කට කියන්න"

"කොහොම කියන්නද චූටී.........?"

"එහෙනම් බලා ඉන්න......... ඔහොම ඉදලා ඇති වෙලා මෙයා වෙන කා එක්ක හරි යාලු වෙනකල්. අයියේ අපේ අක්කට ඔයා විතර ගැළපෙන කෙනෙක් මට හිතා ගන්න බෑ. අපටත් වෙන මස්සිනලා එපා ඔයා ඇර. මම මේ මොකුත් නොදැන මුලිනුත් ඔයාට රන් එකේ හරි අරන් යන්න කිවේ දැන් හිටියා ඇති නිසා. එන්නෙ නැත්නම් උස්සගෙන හරි අරන් යන්න කියලා මම කලිනුත් කිවෙ......... දැන්නම් ඉතිං ඔය, ඔයාට තියෙන්නෙ චාන්සස් ලන්තයක්ම."

"මට බෑ චූටී එහෙම කරන්න......... එයා මට ආදරේ බව හරියට නොදැන. කවුද දන්නේ එයා වෙනකාට හරි ආදරේද කියලා.........





එහෙම නම් මම මොනවා හරි දෙයක් එයාට කෙරොත් ඒක හරි අපරාධයක් වෙනවා. හරි අසාධාරණයක් වෙනවා. මම ආසා නෑ එහෙම......... මේ යක්ෂ කෙල්ල කට ඇරලා කිසිම දෙයක් කියන්නෙ නැනේ........."

"මම දන්නේ එකම දෙයයි......... ඔයා හොඳ වැඩියි. වෙන කෙනෙක් නම් ඔවා හිත හිත ඉන්නෙ නෑ. තමන් ආදරේ නම් උස්සන් යනවා මිස"

"එහෙම හරි නෑ චූටී......... තමන් ආදරේ කරන කෙනා පරෙස්සම් කරන්න ඕන, ගෞරව කරන්න ඕන, ආදරේ අයිති කරගැනීමක් විතරක් නෙවි, පරිත්‍යාග කිරීමකුත් තියනවා......... සමහර විට එයා වෙන කා ගැන හරි දැනට හිතේ තියන් ඉන්නවා නම් එයා ළඟට හරි අක්කා යන්න ඕන ඔය විදියට, පිරිසිදු කෙල්ලෙක් විදියට." නෙත්න කියද්දී අදහන්නට බැරිවා සේ කස්තූරි හිස දෙපසට වැනුවාය.

"අයියලා අද හවස ටවුන් යනවා කිවා නේද......... මම වැඩක් කියන්නද?"

"මොකක්ද.........?"

"අපි යමු ෆිල්ම් එකක් බලන්න......... මම මල්ලි එක්ක වෙන තැනක වාඩිවෙන්නම්" ඇය ඉඟියෙන් යමක් පවසා සිනාසෙමින් කීවාය. නෙත්නට සිනා නැඟිණ.

"ඔ......... ......... ......... බලමු ට්‍රයි කරලා........." නෙත්න කීවේ කස්තූරි දිගුකල අත්ලට ගසමිනි. ඔවුන් ආපසු එන අතර මග ආවේ චිත්‍රපටියක් බලන්නට යන්නට ඕනා බව කියා අක්කාට කරදර කරන ලෙස කසුන්ට උපදෙස් දෙමිනි.

කසුන්ට බැණ වදිමින් කස්තූරි ඇඳගත්තේ පාඩම් කරන්නට තියන බව කියමිනි.

"මොනාද චූටී......... පොඩි එකා දැන් කාලෙකින් ෆිල්ම් එකක් බැලුවෙ නැතුව ඇතිනේ......... ඔන්න යමු. අම්මෙ අම්මලත් යමුකෝ"

"අනේ බෑ ලොකු දූ......... ඔයාලා යන්න........."

"පුතා නෙත්න, මෙයාලත් එක්ක කල්පනාවෙන්........."

"බයවෙන්න එපා තාත්තා......... මම ඉන්නවනේ ළඟ........."

සියල්ලෝම සූදානම් වී එළියට එද්දී සඳරුගේ පියාට පැවසූ නෙත්න සඳරුට වාහනය ගෙන යාමට දුන්නේය.

ගීතවත් ද්විතියිකයක් වූ එය අතිශය සුන්දර ආදර අන්දරයක් විය. 'දිල්කා

හින්දි චිත්‍රපටය ඉතාම සුන්දර ආදර අන්දරයක් විය. 'දිල්කා රිශ්තා........' හදවතේ නෑකම ගැන අලුත් කථාවක් සුන්දර වෙනසක් එහි ඇතැයි චිත්‍රපටය නැරඹූ මිතුරියන් කිවද කස්තුරිට එය නැරඹීමට නොහැකි වූයේ යාමට කෙනෙකු නොමැති හෙයිනි.

බැල්කනි ටිකට් හතරක් රැගෙන ආ ඇය සෙනග අතරේ සොයුරාගේ අත අල්ලාගෙන ඉදිරියට ගියේ නෙත්නට පිටුපසම පේළියේ අසුන් නෙතින් පෙන්වමිනි.

"චූටි අක්කි, අපිත් යමු අක්කලා ඉන්න තැනට"

"පිස්සුද, එතන සද්දෙ හරියට ඇහෙන්නෙ නෑ........ එක සැරයක් ඇවිත් එපා උණා එතන ඉඳලා"

"ඉතිං එහෙනම් අක්කලත් මෙහෙට කථා කරගමු........"

"මෙතන එක සීට් එකයි තියෙන්නේ. අනිත් දෙක අර ඉඳලා ගිය අයගේ. ඉඩ මදියි. ඔහොම ඉඳපුමදෙන්. දැන් කෑ නොගහ ෆිල්ම් එක බලන්න........ මෙන්න චොකලට්........ මෙන්න පොප්කෝන්........"

"හරි ඉතිං........ නාම ෆිල්ම් එක දැම්මයැ"

සඳරුගේ අතින් අල්ලාගත් නෙත්න පිටුපස සිට හතරවන පේළියේ කොණට ගොස් අසුන් ගත්තේ එතැන එතරම් සෙනග නොවූ බැවිනි.

"නංගිලාවත් මෙතනට ගමුද?"

"ඒ ලැජ්ජ නැද්ද........ කොල්ලෙක් එක්ක ෆිල්ම් බලන ගමන් නංගිලව පැත්තකින් තියාගන්න. ගුටිනොකා ඔන්න ඔහොම ඉන්න........"

"මම අදයි දන්නේ ඔයා හින්දි ෆිල්ම්වලට ආසා බව" සඳරු කියද්දී අන්දුන් කුන්දුන් වූ නෙත්න,

"මම........?........ ආ........ ආ........ ඔව් ඔව් මම හරි ආසයි. ඉස්සර ඉඳලම" යැයි කීවේ කස්තුරි කොහේදැයි බලමිනි. ඔවුන් දෙදෙන විරුද්ධ පැත්තේ පහළින් වූ පේළියක සිට අත වනනු දුටු නෙත්න සඳරු දෙස බැලීය.

"හා........ දැන් ඉතිං කියන්න අද මේ මාව ෆිල්ම් බලන්න එක්ක ආවෙ ඇයි කියලා" ඔහු චෝදනාව සඳරුගේ පසට හැරවීය.

"මම එක්ක ආවා........? හරි ඔන්න ෆිල්ම් එක පටන් ගන්න යන්නේ කෑ ගහන්න එපා........" විදුලි ආලෝකය නිවී සිනුව නෙවන වර නාද වෙද්දී සඳරු පැවසුවාය.





"එතකල් තමා බලා හිටියේ"

"මොනවටද?" ඇය ඇසුවේ එකවරමය.

"මොනාටද ෆිල්ම් එක බලන්නනේ........" කටට කඩා ගත් චුවින්ගම් එකේ ඉතිරි භාගය ඇය මුවට දමමින් නෙත්න කීවේය.

අයිශ්වර්යා රායි හා අර්ජුන් රාම්පාල් ප්‍රධාන චරිත මවන මෙම චිත්‍රපටය තමා මීට පෙර සී. ඩී. පටියක් මගින් නැරඹූ බව නොකිව යුතුයැයි නෙත්නට සිතිණ.

"අයිශ්වර්යාගේ ලස්සන........ නේ........"

"හ්ම්........"

"මොකද හ්ම් ගාන්නේ?"

"මම ආවේ නිළියන්ගේ මූණු බලන්න නෙවි"

"එහෙනම්........?"

"මේක නම් පරණ ටියුබ් ලයිට් එකක්........" නෙත්න හෙමිහිට කෙඳිරීය.

"මොකක්ද හිමිට කිව්වේ?"

"ගෙදර හිටියානම් මොන සැපද කියලා........"

චිත්‍රපටය බලා සිටින සඳරුගේ අවධානය සම්පූර්ණයෙන්ම එහි මිස වෙන තැනක නොවේ. අලුත් කාරෙකක් රැගෙන කථා නායිකාවගේ සැමියා නිවසට එන දර්ශනයේදී,

"ආ........ දැන් මම හිතන්නේ ඕකෙදි ගස්බන්ධ මැරෙයි"

"ඔයා කොහොමද කියන්නේ?"

"මම නිකං කිව්වේ........ නැතිනම් ඉතින් අරුන් දෙන්නගෙ ලව් ස්ටෝරි එක දුවන්නේ කොහොමද?"

"පව් නේද අර්ජුන්........ බොහ හැටි"

........ස්ක්‍රීන් එකේ ඉන්න නළුවො ගැන දුක කඩා හැලෙනවා........ ළඟ ඉන්න මා ගැන මෙකිට ගානක් වත් නෑ........ මේ වෙලාවට තමා මෙන්ඩිස් බෝතලයක් ගෙනත් උඩ බලන් ගහන්න හිතෙන්නේ........ නෙත්න සිතුවේ පුටුවේ ඇන්දට හේත්තු වී ඉදිරියෙහි හිස් පුටුවට දෙපා තබමිනි. දෙපා තබා ආපසු ගනිද්දී වාඩිවෙන කොටස උඩට ගොස් යළි වැටුණේ නැඟුණු ශබ්දයෙන් යාබද අසුන් දෙකේම සිටි අය හැරී පිටුපස බලනු දුටු සඳරු,

"මොන්ටිසෝරියක් ගෙනාවා වගේ කොල් ලෙට" යනුවෙන් ඇගේ දෙ පවසමින් නෙත්නගේ අතට ගසද්දී නෙත්න එක් වරම ඇගේ අත

තම අතට සිරකොට ගෙන තද කළේය. සඳරු නෙත්න දෙස බලනු ඔහු දුටුවද නොදුටු ලෙස ඉදිරිය බලා හුන් නෙත්න හෙමිහිට ඒ දිගු ඇඟිලි තම අතැඟිලි වල පටලැවීය. ඒ අතේ වූ උණුසුම ඒ දිගු අතැඟිලි තම අතේ පැටලෙද්දී තම හදවතට දැනෙන හැඟීම් වල නුහුරු බවට සඳරුගේ හදගැස්ම වේගවත් වූවා සේ විය. ඇය හෙමිහිට හිස හරවා ඔහු දෙස බලද්දී නෙත්න තමා දෙස බලා සිටිනු දර්ශන තිරයෙන් වැටෙන ආලෝකයෙන් සඳරුට පෙනිණ. නෙත්න හෙමිහිට ඇය හා බැඳුණු අත එසේම තිබිය දීම එම අතේ වැලමිට සඳරුගේ අතේ වැලමිට තුළට ඇයව තමා වෙතට ඇදගනිද්දී සඳරුද ඔහු වෙත ඇදී ආවේ ලා පතක් මෙනි.........එතරම් ළඟින් ඒ දෙතොල තමා ළඟ තිබෙනුයේ පළමු වතාවට බව නෙත්නට සිහිපත් විය.

ඔහු ඇයගේ වැලමිට අතහැර ඒ අත ඇය උරහිස වටා යවා ඇයව තමා ළඟට ළංකොට ගත්තේය. හෙමිහිට ඔහු ඇයගේ මුහුණට මුහුණ හේත්තු කළේය. අනෙක් අතින් ඇයගේ අත අල්වා ගත් නෙත්නට ඒ අතේ සීතල බව ඇති සිතා නැඟිණ.

"මොකද බයවෙලා......... මම කයි කියලා හිතුවද.........?" ඔහු ඇසුවේ තම දෙතොල ඇය නළල් තලය මත තබමිනි. ආදරය......... අනුරාගය වැනි හැඟීම් කිසලෙක වත් හුරු පුරුදු නැති නොසිඳුල් යුවතිය නෙත්නගේ මේ ආලිංගනයෙන් විශාල අතරමං වීමකට බඳුන්ව සිටියාය. විවාහ වී මාස දහ හතරකට පසු පිරිමියෙකුගේ පහස තම සිරුරේ ඇවටෙද්දී තම සිත සොයන ආදරය ඒ උණුසුමේ පහසේ ඇති බව වැටහෙද්දී තමා කළ යුතු නිවැරැදිම දේ සිතා ගන්නට ඇයට නොහැකි වූවේය.

"සඳු.........???........." එය තමාට වන්නට ඇත......... බොහෝ දුර ඈත දවසකදී ඔහු හමු වූ දාට සිට මේ අද වන තුරු තමාගෙ නමින් හෝ වෙනත් කිසිම නමකින් තමා අමතා නැති මේ යෞවනයා මේ අරුම පුදුම හැනැත්තා ඔහුටම ආවේණික නමක් තමා වෙනුවෙන් සොයා ගෙන ඇත......... ඇයගේ ගැහැනු ආත්මය, මෙතෙක් කලක් නිකලැල්ව පිවිතුරුව තිබූ ආත්මය දෙදරා ගියේ ඒ ඇමතීමෙනි. ඇය එක්වරම තිගැස්සී ඔහු දෙස බැලුවාය. එහෙත් ඒ හාම තමා කවුදැයි යන්න සිහිපත් වූවා සේ ඔහුගේ උණුසුමින් මිදෙන්නට උත්සාහ කළාය.

"හැමදේම තේරිලත් ඇයි නොතේරී වගේ ඉන්නේ" ඔහු ඇසුවේ ඇය මුදාගන්න හදන අත මුදාගන්නට ඉඩ නොදෙමිනි.



"ඔයා සිහියෙන්ද ඉන්නේ?"

"සම්පූර්ණයෙන්"

"එහෙනම් ඇයි මේ......... මතක නැතුවද ඔයා මගේ කවුද කියලා........."

"හොඳට මතකයි"

"අනවශ්‍ය බැඳීම්......... දුක්, හිතට ගන්න උත්සාහ කරන්න එපා......... නියති, නස්රිනා........."

"ඒ ඔක්කොම බොරු" ඔහු කීවේ ඇය යළිත් තම අතේ වෙලා ගනිමිනි.

"නස්රිනා මම දන්නෙ නෑ. ඒත් නියති ඇත්තක් බව ඔයාටත් වැටහේවි......... අද හෙටම"

"ගෙදර මට වැඩක් නෑ......... මට ඕන ඔයා........."

"ඔය ඔක්කොම වැඩක් නැති උණත් රොෂාන් ඉන්නවා......... ඔයාට ඒ ප්‍රශ්නෙ බොරු කියන්න බෑ........."

"ඉතිං ඒක අතාරින්න......... ඔයාටවත් කාටවත් වැඩක් නැති කසාදෙ අතාරින්න........."

"දෙයි......... යනේ......... ඔයා මොනවද කියන්නේ?"

"එහෙනම් ඔයා හැමදාම ඔය දුකේ ඉන්නද හදන්නේ......... සතුටක් ද මේ ජීවිතේ"

"මට පුළුවන් තරම් මම ඉන්නම්......... ඔයා ඒක බරක් කරගන්න එපා"

"එතකල්ම මටත් මේ දුක තනියම විඳින්නද කියන්නේ?"

"ඇයි ඔයා දුක් විඳින්නේ......... ඔයාගෙ අනාගතේ ඉස්සරහ හිටගෙන නියති ඉන්නවා. එයත් එක්ක ජීවිතේ........." නෙත්න ඇයගේ දෙතොල මත තම ඇඟිල්ල තැබීය.

"මේ කටින් මට ඕව අහන්න ඕන නෑ......... මට අහන්න ඕන එක දෙයයි" නෙත්න කියද්දී එයට ඇයගේ විරුද්ධත්වය පවසමින් හිස සැළුවාය.

"මට ඔයා කියන දේ කරන්න බෑ......... ප්ලීස් තේරුම් ගන්න........."

"මම මෙච්චර කල් ඔයා කියන දේ කරන දේ බලා හිටියා......... ඔයා මගේ හිත තේරුම් ගත්තේ නෑ......... මට තවත් ඉන්න බෑ........." එසේ කියූ නෙත්න ඇයගේ අත තම ඇඟිලිවල පටලවා ගත් ගමන්ම ඇදගෙන සිපගත්තේය.

"ප්ලීස් නෙත්න........."

"ආයෙ කියන්න......... මට ආසයි අහන්න"

"මට බෑ........"

"ඔය නම ඔයාට කියන්න වෙනවා දරුවෝ......... වෙන නම හිතේ තියනවා නම් අහාරින්න" එසේ කියූ නෙත්න තම උරහිස දෙසට ඇය හිස හේත්තු කොට ගෙන සිප ගත්තේය. බොහෝ දයාබරව මෘදු ලෙස ඔහු තම හිස සිපගත් අයුරු දුටු සඳරුට ඉකිබිඳින.

"අඬන්න එපා රත්තරං......... මම ඔයාව බලාපොරොත්තු වෙන්නද කියන්න?"

"එපා දෙයියනේ......... කියන දේ අහන්න"

"මට බෑ ඔයා නැතිව විනාඩියක්වත් ඉන්න......... මේ ජේන්ගෙ" "මට බෑ ඔයා නැතිව විනාඩියක්වත් ඉන්න......... මේ ජේන්ගෙ නැද්ද මම......... පිස්සෙක් වගේ ඔයාට ආදරේ කරනවා........." නෙත්න කියද්දී ඔහුගේ කටහඬ බිඳී ගියෙන් ඔහු තම බිඳුණු හඬ වැයමෙන් නවත්වා ගත්තේය. ඔහුගේ කටහඬේ වූ වෙනස වැටහුණු සඳරු වහාම ඔහු වෙත හැරුණාය.

"මම දන්නවා දෙයියනේ......... මට නොතේරී නෙවී......... ඒත් මට ඔයාට කැමති වෙන්න බෑ........."

"ඇයි සඳු......... ඇයි......... මට කියන්න......... අඩුගානේ හිත හදාගෙන මෙහෙන් යන්න ඕන........."

"යන්න......... ඒ......... ඒ කො......... හේ.........ද?"

"ඇමරිකා" නෙත්න හෙමිහිට පැවසීය. ඔහු ඊයෙ සිටම සිතමින් සිටියේද ආපහු ඇමරිකා යාම ගැනය.

"ඔයාට බෑ එහෙම ඇමරිකා යන්න........." ඇය බියපත්ව පැවසුවාය.

"ඔයා මට වචනයක් නොදෙනවා නම් ඔයාට අයිතියක් නෑ මට බල කරන්න"

"මම දන්නවා......... මට මොනම දේකට වත් කිසිම අයිතියක් නෑ කියලා......... ඒක නිසා තමයි මම මේ ඉඳීම ඉන්න හදන්නෙත්........."

"ඔයා හිතලා ඔයා විහින්ම පුංචි කුඩුවක් හිරගෙයක් හදාගෙන ඒකට කොටුවෙන් එපා සඳු......... ඕකෙන් එළියට එන්න......... ඕතනින් එහා ඔයාට ලෝකයක් තියනවා. ඔයා බය ඇති අල්ලපු අත්ත නැති වේවි කියලා. පය ගහන්න අත්තකුත් නැති වේවි කියලා. ලෝකෙ කියන්නේ වැරදිලා දෙකට බෙදිච්ච පොල් ගහක් වත් පුවක් ගහක් වත් නෙවී. එල්ලිච්ච අත්තෙම එල්ලිලා ඉන්න. ඔයාට බය නැතිව අත්ත අහාරින්න පුළුවන් නම් ලෝකෙ කියන්නෙ ලොකු විශාල ගහක් අතු පතර බෙදිච්ච, තව ඕන තරම් අතු......... ඉති තියනවා........."





"ප්‍රශ්නෙ ඒක නෙවී නෙත්න......... මම පනින්නෙ දන්නෙ නැති කම ගැන......... පනින්න බයකම ගැන. මට බෑ අම්මලාගේ බලාපොරොත්තු විනාශ කරන්න......... මට බෑ කසාදෙ කඩාගෙන ගියා කියලා අහන්න. එහෙම අහන්න තරම් මගේ හිතට ශක්තියක් නෑ නෙත්න.

මේ අහන්න......... මට ඔයා එක්ක තරහ වෙන්න බෑ......... මට ඔයා එක්ක කථා නොකර ඉන්නත් බෑ. ඒක නිසා මම ඔයාගෙන් වැඳලා ඉල්ලන්නේ ඔය හිතේ තියන දේ අතැරලා දාන්න......... මම ඔයාගෙ නැනා. අයියගෙ වයිෆ්"

"ඔයාට ඒක මතක් උණේ මාස දහ හතරකට පස්සෙද, මොකද......... අපි දෙන්නා දන්න අඳුනගත්ත දවස්වල හිටම එකට හිටියා. මම ඔයාට මගේ හිතේ තියෙන දේ ඇඟෙව්වා......... ඒ එක මොහොතක වත් ඔයාට මතක් උණේ නැද්ද ඔය දේ"

"මතක් උණා......... ඇයි නැත්තේ.........?"

"මතක් උණා නම් ඇයි මම ඔයාට ළං වෙනකොට සද්ද නැතිව හිටියෙ. ඇයි ඉඩ දුන්නෙ මට, ඔයාට ළංවෙන්න ඔයාට ආදරේ කරන්න........."

"මම ඒක හිතලා කරපු දෙයක් නෙවී. මම ඔයාව ප්ලෑන් කරලා මා ගාවට ගත්තෙ නෑ. මමත් මනුස්ස දුවක්. ජීවිතේ කවදාවත් අත්දැකලා නැති දෙයක් ළඟ තියෙද්දී ඒක විඳින්න හදවතේ තියන කැමැත්ත ලොකුවට ඉස්මතු වෙනවා. ඔයාගෙ යාලු කම, ඔයාගෙ දඟකාර කම, හිතවත් කම, කථා කරන විදිය. බලන විදිය......... ඒ හැම දෙයක්ම මාව ඔයා ළඟට කිට්ටු කළ බව මට පිළිගන්න වෙනවා ඇත්ත. ඒක නිසා......... ඒ උණත්......... ඒ කිසි දෙයක් නිසා මට මගේ යුතුකම් වලින් නිදහස් වෙන්න බෑ........."

"හරි ඔයා ඔයාගෙ වගකීම් ඉෂ්ට කරන්න. යුතුකම් ඉෂ්ට කරන්න......... ......... ඕන දෙයක් කරන්න. මම තව පොඩි කාලයක් දෙන්නම් එතනින් එහාට එක්කො ඔයාට මගේ ජීවිතේ වෙන ඕනම දේකට වගකියන්න වේවි......... එහෙම නොවී මට ඕන විදියට උණොත් මම ඔයා ගැන වගකීම භාරගන්නම්......... හැබැයි මෙන්න මේ දේ ඔයාට මතක තියාගන්න වෙනවා......... මම ඔයාව මැරී කරනවා. තව අවුරුද්දක් යන්න කලින් හොඳින් හරි නරකින් හරි මම ඔයාව මැරී කරනවා......... ඒක නිසා ඔයාගෙ නව තියනවා නම් ප්‍රශ්න මේ අවුරුද්ද ඇතුළත ඉවර කරගන්න. ඔයා හිටවා එහෙම මටත් බෑ

ඔයා එක්ක තරහ වෙලා ඉන්න......... මේ හුස්ම මේ උණුසුම මට ඉව වැටිලා ගොඩක් කල්......... එදා සිට මං කෙල්ලක් ගැන හිතලා නෑ......... ඒ නිසා ඔයාටත් මම කා ගැනවත් හිතන්න දෙන්නෙ නෑ........."

නෙත්න කීවේ ඇයගේ දෙනෙත් පූ කඳුළක් පිසදමමිනි.

"මම අද මෝඩ වෙනවා ඔයා එක්ක ඒ දවස්වල ඒ තරමට හිතවත් වෙච්ච එක ගැන. එහෙම නොවුණා නම් ඔයාට මා ගැන මෙහෙම හිතෙන්නෙ නැහෙ" සඳරු කීවේ වේදනාබර හඬිනි. එය ඇසූ නෙත්න සිනාසුණේය.

"ඔයාට ඔකට හරි උත්තරේ කවදා හරි ලැබේවි. ඒක ඔයා නොදන්නවා උණාට දෙතුන් දෙනෙක්ම දන්නවා. සමහර විට තියහිත් කවදා හරි අනුමාන කරාවි. මම ඔයාට ආදරේ කළේ ඇයි කියන වග" නෙත්න කීවේ බරවූ හදවතිනි.

"මට ගෙදර යන්න ඕන"

"එපා......... දැන්ම යන්න බෑ......... අද මා ගාවට වෙලා ඉන්න ඕන......... ඔයා දැන් ඉතිං යන්නේ මගෙන් ඈත් වෙන්නනෙ........." නෙත්න කියද්දී සඳරු සුසුමක් හෙළුවාය. තමාට කෙතරම් ඔහු ඕනෑදැයි ඔහු දනීනම් ඔහුට තමා ආදරේ කරන තරම ඔහු දනී නම්......... තමාගේ පණ වුව ඔහු නමට දිය හැක......... එහෙත් ඔහු වෙතට ඒම......... එය කළ නොහැක්කකි.

පවුලේ භේද ඇති කරන්නට තමා හේතු වූ බවට චෝදනා ඔවුන් නගනු ඇත. දැනටම තමාට විරුද්ධව මහුම් කැරලි ගසන්නිය. ඒ අතරට රොෂාන් හා නෙත්න බද්ධ වෛරක්කාරයන් කිරීමට තමාට නොහැක. තමා ආදරය කරන ඔහුව අනුන් ඉදිරියේ පහතට හෙලීම කොහෙත්ම කළ නොහැක.

නෙත්නගේ සෙනෙහස අභියස තමා කිරි දරුවෙකු සේ නැමෙන බව ඇයගේ හදවත පිළිගත්තා කරුණකි. එහෙත් එයට සුවිශාල හේතුවක් තිබේ. එය කෙසේ මොවුනට කියන්නද.........

"අපි හෙට ගෙදර යමු........." නෙත්න හදිසියේම ඇසුවේය.

"ඔයා යන්න. මම එන්නම්......... තව දවසක් දෙකක් ඉඳලා"

"පිස්සුද දැන් ඉතිං ඔයා නැතිව මට ඉන්න බෑ......... කොහේ ගියත් ඔයා අරගෙන යනවා මීස. අවුරුද්දකට පස්සේ ඔයා කරන කියන දේ අනුව සමහර විට මම රට අලා සදහටම යන්න ඉඩ තියනවා"





"ඔවා ගොඩක් දුරට වෙනස් වේවි......... ඔයාට තව මාස තුන හතරකින් මැරි කරන්න වේවි......... මම තියනිට කියනවා ඉක්මනට ඔයාව බැඳගන්න කියලා"

"හරි ඔයා ඒ දේ කරන්න......... ඔන්න බලන්න මම ඊට කලින් තියනිව ඇමරිකා යවන හැටි. ඒ ළමයා මෙහෙ ඉඳලා නාස්ති වෙනවා......... මට තියනිව බැඳල වැඩක් නෑ......... බොළඳ වැඩියි. සුරතල් වැඩි. එයාට බෑ මාව බලාගන්න. මටයි උකුලෙ තියලා එයා නලවන්න වෙන්නෙ. ඒ වගේ ගෑනියක් ගැන හීනයක් වත් මගේ හිතේ නෑ......... මම ගෑනියෙක්ව හිතේ ඇඳගෙන තිබුණා. ඒ ගෑනි මට මුණ ගැහිලා තියනවා. එයා කොහේ, කවුරු ළඟ හිටියත් අයිති කරගන්න මම මගේ හිතට පොරොන්දුවක් දුන්නා.........

මට තියනි මගේ වයිෆ් විදියට ඕන නැති උණාට මගේ නංගි විදියට මම එයාට හරි ආදරෙයි. මෙහෙ ඉඳලා එයා නාස්ති වෙනවා......... ගෙදරක හදපු සතෙක් කැලේකට ගිහින් ඇලා වගේ වැඩක් දැන් එයාට වෙලා තියෙන්නේ......... එයා දැන් නිදහසේ සීමාව පන්නලා වැඩ කරනවා......... ඔහොම ගිහින් එයා අමාරුවෙ වැටේවි. නැන්දා මාමා උණත් අන්තිමට දොස් කියන්නෙ මට"

"ඒත් මම මේ ගෙරද නොහිටියා නම් ඔයා තියනි බඳින්න කැමැත්තෙන් හිටියේ"

"මට ඔයාට බොරු කියන්න බෑ සඳු......... ඇමරිකාවෙ ඉද්දි මගෙ මනස හරි සරලයි. සැහැල්ලුයි නිදහස්. ඔක්කොම රොක් වගේ තමා......... ජීවිතේම. ඒ ජීවිතේට තියනි ඇති. උදේ නැගිට්ටා කෑවා වැඩට ගියා. හවස ආවා. පාටි......... රෑට කෑවා නිදාගත්තා. ඒත් අපි අදහන දෙයක් තියනවා නෙ දෛවය කියලා. දෛවය දවසක් මගේ යන මාවත වෙනස් කළා......... එක පින්තූරයක් පෙන්නලා. මම ඇමරිකාවෙ නෙවි ඇන්ටාර්ටිකාවේ හිටියත් දෛවය අපට අපේ උරුමය මුණ ගස්වනවා වගේ එක දවසක් ලංකාවෙන් ආපු ෆොටෝ එකක් ඉන්ටනෙට් එකෙන් දැකලා මගේ ජීවිතේ එක තත්පරෙන් වෙනස් උණා.

රොක් ජීවිතේ ඉවර උණා......... නෙත්න කල්පනා කරන්න පුරුදු උණා......... ඇමරිකාවේ තව එක මොහොතක් ඉන්න බෑ කියලා හිතෙන තරමට අර ලස්සන සුදු මූණ බලන බලන පැත්තේ පේන්න උණා......... අන්තිමට මාමට අම්මිට සේරටම පාතිය දාලා ලංකාවට ආවා......... ඒ මූණ දැක ගන්න. ආ වෙලේ සිට දැනෙඩවා......... මූණ

බලා ගන්න........ ඒත් ගොඩ වෙලාවක් ගිහිල්ලා තමා මට එයාව මීට් උණේ........"

"නස්රිනා........"

"නස්රිනා නෙවි........ එයා වගේ අනිත් කෙනා........" නෙත්න කිවේ ඇයගේ උරහිස වටා යැවූ අතින් ඇයව තමා වෙත නතු කර ගනිමිනි. ඇය බියපත් වූවක සේ මේ සියල්ල අසා සිටියාය.

"ඔව් බබා........ ඒ ඔයා........ අයියගේ වෙඩින් ෆොටෝ එක ඇකලා මම මගෙන්ම අහන්න ගත්තා මට ඕන කරන කෙනා........ මම පතන කෙනා........ කොහොමද අයියට අයිති උණේ කියලා........"

"ඔයා මාව ඇකලා වත් නැති කොට ඇයි ඒ වගේ වැරදි දෙයක් කළේ?" සඳරු අසද්දී සිනාසුණ නෙත්න තම සාක්කුව තුළ වූ මොබයිල් ෆෝනය අතට ගෙන එහි වූ ඔහු ඇඳි චිත්‍ර කිපයක් ඡායාරූප කිපයක් ඇයට ඇක්විය.

"මගේ........"

"ඔයාගෙ නෙවි සඳ........ මගේ ගිහේ හිටිය කෙල්ලගෙ........ මේක මම ඇන්දෙ මට අවුරුදු විස්සෙදි. මේකත් අවුරුදු විස්සෙදි දහනවේදි විතර. ඒත් මේක........ මේක අඳින කොට මට වයස දහතයි. ඔහු කියද්දී මේ සියල්ල අරුම පුදුම වූ දේවල් ලෙස නෙත් අයා බලා හුන් සඳරු අවසානයේ නෙත්නගේ ළයේ මුහුණ ඔබාගෙන හඬා වැටුණාය.

"මම මේ සේරම ගෙනත් ඇත්තේ........ ඒවයෙ දින දවසක ඔයා දකීවි" ඔහු කිවේ වේදනාව මැඩ ගන්නට බොහෝ උත්සාහ දරමිනි.

"මට ඔයාට බල කරන්න අයිතියක් නෑ........ ඒත් මගෙ ආදරේ ඒ තරම් ලාභ දෙයක් කියලා හිතන්න එපා........" නෙත්න කිවේ චිත්‍රපටය නිමා වූ බව දකිමිනි.

ආපසු එන ගමනේදී කිසි දෙයක් සිදු නොවූ ලෙස ඉන්නට නෙත්න තීරණය කළේය. ඒ නිසාම ඔහු හුරු පුරුදු කෙළිලොල් බවින් යුතුව කස්තුරි හා කසුන් සමඟ කථා කරමින් සිනාසෙමින් ආවේය.

"චූටී ඒට ආප්ප කමුද........?"

"අයිඩියා එක නරක නෑ........ ඒයි අක්කේ අර ඉස්සරහ නවත්තන්න........" සඳරු පාර අයිනට කොට රථය නතර කොට බිමට බසිද්දී එහි ආ නෙත්න ඇයගේ අත අල්වා ගත්තේය.





"යමු........ හැබැයි වාඩි උණාම නොකා ඉන්න බෑ" නෙත්න හෙමිහිට කියද්දී ද සඳරු නිහඬව විසූවාය.

"හාපෝ නෙත්නයියා මෙතන මහ කරච්චල් නැතක්නේ........ කැසට් දාලා කන පැලෙන්න" කසුන් කිවේ දෙකන් අතින් වසමිනි. අසල වූ මේසයක ඔවුන් අසුන් ගන්නා අතරේ එහි පැමිණි සේවකයා ඇමතූ නෙත්න,

"මල්ලි අපට ආප්ප, බිත්තර ආප්ප සේරම ගේන්න........ ඔයාගෙ කැසට් එකේ වොලියුම් ටිකක් අඩු කරන්න"

"හොඳයි සර්........" නෙත්න හා කසුන් මේසයේ පසෙක වාඩි වූ අතර අනෙක් පස සඳරු හා කස්තුරි විය. සඳරු සිටියේ නෙත්න ඉදිරිපස අසුනේය. නෙත්න ඇය දෙස බැලීය. ඒ දෙනෙත් රතු වී තිබුණේ හැඬීමෙනි. කස්තුරි සොයුරියට නොපෙනෙන්නට ඉඟිකොට නෙත්නගෙන් හරි දැයි අසද්දී ඔව් යැයි කියන්නට මෙන් නෙත්න හිස වැනීය.

මලේ මටත් හිතයි කරන්න ආදරේ
තනිකමේ පාළුවේ උන්නා ඇතිලු පාඩුවේ
නෙලා ගන්නෙ මමයි නුඹ මලේ........
තනි යහනේ නිදි නොලබා තැවුණු යාමයේ
සිහිනෙන් මේ ඇවිදින් නුඹ සෙනෙහස පිදූවේ
තනිකම මගේ සිතේ නිවුණා එදා ප්‍රේමියේ
සුවඳ සලන මලයි නුඹ මගේ........
සුවඳ මලේ පිපිලා නුඹ ජීවන උයනේ
අවදිකළා මගෙ යෞවන වසන්ත කාලේ
තනිකම මගේ සිතේ නිවුණා එදා ප්‍රේමියේ
සුවඳ සලන මලයි නුඹ මගේ........

ගීතය ප්‍රචාරය වෙද්දී සඳරුට නෙත්න දෙස බැලුණේ නොසිතාමය. එය දුටු නෙත්නට සිනා නැගිණ. මේ සියල්ල වැටහුණ කස්තුරි,

"නෙත්නයියා........ ඔයා සාක්කුවෙ තිබිලා කැසට් කැල්ල කොල්ලට දුන්නාවත්ද?"

"මාරයි නේද චූටී........ ඒවත් වෙලාවට යන හැටි" නෙත්න කියද්දී සඳරු නෙත්න දෙස රවා බැලීය. එහෙත් මේසය පහළ තම අසලම තිබූ ඇයගේ කකුල නෙත්න තම දෙකකුලට සිර කොට ගත්තෙන් සඳරු තම කකුල මුදා ගත්තේ ඉතා අපහසුවෙනි.

# 23

තිබුණාට වඩා සුවයක් පසුගිය දින තුන තුළ ඇතිව තිබුණේ සඳරුගේ බලා සොයාගැනීම හාතෙල් අතගෑම හොඳ නිසා බව වෙදමහතා පැවසුවේය. අමාරුව යහපත් අතට හැරීම ගැන සඳරුට දැනුණේ ඇඩි සතුටකි. නෙත්න ඇයගේ මුහුණේ පැහැබර බව බලා සිටියේය. වෙද මහතා අත අතගාමින් සිටි අතරේ සඳරුට අත අල්ලා ගන්නට කියා නැගිට ගියේ දුරකතන ඇමතුමකටය.

"මොකද අත හොඳයි කීවම හිනා උණේ......... ඉක්මනට මගෙ කරදරෙන් ගැලවෙන්න පුළුවන් නිසාද?"

"ඒකත් එකක්......... අනෙක් එක මම අතගාලා හොඳ කරපු අතනේ......... ඒකයි" සඳරු කීවේ ඔහු කී ඇනුම පදයට පිළිතුරු ලෙසිනි.

"හිතේ තියන සතුට වත් පෙන්නන්න, පිළිගන්න එපා........ උද්දච්ච කම"

"ඔයාට පේන හැටි........."

"මට පේන්නේ මූණෙ තියන දේවල් තමා......... අනිත් එක මම කිව්වනේ......... මා එක්ක තරහ වෙලා කථා නොකර ඉන්න එපා කියලා"

"ඉතිං, කවද කතා නොකර හිටියෙ"

"හිත දන්නවා නේද......... බොරුවට අහන්නේ.........ඒක නෙවි අපිට ගෙට විතර යන්න පුළුවන් අද වෙද මහත්තයාට කීවොත්......... කියමුද?"

"අත යන්නම් අඩු උණා විතරයි"

"වෙදමහත්තයා ඔතැ, වෙද හාමිනේ මා ගාව ඉන්න එකේ........."

"මම අම්මට හරි තියනිට හරි කියන්නම් කරන හැටි"

"එහෙමනම් ඉතිං අතට තෙල් තැවුවට කමක් නෑ" නෙත්න කීවේ තරහෙනි. සඳරු එසේ කීවේ එය කරන්නට නොවේ. එහෙත් නෙත්න දැන් ඉන්නේ ඕනෑම වදනකින් දුක දැනෙන ස්වභාවයක නිසා ඔහුට සඳරුගේ වදන් නිතරම අභියෝග ලෙස ඇනේ.........



"මකට තරහ ගන්න ඕන නෑ......... මම නිකම් කිවේ........."

"හිත රිද්දලා හරි ගස්සනවට වැඩිය කොච්චර හොඳද මුලින්ම නොරිද්දා ඉන්නවා නම්" ඔහු කීවේ සුසුමක් හෙළමිනි. එයින් සඳරුගේ ද සිත රිදී ගියේය. මේ ඇසුරේ කෙළවර මහා දුකක් මහා වේදනාවක් දෙදෙනාටම ගෙන එන බව ඇයට හොඳාකාරව වැටහෙයි. එහෙත් නෙත්න මේ සත්‍යය පිළිගැනීමට සූදානම් නැත. ඔහු හදන්නේ එක ප්‍රශ්නය ප්‍රශ්න ගොඩක් බවට පත් කිරීමටයි. ඔහුගේ ඉලක්කය කරා යාමටයි.

මසකට සෑහෙන තෙල් බෙත් වෙදමහතාගෙන් රැගෙන නිවසට ආ ඔවුන් පසුදින ආපසු යාමට සූදානම් වූහ. නෙත්නගේ ආපසු යාම ගැන කලුන් සිටියේ ඇඩි දුකකිනි. සෑහෙන දිනක් නිවසේ සිටි නිසා ඔවුන් ආපසු යාමෙ පාළුව ගෙදර හැමදෙනාගේම මුහුණු වල විය.

"නෙත්න පුතා......... අපට කියන්න ඉන්නෙ ඔයා විතරයි. සඳරු ගැන පොඩ්ඩක් කල්පනාවෙන් ඉන්න. ලොකු සර්රුත් මට කතා කරලා ගොඩ දේ කිවා බයවෙන්න එපා කියලා. ඒත් ඉතිං මේ ගෑනු දරුවෙක්නෙ. නිතරම ඉතිං අපේ හිත බයේ ඉන්න වෙන්නෙ"

"තාත්තා......... මට කියන්න බෑ බයවෙන්න එපා කියලා. මට කිවත් නැතත් තාත්තලගෙ හිතට ඒක එන නිසා. ඒත් මම එක පොරොන්දුවක් දෙන්නම්......... මෙයාගෙ කෙස්ගහකටවත් හානියක් වෙන්න මම ඉඩ දෙන්නේ නෑ කියලා. අපි දැන් ගිය ගමන් මම නඩුවෙන් සඳරුගෙ නම අස් කරනවා......... එතකොට ගොඩ ප්‍රශ්න ඉවරයි. රැට උණත් මම යන්නම් මෙයා අරගන්න......... අනෙක් එක තාත්තලට දැන් ඉතිං හිතුණ වෙලාවට කථා කරන්න පුළුවන්නෙ ......... ඒ නිසා ඒ ගැන එච්චරම හිතන්න එපා"

"නෙත්න පුතා......... ඔයා මට මගේ දරුවෝ තුන්දෙනා වගේම තමයි. වෙනසක් නෑ. සඳරු ගැන මම මෙහෙමවත් හිත හදාගන්නේ ඔයා ඉන්න නිසා. ඒත් පුතේ හතුරෝ කොතනත් ඉන්න පුළුවන්. දෙන්නම ඒක නිසා පරෙස්සම් වෙන්න." සඳරුගේ මව කියද්දී එය පිළිගත් බව ඇඟවූ නෙත්න මවට හා පියාට වැඳ සඳරු හා ගමනට පිටත් විය.

නිවසට ආවද නෙත්නගේ සිතට කිසිදු සැනසුමක් නොදැනුණේ ඔවුන් පැමිණ දින දෙකකින් රොෂාන් ද යළි නිවසට පැමිණියෙන්

ආවාට පසු සඳරු මුළුමනින්ම වෙනස් වී ඇති බව ඔහුට වැටහීමත් නිසාවෙනි. නෙත්න මාලිංග හා පියුමි සමග මේ ගැන පවසද්දී ඔවුන් පැවසුවේ මදක් ඉවසා බලා සිටින ලෙසය.

"උඹට ගහෙන් ගෙඩි එන්න වගේ මේ ප්‍රශ්නෙ විසඳන්න අමාරුයි. වෙන්නෙ මොනවද කියලා ටිකක් ඉවසලා බලපං"

"අපි එහෙම කිව්වට මාලිංග, මේ ප්‍රශ්නෙ තව පැති කිපයක් තියන බව අපි අමතක කරන්න හොඳ නෑ. මම අහගෙන රිද්මි අක්කියි, ආන්ටියි නියතිගෙයි නෙත්නගෙයි වෙඩින් එක ඉක්මන් කරන්න කථා වෙනවා. ඒකත් මම හිතන්නේ කරන්න හදන්නේ නියති ගොඩක් කට්ටියට වැටීලා කියලා. නෙත්න ඔයා මම මෙහෙම කියනවට තරහ වෙන්න එපා. මට දැන් කිප දවසක්ම තේරුණා නියති ඩ්‍රින්ක්ස් ගන්නවා කියලා. මන්දා මට හිතුණ හැටිද කියලා. ඒත් පොඩ්ඩක් හොයලා බලන්න......... තාම පොඩි ළමයිනේ........." යි පියුමි කියද්දී නෙත්නට දැනුණේ දැඩි බියකි. මන්ද නැන්දාත් මාමාත් නියති ලංකාවට එවුවේ තමා ගැන පූර්ණ ලෙස විශ්වාස කරමිනි. තමා වෙනස් වුවාට ඔවුන් වත් නියති වත් පලි නැත. නියති කෙසේ වෙතත් නැන්දා හා මාමා මේ කිසි දෙයක් නොදන්නෝමය. ඒ නිසාම ඔවුන් රිදවීම තමාට කිසිසේත් කළ නොහැක. තමා පෙම් නොකළද තමා ඉමහත් ලෙස ආදරය දක්වන තම පුංචි නැනන්ඩිය පැමිණි ලෙස ඔවුනට භාර දිය යුතුය. කල්පනා කල නෙත්න පියුමි ඇමතුවේය.

"මම මේ වගක් දැනගෙන උන්නෙ නෑ. මට හිතෙනවා මම මගේ වගකීම් අමතක කළා කියලා......... අදම මම නියති එක්ක මේ ගැන කථා කරන්න ඕන........."

"ඒක හොඳයි......... මොකද ඔයාගෙ වෙනස උණත් එයාට තේරෙනවා ඇති නේ........."

"මම දන්නේ නෑ පියුමි මේකට කරන්න ඕන දේ......... මට නියති ගැන දුකයි......... ඒත් ඒ අහිංසක කෙල්ල අමාරුවෙ දාන්න මට බෑ. දැන් මම මේක කියූවාම එයාට හරියට දුක හිතේවි. ඒත් ඒ දුක තාවකාලිකයි. මම එයාව බැඳගෙන එයාව අමාරුවෙ දාන්න මට බෑ" නෙත්න කියද්දී මාලිංග හිස වැනුවේ ඔහු අනුමත කරමිනි.

රාත්‍රි නිවසට ආ නෙත්න නියති සොයා ඇයගේ කාමරයට යද්දී නියති සිටියේ නිදාගෙනය. නෙත්න එහි ගොස් කථා කොට ඇය නැගිටුවන්නට හැදුවද නිදිමත බවක් ඇඟවූ ඇය යළි දෙනෙත පියා ගත්තාය.





"බොරුවට නිදාගත්තම නැගිටින්න අමාරුයි කියනවනේ. හරි දැන් ඔයා නිදාගන්න. ඒත් මට ඔයා එක්ක අනිවාර්යයෙන් කතා කරන්න ඕන" එසේ කියා නියතිගේ පොරවනය සකස්කල නෙත්න විදුලි පහන නිවා දමා පිටව යද්දී හිස හරවා එදෙස බැලූ නියති ඉකි බින්දාය.

.........ඔයා වෙනස්වෙලා නෙත්නයියා. ඇමරිකාවේ හිටි ඔයා නෙවී මාව ගන්න එයා පෝර්ට ආවේ. ඒත් මම හිතුවා ලංකාවෙදි දැනෙන වෙනස විතරයි කියලා......... ඒත් එයා සම්පූර්ණයෙන් වෙනස් වෙලා ......... එයාව වෙනස් කළේ කවුද......... ඒ නස්රිනා මද......... එහෙම නැති නම් වෙන ඒටත් වැඩිය බලගතු කෙනෙක්ද කියන්න මට තේරෙන්නෙ නෑ......... ඒත් මා එක්ක පුංචි කාලෙ ඉඳලා එච්චර ආදරෙන් හිටි එයා වෙනස් වෙන්න නම් හරි ලොකු වැදගත් දෙයක් වෙන්න ඕන......... ඒ වැදගත් දේ නස්රිනාද.........

විශ්වවිද්‍යාලය යළි ආරම්භ වූයෙන් සඳරු නැවතත් වැඩ අධිකතාවයේ සිරවූවාය. වික්‍රමසේකර සමූහ ව්‍යාපාරයේ සියලුම සම්බන්ධීකරණ කටයුතු ඇයගේ අධීක්ෂණය යටතට වැටුණේ නිරායාසයෙනි. ඇය මේ සියලු කටයුතු කරන අතරේ අධ්‍යාපන කටයුතුද කළ යුතු වූයෙන් ඇයට විවේකයක් නොලැබුණු තරම් විය.

ගමේ ගොස් ආවාට පසු සඳරු හැකි තාක් දුරට නෙත්න මග හැරියාය. එහෙත් ව්‍යාපාරික කටයුතුවලදී ඔහුට උපරිම සහය ලබා දෙමින් ඔහුගේ කටයුතු පහසු කළාය. නෙත්න සඳරුගේ වෙනස ගැනද සිටියේ තදබල ලෙස කම්පාවූ සිතිනි. දිනක් ඔහු කාර්යාල කාමරයේ පුටුවට වී දෙනෙත පියාගෙන සිටියේ ඔහු හිස රිදෙන්නට වූ බැවිනි. මන්ද මොහොතකට පෙර මෙහි පැමිණි සඳරු රාජකාරී ලෙස කථා කළ යුතු සියල්ල කථා කරගෙන ගියා මිස සාමාන්‍ය අයුරින් ඔහු හා වදනක් හෝ නොදෙඩුවාය. මේ තරමට තමාට රිදවන්නට ඇයට හැකි කම ලැබුණේ කෙසේදැයි ඔහු සිතුවේ වේදනාවෙනි.

සඳරුගේ ආගමනය හා නෙත්නගේ වෙනස හොඳින් අවබෝධ කරගත් ප්‍රියලාල් නෙත්න ඇමතීය.

"සර්......... සර්ගෙන් දෙයක් අහන්න ඇත්ත කියනවද?"

"මොකක්ද?"

"සර්ගෙ ඔළුව කැක්කුමට හේතුව සඳරු මිස්ද........." ප්‍රියලාල්

"සර්ගෙ ඔළුව කැක්කුමට හේතුව සඳරු මිස්ද........." ප්‍රියලාල් ඇසුවේ මුගහැරීමට අවස්ථාවක් නෙත්නට නොදෙන ලෙස ඔහුව දෙනෙතින් අල්ලා ගනිමිනි. තමාට ඉතා හිතවත් සේවකයාට බොරුවක් කියන්නට නෙත්නට නොසිතුණ බැවින් නෙත්න ඔව් යැයි හිස වැනිය.

"හොයාගෙන ගියපු විමුක්තිය ලැබිලා නෑ කියලා එනකොටම මට තේරුණා......... ඒත් ඇයි සර් මේ වගේ දරුණු තීරණයක් ගත්තේ......... සර් දන්නවා නේද ඒ කවුද කියලා?"

"ඔව්, ඇනගෙන තමා මුලින්ම ඔක තීරණය කළේ. එයා මගේ අක්කා නංගි නෙවි නම්......... එතනින් එහා නැකම් බොරු......... ඔයා බලාගෙන ඉන්න ප්‍රියලාල්, ඔයාලගෙ සඳරු මැඩමට මා ගාවට එන්න වෙන්නෙ නැද්ද කියලා"

"සර් මට තේරෙන්නේ නෑ......... මම දන්නෙත් නෑ මේකෙ අභ්‍යන්තරය කොහොමද කියන්න. මම සර්ටත් වඩා අවුරුද්දක් දෙකක් වැඩිමල් උණාට මම සර්ට ගරු කරන්නේ මගේම අයියා කෙනෙකුට වගේ......... මොකද මම දන්නවා සර් වැරදි කරන්නේ නෑ කියලා. අද මට මේක වැරදියි කියලා හිතුනත් ඒක හරි කියලා කරන්න සර්ගෙ පැත්තෙන් සාධාරණ හේතුවක් ඇති. ඒක දෙයක් කියලා තියන්නම් සර්......... සර් හරි දේ කරත් වැරදි දේ කරත්......... ඒක මට හරි......... මොකද මම සර්ට ආදරේ නිසා. කවදා හරි මෙතාම දේකදි හරි සර්ට මගේ උදව් ඕන උණොත් පැය විසි හතරේ ඕනම වෙලාවක මේ ප්‍රියලාල් සර් ළඟ ඇති. මට කථා කරන්න සර්"

"තැන්ක්ස් ප්‍රියලාල්......... මට ඔයාගෙ උදව් ඕන වෙන පළවෙනි මොහොතෙම මම ඔයාට කථා කරනවා. මොකද මම දන්නවා ඔයා මට හිතවත් බව. ඒත් මේ සටන කාගෙවත් උදව්වෙන් ගෙනියන්න බැරි දෙයක් ප්‍රියලාල්. මට තනියමයි මේ සටන දිනන් හරි පරදින්න හරි වෙලා තියෙන්නේ"

"පරදින්න හිතන් සටන් කරන්න එපා සර්........."

"එයත් දවසක් ඔක මට කිවා......... බලමු"

"සර් යනවද දැන්ම......... මම යන්නද?"

"නෑ ප්‍රියලාල් ගිහින් මේ සල්ලින් බැන්ක් කරලා ඔයාගෙ අනිත් වැඩ කරන්න......... හවස් උණොත් ඔෆිස් එන්න ඕන නෑ......... වාහනේ අරන් එහෙමම ගෙදර යන්න........."





"සල්ලි ටික දාලා මම යනවා සර් තේ පටවන තැනට. එතන මාර හොරු ටිකක් තේ ඉන්නේ. හෙන්ඩුව නැතුව මෙච්චල් කරන්න බැරි අලි වගේ කෑ ගහන්නේ නැතුව කිසි දෙයක් කරන්න බෑ......... මහ හොරු ටිකක්. වැඩ කරනවට ඇරෙන්න අනිත් සේරටම පඩි ගන්නවා" යි ප්‍රියලාල් කියද්දී නෙත්නට සිනහ නැගිණ.

"හරි හරි......... එහෙනම් එහෙත් ගිහින් බලලම යන්න"

ගිම්හාන බලා සිටියේ සඳරු එනතුරුය. දැන් යළිත් සිතට වසන්තය උදා වී තිබේ......... සරසවි නිවාඩුව නිමා වූයේ ගිම්හානගේ හදවත සතුටින් පුරවමිනි. දේශන සඳහා යාමට පළමුවත් දේශනවලින් පසුවත් ඔහුට ඇය හා කථා කරන්න ඉඩ ප්‍රස්ථාව සැලසෙයි. විටෙක සේම්නිද ඔවුනට එකතු වෙයි. දිනක් ඔවුන් දෙදෙනා පමණක් කථා කරමින් බස් නැවතුමට එද්දී ගිම්හාන සඳරු ඇමතුවේය.

"සඳරු......... මම ඔයාගෙන් දෙයක් අහන්න හිටියේ......... දැන් දවස් ගානක ඉඳලා, මේ සැරේ නිවාඩුවට ගිහින් ආවට පස්සෙ ඔයා කල්පනා කරනවා හරි වැඩියි. ඒක ඒ මට පේන හැටි කියලා විතරක් හිතන්න බෑ......... ඔයාගෙ මූණ දැක්කම. මොකද හේතුව?"

"ප්‍රශ්න නැතුවා නෙවි ගිම්හාන......... හේතුවක් නෑ කියලා මට බොරුවට කියන්න බෑ. හේතුවක් තියනවා. ඒත් ඒක මට කියන්න බෑ. ඔයාට පුළුවන් නම් ටික දවසක් මා එක්ක ඉන්න......... හැබැයි මම ඔයාගෙ කකුල් දෙක අල්ලලා වැඳලා කියන්නම් මා ගැන බලාපොරොත්තු තියාගන්න එපා කියලා. මට කවදාවත් ඔයාගෙ බලාපොරොත්තු ඉෂ්ට කරන්න වෙන්නෙ නැහැ."

"මම ඒක නොදැන ඉන්නවා නෙවි සඳරු......... දන්නවා. ඒත් මට ඔයාගෙන් ඈත් වෙන්න බෑ. අපේ මේ හිතවත් කම මේ යනවිදියට යාපු දෙන් කවදා හරි......... මොන විදියක හරි කෙළවරක් දකින කල්......... ඔයා බයවෙන්න එපා......... මම කවදාවත් ප්‍රශ්නයක් වෙන්නෙ නෑ ඔයාට. කැම්පස් එක මාරුකරන්න මම ට්‍රයි කළා. දැන් ඒක කරන්නත් බෑ" ගිම්හාන කියද්දි සඳරු බියපත් වූ ලෙස ඔහු දෙස බැලුවාය.

"කැම්පස් එක මාරු කරන්න.........? එච්චර දුඩුවමක් මට ලොකු වැඩියි කියලා ඔයාට හිතුණේ නැද්ද ගිම්හාන"

"මම දන්නවා ඔයාට දුක හිතෙන වග. ඒත් මමයි කියලත් මගෙ හිත හදාගන්න ඕනනේ සඳරු. ඔයත් එක්ක ඉන්න ඉන්න ඔයාව පේන්න පේන්න මගේ හිත ගොඩක් වැටෙනවා"

“එහෙම නම් ඉතිං මම කැම්පස් නැවිත් ඉන්න එක හොඳයි” සඳරු කීවේ දෙනෙතේ කඳුළු පුරවා ගෙනය. ගිම්හාන සඳරුගේ අත අල්ලා ගත්තේ නොසිතාමය.

“ඒ වගේ දෙයක් හිතන්න වත් එපා.......” ගිම්හාන හෙමිහිට පැවසීය.

නෙත්න සඳරු කැටුව යාමට පැමිණියේ බොහෝ දිනකට පසුවය. නිවසේ රියදුරන් දෙදෙනාම වෙන වෙනත් කටයුතුවලට ගොස් ඇති බැවින් මට කථාකොට කීවේ සඳරු කැඳවා එන ලෙසය. සඳරු තමා මග හරින බව දන්නා නිසාම මෙසේ කැඳවාගෙන ඒමට යාම පවා ඇයට කරදරයක් වනු ඇති බව නෙත්න සිතුවේය. එහෙත් කළයුතු දෙයක් නොමැත....... ඇය රැගෙන ආ යුතුය. අනෙත් අතට පංති නිමවූ පසු ඇයව පාරේ රඳවා තිබීම ඇයගේ ජීවිතයට තර්ජනයකි. ඒනිසාම නෙත්න මඳක් වේගයෙන් රථය පදවා ඇය සිටි තැනට ගියේය. එහෙත් ඇතදීම ඔහු දුටු දසුනින් ඔහුගේ දෙනෙත් ඔහුටම අදහාගැනුමට බැරි විය. එය....... එය....... තමා කෙසේ දකින්නද....... සිතන්නද....... නෙත්න ආ වේගයෙන්ම මහා ශබ්දයක් නගමින් වාහනය නතර කළේ ගිම්හාන සඳරුගේ අත අල්ලාගෙන සිටිද්දී ඔවුන් ඉදිරිපිටය.

මහ හඩින් ගැසූ බ්‍රේක් පහර නිසාවෙන් බිම බලාගෙන කඳුළු එන දෙනෙත වෑයමෙන් නවතාගෙන සිටි සඳරු හිස ඔසවා බැලුවාය. ඒ සැනෙන් වාහනය දුටු ඇයගේ දෙපා සීතල වී ගියේය. ඇය ගිම්හාන දෙස බැලුවේ දෙනෙත් ලොකු කරමිනි. ගිම්හාන ඇයට යන්නැයි පැවසීය. නෙත්න ගැන කිසිවක් නොදන්නා ඔහු සඳරුගේ බියපත් මුහුණ දෙස මොහොතක් බලා සිටියේය.

“ඔයා බයවෙන්න එපා....... අපි වරදක් කළායැ....... යන්න”

සඳරු හිස හරවා වාහනයේ සිටි නෙත්න දෙස බැලීය. නෙත්න සිටියේ සුක්කානමට වැලමිට ගසාගෙන ඉදිරිපස බලමින් ඇඟිල්ලක් දත් අතරේ තබාගෙනය. සඳරු හෙමිහිට රථයේ දොර විවර කොට නැංගාය. දොර වැසූ පසු වාහනය ඉදිරියට ගත් නෙත්න සඳරු තැතිගන්වන සුළු වේගයෙන් රථය පදවන්නට විය.

සැබැවටම නෙත්න සිටියේ සියවි තත්ත්වයේ නොවේ යැයි කෙනෙකුට සිතිය හැකි විය. ඔහු මෝටර් රථ ධාවකයකු සේ රථය පාරේ ඒ මේ අත කපමින් ඉතා අධික වේගයෙන් යන්නට විය.





සමහර මොහොතක සඳරුට සිතුණේ වාහනය දැන් හැපෙයි. දැන් හැපෙයි යන්නය. ඉතාමත් භයංකරව ගත වී ගිය කාලයකට පසු නිවෙස අද්දරට පැමිණි ඔහු රථයේ දොර හැරියේය. ඔහු තමාට එතැන් සිට පයින් යන්නට කියන බව වටහා ගත් සඳරු බිමට බසිනවාත් සමගම වාහනය යළි ඇය අසලින්ම හරවා ගත් නෙත්න පවනට බඳු වේගයෙන් යන්නට ගියේය.

“ආ....... සඳී දූ....... මොකද මේ පයින් නෙත්න ආවෙ නැද්ද?”

“ආවා අම්මී....... ඇවිත් මාව මෙතන දාලා හදිසි වැඩකට කියලා ගියා”

“අනේ මන්දා ඒ දරුවටත් ආ දවසෙ හිට කිසිම නිදහසක් නෑ.......”

“අම්මි පියුමි ආවද.......?”

“නෑ....... තාම....... එයාව නම් ගන්න ඩ්‍රයිවර් යාවි....... ආ....... ඔයා යන්න ගෙට....... මම තව ටිකක් එළියෙ ඉඳලා එන්නම්.......”

මිදුලේ වූ ඔන්චිල්ලාවක වාඩි වී සිටි මව සඳරුට කියද්දී ඇය ගෙතුළට ගියාය.

දිය නාගෙන කාමරයට ආවද සඳරුගේ සිතට කිසිදු අස්වැසිල්ලක් නොමැති විය. ගිම්හාන තමාගේ අත අල්ලාගෙන සිටිනු දුටුවේ රොෂාන් නම් ඇය මෙසින් හතරෙන් පංගුවක් හෝ දුකක් බියක් නොගනු ඇත. මන්ද රොෂාන්ට තමා ගැන වගක් නැති බැවිනි. දුටුවද ඔහු සමහර විට නොදුටුවාසේ ඉවත බලා හිඳිනු ඇත. තමාගේ කැමැත්ත ඇතිව සිදුවන දෙයකයි සිතනු ඇත.

එහෙත් එය දුටුවේ රොෂාන් නොවේ. ඊට දස දහස් වාරයක් වෙනස් අයෙකි. තමාගේ බැල්මක් පවා අනිකෙකුට වැටෙනවාට බිය, එයට ඊර්ෂ්‍යා කරන අයෙකි. අනෙක් අතට කීවොත් ඔහුගේ ජීවිතයටත් වඩා තමාට ආදරේ කරන අයෙකි. තමා ඔහු මග හැර සිටියද මෙවන් දෙයකින් ඔහු සිත පාරන අදහසක් තිබෙන්නට ඇත් තමාගේ සිතේ නොවූවා නේද....... එසේ නම් මේ වූයේ කුමක්ද....... .......මගේ දෙයියනේ....... කොහේ....... ගියාද....... කෝල් එකක් අරන් බැලුවොත්....... එසේ සිතූ සඳරු ඔහුගේ දුරකතනයට ගත්තද එය විසන්ධි කොට තිබිණ. සඳරු ඒ සමගම පියුමිට කථාකොට සිදු වූ දේ පැවසුවාය. එයින් පියුමිද බියපත් විය. මන්ද නෙත්න සඳරු ගැන ඉන්නේ කෙතරම් පිස්සුවකින් දැයි ඇය දන්නා බැවිනි. ඔහු ඇයට එතරම් ආදරය කළේය.

"අයියෝ මේ කොල්ලා කොහේ ගියාද දන්නේ නෑ........ මම මාලිංගටත් කියන්නම්........" යි පැවසූ පියුමි ජ් හාම මාලිංගට කථා කොට පණිවුඩය පැවසුවාය.

මැදියම රාත්‍රිය ගෙවී යන තුරුම මත්පැන් පානය කළ නෙත්න ඇතිවය. බාර් එක එතැනින් පිට වූයේ තවත් බෝතලයක් ද අතේ ඇතිවය. බාර් එක එම වෙලාවේ නොවසන්නට ඔහු තාමත් එහි රැඳී සිටිනු නියතය. නෙත්න සිටියේ රථය ගෙන යා හැකි තත්ත්වයේ නොවන බව වැටහුණ ඔහු හා කුළුපග වේටර්වරයා කුලී රථයකට කථා කොට ඔහු පිටත් කළේය. එහෙත් අතර මගදී වාහනය නවතා බිමට බට ඔහු රියදුරාට යන්නට පවසා නුවර වැව දිගේ හෙමිහිට ඇවිද ගියේය. ඒ යන අතරේද බෝතලය විවෘත කොට විටින් විට බිවූ ඔහු පෙර එක් දිනෙක සඳරුගේ කරේ මාලය පැළඳී බංකුව වෙත ගොස් එහි අසුන් ගත්තේය.

මුළු නගරයම නිදාගෙන ඇත. රාත්‍රිය නිසංසල තාවයේ වෙලී ඇත. වැව් දිය පිස හමා එන සිහිල් සුවදායක මඳ නල නෙත්නගේ වෙරිමත දෙගුණ කරවයි. අතීතය සිහිපත් කරමින් සිටි ඔහු කුඩා දරුවකු සේ හැඬුවේය. එහෙත් ඔහුගේ හැඬුම් හඬ ඇසෙන මානයේ කිසිවෙකු නොවිය.

"සඳූ........ ඔයා මගේ........ ඔයා මගේ........ වෙන කාගෙවත් නෙවි. රොෂාන්ගෙ වත් නෙවි. මම ඒක ඔයාට කියලා........ තියෙද්දිත් ඔයා මට පිටුපෑවා........ ඔයා මාව ඈත් කළා........ කොහ් කළා........ ඇයි මගේ සඳූ........ අනේ දළදා හාමුදුරුවනේ........ ඔබ වහන්සේට වත් බැරි උණාද මගේ සඳූ මට ලබලා දෙන්න........ ඔබ වහන්සේට වැඳලා යද්දී මේ බංකුවෙ ඉඳගෙන මම ඒ චේන් එක එයාගෙ කරේ ඇම්මෙව්........ හරි පුදුමයි දළදා හාමුදුරුවනේ........ හරිම පුදුමයි........ එයාට මගේ ආදරේ තේරෙන්නෙ නැතිව ගිය හැටි........ මම හිතුවෙ මගේ ආදරේ හරි ශක්තිමත් කියලා........ මේ ආදරේ ශක්තියෙන් මට එයාව මගේ කරගන්න පුළුවන් කියලා........ මතකද........ මතකද මගේ ළඟට වෙලා ඔබ වහන්සේට නෙළුම් මල් පූජා කරපු ලස්සන කෙල්ල........ ඒ මගේ සඳූ........ මගේ සඳූ........??" ඔහු කියූ දෙයම යළි ප්‍රශ්න කළේය.

"ඔව් ඔබ වහන්සේ බලන්න එද්දී එයා හරියටම මගේ වගේ තමයි........ හරි අහිංසකයි. මම කියන දේ ඇහුවා........ කියන දේ





කරා........ පුංචි බෝනික්කියක් වගේ මමත් එයාව අරගෙන හැමතැනම ගියා........ ඒත් අද........? අද එයා මා ගාව නෑ දළදා හාමුදුරුවනේ........ එයා වෙන කාටදෝ ආදරේ කරන්න පටන් අරන්........ මට බලා ඉන්න........ පුළුවන්ද........" ඔහු අසල සිටින කෙනෙකු සේ නුවර වැවෙන් එහා පස වැඩ සිටින දළදා සමිඳුන්ට තම දුක කිවේය. හඬ හඬා කිවේය.

"මට ඉන්න බෑ........ මම යන්න ඕන........ නැත්නම් මැරෙන්න ඕන........ මම මෝඩයෙක් වෙන්න ඇති. ඒත් මට ඕන දේ වෙන කා ගාවවත් තියනවා බල බලා මට ඉන්න බෑ........ මට එයාව රිදවන්න බෑ........ මම මොනවද කරන්න ඕන........ මම මොකවද කරන්න ඕන........"

නෙත්න මෙසේ මහ රාත්‍රියේ තනිවම කථා කරමින් සිටිද්දී එතැනින් යමින් සිටි ත්‍රීරෝද රථ රියදුරෙකු කවුදෝ බංකුවේ සිටිනවා දැක එහි පැමිණියේය. මෙම රියදුරා නෙත්න හඳුනාගත්තේය.

"අයියෝ........ ජීවක මහත්තයගෙ බාල පුතා නේද මේ........?" ඔහු නෙත්නව හොඳ හැටි බලා සිට තමාටම කියා ගත්තේය. එගා නෙත්නට ළං වූ ඔහු,

"සර්........ සර්........ මොකද මේ මහ රෑ........ බීලා........ සර් පාටියකට වත් ගියාද?"

"පාටි........ ඔව් අයියා........ මම සෙමට්‍රි එකේ පාටි එකකට ගියා........" එසේ කී නෙත්න යළි දෙනෙත පියා ගත්තේය.

"සර්........ හරි හරි........ අපි යමු........ මම ගිහින් දාන්නම් ගෙදර........ එන්න සර්........"

රියදුරා නෙත්නව අසීරුවෙන් වත්තන් කර ගනිද්දී බෝතලයද අතැතිව අසීරුවෙන් නැගිට ගත් නෙත්න රියදුරුගේ වාරුවෙන් රථයේ අසුන් ගත්තේය.

"ඔහොම නේන්නු වෙලා ඉන්න සර්........" එසේ කී රියදුරා රථය පදවා පණගන්වා ගෙන කුණ්ඩසාලේ නෙත්නගේ නිවස කරා රථය පදවා ගියේය.

නෙත්නගේ නිවසේ ආරක්ෂක නිලධරයා අඩ නින්දෙන් පිබිද බැලුවේ ගේට්ටුව අසල ත්‍රිවිල් රථයක් නවතනු ඇසීමෙනි.

"බහින්න සර්........" රියදුරා අසීරුවෙන් නෙත්න බිමට බස්සවා ගත් පසු තම පර්ස් එක ඇරගෙන ඔහු වෙත දුන් නෙත්න.

"හරි මෙකෙ තියන සල්ලි ටික අරගන්න......... ඔයාගෙ හයර් එක" යි පැවසීය.

"අනේ එපා සර්......... මම සල්ලි බලාගෙන නෙවි ආවේ........." රියදුරා කියද්දී,

"තමුසෙට සල්ලි එපානම් මාව ගෙනිහින් දානවා හිටපු තැනට" කියමින් ආපසු හැරී ත්‍රීවිලරයට ගොඩ නැගීමට හදනු වූ රියදුරු,

"හරි......... හරි සර්......... දෙන්න සල්ලි" යයි පවසද්දී,

"ඒකනේ මම තමුසෙට මුලින්ම කිව්වේ......... ඔකෙ තියන සල්ලි සේරම ටික අරගෙන පර්ස් එක දානවා මගෙ සාක්කුවෙ" යි පැවසීය. රියදුරා බියෙන් බියෙන් ඔහුගේ පර්ස් එක විවර කරද්දී,

"ටයිම් බෝම්බ හයිකරලා නෑ ඔයි ඕකෙ. ගන්නවා සල්ලි ටික......... පොඩි උන් ඉන්නවානම් උන්ට කැමති දෙයක් ගිහින් දෙනවා......... ඉකිරි එකේ තමුසෙගෙ නෝනට තෑග්ගක් අරන් යනවා" යි පවසා ඔහුගේ උරහිසට අත තබා වැනි වැනී ගේට්ටුව දෙසට ආවේය.

"නෙත්න......... සර්.........? හොඳටම බීලා........." තමාටම කියා ගත් ආරක්ෂක නිලධාරී ජයලත් වහාම ඔහු වෙත දිව ගියද ඔහු වැළකූ නෙත්න,

"තමුසෙ එපා......... මට යන්න පුළුවනි......... I am o.k." යැයි කීවේ ඔහුවද අතින් එහාට කරලමිනි.

"සර් අද වැජ් වෙන්න ගහලා........." ජයලත් රියදුරාට කියද්දී,

"වැව රවුමේ බංකුවෙ බීබී හිටියා තනියම......... පොඩ්ඩක් හොයලා බලන්න......... මම යනවා" කියමින් රියදුරා යන්නට ගියේය. නෙත්නට මදක් ඇතින් ජයලත් ද නෙත්න පිටුපස නිවස දක්වාම ගියේ ඔහු වැටෙතැයි බියෙනි. එහෙත් නෙත්න වැනෙමින් නමුත් දොර හැරගෙන ගෙතුළට ගියේය.

වරින් වර ඔරලෝසුව දෙස බලමින් සඳරු කාමරයේ ඒ මේ අත ඇවිදිමින් සිටියේ හදවත වේගයෙන් ගැහෙන අතරේය. ඇය වරින් වර නෙත්නගේ කාමරය අසලට ගොස් බැලුවද එය බලන හැමවිටම තිබුණේ අඳුරේය. ඇය ඇඳ අසල බිම වාඩි වී දෙදනහිසේ මුහුණ ඔබා ගත්තාය. මේ බිය සමග එළිවෙන තෙක් ඉන්නට සිදු වුව හොත් තමාට රුධිර පීඩනය පවා වැඩි වෙතැයි ඇයට සිතිණ. ඔහු සිටිනා තැනක් දැන සිටියා නම් ඇය මේ මහ රැයේ වුව ගොස් හමාරය. එහෙත් ඔහු කොහේ ගියාද......... මාලිංගද සෑම තැනකටම





කෝල් කර අසා තිබුණද ඔහු ඒ කොතැනකවත් නොවීය. එවන් විට තමා කොහෙන් ඔහු සොයන්නද......... එහෙත් එළිවූ විගසම ඔහු ගැන සෙවිය යුතුය......... එසේ සිතමින් රැය පහන් කරන්නට සිතාගෙන ඇය ඇඳ පාමුල හිඳ ගත්තාය. ඇයට සයනයේ වත් ඉන්නට සිතක් නොවිණ. ඔහු කොහේ හෝ දුකෙන් සිටින කල තමා කෙසේ නම් සයනයට වී ඉන්නද.........

හඬා නෙහෙට්ටු වී සිටි සඳරුගේ නෙත් යන්තමින් පියවුණා විය හැක. කුමක් හෝ මහා බර දෙයක් බිඳී යන හඬක් ඇසී ඇය උඩ විසිවූවා වැනි විය. දොර හැරගත් ඇය වහාම එළියට දිව යද්දී නෙත්නගේ කාමරයේ දොර හැර තිබෙනු දුර්වල ආලෝකයකින් ඇයට දැකගත හැකි විය. තවත් වතාවක් බෝතලයක් වැන්නක් බිඳී යද්දී ඇය වහ වහා ඔහුගේ කාමරයට දිව ගිය අතර දුටු දසුනින් ඇයගේ සිහිය විකල් වී ගියා වැනි විය. දොරකඩ සිටි ඇය මුවින් නැග ආ හීනියේ රාවය අතින් මුව වසාගෙන වළකා ගත්තාය.

කන්නාඩි මේසය බිඳී කැලි සෑම තැනම විසිරී තිබිණ. නෙත්න ඇඳ මත මුනින් තලා වී සිටියේ අසිහියෙන් මෙනි. ඔහුගේ අතින් ලේ ගලමින් තිබුණද ඒ ගැන වගක් නැතිවා සේ ඔහු ඇඳ මත වැටී දෙනෙත් පියාගෙන සිටියේය.

වේගයෙන් නැගෙන ඉකිය මැඩගත් සඳරු යළි වහා එළියට දිවගොස් ශබ්දය ඇසී කවුරුන් හෝ ඇහැරී උඩට එන්නේ දැයි බැලුවාය. නැත මේ රෑ තුනහමාරට සැවොම තද නින්දේ පසුවනවා මිස ඇහැරෙන්නේ නොවේ.........

සියල්ලටම පළමු නෙත්නගේ අතේ ලේ නැවතිය යුතුය. වහාම අසල වූ ලාච්චුව හැරිය ඇය එහි වූ බැන්ඩේජ් හා බෙහෙත් රැගෙන නෙත්නගේ අත තෙත රෙදි කඩකින් පිහිදා පසුව බෙහෙත් දමා බැන්ඩේජ් කළාය.

අනතුරුව බිම බැලූ ඇයට විදුරු කටු ගොඩ දැක හිස කරකැවෙන්නා සේ විය. කෙසේ අයින් කරන්නද......... ඇය ඉතා ප්‍රවේශමෙන් ලොකු කැබලි එකතු කොට අයිනට කර කොස්ස රැගෙන සියල්ලම පිසදා එකතු කළාය. අනතුරුව පරණ තුවායක් තෙමා ගත් ඇය ඔහු පා තගන මානයම එයින් පිසදා හැරියේ වෙරි මතින් කොහේ හෝ යන්නට ගොස් කුඩා කැබැල්ලක් හෝ තිබී කකුලේ ඇනෙතැයි සිතමිනි.

අනතුරුව යළි නෙත්න වෙත ආ ඇය ඔහුගේ සපත්තු හා මේස් ගලවා දැමුවාය. එළියේදී බී නිවසටද රැගෙනවිත් ඔහු මත්පැන් බී ඇති බව පොඩි වී ගිය බෝතලය නිහඬව පැවසුවා වැනි විය. ඔහු දැන් ඉන්නේ අසීමාන්තිකව බීමත්ව බව වැටහුණ සඳරුට දැනුණේ ඇඩි බියකි. ඉතා හෙමිහිට එළියට ආ ඇය ශබ්ද නොනැගෙන සේ පහළට බැස මුළුතැන්ගෙට ගොස් දෙහි ගෙඩියක් මිරිකා කෝප්පයට දමාගෙන තවත් දෙහි බෑයක් රැගෙන යළි උඩට ආවාය. කාමරයට පැමිණි ඇ නෙත්නව අනෙක් පසට පෙරළා හිසේ දෙහි බෑව අතුල්ලා හෙමිහිට ඔහුව තමා දෙසට හරවා ගත්තාය.

"නෙත්න........ නෙත්න........" ඔහු දෙනෙත් නොහැරියේය. සඳරු යළි ඔහු උරහස සොළවමින් කථා කළාය.

"නෙත්න........ අනේ කතා කරන්න........ ඇහැ අරින්නකෝ........"

ඇය ඔහු සොලවමින් කියද්දී කෙඳිරි ගාමින් නෙත හැරිය නෙත්න සඳරු හඳුනා ගන්නට මෙන් ඇය දෙස බලා සිටියේය. අසල වූ දෙහි ජෝගුව අතට ගත් සඳරු එය ඔහ වෙත පාමින්,

"මේක බොන්න........" යැයි පැවසුවාය. නෙත්න එක වරම ඉවත බලා ගත්තේය.

"මා එක්ක තරහ නම් මට බනින්න........ ගහන්න........ ඒත් මෙහෙම බොන්න එපා........" ඇය හෙමිහිට හඬමින් කීවාය. නෙත්නගේ ඇසින් කඳුළු ගලා යමින් තිබිණ. ඔහු එක එල්ලේම ඇය දෙස බලා උන්නාය. හිටිවනම ඇයගේ උකුලේ හිස ඔබාගත් ඔහු කුඩා එකකු සේ හැඬුවේය.

"අනේ........ දෙයියනේ........ මෙහෙම අඬන්න එපා........ මට දරාගන්න බෑ........" සඳරු ඔහු හිස ඔසවන්නට උත්සාහ දරමින් කිවද ඇය වටා දෙ අත යවා ඇයව තද කොට ගත් ඔහු එක දිගටම හැඬුවේය. සඳරු කඳුළු සලමින් ඔහු හිස අත ගාමින් සිට අසීරුවෙන් ඔහු හිස මෑත් කොටගෙන අත වූ දෙහි එක ඔහුට බිදෙන් බිද පෙව්වාය. අනතුරුව වාඩි වී සිටි තැනින් නැගිට ගත් ඇය නෙත්නගේ දෙපා නිසි ලෙස සකසා ඔහුගේ හිස අද්දරට ගොස් පහත් වී කොට්ටයද සකසා විදුලි පහන නිවා පිටව ගියාය.

පාන්දරින්ම අවදිව ප්‍රේමා සොයා ගිය සඳරු ඊ සිදුවීම පවසා තමා කළ කී දේද පවසා වීදුරු කටු ඇන්මම ඉවත් කරන ලෙස කීවාය. මන්ද තමා ඒ රාත්‍රියේ ඒවා කළ බව කිසිවෙකු හෝ දැනගැනීම





දෙදෙනාටම ප්‍රශ්නයක් විය හැකි බැවිනි. නෙත්න බේබි එලෙස බී ඇත්තේ කුමකටදැයි අසන්නට ප්‍රේමාට සිතුණද එයින් සඳරු බියවනු ඇතැයි සිතූ ප්‍රේමා එවෙලේම උඩු මහලට ගියාය.

නෙත්න අවදි වූයේ බොහෝ දවල් වූ පසුය. පෙරදා රාත්‍රිය සිහිනයක් සේ ඔහු මතකයට නැගිණ........ දෙනෙත් විසඳා කොට්ටයට හේත්තු වූ ඔහුට බිඳී ගිය කන්නාඩි මේසය පෙනුණෙන් සිදු වූ දේ අපැහැදිලි චිත්‍රයක් සේ හෙමි හෙමින් සිහිපත් විය. එක්වරම අත ඇඳුම් කන්නට වූයෙන් ඔහු අත ඔසවා බලද්දී අතේ වූ බැන්ඩේජ් කරන ලද තුවාලය දැක එය ළඟට ළංකර බැලුවේය.

"අත බැන්ඩේජ් කරලා........ කවද........ සඳු........??........ මට මතකයි එයා ආවා වගේ" ඔහු තනිවම මිමිණුවේ උඩට මතුව ආ ලේ එහිම වියලී තිබෙනු දකින අතරේය. ඒ අතරේ කාමරය වෙත ආ ප්‍රේමා........

"ආ........ අවදි උණාද........ ඊයෙ රෑ හොඳ ජල්ලියක් ඇල්ලුවා කියන්නේ........"

"ප්‍රේමක්කා........ අම්මිලා දන්නවද?"

"අම්මිලා දන්නේ නෑ........ ඒත් ඉතිං කන්නාඩි මේසෙ කන්නාඩිය ආන්න බෑනේ අම්මි දන්නෙ නැතිව........ අම්මිට පෙනේවි දැන් කාමරේට ආ ගමන්........ ඇනුත් එන්න හැදුවෙ. මම කීවා දොර වහගෙන නිදි කියලා........ මොනවද නෙත්න බේබි මේ කරේ........ එළිවෙන්නලු නේද ගෙදර ආවේ"

"කෝ........?" නෙත්න ඇසීය.

"අන්න කිවත් එකේ........ අද එළිවෙනකල් මහ සඳරු නෝනා ඇහැ පියවලා නෑ........ පාන්දරම ගිහින් මාව කිද්දුවා වීදුරු කටු අයින් කරන්න........ ජයලතුත් මට කිවා ඊයෙ රෑ ආපු විදිය"

"සඳරු මොනා හරි කිවද ප්‍රේමක්කා" නෙත්න පොඩි දරුවකු සේ අසද්දී ප්‍රේමාට දැනුණේ ඇඩි දුකකි.

"සඳරු නෝනා දන්නෙ නෑනේ බේබි, මම දන්න බව........ ඒ නිසා මට මොකුත් කිවේ නෑ වෙච්ච දේ මිස. හැමැයි එළිවෙකල් අඬලද කොහෙද තියනවා........ අනේ මම දන්නෙ නෑ බේබි මේ ප්‍රශ්නෙ කොහෙම කොහෙන් කෙළවර වේද කියලා........ මට තියෙන එකම බය රොෂාන් මහත්තයා මේක දැනගත්ත දවසට මොනවා වේවිද කියලා........" එසේ කියා සුසුමක් හෙළූ ප්‍රේමා ප්ලාස්ක් එකෙන් මග් එකට නෙත්නට කිරි එක වත් කළාය.

කොට කලිසමට උඩින් ටී ෂර්ට් එකක් ඇගත් නෙත්න හෙමිහිට පහළට බැස්සේය. තාමත් හිසෙහි බර ගතිය ඇත්තේ රාත්‍රියේ අධික ලෙස මත් පැන් ගත් හෙයිනැයි නෙත්නට සිතිණ. තාමත් උදේට කෑම නොකැවද කන්නට ප්‍රියක් නැත. ඒ අතරේ රිද්මිගේ දියණිය වඩාගෙන සාලයට ආ සඳරු දුටු නෙත්නගේ සිත හිරි වැටී ගියේ ඇයගේ ඉඳිමී ඇති දෙනෙත් ඇකීමෙනි. සඳරු ද තමා දැක දරුවාද සමග එළියට යන්නට ගියද ඒ මොහොතේ එහි පැමිණි රිද්මී සඳරු සමගම මදක් එහායින් වූ සෙට්යේ අසුන් ගත්තාය. නෙත්න රූපවාහිනිය අසලට ගොස් එය ක්‍රියාත්මක කොට එතැන වාඩි වී සෙට්යට හේත්තු වූයේය. සොයුරිය හා දරුවා සුරතල් කරන සඳරු දෙස ඔහු මොහොතක් බලා උන්නේය. ඔහුගෙන් සුසුමක් පිට වූයේ නිතැතින්මය.

අන්සතු වන්නට රඟපෙම හැකි නම
සමුගෙන යන්නට කුමටද අවසර
ඔබේ චපල බව නොකියමි ලොව වෙත
ඉනු මැන සතුටින් මා අමතක කර
සෙනෙහස අහිමිව ඔබගේ හදවත
සුසානයක මටු සමය පතන සඳ
ජීවත් වන්නට උණුසුම ගෙන දුන්
මගෙ හද තනිකර කෙලෙස ගියේ
ඔබ හට නොමැතිව ලොව වෙන ළඳකට
මගෙ හිත දෙන්නට කියනු එපා
මගෙ දිවි සුසුමෙම ගෙවුනට කම් නැත
මින් පසු ඔබ දුක් වෙන්න එපා.........

රූපවාහිනියේ විකාශය වෙන ගීතය දෙස බලා හුන් සඳරු තමා දෙස බලනු දුටු නෙත්න රූපවාහිනිය නිවා දමා එතැනින් නැගිට එළියට ගියේය. ඔහු හෙමිහිට ඇවිදගෙන වත්ත ඈතට ඇවිද ගොස් වෙනදා සඳරු වාඩි වී කල්පනා කරමින් සිටින තැන හිඳ ගත්තේය.

හදවත මලගම් ගොසින් යැයි නෙත්නට සිතිණ. හඬන්නට බැරි දුක මෙසේ හදවතේ දරාගෙන තෙරපාගෙන කොතෙක් කලක් තමා මෙසේ ජීවත් වන්නද......... ලංකාව දමා යා යුතු යයි නෙත්න තීරණය කළේය. ඔහු එතැනම සිටගෙන අමෙරිකාවේ සිටින තමා මිතුරෙකුට කථාකොට සුදුසු රැකියාවක් සොයන ලෙස දැන්විය.





වික්‍රමසේකර සමූහ ව්‍යාපාරයට වසර 20 ක් පිරීම නිමිත්තෙන් සාදයක් පවත්වන්නට කටයුතු යෙදුණේ මේ අතරය. අවන්තගේ නෙත්නගේ රොෂාන්ගේ පෞද්ගලික ව්‍යාපාරද සමූහ වශයෙන් කෙරෙන ව්‍යාපාරවලද සේවයේ නියුතු සියලුම සේවක සේවිකාවන්ට ඒ සඳහා ආරාධනා ලැබිණ. අවන්තගේ ව්‍යාපාරවල නියැලි අයද එහි එන නිසා මනුෂිද මෙම උත්සව කටයුතු සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කරන්නට වූවාය.

එනෙක් ශාලාව සැරසීම හා ආහාර පාන ඇණවුම, සැකසීම ආදී සියලුම කටයුතු නෙත්නගේ පියා සඳරුට පැවරුවේ ඇය ඒ කටයුතු හොඳින් සිදු කරන බව දන්නා බැවිනි. තමාට මේ කටයුතු හරියාකාරව ඉටුකිරීමට හැකිදැයි සඳරු සිතුවේ ඉහළ සමාජයේ බොහෝ උසස් පුද්ගලයන්ද සාදයට ආරාධනා ලබන බව දන්නා බැවිනි.

"මට බයයි පියුමි......... ගමේ එක එක දේවල් ඇරේන්ජ් කළාට මේක එහෙම එකක්යැ. මේකට එන තරමක් එන්නේ හයි ෆයි මිනිස්සු. අන්තිමට මාව නරක ගැනි වේවි"

"උඹට පිස්සු මෙච්චර ලොකු බිස්නස් එකක් කෝඩිනේට් කරන උඹට මේක මොකක්ද? මොකද අපි උයනවද......... කෑම ඕඩර්ස් දෙන්න තියෙන්නේ. දෙන්න ඕන කෑම මොනවද ඩෙකරේෂන්ස් කොහොම වෙන්න ඕනද කියලා තමා හිතන්න තියෙන්නේ........."

"මට නම් මේ කිසි දෙයක් කරන්න හිත නෑ පියුමි......... නෙත්න මේ දවස් ටිකේම ගෙදර ආවේ බීලා. ඊයෙ රෑ කාමරේ මොනා හරි බිඳෙන සද්දයක් ආවා......... රොෂානුත් ඇහැරුණා සද්දෙට. එයා යන්න හදන කොට මම යන්න දුන්නෙ නෑ........."

"අනේ මන්දා සඳී මට උඹට බනින්නත් බෑ......... ඒත් නෙත්න පව්......... එච්චර වටින කොල්ලා නාස්ති වෙනවා අපේ ඇස් ඉදිරිපිටම........."

"උඹම හිතපං මම කොහොමද එයා කියන දේ කරන්නේ.........?"

"ඇත්තම කියනවා නම් නෙත්න විතරක් නෙවි ගිම්හානත් පව්.........

උඹ කියන්න වගේ කරන්න දෙයක් නෑ ඒකට නම්......... ඒත් නෙත්න නම ගිම්හාන වගේ ඉවසගෙන ඉන්න පුතුයෙක් නෙවි. ලෝකෙ පෙරලයි"

"ගිම්හානටත් මම කොච්චර සේමිනි ගැන කිව්වද......... එක දවසක් මගෙන් පොරොන්දුවක් ගත්තා සේමිනි ගැන කථා කරන්න එපා කියලා. එදා හිට මම ඒ ගැන කීවෙ නෑ........."

"ඔව් ඉතිං නොකෙරෙන බෙහෙතට කෝඳුරු තෙල් හොයන්න ඕනයැ"

"අපි යමුද පොඩක් කේටරින් සර්විස් දෙක තුනක මෙනු බලලා එන්න........ මම නම් හිතා ඉන්නේ නිකං කන්ද උඩරටට ගැළපෙන විදියට කෑම........ ඩෙකරේෂන් සේරම කරන්න........ උඹ මොකද කියන්නේ?"

"අයිඩියා එක නරක නෑ........ කියපං විස්තර"

"දැන් මේ ගොල්ලො හිතා ඉන්නවා ඇත්තේ නිකං කොළඹ තාලෙට පාටි එක ගන්නනේ. අපි වෙනස් කරමු ඒක හොඳ සිංහල මුහුණුවරකට.

කෑම බීම උණත් ගොඩක් ඔඩර් කරමු සිංහල විදියට. ඒ අතරට දාමු ඔය අනිත් ඒවා........ සොසේජස් වගේ ඒවා උණත් බැදලා තියනවට අමතරව අපි කරියක් විදියට එහෙම හදමු........ වැදගත්ම දේ ඇවිල්ල නැති වෙන්න හදන එකනේ........ ඩ්‍රින්ක්ස් මක්කොම ෆ්‍රෙෂ් ජූස් ගමු........ ලිකර් නම් ඉතිං කොහොමත් වෙනම ඔඩර් කරනවනේ........"

"ඩෙකරේෂන්ස්........?"

"ගොක්කොළ........ අරලිය, ඔකිඩ........ ඒවයින් කරමු........ හැමදාම, හැමතැනම රෝසස්, කානේෂන්ස් නේ තියෙන්නේ........ තව හෝල් එකේ පුන් කලස් තියලා ඒවා උඩ පහන් තියලා"

"මට නම් අයිඩියා එක ගුඩ් ගුඩ්........ උඹගෙ නැන්දම්මලා මාමණ්ඩිලා තමා ඉතිං........"

"මට ඕන විදියට කරන්න කිව්වේ කරන දෙයක් පිළිගන්නනේ........ බලමු කරලා"

"හ්ම්........ Wil see"



# 24

උත්සවයේ කටයුතු දුව පනිමින් සංවිධානය කරන සඳරු එදින ප්‍රියලාල් සොයා ගියේ පොල්මල් හතරක් ගෙනත් දෙන ලෙස පැවසීමටත් සමගය. ඇය යද්දී නෙත්න එහි සිටියද නෙත්න ඇය නොදුටු ලෙස ලිපි ගොනුවක වූ යමක් බලමින් සිටියේය.

"ප්‍රියලාල්........ මෙන්න මෙකෙ තියනවා ඕන කරන බඩු. මේ ටික හෙට හවස් වෙනකොට හෙඩ් ඔෆිස් එකට එවන්න පුළුවන්ද?"

"සිඹපල් මැඩම්........ වැඩ කරන්න ගෝලයොත් ඕනෙද?"

"හිටියොත් හොඳයි ප්‍රියලාල්........ තුන්දෙනෙක් විතර එවන්න. එතකොට ලේසියි"

"මැඩම් තනියමම මහන්සි වෙන්නේ කාව හරි කථා කරගත්තා නම් ඉවරනේ මැඩම්........" ප්‍රියලාල් කීවේ නෙත්න දෙස හොරෙන් බලමිනි.

"නෑ ප්‍රියලාල් දැන් ගොඩක් වැඩ ඉවරයි. තව ටිකයි තියෙන්නේ. ඒක ඒ හැටි ගාණක් නෑ. මම එහෙනම් යනවා ප්‍රියලාල්........ බඩු ටික වෙලාවට එවන්න" එසේ කියූ සඳරු නික්ම යන අයුරු නෙත්න නිහඬවම බලා සිටියේය.

"දැන් බලා ඉඳලා වැඩක් නෑ. ඉද්දි කථා කරන්න එපායැ"

"වැඩක් නෑ ප්‍රියලාල්........ මම ඒක අමතක කරලා ඉන්නේ........ මම තව ටික දවසයි ඉන්නේ. තාත්තට මේවා දීලා ආපහු යනවා"

"ඇමරිකා........? සර්ට පිස්සු........ ඔච්චර ඉක්මනට පරාජය භාරගන්න එපා සර්........ එහෙම කරන්න කලින් අඩුම ගාණේ තව දහපාරක් වත් ට්‍රයි කරලා ඒත් බැරි උණොත්........ තව එක පාරකුත් ට්‍රයි කරන්න. සර්ත් කොල්ලෙක්........ මාත් කොල්ලෙක්........ කෙල්ලක්ව අල්ලගන්න බැරි නම් අපේ කොල්ලකමෙන් ඇති වැඩේ මොකක්ද සර්........?" ප්‍රියලාල් කියද්දී නෙත්න එය අවධානයෙන් අසා සිටියේය.

මම කිව්වනේ ඕන දේකට මම රෙඩි......... ඒත් ඊට කලින් සර්
"මම කිව්වනේ ඕන දේකට මම රෙඩි......... ඒත් ඊට කලින් සර්
තනියම ට්‍රයි කරන්න. මොනාද සර් ගෙදර මල් වාස් එකේ තියන
මලනේ......... අනිත් අයගෙ ඇහැටහලා ඔක ගන්න බැරි නම්.........?"
"තමුසෙ කියන එකෙත් ඇත්තක් තියනවා......... ඒ උණත් ඔතන
ප්‍රශ්න දෙක තුනක් තියනවා........."
"මම දන්නෙ නෑ සර් ඒ ප්‍රශ්නෙ......... මම නම් මට ඕනෙ කියලා
හිතුණොත් රාණි මුඛර්ජී හරි උස්සන් එනවා"
"රාණි මුඛර්ජීව උස්සන් ආවත් මේ සොනාලි බ්‍රෙන්ඩිව තමා
උස්සගන්න බැරි........." නෙත්න කීවේ සිනාසෙමිනි" නෙත්නගේ
සිනාව දුටු ප්‍රියලාල්.
"සති ගාණකට පස්සෙ සර් හිනාවෙනවා දැක්කේ"
"මට දැන් හිනාවෙන්නත් අමතක වෙලා ප්‍රියලාල්"
"රෝගෙ ඒ තරමට සීරියස් වෙන්න දෙන්න එපා......... ලෙඩේ
ඇට්ටකුනා වෙන්න දෙන්න එපා......... තේරෙනවනේ මම කියන
දේ......... දුරස්ථිම ගොඩක් විශාල වෙන්න දෙන්න එපා......... කොයි
වෙලෙත් නිකං ඔහේ ටව් එකේ ඉන්න......... පනින පිලවට ඉනිමං
වගේ වෙනවා සර්රුත් වැඩේ අතෑරලා වගේ හිටියොත්. අතට එන
එක චාන්ස් එකක් වත් අතාරින්න එපා........." ප්‍රියලාල් කීවේ අතින්
පයින් ද එයට උංණ පුරණ යොදමිනි. ඔහුගේ විලාසය දුටු නෙත්න
මදහසක් නැඟීය.
"ප්‍රියලාල් කියන කොට මටත් හිතෙනවා අදහස් අතාරින්න හොඳ
නෑ කියලා"
"ඔන්න ඔහොමනේ සර් කොල්ලො කියන්නේ........."
"හ්ම් හරි......... මාත් යනවා......... ප්‍රියලාල්"
"එහෙනම් සර් ඕල් ද බෙස්ට්" ප්‍රියලාල්ට සිනාවක් පෑ නෙත්න
ඔහුගේ රථය වෙත ගියේය.

උත්සව ශාලාවේ වෙනස නවමු බව කලාත්මක සුන්දරත්වය දුටු
කාගෙත් මන නුවන් ඒ වෙත ඇදිණ......... අරලියා මල්වල සුමුදු
සුගන්ධය, රාත්‍රී විදුලි පහන් මැද හැම හදවතකටම ගෙනාවේ අපූරු
ආනන්දයකි. වික්‍රමසේකර මහතාගේ මිතුරෝ බොහෝ දෙනෙකු
මෙම ශාලාවේ සැරසිලි කළ නිර්මාපකයා සෙවුවේය.
"ඇත්තටම ජීවක කවුද මේ ඩිසයිනර්......... හොඳට කල්පනා
කරලා වැඩ කරලා තියනවා" හැමදෙනාගේම පැසසුම් ලැබෙද්දී





ඇයව හඳුන්වා නොදීම වරදක් බව වික්‍රමසේකර මහතාට දැනිණ.
ශාලාවේ වූ සංගීත කණ්ඩායමේ මයික්‍රොෆෝනය වෙත ගිය ඔහු රැස්ව
සිටි අමුත්තන් ඇමතුහ.
"සම්භාවනීය අමුත්තනි, මගේ ආදරණීය සේවක මණ්ඩලයේ
නෝනාවරුනි, මහත්වරුනි, වසර විස්සකට පෙර ආරම්භ කරන
ලද අපේ මේ ව්‍යාපාරය එදා හරි පුංචි දෙයක්......... ඒත් අද ඒක
ශාඛා අතු ඉති වැඩී ගිය ගසක් වගේ ප්‍රචාරනය වෙලා තියනවා.
ඇත්තටම මම මේ වසර විස්ස තුළ මේ ගමන ආවේ මල් පාවඩ
දිගේ නෙවී. හරිම රළු මාවතක. එක අඩියක් ඉදිරියට තියද්දී සමහර
වෙලාවට අඩි දහයක් මම පස්සට විසි උණා......... ඒත්......... මම
මගේ උත්සාහය අතහැරියෙ නැහැ"
ජීවක මහතා අමුත්තන් අමතා කථා කරද්දී නෙත්න අසල ප්‍රියලාල්ද
සිටියේය.
"සර් පෙරේදා මම කී දේ අද සර්ට තාත්තා කියනවා වගේ.........
"සර් පෙරේදා මම කී දේ අද සර්ට තාත්තා කියනවා වගේ.........
අගගෙන හිටියොත් ටියුෂන් කෝස් එකක් කරනවට වැඩිය පාඩමක්
හම්බවෙයි වගේ" ප්‍රියලාල් කියද්දී නෙත්න ඔහු දෙස බැලුවේ විමසුම්
බැල්මකි. ප්‍රියලාල් ශාලාවේ ඉදිරිපස නෙතින් දැක්වීය.
"මම තියපු හැම අඩියකටම කටු තිබුණා......... ගල් ගොඩැලි වල
ගොඩැලි තිබුණා. ඒවට තුවාල වෙලා මාව හරියට හෙම්බත් උණා
......... ඒ හැම මොහොතකම මගේ ආදරණීය ශ්‍රියන්තා, මගේ බිරිඳ මහ
විශාල ශක්තියක් වෙලා මගේ පිටිපස්සෙ හිටියා. මගේ පිටිපස්සෙ
ඉඳගෙන මට ධෛර්යය දුන්නේ එයා. මම අඩන කොට මගේ
කඳුළු පිහිදැම්මෙ එයා. අද අපේ සේවක සංඛ්‍යාව දෙදාහ ඉක්මවලා
තියෙනවා. ඒත් මේක ආරම්භයේදී මා ළඟ හිටියෙ සේවකයො
තුන්දෙනයි. මේ අවුරුදු විස්සට මම සැහෙන දුර ගමනක් ඇවිත්
තියනවා. ලාභ මැද්දෙ පාඩු මැද්දෙ හැල හැප්පිලි මැද්දෙ මම ලොකු
දුරක් ඇවිත්......... කාලයත් එක්ක මගේ දරුවෝ මේ ව්‍යාපාරයට
සම්බන්ධ උණා......... ඒත් එයාලට මට වගේ රළු පාරක් නෙවී
තිබුණෙ. හොඳට මට්ටම් වෙච්ච පාර දිගේ එයාලා මේ සමූහ
ව්‍යාපාරය කියන වාහනය අරගෙන ආවා......... මගේ බෑනා.........
මගේ පුත්තු දෙන්නා මේකට සම්බන්ධ වෙලා අද එයාලගෙම
ව්‍යාපාර ආරම්භ කරලා තියනවා. අන්තිමටම මගේ බාල පුතා
නෙත්න මේ ව්‍යාපාරවලට සම්බන්ධ උණා......... අද මේ වෙනකොට
එයා ලොකු දියුණුවකට මේ ව්‍යාපාරෙ රැගෙන ඇවිත් තියනවා.

වික්‍රමසේකර සමූහ ව්‍යාපාරය කියන ගසේ කඳ, මම නම් මගේ දරුවො හතර දෙනා හරියටම ඒ ගහ ශක්තිමත් කරපු, ඒක ගහක් කියන එක ලෝකයාට පෙන්වපු ප්‍රධාන අතු වගේ......... එයාලා හතරදෙනාගෙම ආඩිය, මහන්සිය, මොළය මේ ව්‍යාපාරෙ දියුණු කරන්න හේතු උණා.........

කොච්චරම විශාල මහක් උණත් මල් නැත්නම් ඒ ගහේ ලස්සන ගැන කාටවත් පේන්නෙ නෑ......... මෙතෙක් කාලයකට මේ ගහේ කඳ වගේ ඉඳපු මාව තමා හැමෝම දැක්කේ, මොකද ගහ විශාල උණාම ඕන කෙනෙකුට පේන්නෙ යන එනකොට කඳනේ......... ඒත් කාලයත් එක්ක ගහේ අතු ඉති මෝරන කොට ප්‍රධාන ශාඛා......... ඒ අතු දිහාත් කවුරුත් බැලුවා......... ඒත් මේ ගහට මල් අඩුවෙලා තිබුණේ.........

ඒක ඇත්ත......... ගහක මල් එන්නේ ගහ මෝරලා නියමිත කාලෙට ආවාම......... ඒ වගේ වික්‍රමසේකර සමූහ ව්‍යාපාරශ කියන ගහේ මල මෑතකදී පිපුණා.........”

ජීවක මහතා එසේ කියද්දී මනූෂිගේ හා අවන්තගේ මිතුරු මිතුරියන් මනූෂි දෙස බලා සිනාසුණහ. මනූෂි සිටියේ ආඩම්බර සිනාවක් නගමිනි. ඇයගේ හද සතුටින් ඉපිල ගියේ පියා තමා ගැන කියනු ඇසීමෙනි.

“තමන්ගේ මහන්සිය කැපකිරීම ශක්තිය මේ හැමදේම කැප කරලා අපේ මේ සමූහ ව්‍යාපාරය ලංකාවේ හොඳම ව්‍යවසායිකයෙක් විදියට ඉහලට ගෙනියන්න දැන් කාලෙක හිට කෙනෙක් අපට උදව් කළා. මම කිවේ ඒ හමයි මම පෙර කිව මල......... එයා ඇත්තටම මේ ව්‍යාපාරයට ආශිර්වාදයක් උණා. රැයක් දවාලක් නොබලා තමන්ගෙ අවධානය කැප කිරීම මේකට යොදවලා එයා මේක අපට හිතාගන්න බැරිව තිබුණු ඉහළ තැනකට ගෙනත් දුන්නා. ඉස්සර අපට වලකන්න බැරි ප්‍රශ්න තිබුණා. සේවක ප්‍රශ්න, පුංචි පුංචි උණත් වැඩ වර්ජන, වංචා දූෂණ වගේ අකටයුතු කම්......... හරි පුදුමයි මේ ගහේ පිපුණු මලේ ලස්සනට හැම දෙනාම වශී උණාද කියලා මම අදටත් හිතනවා. ඒ ප්‍රශ්න එයාගෙ ආගමනයෙන් පස්සෙ නැති වෙලා ගියා”

තම පියා මේ කියන්නේ සඳරු ගැන බව නෙත්නට වැටහිණ

“සඳරු මැඩම් ගැන නේද කියන්නේ?” ප්‍රියලාල් විමසුවේ සිනාසෙමිනි.





“ඒ වගෙයි”

“අත් හත අටකින් ඕන කරන, ඔළු කීපයක් පාවිච්චි කරන්න ඕන වැඩ එක දවසකට එයා කරා......... අදටත් කරනවා......... මගේ කාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙකුගෙ ආදරය එයාට ලැබෙන නිසා එයාට කරන්න බැරි දෙයක් නැති තරමට ඇත්තටම එයා වටා මේ ව්‍යාපාරය ඒකරාශී වෙලා......... මට ඒක අදහාගන්න බැරි පුදුමයක් වගේම දරාගන්න බැරි සතුටක්.........

අද මම මේ උත්සව ශාලාවට අඩිය තියපු වෙලේ හිට මට සිද්ධ උණේ පුදුම වෙන්න.මම පුදුම වෙද්දී මම දැක්කා ඔයාලත් පුදුම වෙනවා......... ඒ මේ ශාලාවෙ අලංකරන කටයුතු දැකලා. මගේ හිතවත් උගත් මිතුරෝ බොහොම දෙනෙකුට ඕන උණා මේ ඩිසයිනර් කවුද කියලා හොයාගන්න......... මම හිතන්නේ එයාලගෙ ඇනුවල් පාටිපුත් මෙයාට භාර දෙන්න වෙන්න ඇති......... ඒකට නම් මට ඉරිසියයි. (සභාවේ සිනා) සාජහාන් රජ්ජුරුවො ටජ්මහල හදපු නිර්මාණ ශිල්පියගෙ අත් දෙකයි දිවයි කපලා අලා තියනවා. ආයෙ ඒ වගේ දෙයක් නොහදන්න. අවාසනාවට මට නම් ඒ මොකුත් කරන්න විදියක් නෑ......... මෙයා මේ ගහේ මල නිසා (සභාවේ සිනා) ඉතිං සම්භාවනීය අමුත්තනි, මම දැන් ඉරිසියාවෙන් උණත් බොහොම සාඩම්බරයෙනුයි බොහොම සන්තෝෂයෙනුයි මගේ මේ වික්‍රමසේකර ව්‍යාපාරයේ පිපිච්ච මල ඔබට හඳුන්වලා දෙනවා. මේ ශාලාවේ තියන සිංහල ඌරුව, අපේ සංස්කෘතිය, ඒ වගේම චාම් සුන්දර බව......... ඒ විතරක් නෙවි.........ඔබ අද අපෙන් ලබන සාද සංග්‍රහයේ සියලුම කටයුතු කළෙ වෙන කවුරුත් නෙවි......... මගේ දෙවෙනි ලේලි......... රොෂාන් වික්‍රමසේකරගේ නෝනා මහත්මියා වන සඳරු වික්‍රමසේකර.........” එසේ කියමින් මයික් එක අතැතිව සෙනඟ අතරට ආ ජීවක මහතා සඳරුවද කැටිව යළි ඉදිරිපසට ගියේය. ශාලාවෙන් නැඟුණේ විශාල අත් පොලසන් නාදයකි......... සඳරු ඉතා විනීත ලෙස රැස්ව සිටි පිරිසට ආචාර කළාය.

නෙත්නගේ ඇසට කඳුළු නැඟුණේ පියා ඇයව පැසසූ අයුරු ඇසීමෙනි. එය ඇය ලැබිය යුතුම ගෞරවයක් බව ඔහු දැන සිටියේය. වසරකටත් වැඩි කාලයක් ඇය ඇයගේ සියලු ශක්තිය කැපකරමින් මේ සියලු කටයුතු සඳහා ඇය තුළ ඇති හසල දැනුම ප්‍රකට කළාය.

සෙනඟට ආචාර කළ සඳරු යළි ආපසු එමින් සිටියාය. බොහෝ දෙන ඇයට අතට අතදී කථා කරන්නට පෙළඹුණේ ඇයගේ දක්ෂ කමටද වඩා ඇය තුළ ඇති අසීමිත රූමත් බව නිසාවෙනැයි නෙත්නට

හැඟිණ. බොහෝ පිරිමින්ගේ සරාගික දෙනෙත් ඇය යන තැන හඹා යනු ඔහු බලා සිටියේය.

"ප්‍රියලාල්........අද මැඩම් ගැන ටිකක් ඇහැ ගහගෙන් ඉන්න. බිස්නස් කාර්යය නිසා ඉන්වයිට් කළාට මුන් හුගක් හරිය මහත්තුරු නෙවි"

"සර් බයවෙන්න එපා........ මම ගාඩ් එක දෙන්නම්........"

තමාගේ හා සැමියාගේ මිතුරු මිතුරියන් අතරේ තමාට ඉතා විශාල අවමානයක් සිදුවිණැයි මනුෂිට සිතිණ. තමා ඉමහත් ආඩම්බරයෙන් මිතුරියන්ට ප්‍රතිචාර දැක්වූයේ කියන්නේ තමා ගැන යැයි සිතූ බැවිනි. තමාගේ හිතවත්ම මිතුරියන් කිප දෙනෙකුට ඉගිකළ මනුෂි ඔවුනට ඇය හා කථා කරන ලෙස කිවාය. ඔවුන් සඳරු වෙත ගොස් ඇය ඇමතිය.

"හායි සඳරු........ ඔයාද රොෂාන්ගෙ වයිෆ්?"

"ම........ ඔව්" සඳරු මඳ සිනාවක් පා පැවසුවාය.

"ආපෝ අදයි දැක්කේ........ එතකොට ඔයාද අර අනුරාධපුරෙන් ආවා කිව්වේ"

"මොනාද දිල්කි ඔක අහන්නේ........ මෙයා නම් වයිෆ් මෙයා තමයි අනුරාධපුරෙන් ආවේ. නේද සඳරු?" තව එකියක් වයින් විදුරුවක් අතැතිව කීවාය. මනුෂිගේ මිතුරියන් සඳරු වෙතට යනු දුටු නෙත්න ප්‍රියලාල්ටද ඉඟිකොට මාලිංග හා ඒ අසලට ගියේය.

"සඳරු ලස්සනට හෝල් එක ඩෙකරේට් කළා කියලා කට්ටිය කථා වෙනවලු........ මට නම් ඇහුණේ නෑ........"

"ඔක වැඩක් යැ නේද සඳරු........ මල් ටිකකුයි ගොක් අතු ටිකකුයි ගෙනත් එහෙ මෙහෙ ගැහුවාම ඩෙකරේට් තමා නේද?" එකිනෙකා එක එක දේ කියද්දී සඳරු පියුමිගේ මුහුණ බලා එතැනින් ගැල වී යන්නට හැදුවාය.

"ඔක හිතාගන්න ඔච්චර අමාරුද සංගීතා........ මෙයා වගේ මිඩ්ල් ක්ලාස් කෙල්ලක්ගෙන් අරලිය, ඔකිඩ් වගේ ඒවා මිස රෝස, කානේෂන් ........ ටයිගර් ලිලි බලාපොරොත්තු වෙන්නයැ" යි මනුෂි එතැනට එමින් කියද්දී එතැන සිටි අනෙක් සියල්ලෝම සිනාසෙන්නට වූහ. සඳරුගේ මුහුණ ලජ්ජාවෙන් රතු වෙනු බලා සිටි නෙත්නගේ කෝපය ඉවසුම් නැතිවිය. නෙත්නගේ වෙනස දැනුණ මාලිංග ඔහු අත අල්ලා ගත්තේය. තව දුරටත් මිතුරියන් ඇමතූ මනුෂි,





"මෙයා ඉතිං ජීවිතේ පුරාවෙම ගුඩු සෙල්ලම් කරනවා මිස ඔලිම්පික් ගේම් යන්න හිතලාවත් නැති කෙනෙක්" යි කියද්දී අනෙක් අය මහ හඬින් සිනාසුණහ. නෙත්න එක් වරම මාලිංගගේ අත ගසා දමා මනුෂි වෙත ගියද යළි ඔහු තමා වෙත ඇදගත් මාලිංග,

"ඉවසපං........ දාහකටත් වැඩි සෙනගක් මෙතන ඉන්නවා........ පිස්සු නටන්න එපා........ අංකල්ගෙ අවුරුදු විස්සක ජයග්‍රහනයක් මේ සමරන්නේ........ ඒ මනුස්සයට ඒ සතුට විඳගන්න දීපං" මාලිංග කියද්දී නෙත්න බැලුවේ සඳරු දෙසය........ඇය දැසේ කඳුළු පුරවාගෙන පුදුමයෙන් ද බියෙන් ද සිතා ගත නොහැකි බැල්මකින් මනුෂි දෙස බලා සිටියාය. එසේ මොහොතක් බලා සිටි ඈ ඔසරි පොට ගෙන මුව වසා ගත්තී පියුම්ද අතැර දිව ගියාය. එහෙත් මාලිංග අතින් කියද්දී පියුම්ද ඒ පසු පසම දිව ගියාය.

ගෙමිදුලේ සැම තැනම සෙනග නිසා ඔවුන් ගියේ කොහි දැයි සොයා ගැනීම ඉතා අසීරු විය. බැරිම තැන නෙත්න පියුමි වෙත ඇමතුමක් ගත්තේය.

"පියුමි........ කෝ........"

"ඉන්නවා........ එළියේ බෝගන්විලා පඳුරෙ එහා පැත්තේ........" මදක් මිතුරියගෙන් මිදී එහාට ගිය පියුමි රහසේ පැවසුවාය.

"අඬනවද?"

"ගෙදර යන්න ඕන කියනවා"

"ඕන නම් මගේ යතුර අරන් යන්න........ මටත් ඕන හෙට මේ ගැන ගෙදර කථා කරවන්න"

"එහෙනම් යන්නද? මොකද ජයතුංග එළියෙ ඉන්නවා"

"හා........ මොකද අද රෑ එක දෙක වෙනකල් පිරිමින්ගෙන් එයාව පරෙස්සම් කරන එකත් ලේසි නෑ........"

"ඔව්........ මමත් බලාගෙන........ එහෙනම් අපි යනවා........"

"පරෙස්සමෙන්........ ගිය ගමන් කෝල් කරන්න........"

සඳරු යාම නිසා සිතට පාළුවක් මෙන් දැනුණද ඇය සිටිනවාට වඩා සිතට සැහැල්ලුවක් ඇතිණ.

"කෙල්ල යැව්වා අපරාදේ?" යළිත් ආ මාලිංග පැවසීය.

"නෑ බං........ මෙතන ඉන්න සෙවලයන්ගෙ ඇස් එයා පස්සෙමයි. බොරුවට හරි ගිහින් අත අල්ලනවා.

"අතන අර ඉන්න උප එකා මම දැක්කා දෙපාරක් විෂ් කරනවා ........"

"උඹත් දැන් තද ඉරිසියාකාරයෙක් වෙලානේ"

"අයියටත් අත ගහලා නැති එකෙක් මොන රෙද්දකටද එක එකාට අත අල්ලන්න දෙන්නේ. එතකොට ඒකිගේ අගේ යනවා" නෙත්න කිව්වේ සිනාසෙමිනි.

"අනේ අම්මපා........ තාම මේ රොෂාන් අයියා ළඟ ඉඳලා........ උඹට කෙල්ලව අහු උණු ආට දෙයියන්ගෙම පිහිටයි ඒකිට"

"මමත් මේ මට හරියකට අහුවෙනකල් ඉන්නේ........ තාම මම වත් ඔකට අත තියලා නෑ........ එහෙව් එකේ මම කොහොමවත් යන හැලගෙම්බො........ ප්‍රෙග් එකේ කියන එක ප්‍රෙග් පිටම තියා ගත්තම ඉවරයි........" නෙත්න කියද්දී මාලිංග මහ හඬින් සිනාසුණේය.

සාදයට පසු දින උදෑසන නිවසේ සියලුම කථාබහ සඳරු වටා ගොනු වී තිබිණ. මනුෂි කල කී සියල්ලම රිද්මිගේ මිතුරියක් රිද්මිට එවෙලෙම පැවසුවෙන් මව ඇතුළු අන් අය කලබල විය. එහෙත් නෙත්න ගේ කීම පිට පියුමි සඳරුව රැගෙන ආ බව කිසිවෙක් නොදත්හ. කවුරුත් සිතුවේ හඬමින් ශාලාවෙන් එවෙලේම ආ බැවින් ඒ මොහොතේම ඇය ගෙදර ආ බවකි........ ඒ වන විටද සඳරු සරසවියට ගොස් තිබුණෙන් නෙත්නට විවෘතව කථා කළ හැකි විය.

"ඔගොල්ලො දැන් මෙතන පිකටින් කළා කියලා සඳරුට වෙච්ච අවනම්බුව වැහෙන්නෙ නැහේ. ඇයි ඔය ගැන ඔය තරම් කථා කරන්නේ........"

"ඒ වෙලාවෙ අපි බැලුවා සුදූ පුතා........ මේ ළමයා එතකොටත් නෑ"

"බලන එක නෙවි අම්මා වැඩේ........ ඒ ළමයට මේ ගෙදර නිසි තැන නැති එක........ තව අවුරුදු දහයක් ගියත් ඒ කෙල්ලගෙ ඉරණම ඒක........ මේව මෙහෙම වෙන්න රොෂාන් අයියත් වග කියන්න ඕන. මම එයාටත් මේ ගැන කියනවා. වත්තේ අයිතිකාරයා වත්ත ගැන හොයන්නෑ කියලා දැනගන්න ඕනම තිරිසනෙක් ඒ වත්ත ඇතුළෙ ඔඩා නටනවා........එත්කොට වැට ගහන්න ඕන........ නැතිනම් විකුණන්න ඕන........" එසේ කී නෙත්න එතැනින් නැගිට ගියේ කේන්තියෙනි.

රසාංග හා රිද්මී මව දෙස බැලුවේ සොයුරා කියන්නේ සත්‍යයක් බව පවසන ලෙස හිස වනමිනි.





සාදයකට යන බව කියා නිවසින් ගිය නියති රෑ එකොළහ පසුවිත් නිවසට නොපැමිණි බැවින් ඇයව රැගෙන එන ලෙස මව නෙත්නට පැවසුවෙන් ස්ථානය අසාගත් නෙත්න හෝටලය වෙත ගියේය. ඔහු සෙනග අතරේ මදක් ඒ මේ අත ඇවිද්දේ නියති කොහේදැයි කිප දෙනෙකුගෙන්ම විමසමිනි. ඔවුන් පෙන්වූ දෙසට ගිය නෙත්නගේ දෙනෙත් ඔහු දුටු දසුනින් විසල් විය.

මත්පැන් විදුරුවක් තොල ගාමින් සිටි ඇය අත වූයේ සිගරට් එකකි. පළපුරුදු එකියක මෙන් ඇය සිගරට් එක බොනු දැක නෙත්නගේ ඇඟ හිරි වැටී ගියේය. මොහොතක් ගල් ගැසුණා සේ එදෙස බලා හුන් නෙත්න වහාම ඇය වෙත ගොස් ඇයව නැගිටුවා ගත්තේය.

"නෙත්නයි........යා........" නියති දෙනෙත් හැර බැළුවේ වෙරි මතින් බව නෙත්නට වැටහිණ. ඇය අත වූ සිගරට්ටුව තාමත් ඇවිලේ. නෙත්න ඇය අත වූ සිගරට් එක ගෙන විසිකළේය.

"එනවා........ යන්න ගෙදර........" දත්මිටි කමින් පැවසූ ඔහු අත් අයට වෙනසක් නොවෙන්නට ඇයගේ උරහිසේ අත දමාගෙන ඇයව එළියට කැටුව ගියේය.

"නෙත්........ නයි........ යා තාම පාටිය........ ඉවර නෑ........"

"නියති මගෙන් ගුටි නොකා නගිනවා වාහනේට" නෙත්න කියද්දී ඇය එක්වරම හැරී නෙත්න දෙස බැලුවාය.

"මොනාද කිවෙ ඔයාගෙන් ගුටි කන්න........ ඇයි ඔයා මට ගහන්නේ........ ඔයාට මොකක්ද අයිතිය"

"අයිති........ මම ඔයාගෙ අයියා........ මස්සිනා........අපේ ගෙදර ඔයා ඉන්නේ"

"ඔය එකක් වත් මට ගහන්න තරම් අයිතියක් ඔයාට දීල නෑ........" නියති කියද්දී නෙත්න ඇයව බලෙන් මෙන් වාහනයට නංවා ගෙන වාහනය පණ ගැන්විය.

"ඇයි මේ මාව බලෙන් අරන් යන්නේ"

"අරන් යන්නැතුව තමුසෙට මෙතන විස්කි ගගහ සිගරට් බිබී ඉන්න දෙන්නද කියන්නේ"

"ඇයි........ඉ........ඉතිං........ ඔයාට මොකද........ ඔයා මගේ කවුරුත් නෙවි........ නම........ ඔයාට මොකද මම මොනා කරත්"

"මම ඔයාගෙ කවුරුත් නෙවි? නියති ඔයාට වෙරිද? ඇයි මෙහෙම කියන්නේ"

"එහෙම කියන්නේ ඔයා වෙනස් වෙලා නිසා........ ඇමරිකාවෙදි ඔයා මට ආදරේ කලා........ මාව මැරි කරන්න හිටියා........ ඒත් අද තියනවද ඒ ආදරේ........ මට ඇත්ත කියන්න නෙත්නයියා තියනවද ඒ ආදරේ?" නියති අසද්දී ඔහු නිරුත්තර විය.

"නියති මෙ අහන්න නංගි" නෙත්නගේ කටහඬ වඩා මෘදු ලෙස ඇයව ඇමතිය.

"මට අහන්න අළුත් දෙයක් නෑ නෙත්නයියා. මොකද ගොඩක් කාලෙක හිට මේ ගෙදර වෙන දේවල් මම දකිනවා........" නියති කියද්දී ඇය කියන්නේ මොනවාදැයි ඔහුට බිය සිතිණ.

"මම තාම දන්නේ නෑ ඔයා ආදරේ කරන්නේ කාටද කියලා........

ඒත් ඒ මට නෙවි බව හොඳටම දන්නවා. මම........ මට ඇත්ත කියන්න........ මට ඇත්ත කියන්න" ඇය ඔහුගේ අතින් අදිමින් පැවසුවාය. නෙත්න අතරමග පාරේ රථය නතර කළේය.

"නියති මෙ අහන්න........ අපි දෙන්නා එකට හැදුණ බව ඇත්ත. අපි එහෙදි ආදරේ කළා කොහොම වෙනත් ගොඩක් ළඟින් ආශ්‍රය කළ එකත් ඇත්ත. ඒත් ලංකාවට ආවම මට තේරුණා අපි දෙන්නා ගැළපෙන්නේ නෑ කියලා........ මගෙයි ඔයාගෙයි අදහස් වෙනස්........ ආශ්‍රය කරන අය........ සමාජය වෙනස්. මට තව දුරටත් ඉස්සර ගෙවපු ජීවිතේ ඉන්න බෑ. මම වෙනස් වෙලා"

"වෙනස් වෙලා නෙවි නෙත්නයියා වෙනස් කරලා. මට ඕන දැනගන්න ඔයාව වෙනස්කලේ කවුද කියලා?"

"ඒක දැනගෙන ඔයාට වැඩක් නෑ........ මොකද මම එයාව මැරි කරයිද නැද්ද මම දන්නෙ නැති නිසා........ මම දන්නේ මම ඔයාට ආදරෙයි........ හැබැයි මගේ ලවර් විදියට නෙවි........ මගේම නංගිට වගේ........ එහෙම නැතුව පෙම්වතියකට වගේ ඔයාට ආදරේ කරන්න මට බෑ........ ඔයා මගේ නංගි විතරයි"

"ඔයා දන්නවද තව ටික දවසකින් අපේ වෙඩින් එක ගන්න නැන්දිලා තාත්තිලා හිතා ඉන්න බව"

"ඔව් මම දන්නවා. ඒක නිසා තමා එදා රෑත් මම ඔයාට කථා කරන්න ආවේ. එදා රෑ ඔයා මා එක්ක කථා කරන්න කැමති උණේ නෑ"

"මම දැනගෙන හිටියා උත්තරේ........"

"ඒ කියන්නේ ඔයත් දන්නවා මම කියන්න හිටිදේ........අපි දෙන්නා ගැන අපි දෙන්න හොඳට දන්නවනේ........ ඇයි අපි මැරි කරලා





නිකං නොගැලපිම එක්ක හිත නරකින් එක ගෙදරක ඉන්නේ. ඇයි අපිට බැරි අපේ සහෝදර කම තියාගෙන හැමදාම මෙහෙම ඉන්න........ සමහරවිට අපි බැන්දොත් අපි දෙන්නටම අපි දෙන්නා එපා වෙවි. මොකද ඔයාට බෑ මගෙ විදියට හැඩ ගැහෙන්න. මටත් බෑ ඔයාගෙ ලෝකෙට එන්න. මම ආසා කරන්නේ මගේ හැම වැඩක්ම හොයලා බලලා කරන මගේ හුස්ම වැටෙන හඬ පවා අඳුන ගන්න පුළුවන් කෙනෙකුට........ මාව නලවන්න, කවන්න, පොවන්න කොටින්ම මාව දරුවෙක් වගේ බලා හොයාගන්න පුළුවන් කෙනෙකුට........ මම දන්නවා ඔයාට බෑ ඒ වගෙ ජීවිතයක් ගෙවන්න........ ඔයා ආසා හරි සරල සැහැල්ලු විදියට යාළුවො, පාටි........ ඒ වගේ තියන ලයිෆ් එකක් ගෙවන්න. මගේ විදියට හැඩ ගැහෙන්න තරම් ඔයා මෝරලා නෑ........ බොළඳ වැඩි. ඉතිං එහෙව් එකේ අම්මලගෙ හිතට හරි ඔයාගෙ ඕන කමට හරි මම ඔයාව මැරි කරොත් මාසෙ යනකොට මට ඔයාව එපා වෙවි"

"ඔයාගෙ ළඟ මා ගැන තියෙන හැඟීමෙ වටිනාකම මොකද?"

"ඊටත් අඩු වෙන්න පුළුවන් නියති........ මොකද මැරි කරපු පළවෙනි පැයේ ඉඳලා මම හොයන්නේ මට ඕන කරන ආදරේ. ඒක නැතිවන කොට අපි අතරේ ගැටීම් ඇතිවෙන්න පුළුවන්. උදේ නැගිටලා තේ හදලා මට අරන් ඇවිත් කථා කරනවා වෙනුවට අපි දෙන්නම එකම වෙලාවක් වෙනකල් නිදියාවි. ගැහැනියෙක් ගෙදර ජීවිතයේදි මිනිහට ඉස්සරහින් ඉන්න ඕන. හැම දේකදිම. ලෙඩ දුකේදි. අනිත් හැම දේකදිම. එතකොටයි ඒ පවුල ගෙනියන්න පුළුවන්. ඒත් මම දන්නවා අපි දෙන්නට එහෙම ඉන්න බෑ........ මොකද එහෙම ආදරයක් අත් විඳපු නිසා මම ඔයාගෙ හැම දෙයක් තුළින්ම එයාව හොයාවි. මොකද ඔයාගෙ ආදරේ බැඳීම තියනකොට එයාගෙ ආදරේ ශ්‍රද්ධාව තියනවා කියලා මම දන්නවා. බැඳීම මිනිස්සුන්ට අයිති දෙයක්. ඒත් ශ්‍රද්ධාව දෙවියන්ට අයිති දෙයක්. මම දන්නවා එයා මට දෙවියන්ට වගේ සලකනවා. මම පතන්නෙත් ඒ වගේ ආදරයක්. ඉතිං එහෙම කෙනෙක් ලැබිලා නොලැබුණොත්........ මම වචනෙන් වචනෙට එයා ගැන කියාවි........ කසාද බැඳලා සතියෙන් ඔයාට මාව එපා වෙවි. ඔයාම කියාවි මාව බැඳගත්තෙ වෙන ගෑනුන්ගෙ නම් කියන්නද........එහෙනම් එයා ළඟටම යන්න කියලා........ ඒ දේ වෙනට වඩා සිය ගුණයක් මේ වෙන්වීම හොඳයි. තරහෙන් දුකෙන් ආයෙ මූණ නොබලන්න වෙන් වෙනවට වඩා මේ වෙන්වීම

සේරම තියනවා. ටික ... අපේ සහෝදරකම යාළුකම සේරම තියනවා. ටික සැනසිලිඅයකයි. අපේ සහෝදරකම යාළුකම සේරම තියනවා. ටික කාලෙකට ඔයාගේ හිතේ දුක තියේවි. ඔයාටත් ගැළපෙන කෙනෙක් මුණ ගැහුණම තේරේවි නෙත්නයියා එදා කිවේ කොච්චර ඇත්තක් ද කියලා.........එතකොට නම හිතෙයි අපි දෙන්නා මැරි නොකළ එක කොයි තරම් හොඳද කියලා"

"ඔයාට මය හැම තර්කයක්ම ගේන්න පුළුවන් ඔයා මට ආදරේ නොකළ නිසා. ඒත් මම ඔයාට ආදරේ කළා........ මම ඔයාගෙන් ආදරේ අඳුන ගත්තා........ පුංචි කාලෙ හිට ඔයා විතරයි මා ගාව බෝයි කෙනෙක් කියලා හිටියෙ. ඉතිං මම ඔයාට බැඳුන එක ආදරේ කරපු එක මගේ වරදක්ද......... එහෙම ආදරේ කරලා දැන් මට ඔයා කියන්නේ ඔයා කියන කොට මම මගෙ හිත වෙනස් කරගන්න ඕන කියලද........ ඔයා කියන විදියට මම මොනවා හරි බඩුවක් මුට්ටුවක්ද හිතෙන හිතෙන විදියට වෙනස් වෙන්න" ඇය කෑ ගසා ඇසුවාය. ඇය කෑ ගැසුවද නෙත්නට තරහ ගියේ නැත........ මන්ද ඇගේ හිතේ දුක ඔහු හඳුනන බැවිනි.

"මෙ අහන්න නියති........ මට ඔයාගෙ දුක නොතේරෙනවා නෙවි........ මම හොඳටෝම දන්නවා ඒ ගැන. ඒත් ඇයි ඔයා නොහිතන්නේ මේ දුක තාවකාලිකයි කියලා........ ඔයයි මමයි මේ ඇත්ත පිළිගන්න ඕන. ඔයා පිළිගත්තත් නැතත් මම ඔයාට හුගක් ආදරෙයි. රිද්මි අක්කිට තරමම......... සමහරවිට ඊටත් වැඩිය ආදරෙයි. මොකද අපි දෙන්නා හැදුනෙ එකට නිසා........ ඒක නිසා මම කැමති නෑ මම නිසා වත් ඔයා අමාරුවෙ වැටෙනවා බලන්න......... ඒක මගේ හිතට හරි දුකක්......... ඒක නිසා මේ මගුල කෙරෙන්න බෑ"

"ඇයි මට කියන්නේ......... ඔයාගෙ අම්මිට කියන්න......... ඔයාගෙ මාමාට කියන්න......... අහිංසක මාව විතරක් බයකරගන්න හදන්නේ ........ කියන්න ඔයාගෙ ගෙදරට කියන්න......... මාව බඳින්න බෑ කියලා. මාව ඔයාට ගැළපෙන්නේ නෑ කියලා කියන්න........." ඇය කෑගසා කියා හඬමින් දෙදණහිසේ මුහුණ ඔබා ගත්තාය. නෙත්නට දැනුණේ දැඩි වේදනාවකි. මේ බොළඳ යුවතියට සත්‍ය වටහා දීම බොහෝ දුෂ්කර වනු ඇත. ඇය දුක් වෙද්දී තමා බලා සිටින්නේ කෙසේද.........

"නියති බබා........ මම කියන දේ අහන්න........" නෙත්න ඇය දෙසට නැමී ඇයගේ උරහිසට අත තබා පැවසුවද හිස එසවූයේ





නියති නොවේ......... දැන් ඉතිං ඔහු කුමක් කිවද තමාට ඒ කිසිවක් එතරම් වැදගත් නොවනු ඇත. ඔහු අද එතරමම කියුණු ලෙස තමා ප්‍රතික්ෂේප කළ හැටි......... තවත් ඔහුගේ බහ ඇඳහුවද, නැති වුවද ලොකු වෙනසක් නොවනු ඇත.........

බොහෝ වේලාවක් නියතිට කරුණු පැවසූ නෙත්න ඇයද කැටිව නිවසට ගියේ බොහෝ කල් ගත වී ගිය පසුවය. වාහනයෙන් ඉක්මනින් බැසගත් නෙත්න අනෙක් පසින් ගොස් නියතිගේ දොර හැර ඇයව බස්සවා ගත්තේය. ඇයගේ කරවටා අත යවා ගත් නෙත්න ඇයට කුමක් හෝ පවසමින් ගෙතුළට ගියේය. ඒවන තුරුද සාලයේ සිට රූපවාහිනිය නරඹමින් මව සමග ඇහැරී සිටි සඳරු දොර හැරෙන ශබ්දය ඇසී හැරී බලද්දී දුටු දසුනින් සිත මදක් තිගැස්සී ගියේය. නෙත්න ඇතුළට ආවේද නියතිගේ කරවටා අතක් යවාගෙන ඇයව තමා වෙත සමීපව ළංකොට ගනිමිනි. සඳරු තමා දුටු වනම ඇයගේ මුහුණ වෙනස් වනු නෙත්න දුටුවද ඒ ගැන නොතැකූ නෙත්න නියති හා පහළ මාලයේ වූ ඇයගේ කාමරයට ගියේ මවටද කිසිවක් විමසන්නට එපා යැයි ඉඟි කරමිනි.

"එහෙනම් අම්මා දැන් නිදාගන්න......... මම උඩට යනවා" එසේ කියූ සඳරු තරප්පු පේළිය නැග උඩුමහලට ගියාය. කාමරය තුළ රොෂාන් සිටියද ඇයට නිදිමතක් නොවූයෙන් ඇය කාමරය ඉදිරිපිට වූ ගරාදි වැටට හේත්තු වී අඳුර දෙස බලා සිටියාය. ඇයගේ හදවත රිදී තිබිණ. ඒත් එසේ රිදීමට හේතුව ගැන සිතද්දී එය කෙතරම් සාධාරණ හේතුවක් ඇයි ඇය සිතුවාය. නියති යනු නෙත්නගේ අනාගත මනාලියයි. දෙමාපිය ආශිර්වාද මැද ඔවුන් විවාහ වීමට සිටින්නේය. ඉතිං ඔවුන් කුමක් කළද, කොහේ ගියාද, කෙසේ ආවද, හැසිරුණද එය තමාට ප්‍රශ්නයක් නොවිය යුතුය. ඒත් නොනවතී හිතවත් මේ දෙය නොසිතන්නේ ඇයි. නෙතට කඳුළක් උණා ආවේ ඒ අතිකරු කමටය.

නෙත්න ටික වෙලාවකට පසු උඩට ආවේ සඳරු ගැන සිතමිනි. "දැන් මොනවා හිතනවද........." එසේ සිතූ ඔහු තමාගේ කාමරය පසුකොට ගොස් බිත්තියට මදක් මුවාවී මදක් එහායින් වූ ඇයගේ කාමරය දෙස බලද්දී කොරිඩෝරයේ වූ ගරාදි වැටට හේත්තු වී අඳුර දෙස බලා සිටින සඳරු දුටුවේය.

......... ම්ම හිතුවා හරි. ඔයා ඉන්නේ කල්පනා කර කර......... ඇත්තටම මේ ගෑනුත් පුදුම ජාතියක්. දෙන්නගෙන් එක්කෙනෙකුටවත් බැරිද මගේ හිත තේරුම් ගන්න......... එපා එකිට එපා කියන එක තේරෙන්නෙ නෑ......... ඔන එකිට ඕන කියන එක තේරෙන්නෙ නෑ......... "damn......... it" බිත්තියට පහරක් ගැසූ නෙත්ත ආපසු හැරී කාමරයට ගියේය. බොහෝ වේලාවක් තනිවම කල්පනා කරමින් සිටි සඳරු කාමරයට ගියේ නිදිමත පැමිණ දෙනෙතට අරක් ගත් පසුවය.

පෞද්ගලික ව්‍යවසායිකයින්ගේ සංවිධානයේ දේශන හා සම්මන්ත්‍රණ මාලාවක් සඳහා සහභාගි වන්නැයි නෙත්තගේ පියාට ආරාධනා ලැබුණේ මේ අතරය. එම සම්මන්ත්‍රණ මාලාව ජාත්‍යන්තර මට්ටමේ වූවක් විය. අලුත් ව්‍යාපාර ඇරඹීමට පවත්වාගෙන යාමට නව තාක්ෂණ විදි හඳුන්වා දීමත් අන්තර් ජාලය හරහා ව්‍යාපාර කටයුතු මෙහෙයවීම ගැන ව්‍යාපාරිකයින් දැනුවත් කිරීමත් අරමුණු කොට පැවැත්වෙන එම දේශනමාලාව ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටකට, එහි සිටින ව්‍යාවසායිකයින්ට නව ලෝකය වෙත ගොස් ඔවුන් හා අදහස් හුවමාරුවට ලැබෙන කදිම අනගි අවස්ථාවක් විය.

නුවර එළියේ පිහිටි තරු පන්තියේ හෝටලයක් වන ටී ෆැක්ටරි හෝටලයේ එම සම්මන්ත්‍රණ පැවැත්වෙන බැවින් ඒ සඳහා සහභාගි වන්නැයි එම ආරාධනාවෙන් කියවිණ. එම සම්මන්ත්‍රණය ව්‍යාපාරික ප්‍රජාව අතර ඉමහත් ආන්දෝලනයක් ඒ වන විටද ඇති කොට තිබුණේ ලංකාවේදී පළමු වරට එතරම් විශාල සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලද බැවිනි.

එදින රාත්‍රියේ තිවසට ආ පියා මේ ගැන කෑම මේසයේදී අනෙක් අය වෙත දැනුම් දෙද්දී අවන්ත මුලින්ම එයට යා නොහැකි බව පැවසීය. රොෂාන් අතිද්දා දිනයේ යළිත් මැලේසියාවට යන බැවින් ඔහු ඒ ගැන කතා නොකළේය.

"ඇත්තටම හරිම හොඳ චාන්ස් එකක්......... ෆස්ට් ටයිම මම හිතන්නේ ලංකාවේ මිය වගේ දෙයක් කරන්නේ........."

"ඇයි අවන්ත ගියා නේද දැන් අවුරුදු දෙකකට විතර කලින් ඔය වගේ එකෙකට ක්වාලාම්පූර්වල"





"ඒ රටවල නම් ඔවා නිතරම තියනවානේ......... ඇත්තටම ඒවා හරි ෂෝක්......... කවුරු හරි යනවා නම් හොඳයි" අවන්ත පියා දෙස බලමින් පැවසීය.

"තාත්තිට යන්න බෑ ලොකු පුතා......... තාත්ති ලෙඩ ගානේ......... තනියම ගිහින් බෑ කොහොමත්"

"ඒ උණාට අම්මි කවුරු හරි යන්න ඕන"

"මම කියන්නද......... සඳරු යවමු........." රසාංග කීවේ කල්පනා කරමින් සිටිමිනි.

"ඒ ළමයා තනියම.........?" මව ඇසුවාය.

"මෙකයි ශ්‍රියන්තා ඇත්තටම අපිට වඩා අලුත් ජෙනරේෂන් එකට තමා මේක හොඳටම ප්‍රයෝජනවත්......... සඳරු ඉගෙන ගන්න දේවල් එක්ක එයාට මේ දැනුම ලැබුණොත් ඒක එයාට කොහොමත් හරි වටිනවා ඉස්සරහට. අනෙත් එක වෙන රටවල අය අඳුනගන්න ලැබෙනවා. අලුත් එක්ස්පීරියන්ස් ගන්න ඒක හොඳ අවස්ථාවක්........."

"සඳරු යාවිද......... තනියෙන් නම් යන එකක් නෑ........." ඊද්මි කීවාය.

"ඉතිං පියුමියි නෙත්තයි දෙන්නා එක්ක යවන්න......... මොකද නෙත්තට උණත් මේක අපි හැමෝටම වැඩිය වැදගත්........."

"කෝ ඉතිං අහලා බලන්න තුන්දෙනාගෙන් එක්කෙනෙක්වත් ඉන්නවයැ"

"අහන්නෙ මොනවද......... අපිත් එක්ක කම්පෙටිෂන් ඉන්න හැම කම්පැනියක්ම ඕකට යනවා. නොගියොත් පාඩු අපටමයි. එතනදිත් තියරි පැත්තෙන් ගත්තත් සඳරුට මේ ගැන දැනුම වැඩියි මටයි අවන්තටයි වැඩිය. ඒ නිසා නෙත්තයි සඳරුයි යවන්න......... සඳරුගෙ තනියට පියුමිට යන්න කියන්න......... මේ සෙමිනා එක හරි වැදගත් ........." එසේ කියූ පියා පළතුරු සලාදය ටිකක් කප් එකකට බෙදා ගත්තේය.

සම්මන්ත්‍රණ සඳහා තමන් තිදෙන යැවීමට පියා තීරණය කොට තිබුණෙන් එහි යනවා මිස විරුද්ධ වීමට සඳරු හා නෙත්ත දෙදෙනාටම නොහැකි විය. සඳරු නම් නිහඬව සිටියද තමාට යා නොහැකි බව නෙත්ත මවට කීවද පියා යන්නට කියා ඇති බව මව අවධාරණය කළෙන් නෙත්තට කළ හැකි දෙයක් නොමැති විය. නෙත්ත එහි යාමට අකමැති වූයේ සඳරු නිසාවෙනි. ඇය ඇති

තැනක ඇය හා කථා නොකර ඇය දෙස නොබලා සිටීම ඉතාමත් අසීරු කරුණකි. එසේ වූ කළ දින කිපයක් ඇය පෙනි පෙනී ගත කරන්නේ කෙසේද.........

පියුමිට කථා කළ නෙත්න ඇයටද පැවසුවේ එළඹ ඇති තත්ත්වයයි.

"කරන්න දෙයක් නෑ නෙත්න......... ආන්ටි මට කිවා......... මට නම් ප්‍රශ්නයක් නෑ......... මම එන්නම්. මිස්ටර ජයවර්ධනට මම සේරම හැන්ඩ් ඕවර් කළා......... ඔයා ඕවා ඔච්චර හිතන්නෙ නැතුව යමු"

"මාලිංග වත් එක්ක යන්න තිබුණා නම්"

"මාලිංගට යන්න වේද දන්නෙ නෑ නෙත්න......... අම්මිට ආයෙ ටිකක් සනීප මදි........."

"අයියෝ ඇත්තද......... මම එහෙනම් දැන්ම කෝල් එකක් දෙන්නම්......... මේ ඔයාගෙ යාලුවට එහෙනම් අවශ්‍ය උපදෙස් දීලා ගමනට ලෑස්ති කරන්න......... හැබැයි මට මල පනින ඒවයෙන් වැළකිලා ඉන්න කියන්න........."

"හරි......... සර්......... හරි......... අනෙත් එක්කෙනාත් ඉතිං කල්පනාවෙන් හිටිය නම් හරි......... කොහොම උණත් ඉතිං ඔය තරහ දිගටම තියන එකක් නෑ........." එසේ කියූ පියුමි සිනාසෙන්නට වූවාය.

"තරහ උණත් නැතත් අනුන්ගෙ ගෑනු මට එපා"

"කව්ද අනුන්.........?"

"කව්ද ඉතිං......... ගිම්හාන මිස"

"ඔයා තාමත් එහෙම හිතන්නේ ඇයි......... ඒ දෙන්නා........."

"ඒක වැඩක් නෑ......... මගෙ ඇහින්ම දැක්ක දේනේ......... හරි......... එහෙනම් හෙට උදේ......... ඕ. කේ."

kathapothak.blogspot.com



# 25

ගමනට අවශ්‍ය සියලුම කළමනා ඇඳුම් පැළඳුම් ආදිය අසුරා වාහනය තුළට ඇමූ සඳරු මවට හා පිද්මිට පවසා පියුමි සමග වාහනය තුළට නැංගාය.

"දූව සඳී......... පරෙස්සම් වෙන්න. හතුරො කොහෙත් ඉන්න පුළුවන්"

"හොඳයි අම්මි......... අපි ගිහින් එන්නම්........."

මාලිංගගේ නිවසේදී නෙත්න හා වාහනයේ ඉදිරිපසින් මාලිංග ගොඩ වූ අතර පියුමි හා සඳරු වාහනයේ පිටුපසට ගොඩ විය. නෙත්න ඒ දුටුවද නොදුටුවා සේ සිටියේය. මඳ දුරක් ගිය තැනේදී සඳරු ඇමතූ පියුමි.........

"ඒයි......... සඳී පලයන් ඉස්සරහට......... මාලිංගට පස්සට එන්න ඕන" යි කීවාය.

"ඔහොම යමං බං......... කොහොත හිටියත් වාඩි වෙලානෙ යන්නෙ"

"ඒ උණාට මේ ෂීට් එක මගේ නෙවි" මාලිංග පැවසීය.

"ඒක මගෙත් නෙවි......... ඒක නිසා ඔහොම යමු" සඳරු පැවසුවද නෙත්න සිටියේ නිහඬවය.

සෑහෙන දුරක් ගමන් කළ තැන පියුමිට ඇනුණේ ඇඩි කුසගින්නකි.

"නෙත්න දැන්නම් මට හොඳටම බඩගිනියි. කොහේ හරි කඩයක් ළඟ නතර කරමුකෝ........."

"මේ හරියේ තියෙන්නෙ පොඩි කඩනේ පියුමි......... තව ටිකක් යමු"

"බෑ බෑ නෙත්න මාව මැරෙයි බඩගින්නේ......... ඔය කඩ හොඳයි" පියුමි කියද්දී අසල ඉඩ පහසුව හොඳින් තිබූ කඩයක් ළඟ නෙත්න වාහනය නතර කළේය. පියුමි හැම දෙනාටම පළමු ගොස් එළියේ වූ කුඩා රවුම් මේසයක වාඩි වූවාය.

"මොනාද කන්නේ නෙත්න.........?"

"මොනාද දන්නෙ නෑ තියෙන්නෙ යමු බලන්න........" එසේ කියූ නෙත්න මාලිංග හා ගොස් විමසද්දී පිට්ටු, ඉඳිආප්ප හා පොල් රොටි තියෙන බව පවසද්දී,

"ආ........ නෙත්න........ මට නම් පොල් රොටි ඔන" යිය පියුමි කීවාය.

"මට පිට්ටු හොඳයි........ ඔයාගෙ යාළුවට"

"එයා ෂුවර් එකට පිට්ටු කයි........ දෙන්නටම ගන්න" යි කීවාය.

ආපසු මේසයට ආ නෙත්න එහි වාඩි වූයේ ඈත බලා සිටින සඳරු දෙස නොබලමිනි. කෑම ගෙනා පසු කෑම ගත් නමුදු නෙත්න වැඩි පුර කථා නොකලේය.

එහි වූ නිහඬ බව නොඉවසූ පියුමි නොයෙක් දේ කථා කළද සඳරු හා නෙත්න වෙන වෙනම ඇයට පිළිතුරු දුන්නද දෙදෙනා අතර කිසිදු කථා බහක් නොවීය.

"මොනාද අප්පා මම නිකං ගොලුවො දෙන්නට මැදිවෙච්ච තෝල්කයා වගේ වෙලානෙ. මෙ දෙන්නට එන්න කියලා අපට නවතින්නයි තිබුණේ"

"හාපෝ ඔයාලා ආවේ නැත්නම් මම එන්නෑ පියුමි........ තාත්තිට බඹබු ගහගන්න කියලා මාතර යනවා........"

"මාතර........? ඒ කොහෙද?"

"මගේ යාලුවෙක් ඉන්නවා එහෙ........ ඇමරිකා හිටියෙ........ දැන් නිවාඩු ඇවිත්........"

"ඔච්චර තරහෙන් ප්‍රශ්න විසඳන්න බෑ නෙත්න........ දෙයක් තියේ නම් කතා කරලා විසඳගන්න"

"තිබ්බච්ච ප්‍රශ්න දැන් විසඳිලා ඉවරයි. බලා ඉන්නෙ ඒවයේ ප්‍රතිඵල තමා........" නෙත්න කීවේ අසුනින් නැගිටිමිනි. ඔහුගේ හැසිරීමට සඳරුගේ දෙනෙත පුරා කඳුළු නැගිණ.

පැය කීපයක් ගතවෙද්දී නුවර එළියට පැමිණි ඔවුන් නැවතීම සඳහා තැනක් සෙවූහ.

"හොටෙල් එකකට යමු පියුමි කියන එක අහලා"

"ඕන නෑ නෙත්න........ අපි ඔය සාමාන්‍ය ගෙස්ට් හවුස් එකක නවතිමු........ රූම් දෙකයිනේ ඕන........ අපරාදෙ දහස් ගණන් සල්ලි වියදම් කරන්න ඕන නෑ........"

"ඔයාලට පිස්සු........ මම නම් ආසා නෑ ඔන්න මුලින්ම කිව්වා"





"හරි........ ෆස්ට් වේ එකේ බලමු........ බැරි උණොත් ඔයා කියන දෙයක් ඕ. කේ." පියුමි කියද්දී නෙත්න ඒ අවට තිබූ නවාතැන් පොළවල් කීපයක්ම විමසා බැලූහ........ අවසානයේ ඔවුන් ගිය තැන දුටු සඳරු හා පියුමි ආශාවෙන් මත් වූවන් සේ එහි වූ සුන්දරත්වය බලා සිටින්නට වූහ........

"ආ........ නේ සඳී........ බලපංකෝ මේකෙ ලස්සන........ මල්........ පිස්සු හැදෙනවා........ අනේ නෙත්න කිය උණත් කමක් නෑ මෙහෙ ඉමු........" පියුමි කෑ ගසද්දී සඳරු අවට පරිසරය දෙස ආශාවෙන් බලා සිටින දෙස හොරැහින් බැලූ නෙත්නගේ මුවඟ සිනාවක් නැගිණ.

"........මුන් දෙන්නාවනම් ගෙදර ගෙනියන්නත් බැරි වේවි........" අවට පරිසරය බලමින් ඔහු මාලිංගට පැවසීය.

"හ්ම්........ යමු බලන්න........ කාමර තියනවද දන්නෙ නෑ........"

"එකෙක් දෙන්නෙක් එළියට ඇදල හරි රූම්ස් මේකෙන් ගමු........"

"ඒයි උඹ නම් මැරි කළ දවසක මේකි එක්ක නුවරඑළි එන්න එපා........ නුවර එළියෙ නවතින්න හදයි" මාලිංග නෙත්නට කීවේ සඳරු බිමට බැස මල් අතගාමින් සිටි අයුරු බලමිනි.

ඇතුළට ගිය නෙත්න හා මාලිංග කාමර දෙකක් වෙන් කරවා ගෙන යළි පැමිණ ඔවුන් සමග ආ සේවකයාට බඩු බාහිරාදිය රැගෙන යාමට ඉඩ සැලසූහ.

"සර්........ මේ එහා පැත්තෙ තමා ලවර්ස් ලීප් දිය ඇල්ල තියෙන්නෙ. සර්ලාට දවල් කෑම කාලා යන්න පුළුවනි."

"ගොඩක් දුරද මල්ලි?"

"නෑ සර්........ පයින් යන දුර........ පොඩ්ඩක් කඳුයි කැලෑවයි අතරෙන් යන්න ඕන........ දවාලෙන් පස්සෙ තව කට්ටි දෙකක් යනවා. සර්ලටත් ඒ ගමන් යන්න හැකි........"

"ඒක හොඳයි........ ඒයි නෙත්න කෑම දැන්ම ඕඩර් කරමුද?"

"උඹ ඕඩර් කරපං........ මගෙ හිස කැක්කුමයි........ මම නිදාගන්නවා ටිකක්"

"ඇයි ඉතිං බාම් එක එහා කාමරේ තියෙන්නෙ........"

"ඒක බාම් එක නම් මට ඔළුව කැක්කුම හැදේයැ........ ඒක නිසා තමා සේරම ලෙඩ"

"උඹ ඔහොම ඉඳලා බෑ බං........ උඹට කෙල්ලවත් ඕන........ උඹ ඒකි එක්ක මූණ බලලා කතා කරන්නෙත් නෑ........ ඉතිං කොහොමද

උඹේ බලාපොරොත්තුව ඉෂ්ට කරගන්නේ........ අද මම මේ සේරම වැඩ අලා ආවෙත් උඹලා දෙන්නා නිසා. පියුමි එහෙත් මැරෙන්න හදනවා උඹලා දෙන්නගෙ ප්‍රශ්නෙ ගැන කිය කියා. සඳී ගොඩ දවසට කන්නෙ නැහැලු. ඊයෙ ඔන්න ගැස්ට්‍රයිටිස් ඇවිත් බෙහෙත් ගෙනත්" මාලිංග කියද්දී ඇය ගැන නෙත්තට ඇනුණේ බියකි.

"ප්ලීස් මචං........ ඒකි එක්ක අඩු ගාණේ කතා කරපං........ ඒ කෙල්ල ඉන්නෙ කොච්චර ප්‍රශ්න මැද්දෙද........ රොෂාන්, උඹ, නියති, මනූෂි........ මේ හැමෝම ඒ කෙල්ලට ප්‍රශ්න. එහෙව් එකේ ඔය තරමට ඒ හිත රිද්දන එක පව්........" මාලිංග කියද්දී ඔහු කියන්නේ සත්‍යය බව නෙත්තට වැටහිණ. ඔහු සුසුමක් හෙළුවේ කොට්ටයේ ඇලවී ඇස් පියාගන්නා අතරේය. දහවල් කෑම කාමරවලට ගෙන්වා ගත් ඔවුන් ආහාර ගෙන දිය ඇල්ල බැලීමට යාමට පිටත්වූහ........

සඳරූ ඇඳ සිටියේ තමා ඇයට ජපානයෙන් ගෙන එන ලද සීත කබායකි. එය දුටු ඔහු සිතට ඇනුණේ පහන් හැඟුමකි. එහෙත් ඇය කිසියම් රෝගී තත්ත්වයකින් පසුවනවාදෝයි නෙත්තට හැඟුණේ ඇයගේ මලානික මුහුණ ඇකිමෙනි. ආහාරයෙන් පසු එවෙලෙට ඇවැසි දේවල් බෑගයක දමා ගත් ඔවුන් සිව් දෙන ගෙස්ට් හවුස් එකෙන් වැටී ඇති පාර දිගේ දිය ඇල්ල බැලීමට යන්නට පිටත් වූහ........ මාලිංග නෙත්තට දොස් කීමෙන් අනතුරුව නෙත්ත කිප වරක් සඳරු දෙස බැලුවද ඇය ඔහු යන බවක් හෝ නොදන්නා ගානට තමාගේ පාඩුවේ ගමන් කළාය.

පියුමි මාලිංග හා කථා කරමින් මදක් ඉස්සර වෙද්දී තම බෑගයේ වූ වෝක්මන් එක අතට ගත් නෙත්ත එය ක්‍රියාත්මක කොට එය අසන්නට විය. සඳරූ හැමටම පසුවී කල්පනා කරමින් හෙමිහිට ඇවිද ගියාය. දිය ඇල්ලේ සුන්දරත්වය දුටු කවුරුත් වශී වූවාසේ එදෙස බලා සිටින්නට වූහ. මාලිංග ඒ අවට නෙත්තගේ වීඩියෝ කැමරාවට නගද්දී තමා අත වූ ඩිජිටල් කැමරාවෙන් දිය ඇල්ල පසුබිම් කොට ගෙන වාඩි වී කල්පනා කරමින් සිටින සඳරූගේ ඉතාමත් කලාත්මක ඡායාරූප කිපයක්ම ඇයට රහසේ ගත්තේය.

නෙත්ත පියුමි හා සඳරූට මදක් එහායින් වූ ගලක වාඩි වී ඔහු ගත් සඳරූගේ ඡායාරූපය දෙස බලා සිටින්නට වූහ. ඒ මොහොතේ එහි ආ මාලිංග ඔහු අසල වාඩිවෙමින්,

"උඹ මොකද ගෑනි දිහා කැමරාවෙන් බලන්නේ........ කෙළින්ම බලපං ළඟම ඉන්නේ........" යයි පැවසුවේය.



"මගේ ගෑනි උණානම් මෙහෙම බල බලා ඉන්න ඕනෙ නෑනේ බං........ මට වැඩක් නෑ දැන්"

"හරි ඉතිං වැඩක් නැත්නම් ඇයි උඹ මේ තරම් දුක් විඳින්නේ. අමතක කරලා දාපං........" මාලිංග කීවේ අභියෝගයකට මෙනි.

"ඕවා වැඩක් නෑ........ ලස්සන ෂොට්ස් ටිකක් ගන්න හැකි........ යමං අර ගල්කුල උඩට" එසේ කියූ නෙත්ත මාලිංග එනතුරුද නොසිට ඉක්මන් ගමනින් ඉහළින් වූ ගල්කුලකට නගිණු සඳරූ බලා සිටියේ හදවත මත අතක් තබාගෙනය.

"බලපං පියුමි........ අර නගින ලස්සන........ ඔය සේරම කරන්නේ මට රිදෙන්න........ ඔය වෙලාවට තමා මට හිතෙන්නේ මේකෙන් පැනලා හරි මැරෙන්න ඇත්නම් හොඳයි කියලා"

"උඹලා දෙන්නම උඹලා දෙන්නට ආදරෙයි........ ඒත් ඒ ආදරේ පෙන්නන්නෙ නැතුව පේන්නෙ නැතුව දෙන්නම දුක් විඳිනවා........"

"මම ආවෙ හරි ලොකු වැරදි ගමනක් පියුමි........ බලපං මේ දවස් දෙකට මාව පුච්චලා මරයි නපුරු වැඩ කරලා........"

ගල් කුලක නැගගත් මාලිංග හා නෙත්ත කැමරාවෙන් ඒ සියලුම පරිසරය වීඩියෝ කරන්නට විය. එතැන සිට බලද්දී හාත්පස පෙනෙන සුන්දරත්වය දකින්නට නෙත් මදිවනු නියතය. නුවරඑළිය අවටද හාවා එළිය ප්‍රදේශයද, කිකිලියමාන, සිංගල් ට්‍රී, හග්ගල, කොනිකල් කඳු හා ඇතින් ඇතට විහිදී යන තවත් බොහෝ කඳු වැටි හා වනාන්තර මෙහි සිට නිරීක්ෂණය කළ හැක.

"පිස්සු හැදෙනවා බං මේ ලස්සන දැක්කාම........"

"කෙල්ලො දෙන්නා අරන් එමුද උඩට"

"මම ගියාට අර බඩුව එන්නේ නෑ........ උඹ ගිහින් අඬගහගෙන වරෙන්........"

"මැයි කෙල්ලක් යාලුකරගෙන පොඩ්ඩක් ලව් කරන්න නුවරඑළි ආවා........ දැන් වෙලා තියෙන්නෙ මගුල් කපුකමේ යෙදෙන්න"

"උඹලට තව කාලෙ තියනවා"

"ඇයි උඹ නාකිවෙලාද?"

"නාකි උණේ නැතිවට මගේ එකිට ගැනුම්කාරයො අයිතිකාරයො වැඩියි. ඇනුවල් පාටි එකෙන් පස්සෙ ඇනටම ප්‍රපෝසල් කීයක් ආවද දන්නෑ"

"පව් බං........ උඹ කියන කතා. ඒකි එහෙම කෙල්ලක් නෙවි"

“ඒකී එහෙම නැකි උණාට මිනිස්සුන්ට විසේ නැති වෙන්නෙ නෑනේ......... මා ළඟට එනවා නම් කාටවත් පේන්න නොදී බලා ගන්නවනේ”

“ඒකම තමයි ඒකී බය ඇත්තේ උඹ ළඟට එන්න......... මේ මට සීතලයි......... මම නම් සිගරට් එකක් බොනවා......... උඹ දුම්ට ආසා නෑනේ......... එහාට වෙයන්.........” මාලිංග කියමින් සිගරැට් එකක් දල්වද්දී ඔහුගේ සිගරැට් පැකට් එක ගත් නෙත්ත.........

“දීපං බලන්න සීතලට මාත් ඒ වගේ හීට් එකක් වත් අරගන්න” එසේ කියමින් මිතුරාගෙන් ලයිටරය ගත් නෙත්ත සිගරැට්ටුව දල්වා ගත්තේය.

“නෙත්ත......... උඹ කරන ඒවා හරි දරුණුයි. සඳරුට මළ පැනලා පහළට පනිද දන්නෑ. බලාගෙන කරපං ඔය යක්ෂ වැඩ”

“ඕන කමක් තියේ නම් පනින්නෙ නැතෑ” නෙත්ත පැවසුවේය.

නෙත්ත සිගරැට් එකක් බොනු ජීවිතයේ පළමු වතාවට දුටු සඳරු පුදුමයෙන් පුදුමයට පත් වූවාය. “ඒයි අන්න බලපං......... උඹේ බොස්......... අද අලුත් සෙල්ලමක් පටන් අරන්”

“අනේ නෙත්ත සිගරැට් බොනවා......... මම දන්නෙ වත් නෑ”

“උඹ දැනගන්න ඉතිං එයා බොන්න එපැයි. අද ඉතිං මේ මට රිද්දන්න පහසු ක්‍රම හොයාගෙනනේ. මගෙ මොකෝ......... මම සද්ද නැතිව ඉන්නවා”

“සද්ද නැතිව උඹ හිටියට නෙත්ත නම් හරියට සද්ද කරයි......... බලපං” එස් කී පියුමි සඳරු සමඟ අසීරුවෙන් තමුන් ගල් කුල උඩට ගොඩ විය.........

“නෙත්ත......... ලවර්ස් ලීප් එකෙන් පැනලා මැරිලා ඉන්නවා ඕන තරම්......... අදත් එයින් එකක් වෙන්න ඉඩ දෙන්න එපා.........” මාලිංග කීවේ හෙමි හෙමිහිට සිගරැට් එක උරනා නෙත්ත දෙසද කල්පනාකාරී ලෙස ගෙල දෙස බලා සිටින සඳරු දෙස බලමිනි.

“උඹ බයවෙන්න එපා......... මෙහෙ මම වෙනුවෙන් මැරෙන්න තරම් කෙනෙක් නෑ......... ඒ මෝඩ පෙම්වතියො වගේ නෙවි අද කාලේ පෙම්වතියො......... ආදරේ නැතිවෙනවට ගල්වල උස මනින්න......... ඒ ආදරේ එපා නම් ඊට කිලෝ මීටර් 3 - 4 ක් එහායින් වෙන එකක් හොයාගන්නවා මිස......... ලස්සන එවුන් කොල්ලෙක් නැති වුණාට අඬන්නෙ නෑ......... තව පෝලිමක් එන බව





දන්නවනේ.........” නෙත්ත කියද්දී එක්වරම සිටි තැනින් බැසගත් සඳරු ඉක්මන් ගමනින් ගල්කුල බැස ඔවුන් ආ පාර දෙසට යන්නට ගියාය.

“ඒයි සඳරු......... ඔහොම හිටපං.........මම එනවා” පියුමි කෑ ගැසුවද නැවතුණේ ඇය නොවේ.

“හරිනේ......... උඹට ඕන කරලා තිබ්බ දේ උණා......... රිදෙන විත්තිය දැන දැන එච්චර රිදවන්න උඹට දුක නැද්ද බූරුවෝ” මාලිංග ඇසුවේ තරහෙනි.

“උඹලට පේන්නෙ එයා අඬන එක......... එයාට රිදෙන එක......... එයා නිසා මගෙ පපුව කොච්චර රිදිලද කියලා උඹලා දන්නවද. කෙල්ලන්ගෙ කඳුළු විතරද කඳුළු......... කොල්ලන්ගෙ කඳුළු කඳුළු නෙවිද. කොල්ලො අඬන්න ඕනි නැද්ද......... උන්ට පපුවක් නැද්ද......... උන්ගෙ හිත නැද්ද. උඹලා දන්නවා මම ඇමරිකා හිට ආවෙ එයා හින්දා......... ඒ ආවත් මම එයාට මගේ අදහස කියන්න ඉස්සර උණේ නෑ......... මම බලාගෙන හිටියා......... ඒ අතරේදී මට හරි සාධාරණ හේතුවක් හම්බ උණා......... මොන හේතුවක් හින්දා හරි හරි එයයි අයියයි ෆැමිලි ලයිෆ් එකක් ගත කරලා නෑ......... ඉතිං ඒක දැනගෙනත් හුඟ දවසකට පස්සෙ මම එයාට මගේ යෝජනාව කීවා......... එයා මාව කුණු ගොඩක් වගේ අයින් කරනවා......... මොකද එයා ජීවිත කාලෙම නොබැඳ ඉන්න නෙවි......... එයා වෙන කෙනෙක් එක්ක යාළු වෙලා නිසා......... එතකොට මම......... මම පරාද වෙලා මගේ ආදරේ පරාද වෙලා......... මගේ ආදරේ එච්චර ලාභද......... හැල්ලුද......... මේක හරි අසාධාරණයි මාලිංග......... මගේ පැත්තෙන් හරිම අසාධාරණයි......... ඒත් මට එයා එක්ක රංඩු කරන්න බෑ......... බලෙන් උදුරලා ආදරේ ඉල්ල ගන්න බැරි නිසා.........මට දැන් ඒක නිසාම එයා පේන එක හිතට වදයක් වෙලා......... එයා දකින කොට මගේ හිත කඩා වැටෙනවා......... මට ඉන්න බෑ මෙහෙම. මම ඇමරිකාවටත් කෝල් කළා......... ලබන මාසෙ දිහා වෙනකොට මගේ ජොබ් එක හරියාවි. මම ආපහු යනවා නො එන්නම.........” නෙත්ත කීවේ හදවතේ වේදනාව සිය ගුණයක් වැඩෙද්දීය. මිතුරාගේ කථාව ඇසූ මාලිංගට දිය යුතු උත්තරයක් සිහිපත් නොවීය. ඔහු පියුමිගේ මුහුණ බැලීය.

නෙත්ත වෙත ආ පියුමි ඔහු අසල හෙමිහිට සිටගත්තේය.

“නෙත්න අපි යමු........ සඳරු මොනා කරගනීද මන්දා........ අද දවාලට ගෙනා කෑමත් තාම කාමරේ........ ඊයෙ බෙත් ගන්න ගියාම ඩොක්ට කිව්වා ගැස්ට්‍රයිටීස් හොඳටම වැඩිවෙලා තියෙන්නෙ මානසිකව තදබල විදියට කල්පනා කරනවද කියලා........ සඳරු ඔයාට ආදරේ නෑ කියලා නම් මට කියන්න බෑ........ ඒත් එයා රොෂාන් අල එන්න හිත හදාගෙන නෑ........ ගිම්හාන ගැන නම් මම ඇනුත් කියන්නෙ ඔයා හිතා ඉන්න තරමට බය වෙන්න එපා කියලා........ ගිම්හාන සඳරුට හරි ආදරෙයි........ ඒක මම පිළිගන්නවා........ ඒත් සඳරුයි ගිම්හානයි අතරේ එහෙම සම්බන්ධයක් නෑ........”

“සම්බන්ධයක් නැති නිසාද අත අල්ලාගෙන පාරේ අඩ අඩා ඉන්නේ........ ඔය දෙවෙනි දවස පියුමි එකම දේ මම දැක්ක”

“එහෙම නෙවි නෙත්න. අපි යමු........ ඇන් කාමරේට........ ඔයා යන්න........ අර කෙල්ලට මොනා හරි කන්න දෙන්න. හැබැයි ලෙඩ උණොත් ඔයා තමයි ඉකිං හිතින් දුක් විඳින්නෙ........ ආයෙ ඒකිට දවසක් වත් ගෙදර එන් ගිහින් ඉන්න දෙන්නෙත් නෑ........ ඉන්න විකෙන් ලුණු පොල්කට්ටට දාගත්තා වගේ........ ඒකිව දැවිලා පිච්චෙන දේවල්මයි කරන්නෙ”

“ඒ සෙරටම හේතුව මම එයාට ගොඩක් ආදරේ කරන එක........”

“අපි යමු” මාලිංග පියුමිගේ අත අල්ලාගෙන පැවසීය. ඔවුන් ආපසු එද්දී කාමරයේ දොර වසා තිබුණෙන් පියුමි හෙමිහිට ඇතුළට විත් බලද්දී ඇය නාන හඬ ඇසිණ. ආපසු නෙත්නගේ කාමරයට ගිය ඇය.

“අන්න නානවා........ අපි දෙන්න යනවා ටවුන් එකට........ ඕන දෙයක් කරගන්න........” යි පැවසුවේ සිනාසෙමිනි. වාහනයේ යතුර රැගත් මාලිංග පියුමි හා පිටව යද්දී නෙත්න සඳරුගේ කාමරයට පැමිණ දොර වසා ඇමුවේය.

සීතල සමනය කිරීම සඳහා දමන ලද ඉතා සණකම, බර ජනෙල් තිර නිසාවෙන් ඒවා විවර කලොත් මිස මේ සැඳෑවේ කාමරය තුළ ආලෝකයක් නොවිය. සඳරු නාන කාමරයට ගොස් තිබුණේද විදුලි පහන් දල්වා තබමිනි. එහෙත් ඒවා ඇල් උණොත් මුලින්ම තමාව පෙනෙන බැවින් ඒවා නිමා ඇමූ නෙත්න කාමරයේ වූ ඇඳෙහි ඇලවිණ. කිසිවක් නොපෙනෙන අඳුරේ රෙද්දද පෙරවා ගත් ඔහු ඇයට නාන්නට දී ඇලවී උන්නේය.





සැනෙන වේලාවක් නැම සඳහා ගත කලේ පැහැදිලිව ඇය එතුළට වී හඬන්නට ඇතැයි නෙත්නට සිතිණ........

නා හමාර කළ සඳරු හැඳ සිටි ඇඳුම් ද සෝදා දමා හෝටලයෙන් දෙන ලද විශාල තුවාය හැඳ අනෙකක් හිස බැඳගෙන ගෙතුළට එන්නට ආවද කාමරය සම්පූර්ණ කළුවරේ විය. නාන කාමරය තිබුණේද බිත්තියකින් ආවරණය වී නිසා කාමරයට එහි ආලෝකය ආවේ යන්තමිනි.

“ඒයි පියුමි........ කළුවරයි........ ඔයා කොහේද........?”

“පියුමි........ ලයිට් එක දාන්නකෝ........ මොනවත් පේන්නේ නෑ” සඳරු දෙවන වරද කථා කලේ ඇයගේ දෙනෙත් වලට කිසිවක් නොපෙනෙනු බැවිනි. මන්ද ඇය ආවේ ආලෝකයේ සිට නිසා අඳුර ඇය ඇසට නුහුරු බැවිනි. එහෙත් මෙතෙක් වේලා අඳුරේ හුන් නෙත්න හෙමිහිට නැගිට ඇය වෙතට ගොස් තම අත වූ ලයිටරය දැල්වූයෙන් සඳරු එක් වරම බියපත් වූයේ ඒ කවුදැයි සිතා ගත නොහැකිවය. මන්ද අඳුරේ මුලින්ම ඇය දුටුවේ ආලෝකය පමණක් බැවිනි........ ඇය එක් වරම හීතියෙන් කෑගසන්නට මුව විවර කරද්දී තමා වෙතට ආලෝකය ළංකල නෙත්න ඇයට තමා හඳුනාගන්නට සැලසුවේය.

ලයිටරයේ ඇල්ල වරක් නිවී ගියෙන් යළිත් එය දැල්වූ නෙත්න අඳුරේ දිලෙන ඒ රූමත් මුහුණ දෙස ආදරයෙන්ද ආශාවෙන්ද බලා සිටියේය. සඳරුගේ දෙතොල් වෙව්ලන්නට වූයේ බියෙනි. ඇය බියපත් දෙනෙතින් ඔහු දෙස බලා උන්නාය. නෙත්න ඇය හිසෙහි වූ තුවාය ගලවා දැමුවේ ඒ මොහොතේය.

“Be.........auti.........ful.........” නෙත්න කෙඳිරුවේ ඇය වෙත ළංවෙමිනි. තෙත බරියම වූ කොණ්ඩය ........දිය බිඳු වැටුණු ඒ නැවුම් සොඳුරු මුහුණ රත් දෙතොල අනුරාගය ගැන අලුතින් ලියූ පාඩමක් වැනි විය. යොවුන් හදවතක ආදරය හරහා උපදින ආශාව නෙත්නගේ සිතද මේ මොහොතේ ඇයගේ සොඳුරු සොබාවෙන් වශී කලේය. මද එළියේ දිලෙන ඒ රෝස පැහැ දෙකොපුල් ද, රත් දෙතොල දෙස ඔහු මොහොතක් බලා සිටියේය. ඉඳුනිල් මිනි සේ දිලෙන සුන්දර දෙනයන මුවැත්තියකගේ සේ බියෙන් වෙලී තිබිණ.

නෙත්නට නැඟුණේ සරදම් සිනාවකි. ඇන් ඇන් තමාගෙන් ඈයට අවැඩක් වෙතියි සිතන්නාසේ බියෙන් ගුලි වී සිටින යුවතිය දුටු ඔහු

හෙමිහිට ගොස් විදුලි පහන ක්‍රියාත්මක කළේය. එයින් ලද අස්වැසිල්ලෙන් සේ සඳරු අනෙක් පස හැරුණාය. ලයිටරය ඇඳ ළඟ ටීපෝව මත තැබූ නෙත්න හෙමිහිට සිවුරුහන් කරමින් සඳරු වෙත ආවාය.

සඳරුගේ සිත අවශ්‍ය පමණට වඩා බිය ගත් නිසාදෝ ඇයට එක්වරම ඔක්කාරයට මෙන් ආවේය. ඇය වමනය කරන්නට මෙන් හදමින් අසල වූ සින්ක් එක වෙත යද්දී නෙත්නට ඇනුණේ බියකි......... එහෙත් ඔහු වදනක් හෝ නොකීවේය. සින්ක් එක වෙත ගිය සඳරු වමනය කරන්නට උත්සාහ කළද කිසිවක්ම බඩ තුළ නොවීමෙන්දෝ එය අසාර්ථක විය. ඇය වතුර බොන්නට සිතා හැරෙද්දී වතුර විදුරුව රැගෙන නෙත්න ඇය අසල විය. සරදම් ලෙස ඉඟිකොට වතුරු විදුරුව ගන්නැයි නෙත්න සඳරුට පවසද්දී ඇය බියෙන් මෙන් ඔහුගේ මුහුණ බලන අතරේ එය රැගෙන වතුර උගුරක් බීවාය.

"තාම ඇඟට අත තිබ්බෙත් නෑ......... ඒ වුටටට බබෙක් වත් හම්බවෙන්න ආවද?" ඔහු ඇහුවේ සෝපාහාසයෙනි. එයින් සඳරු අන්තයටම විලි වැදීගියාය. ඇයගේ කොපුල් තලවලට ලේ පුරා එන අයුරු ඔහු ආශාවෙන් බලා උන්නේය.

"Amazing........" ඔහු කීවේ මුහුණට වැටෙමින් සරාගික බවක් ඇයට ගෙන ආ කෙහෙරොද ඇයගේ මුහුණෙන් ඉවත් කරමිනි. ඔහුගේ ඇතම ඇය උරහිස වෙත රැඳෙද්දී සඳරු තවත් තදින් තුවායේ ගැටය ඇතිින්ම අල්ලා ගත්තාය.

"ඔය බය සාධාරණයි......... ඔය කතා කරන ලිප්ස් දැක්කාම නම් ගිත කියන්නේ සේරම වැඩ ඉවරයක් කරන්න........." ඔහු කීවේ ඒ දෙනෙත් දෙස බලාගෙනය. එය ඇසූ සඳරුගේ දෙනෙත් විසල් විය. නෙත්න ඒ දැක සිනාසුණේය.

"සල්ලාලයෙක් ඔයාගෙ කාමරේට ඇවිත් ඔයාව රේප් කරන්න හදනවා වගේ බයවෙන්න එපා......... කවදා හරි මම ඔයාගෙ හස්බන්ඩ්........" නෙත්න ඇයගේ දෙතොල් මත ඉතා හෙමිහිට ඇඟිලි දුවවමින් කීවේය......... සඳරුට ඔහුගෙන් ඈත් වන්නට උවමනා විය. ඇය යන්නට හදද්දීම ඇයගේ බඳවටා දැත යැවූ නෙත්න ඇය තමා වෙත ළංකොට ගත්තේය.

"........පිස්සු වැටෙනවා මාව........" ඔහු මහා වල් තාලයකට කියද්දී එය අසන්නට බියෙන් මෙන් කට ඇඹුල් කරගත් සඳරු ඇස තදකොට පියාගත්තාය. දැන් දැන් ඔහු තමාට කුමක් හෝ කරනැයි සිතමින්





ඇය තත්පරයක් දෙකක් දහයක් පහළොවක් බලා සිටියාද කිසිවක් නොවූ නිසා හෙමිහිට ඇස හැරියාය. නෙත්න තාමත් ඒ බැල්මෙන් තමා දෙස සිනාසිසී බලා සිටී.

"බය වෙන්න එපා......... පර්මිට නැතිව අත තියන්නෙ නෑ......... මොකද අත තිබ්බොත් හෙට උදේ වෙනකල් අතාරින්නේ නෑ........" ඔහු කීවේ ඇයගේ සවනට මුව ළංකරමිනි......... සඳරු යළින් තැති ගැන්මෙන් ගුතුව හැකිළුණාය.

"මොකද ඔය තරමට බයයි ලජ්ජාවයි......... අවුරුදු එක හමාරක් තිස්සේ හස්බන්ඩ් එක්ක ඉඳලත්......... තිකම් ඉන්නේ මහ ගෙදරින් එළියට බැහැලා එද්දි මට අහු උණා වගේනේ........." ඔහු කීවේ ඇයව විනිවිද යන බැල්මක් හෙළමිනි. ඔහු කියනා දේවලින් ඇය ජම්බු ගෙඩියක් සේ රෝස පැහැවී සිටියාය.

"ඇයි මේ බයවෙලා......... රොෂාන් තරමට ආදරේ කරන්න මම දන්නෙ නැති වෙයි කියලද........" ඔහු යළිත් ඇසුවේ එක් අතක ඇඟිල්ලක් රැගෙන ඇයගේ කොපුල් තලය පුරා හෙමිහිට දුවවමිනි. එයින් ඇනුණු කිතියෙන් සඳරුගේ මුළු සිරුරම හිරි වැටී ගියාය. ඇය ඔහුගෙන් මිදෙන්න හැදුවාය.

"මාව අතාරින්න......... මට ඇඳගන්න ඕන........." ඇය පැවසුවේ බිම බලාගෙනය.

"පිස්සුද......... මේ වෙලාවට ඇඳුම්වල මොකක්ද ඕන කම......... තමන්ගෙ හස්බන්ඩ් ළඟට එන්න ඕන හැටි මතක නැද්ද........." ඔහු ඇයගේ මුහුණ ඔසවා අසා, "ආ......... ආ......... මතක නැතිව ඇතිනේ ......... දැන් ගොඩකල් ගිහින්නේ......... නේද එදත් මේ වගේම ලජ්ජාවෙද හිටියේ........." ඔහු ඇය වෙත ළංවෙමින් ඇසුවාය.

"ඇයි මගෙන් ඕවා අහන්නේ........ මොනවද මේ අහන කතා.........?"

"අහන කතා.........? තව ටික දවසකින් ඔයා මගේ වයිෆ්.........ඉතිං ෆැමිලි ලයිෆ් එක එන්ජෝයි කරන හැටි මම දන්නේ නෑ......... මම තාම ඒකට අලුත් නිසා. අත් දැකීම් තියන ගෑනිගෙන් අහගන්න එපැයි........." ඔහු එසේ කියමින් ඇයව හෙමිහිට ඇඳ වෙත කැටුව ගියේය. ඔහු විසින්ම ගලවා ඇමූ තුවාය අතට ගත් ඔහු ඇයව බලෙන්ම මෙන් ඇඳ මත වාඩි කරවා ඒ හාම ඇයව ඇඳ මත පෙරලා ඔහුද ඇය අසල මදක් ඇලවී වාඩි විය. එයින් සඳරුගේ බිය සිය ගුණයකින් වැඩි විය. ඇය ගැහෙන හඬවතින් කතා කළාය.

මට ඇඳගන්න ඕන.........." යි

"අනෙ මට නැගිටින්න දෙන්න......... මට ඇඳගන්න ඕන.........." යි ඇය කියද්දී ඒ හදවත ගැහෙන හඬ නෙත්නටද ඇසෙන්නට ඇත. "කොච්චර ඔහු හෙමිහිට ඔහුගේ සවන ඇයගේ ළමැදට පහත් කළේය. "කොච්චර බයවෙලාද කියලා තේරෙනවා පපුව ගැහෙන සද්දෙන්ම......... ඇයි ඔච්චර බය......... හස්බන්ඩ් ළඟට ආවාම" එසේ කියා මදක් කෙළින් වූ ඔහු තුවාය අතට ගෙන කිසිවක් නොවූ ලෙස ඇයගේ හිස හෙමිහිට පිහිදන්නට විය. සඳරූ ඔහු කරනා දෙය බලා සිටියේ පුදුමයෙන් පුදුමයට පත් වෙමිනි. ඉතා හොඳින් හෙමිහිට හිස පිසදැමූ ඔහු ඇය දෙස මොහොතක් බලා උන්නේය.

"ඔයා ඇයි ඔච්චරම ලස්සන උණේ......... මාව පිස්සෙක් වෙන තරම්........." ඔහු රහසෙන් අසන්නා සේ ඇය දෙනෙතට වඩාත් ළංවී අසද්දී ඇය පත් වූයේ ඇඩි අසීරුතාවයකටය. ඇය කථා කරන්නට වචන සොයන්නා සේ බලා සිටියාය.

"මට නැගිටින්න දෙන්න......... ඇඳගන්න ඕන......... පියුමිලාවත් ආවොත් මොනාද නොහිතන්නේ"

"නෙත්නගේ මී වදේ නෙත්නාට අහුවෙලා කියලා හිතයි. තව මොනවද........." ඔහු කීවේ ඇය දෙස ආශාවෙන් බලමිනි. ඒ බැල්ම දරාගත නොහී සඳරූ ඇතින් මුහුණ වසා ගත්තාය.

"හඳ ලස්සන වලාකුලකින් භාගෙට වැහුණාම වගේ......... මේ හඳත් ලස්සන භාගෙට ඇඳන් ඉන්නකොට තමයි........." නෙත්න කීවේ ඇයගේ අත හෙමිහිට ඇයගේ මුහුණෙන් අයින් කරමිනි. "ඒත් ඉතිං වැඩේ කියන්නේ හඳ අහසට අයිති නැති එක. මම අහසක් විතර ආදරය පුරවාගෙන කාලෙක හිට බලා ඉන්නවා මේ හඳ මගේ අහසට එනකල්......... ඒත් හඳ කොහේද රස්තියාදුවක යන පාටයි. ඉතිං අහුවුණු වෙලාවේ අයිති කර නොගත්තොත් අහසට සඳ නැති වේවි......... එහෙම නේ........."

"අනේ මට නැගිටින්න දෙන්න......... මට මෙහෙම ඉන්න බෑ........." සඳරූ කියද්දී නෙත්න ඇයගේ ගෙල මුලට පහත් වී ඇය වැළඳ ගත්තේය. හෙමිහිට තම ගෙල මුලට දැනෙන ඒ දෙතොලේ පහස සඳරූගේ සිතට ගෙනාවේ කවදාවත් විඳ නැති ඇයට නොතේරෙන හැඟීම් පොදියකි. ඔහු හෙමි හෙමිහිට ඉතාමත් මෘදු ලෙස ඇයගේ ලවන් පෙති මත දෙතොල තබද්දී එහි දැනුණු කිතියෙන් සඳරූ වෙව්ලා ගියාය. තමා කෙතරම් විරුද්ධ වන්නට හැදුවද තමා කෙතරම් ඈත් වීමට හැදුවද තම සිත සොයන්නේ තම විරුද්ධත්වය නොතකා තමාව ආක්‍රමණය කරන මේ පහස නොවේද.........





නෙත්න තමා වැළඳගෙන සිටින ග්‍රහනය වැඩිවනු ඇයට දැනිණ......... ඔහුගේ ශක්තිය ජවය ළඟ තමා මල් පියල්ලක් සේ සැලී යද්දී එක් මොහොතකින් පියවි ලොවට ආ සඳරූ ඔහුගෙන් මිදී ඉවතට පැන්නාය. නෙත්න ඇයගේ බියපත් බව දැක හයියෙන් සිනාසෙමින් ඇය දෙස බලා කොට්ටය ඇඳ විට්ටමට තබා එහි හේත්තු වූයේය.

තාමත් සිහින් වේදනාවක් දැනෙන ගෙල මුල අත ගෑ සඳරූ ඔහු දෙස බැළුවේ ගැහෙන සිතිනි.

"මොකද බලන්නේ......... මම කිව්වනේ මොකුත් කරන්න විදියක් නෑ කියලා......... ඇඳගන්න........." ඔහු කියද්දී නැගිට ගත් ඈ සූට්කේසය වෙත ගොස් ඇඳුමක් තෝරද්දී නැගිට එහි ගිය නෙත්න......... "රෑට ඩිනර් එකට හොටෙල් එකට යන්න තියනවා. මම සිලෙක්ට් කරන්නම් ඇඳුමක්........." කීවේ පිටුපසින් සිට ඇය බඳ වටා දෑත යවා තිකට ඇය උරහිසේ රඳවමිනි......... ඔහුට විරුද්ධ වීමට තමාට වුවමනා වුවද මේ හිතුවක්කාර දඩබ්බරයාට විරුද්ධ වීම ඉතා අසීරු බව දත් සඳරූ ඔහුට ඕනෑ දෙයක් කරගන්නට දීමෙන් නිහඬ වූවාය.

"ගුඩ් ගර්ල්......... ජීවිත කාලෙම ඔන්න ඔහොම ඉන්නවා නම්......... මට ඕන දෙයක් කරන්න දීලා........." ඔහු කීවේ ඇයගේ මුහුණට එබෙමිනි. සඳරූ ඉවත බැලුවද ඇයට එතැනින් පෙනුණේ කණ්නාඩි මේසයෙන් පෙනෙන ඔවුන් දෙදෙනාගේ රුවයි. ඇය යළි ඉවත බලන්නට හදත්ම එදෙස බැලූ නෙත්න ඇයගේ බැල්ම තම ඇසේ පටලා ගත්තේය.

"අපි දෙන්නා තරම් perfect කපල් එකක් නෑ කියලා ඔයාට හිතෙන්නෙ නැද්ද බබා"

"මට ගැළපෙන කෙනා මම දැන් තෝරගෙන තියෙන්නේ........."

"කවුද.........ගිම්හානද?"

"ගිම්හාන නෙවි රොෂාන් ගැන මම කථා කරන්නේ......... රොෂාන් මගේ හස්බන්ඩ්......... ඔයා හිතන්නෙ ඔයා කරන්නෙ හරි දෙයක් කියලා ද......... මම ඔයාගෙ අයියගෙ වයිෆ්........."

"කවද ඉඳලද.........?" නෙත්න එකවරම සැරෙන් විමසද්දී තිගැස්සී දෙනෙත් කුඩාකර ඔහු දෙස බැලුවාය.

"මම අහන්නේ කවදා ඉඳලද කියලා......... මොකද දිනේවත් මතක නැද්ද? එහෙම නැතුව එහෙම දිනයක් නැද්ද........." ඔහු දරුණු ලෙස සෝපාහාසී මදහසක් හෙලා ඇසීය. එයින් සඳරූගේ ආත්මය කඩා වැටුණා සේ විය.

එයා මගෙ හස්බන්ඩ් බැඳපු අ
"මොකක්ද ඒකෙ තේරුම.........
හිටම"
"ඔ.........හෝ......... මම අදයි දන්නේ දෙන්නා හස්බන්ඩ් ඇන්ඩ්
වයිෆ් බව එදා හිටම. ඒත් මම අද වෙනකල් දැකලා නෑ දෙන්නගෙ
ඒ නෑ කමට සම්බන්ධ කිසිදෙයක්......... මොකද බබෙක් එහෙම
හදන්නෙ නැත්තේ රොෂාන් කැමති නැද්ද......... ඔයා කැමති නැද්ද
........." නෙත්න අසද්දී සඳරුට දැනුණේ පොළව පලා ගෙන යන
අයුරකි......... මොහු මෙසේ අසන්නේ ඇයි? "බොඩි එක out of
shape යනවට බය ඇති නේද......... තාම ඉතිං විසිතුනක් විසිහතරක්
කියන්නෙ ඒ හැටි වයසක් නෙවිනෙ......... නේද?"
"ඔයාට වැඩක් නෑ ඒවා......... ඒවා ඕන වෙලාවට මම කරගන්නම්"
"මට ඉතිං ඔකට උත්තරේ එනවා......... ඒත් දැන් නෙවි මම
පස්සෙ කියන්නම්......... දැන් ඇඳගන්න. ඔයා කලින් කාගෙ උණත්
මට කමක් නෑ......... දැන් ඔයා මගේ......... ඒක නිසා දැන් මම කියන
දෙයක් කරන්න" එසේ කී ඔහු ඇඳුම තෝරා ඇය අතට දී ඇයට
ඇඳුම් හැඳ ගන්නට ඉඩ හැරියේය. නාන කාමරය වෙත ගිය සඳරු
යට ඇඳුම් හැඳ ඇඳුම ද ගත්තද එහි ඉතා සිගු වූ සිපර් එක ද ගත
නොහැකිව එයට අත තබාගෙනම ආපසු එන්නට හැරෙද්දී එහි ගිය
නෙත්න මද වේලාවක් ඇය දෙස බලා සිට ඇය වෙත ළංවී ඒ
නිරුවත් පිට ආදරයෙන් සිප ගත්තේය. ඔහුගේ ඒ ආදරණීය
හැසිරීමෙන් හිරි වැටී ගිය සඳරු ඔහුව නොදකින්නට මෙන් දෙනෙත්
පියා ගත්තාය. නෙත්න ඇයව තම පසට හෙමිහිට හරවා ගත්තාය.
"ඔයාට මතක නැති උණාට ඔයා කොහොමත් මගේ......... මතකනේ
පොළඟා කාලා......... තවත් විනාඩි 5ක් පමා උණානම් ඔයා
බේරගන්න බැරි වේවි කිවා......... මම ගිහින් ඔයා නොගෙනාවා නම්
කාටවත් ඔයාව නෑ.
ඔයයි මමයි රොෂානුයි පාටි එකට ගියාමත් මේ වගේම සිප් එක
ඔපන් වෙලා තිබුණා......... මට එදත් ආස හිතුණා......... මට එදා ඒත්
කිසිම අයිතියක් තිබුණේ නෑ........." ඔහු කියද්දී,
"දැන් තියනවද........." ඇය සැරෙන් ඇසුවාය.
"Why not ......... දැන් ඔයා දන්නවා මම ඔයාට කොච්චර ආදරේද
කියලා ......... ඒ මදිද.........?" ඔහු ඇසුවේ අභියෝගයකට මෙනි.
නිහඬ වූ සඳරු නාන කාමරයෙන් එන්නට හදද්දී ඇයව තමා වෙත
නතු කරගත් නෙත්න ඇය සමඟ කාමරයට ආවේය.





"රටේ නැති ලෙඩ හදාගන්නද නොකා ඉන්නේ......... එච්චරටත් දුක් විඳින්න වෙන්නෙ මට......... යමු මම කවන්න."

"මට එපා......... මට බඩගිනි නෑ........."

"සඳූ......... මාව කේන්ති කරවන්න එපා......... ඔයාට විතරක් නෙවි මටත් නොකා ඉන්න පුළුවන්......... තව ඕන දෙයක් කරන්න පුළුවන්......... ඔයා දන්නවනේ මාව"

"ඔව්......... ඉතිං බැනලා සැරකරලා ඔයාට ඕනෙ හැමදේම කරගන්න......... මම ඉතිං අසරණයිනේ"

"ඔයා නෙවි මමයි අසරණ......... මමයි කරකියා ගන්න දෙයක් නැතිව ඉන්නේ......... ඔයාට නම් ඉතිං එක්කෙනෙක් නෙවි දැනට දෙන්නෙක්ම ඉන්නවනේ......... ඒනිසා අසරණ වෙලා නෑ"

"මොනවා දැනගෙනද ඔයා ඔය කියන්නේ.........?"

"දන්න ඕන ඒවා මම දන්නවා......... ඒත් මට ඔයා නැතුව බෑ........."

එසේ කියා පිඟානට බත් ටිකක් බෙදා ගත් ඔහු එය අතා ඇය මුවට ළංකරද්දී මෙතෙක් දරා තද කොට සිටි දුක මහෝඝයක් වී මහා සැඩ ගං වතුරක් වී ඇයගේ මුවින් ගලා හැලිණ. ඇය දෙදනහිසේ මුහුණ හොවා ඉකි ගසමින් හඬද්දී පිඟාන පසෙක තමා ඇයව් තම උකුලේ හොවා ගත් නෙත්න ඇයගේ ඉකිබිඳුම පහව යන තෙක් බලා උන්නාය.

## 26

නුවර එළියේ ඇති ඉතාමත් විශාල හෝටලයක් වූ වින්ඩ්සර් හෝටලයට රාත්‍රී කෑම සඳහා ගිය ඔවුන් සිව් දෙන ආහාර ඇණවුම් කොට කථා කරමින් සිටියහ.

"හප්පා මේ තරමට හරි උඹලා දෙන්නා යාළු උණු එක ලොකු දෙයක්........"

"උඹ රැවටෙන්න එපා........ මේක ඒකපාර්ශ්වීය යාළු කමක්. මම කතා කළා........ මම ළඟට ගත්තා........ මම........? එසේ කී නෙත්න සඳරු දෙස බැලුවේ තවත් රහසක් ඇතිවා මෙනි. නෙත්න දෙස ලජ්ජාවෙන් යුතුව කරබාගත් සඳරු දුටු පියුමිට සිනා නැගිණ.

"එපා එපා නෙත්න අපට ඒවා හිතා ගත හැකි........ කියන්න එපා........" යි කියද්දී සඳරු මිතුරිය දෙස රවා බැලුවාය.

"මොකද රවන්නේ........ ඔය මාක්ස් අපට ඉතිං නිහඬ මුවින් ලොකු කථාවක් තියනවා........ නෙත්න හැබැයි බලාගෙන ආයෙ ගෙදර අරන් යන්න ඕන........"

"මොනවා කරන්නද පියුමි........ මාත් කොල්ලෙක්නේ........" නෙත්න කීවේ සඳරුට ඇසකින් ඉඟි කරමිනි. ඇය ඉවත බැලුවාය.

පසු දිනයේ සම්මන්ත්‍රණයට උදේ වරුවේ සහභාගී වූ ඔවුන් සවස ඇවිදින්නට ගියහ........ ඒ වන විට සඳරු නෙත්නගේ බහට විරුද්ධ නොවන තරමට නිහඬව සිටියාය. ඔහුට ඕනෑ දෙයක් කරන්නට ඉඩ හරින්නා සේ නිහඬ වූ ඇය ඒ කාලය තුළ ඔහු හා අමනාප නොවී සිටින්නට තීරණය කළේ ඒ සිත රිදෙන තරම දත් බැවිනි. තමාටද ඒ සිත රිදවන්නට ඇත්තේ කෙතරම් ලෝභකමක්දැයි ඇය දැන සිටි බැවිනි. තමා කෙතරම් ප්‍රතික්ෂේප කරන්නට හැදුවද ඒ අපරිමිත ප්‍රේමය ලඟ තමා පාදුවිල්ලක් සේ පැතිරී වැතිරී යන බව ඇයට පිළිගන්නට සිදුවිය. තමා දකින්නට වසර තුන හතරකටද පෙර ඔහු පෙම් කළ, ඔහුගේ මනසේ ජීවත් වූ යුවතිය තමා වීම



කෙතරම් පුදුමයක්ද........ ඒනිසාම ඔහුගේ පැත්තෙන් මේ සටන, සර්ව සාධාරණය. හැකි කමක් ඇත්නම් තමාද එයට පූර්ණ සහය දෙන්නේමය. එහෙත් කෙසේ කරන්නද තමාගේ පියවි රුව පවා ඔහු දැක්කේ අන්සතු ළඳක් ලෙසිනි.

සඳරු සිවියේ නාන අතරේ නෙත්නගේද තමාගේද රෙදි සෝදමිනි. එසේ කරද්දී ඇයට සුසුමක් හෙළුණේ අද තමා මෙසේ රහසේ දෙදෙනාගේම ඇඳුම් එකට දමා සේදුවද මෙතනින් එහාට ලෝකයේදී එය කෙතරම් මායාවක්ද යන්නය. ඔහු නියතිගේ වතු ඇත. තමාගේ ඉරණම සදාකාලයටම රොෂාන් හා සිටීමය. එහෙත් එය කරන්නට කෙතරම් ශක්තියක් ඇවැසි වේද. විශේෂයෙන්ම මෙවැනි ආදරයක් දිස්න දෙමින් තමා වටා සරණ කළ........? එහෙත් මෙසේ තමාගේ සිත දුර්වල වීමට දීමෙන් වන්නේ එන්න එන්නම තමා නෙත්න කෙරෙහි බැඳී යාමය. තම සිත තම විවාහය ගැන හඬා වැටීමය. අද වන තුරු මේ වන තුරු රොෂාන් තමා පිළිකුල් කරන නියාම හේතුව සොයා ගැනීමට හෝ අසා දැන ගැනීමට ඇයට නොහැකි විය. නිවැරදිවම ඔහුට වෙන බිරිඳක්........ පවුලක් වෙන රටක සිටිනු විය හැක. ඔවුන් මෙම නිවසට ගෙන ඒමට බැරිකම නිසා මෙසේ තමා හා විවාහ වන්නට ඇත්තේ නිවසේ තදබල ඉල්ලීම නිසාවෙනි. එහෙත් කුමන විදියකින් වුවද ඔහු යහපත් මිනිසෙකි. මේ වන තුරු තමා දෙස වැරදි නෙතකින් බලා හෝ නොමැති ඔහු ඔහුගේ බිරිඳ වෙනුවෙන්ම කැපවී සිටිනවා විය යුතුය. අනෙක් අතට කී වාරයක් නම් තමාගෙන් දික්කසාද වන ලෙස ඔහු කිවද. ඔහු විවාහ වී ඇත්තේද කෙටි කලකින් කරුණු කියා තමාව දික්කසාද කරන අටියෙනි.

එහෙත් දැන් තමාට සිදුව ඇත්තේ දෙමාපිය සිත් රිදෙනවාට බියෙන් මේ රහස සැමදා සුරැක ගන්නටය. රොෂාන්ගේ පවුලේ අයගේ බැඳීම අතර සිරවීමටය. ඒ සේරටමත් වඩා තමාට මේ නිවස හැර දමා යා නොහැක්කේ මේ ආදරණීය දඟකාරයා නිසාවෙනැයි ඇය විටෙක සිතුවාය. ඔහුට ළංවෙන්නට බැරි වුවද ඔහු පෙනෙන ඉමක ඔහුට ඇතින් හෝ මෙසේ සිටින්නට ලැබීමද සැනසුමකි. මන්ද හමු වූ දා සිට ඔහු තම හදවත මත ආදරය කෙනෙකුගේ වැනි අපූරු හැඟීම් දහසක් සිත්තම් කළ බැවිනි........

නාගෙන විත් රෙදි වනන සඳරු දෙස නෙත්න කාමරයේ දොරකඩට වී බලා සිටියේය. නිවසේදී මෙන්ම කෙසේ තුවාය හිසෙහි

ඇය තමාගේද ඇයගේද රෙදි අව්වට දමයි. තමා මෙ බැඳගෙන ඇය තමාගේද ඇයගේද රෙදි අව්වට දමයි. තමා මෙ සිටින්නේ ඇය හා ගෙවන ජීවිතයක නම් මේ සොඳුරු බැඳීම කෙතරම් ආහ්ලාදකර වනු ඇත්ද.........?

දිවා ආහාරය රැගෙන නගරයේ ඇවිදින්නට ගිය ඔවුන් සතර දෙන වෙන්ව ගියේ ඇවැසි වේලාවට හමුවන අටියෙනි......... නෙත්න සඳරුගේ බඳවටා අත යවා තමා වෙත තතු කොට ගත්තේය.

"නුවර එළියෙදී අයිස්ක්‍රීම් කාලා තියනවද?"

"මත්........"

"අද කමු......... හැබැයි දෙන්නටම එකයි........." නෙත්න කියද්දී සඳරු නිහඬවම ඔහු දෙස බැලුවාය.

"ඇයි......... මම කන එක කන්න බැරිද.........?"

"පිස්සුද මන්දා"

"අද දවල් ඔයා අපි දෙන්නගේ රෙදි සෝදලා වනද්දී මට හරි ආසා හිතුණා බබා......... අපි දෙන්නා එක ගෙදරක ඉඳලා ඔයා ඕවා කරනවා නම්.........? කොච්චර ලස්සනද?" ඔහු ඇය දෙස බලා මද සිනාවක් පාමින් පවසද්දී සඳරුට දැනුණේ පුදුමයකි......... දෙයියනේ මම ඒවෙලෙ හිතපු දේම එයත් හිතලා.........අපි දෙන්නගෙ අදහස් ගොඩ වෙලාවට එක වගේ......... ඒත් අපි කොච්චර ඈතද......... කවදාවත් ළංවෙන්න බැරි රේල් පාරක් වගේ......... ගඟක ඉවුරු දෙකක් වගේ........ එක්තරා දුරකට සමීප වෙන්න පුළුවන්......... එතනින් එහාට මොකුත් බෑ.........

"මොනවද කල්පනා කරන්නේ.........?" ඔහු ඇසුවේ ඇය උරහිස වටා යැවූ අතින්ම ඇයගේ මුහුණ තමා වෙතට හරවමිනි........."

"අපි හෙට කීයටද ගෙදර යන්නේ?"

"ඇයි හදිසිද යන්න.........?"

"ඔව්........ මම යන්න ඕන"

"ගිම්හාන බලා ඉන්නවා නේ......... දැන් දවස් දෙකක් කැම්පස් නොගිය නිසා"

"ඔව්........ එයා බලාගෙන ඇති......... ඒක නිසා යන්න ඕන........."

සඳරු කීවේ සිතකින් නොවේ. එහෙත් මේ සෙනෙහස අත්හැරීමට නෙත්න වගබලාගත යුතුය. නැතිනම් මේ ආදරය නිසා දෙදෙනාම වද වේදනා විඳිය යුතුය. තමාට ඔහු පිළිබඳ කෙතරම් දුකක්ද......... ඒත් අප දෙදෙනාට එක්වීම මේ භවයේ කළ නොහැකි දෙයකි.........



සඳරු කියූ දෙය ඇසූ නෙත්න සිනාසුණේය. එය දුක සඟවාගත් සිනාවක් විය.

"ඔයා දන්නවද සඳු......... ඉස්සර පුංචි කාලෙදිත් මම මොනා හරි ඕන උණාම ඒක මට ඕන කියලා අම්මිලට කරදර කළාම ඒක මට ලැබුණා......... ඒ උණාට ටික ටික තේරෙන්න තේරෙන්න මම එයාලට කරදර කළේ නෑ......... මොකද මට ටික ටික තේරුණා අපට ඕන දෙයක් ලබාගන්න අඬලා විතරක් හරි යන්නෙ නෑ කියලා......... අපි සටන් කරන්න ඕන කියලා ඒක ලබාගන්න......... ඉස්කෝලෙ කාලෙදිත් මට කෙල්ලක් එක්ක යාළුවෙන්න හිතුණාම යාළු උණා......... ඒත් ඒ යාළු කම ආදරේ නෙමි......... නිකං එවෙලෙට හිතට එන පිල් එකක් විතරයි කියලා මම තේරුම් ගත්තේ ඒ ලෙවල් ලියලා ඉවර උණාම......... ඇත්තටම අපි හිටිය තත්ත්වය, සමාජය, පරිසරය ආදරය ගැන මහ ලොකුවට හිතන්න මට ඉඩ හැදුණෙ නෑ......... මම ඔයාට කීවේ......... කලබලය තේමා පාඨය වෙච්ච ඇමරිකාව වගේ රටක සුන්දර ආදරය, ප්‍රේමය වගේ දේවල් ගැන ඇත්තටම අපේ වගේ වයසෙ අයට හිතට එන්නෙත් නැතුව ඇති......... අනෙත් එක ඒක මට ඒ හැටියටම හිතෙන්න තව හේතුවක් උණේ තියති......... නියති මා ගාව හිටින එසා නිතරම ආදරය මොකක්ද කියන එක ගැන ඒ තරම් හිතන්න. මට මතක් උණේ නෑ......... ආට්ස් වලට කොහොමත් මගේ තිබ්බච දක්ෂ කම නිසා මම චිත්‍ර ඇන්දට ලොකු හර බර හැඟීම් මගේ ඔළුවට ආවේ නෑ......... ඒත් ඒ අඳින හැම වෙලාවකම මට හිතට ආවේ එකම ඇස් දෙකක්......... එකම මූණක්......... හරියට හිනාවක්......... මම ඒක නම් ඇන්දේ ලොකු හැඟීමකින්......... මම දන්නවා දන්නවා වගේ කෙනෙක්ගෙ පින්තූරය මම අඳිනවා කියලා මට නිතරම හිතට හිතුණා......... ඒත් මම එහෙම දන්න කෙනෙක් හිටියෙ නෑ......... මගේ අනාගත පෙම්වතියගේ මගේ පුංචි මනමාලිගෙ පින්තූරෙ එක දවසක් අයියගෙ පින්තූරෙත් එක්ක මට ලැබුණම මට හිතුණා මේ එයා නේද කියලා......... ඒ ඔයා නේද කියලා......... එදා ඉඳලා මට ආදරේ කියන එක දැනෙන්න ගත්තා......... එච්චර කල් හිතට දැනිලා නොතිබ්බ හරි අමුතු දේවල් දැනුණා......... ඔයාගෙ පින්තූරෙ මිස වෙන කිසි දෙයක් දැකලා නැති දන්නෙ නැති මම ඊ ගනන් ඔයාගෙ පින්තූරෙ බලාගෙන තනියම කල්පනා කළා......... පින්තූරෙ එක්ක තනියම කථා කළා......... මට හිතුණේ ඒ පින්තූරෙ ඉන්න සුරංගනාවි මා ළඟම ඉන්නවා කියලා ඇත්තටම.........

මට එහෙම ඉන්න කොට හිතට හිතුණා මෙහෙම පින්තූරෙ එක්ක කථා කරනවට වැඩිය ලොකු වැඩ කොටසක් තියනවා කියලා මගේ ආදරේ දිනාගන්න........ මම ලංකාවට යන්න ඕන. ගිහින් මෙ ප්‍රශ්නෙට මූණ දෙන්න ඕන කියලා........ ඉතිං මම ලංකාවට එදා ආවට පස්සෙ තාමත් මම ඉන්නේ ප්‍රශ්නෙ එක්ක........ විසඳුම එක්ක නෙවි........ ඒත් මගේ ආදරේ කොච්චර ඇත්තද අවංකද කියලා හිතද්දී මට හිතෙනවා මම මේ සටන දිනන්නම ඕන........ ඒක වෙනවා කියලා........ ඒ ආදරේ එච්චරටම පිවිතුරුයි. ඒක මගේ ඇට ලේ මස්වල රැඳිලා තියෙන දෙයක් කියලා මම දන්නවා........ මෙ ආදරේ ඔයාට නොදැනෙන්නෙ විදියක් නෑ කියලත් මට හිතෙනවා ඔයාගේ ඇස් දකින වෙලාවට" එසේ කියූ නෙත්ත සඳරුගේ දෙනෙතින් හෙමිහිට ගලා ගිය කඳුලක් අතට ගත්තේය.

"ලොකු චණ්ඩිකමක් කරලා මාව මවට්ටු කරන්න. ගිම්හාන ජීවිතේට ළංකරගත්ත බව මට පෙන්නන්න හැදුවට ඔය ඇස් දෙකේ, ඔය හිතේ, මේ ශරීරයේ ගිම්හානට ඉඩ නෑ කියලා........ හරි දිග දුරට කල්පනා කරද්දී මට හිතෙනවා" නෙත්ත කිවේ රහසක් සොයාගත් කුඩා එකෙකු මෙනි. ඒ කොහොමදැයි අසන්නට මෙන් සඳරු නෙත්ත දෙස හිස හරවා බැලුවාය. නෙත්ත සිනාසුණේය. බොහෝ ආදරණීය ලෙස ඇය දෙනෙත් පත්ලේ ගැඹුරටම එබී ඔහු සිනාසුණේය.

"ඔයා ගිම්හානගෙ නම්........ මට ඔයා ළඟ ඉන්න වෙන්නෙ අඩුම තරමේ අඩි එකහමාරක් වත් ඈතින්........ ඔයා එයාට ආදරේ නම්........ මගේ ඇඟේ වැදෙන මානෙක, අතක් පයක් වැදෙන මානෙක ඔයා ඉන්නේ නෑ කියලා මම දන්නවා........" ඔහු ඒ දෙනෙතට එබී රහසක් පවසද්දී බියපත් සඳරු ඒ රහස ආපසු ගන්නට මෙන් ඔහුගෙන් ඉවත් වෙන්නට වෙර දැරුවාය. ඇයගේ හදවත ඔහු වටහාගෙන තිබීම ඇයට ගෙනාවේ පසුතැවීමකි........" එහෙත් ඇයගේ උත්සාහයෙන් සිදුවූයේ නෙත්ත තව තවත් ඇයව තම සිරුරට ළං කර ගැනීමයි.

"මලකට කවදාවත් බෑ ගලක් වෙන්න........ මලේ මෘදු ගතිය කොහෙන් හරි මතු වෙනවා........ මලම පතාගෙන ඉන්න සමනලයට තේරෙනවා ඒ මල පෙති විහිදලා කියන්නේ මොකක්ද කියලා........ අහන්න........ එහෙනම් ඇත්........ මට ඔය හිත නොතේරෙනවා නෙවි........ ඔය ඇස්, ඔය ලිප්ස්........ මා ගාවදී කියන දේ මට අපූරුවට කියවාගන්න පුළුවන්........ ඒ නිසා බොරු කියලා ඔයාට





හරි අමාරුයි මාව රවටන්න" ඇයගේ සවනට දෙතොල් පෙති ළංකොට නෙත්ත කිවේ ඇයට පමණක් ඇසෙන නෑසෙන තරමිනි. සඳරුගේ දෙකොපුල් රෝස පැහැවී යද්දී නෙත්ත ආදරයෙන් ඇය දෙස බලා උන්නේය. බිමට නැමුණු ලජ්ජාබර දෙනෙත........ කියන්නේ හරි ලොකු කථාවක් බව ඔහුට වැටහිණ........ යෝජනාවකින් යුවතියක් බලන්නට ගිය විට තරුණයාට කැමති වුවද ඒ බව කියන්නට නොහැකි නොබිඳුල් යුවතියකගේ ආදර බව ලජ්ජාශීලී බව නෙත්ත නිහඬ සිනාවෙන් බලා උන්නේය.

අනතුරුව ඇයගේ අත මත තම අත තැබූ ඔහු ඒ දිගු රෝස පැහැති ඇඟිලි තම ඇඟිලි අතර ගුලි කරගත්තේය. සඳරු හෙමිහිට හිස ඔසවා බලද්දී ඒ දෙනෙත්වල පැටලෙන්නටම බලා සිටි නෙත්තගේ ඇස ඇයට හමු විය........ නෙත්තගේ මුවේ වූ මදහස පිරි බැල්ම කීවේ තමා කී සියල්ල ඇත්ත නේදැයි ඇයගෙන් විමසන්නා වැනි දෙයකි........ ඇය නිහඬවම බිම බලන්න උත්සාහ කරත්ම,

"එපා බලන්න අහක........ මා දිහා බලා ඉන්න........ අදට විතරක් හරි........ මට මේ හීනෙ තනි වෙන්න ඉඩ දෙන්න........ මම විතරක් නෙවි........ ඔයා ඇස්වලත් මං ගැන ආදරේ ලියවිලා කියලා මගෙ හිතටම වටහලා දෙන්න ඕන මට........ ඒක නිසා මගේ ඇස් දෙක දිහා බලා ඉන්න රත්තරං........ ඔයාගෙ සුවඳ, බැල්මට පවා ආදරේ කරන බව ඔයාට තේරුම් ගන්න පුළුවන් එතකොට........" නෙත්ත කියද්දී සඳරුගේ දෙනෙතට කඳුළු පුරා ආවේය.

"ප්ලීස්........ අඬන්න එපා........ නිතරම අඬන ඔය ඇස්දෙකට ආදරේ අඳුනගන්නත් ඉඩදෙන්න ඕන........ ඒක නිසා දැන් අඬන්න එපා........ මොකද මාත් එක්ක මගේ ජයග්‍රහණය බෙදාගන්නත් ඉන්නේ ඔයා........ මම හිතන්නේ මගේ ඒ ලොකු සටනේ පළමෙනි ජයග්‍රහණය මෙක........ ඔයත් මට ආදරය කරන බව පිළිගත්ත එක........" එසේ කී නෙත්ත මොහොතක් කල්පනා කළේය. යළිත් කටහඬ අවදි කළ ඔහු,

"කවදාවත් මගේ හිතේ අදහසක් නෑ ඔයාව මට අයිති කර නොගෙන ඉන්න........ ඒත් ඒ බලාපොරොත්තුව හීනයක්ම විතරක් උණත් අද මම දන්නවා ඔය හිතේ මම ඉන්නවා කියලා........" නෙත්ත හෙමිහිට කිවේ තමාටම කියාගන්නක් මෙනි.

"මෙච්චර කල් මගෙ හීන සැකෙන් තිබුණේ මගේ ආදරේ ඉලක්කය නොදැන ගහන ගලක් කියලා........ ඒත් මම දැන් දන්නවා........ ඒ

ඔහු කියද්දී සඳරු සුසුමක් හෙළුවාය.........
ඉලක්කය හරි කියලා........" ඔහු කියද්දී සඳරු සුසුමක් හෙළුවාය......... අනේ දෙවි හාමුදුරුවනේ......... මම කොහොමද කියන්නේ මමත් මුළු හිතින්ම ඔයාට ආදරේ කරන බව......... දැකපු කාලෙ හිටම ඔයා මගේ හිතේ හීනයක් වෙලා ඉන්න බව......... ඇය තනිවම හදවතින් හඬා වැටුණාය.

සෙනෙහස විඳිනට පින්කර ඇති මුත්
පිවිතුරු ඔබේ හදින්
ඔබේ දෙපා ළඟ දූවිල්ලක් වත්
වන්නට නොමැත වරම්.........
හැන හැන බැඳුනද මනසින් හැඟුම්න්
ඔබ මා එකම සිතින්
කුමටද නිදි නැති යහනට නැතිනම්
ඔබගේ සුසුම් පවන්.........
යළි යළි බැඳුනද නොසැලෙන විලසින්
ඔබ මා සිතට සිතින්
කුමටද හැකි කල සෙවනට මොහොතක්
ඔබ ළඟ රැඳෙන වරම්.........

ගීතය අසා සිටි නෙත්න බලාපොරොත්තු සහගත ලෙස ඇය දෙස බැලුවේය.

"ගීත ඇත්නම්......... ජයගන්න බැරි ඉලක්කයක් නෑ සඳු......... ආ......... අයිස්ක්‍රීම් එක කන්න........." අසල තිබූ අවන්හලේ පැමිණ වාඩිවෙද්දී ඇසුණ ගීතය අසාහුන් නෙත්න වේටර්වරයා ගෙනත් දුන් අයිස්ක්‍රීම් කප් එකෙන් හැන්දක් කා ඇය වෙත පෑවේය.

"ඔයා කන්න......... මට සීතලයි........." ඇය කීවේ ඇයට දැනුණ තද සීතල නිසාවෙනි. නෙත්න පුටුව මදක් ඇද ඇයගේ පුටුව අසලට ලංවිය.

"සීතලේ ගැහි ගැහි අයිස්ක්‍රීම් කනකොට ඒකෙ තියෙන්නේ මාර ගතියක්........."

"ඒ උණාට මට නම් බෑ කන්න......... හවස් උණ නිසා හරි සීතලයි"

"සීතලට තේන්නම් යෝදියේ මම ඉන්නේ......... කාපං......... පොඩි එකී වගේ තාගෙන් අඬන්නෙ නැතුව" එසේ කී නෙත්න අයිස්ක්‍රීම් හැන්දක් ගෙන ඇය මුවට ඇමීය. ඇය විහා පැන ඔහු බදාගත්තේ මුවට දැනුන සීතලයෙන් කෑ ගසමිනි. නෙත්න මහ හඬින් සිනාසුණේ ඇයගේ ඇඟලිල්ල ඇකිමෙනි. ඇය තමා වටා දෑත යවා උරහිසේ





මුහුණ සඟවා ගනිද්දී ඇය ගැන දැනුණ අනුපමේය ආදරයෙන් නෙත්න ගේ හද පිරී ගියේය. අයිස්ක්‍රීම් කටක් කන අතරේ ඔහු හිස හරවා ඇය දෙස බැලුවද ඒ මුහුණ තම උරහිසේ සැඟව තිබිණ.........

......... ඔන්න මහොම පුංචි එකියක් වගේ මගේ ළඟට වෙලා ඉන්න සඳු......... මෙ සල්ලි......... මේ තෑයෝ ඒ කිසිදෙයක් මට ඕන නෑ එතකොට......... ඔහු තනිවම සිතුවේය.

"ඒයි......... හොර කෙල්ල නැගිටපං......... මට තනියම කන්න බෑ කප් එකම"

"ඇයි මහ ලොකුවට ගත්තේ......... කන එකයි තියෙන්නේ ගත්තා නම්"

"දැන් ඉතිං නැවත් බිව්වත් සතුටක් දුකක් විඳගන්නත් ජීවිතේ අනිත් භාගෙ ළඟ ඉන්නවා කියලා හිත කියනවානේ......... ඒ නිසා කිසි දෙයක් තනියම බෑ........." එසේ කී නෙත්න හිස ඔසවා ඇයට හැන්දක් කැවීය......... සඳරු ඔහු උරහිසට හේත්තු වී ඒ සිටි මොහොතේ භාහිර ලෝකය අමතක කළාය.........

මෙතෙක් වේලා හිස්ව තිබූ ඉදිරිපස මේසයට කුඩා දියණියකද රැගෙන තරුණ යුවලක් පැමිණ අසුන් ගත් ඔවුන් දුටුවේ ඒ මොහොතේය. කුඩා බෝනික්කියක වැනි පුංචි කෙල්ල දුටු නෙත්නගේ සිත ආසාවෙන් පිරිණ.........

"ඒයි......... බබා......... අර චූටි කෙල්ල මාර ලස්සනයි නේද.........?"

"හ්ම........."

"හ්ම් නෙවි බං......... හොඳට නෝට් කරගනින්......... උඹටත් මය විදියෙම එකෙක් හදන්න තියනවා" නෙත්න කීවේ ඇය දෙසට සිරුර තද කරලමිනි.

"ච්ක්......... කථා කරන හැටි........."

"ගැනි වෙන්න ඉන්න එකීට කොහොම කථා කරාම මොකද......... ඇත්තටම සඳු......... මම හරි ආසයි ළමයි තුන් හතර දෙනෙක් අපිට ඉන්නවා නම්........."

"ඔය ඉන්නේ රිද්මි අක්කිගෙ දෙන්නයි......... තව ටික දවසකින් අවන්තයියගේ........." සඳරු කියද්දී

"ගෙදර උන් ගැන නෙවි මම කියන්නේ......... ඔයාගෙයි මගෙයි බබාලා ගැන" යි නෙත්න පැවසීය.

"ඒක කවදාවත් ඉෂ්ට වෙන්නෙ නෑ......... ඔච්චර ලොකු හීන බලන්න එපා ඒක නිසා........."

"හීන බලන්න විතරක් නෙවි. ඒවා හැබෑ කරගන්න තරමටත් මම දක්ෂයි........ මොකද මාළඟ කියනවා ඒ හීනෙ හැබෑ කරගන්න ඕන කරන බඩු ගොඩක්........ මම දන්න දේවල්........ සිද්ධ වෙච්ච දේවල් සිද්ධ වෙන දේවල්........ මේ සේරම එකතු කරලා මම ඒ හීනෙත් ඇත්තක් විදියට නිර්මාණය කරනවා........ ඔන්න බලන්න ඔයා බලා ඉන්න........" එසේ කී ඔහු ඇයට ඉඟි කළේය. සඳරු එක්වරම සසල වූයේ ඔහු මේ කියන්නේ මොනවාදැයි සිතමිනි........

"ඔයාට මම මේ කියන්නේ මම චැලෙන්ජ් එක භාරගත්තා කියන්නත් එක්ක. ඔන්න බලන්න අපි හෙට ගෙදර ගියාට පස්සෙ ඉස්සරහදි වෙන දේවල්........ මගේ හීන වගේ තියන තාප්ප එක කැඩිලා වැටෙන කොට මම ඔයාට මතක් කරන්නම් අද මම කියපු දේ........ අනෙත් එක ඔයාටත් පෙනේවි........"

"මොනවද ඔයා මේ කියන්නේ........?"

"මොකුත් නෑ........ ඔයා බලා ඉන්න........ දැන් අපි යමු"

නුවර එළි ගිය ගමනින් පසු නෙත්නගේත් සඳරුගේත් හැසිරීම බොහෝ අමුතු බව මනුෂිට වැටහිණ. මනුෂි තමන් දෙදෙනා ගැන කල්පනාවෙන් සිටින බව වැටහුණ නෙත්න ඇයට දැනෙන්නටම සඳරු හා අමුතු ලෙස කථා කළේය. ක්‍රියා කළේය. එහෙත් මනුෂිගේ අවධානය තමා වෙත යොමු වී ඇති බව නොදත් සඳරු නෙත්නගේ සමහර ක්‍රියා කලාපයන් ගැන ඉතාමත් බියට පත් විය. දිනක් කෑම කා උඩට එන්න ආ සඳරු පසු පසින් නෙත්න ආවේ ඇය ආ නිසාම නොවේ........ එහෙත් මනුෂි සිතුවේ අනෙකකි. ඒ නිසාම නෙත්නට නොදැනෙන සේ හෙමිහිට පඩිපෙළ නැග උඩට ආවේ වෙනත් යමක් දකින අටියෙනි. මනුෂි මේ එන්නේ තමාගේ හොර අල්ලන්න බව වැටහුණ නෙත්න එමින් සිටි සඳරු ඇමතුවේය.

"සඳු........" නෙත්න කියද්දී සඳරු හැරී බැලුවාය.

........අප්පා නමත් වෙනස් කරලා........ ඔය තියෙන්නේ වැඩ........

මනුෂි සිතුවේ අසල වූ බිත්තියට මුවාවෙන අතරේය.

"සඳු........ පොඩ්ඩක් මගේ කාමරේට එන්න........"

"ඇයි........?"

"කිව්වම කියන දේ කරන්න........ එන්න" මදක් සැරෙන් කී නෙත්න කාමරයට යද්දී සඳරු ද ඔහු පසු පස කාමරයට ගියාය. මනුෂි ඔවුනගේ කථා බහ ඇසෙන තැනක හිඳ බලා සිටියාය.



"හෙට උදේ මට මීටින් එකකට යන්න තියනවා........ මට ඇඳුමක් තෝරලා තියන්න........" කාමරයේ වූ ලිපිගොනුවක් ගෙන ඇඳ මත වාඩිවෙමින් නෙත්න පැවසීය.

"ඇඳුමක්........? ඉතිං ඔක තෝරගන්න බැරිද?"

"මගේ ගමන් වලට ඕන කරන ඒවා ඔයා විතර මම දන්නෙ නෑනේ"

"ඔයා නම් දැන් ඕනැවට වඩා බබෙක් වෙලා"

"නලවන්න කෙනෙක් ඉන්නකොට එහෙම තමයි........" නෙත්න හෙමිහිට නැගිට අයෙ වෙත යමින් කීවේය. සඳරු අල්මාරිය හැර ඇඳුමක් එළියට ගෙන,

"අයන් කරාට කොලර් එක පොඩි වෙලා වගේ........ අයන් කරන්න වෙයි"

"ඉතිං මටද කියන්නේ........ අයන් කරන්න"

"මොනාද අනේ........ මටම කරදර කරනවා ප්‍රේමක්කාට කියන්නේ නැතිව........"

"ඔයා ඉන්දෙද්දී තව කවුරුත් ඕනෙද........?" නෙත්න කීවේ ඇයගේ දෙවුරහිස මත අත තබමිනි. එහෙත් ඒ හාම සඳරු ඉවතට පැන්නාය. ඇයට දැනුණේ දැඩි බියකි........

"දෙයියනේ........ මොනාද කරන්නේ........ තියන බය නැති කම........"

ඇය ඔහුට රවමින් කියද්දී නෙත්න හඬ නගා සිනාසුණේය........

මනුෂි මේ සියල්ල බලාසිටියේ පුදුමයෙනි........ මෙ තරම් දුර ගිහින් දෙන්නාගෙ සම්බන්ධෙ........ බලමුකෝ තව කොච්චර කල් නටයිද කියලා........

"හරි හරි........ ඔක ගෙනිහින් අයන් කරන්න........ උදේට මාව ඇහැරවන්න........"

"ඇයි එලාම් එක තියෙන්නේ"

"ඔරලෝසුවෙ කරච්චල් සද්දෙ වගේද ඔය මූණ උදේට දැක්කාම........ මීටින් එක සක්සස්. හරි මම හෙට මීටින් එකට යන්න ඕනෙ නම් මාව ඇහැරවන්න........"

"මට ඕනෙවට වගේ නේ වැඩ කරන්නේ"

"ඔයා දන්නෙ අදද........ ඔයාට ඕනවට තමා මම වැඩ කරන්නේ........ ඕ. කේ. මම නිදාගන්නවා........ මේ ඒක නෙවී........"

"ඒ පාර මොකක්ද........?"

"කිස් එකක් දීලා යන්න බැරිද.......?" ඔහු සිනසෙමින් අසද්දී බියපත් වූ සඳරු විදුලි පහනද නිවා දමා ඉක්මනින්ම යන්නට ගියා. ඇය ගිය පසු යළි විදුලි පහන ඇමූ නෙත්න එළියට ගියේය. ඒ මොහොතේ එතැනින් ඉවත් වී ආපසු යන මනුෂ් දුටු නෙත්න ඇය දෙස බලා උගුර පෑදුවේය.

නියති බොහෝ වෙනස් වී ඇති බව නිවසේ සියල්ලන්ටම එක ලෙස ඇනුණේය. ඇයගේ පෙර තිබූ ජීව ගතිය නැතිව ගොස් දෙනෙත් පවා මලානික වී ගොස් ඇති සැටියකි. රැකියාවට ඇය සුපුරුදු ලෙස යන නමුත් බොහෝ දිනවල ඇය වැඩ නිමවූ ගමන්ම නිවසට ආවාය. එසේ නොආ දිනක බොහෝ රෑ වනතුරු නොපැමිණි ඇය නිවසට ආවේ මුහුණ සඟවාගෙන මෙනි.......

මේ ගැන සැක කළ නෙත්නගේ මව දිනක් ඇය එද්දී ඇයට කතා කළාය.

"දූ....... නියති ඔහොම ඉන්න" මොකද මෙහෙම රෑ වෙන්නේ"

"අද පාටි එකක් තිබුණා නැන්දි යාළුවෙකුගේ......."

"කවුද යාළුවා?"

"මේ....... මේ....... නැන්දි අඳුනන්නේ නෑ....... ඇය සිත සිතා හිට අවසානයේ කිවාය. නෙත්නගේ මවට ඇය ගැන සැක සිතී ඇයට ළංව බලද්දී මුවින් නිකුත් වූ සැර මත්පැන් ගඳ ඇනී බිය වූවාය.

"නියති.......?.......ඔයා බීලා"

"සොරි නැන්දි....... පාටි එකේදී චුට්ටක් ගන්න උණා යාළුවො.......?"

"චුට්ටක් නෙවී....... ඔයා ගොඩක් බීලා....... අනෙක මෙක ෆස්ට් ටයිම් නෙවි නේද....... ඔයා මෙහෙම ආව හැම දවසකම ඔයාගෙ මම දැක්ක වෙනස මේකද එහෙනම්....... බොහොම අපූරුයි නියති. මම තාත්තිට හෙට උදේම කෝල් කරනවා"

"තාත්තිට කියන්න එපා නැන්දි....... මට විසුමක් වෙන්නෙ නෑ"

"ඔයා මෙහෙම බොන බව දන්නවා නම් මට වත් විසුමක් වෙන්නෙ නෑ කාගෙන්වත්....... තාත්ති විතරක් නෙවි මාමා අයියලා උණත් මට බනීවි.......අනෙත් එක ඔයා ඔහොම බීලා ඉන්නවා සුදු අයියා දැක්කොත් ඔයා ඉවරයි තයි"





"නෙත්නයියා.......?" නියති සිනාසුණාය. "නෙත්නයියා දන්නවා නැන්දි මේ ගැන" නියති කීවේ ඈත අඳුර දෙස බලමිනි.

"මොනවා....... නෙත්න දන්නවා....... වෙන්න බෑ....... එයා දන්නවා නම් ඔයා බොනවා කියලා ගේ දෙකකරයි"

"කෝ ඉතිං එහෙම උණේ නැනේ නැන්දි. මාත් හිතා හිටියා එහෙම වේවි කියලා....... උණේ නැත්තේ ඇයි කියලා තමා පුදුමේ" නියති කීවේ විහිළුවට නොවන බවත් ඇයගේ සිතේ කුමන හෝ දුකක් සිරකරගෙන සිටින බවත් ශ්‍රියන්තාට වැටහිණ. ඇය නියතිගේ අත ගත්තාය.

"මට නම් හරි පුදුමයි සුදු පුතා දන්නවා කීවාම....... මට කියන්න ඔය දෙන්නා තරහ වෙලාද....... එයා ඔයාට ගැහුවා බැන්නාද?"

"එහෙම කළා නම් මට සතුටුයි....... අඩුගානෙ මා ගැන හොයනවාවත් කියලා....... එයාට මා ගැන එහෙම ගානක් නෑ නැන්දි......."

"ඒ....... ඒ කිව්වෙ.......?"

"නෙත්නයියා වෙනස් වෙලා....... ඔව් ගොඩක්ම....... හිතාගන්න බැරි තරම.......?" නියති කීවේ සුසුමක් හෙළමිනි....... ඒ කථාවෙන් ශ්‍රියන්තා මහත්මිය කලබල වූවාය....... නියති ඇමතූ ඇය,

"ආයිත් නම් මේ වගේ වැඩ කරන්න එපා දූ....... මම බලන්නම් නෙත්නගෙන් අහලා වෙලා තියන දේ....... ඔයා උණත් දන්නවනේ එයා ඉන්න තත්ත්වෙ. වැඩ වැඩ....... කොයි වෙලෙත්....... ඉතිං අතපසු වීම් වෙනවා ඇති"

"ඒවා අතපසුවීම් නෙවි නැන්දි....... හිතාමතා මග හැරීම....... මම ඒක දන්නවා....... එයා මට කිවා"

"මොනවා....... එයා කිවා....... මොනවද කීවේ.......?"

"එයාට මාව එපා කියලා....... එයා මට ආදරේ නෑ කියලා"

"නෑ දූ....... ඔය මොනා හරි තරහකට කියන්න ඇති....... දන්නවනේ....... කේන්තිකාරයගෙ හැටි. ඒත් ඉතිං ආයෙ චුට්ටෙන් යාලු වෙනවනේ"

"ඒත් මේ වෙනස් උණේ හිටපු විදියට හැඩගැහෙන්න නෙවී නැන්දා....... ඒක මම දන්නවා....... එයා මගෙන් හරි දුර ඈතකට ගිහින්......."

"එහෙම වෙන්න බෑ දූ....... එයා ඔයාට ආදරෙයි....... අනෙත් එක ඔයා මොනවා කීවත් එයා ඔයාව මැරී කරනවනේ....... අපි

ඉක්මනට ඔයාලගෙ වෙඩින් එක ගමු......... එතකොට සේරම හරි. ඔයත් ටිකක් මය පොඩි එකා වගේ ඉන්න එක අඩු කරලා එයාට ඕන විදියට ඉන්නකෝ"

"නැන්ඳ නොදැන හිටියට අශ්වයා පැනලා ගිහින්. ඉස්තාලෙ වැහුවත් නොවැහුවත් ගානක් නෑ" නියති කිවේ ඇඩි දුකකිනි. මෙ අලුත් ආරංචියෙන් නෙත්නගෙ මව පුදුම වූවාය. මෙතෙක් කාලයකට ඇය සිතා සිටියේ නෙත්න හා නියති පෙමින් බැඳී සතුටෙන් සිටින බවය. ඔවුන්ට නිතර හමුවීමට නොලැබුණද ඔවුන්ගේ ඇසුර හොඳින් පැවතෙන බවය. එහෙත් දැන් මේ ඇසූ කථාවෙන් පසු එය එසේ නොවන බවත් නියති සමහරවිට වෙනස් වූයේද මේ නිසාම විය හැකි බවත් ඇයට සිතිණ. නියතිව අස්වසා කල්පනාවෙන් බරව ඇය කාමරයට ගියාය.



# 27

දිනක් මිදුලේ බංකුවට මතට වී කල්පනා කරමින් සිටින නියති දුටු මනූෂි වෙන යම්කිසිවකට යන්නාසේ ඇය වෙත ගියාය.

"ආ......... මනූෂි අක්කි......... කොහෙද යන්නේ?"

"මම යනවා නියති අපේ යාලුවෙකුගෙ පාටි එකකට......... ඒක නෙවි අද මොකද ඔයා ගෙදර, අද නැද්ද පාටිස් එහෙම?"

"නෑ අක්කි......... ගිහිල්ලා ගිහිල්ලම මට දැන් එපාත් වෙලා ඕවා"

"ඒකනේ......... පාටනර් කෙනෙකුත් නැතුව තරුණ කෙල්ලො කොල්ලො පාටිස් වලට ගියාට කිසි වැඩක් නැ. බැඳපු අපි වගේයැ ......... කොහෙද නෙත්නාත් එන්නැනේ ඔයා එක්ක කොහෙවත් නේද?" ඇය නියති දෙස උවමනාවෙන් බලමින් අසද්දී නියති ඇය දෙස විමසුම් බැල්මක් හෙළුවාය.

"ඇයි අක්කි එහෙම කීවේ?"

"නෑ ඉතිං නෙත්න ඔයා එක්ක ඉන්නවා නම් එන්ජෝයි කරන්න පුළුවන්නේ"

"නෙත්නයියට ඕවට වෙලාව නෑනේ මනූෂි අක්කි......... වැඩනේ නිතරම......... රෑට ගෙදර එන්නෙත් කියටද?"

"ආපෝ නෙත්නට මොකද වෙලා නැත්තේ......... එයාට ඔයා එක්ක යන්න වෙලා නැති උණාට සඳරු එක්ක නම් ඕන අහක යන්න ඕන දෙයක් කරන්න වෙලා තියෙන්නේ......... රෑ කීයට ගෙදර ආවත් මය පොඩ්ඩක් කතා කරන්නත් වෙලා තියෙන්නේ........." මනූෂි එතරම් ගාණක් නොගෙන කිවේ නියති දෙස හොරැහින් බලමිනි. මනූෂි සිතූ වෙනස නියති තුළ ඇති විය.

"ඒ දෙන්නා ඉතිං එකට වැඩ කරන නිසා එහෙ මෙහෙ යන්න වෙනවනේ නිතරම"

"අපෝ ඔෆිස් වැඩ වලට විතරක් නෙවි......... දෙන්නාගෙ පුයිවෙට් වැඩ වලටත් දෙන්නා ඕන තරම් යනවා. මම දැන් කීප දවසක් නෝට් කළා......... ඒ දෙන්නා අතරේ මොකක් හරි තියනවා......... මම

හැටිද කියලා........ ඒ උණාට ඉතිං මම මේ දන්නෑ ඉතිං මට පෙනුණ හැටිද කියලා........ ඒ උණාට ඉතිං මම මෙ ඔයාට කියන්නේ එයා බඳින්න ඉන්නේ ඔයාව නම් එයා ඔයා එක්ක එපැයි ලන්ච් වලට. ඩිනර් වලට යන්න. එහෙ මෙහෙ ඇවිදින්න........ ඒ උණාට ඒවා ඉතිං සඳරූ එක්ක තමා කෙරෙන්නේ ........

සඳරූත් ඉතිං හස්බන්ඩ් හිටියට වැඩි හරිය තනියමනේ........ ඒක නිසා ඉතිං නෙත්ත යාලුකමට වගේ නැතට තනි රකිනවද දන්නෙත් නෑ තමයි........ සඳරූ දැක්කම ඉතිං ඕන කෙනෙකුට පිස්සු හැදෙනවනේ........" එසේ කියද්දී නියතිගේ මුහුණ අමුතු වී යනු දුටු මනුෂි සරදම් සිනාවක් පෑ.

"මම එහෙම කියුවට ඔයා ඕවා සීරියස් ගන්න එපා........ අලුත් වාහනේ ගන්න කලින් නෙත්ත ඉතිං හිතනවද දන්නෙත් නෑනේ පරණ වාහනයක් ටිකක් එළවලා බලන්න........ එක්ස්පීරියන්ස් එකටත් එක්ක........ නෑ මම කිවේ පරණ වාහනෙත් වැඩි හරිය හිකම් නේ........ ........any ways........ මම යන්නම් නියති........ ලේට් වෙනවා........ ඔයා ඕවා ඔච්චර හිතන්න එපා. නෙත්ත මැරි කරාම හරියාවි. දන්නැද්ද පොහොසත් ගෙවල්වල ඕවා ඔහොම තමයි........" එසේ කියූ මනුෂි එතැනින් පිටව ගියේ තමා වැපිරූ බීජ නිසි පසෙහි වැටුණු බවට සැහීමකට පත්වෙමිනි........ මනුෂි කියූ වදන් අදහාගත නොහී නියති පොත වසා දමා දෙනෙත් පියා ගත්තාය.

පසුගිය දින ටිකේම සඳරූ හා මොහොතක් කථා කරන්නට ගතකරන්නට නොලැබීමෙන් නෙත්ත සිටියේ දැඩි අපහසුවකිනි. ඇය හා කතා නොකර සිටීමේදී වැඩක් පවා හරි හැටි කරන්නට ඔහුට නොසිතෙයි. බොහෝ කාලයකින් ඇය හා සාප්පුවකට වත් ගියේද නැත. නෙත්ත තම දුරකතනය ගෙන ඇයට ඇමතුමක් ගත්තේය.

"කොහේද ඉන්නේ........?"

"ලෙක්චර්ස් ගිහින් ඔෆිස් ආවේ දැන්........ ඇයි?"

"ඔය වැඩ හෙට කරන්න හැකි. දැන් එන්න ගමනක් යන්න........"

"කොහෙද මේ හදිසියේ........ මම මෙහෙ හිරවෙලා වැඩවල"

"කිව්වනේ........ අලා එන්න කියලා........ මට හදිසියි........ දන්නවනේ........ මට හිතුණ ගමන් ඔයා මා ගාව ඉන්න ඕන"





"ඒක යස කතාවක්........ මම ඉතිං මෙතනින් එළිදි වෙලා වෙහිකල් එකේ සීට් එකට බහින්න ඕන"

"පුළුවන් නම් ඒත් හොඳයි........ එච්චර එපා මම එනවා දැන් ගන්න........"

නෙත්ත ඊට විනාඩි කිපයක පසු ප්‍රධාන කාර්යාලයේ ගේට්ටුවෙන් ඇතුල් විය. ආරක්ෂක නිලධාරියා වහාම ඔහු දැක ආචාර කොට ගේට්ටුව විවර කළේය.

"කුමාර........ සඳරූ මැඩම් පහළට ආවද?"

"නෑ සර්........ මැඩම් දැන් ටිකකට කලින් කැම්පස් ඉඳලා ආවේ........ ඊට පස්සේ කාම පහළට ආවේ නෑ"

"හා හරි මම බලන්නම්........" එසේ කියූ නෙත්ත වාහනය නවතා සෝපානය දිගේ 6 වන තට්ටුවට ගියේය. ඔහු යද්දී සඳරූ ඒමට සූදානම් වෙමින් සිටියාය.

........තව මෙතන හැඩ වෙනවා........ මෙකිට ගානක් වත් නෑ මම එන්න කියුවට........ මට මෙහෙ දකින්න නැතුව විකාර වෙලා ඉන්නවා. වැඩක් වත් හරියට හිතකින් කරන්න නැතිව........ එයා නම් ඉතිං මම කරන්න කියනවට හැමදේම කරනවා මිස මා ගැන උනන්දුවක් තියන එක්කයැ........

"යමු........ මට චුට්ටක් පරක්කු උණා"

"එන්න කීවාම වෙලාවට එන්න ඉගෙන ගන්න"

"කොහෙද මේ නැකැත් පහුවෙනවට බයේ වගේ දුවන්නේ?"

"පෝරුවට නගින්න........"

"ඒකට ඉතිං මට කථා කරලා හරියනවයැ........ නියති ගෙදර ඉද්දී"

"ඔව් ඔව් එයා එක්ක පෝරුවට යන්න තමා මේ සේරම කරන්නේ ........ යමු යමු"

නෙත්ත සඳරූ හා රථයට ගොඩ වී පාරට පැමිණ ඇය දෙස බැලීය.

"කොහේද යන්න ඕන........?" නෙත්ත ඇය දෙස බලමින් ඇසීය. සඳරූ පුදුම වීය.

"ඒක හරි කථාවක්........ මට කොහේවත් යන්න ඕන කීවද........?"

"මෝඩියෙ........ මටත් ඔයා එක්ක ඉන්න විතරයි ඕන උණේ........ ඉතිං ඔයාට යන්න තැනක් තියේනම් මම එක්ක යන්නම්........"

"එන්න එපා මට මෝඩි කියන්න........ අනෙක මට කොහේවත් යන්න ඕන නෑ........ ඔයාට ඕන නම් මිස"

"පුදුම ගෑනියෙක්......... මිනිහා ළඟ ඉඳිද්දිත් ඒකෙන් ප්‍රයෝජන ගන්නෙ නෑ"

"ඒ ඉතිං......... ගෑනු මිනිස්සුනේ......... මම ඔයාගෙ ගෑනි වත් ඔයා මගේ මිනිහා වත් නෙවිනේ......... ඔයාගෙන් අනවශ්‍ය ප්‍රයෝජන ගන්න........." සඳරු ඈත බලාගෙන කීවාය.

"දැන් නොවුනත් කවදා හරි වේවිනේ........."

"ඔව්......... ඒත් මේ ආත්මෙ නෙවි........."

"ඔන්න ඔන්න පටන් ගත්තා......... මම එන්න කීවෙ ෂොපින් යන්න........."

"මේ හදිසියේ........."

"මොන හදිසියෙද......... මට ඇඳුම් ටිකක් ගන්න ඕන......... ඉතිං ඔයාට පුළුවන්නේ ඒවා සිලෙක්ට් කරන්න" ඔහු කීවේ ඇය දෙස බලමිනි.

"අතන රෙදි කඩයක් තියනවා.........මේ වෙන තැන්වලින් ඇඳුම් ගන්නවා"

"ඔයා ඔහොම කියනවා. මම දැන් තමයි ලංකාවෙන් ඇඳුම් ගන්නේ......... වෙනදා නම් කොහෙ හරි රටකින් ගන්නවා මිස ගන්නෙම නෑ"

"දැන් ඉතිං ඇඳුම් ගේන්න විතරක් රට යන්න බෑනේ"

"යමුද දෙන්නා එක්ක......... ගමනක් හදාගෙන"

"අනේ මේ මට බෑ"

"හරි එහෙනම් දෙන්නටම ගමු කෑ නොගහ........."

"මට.........? මට මොනාටද......... ඔයා ගෙනාපු ඇඳුනුත් තියනවා. රොෂාන් ගෙනාපුවත් තියනවා ඇඳලා නැතිව තාම"

"රොෂාන් ගෙනාපුවා අඳින්න එපා දැන්........."

"ඇයි ඒ.........?"

"ඇයි ඒ අහන්නේ......... මම ඉන්නේ ඔයාගෙ අවශ්‍යතා හරිගස්සලා දෙන්න තමා........."

"රොෂාන් මගේ මහත්තයා"

"හ්ම්......... තමට........." එසේ කියූ නෙත්න ඇය තමා දෙසට හැරෙද්දී නොදුටුවා සේ රථගාල වෙත රථය හැරවීය.

සුවිශාල සාප්පු සංකීර්ණයේ වූ ජාත්‍යන්තර ශාඛා ඇති නිමි ඇඳුම් හල වෙත සඳරු ද කැටුව ගිය නෙත්න ඇය හා එකතුව ඇඳුම් කිපයක් තෝරා ගත්තේය.





"දැන් ඔයාට මොනා හරි ගන්න යමු" නෙත්න කීවේ සාක්කුවේ වූ චුවින්ගම් එකෙන් භාගයක් ඇය මුවට කඩවමිනි.

"අනේ එපා කිව්වම අහන්නකෝ" සඳරු කියද්දී ඇයගේ උරහිස වටා අත යැවූ නෙත්න කාන්තා ඇඳුම් ඇති තැනට ගොස් ඔහුගේ නෙතට ප්‍රිය වූ ඇඳුම් කිපයක් තේරුවේය.

"සඳු, මේ ෂෝට් ඩෙනිමක් ගන්න......... ඔයාගෙ සුදු කකුල් වලට ලස්සනයි........."

"අනේ......... මට බෑ......... ඕවා ගෙදර කොහෙ අඳින්නද?"

"ගෙදරට මොකටද අඳින්නේ......... මාත් එක්ක එහෙ මෙහෙ යන්නනේ........."

"හරි අපූරුයි......... මේවත් ඇඳගෙන ඔයත් එක්ක රෝන්දෙ ගහන්න ගියොත්......... එක දවසයි කරන්න වෙන්නේ"

"ඒකට කමක් නෑ සඳු......... අපි දෙකක් ගමු......... ඔයාගෙ කකුල් ලස්සන නිසා කොට්ට ඇන්දම ලස්සනයි"

"ඔයා මොකටද ඕවා බලන්න ගියේ........."

"අමුතුවෙන් බලන්න දෙයක් නෑ නිතරම පේන කොට......... ඒ උණට නුවර එළියෙදි තමා හිතුණේ" එසේ කියමින් සිනාසී ඔහු ඇසක් වසද්දී සඳරු ලජ්ජාවෙන් ඉවත බැලුවාය. තමාගේ අකමැත්ත තිබුණද නෙත්න ඔහුට ඕනෑ දේ ගන්නා නිසාම සඳරු නිහඬව සිටියාය.

කලිසම් දෙක සමග කොට සාය කිපයක්ද ඒවාට ගැළපෙන ටීෂර්ට් බ්ලවුස් ආදියද ගත් නෙත්න ඒ සියල්ලම බෑග්වල දමාගෙන සඳරු අතට භාගයක් දුන්නේය. අනතුරුව ඇය හා ඇඳුම් හලෙන් එළියට ආ නෙත්න,

"දැන් කොහේද යන්නේ.........?" යි ඇසුවේය.

"කොහේද......... යමු ගෙදර......... පරක්කු වෙනවා"

"තව කියද......... අටයි වෙලාව......... යමු කොහේ හරි......... කන්න........." එසේ කියූ නෙත්න සඳරු හා ගියේ ඔවුනට සුපුරුදු චයිනීස් අවන්හලටය. කෑම ඇනවුම් කොට සුළු වේලාවකින් ආහාර ගෙන එන ලදින් ඔවුහු ආහාර ගන්නට වූහ. නෙත්න සඳරු වෙතට මදක් පුටුව ගෙන,

"මම කවන්නද මගේ පිඟානෙන්" යනුවෙන් අසද්දී සඳරු එපා යැයි පැවසුවාය.

"ඒ මොකද........ මට කියලා කවාගන්න එක ඔයාට මදිකමක්ද?"

"එහෙම එකක් ද මම කියන්නේ........ අපි දෙන්නා මෙ නුවර ටවුන් එකේ මෙහෙම ඉන්න එක හරි නෑ. ඔයාව අඳුනන්නේ නැති කෙනෙක් ඉන්නවද මේ ටවුන් එකේ"

"ඉතිං අඳුනන අය ඉන්නවා කියලා අපට කන්න බොන්න බැරිද ........ මම වෙන අයක් එක්කත් ඇවිත් මේකට කෑම ගන්නේ?"

"ඒ එන කාටවත් කවන්න ගියේ නෑනේ"

"මට පිස්සුද?"

"ඉතිං ඒක තමයි කියන්නේ........ මට විතරක් එහෙම කරන කොට දකින අය හිතන්න ඕන දේ හිතලා ඉවරයි. ඒක නිසා"

"හරි කථා එපා........ කවන්න එපා කියලනේ කියන්නේ........ අපි යමු දැන්" නෙත්න හැන්ද පිඟානට දමමින් කීවේය.

"ඔය ඉතිං තද වෙනවා........ හරි ඉතිං කවන්න........"

"Good girl ........ ඔය තරම් බයවෙන්න එපා සඳු........ දැන් අපි හැංගිලා හිටියා ඇති........ දැන් මේ ප්‍රශ්නෙ අපි ගෙදරට කොහොම හරි කියන්න එපායැ........ අම්මිලා........ රොෂාන් අයියා දැනගන්න ඕන"

"එදාට ඉතිං මගේ ජීවිතේ නැතිකරගන්න තමා වෙන්නේ........"

"ඔයාට පුළුවන්ද මාව දාලා මැරෙන්න........" නෙත්න ඇසුවේ ඒ දෙනෙත දෙස බලමිනි. බොරුවක් කියන්නට දිව නොහැමුණු සඳරු හිස හෙම්හිට සෙලවූවාය.

"කොහෙන් හරි මොනවා හරි ප්‍රශ්න ටිකක් අනිවාර්යයෙන්ම එනවා........ ඒක එන්න ඕන........ ඒක ඇවිත් ඉවර උණාම තමා මේ ප්‍රශ්නෙ විසඳුනා වෙන්නේ. ඔයා බයවෙන්න එපා........ මම ඉන්නවා ඒ හැම ප්‍රශ්නයකදීම........ එකම දේ ඔයා හිත හයිය කරගෙන මේ ප්‍රශ්න වලට මුහුණ දෙන එක"

"ටවුන් එකේ ඉන්න ජනප්‍රියම බිස්නස් ෆැමිලි එකේ බාලයා එක්ක ඒ ගෙදරම දෙවෙනි ලේලි වෙන්ඩ සම්බන්ධයක් පවත්වනවා කියලා කතා කරවන්නද ඕන"

"ඇත්තටම නෑ........ ඊට කලින් අපි එකතු වෙන්න ඕන"

"ඇයි නෙත්න මේ ප්‍රශ්නෙ මේ තරම් සරලව ගන්නේ........ ඔයා ගිහින් රොෂාන්ගෙන් මාව ඉල්ලගන්නද........ මම ගිහින් රොෂාන්ගෙන් අහන්නද?"





"අපි බලමු දැන් කමු........" එසේ කියමින් නෙත්න ඇයටද හැන්දෙන් කෑම කවන අතරේ කථාකරමින් ඔහුද කෑවේය. මෙසේ නෙත්න සඳරුට කෑම කටක් කවන විට,

"නෙත්නයියා" යි කියනු ඇසී දෙදෙනාම හිස ඔසවා බැලුවෙන් එකවරම දුටු දසුනින් දෙදෙනාම තැති ගැනුණේ නිතැතිනි. නියති ඔවුන් ඉදිරිපිට තවත් කෙල්ලකු හා හිටගෙන සිටියාය. නියතිගේද දෙනෙත තමා දුටු දේ අදහාගන්නට බැරි පුදුමයෙන් මෙන් විවර වී තිබිණ........

නෙත්නටත් නියතිටත් වඩා වැඩි තැති ගැන්මක් ඇතුණේ සඳරුටය. කළයුතු දෙය කුමක්දැයි සිතා ගත නොහැකිව ඇය ප්‍රකම්පනයට පත්ව සිටියාය.

"නියති........ ඔයා කොහෙද මෙහෙ........" සුළු මොහොතකින් සාමාන්‍ය තත්ත්වයට පැමිණි නෙත්න ඇසුවේ සඳරු දෙස ද බලමිනි.

"ආ........ අපි........ මෙ........ ඩි........ ඩිනර්........ එකට ආවා" නියති කීවේ වරද කෙරුවේ තමා මෙන් බියපත් ස්වරයෙනි. ඇයට ඇයගේ දෙනෙත් අදහා ගත නොහැකි විය. කාලයක් තිස්සේ කල හොරා පොලිස් ක්‍රීඩාවේ නිමාව මෙය වේයැයි ඇයට සිතුණේ නැත........ ඇය සැක නොකළා නොවේ........ එහෙත් එහිදී නස්රිනා පෙරට ආවාය ........මන්ද මෙවැන්නක් සිදුවේතැයි අදහාගන්නට නොහැකිව සිටි බැවිනි. එහෙත් දැන් දැන් සත්‍යය යැයි යමක් තමාගේ දෙනෙත් ඉදිරිපිට වෙයි........

තමා වෙව්ලන්නට මෙන් වූයෙන් නියති මොහොතකට පුටුවේ ඇන්ද අල්ලා ගත්තාය. නළල පුරා දිව ගිය දූකේ වේදනාවේ රේඛාවක් නිසා ඇය නළල පිරිමැද හිසකෙස් මදක් ඇද ගත්තාය. තවත් මෙහි ඉන්නට ඇයට නොහැකි වූයෙන් ඇය,

"එක්ස්කියුස් මී........ මම යන්නම්" කියමින් මිතුරිය හා යන්නට ගියාය.

මේ සියල්ල මෙසේ සිදුවෙද්දී සඳරු පියවි සිහියෙන් බොහෝ ඈත් වූවා වැනි විය. නියති දුටුවේද යළි සිහි කරන්නට ඇය උත්සාහ කළාය........ නෙත්න තමාගේ උරහිස මත අත රඳවාගෙන තමාට කෑම කවනු ඇය දුටුව බව භයංකර සත්‍යයක් ලෙස ඇයට පිළිගන්නට සිදුවිණ........

අසුරු සැනකින් තමාගේ ලෝකය දෙදරා ගොස් ඇත. තමාගේ ප්‍රතිරූපය විනාශ වී ගොස් ඇත. මිනිහා මදි වෙලා මිනිහගෙ මල්ලී

ඒක ඇක්කෙත් නියතිම......... එයා රවටගෙන......... දෙයියනේ......... බඳින්න ඉන්න කෙනා මට කෑම කවනවා දැකලා මොනවා හිතෙන්න ඇද්ද......... අයියෝ මම දැන් ඒ ගෙදරට මොන විදියකින් යන්නද......... නියති ගිහින් දැන් සේරම කියාවි.........සේරම ඉවරයි......... එයින් පසු මේ ප්‍රශ්නය රොෂාන්ට ද යනු ඇත......... තම නිවසට යනු ඇත......... රොෂාන් තමාව දික්කසාද කරනු ඇත......... කසාදය කඩා ගෙන නිවසට යන තමා දුටු මව හතරට පැලී මිය යනු ඇත. ඒ විතරක්ද තම පවුලට වන ලජ්ජාව......... අවනම්බුව......... තමාගේ සොයුරියට පවා ඇය විවාහ වන දිනක මේ ප්‍රශ්නය ගැටලුවක්ම වනු ඇත.

මෙසේ සිතත් සිතත්ම ඇයගේ හිස හිත ගිනිගත්තා බඳු විය......... ඇය එක්වරම නැගිට්ටාය.

නියති තමන් දෙදෙන දැකීමෙන් නෙත්න මුලදී සසල වූ නමුදු මෙසේ සිදු විය යුතු බවත් අන් කාටත් වඩා ඇයම තමන් දෙදෙන මෙසේ දැකීම වඩා යහපත් බවත් ඔහුට වැටහිණ......... සඳරු දෙස බලද්දී ඇය බියපත් වූ විලාසයෙන් දෙනෙත් විසල් කොට ගෙන නියති ගිය දෙස බලා සිටිනු දුටු නෙත්න කෑම අතර මග නවතා පුටුවේ පිටුපසට හේත්තු වී දෙනෙත් පියා ගත්තේය.

ඒ මොහොතේ ඔහු අසල පුටුව පිටුපසට යනු ඇසී දෙනෙත් හැර බැලූ ඔහුට සඳරු නැගිට යන්නට හදනු පෙනිණ......... ඔහු කලබලකාරී ඇය දෙස බැලීය.........

"සඳූ......... ඔයා කොහේද යන්නේ.........?"

"මට යන්න ඕන........."

"ඉතිං......... යමු......... මාත් යනවා........." ඔහු නිවුණු හඬින් කියද්දී සඳරු ඔහු දෙස කෝපයෙන් බැලුවාය.

"වෙන්න තියන දේ උණාටත් පස්සෙ ඔයා එක්ක යන්න.........?......... ඔයාට මම කිව්වා මේ ටික වේවි කියලා......... දැන් ඉතිං කෝ......... එහාට වෙන්න මට යන්න ඕන........."

"ඉන්න බිල් එක පේ කරන කල්......... දෙන්නම යමු" එසේ කී ඔහු බිල ගේන්නට සේවකයාට කීවේය.

"ඔයාට විකාරද......... උණු දේ මදිද......... ඇයි මම ඔයා එක්ක යන්නේ......... තවත් ප්‍රශ්න ඇගන්නද......... පින්සිද්ධ වේවි නෙත්න......... මට යන්න දෙන්න........."





"මම කියන දේ අහන්න සඳූ......... ඔයා ඇයි ඔච්චර බයවෙලා......... උණු දේ උණා......... අපි බලමු ඊළඟට වෙන දේ........."

"ඊළඟට වෙන එක දේ නෙවි ගොඩ දේ බලා ඉන්න වේවි......... මම දැනගෙන හිටියා මේ දේ වෙන බව. මම ඔයාට කීවා......... ඒත් ඔයා ඇහුවෙ නෑ......... ඒත් අද පේනවද උණු දේ......... මේ හැම දේකින්ම මමයි අමාරුවෙ වැටෙන්නේ" සඳරු කීවේ තරහෙන් හා දුකෙන් මුහුණ රතු කොට ගෙන සිටගෙන සිටින අතරේය.

"සඳූ......... සඳූ......... ඔයා මොනවද මේ කථා කරන්නේ......... ඔයා කොහොමද ඔහොම කියන්නේ......... ඔයා අමාරුවෙ වැටෙන්න......... ඔයා අමාරුවේ වැටෙන්න ඇරලා මම නිකම් ඉන්නවද......... මම ඔයා එක්ක නෙවිද ඉන්නේ......... ඔයාට ආදරේ කළේ ඔයාව අමාරුවෙ දාන්නද?"

"එහෙම නොහිතුවත් අන්තිමට දැන් ඒක වෙලා ඉවරයි......... දැන් ඉතිං මේ හැම ප්‍රශ්නෙකටම මූණ දෙන්න ඕන ඔයා නෙවි මම......... තේරුණාද......... මම......... ඔයා ගෙදර කෙනා. ඔයාට අද ගෙදරින් බැන්නත්......... අද නියති තරහ උණත්......... හෙට ගෙදර හොඳ වෙනවා......... නියති උණත් ඔයා මැරි කරන්න බෑ කියන්නේ නෑ......... ඒත් ටිකක් හිතන්න......... මේ ප්‍රශ්නෙ නිසා මට මොකද උණේ......... මට නේද කැළල උණේ......... මගේ හොඳ නම නේද විනාශ උණේ........." සඳරු මදක් වේගයෙන් අසද්දී.

".........හෙමින් කතා කරන්න......... මේක පිට තැනක්......... අනිත් අය බලා ඉන්නවා......... අන්තිමට බලයි අපි දෙන්නා රංඩු වෙනවා කියලා"

"මට රට ලෝකෙ ගැන හිතන්න වෙලා නෑ......... මගේ ප්‍රශ්නෙ මම හිතන්නේ........."

"ඔච්චර කේන්ති අරන් ආත්මාර්ථකාමී විදියට හිතන්න එපා සඳූ......... ප්‍රශ්නයක් නම් දෙන්නටම එකයි. මොකද ඔයා පිළිගන්නෙ නැති උණාට මම ඔයා එක්කයි" එසේ කියමින් නෙත්න වේටර්වරයා ගෙනා බිල වෙනුවෙන් මුදල් ගෙවීය.

"දැන් මේවා කථා කරලා වැඩක් නෑ......... මම යනවා"

"ඔහොම ඉන්න........, එකට ඇතුළට ආවා නම් එකට එළියට යමු......... පිස්සි වගේ කඩාගෙන දුවන්නෙ නැතුව" එසේ කී නෙත්න ඇයගේ අතින් අල්ලා ගත්තේය.

"කරුණාකරලා අතාරින්න මාව........ තවත් මෙතන මට වද නොදී........ තවත් රටේ ලෝකෙ අයව හිනස්සන්න නැතිව"

"මම නෙවි මෝඩියෙ මිනිස්සු හිනස්සන්න හදන්නේ ඔයා........ මෙතන විනාශ කරලා........ යමු ඔන්න ඔහොම එළියට යමු........ වාහනේට ගිහින් ඕන එකක්" එසේ කී නෙත්න සඳරුගේ අත අල්ලාගෙන බොජුන් හලෙන් පිට විය. එළියට ආ විගසම සඳරු නෙත්නගෙන් අත මුදා ගත්තාය.

"මම එන්නම් ටැක්සියක........ ඔයා යන්න........"

"පිස්සු කරන්න එපා දරුවො........ අපි යමු........ ගිහින් ගෙදර ප්‍රශ්න නම් අපි යමු යන්න කොහේ හරි. මටත් බෑ තවත් ඔයා නැතිව ඉන්න........" එසේ කියමින් නෙත්න ඇයගේ අතින් ඇල්ලීය.

"මේ........ නෙත්න........ එහෙනම් මම කියන දේ අහගන්න........ ඔයාගෙ ඔළුවෙ තියන ඔය සුරංගනා හීන මේ ලෝකෙට ප්‍රායෝගික නෑ........ හීන වල ජීවත් වෙන්න බෑ........ පය ගහන්න පොළවේ........ එතකොට පෙනේවි ඇත්ත........ අපි කාට හරි ආදරෙයි කියලා........ අපිට ඕන හැම දේම වෙනස් කරන්න බෑ එයාව ලබා ගන්න........ කරුණාකරලා මා ගැන තියෙන අදහස අතාරින්න........ මේ කෙහෙල්මල් සම්බන්ධෙ නවත්වන්න........ ඔයත් පාඩුවෙ ඉන්න........ මටත් පාඩුවෙ ඉන්න දෙන්න........" එසේ කියා සඳරු නෙත්නගේ අත ගසා දමා යන්නට යද්දී නෙත්න වහා ගොස් ඇයව නැවැත්වීය.

"කරුණාකරලා මේ අහන්න සඳූ........ ඔහොම අපිට බෑ මේ ප්‍රශ්නෙ විසඳගන්න........ අපි තරහ ගත්තා කියලා ප්‍රශ්නෙ විසඳෙනවද ........?"

"ප්‍රශ්නෙ........ මොකක්ද ප්‍රශ්නෙ........ ඔයා මාව අයිතිකරගන්න එකද........ මේ........ නෙත්න, දවල් හීන බලන්න එපා........ මේ ආදරේ........ අපිව නිකං අවුලෙන් අවුලට දානවා විතරයි........ ඒක නිසා මේ මල කෙහෙල්මල හිතෙන් අයින් කරන්න........ මම ඔයාට හැමදාම කිව්වා........ අදත් කියන්නේ මිරිගුව පස්සෙ දුවන්න එපා........ ඒක ඇත්ත නෙවි........"

"සඳූ........ සඳූ........ මේ අහන්න බබා ඔයා කඳුළු පිහිදගන්න මිනිස්සු බලනවා........ අනෙක කෑ ගහන්න එපා........ මොකක්ද මේ මෙච්චර කෑ ගහන්නේ........ මම දන්නවා දැන් ඔයා ඉන්න මානසික මට්ටම........ ඒත් ඔය තරම් කලබල වෙන්න එපා" ඔහු කීවේ ඇය අතින් අල්ලා ගනිමිනි.





"අතාරින්න මාව........ මට යන්න ඕන........"

"පිස්සුද........ තනියම යන්න දෙන්න බෑ ඔයාට........, යමු දෙ........" නෙත්න එසේ කියමින් ඇයගේ අතින් අල්ලා අදිත්ම නෙත්න වදන් නිමා කරන්නටත් පෙර ඔහුගේ කම්මුලට ගැසූ සඳරු ඔහුගෙන් අත මුදා ගත්තාය.

නෙත්නගේ ලෝකය හිටි හැටියේම නතර වූවා වැනි විය. ඇය තමාගේ කම්මුලට ගැසුවාය........ එය රැව් පිළිරැව් දෙමින් යළි යළිත් ඇසෙන්නාසේ වෙද්දී නෙත්න තම ආවේග මැඩ ගන්නට මෙන් අතේ ඇඟිලි ගුලිකොට ගෙන තම හැඟීම් මහා හුස්මක් ගෙන දරාගත්තා. ඇය දෙස තවත් එක් වරක් හෝ නොබලා හැරී ගොස් වාහනයට නැංගේය. රථය පනගන්වාගත් ඔහු ඇය දෙස වරක් හෝ නොබලා යන්නට ගියේය.

සඳරු........ තමාගේ ආවේශයෙන් මිදුණේ ඒ මොහොතේය........ තමා කළේ කුමක්දැයි ඇයටම තේරුම් ගියේ වාහනය පිටත් වී යද්දීය.

........දෙයියනේ........ මම ඒ කළේ මොකක්ද........ එයාගෙ කම්මුලට ගැහුවා........ මට හිතාගන්නවත් බෑ........ මම එහෙම කළාද........ එයා ගියා........ එයා යන්න ගියා........ දැන්........? ඇය එතැන වූ බංකුවේ වාඩි වී දෑතින් මුහුණ වසා ගත්තාය. එහෙත් තමා සිටින තැන එක්වරම සිහි වූයෙන් ඇය හිස එසවූවාය. ඒ මොහොතේද කවුදෝ මිනිසෙකු එතැන කැරකෙනු දුටු සඳරු මෙතන සිටීම කරදර ගොඩක ආරම්භය විය හැකි බව දැන පාරට ආවාය. ඒ මිනිසාද ඇය පසු පසම වාගේ ආවේය. බියට පත් ඇය වහාම කුලී කාරයක් පාරේ යමින් තිබෙනු දැක එයට අත ඇමූවෙන් එය ඇය අසල නතර කළේය. වහාම එයට ගොඩ වූ ඇය දොර වසා ගත්තාය.

"කොහේටද මිස්........?"

"පේරාදෙණියට........" එසේ කී ඇය දෙනෙත් පියා ගත්තාය. එහෙත් තමා මේ පේරාදෙණියට යන්නේ ඇයිදැයි ඇය සිතුවාය. ඒත් තමාගේ සිත සමහන් වීමට කාලය අවශ්‍යය. සිතීමට කාලය අවශ්‍යය........ මේ රෑ හුදකලාවේ කොහේවත් තනිව සිටිය නොහැක. සිටිනවා නම් නිවසට යා යුතුය........ එහෙත් දැන් එහේ මොනවා වී ඇද්ද........ නියති දැන් ගේ දෙවනත් කරමින් හඬනවා ඇත........ නෙත්නද සමහරවිට යන්නට ඇත. දැන් ඉතිං සැවොම බලා ඇත්තේ තමා එනතුරු විය යුතුය........ අද රාත්‍රිය එම නිවසේ අවසන් රාත්‍රිය

වනු ඇත......... හෙට උදේ......... හෙට එළිවෙන්නේ තමාට අමුතුම ජීවිතයක් රැගෙනය. විවාහය......... නමට පමණක් වුව තිබෙන මේ විවාහය......... කඩා බිඳ දමන්නට රොෂාන් ආසාවෙන් සිටින මේ විවාහය කඩා බිඳ දමන්නට හොඳ හේතුවක් වනු ඇත......... හේතුවක් නොව මහා පත චෝදනාවක් ඇත......... පිට කෙනෙක් නොව ඔහුගේම මල්ලී සමග අනියම් සබඳකමක් පැවැත්වීමේ හේතුවෙන් අපචාරයේ හැසිරීම හේතුවෙන් ඔහු නඩු දමනු ඇත......... සාක්ෂි ලෙස නියති ඉදිරිපත් වනු ඇත.

තමා හා විවාහ වීමට සිටි තරුණයා රවටාගෙන අනියම් සබඳකමක් පවත්වාගෙන ගිය බවට ඇය උසාවියේදී කියනු ඇත......... නරක නාමය......... නරක ගැහැනියක ලෙස දික්කසාදයද රැගෙන හැමෝගෙම සමච්චල් සිනා මැද තමාට උසාවි භූමියෙන් පිටව එන්නට සිදුවනු ඇත......... එහි බලා සිටින අම්මා......... තාත්තා......... නංගී......... මල්ලී......... තමා දෙස බලමින් හඬනු ඇත.

පුංචි කාලයේ සිට ගමේ හොඳ නමක් තියාගෙන තමා රැගෙන ආ ජීවිතය. පුංචි පන්තියේ සිට අධ්‍යාපන කටයුතු නිමකොට ලබාගත් සරසවි ජීවිතය......... මේ සියල්ලටම නිමාවක් තියන්නට සිදුවනු ඇත. මන්ද මෙතනින් එහාට කිසිවෙකුගේ මුහුණ බැලීමට සුදුසුකමක් තමාට නොලැබෙනු ඇති බැවිනි.........

සියල්ල ඇන ඇනත් තමා නෙත්නට ආදරය කළේ ඇයි......... ආදරය නම් ඇති උණාමය. එහෙත් ඒ කිසිත් නො අඟවා ඉන්නට තමාට හැකියාව තිබුණේද......... තමාගේ තත්ත්වයේ සිටිනා කෙනෙකුට ආදරය අකැපය......... මන්ද තමා විවාහක කාන්තාවකි. නෙත්න හැරෙන්නට අන් කිසිදු පිරිමියෙකුගේ පහස මෙතෙක් කාලයකට නොදැනී නොතිබුණද ලෝකයා දන්නේ තමා රොෂාන්ගේ බිරිඳ බවය. ඔහු හා පවුල් ජීවිතයක් ගෙවන බවය. අද වන තෙක් රොෂාන් හා තමා එකම කාමරයේ එකම ඇඳ දෙකෙළවරේ නිදාගන්නා බව......... තමා කන්‍යාවියක බව කිසිවෙකු දන්නේ නැත. අඩුම තරමේ නෙත්න පවා දන්නේ නැත. ඔහු එය නොදැන සිටීම කෙතරම් හොඳද? තමා ඔහුට එය කිසි දිනක නොකිවේ එසේ කීවානම් ඔහුගේ බලපෑම තවත් වැඩිවන බව දන්නා බැවිනි.

අද වන විට ඔහු එය දැන සිටියා නම් මෙ වැනි අවස්ථාවක වුව ඔහු තමාට බල කරනු ඇත. නියති හා ද විවාහ නොවී තමා ම පතනු ඇත. එහෙත් දැන් එසේ නොවේ. ඔහු මේ කිසිත් නොදත් නිසාම





ගෙදර බලපෑම යටතේ ඔහු හිත හදාගනු ඇත......... ටික දිනකින් සිදුවන ඔහුගේ විවාහය ඔහුගෙ හිත හදනු ඇත......... ඔහුගේ ආදරය ලෝකයටම රහසේ හදවතේ නිදන්කොට ගෙන මැරෙන තුරුම ඉන්නට තමාට එවිට හැක......... මන්ද ඒ ආදරය සෙනෙහස කිසිවිටෙක අමතක කළ නොහැකි බැවිනි. හමු වූයේ ළංවූයේ කෙටි කාලයකට වුවද ඔහු තුළ වූ ආදරය තමාව අලුත් ලෝකයකට කැඳවා නම් ගියාමය. එය බොරුවක් යැයි කීමට තමාට නොහැක. එහෙත් මේ ලෝකයා දොස් කියන සම්බන්ධයෙන් ඔහු මුදා හැරිය යුතුය......... ඔහුට ඔහුගේ ජීවිතයක් ගත කිරීමට ඉඩ සැලසිය යුතුය. තමා සදහටම......... සදහටම ඔහුගෙන් ඈත්විය යුතුය......... දෛවයෙන් තමා ලද ජීවිතයක් වේ......... හරි වුව වැරදි වුව එය භාර ගත යුතුවේ......... උරුමය කරුමයක් වුව අරුමයකට මෙන් මේ ජීවිතයම විඳවිය යුතුයැයි තමාගේ සිතම බලකොට කියන නිසා......... මේ ජීවිතය භාරගත්තා සේ ඉදිරියට ගෙන යා යුතුය. තමා නිසා ලෝකය කණපිට පෙරලිය යුතු නොවේ.........

"මිස් පේරාදෙණියට ආවා......... එතැනින් කොහේටද?" රියදුරා අසද්දී යළි කල්පනා ලොවින් මිදුන සඳරු වටපිට බැලුවාය......... දැන් ඉතිං......... යන්නට අතක් නැත......... රැය පුරා කුලී රථයේ නැගී රවුම් ගැසුවද කොයි යම් හෝ මොහොතක මේ සත්‍යයට මුහුණ දීමට වනු ඇත......... ඒනිසා අලුත් පිටම ආවේගය පිටම එයට මුහුණ දීමෙන් තීරණ ගැනීමට ශක්තිය ලැබෙනු ඇත.........

"ඩ්‍රයිවර් මහත්තයා මට පොඩ්ඩක් වැරදුණා......... මට යන්න ඕන කුන්ඩසාලෙට......... මේ හරියෙද කුන්ඩසාලේ" ඇය නොදන්නා බවක් පෑවාය.

"නෑ මිස් ටවුමට ගිහින් අනෙක් අතට යන්න ඕන......... මට පේන්නෙ මිස් මෙහෙට අලුත් වගේ"

"ඔව් මම අනුරාධපුරේ......... මෙහෙ යාලුවෙකුගෙ ගෙදර යනවා........."

"කොහෙද මිස් කුන්ඩසාලේ.........?"

"අර වික්‍රමසේකර ගෲප් කම්පැනි එකේ ඕනර් ගෙ ගෙදර"

"ආ එහෙද......... මුලින් කිවා නම් මම බස්සවනවනේ මිස්......... යමු......... මම දන්නවා ගේ........." එසේ කී රියදුරා රථය හරවා ගත්තේය.

සඳරුට පළමු වතාවට නෙත්න සිහිපත් විය......... හරි පුදුමයි......... ඒයාට මොනවා උණාද කියලාවත් මට සිහියට ආවෙ නෑ......... ඔහු

මෙ වැඩ කරන හැටි වැරදිද......... මම යන්නෙ හරි පාරෙ නෙවිද......... අනේ දෙවියනේ මට හරි පාර පෙන්නන්න......... නෙත්නගෙන් මම ඈත් වෙන්නෙ හිතකින් නොවේ......... ඒත් හදවතයි මොළෙයි එකට ගමන් කරන්න බෑ......... හදවතට ඉඩ දුන්නොත් මොළේ පරාද වෙලා ප්‍රශ්න ගොඩක් ඇති වෙනවා......... මෙකෙන් දුක් විඳින්නේ මම විතරයි......... මගේ හදවත විතරයි. ඒත්......... මගේ හිත සනසන්න ගියොත් තව ගොඩක් අය අඬනවා......... මට මෙහෙම හරි හිත හදාගෙන ජීවත් වෙන්න ගෙදර වාතාවරණයක් තියේද......... හෙට උදේම මට යන්න වේවි......... කට්ටියම බලා ඇත්තෙ මම එනකල්.........
නෙත්නත් සමහරවිට ගෙදර ගිහින් ඇති.........

ඈත සිටම නිවස දෙස බලාගෙන පැමිණි සඳරු රථය නතර කළ පසු මුදල් ගෙවා පැමිණ ආරක්ෂක නිලධාරියාට කථා කළෙන් ඔහු පැමිණ කුඩා දොර විවෘත කළේය.

"පුංචි නෝනා......... තනියම........."

"ඔව් ජයලත්......... මම ටැක්සියක ආවේ......... ඒක නෙවි ගෙදර සේරම ඉන්නවද?"

"ඔව් නෝනා ඇයි.........?"

"නෑ මම. නිකම් ඇහුවේ........." එසේ කියූ සඳරු......... බියෙන් ගැහෙමින් හෙමි හෙමිහිට ගෙතුළට ගියාය. තමාගේම ඩේලියා පාත්ති අද්දරින් ගමන් කරද්දී ඇයගේ හදවතට මහා බරක් සේ දැණුනේය. මේ සියල්ල දමා දැන් ඉතිං තමා යා යුතු බැවිනි.........

ගල් බොරලු දිගේ හෙමිහිට ඇවිද ගිය ඇය උඩ තට්ටුව දෙස බැලුවද එහි ආලෝකය නොවීය......... ඇයගේ හදවත ගැහුණේ ළඟ සිටියෙකුට ඇහෙන තරම් වේගයකිනි......... සියල්ලෝම ඇත්තේ සාලයේය......... තමා එන තුරු බලා සිටිනවා විය යුතුය......... ආ වේගය දොරකඩදී තවත් බාල වී ගියේ ඇයටද නොදැනිමය......... හෙමිහිට පෝටිකෝව යටට ගිය ඇය ගෙතුළට ගොඩ වූයේ ගැහෙන හදිනි......... බිය සන්ත්‍රාසය උපරිම ලෙස ඇය හදේ පිරිණි.........

"ආ......... සඳරු.........ආවද.........?" රසාංග ඇය එනු දැක කියද්දී සඳරුගේ දෙනෙත් පුළුල් විය. රසාංග අසද්දී රූපවාහිනිය නරඹමින් උන් අය ඇය දෙස හැරී බැලුවෝය.........

"සඳී......... අන්න අම්මි ඔයාට කාමරේට එන්න කිව්වා" රිද්මි කියද්දී සඳරු වෙව්ලා ගියාය. හරි දැන් මේ සූදානම වන්නේ තමා





තනිකොට ගෙන මෙය විමසීමටය. දැන් ඉතිං මුහුණු දෙනු මිස ගැලවීමක් නැත......... ඇය හෙමිහිට පහළ මාලයේ වූ මවගේ කාමරයට ගියාය.........

කාමරයට ඇතුල් වන්ම දුටු දසුනින් ඇයගේ සකල ශරීරයම වෙව්ලා ගියාය......... නියති සිටියේ හඬමිනි......... මව ඇයට කුමක් හෝ කියමින් සිටියාය. පොත් ගොන්න දැතට තද කර ගත් සඳරු පියවර මනිමින් බිම බලාගෙන මව වෙත ගියාය.

"අම්.........මි.........ම.........මට එන්න කිවද.........?" සඳරු ඇසුවේ නියති දෙස බලමින් අසමින් ගොත ගසමිනි. ඇය දෙස බැලූ නියති බිම බලා ගත්තාය......... සඳරු ඊළඟ අවස්ථාවට සූදානම් වූවාය.

"ආ......... ඔයා එන ගමන්ම ආවද......... මොකෝද ආවේ......... අද කා එක ගියේ නැනේ. රිද්මි නෙත්නට කෝල් කලා මහිතේ ඔයාව ගේන්න........." මව තුනටිය අල්ලාගෙන නැගිට්ටින්නට හදමින් අසද්දී සඳරුගේ දෙපා හිරිවැටී ගියාය. නියති තමා දෙස බලනු දුටුවද සඳරු ඇයගේ බැල්ම මඟහැරියාය.

"අම්.........මි.........ඒ.........එන්.........න.........කී.........මෙ?"

"ඔයාට කියලා බාම් ටිකක් වත් ගාවගන්න......... මට නැගිට්ටින්නත් අමාරුයි. මෙන්න මේ උඩ රාක්කෙ තිබ්බව් පෙට්ටියක් ගන්න ගිහින් කොන්ද ඇවිළුණා........." මව කියද්දී සඳරු ඇය වෙත යමින්.

"අ.........මී......... නැගිට්ටින්න.........එපා.........ඉන්න මම දැන් ගාන්නම්........." කියමින් පොත් බෑගය පසෙක තබා ඇයව යලි ඇළ කරද්දී ඇය අසල මෙතෙක් වේලා වාඩි වී හුන් නියති එක්වරම නැගිට යන්නට ගියාය. සඳරු ඇය දෙස බැලුවේ කිව නොහැකි තරම් අවිහිංසක බැල්මකි. කෘතඥතාපූර්වක බැල්මකි. එහෙත් ඇයව ගනනකට හෝ නොගත් නියති ගස්සාගෙන යන්නට ගියාය. සඳරුගේ හදවත මදක් ඉහිල්ව ස්පන්දනය වීමට ගත්තේ ඒ මොහොතේය.........

බාම් එක රැගෙන සඳරු ඇඳ අසල දණ ගසද්දී හැරී බැලූ මව,

"ආ......... කෝ නියති ගියාද?" යි ඇසුවාය

"ඔ......... ව්"

"අද මොනා හරි දේකට දෙන්නා තරහ වෙලා වගේ......... හෙටම ඇමරිකා යන්න ඕන කියලා අඬනවා. අනේ මන්දා පුංචි එකෙක් වගේ" මව කියද්දී සඳරුගේ දෙපා සිට හිස දක්වා හිරි වැටී ගියාය. තව දුරටත් කථා කළ මව,

"අපේ නෙත්නටත් වෙඩින් එක ගමු කීවාම ගාතක් වත් නෑ......... සෙල්ලමේ ඉන්නවා......... මේ ළමයටත් දැන් බලා ඉඳලා කම්මැලි

ඇති......... එයා ඉතිං ආවෙත් මෙහෙ ඉක්මනට මැරි කරයි කියලා හිතාගෙන වෙන්න ඇතිනේ......... ඇමරිකාවෙදි එකටම ඉඳපු නිසාද මන්දා නෙත්ත දැන් ටිකක් දුරින් ඉන්න හදනවා......... එයාට මෙහෙදි ලජ්ජා වගේ ඇති......... ගෙදර කට්ටිය නිසා......... ඊත් නියතිට ඒක පුරුදු නැතේ......... පොඩ්ඩ ඇත්තම් තරහ වෙනවා අඬනවා........."

මට කියද්දී සඳරු ගල් ගැසුණාසේ අසා සිටියාය.

"අද මොකක් හරි ලොකු දෙයක් වෙලා......... කාමරේට ආවේ නෑ ගහලා අඬාගෙන......... තාත්තිට කෝල් කරලා ටිකට් හදවන්න කියලා......... ඉන්න බෑ කියනවා......... හේතුව ඇහුවම කියන්නේ නෑ......... දැන් ඉතිං ඉඳියි දෙන්නා එක්ක දවස් දෙක තුනක් තරහ වෙලා........." මට සිනාසෙමින් කියද්දී සඳරු කථාකරන්නට උත්සාහ කළේ නොකළොත් මට සැක සිතන බැවිනි.

"මම කථා කරන්නම් නියතිට........." ඇය බිඳුණු හඬ සඟවාගෙන කීවාය.........

"අනේ මට සදී......... අහිංසක කෙල්ල.........දැන් ඉතිං ඔය වෙනදා වගේ එළියෙ වත් වැඩිපුර යන්නෙ නෑ නෙත්ත කැමති නෑ කියපු නිසාද කොහේ. එයාට හිතෙනවා ඇති තනිවෙලා කියලා......... ඔයාවත් ඔන්න ටිකක් කියන්න......... දැන් ඇති දරුවො ඔයා යන්න........."

"ආයෙ මම උදේට ගාත්නම් අම්මි........."



# 28

නෙත්ත රථය පදවාගෙන ගියේය......... යා යුතු අතක් නොදත්තද යාමට ඔහු සිත කීවේය. මේ සෙංකඩගල අහස යට තව දුරටත් තම ලෝකය නැති බව එය නැති වී විනාශ වී ගිය බව ඔහුට වැටහිණ......... තමාටද උරුමයක් තිබෙයයි ඔහු පෙරදී තනිවම රහසේ සතුටු විය......... ඔහුට මුළු අතීතයම සිහිපත් විය. ඇය හා බැඳී ගිය ආදරණීය......... අනුස්මරණීය සිහි වටන......... ඇය තමා හා මුලින්ම හමු වූ මොහොත ......... පිපුණු ඩේලියා යාය සොඳුරු වූයේ සඳරු නිසාවෙනැයි එදා තමාට සිතුණ හැටි......... ඇය තමා දැක බියපත් වූ තරම්......... ඇය නැඳවා ඒමට ගොස් කෝපි බිවු හැටි......... බියේ ගැහෙමින් ඇය සිටි අයුරු......... උඩුමහලේ වූ සිදුවීම තමා ඇයගේ කම්මුලට ගැසූ අයුරු ......... නෙත්තට එක්වරම ඔහුගේ කම්මුලට අත ගියේය. එය තාමත් පුපුරු ගසනවාද......... තමාට එසේ දැනෙනවාද......... තමා එසේ ගසන්න තරම් ඇයට ශක්තියක්......... ආවේ කොහෙන්ද......... තවත් ඉතිං නම් ඇයගේ මුහුණ බැලීමට තමාට උවමනා නැත......... තමා මේ කම්මුල් පහර කෑවේ එකම එක වරදකටය......... ඇයට ආදරය කළ වරදටය.........

සැබැවටම එය වරදක්ද......... තමාගේ සිත ගිය ගැහැනියකට ආදරය කිරීමෙ ආදරය ප්‍රකාශ කිරීමේ අයිතියක් නැද්ද......... ඇය රොෂාන්ගේ බිරිඳ වූවාට තමා පළිද......... තමා දන්නේ සඳරු රණසිංහ නම් යුවතියට තමා ආදරය කරන බව පමණය......... තමා එය පළකරන්නට තෝරා ගත් මග වැරදිද......... ආදරේ නම් ආදරයෙන් මිස බලහත්කාරයෙන් ප්‍රකාශ කළ හැකි නොවේ......... ඒ නිසාම ඔහු ඇයට ආදරය පෑවේය. ඇය පවා අන්දමන්ද වී කිසිවක් සිතාගත නොහැකි තත්ත්වයට පත් වන තුරු ඔහු ඇයට ආදරේ බව නොයෙක් ක්‍රම වලින් හුවා දැක්වූයේය. අවසානයේ ඇය ද ඒ ආදරයට නිරායාසයෙන්ම අනුගතව ඇති බව ඔහුට වැටහිණ. එසේ අනුගත වුවද සිටි තැනින්......... ඇය වටා වූ ප්‍රාකාරය බිඳ සීමා මායිම් බිඳ

මෙපිට ලෝකයට එන්නට ඇය කිසිදිනෙක......... අඩුම වශයෙන් සිහිනෙන් හෝ සිතා නොතිබිණ. තමා ඒ ගැන කියද්දී විරුද්ධත්වය පෑ ඇය එය සරදමක් ලෙස දුටුවාය. සෙනෙහස ඇනෙද්දී සෙනෙහසට සෙනෙහස පුදකලා මිස එසේ නැත්නම් තමාගේ ආදරය නිහඬව ඉවසුවා මිස දෙවන තීරණයක්......... දෙවන පියවරක් ගැන ඇය සිතා හෝ තිබී නැත.

ඒනිසාම තමා ගත් සියලු උත්සාහය වතුරේ ගිය වග......... ව්‍යර්ථ වූ බව නෙත්තට වැටහිණ.........

“ඒකී......... මට ආදරේ කරලා නෑ......... මාව රැවැට්ටුවා......... මාව විනාශ කළා......... සඳරූ......... උඹ මාව විනාශ කළා.........” මෙසේ සිතත් සිතත්ම නෙත්තගේ කෝපය දුක ආවේගය සිය දහස් ගුණයකින් වැඩි වී ගියේය......... ඔහුට මේ ලෝකයෙන් සදහටම සමුගැනීමේ සිතක් පහළ විය......... කොහේ හෝ දුර ඈතකට......... යාපනයට හෝ පලායාමේ සිතක් පහළ විය......... ඔහු රථය පදවාගෙන ඔහේ යන්නට ගියේය......... රථයේ වේගය අසූව සියය එකසිය විස්ස ඉක්මවා ගියේය. අතර මගදී විස්කි බෝතල් කිපයක්ම ගත් නෙත්ත වාහනය මග අයිනක නවතා හොඳහැටි බීවේය. අතීතය සිහිව එද්දී ඔහුට නැග එන රුදුරු වේදනාව ඔහුගේ හදවතට මහා බරක් විය.

“සඳරූ......... ඔයා ඇයි එහෙම කළේ......... ඇයි මට මේ දුක දුන්නේ......... මාව මේ තරමටම ඔයාගෙ ජීවිතේට අවැදගත් කෙනෙක්ද......... ඒත් මට පුළුවන්ද......... ඔයා නැතුව ඉන්න......... මට බෑ......... මට බෑ......... මට මගේ හුස්ම නැතුව ජීවත් වෙන්න පුළුවන්ද......... ඒ වගේම මට ඔයා නැතුවත් ජීවත් වෙන්න බෑ......... මට බැරි උණා......... ඒත් ඒ මගේ අහිංසක කමට ඒ මගේ ආදරේට......... ඔයා අද මට ලොකු තෑග්ගක් දුන්නා......... ආයෙ මම ඔයාට කරදර කරන්නේ නෑ......... ඔයාට මා ළඟට එන්න බැරි තරමට ඔය ජීවිතේ හොඳ නම් ඇයි දුකෙන් හිටියේ......... ඇයි දුක විත්තිය පෙන්නුවෙ......... ඔයා දුකෙන් ඉද්දි මගේ ආදරේ හිතයට හංගගෙන ඉන්න මට බැරි උණේ ඒකයි......... කාගෙ හරි ආදරයක් ඔයාගෙ හිතට ඕන වෙලාවෙ ඔයා අසරණ වෙලා ඉන්න හැටි මට බලා ඉන්න බැරි උණේ ඒකයි.........

මම ඔයාට ආදරේ කරපු එක වරදක් වෙන්න ඇති......... ඒත් මට මේ ආදරේ ආපහු ගන්න බෑ......... මොකද කොච්චර ආදරයක් මම





ඔයාට දීලද කියලා මම වත් දන්නෙ නැති නිසා......... ඒත් මම අදින් මත්තට ඔයාට කරදරයක් වෙන්නෙ නෑ......... අපි හමු උණේ නෑ......... අපි කථා කළේ නෑ......... අපි ආදරේ කළේ නෑ කියලා හිතන්න මම මගේ හිත මට්ටු කරගන්නම්......... මටම ඇති තරම් වද දෙන්නම්......... ඔයාට සතුටෙන් ඉන්න පුළුවන් නම් මම ඕන දෙයක් කරන්නම්......... හිත හදාගෙන ඔයාට ඔය ගෙදර ඉන්න මම සදහටම යන්නම්.........”

ඔහු මෙසේ තනිවම කියමින් හඬමින් දිගටම බීවේය......... එතැන සිටීම එපා වූ තැන යළි රථයට නැගුණ ඔහු යළිත් එය පදවාගෙන යන්නට විය......... රාත්‍රී වේලාව දෙකයි තිහද පසු වී ඇති නිසා පාරේ ගමන් කළේ කලාතුරකින් වාහනයකි. ඔහු පුරුද්දට මෙන් වාහනය පදවාගෙන ගියේ අනුරාධපුරය දෙසටය. රජරට කලාපයට ඇතුලුවද්දීම ඔහුට එකින් එක ගලා ආවේ ඇය ගැන මතකයයි......... ඒවා සිහිපත්වත් වත්ම ඔහු වඩ වඩාත් වේගයෙන් රථය පදවන්නට විය......... අනුරාධපුර නගරයම නිදාගෙන ඇති මේ පාලු රාත්‍රියේ නගරයට රහසේ නෙත්ත නගරයේ මාවත දිගේ ගමන් කළේ අනුරාධපුරය පසු කරමිනි. එළිවෙන්නට ඉතිරි හෝරා දෙක තුනේ හරි බැරි ගැහී ලෝකයා තද නින්දේ පසුවෙද්දී වෙරි මත මිස නිදිමත අසලක නැති නෙත්ත රථය පදවාගෙන ගියේ අරමුණක් නැතිවය. ඔහු මෙසේ බොහෝ දුරක් පසු කොට එළිවන විට මැදවච්චිය දක්වා රිය පදවාගෙන ගොස් තිබිණ. මැදවච්චිය නගරයට පෙර හමුවන එක්තරා විශාල වෙල්යායක් අසල ඔහු රථය නතර කළේ ගමන් වෙහෙස නිසාමය. ගමට හිරු උදා වී එද්දී ගම අවදි වෙද්දී වෙල් යායට වතුර බෙදා දෙන ඇලක් දුටු නෙත්ත ඒ අසල රථය නතර කොට පිටතට ආවේ අධික තෙහෙට්ටුවෙනි. ගමන් වෙහෙස කුසගින්න නිදිමත හා වෙරිමත එකලෙස ඔහු වීඩාපත් කොට තිබිණ......... ඇල හරහා බැඳී පාලම උඩට පැමිණි ඔහු අතවූ මත්පැන් බෝතලය ගෙන ඉන් සෑහෙන ප්‍රමාණයක් බීගෙන බීගෙන ගියේ ඔහුට වමනයට මෙන් දැනෙන්නට වූ බැවිනි. බෝතලය අතැතිවම යකඩ පාලම මත වාඩි වූ ඔහු බීමට හැරී ඇල දෙස බැලුවේය. එය නිසලය. වෙල්යාය පිස එන සුළඟ ඔහුගේ නිදිමතට යකඩ පාලම සුව යහනක් කළා සේ විය. කකුල් දෙක ගෙන හම්බරව තබාගන්නට වෙහෙස ගනිමින් ඔහු පාලමේ කනුවකට පිටදී මොහොතකට දෙනෙත් පියා ගත්තේය.

උදෑසන වන විටද නෙත්ත නිවසට පැමිණ නොතිබීම නිසා වික්‍රමසේකර නිවැසියන් ඇඩි කලබලයට පත්වූහ. ඔහුට කථා කරන්නට හැමදෙනම එළිවනතුරු උත්සාහ කළද දුරකතනය වසා දමා තිබිණ........ මෙයින් හැම දෙනාටම වඩා බියගත්තේ සඳරුය. මන්ද සත්‍යය විස්තරය දන්නේ ඇය බැවිනි........ තමා හා තරහට මීට පෙර ඔහු සිදු කරගත් රිය අනතුරු ඇයට සිහිවිය. ගිම්හාන හා කථා කරනු දැක එළිවෙන තෙක් මත්පැන් බොමින් වැවරවුමේ ඔහු ගත කළ අයුරු සිහි විය. අද ඔහුට එහෙ දෙයක් සිදුවීමට අවකාශ ඇත. මන්ද තමා ඔහුට එතරමම දඬුවමක් දුන් බැවිනි. කිසිදු අතවරයක් නොකළ........ ඒ ගැන සිහිනයකින් හෝ නොසිතූ තමා තනිව යනවාට විරුද්ධව තමාව අල්ලාගත් අහිංසකයාට තමා සැලකූ හැටි........ ඔහු තමාට ආදරය කරන තරම තමාට පවා සිතා ගත නොහැකිය. එවන් වූ සෙනෙහසකට තමා සැලකූ හැටි අපූරු ය........ අද ඔහු කොහේ ද? ඔහුට කරදරයක්ද........ ගෙවී ගිය රාත්‍රිය නිදිවර්ජිතව ගත කළ බැවින්ද හඬා වැළපුන බැවින්ද සඳරුට ඇනුණේ ඇඩි නෙහෙට්ටුවකි........ එහෙත් ඒ බවක් නො ඇඟවූ ඇය පහලට ගොස් ඔහු ගැන තොරතුරක් ලැබුණාදැයි විපරම් කළාය........ මව ඒ වන විට හඬමින් සිටියාය. උදෑසනම අවන්ත හා රසාංග පොලිසියට ගොස් තිබුණේ පැමිණිල්ලක් කිරීමටය. මන්ද ගෙවී ගිය රාත්‍රියේ සිටම ඔහු ආගිය අතක් නැති බැවිනි.

නිවසේ හැම දෙනාගේම අවධානය යොමුව තිබුණේ නියති වෙතය. මන්ද ඇය ඊයේ රැයේ කළ කී දේය. හැමදෙනාම නියතිගෙන් ප්‍රශ්න කළද ඇය කිවේ තමා නොදන්නා බවය. පුදුමයකට මෙන් ඇය සඳරු ගැන ඒ මොහොතේ පවා එකම වදනක් හෝ සඳහන් නොකළාය. එයින් සඳරුට ඇනුණේ වඩාත් ඇඩි පුදුමයකි.

නෙත්ත නිවසේ නැති නිසාම වෙළඳ ව්‍යාපාරය සඳහා යාමට හෝ කිසිවෙකුට කිසිදු උවමනාවක් නොවීය. ඔහු ගැන තොරතුරක් සොයා ගැනීමට සැම දෙනම ඒ මේ අත දිවූහ........ මනුෂි මේ නිවසේ කලබලය ගැන තනිකරම සඳරු සැක කළාය. එහෙත් සැම දෙනම නියතිගෙන් ඒ ගැන විමසන්නේ මන්දැයි ඇයටද ඇතිවූයේ ඇඩි කුතුහලයකි.

පාන්දරම අවදි වූ යශෝදා කුඹුරට වතුර අරින්නට සිතාගෙන ඉක් ඉක්මනින් ආවේ අද මදක් පමා වූ බැවිනි........ පියාගේ කිරි



ජෝගුවද සාදා ඇය එළදෙනද කැටුව පැමිණ වත්ත පහළ ගැට ගසා වතුර ඇරීමට සිතාගෙන පින්න මැකී නැති නියර මතින් ඉක්මන් ගමනින් ආවාය. පාර අයිනේ ලොකු වාහනයක් ජීප් රථයක් නවතා තිබේ........ එහි ආ කිසිවෙකු අවට සිටීදැයි බැලුවද නැති බැවින් ඒ ගැන හැකිමක් නොකළ ඇය කන්ඩිය අසලින් බැස පාර පැන පාලම අසලට ආවාය. වතුර හරින්නට නම් මදක් එහාට ඇල දිගේ යා යුතුය. ඇය අඩි කිපයක් ඉදිරියට ගිය විට එහි දුටු දසුනින් ඇයට කෑ ගැසිණ. කවුදෝ ඇලට වැටී ඇත........ වැටුණු තැනැත්තා පිහිනන්නට උත්සාහ කළද කුමන කරුණක් නිසා හෝ ඔහුට ගැඹුරු ඇලේ පීනා ගත නොහැකිව දඟලනු දුටු ඇය කෑ ගසන අතරේම එහාම දියට පැන්නාය. දියට පැන එහාට පීනා ගියා ඇය වැටුණු තැනැත්තාගේ අතින් ඇද තමා ළඟට ගෙන ඔහුගේ කමිසයෙන් එක් අතකින් අල්ලාගෙන අනෙක් අතින් පිහිනා ඔහුව ඇල ඉවුරට ඇදගෙන ආවාය. ඔහුව ගොඩට ඇද ගත් යශෝධා යළි කන්ඩිය උඩට නැග ආධාර ඉල්ලමින් කෑ ගසන්නට විය.

“කරුණාවතී නැන්දේ........ චන්ද්‍රපාල මාමේ........ ඉක්මනට එන්නෝ........ කවුදෝ ඇලට වැටිලෝ........ ඉක්මනට එන්නෝ........

ඇය බෙරිහන් දෙන්නට වූවාය. කිසිවෙකුගේ කෑ ගැසීම ඇසීමෙන් මදක් එහායින් පිහිටි නිවාස දෙක තුනේ පිරිස මෙදෙසට වහ වහා දිව ආවෝය. ළඟ එද්දී කෑ ගසන්නේ යශෝධා බව දුටු චන්ද්‍රපාල නම් තැනැත්තා........

“මොකද දුවේ........ මොකද?” යි කියමින් වහ වහා දිව ආවේය.

“මාමේ විගහට එන්න........ කවුද ඇලට වැටිලා........ මම ගොඩ ගත්තා........ පණ තියෙනවද මන්දා........”

“දෙයියන්ට පෙනියත්........ ඉලන්දාරියෙක් නේද........ බලමු බලමු ........” එසේ කියා ඔහුගේ ළයට කන තැබූ ගැමියා,

“පණ තියෙනවා........ වතුර පෙවිලා වගේ........” ඒ හාම අනෙක් අයද පැමිණ රෝගියාගේ වතුර හැකි තරම් ශරීරයෙන් පිට වන ලෙස ඔහුව තෙරපන්නට විය.

“මේක මෙතන හරියන්නේ නෑ........ දුවේ යශෝධා........ අප්පච්චි ගෙදර නේද........”

“ඔව් මාමේ........ ගෙනියමු ගෙදර........”

සැම දෙනම එකතු වී රෝගියා ඔසවාගෙන වහවහා ආසන්න ගියේ ගමේ වූ වෙද මහතාගේ නිවසටය. එනම් යශෝධාගේ නිවසටයි.

කට්ටියම එකතු වී යමෙකු ඔසවා එනු දුටු වෙද මහතා ඒ කවුදැයි බලන්නට උනන්දු වූහ.

"සාමෙල් කවුද මේ?"

"වෙද මහත්තයා......... මේ ඇත්තා ඇලට වැටිලා. ඔං යශෝධා දූ මයි බේරගෙන තියෙන්නේ" එසේ කියමින් ලුණු ඇඳේ රෝගියා ඇලකල පිරිස වෙදමහතාට රෝගියා පරීක්ෂා කිරීමට පසෙකට විය......... ඔහුව හොඳින් පරීක්ෂා කළ වෙද මහතා කලබලයෙන්,

"බොහොම අමාරු පාටයි......... සිහියත් නෑ......... දුවේ මගේ බෙහෙත් හෙප්පුව ගෙනෙං. ආ......... ඒ එක්කම සාමෙල් පොඩ්ඩක් ඔය උඩහට රිංගලා කුඹුරු දලු. පෝටා කොළ. ගුරුල්ල කොළ ටිකක් එහෙම ඉක්මනට ගේන්න......... අත පය වල තුවාල වලට......... ඒකට කලින් ඉතිං සිහි ගන්වන්න එපැයි"

එසේ කියූ යශෝධාගේ පියා සෙනෙවිරත්න වෙද මහතා දියණිය ගෙනා බෙහෙත් හෙප්පුවෙන් දුම් කුඩු වැනි වූ රහස් ඖෂධයක් ගෙන රෝගියාගේ නාසයට ළං කළේය.........

"චන්ද්‍රපාල මෙන්න මේ තෙල යටි පතුලේ ගාලා හොඳින් අතුල්ලන්න......... කරුණා නංගි මේක ඔළුවට දාන්න......... එසේ කියා තවත් තෙල් බෝතලයක් දී ප්‍රතිකාර සකස් කිරීම සඳහා කාමරයට ගිය වෙත මහතා අවශ්‍ය බෙත් හේත් ඇඳ අසලට ගෙනාවේය.

සෑහෙන වෙලාවක් මෙසේ ගත වෙද්දී රෝගියා යන්තමින් සිහි ලබන ලකුණු පෙන්නුම් කලෙන් තවත් කුඩු බිඳක් නාසයේ ඇතිල්ලූ වෙද මහතා යමකිසි මන්ත්‍ර කීපයක් මතුරන්නට විය......... මෙසේ සෑහෙන වේලාවකට පසු හෙමි හෙමින් සිහිය ලැබූ නෙත්න තමා සිටිනා තැන බලන්නට මෙන් ඇස් හැර බැලීය. ඒත් සියල්ල අපහැදිලිය......... ඔහු යළිත් නෙත පියා ගත්තේය.

"වෙද මහත්තයා ලෙඩාට සිහිය ආවා"

"හා එහෙනම් වමනෙ කරවන්න සූදානම් කරන්න......... ජයපාල ඕක හැඳුවා නම් මෙහාට ගේන්න........." එසේ කියමින් එළියට ආ වෙද මහතා ලෙඩා දෙස බලා,

"වතුර පෙව්ලා තියෙන්නේ සෑහෙන්න......... වතුර අයින් කලාට නාම ඇති......... අනෙක මොන මොන විස සරීරෙට ඇතුළු උණාද දන්නෙ නැතේ" එසේ කියමින් ජයාපල ගෙනා අලුකෙසෙල් මුහ ඉස්ම කෝප්පය නෙත්නට බොහෝ අසීරුවෙන් බොන්නට දුන්නේය.





ටික වෙලාවකින් ඔහු වමනය කරන්නට විය......... වමනය කරද්දී ඒවා කලු පැහැයක් ගෙන ඇති බව දුටු වෙද මහතා,

"මම කිවේ......... මෙයා එක පාරක් වත් දිය යට මඩට ගිහින් තියනවා. අනෙක බොහෝම සැරට මත්පැන් බීලා ඉන්නේ......... මෙහෙම වත් ජීවිතේ බේරුණේ ග්‍රහචාරේ බලවත් ඇති........." එසේ කී වෙද මහතා......... තව පැය භාගෙකින් ඉතිරි අඩු කෝප්පෙ පොවන්න යැයි පැවසීය.

"වෙද මහත්තයා......... මේ නාහෙන් ලේ ගලනවා........." චන්ද්‍රපාල කෑ ගැසුවේ බියෙනි.

"ඔළුවත් කොහේ හරි වැදෙන්න ඇති......... මෙන්න මේ නෙළුම් මල් දෙක හොඳින් තලලා ඉස්ම ටිකක් ඇත්න එන්න නහේට දාන්න........."

මේ ලෙස කඩිමුඩියේ සියලු ප්‍රතිකාර ආරම්භ කළෙත්......... රැගෙන ආවාට වඩා ඉතා යහපත් තත්ත්වයකට ලෙඩාව ගැනීමට ලැබුණෙන් එතැන පිරිසේ වූ කවුරුත් සතුටු වූහ.........

"අප්පච්චී අද මට ඉස්කෝලේ යන්න වෙලා නෑ......... මම ගෙදර ඉන්නම්........."

"එහෙනම් ඉන්න......... එක දවසක ඉස්කෝලෙ පාඩුවට ජීවිතයක් බේරගත්ත පින හිලව් වෙන්නෙ නැතෑ......... නැද්ද චන්ද්‍රපාල?"

"එහෙමයි වෙද මහත්තයා......... යශෝධා දූව නොදකින්න මේ ඇත්තා ඉවරයි........."

"ඔව් තව ටික වේලාවක් ගියා නම් දියේ ගිලිලාම වැඩ ඉවර වෙන්න තිබුණා" තම පියා කියද්දී යශෝධා සීතල වී ගියාය. අද තමා කිසිවෙකුගේ ජීවිතය බේරාගෙන තිබේ.........

සවස් වන විට නෙත්නගේ තත්ත්වය වඩා යහපත් වූහ......... ඔහු ඇස් හැර හොඳින් වටපිට බලන්නට වූහ......... එහෙත් ඒ වන විට ඔහුට මදින් මද උණ රෝගය වැළඳෙමින් තිබිණ. ප්‍රතිකාර ආරම්භ කොට තිබුණෙන් වෙද මහතා ඒ ගැන පරීක්ෂාකාරී විය.

නෙත්නගේ තුවාල වලටද බෙහෙත් බැඳ තිබුණෙන් ඔහුට නැගිටීම පවා ඉතා අසීරු විය. ඔහුගේ සියලු ආවතේව කටයුතු කෙරුණේ ජයපාල නම් වූ වෙද මහතාගේ අතවැසියා අතිනි. තමන් මග නවතා ඇති ඔහුගේ වාහනය රිය පැදවීමට දන්නා කිසිවෙකු විසින් වෙද මහතාගේ නිවසේ මිදුලට රැගෙන විත් දැමූහ......... මන්ද යතුර තිබුණේ රථයේම බැවිනි.

දින කිපයක් ගෙවී ගියද නෙත්තගේ උණ රෝගය දිනෙන් දිනම උත්සන්න විය. ඒ සඳහා කසාය පිළියෙල කොට දුන්නද අඩුවක් නොවන තැන වෙදමහතා ප්‍රතිකාර විධි තවත් පුළුල් කළේය. අහල පහල නිවෙස් වල සිටි සියල්ලෝමද නිතර පැමිණ ඔහුගේ සාත්තු සප්පායම් කිරීමට වෙදමහතාට උදව් ලබා දුන්හ.........

මේ වන විට නෙත්ත නැති වී සතියක් ගත වී තිබුණෙන් දන්න අත්තා වික්‍රමසේකර නිවස මළගෙයක ස්වරූපය ගත්තේය. දන්න අත්තා සැම තැනම නොයෙක් දෙනා පිටත් වී ගොස් ආරංචි කොට බැලුවා......... අනුරාධපුරයට පවා පණිවුඩ ලබා දුන්නද ඒ කිසි තැනක ඔහු සොයාගන්නට නොමැති වීමෙන් නිවසේ තත්ත්වය ඉතාම සංවේගදායක විය. කිසිවෙක් හෝ කෑම බීමක් ගැන පවා සිතුවේ නැත......... පියල්ලන්ටම වඩා සඳරුගේ තත්ත්වය ඉතාම කණගාටුදායක විය......... ඇය කාර්යාලයට හෝ සරසවියට නොගියාය. සති අන්ත පන්තියටද නොගිය ඇය කාමරයට වී මුළුගැන්වී හඬමින් පසු වූවාය. තම සොයුරාගේ අතුරුදන් වීම දන්වන ලදින් රොෂාන් ද ඊට පසු දිනම ආපසු ලංකාවටආවේය. ඔහුගේ හදවතටද සොයුරා නැති ශෝකය අපමණවත් දැනෙමින් තිබිණ. ඒ අතරේ තම බිරිඳ නොකා නොබී වැළපෙනු දුටු ඔහුට ඇය ගැනද දැනුණේ දුකකි......... ඒ දුකට අමතරව ඔහුගේ යටි සිත කිවූ යම් කිසි අනුමානයක් දෙස ඔහු එක එල්ලේ බලා සිටින්නට වූයේය. මනුම්ට වඩා සඳරු නෙත්තට බොහෝ සමීප වූවද......... නියතිටද පවා නැති තරම් වේදනාවක්......... (එය පිද්මි අක්කාගේ ද මුහුණේ දක්නට නැති වේදනාවක්......... (එය නෙත්ත වෙනුවෙන්නම්) සඳරුගේ මුහුණේ ඇති බව රොෂාන්ට වැටහෙන්නට විය. ඒත් ඇයගේ මේ වැලපීම කා ගැනද......... මේ දුක කා ගැනද......... මෙතරම් නොකා නොබී වැලපෙන්නට සරසවි දේශන පවා අතහැරීමට හේතුව නෙත්තගේ නැතිවීමද......... නොඑසේ නම් වෙනත් කවුරුන් හෝ ඇය ජීවිතය වෙතට පැමිණ ඇද්ද.........

මේ නිවසේ කලබැගෑනියට සමගාමීව ඇයගේ හදවතේ පවතින්නේ කවර කලබගෑනියක් විය හැකිද......... ඇය මෙතරම් අසරණ ලෙස දුඃඛිත ලෙස දිවිගෙවනු විවාහ වී ඇය මේ නිවසට ආවාට පසු දුටුවාමය. එහෙත් ඒයට හේතුව කුමක් විය හැකිද......... තමා හා මෙතරම් කටුක දිවියක් ගෙවද්දී හෝ ඇය මෙතරම් අසරණ වී නොමැත......... වැලඹිත්තියක සේ නොකා නොබී වැළපෙන්නේ කවර නම් වටිනාකමක් ඇයගේ ජීවිතයෙන් මගහැරී ගොස්ද.........





සොයුරා සොයාගන්නවා සේම ඇය ගැනද අවධානය පෑ යුතුය. අහිංසක යුවතිය මෙ දිවි මං තලාවේ අසරණව ඇත්තේ තමා නිසාවෙනි. ඇයගේ ළඳ බොළඳ කමින් ප්‍රයෝජන ගැනීමේ අරමුණින් කිසිවෙකු ඇයව මුලාවේ දමා වත්ද......... ඔහු හෙමිහිට ඇඳ අසලට ගොස් සඳරු අසල හිඳ ගනිද්දී හිස ඔසවා බැලූ සඳරු බියට පත් විය......... ඔහුට තමා ගැන සැකසිතිවත්ද.........

"සඳරු......... මොකද මේ......... දවස් ගානකින් කෑවෙ බීවෙ නෑ කියලා කියන්නෙ......... මොකද මොනා හරි අසනීපයක්ද.........?"

"නෑ......... මේ......... මට......... නිකං කෑම අප්පිරියයි වගේ........."

"ඒ මොකද......... හිටි ගමන්ම........."

"නෑ ඒක ගනන් ගන්න දෙයක් නෙවි......... දවසකින් දෙකකින් හරියයි"

"හැබැයි සතියක් විතර වෙලත් හරි ගිහින් නෑ වගේ නේද?" රොෂාන් කියද්දී සඳරු සීතල වී ගියාය.

"මල්ලින් නැතිවෙලා ගෙදර අය කරදරෙන් ඉන්න වෙලේ ඔයත් ලෙඩ හදාගන්න එපා......... මොනවා හරි කන්න......... අනෙත් එක යමු බෙහෙත්ගන්න"

"බෙත් ගන්න දෙයක් නෑ......... ඇරිලා යාවි" එසේ කියූ සඳරු රොෂාන්ගේ ඇස් මගහැරියාය.

"ඔයාට හොඳ විදියක්. හැබැයි අද විතරයි. හෙට යන්න ඕන බෙහෙත් ගන්න........." එසේ කී රොෂාන් නැගිට යද්දී සඳරු මහ හඬින් හඬාගෙන කොට්ටයේ මුහුණ ඔබා ගත්තාය.

.........අනේ නෙත්ත......... ඇයි මේ තරම් දඬුවමක් දුන්නෙ මට......... එදා ඒ ගහපු කම්මුල් පහරටද මේ හැම දේම......... මේ වියෝදුක......... මේ වේදනාව......... මේ කඳුළු......... මුලු ගෙදරම මළ ගෙයක් කරන්න හේතු උණේ මම කියලා කට ඇරලා කියන්න මට හැටියක් නෑ......... අනේ ඒ සේරමත් හරි. ඔයා කෝ......... කොහේද......... ඉන්න තැනකින් එන්න......... අඩුගානෙ ඉන්න තැනක් වත්......... අයියෝ මේ තරම් බෝධි පූජා කළා......... භාර හාර උණා......... දෙවියන් වත් ඇයි මා ගැන බලන්නෙ නැත්තේ.........

සුසුමක උණුසුම පමණක් උරුම කරගන්නට තරම් මේ ආදරය රුදුරු වූයේ කෙසේද......... නොලැබෙන සිතකට පැතුම් එකතු කරන්නට එපා කී පවට මේ තරම් දඬුවමක්.........? නෙත්ත......... ඔයා කොහේද.........? කොහේද.........?

තෙත්තට බොහෝ සුවය ලැබී තිබිණ.
දින දහයක් පමණ යද්දී තෙත්තට ආශ්චර්යයකට මෙනි. තමාගේ
ඔහුගේ තුවාලද සුව වී තිබුණේ ආශ්චර්යයකට මෙනි. තමාගේ
රෝග සුවයට එකම හේතුව වෙදමහතාත් අන් අයත් දිවා රෑ නොබලා
කළ සත්කාර බව තෙත්තට අවබෝධ විය. දිනක් උදෑසන තෙත්ත
ඇඳෙන් නැගිට මිදුලේ ඇවිදිමින් සිටිද්දී යශෝධා ඔහු වෙත
සිනාසෙමින් ආවාය. ඔහුට සිහි වූයේ කස්තූරිය. ඇයද ඒ වයසේම,
ඒ පෙනුමෙම සුන්දර යුවතියක වූවාය.

"තෙත්තයියා......... ඇත් සනීපයි නේද.........?" තමාගෙ කලිසමේ
වූ තෙත් බත් වී ගිය පර්ස් එක රැගෙන එහි වූ සියල්ල වේලා
නිසිලෙස තිබූ පරිදි තබා ඇත්තේ ඇය විසිනි. තමාගේ හැඳුනුම්පත
හා බැංකු කාඩවලින් තමාගේ නම ඔවුන් ඇනගෙන ඇත.

"ඔව් යශෝධා......... ඇත් හොඳයි මට......... මම කල්පනා කළේ
මට හෙට විතර යන්න පුළුවන් කියලා"

"හා......... හා......... කියන්න එපා අප්පච්චිට ඇහෙන්න......... ඔයාට
තාම හොඳටම ගුණ නෑ"

"තිබුණු විදියට......... මැරිලා හිටි මට ඔයයි අප්පච්චියි පණ අරන්
දීපු එක මදිද......... මම මෙහෙ ඉන්න ඉන්න ඔයාලට කරදරේ"

"අපිට වෙන විශේෂ කරදරයක් නෑ ඔයා යනවා නම් යන එක
ඇරෙන්න......... මොකද ඔයා යන්නේ හරියටම ලෙඩ සනීප වෙලා
නෙවිනේ. ලෙඩ හොඳ වෙලා ගියාට කමක් නෑ......... ඔයාට
ජේනවනේ ඔයාටයි කියලා අපි අමුතුවෙන් කරනවා නෙවි.........
ලෙඩ්ඩු පිරිලා අපේ ගෙදර......... තෙල් බෙත්......... සාත්තු......... ඕවා
අපිට හැමදාම එකයි......... අයියා ගියත් හිටියත් අද එන්න පුළුවන්
සර්පයෙක් කාලා මැරෙන්න වැටිච්ච කෙනෙක්......... ඉතිං අපි එයාවත්
ඔයා වගේම බලාගන්නවා......... බෙත් කරනවා......... ඒක අපේ
වගකීම........."

"ඒත් මට හරි දුකයි යශෝධා......... ඔයා ඉස්කෝලෙත් යන ගමන්
මෙහෙම නැතෙන කොට"

"ඉස්කෝලෙ කාලෙ ඉවර වෙච්ච ගමන් මම කැම්පස් සිලෙක්ට්
නොවුණොත් මටත් මේ වෙදකම භාරගන්න වෙනවා අයියා........."
යශෝධා කැම්පස් එක ගැන කථා කරද්දී තෙත්තට සඳරූ සිහිවිය.
මෙතෙක් දින ඔහු ඒ මතකය අමතක කළා සේ දිවි ගෙවූවේ අසනීප
නිසාවෙනි. එහෙත් යළිත් ශරීරයේ තුවාල හොඳ වන්නට වන්නට
හදවතේ තුවාලය පෑරුනු ඇතේ.........





තෙත්තගේ මුහුණේ වෙනස දුටු යශෝධා.........

"තෙත්තයියා මොකද මූණ අමුතු උණේ......... ඔයා මෙහෙ ගෙනත්
දවස් තුන හතරකින් ගෙදරට දන්වන්න ඇහුවම එපා කිව්වනේ.........
දැන් ඉතිං අයියට සනීපයි......... දැන්වත් දන්වන්න අයියේ ගෙදරට.........
ඒ අය කොච්චර බයේ ඇද්ද........."

"මා ගැන එහෙ බයවෙන්න කෙනෙක් නෑ නංගි"

"මම දන්නව ඔය කියන්නේ තරහෙන් කියලා......... එහෙනම්
කව්ද සඳරූ......... ලෙඩ වෙලා ඉන්න කල්ම කතා කළේ එයාට.........
ඒ අයියගෙ අක්කද........." යශෝධා අසද්දී තෙත්ත තිගැස්සුණේය.........
එසේ නම් තමා උණ විකාරයෙන් ඇයට කථා කරන්නට ඇත.........
වෙනදා නම් කුඩා දේකටත් ඇය ළඟ උන්නා නොවේද?

"මොකද මූණ වෙනස් උණේ......... කව්ද සඳරූ.........අප්පච්චිත්
අහයි මගේ හිතේ......... අනෙක අප්පච්චි කිවා අහල බලලා ගෙවල්
වලට දන්වන්න ඕන කියලා.........අප්පච්චි කියනවා අයියා ලොකු
පවුලක කෙනෙක්ලු" යශෝධා කියද්දී තෙත්තට සිනා නැගිණ.

"ඒ කොහොමද.........?"

"වාහනේ ඇක්කම ඕනම් කෙනෙක්ට ජේනවනේ......... අනෙත්
එක පර්ස් එකේ තියෙන බැංකු කාඩ්ස්......... පිටරට කාඩ්ස්......... ඒත්
ඔය එකකින් වත් නෙවි අප්පච්චි කිවේ. අංගලක්ෂණ විද්‍යාවෙන්.........
අත බලලා විශේෂ ලකුණු බලලා එයා කොයි වගේද කියන්න
අප්පච්චිට පුළුවන්........."

"බලාගෙන යනකොට ඔයාගේ අප්පච්චි මේ පුංචි ගමේ හැංගිලා
ඉන්න ඕන කෙනෙක් නෙවි........." යශෝධා හා තෙත්ත කතා කරන
තැනට පැමිණි වෙද මහතා.

"දැන් කොහොමද තෙත්ත මහත්තයා ඇඟ පත අමාරු ගතිය"

"දැන්නම් හොඳටම වගේ අඩුයි වෙද මහත්තයා.........
වෙදමහත්තයලට පින් සිද්ධවෙන්න........."

"අනූ නමෙන් තමා ජීවිතේ බේරුණේ......... බේරුණා කිවාමත් හි
පුදුමයි......... ඒ තරමටම තත්ත්වෙ නරකට තිබුණේ......... හරියට
මත්පැන් පෙවිලා තිබුණා........."

තමා එදා මත්පැන් බෝතල් දෙක හමාරක් තුනක් පමණ බිව
අන්දම ඔහුට සිහිපත් විය.........

"අයියා එදා ඇලට වැටුණෙ කොහොමද......... පැන්නා නෙවිනේ
........."

“නෑ පනිනවා නම් ඒකට පනින්න හිතන්නේ නෑ......... මම වැටෙන්න ඇති. මට මතකයි මම ඇවිත් පාලම උඩ වාඩි උණා......... වාඩි වෙලත් බීවා.........මොකද ඊ එළිවෙනකල්ම මම බීබී ආවෙත්......... මට නින්ද යන්න ඇති පාලම උඩ”

“අර පුංචි පටු පාලම ඇන්දේ......... කොහොම නිදාගත්තද?”

“ඒකනේ එක පාරක් හැරෙන්න යනකොට වැටෙන්න ඇති.........” නෙත්න මදහසක් පා පැවසීය.

“අයියට නම් හිනා......... දෙයියනේ එවෙලෙ මම නොහිටියානම් ......... ඔයාට මොකද වෙන්නේ.........?”

“වතුර පෙනහලු වලට පවා ගිහින්......... ඒකයි නිව්මෝනියාවට ආවේ......... යශෝධා නොයන්න මහත්තයා ඉවරයි. ඒක නෙවී මහත්තයා මම මෙ කියන්න හිටියේ......... දැන් ඉතිං හොඳට සුවය එහෙම තියෙනවනේ. මහත්තයගෙ දෙමව්පියො බයේ ඇත්තේ......... ඉන්න තැන කියන්න අකමැති මොනවා හරි ප්‍රශ්නයක් නිසානේ. ඒක ඉතිං පසුවට බලමු......... අඩුගානේ පණිවුඩයක් දෙන්න ජීවතුන් අතර ඉන්නවා කියලාවත්......... දැන් ඒ ගෙවල් මළ ගෙවල් වෙලා ඇති.........” වෙද මහතා කීව. සඳරුගෙන් පලිගන්නා සිහින් ඔහුට වුවමනා වූයේ හැමදාටම මෙසේ වසන් වී යාමටය. දෙමාපියන්......... අයියලා බිය වී දුකින් ඇති බව සැබවි......... ඒත් එයින් තමාට නැගෙන දුකට වඩා තමා නැති සොවින් සඳරුට පසුතැවෙන්නට ඉඩ දීමට නෙත්නට ඕනෑ විය.

.........මාව එපා නිසානේ මාව එලෙව්වේ......... දැන් තමුසෙ ඉන්නවකෝ සතුටෙන්......... ඔහු තනිවම සිතුවේය. වෙද මහතා ඉවත් වී ගිය පසු යශෝධා ගෙට ගොස් වාහනයේ යතුර ගෙන විත් එහි දොර හැර යමක් ගෙනෙනු දැක නෙත්න බලා උන්නේය. ඇය ඔහුගේ මොබයිලය ඔහු අතට දෙමින්,

“දැන් මග අරින්න බෑ......... මම මෙතන ඉද්දීම ඔයාගෙ කාට හරි කියන්න අඩුගාණේ ඔයා ජීවතුන් අතර බව.........”

“ඇයි මේ හදිසියෙම මේක කරන්න කියන්නේ?”

“මම දැක්කා දැන් තාත්තා ඔයා එක්ක දොඩද්දි ඔයාගේ ඇස්වල ලොකු පලිගැනිල්ලක් වගේ දෙයක්. මේ මට හිතෙන හැටි......... තමන් හිතින් විඳවලා......... කන පැලෙන්න බීලා......... වාහනෙත් අරගෙන අරමුණක් නැති ගමනක් ඇවිල්ලා මේ පලිගන්න හදන්නේ වෛරක්කාරයෙක්ගෙන් වෙන්න නම් බෑ......... එයාට ඔයා නැහීගෙන





ආදරේ කරන පාටයි......... අර ඇස්වල තරහ, ඒ පලිගන්න ගතිය මට තිබ්බේ නම් එයත් ඔයාට ආදරේ කරන බව......... මොකද මේක ඇත්ත පලිගැනිල්ලක් නම්......... කඩාබිඳ ගෙන ළඟට ගිහින් මරලා කොටලනේ පලි ගන්නේ......... මේක මේ තමන්ට දුක්දීලා ලෝකෙන් හැංගිලා සමහරවිට ඔයාගෙන්මත් හැංගිලා ඔය පලි ගන්න හදන්නෙ නම් ඔයා නිසා හොඳටම විඳවන කෙනෙක් ඉන්න බව දන්න නිසා එයාගෙන්......... එයාව අඬවන්න.........එයාට දුක් දෙන්න නේද ඕන වෙලා තියෙන්නේ.........” එසේ අසමින් යශෝධා දුරකතනය අල්ල මත තබාගෙන සුදු වැලි පොළවේ ඔහු අසල දණ ගසාගෙන ඒ දෙනෙත දෙස එක එල්ලේ බලා උන්නේ ඔහුට බොරුවක් කියන්නට අවකාශ නොදෙමිනි.

තමාගේ සිතුවිලි හරියටම දශමයට තෝරාගත් මේ බුද්ධිමත් යුවතිය ගැන උපන් පුදුමයෙනුත් සෙනෙහසිනුත් නෙත්නගේ සිත සැහැල්ලු වී ගියා සේ විය. ඔහු සිනාවක් පාමින් ඔව් යයි කියන්නට හිස වනා යශෝධාගේ හිස මත අත තැබීය.

“මම එක ඇත්තක් කියන්න අයියා පිළිගන්නවද.........?” යශෝධා අසද්දී නෙත්න හිස වැනීය. ඇය හෙමිහිට හිටි තැනින් නැගිට්ටාය.

“පුංචි කාලෙදිමයි මගේ අම්මා නැතිවෙලා තිබුණේ......... එදා හිට අප්පච්චි තමයි කාගෙවත් උදව් නැතිව මාව හදාගෙන තියෙන්නෙ. අප්පච්චිගෙ නෑයො ආයෙ බඳින්න කිවත් අප්පච්චි බැඳලා නෑ මට වෙනසක් වේවි කියලා. පුංචි කාලෙ මට ලැබුණේ අප්පච්චිගෙ ආදරේ......... මමයි අප්පච්චියි හරියට යාලුවෝ වගේ තමා ඉන්නේ......... මේ ගමේ අය අපිට හරි ආදරෙයි......... සලකනවා ......... එයාලගෙ හිතවත් කමයි අප්පච්චිගෙ ආදරෙයි මැද්දෙ තමයි මම ලොකු උණේ......... පුංචි කාලෙ හිටම හැමදාම මේ ඔයාට පේනවා වගේ අපේ ගෙදර සෙනඟ, ලෙඩ්ඩු යන එන තැනක්......... මමත් මේ වෙනකොට මගෙ මේ අත්දෙකින් ලෙඩ්ඩු සිය ගානක් ගොඩගන්න අප්පච්චිට උදව් කරලා තියනවා......... හැබැයි මම ජීවිතේටම කෙනෙක්ගෙ පණක් බේරුවා කියලා මට හැඟීමක් ආවේ අයියව බේරගත්තට පස්සෙ. අපේ ගෙදරට මම ලොකු ළමයෙක් උණාට පස්සෙත් ගොඩක් තරුණ අය ලෙඩ්ඩු විදියටත් එයාලගෙ නෑදෑයො විදියටත් ඇවිත් තියනවා......... සමහර අය මා ගැන අප්පච්චිගෙන් අහලා හිට තියනවා.........” එසේ කී ඈ සිනාසුණාය.

"ඒ කියන්න නෙවි මම හැදුවේ......... ඒ තරම කට්ටිය ආවත් මට කවදාවත් ඒ කිසිම කෙනෙක් ගැන කිසිම විදියක හැඟීමක් ඇතිලා තිබුණෙ නෑ......... ඒ අය මට ලෙඩ්ඩු ආගන්තුකයො විතරයි......... ඒත් අයියා දැක්කට පස්සේ, අයියව බේරගත්තෙ මම නිසාද මන්දා......... මට මෙතෙක් කාලෙකට නොදැනුණු මගේ කමක්, සහෝදර කමක් ඔයා ගැන ඇතිවෙලා තියනවා......... හරියට පුංචි කාලෙදි නැති වුණු අයියා ගෙදර ඇවිත් වගේ........." යශෝධා කියමින් හිට ඔහු දෙස බැලුවාය. දෙනොටම දෙදෙනාගේ දෙනෙත්වල වූ කඳුළු පෙනෙන්නට වූවා විය යුතුය.

"අයියා ආසා නැද්ද මම මෙහෙම කියනවට?"

"පිස්සි......... මේ ලෝකෙ මම අහපු තවත් ලස්සන වචන ටිකක්, තවත් ලස්සන නෑකමක්, බැඳීමක්......... කියාගෙන යන්න" ඔහු කීවේ ඇයගේ හිසකේ අවුල් කරමිනි.

"ඉතිං මට හිතෙනවා......... මට අයියා කෙනෙක් උන්නා නම්......... එයත් මොනා හරි දේකට හිත රිද්දගෙන හිටියා නම්......... මට දුවගෙන ඇවිත් කියයි කියලා......... මොකද අයියෙක් උන්නා නම් මම එයාගෙ බෙස්ට් ෆ්‍රෙන්ඩ් වෙනවා කිසිම රහසක් මට හංගන්න බැරි වෙන්න......... සේරම හිතේ තියෙන දේවල් කියන්න පුළුවන් වෙන්න........." නෙත්න සිනාසුණේය.

"ඉතිං......... දැන් ඔයාට ඕන කරන්නේ.........?"

"හරි ඔයා හිතුවා......... මට ඕන ඔයා මගේම අයියා කරගන්න......... ඔය හිත පොතක් වගේ මාගාව දිගැරෙන තරමට අපි යාලුවෝ වෙන්න........." යශෝධා කීවේ යළිත් ෆෝනය ඔහුට පාමිනි.

"දැන් මොකද මට කරන්න කියන්නේ මගේ නංගි බබා........." නෙත්න ඇසුවේ හැබෑවටම ඇය ගැන උපන් සහෝදර හැඟුමිනි.

"ම......... ම......... මට හරි ආසයි අයියා නංගි බබා කියනකොට......... දැන් නම් මට දුකක් ඇනෙන එකක් නෑ අයියෙක් නෑ කියලා" ඇය පුරතල් ලෙස සිනාසී කීවාය. යළිත් කථාකළ ඇය,

"මම දැන් මේ ඔයාට කියන්න යන්නේ මම තාම දැකලා නැති මගේ නෑනට කෝල් කරන්න කියලා" ඇයි කියත්ම නෙත්න යමක් කියන්නට හදනු දුටු යශෝධා,

"හෝව්......... සර්......... හෝව්.........මම කියලා ඉවර නෑ......... එයාට කථා කරන්න බෑ කියන්නනේ හදන්නේ......... හරි වෙන කාට හරි කෝල් කරන්න ඔයා හොඳින් ඉන්නවා කියලා........." යි කීවේ නෙත්නට ගැලවීමට ඉඩක් නොදෙමිනි.



"මැයි අවුරුදු විසි දෙකකට පස්සෙ නංගියෙක් හදාගත්තා......... හරියට පොලිස්කාරියක් වගේ. ඕ. කේ. මම කතා කරන්නම් එත් කෙනෙකුට......... ඔන්න අහගෙන ඉන්න........." එසේ කියූ නෙත්න සති දෙකකට පමණ පසු ඔහුගේ ජංගම දුරකතනය ක්‍රියාත්මක කළේය......... ඒ හාම ප්‍රියලාල්ගේ අංකය ගත් ඔහු එය යශෝධාට දුන්නේය. "මගේ ඔෆිස් එකේ......... හොඳම ගෝලයෙක්......... නම ප්‍රියලාල්"

"හලෝ........."

"හලෝ මේ ප්‍රියලාල්.........ද?"

"ඔව්......... කව්ද මේ......... මේ කොහෙන්ද කතා කරන්නේ නෙත්න සර්ගෙ ෆෝන් එකෙන්........." ඔහු ඇඩි නොඉවසිල්ලෙන් අසනු නෙත්නටද ඇසිණ.

"ආ......... කෝ ඔයාලගෙ නෙත්න සර්?"

"එයා දැන් සති දෙකක් විතර ආගිය අතක් නෑ......... මේ ෆෝන් එක කොහෙන්ද ඔයාට. කව්ද ඔයා?"

"නෙත්න සර් ඉන්න තැන මම දන්නවා"

"අනේ කියන්න......... කොහෙද ඉන්නේ......... මම දැන්මම එන්නම්"

"එහෙම එන්න බෑ......... මම ඕන්නම් කතා කරන්න දෙන්නම්......... ඔහොම ඉන්න........."

"හලෝ......... ප්‍රියලාල්........."

"දෙවියනේ......... සර්......... සර් ඔයා කොහේද......... මෙහෙ ගිනි කෙළි......... ගෙදර ඔෆිස් මළ ගෙවල් තමා......... සර් ඉන්නෙ කොහෙද දැන්......... මම එන්නද......... මට තැන කියන්න......... මම ගෙදරටත් කියන්නම්"

"මනුස්සයෝ ඊළඟ වචනෙ කියන්න කලින් හුස්ම අරන් ඉන්නවා. නැත්නම් හුස්ම හිරවේවි"

"සර් විහිළුත් කරනවද......... පිස්සු කියන්න එපා සර්......... අපි මෙහෙ හුස්ම හිරවෙලා ඉන්නේ......... සර් ඉන්න තැන කියන්න........."

"ඇයි මට මගෙ පාඩුවෙ ඉන්න නොදෙන්නද......... ඒවා වැඩක් නෑ......... තාත්තිට කියනවා මම හොඳින් ඉන්නවා කියලා........."

"සර් මට විතරක් කියන්න ඉන්න තැන........."

"ඒක වැඩක් නෑ......... බයේ හිටියෙ මම ගැන නම් දැන් බය ගියානේ......... තාත්තිට පණිවිඩය කියනවා........."

" නෙත්න දුරකතනය යළිත් වසා දැමුවේය.

"සර්......... සර්........."

"හරිද.........?"

"හරි.........ඒක නෙවි......... නැනගෙ ෆොටෝ නැද්ද.........?" යශෝධා

"හරි.........ඒක නෙවි......... ඇයගේ රුව දැකීම, කතා අසද්දී නෙත්නගේ මුහුණ අඳුරු විය......... ඇයගේ රුව දැකීම, කතා කිරීම ඔහුට නොරිසි විය.

"ඇයි මම වරදක්ද ඇනුවේ?"

"ඇයි මම වරදක්ද ඇනුවේ? ඒකින් එක ප්‍රෙස් කරන්න.........

"නෑ......... මෙන්න මේ බටන් එක ඒකින් එක ප්‍රෙස් කරන්න.........

"නෑ......... හැබැයි මට පේන්නෙ නැතිව නැගිට්ටත්ත........."

ඒ පේ්‍රම ඒයාගේ......... හැබැයි මට පේන්නෙ නැතිව නැගිට්ටත්ත

"ඔ......... එච්චරටම තරහක්. ඒ උණාට හරි පුදුමයි නේද මතන්න ගිහෙන්නෙ නැති කම" යශෝධා ඉඟි කළේය. නෙත්නගේ මුහුණ රතු වී ගියේය. යශෝධා ඡායාරූප දැක දෙනෙත් විසල් කොට ගත්තාය.

"ඇත්තටම අයියා......... වී වී එකේවත් මම මෙච්චර ලස්සන ගර්ල් කෙනෙක් දැකලා නෑ"

"ඒක තමා කරුමෙ......... ඒ ලස්සන........." එසේ කී නෙත්න ඇයට කැමැත්තක් කරගන්නට දී නැගිට ගියේය.



# 29

නෙත්න ප්‍රියලාල්ට කථා කළ පුවත ඒ සැනින්ම නිවසටද කාර්යාල වලටද ආරංචි වූයෙන් මෙතෙක් ඇවෙමින් සිටි සිත්වලට අස්වැසිල්ලක් ලැබිණ. නිවසින්ද පිට අයගෙන්ද ඉන්පසු ප්‍රියලාල්ගේ ෆෝනයට ඉස්පාසුවක් නොවීය. එකම දේ පවසා ඔහු හෙම්බත්ව සිටි මොහොතක ආ ඇමතුම නොගෙන ඉන්නටද සිතූ ඔහු නිකමට මෙන් ස්ක්‍රීන් එක බැලුවේය.

"......... සඳරූ......... මැඩම්?" ඔහු ඉක්මනින්ම ෆෝනය ඔන් කළේය.

"ප්‍රියලාල්........."

"මැඩම්........."

"සර් කතා කළාලු නේද ප්‍රියලාල්?" සඳරූගේ කටහඬ එතරම් දුර්වලව ඔහු ඇසුවාමය.

"ඔව් මැඩම්"

"සර් කොහෙද කිව්ද ඉන්නේ?"

"එහෙම කිවේ නෑ මැඩම්......... හැබැයි මට තේරුණේ නම්......... සර් සතුටෙන් කොහොම වෙතත් සැහැල්ලුවෙන් ඉන්නවා කියලා......... මම මේ ගැන කාටවත් කිවේ නෑ මැඩම්ට ඇරෙන්න......... මුලින් කතා කළේ ගැනු ළමයෙක්......... එයා කතා කළා මා එක්ක හරි හොඳට......... කතා කරලා තමා සර්ට දුන්නේ" ප්‍රියලාල් කියද්දී සඳරූගේ සිත හිරි වැටී ගියා බඳු විය.........

"ගෑ.........නු.........ළම.........යෙක්.........?"

"ඔව් මැඩම්......... පොඩි කෙනෙක් නෙවි......... තරුණ ළමයෙක් වෙන්න ඕන......... සර් කතා කරද්දී මට ඇහුණා ළඟ ඉඳන් කියාත් වෙනවා........."

"ඉන්න තැනක් අහගන්න හැඩුවෙ නැද්ද?" සඳරූ තම කටහඬ සාමාන්‍ය ලෙස පවත්වාගන්නට උත්සාහ කරමින් ඇසුවාය.

"නෑ මැඩම් ඇහුවා......... කිවේ නෑ........."

"හරි ප්‍රියලාල්......... මම කියන්නම්........."

සඳරුගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය......... ඔහු සිටිනා බව......... හොඳින් සිටිනා බව ඇනගන්නට ලැබීම පවා තමාට හුස්ම ගැනීමට අයිතිය ලබා දුන්නා වැනි විය. එහෙත් ගැහැනු ළමයකු......... ඒ නස්රිනාද......... එහෙත් නස්රිනා මේ දිගටම තමාට කථා කරමින් ඔහු ගැන විමසුවේ ඇයද ඔහු ගැන නොදන්නා බැවිනි. නැත......... මෙ අන් කවරෙකු හෝ විය යුතුය......... එසේ නම් ඒ කවුද......... තමා දන්නා කිසිවෙකු නොවිය හැක......... කුමන දෙයක් සිදු වුවද ඔහු නිරුපද්‍රිතව ඉන්නා බව දැන ගැනීමම සතුට බව ඇය හදවතට පහදා දුන්නාය.

නෙත්තගේ කාලය ඉතා සැහැල්ලුවෙන් ගෙවන්නටත් මනස සංසුන් වන්නටත් යශෝධා මූලික වූවාය. ඇය ගෙවී ගිය වසර දහ හතටම හරියන්නට සේ ඔහුට සෙනෙහස පාමින් නිරන්තරයෙන් ඔහුගේ සෙවණැල්ල සේ විසුවාය. තමාට සොයුරකු ලැබුණු බව ඇය පියාටද පවසා තිබුණෙන් මේ සහෝදර සෙනෙහස දෙස වෙද මහතාද සතුටු සිතින් බලා උන්නේ යශෝධාගේ දිවියේ වූ පාලු බව ඔහු දැන සිටි බැවිනි. එහෙත් අද හෙට නෙත්ත යළි ගිය විට ඇය දුකට පත්වනු ඇතැයි ඔහු සිතිණ.

"දූ යශෝධා......... ඔයා දැන් දවසම නෙත්තයියා එක්ක ඉන්නවා......... කතා බහ කරනවා......... ඒත් හිතුවද දැන් අයියා ගියාම ඔයාට දැනෙන පාලුව"

"මම අයියව යවන්නෙ නෑ......... අපි අයියව ඉන්දගමු"

"එහෙම බෑ දූ......... එයාට අපි එක්ක ඉන්න බෑ......... මම හේතුව නොදන්නවා උණත් මම තාම නෙත්තව මෙහෙම තියාගත්තෙ නෙත්ත උන්නු තත්ත්වෙ දන්න නිසා......... එහෙම නැතිව එයාගෙ ගෙවල් වල අය මෙයා කොහේද කියලා දුකෙන් ඉද්දි අපිට එයාව තියාගන්න බෑ......... අනෙක අයියගෙ වැඩ රාජකාරි......... ඔය තරම් තියන බිස්නස් වැඩ අලා මෙහෙට වෙලා ඉන්න අයියට බෑ........."

තම පියා කියද්දී යශෝධා එය අවබෝධ වූවා සේ හිස වැනීය.

"කමක් නෑ නෙත්තයියා......... මාව බලන්න හැම මාසෙම එන්න ඕන......... එහෙම නම් මම යන්න දෙන්නම්........." නෙත්ත සිනාසුණේ එකඟ වූවා මෙනි. මේ කාලය තුළ යශෝධා තම පාසලටද ගියේ නෙත්ත සමඟිනි. ඇයගේ පාසලේ මිතුරියන් හා නෙත්ත ගැන ඇය කතා කළේ ඉමහත් අභිරුචියෙනි. එහෙත් එයින් වූයේ යශෝධාගේ





පාසල් මිතුරියන් නෙත්තට වශී වී යාමය. ඔහුව කෙසේ හෝ යාලු කරදෙන ලෙස කෙල්ලන් කරන ඉල්ලීම් ගැන යශෝධා ඔහුට කියමින් සිනාසෙන්නට වූවාය.

"තව ටික දවසක් ඔයා මෙහෙ හිටියොත් අපේ පන්තිවල කෙල්ලො ඉන්න තැන්වල ඉඩම් විකුණලා මේ අවට පදිංචියට එවි. ඔයා දන්නවද නෙත්තයියා මේ දවස්වල මට මාර සැලකිලි. කෙල්ලො පොර කනවා මාව ටක් ෂොප් අරන් යන්න......... මාත් ඉතිං මෝඩයා වගේ ගිහින් හොඳට කනවා......... එක්කෙනෙක් තේ අරන් දෙයි......... කට්ලට්......... පැටිස්......... බතල රෝල්ස්......... අප්පා......... ඔයාව දෙන්නම් කියලා මම හොඳට කනවා" යශෝධා කියද්දී දෙදෙනා ඇති තරම් සිනාසුණේය.

"ඒක නෙවි නංගී බබා......... ඔයාලගේ ටක්ෂොප් එකේ බතල රෝල්ස් තියනවද.........?"

"හා......... ඔව්......... හැමදාම තියනවා......... මාර රහයි අයියේ"

"හරි......... හෙට අරන් එන්න එහෙනම් මටත්"

"කීයක්ද......... පහක්.........දහයක්........."

"එච්චර එපා මෝඩියේ........."

"එන්න එපා මට මෝඩි කියන්න........." යශෝධා කියද්දී නෙත්තට සඳරු සිහිවිය. ඇයට මෝඩියි කීවිට ඇයද මේ වාක්‍යයම කියන බව සිහිවිය.

"මොකද ඩිම් උණේ......... සඳරු අක්කා මතක් උණා නේද?"

"හ්ම........."

"ඇයි ඒ......... හිටි ගමන්........." ඇය අසද්දී ඔහු ඇයට සිදුවීම පැවසීය.

පසුදින යශෝධා පාසල් ගිය පසු නෙත්ත වෙද මහතා සොයා කාමරයට ගියේය.

"ආ......... නෙත්ත මහත්තයා......... ඉඳගන්න ඔය පුටුවෙන්"

"වෙද මහත්තයා......... මම ආවෙ වෙද මහත්යගෙන් ඉල්ලීමක් කරන්න........."

"ඒ මොකක්ද මහත්තයා?"

"මම මෙහෙම කියනවට මා ගැන වරදවා වටහා ගන්න එපා......... මම බොහොම පිරිසිදු හැඟීමෙන් මේ දේ කියන්නේ........."

"කියන්නකෝ........."

“මම දැන් මෙහෙ ඇවිත් සති තුනකටත් වැඩියි......... වෙද
මහත්තයා මගේ ජීවිතේ බේරලා ගෙදර ගෙනත් ඊට පස්සෙ මාව
මාරයගෙ කටෙන් බේරගත්තා වගේ දහදුක් විඳලා බේරගත්තා.........
මට කන්න බොන්න දුන්නා......... මෙ ගෙදර නවත්තා ගත්තා.........
අද වෙනකල් වත් මට කිසි වෙනස් කමක් කළේ නෑ......... මටත් මල
විඳපු දුක සේරම අමතක උණා......... ජීවිතේ ආයෙ අලුතින් දකින්න
ඉඩ ලැබුණා වෙද මහත්තයගෙ කරුණාවයි යශෝධා මට
සහෝදරයෙකුට වගේ සලකන හින්දයි.
ඒත් දැන්, මම යන්න ඕන මෙහෙන්......... හැමදාම උණත් මෙහෙ
ඉන්න ආසයි......... ඒත් මෙහෙ ඉන්න බෑ......... ඒකත් වෙද මහත්තයලට
තවත් කරදරයක් කරන්න මම කැමති නෑ......... අනෙක් අතට මට
යන්න ඕන නිසා මට යන්න වෙලා තියෙනවා”

“මෙ අහන්න පුතා” වෙද මහතා මෙ යෞවනයා කෙරෙහි පැහැදී
ගියේ දැන් සැහෙන දිනක සිටය. පුතු සෙනෙහසක් වැනි යමක් ඔහු
ගැන තම සිතට දැනෙමින් පවතින්නේ යශෝධාද ඔහුට දැඩි ලෙස
ආදරය කරන නිසාමදැයි හෙතෙම විටෙක සිතුවේය. එහෙත් මොහු
අමුතු තරුණයෙකු බව......... සල්ලිකාරයෙකු බව පෙනෙන්නට
තිබුණද......... ඉතාම යහගුණ ඇති තරුණයකු බව ඔහුට පසක් වූයේ
වෙදමහතා මෙ තරුණයාව දිගටම නිරීක්ෂණය කල බැවිනි. ඒ
නිරීක්ෂණයේදී ඔහුගේ යහපත් ගති මිස නරකක් කිසිවිටක ඔහු
නුදුටුවේය. ඒනිසාම ඔහු ගැන ඉතාම පහන් හැඟුමක්......... පුතෙකුට
......... පුතෙක් සිටියා නම් ඇතිවන හැඟුමකට සමාන හැඟුමක්
වෙදමහතාගේ හදවතේ ඇතිව තිබිණ......... ඒ නිසාම ඔහු තෙත්නට
පුතායි ඇමතුවේය.

“ඔයා මෙ ගෙදරට ආවට පස්සෙ මම ඔයා ගැන බොහොම
හොඳට බැලුවා......... කොහන හැදුණත් ඔයා හොඳ දරුවෙක් වෙන්න
ඕන......... ලෙඩෙක් විදියට, සිහිසන් නැති ලෙඩෙක් විදියට ඇවිත්
ඔයා අද මේ විදියට ඉන්නවා දකින කොට ඒකෙන් මම ලබන
සතුට ඇත්තටම වචන කරන්න අමාරුයි. ඔයා සනීප වෙලා මෙහෙන්
යන්න ඕන ඒක ඇත්ත......... ඔයා මට මෙහෙ හැමදාටම ඉන්දගන්න
පුළුවන් කමක් නෑ......... ඒත් අද එහෙම ගියත් ඔයා යශෝධගෙ
හදවතේ ඇති කරපු සහෝදර කම වත් මගේ හිතේ ඇති කරපු
දරුවෙකුට සමාන හැඟීමවත් ඔයා ගියා කියලා වෙනස් වෙන්නේ
නෑ......... ඔයාට ඕනම වෙලාවක ඔයාට මේ ගෙදර දොර අපි ඇරලා





තියෙන්නේ......... ගියත් ඔයාට මම කොහොම වෙතත් යශෝධව
බලන්න එන්න වේවි” වෙද මහතා කීවේ මදහසක් නගමිනි.

“මම මේ ගෙදර ආයෙ කවදාවත් අමතක කරන්නෙ නෑ. මොකද
වෙදමහත්තයලා මෙහෙට ගේන ලෙඩ්ඩු සනීප කළාට ලෙඩෙක්
මරණෙන් ගලවගෙන සනීප කළේ පළමවෙනි වතාවට වෙන්න ඕන.
මටයි ඒ දේ උණේ. මමයි ඒ මරණෙන් ගැලවුණේ......... ඒක නිසා
මට මේ ගෙදරවත් ඔය දෙන්නවත් කවදාවත් අමතක කරන්න බෑ.........
ඒත් ඒක නෙවි වෙද මහත්තයා මම කියන්න ගියේ”

“එහෙනම්.........”

“අක්කෙක් විතරක් හිටි මට නංගිලා හිටියෙ නෑ. මම මගේ
නංගිලා විදියට සැලකුවෙ මගෙ මාමගෙ දුවලා දෙන්නා. ඒත්
යශෝධා හම්බ උණාට පස්සෙ මගේ නෑනලාටත් වඩා ළඟ නෑ
කමක් සහෝදර කමක් මට යශෝධා ගැන ඇතිවෙලා තියනවා.........
වරදවා තේරුම් ගන්න එපා මෙහෙම කියනවට. පුළුවන්කමක්
තියේනම් මම යශෝධා එක්ක කාලෙ ගත කරන්න ඕන නිසාම,
එයාට අයියා කෙනෙක් වෙන්න ඕන නිසාම මේ ගෙදරට එනවා.........
මේ ගෙදරට ඇවිත් ඔයාලත් එක්ක ජීවිතේ ගෙවනවා......... ඒත්
එහෙම කරන්න විදියක් නෑ......... මටත් මගේම ප්‍රශ්න වගයක් තියනවා
විසඳගන්න......... ඒක නිසා මට එකම එක දෙයක් කරන්න ඉඩ
දෙන්න යශෝධා වෙනුවෙන්”

“ඒ මොකක්ද පුතා?”

“මම මේ දේ කරන්නේ ඔයාලව හැල්ලු කරන්න නෙවි.........
මගේ ජීවිතේ බේරගත්තාටත් නෙවි. යශෝධා මම මගේම නංගි
කියලා හිතන නිසා”

“ඉතිං කියන්න?”

“මම හිතා ඉන්නවා යශෝධගෙ ඉගෙනීමේ වැඩ වලට ගන්න
පුළුවන් වෙන්න එයාගෙ පොතකට සල්ලි ටිකක් දාන්න”

“ඔයා මේ මොනවද කියන්නේ......... අපි සල්ලි බලාගෙනද.........”

“මම කිවනේ වෙද මහත්තයා......... මේ කිසි දෙයක් කියන්නේ ඒ
කළ දේවලට නෙවි කියලා. මම එයාගෙ අයියා නම් ඒ සහෝදර
කම නමට විතරක් තිබිලා මොකටද......... මගේ යුතුකම මම ඉෂ්ට
කරන්න ඕන. මට අමතක කරන්න බෑ යශෝධා එයාගෙ යාලුවන්ට
මම එයාගෙ අයියා කියලා අඳුන්නලා දෙද්දී ඒ මූණෙ තිබුණ සතුට
......... ඉතිං එහෙම එකේ එයාගෙ අයියට පුළුවන් වෙන්න ඕන

තමන්ගෙ නංගිට අතීත් අයට වැඩිය හොඳ විදියකට එයාගෙ අවශ්‍යතා සපුරන්න පුළුවන් ආර්ථික පසුබිමක් හදන්න......... මා ගැන වැරදියට නොහිතා මට යශෝධගෙ බැංකු පොතක් තියේනම් දෙන්න........"

නෙත්න ඉතා අහිංසක ලෙස එම ඉල්ලීම කරද්දී තවත් ඔහු සිත රිදවීම වැරදි යයි සිතූ වෙද මහතා මෙස ලාච්චුව හැර එහි වූ මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම් පොත ගෙන ඔහු අතට දුන්නේය.

"පුතා......... යශෝධට බැංකු පොතක් නම් තියෙනවා තමයි......... ඒත් ඒකෙ සල්ලි නැහැ......... මොකද මම වෙදකම් කරලා සල්ලි හම්බ කරන්නේ නෑ......... ලෙඩ්ඩු සතුටෙන් දෙන දෙයක් තිබුණොත් ගන්නවා මිස අපේ කුඹුරු වල බතෙන් බුලතෙන් යැපෙනවා මිස ස්ථිර ආදායමක් නෑ නොවැ......... ඒ නිසා දුවගෙ පොතට දාන්න මට සල්ලි හොයන්න බැරි උණා......... ඒත් ඒකයි මම එයාට හොඳට උගන්නන්න හිතුවෙ......... එයාවත් එයාගෙ අනාගතේ හදාගනියිනේ කියලා"

"වෙද මහත්තයා කරපු දේ හරි. අනෙක් එක මම දැන් දන්නවනේ කොහොමත් ඉතුරු කරන්න සල්ලියක් මේ ගෙදර ඉතුරු වෙන්නෙ නෑ කියලා. හරි......... බොහොම ස්තූතියි......... මම ගිහින් එන්නම්........."

එසේ කියූ නෙත්න අනුරාධපුරයට ගොස් ඔහුගේ බැංකුවට කතාකොට තමාගේ ගිණුමෙන් අනුරාධපුර ශාඛාවට මුදල් ගෙන්වා ගත්තේය. එසේ ගෙන්වා ගත් මුදල් රැගත් ඔහු මහජන බැංකු ශාඛාවට ගොස් යශෝධාගේ නමට රුපියල් ලක්ෂ තුනක මුදලක් බැර කළේය. එය කළ පසු ඔහුගේ සිතට දැනුණේ සුවිශාල සැහැල්ලුවකි. ප්‍රියලාල්ට උදව් කළාට පසු කිසිවෙකු වෙනුවෙන් යමක් කොට සතුටක් ලැබූ පළමු අවස්ථාව එය යැයි නෙත්නට හැඟිණ.

රාත්‍රී අඳුර දසතම අරක්ගෙන ඇත......... ඔහු තමා වැටුණු දිය ඇලේ යකඩ පාලමට හේත්තු වී කල්පනා කරන්නට විය. තමා හෙට හෝ අනිද්දා දින මෙම නවාතැනෙන්ද පිටවෙනු ඇත. තම මිතුරකු වූ අරුන් ගේ මවගේ නිවස කාලයක් තිස්සේ ඇත්තේ වසා දමා බැවින් එය තමා වෙනුවෙන් ඕනෑම කාලයක් සඳහා ලබා දිය හැකි බව අරුන් පවසද්දී නෙත්නට දැනුණේ සතුටකි. ඇමරිකාවේ මිතුරා දන්වා එවන තෙක් ලෝකයාගේ නෙතින් මිදී පාඩුවේ ඉන්නට තිබුණා නම් ඒ හොඳටෝම ඇතිය.





දැන් ඉතිං සියල්ලම නිමා වී ඇත. තවත් ඉතිං ජීවිතයෙන් කිසිවක් ඉල්ලිය යුතු නැත. අනෙක් අතට දැන් ඉතිං කිසිවක් අවශ්‍යද නැත.........

ඔබ මා හමුවේ නම්
එකම වතාවක් එකම කථාවක්
යළිත් කියන්නට
ඔබ මා හමුවේ නම්.........//
අතීතයට පිය මනිනු බැරි

ඒ පෙම් ඇහැනේ නටබුන්ද නැති
පිනි කඳුළක් සේ මැකී ගිහින්
සිතේ ඉතිරි වූ එකම කථාවක්
යළිත් කියන්නට
ඔබ මා හමුවේ නම්.........

සිනා පිරුණු නෙතු දකිනු බැරී
මා ඔබ හමු වූ මාවත වෙන්වී
මහ පවුරක් සේ නැඟී ඇවිත්
මුවේ පිපේ නම් එකම සිනාවක්
යළිත් දකින්නට
ඔබ මා හමුවේ නම්.........

නෙත්න නෙතු නැඟි කඳුළු හෙමිහිට පිසදා ගත්තේය.

"අයියා........." යශෝධා ඔහු අසල විය.

"නා.........ගී බබා" ඔහු සිනාසෙන්නට වෙර දැරුවේය.

"අඳුර පැත්තට හැරිලා ඇඹුවට අවධානෙන් ඉන්න කෙනාට පේනවා ඔයා අඬන බව"

"ඔයාට පිස්සු මම ඇඬුවේ නෑ"

"ඔයා කියන එක පිළිනොගෙන ඉන්න තරමට මම දැන් ඔයාව අඳුනගෙනයි අයියා ඉන්නේ......... ඒක නෙවී ඔයා අද හරි ලොකු වැඩක් කරලා නේද?"

"මොකක්ද?"

"මගේ පොතට සල්ලි දාලා......... ඇයි නෙත්නයියා එහෙම කළේ ......... මට මොකටද සල්ලි......... මට ඕන අයියා විතරයි......... හොඳ සහෝදරයෙක් විතරයි" යශෝධා කීවේ බිඳුණු හඬිනි.

"හොඳ සහෝදරයෙක් කවදාවත් තමන්ගෙ නංගී ගැන එයාගෙ අනාගතේ ගැන නොහිතා ඉන්නේ නෑ. මම දන්නවා. [illegible]

කියාගන්න බැරිව ඔය හිතේ කොච්චර ආසාවල් තියනවද කියලා, ......... එහෙම ලස්සනට අඳින්න, හිතෙන වෙලාවට ඇඳුමක් ගන්න......... හිතිච්ච ක්ලාස් එකකට යන්න......... ඒවා ඔය වයසේ හීන......... මම ඔය වයස පහුකරලනේ ආවෙ, දන්නවා මම. ඒත් අප්පච්චිට කරදර කරන්න බැරි නිසා ආසා දේවල් දැක්කත් නොදැක්ක ගානට ඔයා ඉන්න බව මම දන්නවා......... ඒත් දැන් එහෙම එපා......... හිතට හිතෙන ඕනම දෙයක් ගන්න, කන්න, අප්පච්චි එක්ක කොහේ හරි යන්න හිතුනම යන්න......... ඒ ඕනම දේකට ඔයා මේ සල්ලි පාවිච්චි කරන්න ඕන. මම ඔය වයසේ සුර සැප වින්දා......... මම ආසයි මගේ නංගිත් එහෙම සතුටෙන් ඉන්නවට. මට කියන්න තේරෙන්නේ නෑ......... මට දැනෙන්නෙම අපි දෙන්නම එකම අම්මෙක්ගෙ බඩෙන් ඉපදිලා කියලා......... මේ පුංචි කාලෙට ඔයා එච්චරටම මගේ හිතේ ඉඩ අයිති කරගෙන"

නෙත්න ද කීවේ හැඬුම්බර හඬකිනි. යශෝධා එක්වරම පැන නෙත්න වැලඳ ගත්තාය.

"නෙත්නයියා........." ඇය ඉකිබිඳිමින් හැඬුවාය. නෙත්න හෙමිහිට ඇගේ හිස අතගෑවේය.

"අඬන්න එපා......... මම කොහේ හිටියත් ඔයාට කතා කරනවා......... ඒකට තමයි වැඩියම තාත්තට මොබයිල් එකක් ගෙනත් දුන්නේ......... අනෙත් එක මේ රටේ හිටියොත් ඔයාව බලන්න හැම වෙලේම එනවා......... ඒක නිසා අඬන්න එපා......... මේ නෑ තම උපතෙදි නාවාට හරි ශක්තිමත්........."

නෙත්න හොඳින් සිටිනා බව දැනගත්තා විනා ඉන් අනතුරුව කිසිම විදියකින් ඔහු ගැන ආරංචියක් නොවීය. ඔහුගේ නික්ම යාම සැඟව යාම වික්‍රමසේකර නිවසට පමණක් නොව වික්‍රමසේකර සමූහ ව්‍යාපාරයට ද විශාල දුර් දසාවක්, දුකක් කනගාටුවක් ගෙන දී තිබිණ. නෙත්න සිටියදී සෑම දෙනම තුළ වූ උද්යෝගය අද කොතැනකදැයි නැති විය. විශේෂයෙන්ම වික්‍රමසේකර මහතා කලකිරීමටත් උදාසීන බවටත් පත්ව තිබුණේ සිතාගන්නටත් බැරි අන්දමිනි. තමාගේ දරුවන් අතරින් වඩාම දඟකාරයා, සුරතලා නෙත්න බව ඔහු දන්නේය. ඒ වාගේම නිවසේ හැමදෙනාගේ ආදරය ලබමින් ජීවත් වූ ඔහු මෙසේ නිවස හැර යාම නිසාම මේ තරම්





ධනයක් කා වෙනුවෙන් උපයන්නදැයි ඔහු නිතර නිතර කල්පනා කිරීමට පටන් ගත්තේය. නෙත්නගේ සියලුම ව්‍යාපාරවලද කටයුතු ආවේ ඔහු හිස මතට බැවිනි. ඒ කරදර එන්නට එන්නට ඒවාට මුහුණ දීමට තරුණ ජවයක් නොමැති තැන ඔහු දුර්මුඛ විය.........

සඳරූ පවා දැන් කාර්යාලයට යන්නේ ඉඳහිටය......... ඒ ගියද ඇය වෙනදා මෙන් උනන්දුවෙන් වැඩ නොකළාය. නිතර දෙවේලේ කල්පනා කිරීම දැන් ඇයගේ දෛනික පුරුද්දක් බවට පත්ව ඇතුවා මෙනි. මෙම සියලුදෙනා ගෙන්ම නියමාකාරයෙන් වැඩ කළේ පියුමි පමණි. මේ අවස්ථාවේ ඇයද නොසිටියානම් රෙදිපිළි ප්‍රදර්ශනාගාරය වසා දැමීම පවා සිදුවීමට ඉඩ තිබිණ. මන්ද මේ සියලු බර කරගැසීමට හුරු පුරුදු කෙනාම සිටිය යුතු බැවිනි.

මීතුරාගේ නිවසට පැමිණි පසු නෙත්ට වැඩි හරිය කාලය ගත කළේ චිත්‍ර ඇඳීමෙනි. නිවස බලාගන්නා ජේම්ස් ඔහුට යමක් පිළියෙළ කරදෙන අතර එක් වේලකට හෝ දෙවේලකට එයම ආහාරයට ගන්නා නෙත්න වත්ත පහලට ගොස් චිත්‍ර අඳින්නට පුරුදු විය. එසේ නැති වෙලාවට ඔහු කල්පනා කරමින් වත්තේ ඒ මේ අත ඇවිද්දේය. සමහර දිනක යශෝධාට කථා කළේය.

හදවතේ පැන නැගුණු තුවාලය......... තුවාලයේ වේදනාව අකා මකා ගන්නට ඔහු එසේ කාලයෙන් පිලියම් සොයමින් සිටියේය. ඔහුට ඒ අතරේ නිවස සිහිවිය. සඳරූ......... මාලිංග පියුමි......... එපමණක්ද ගිම්හාන පවා සිහිව එයි......... සමහර විට ඔවුනට තිබූ බාදකය ඉවත්වීමෙන් දැන් ඔවුන් සතුටින් සිටිනවා විය යුතුය. දැන් ඔවුන්ට අවහිර කරන්නට ඒ ගැන සොයන්නට කිසිවෙකු නැති බැවිනි.........

සඳරූ තමාට එතරම් තද පරුෂ ලෙස සැලකුවේද ඇයට මෙයින් ගැලවීමක් ලබාගැනීමට ඕනා වූ නිසා විය හැක. එහෙත් ඇය කළ දෙය.........? එය කිසිදාක තම සිතින් අමතක නොවනු ඇත......... කාලය ගෙවෙමින් තිබිණ......... දිනක් මාලිංගට කතා කළ යුතු යැයි සිතුනෙන් නෙත්න ඔහුගේ අංකයට ඇමතුමක් ගත්තේ විස්තර විමසීමටය.

"මචං......... මාලිංග........."

"ඒයි......... නෙත්න......... උඹ......... උඹ කොහේද......... ඇත්තම වරෙන් ......... අංකල්ට සීරියස්"

"මො.........ක.........ක්.........ඇයි.........තාත්තිට........."

"හාට් ඇටෑක් කියලා ඩොක්ට කියනවා......... මචං......... උඹ පුදුම වෙලාවට ගත්තේ......... මේ අපි දැන් හොස්පිටල් එකේ......... උඹ කොහේ හිටියත් පටස් ගාලා වරෙන්......... අංකල් උඹව අහනවා........."

මාලිංග කථා කරන්නේද දුවමින් මෙන් බව වැටහුණ නෙත්ත භයෙන් භ්‍රාන්ත වූවා සේ සිටි තැනම මොහොතක් හිඳ දෙයියනේ......... තාත්තිට මොකුත් උණොත්.........නෑ.........නෑ.........එහෙම නෑ......... එහෙම වෙන්න විදියක් නෑ........."

නෙත්ත යන අතරේ ද කිප වරක්ම මාලිංගට කථා කළේ ගැහෙන හදවතිනි. වැඩිපුර යමක් නොකියූ ඔහු කියන එකම දෙය "උඹ බය නොවී වරෙන්........." යන්නය. එහෙත් එහිම ඇත්තේ බය වීමට තරම් දෙයකියි නෙත්තට සිතිණ.

පැය කිපයක ඇවෑමෙන් ඔහු කැන්ඩි නර්සිං හෝම් වෙත ළඟා විය. නෙත්ත කඩා බිඳ ගෙන දිව ආවේ තමා මෙතෙක් දිනක් මොවුන්ගෙන් ඈත් වී සිටි බවද අමතක කරමිනි. ඔහු එද්දී පියා ප්‍රතිකාරවලින් පසු කාමරයට ගෙනවිත් තිබිණ. ඔහු වහ වහා කාමරය වෙත දිවවිත් එක්වරම උළුවස්ස මත මොහොතක් නතර විය සියල්ලෝම ඔහු දෙස හැරී බැලුවේ එක් වරමය.

"පුංචි පුතා.........??"

"මල්ලි.........?" සැම දෙනාගේ මුවින් නිකුත් වූ ප්‍රීතියේ රාවයකි. නෙත්ත අවට කිසිවෙකු දෙස නොබලාම පියා අසලට ගියේය. ගොස් ඇඳ අසල දණගසා ගත්තේය. ඒ වන විට ජීවක මහතා යම් කිසි මද සුවයක් ලබා තිබිණ......... ඔහු තම අත් අල්ලාගත් අත කාගේදැයි ඉවෙන් මෙන් හඳුනා ගත්තාසේ හෙමිහිට දෙනෙත් හැර බැලුවේය. තම බාල පුතා තමා අසල සිටිනු දුටු ඔහුගේ මුහුණේ මන්දස්මිතයක් වැන්නක් ඇඳී ගියේය. පියා කථා කරන්නට උත්සාහ දරනු දුටු රොෂාන් එයට ඉඩ නුදුන්නේය.

"තාත්ති......... දැන් මල්ලි ආවනේ......... දැන් ඉතිං සේරම හරි......... තාත්ති ඉක්මනට සනීප වෙන්න........."

"ඔය ලෙඩාට අමාරුව තාම අඩු නෑ......... ඔයාලා ඇඳ වටේ ඉන්න එපා.........එයාට ඉන්න දීලා එළියට යන්න" හෙදියක් කියද්දී සැම දෙනාම පාහේ එළියට ගියෝය. නෙත්තද යන්නට සිතා පියා වෙතින් අත ඉවතට ගනිද්දී පියා බොහෝ අමාරුවෙන් එපායැයි කියන්නට හිස සෙලවීය. නෙත්ත එතැනම නැවතිණ. තමාට කිසිවක් කියන්න පියාට ඕනෑකම ඇතැයි නෙත්ත සිතුවද ඔහුට කථා කිරීම හොඳ නැත.





"තාත්ති......... දැන් මම ආවනේ......... දැන් ඔයා ඉක්මනට සනීප වෙන්න......... අපි පස්සෙ කථා කරමු........." එසේ කියූ නෙත්ත එළියට ආවේය. ඔහු එළියට එනු බලා සිටි අක්කා ඔහු වෙත පැමිණ මදක් එහායින් සිටි මව පෙන්වූවාය.

"අන්න ඔයාට පේනවද......... ඉකිගගහ අඬන හැටි......... එයාට එයාගේ බාල පුතා කලේ හරි දෙයක් නෙවි. දැන්වත් ගිහින් කතා කරන්න......... තව ටිකෙන් එයාවත් එහා කාමරේ ඇඩ්මිට් කරන්න වෙනවා"

නෙත්ත හෙමි හෙමිට මව දෙසට ගියේය.

"අ.........ම්.........මී" නෙත්ත මව පිටුපස සිටගෙන කියද්දී එක්වරම හඬාගෙන නෙත්තව බදා වැළඳ ගත් මව ඉකි ගසමින් හඬන්නට වූවාය.

"අනේ......... රත්තරං.........මේ අපිට දුන්නු ගින්දර මොකක්ද......... අපි ඔයාට මොන වරදක් කළාද......... ඇයි මෙහෙම දුකක් අපිට දුන්නේ......... බලන්න ඔයා නිසා ඔයා ගැන හිතලම තාත්ති ලෙඩෙක් උණා......... ඔයාගෙ තාත්ති කොහොම හිටි කෙනෙක්ද......... කඩියෙක් වගේ දුව දුව වැඩ කළා......... ඔයා ගියදා ඉඳලා තාත්ති කල්පනා කරලා ලෙඩ උණා......... ඇයි මෙහෙම උණේ......... ඇයි මෙහෙම කළේ.........?"

"අම්මී......... මම දැන් ආවනේ........."

"ආවට වැඩක් නෑ......... මට පොරොන්දු වෙන්න......... ආයෙ අපි දාලා යන්නෙ නෑ කියලා පොරොන්දු වෙන්න........."

"අම්මී........."

"මම දන්නවා ඔය හදන්නේ හේතු කියන්නද......... ඔයාට ඔයාගෙ අම්මා ජීවත් වෙන්න ඕන නම් මට කියන්න ආපහු කොහේවත් යන්නෙ නෑ කියලා........." මව වේගවත් ස්වරයෙන් කියමින් හැඬුවාය. නෙත්තට බිය දැනිණ.

"නෑ.........අම්මී......... ඔය දෙන්නා දාලා මම කොහේවත් යන්නේ නෑ........."

"මගේ පුතා........." මව යළි ඔහුව වැළඳ ගත්තේ මහ හඬින් හඬමිනි. නෙත්තටද දැනුණේ දැඩි වේදනාවකි......... තමා නැති ශෝකය තම පියාට මේ තරම් බලපාතැයි ඔහු කිසි දිනක සිතා නොතිබිණ. මන්ද තමා බොහෝ කාලයක් සිටියේද ඔහුගෙන් වෙන් වී බැවිනි.........එහෙත් දුරස්ව සිටි කාලයේ පවා දරු සෙනෙහස ඔහු වෙතින් ගිලිහී ගොස් නැත......... එය වඩ වඩා ශක්තිමත් වී ඇතුවා

මෙනි. දරුවන්ට ආදරය පාන්නට වෙලාවක් නැති වුවද පියා තමනට කොතරම් ආදරය කරන්න ඇද්දැයි නෙත්නට සිතිණ. ඔහු මෙසේ සිත සිතා සිට බොහෝ වේලාවකට පසු මව වෙතින් මිදුණේය.

"දැන් අම්මිලා ගෙදර යන්න........ මම ඉන්නම් තාත්ති ළඟ........"

නෙත්න කියද්දී ඔහු වෙත ආ අවන්ත" නෑ මල්ලී ඔයා අම්මිලා එක්ක ගෙදර යන්න........ මම ඉන්නම්........ අම්මිලාට ඔයා එක්ක කතා කරන්නත් ඕන ඇති........" යි කිවේය.

"කතා කරන එක කවදා කරන්න බැරුවද........ මට තාත්ති එක්ක ඉන්න ඕන........ ප්ලීස් ඔයාලා යන්න" නෙත්න කියද්දී රොෂාන් අන් අයට ඉඟි කළෙන් සැම දෙනම යාමට පිටත් විය. එහෙත් මාලිංග ඔහු හා නැවතිණ.

"උඹ යන්නෙ නැද්ද........?"

"නෑ........ මාත් ඉන්නවා"

"ආන්ටිට කොහොම දැන්........?"

"තිබුණට වඩා හුඟක් හොඳයි. දැන් සාමාන්‍ය විදියට ඉන්නවා........"

"උඹ ඔහොම හිටපං........ මම තාත්ති නිදිද බලලා එන්නම්"

කාමරයට එබුන නෙත්න පියාට නින්ද ගොස් ඇති වග දැන යළි එළියට පැමිණ මිතුරා අසල පුටුවේ අසුන් ගත්තේය.

"ඉතිං කොහොමද ජීවිතේ මල්ද........?" මාලිංග ඇසුවේ ඇණුම් පදයක ස්වරයෙනි.

"මල්........ නේද........ නැත්තෙමත් නෑ........"

"උඹ ඉතිං දින 56 ක ලංකා සවාරියක් නිමකරලා ඇවිත් ඉන්නේ ........ මොන මොනවා හරි එක්ස්පීරියන්ස් නැතෑ. කියපං බලන්න තරඟ ආරම්භයෙ ඉඳලා"

"තරඟයක් නම් එකට වැඩි ගානක් ඉන්න ඕන මචං........ ඒත් නොදැනුවත්කමට මම සවාරියට සහභාගි වෙලා තිබුණේ තනියම........ ඉතිං ඒ සවාරිය මම තනියම ගියා........ආයෙ කවදාවත් එන්න නම් හිතුවෙ නෑ. උඹේ කෝල් එක නොවෙන්න........"

"උඹත් යාලුවෙක්ද බං........ දවස් 56 කට පස්සෙද මාලිංග කියන නම උඹේ මොබයිල් එකේ තියන බව උඹ දැක්කේ........ මීට කලින් කථා කළා........ ඒ කලෙත් මට නෙවි........ ප්‍රියලාල්ට........ මොකක්ද වෙනස........?"

"වෙනස උඹට දැනගන්නම ඕනද........ එහෙනම් අහපං........ මම උඹව මගේ හදවතේ ඉන්න එවුන් අතරට දාපු එක........ අම්මි, තාත්තිට වගේම උඹටත් කතා කරන්න මට ඕන උණේ නෑ........ මොකද හිත හදාගන්නෙ උඹලා හැමෝගෙන්ම වෙන් වෙන්න නම්........ උඹලා එක්ක කතා කරලා හිත දුර්වල වේවි කියලා බය තිබුණා........ ඒත් ප්‍රියලාල් එහෙම නෙවි........ උඹට වඩා හිතට දුරින් ඉන්නේ........ ඒකයි වෙනස"

"ඒත් අද ඇයි එහෙනම් කතා කළේ........?"

"දන්නෑ බං........ ඒක නිකං පුදුමයක්........ සමහරවිට නොපෙනෙන බලවේගයක් කළා වගේ........"

"කොහොම උණත් උඹ කතා කළ එක හොඳයි. නැත්නම් අංකල් උඹ ගැන හිතලම මැරිලා යන්න තිබුණා" මාලිංග තරහෙන් කියද්දී නෙත්නගේ දෙනෙතට කඳුළු පිරුණේය. මිතුරාට දුක සිතුණ බව දුටු මාලිංග නෙත්නගේ දණහිසට අත තැබීය.

"අමතක කරපං........ මම උඹට රිද්දන්න කිවා නෙවි........ මගේ හිතේ දුකට කිවා මිස" මිතුරාගේ හදවතේ තුවාලයේ ගැඹුර දන්නා මාලිංග ඔහු සැනසවීමට උත්සාහ කළේය.

"මම දන්නවා, මේ ගෙවිලා ගිය කාලයෙන්ම මට තේරෙනවා උඹ හරි තද දරුණු තීරණයක් අරන් කියලා........ ඒත් මම පිළිගන්නවා උඹ ගත්ත තීරණේ හරි කියලා........ තුවාලෙ හැටියට බෙහෙත පැරකම වැඩිවෙන්න ඕන........ නැතිනම් තුවාලෙ හොඳ කරන්න බෑ........ උඹ ගත්ත තීරණේ දරුණු නැත්නම් උඹ මෙච්චර කල් ඔහොම කාගෙවත් ඇහැට නොපෙනී ලෝකෙන්ම වහන් වෙලා ඉන්නේ නෑ........ ඒත් මම දන්නේ කථාවෙ එක පැත්තක් විතරයි........ මට කියපං මොකද උණේ කියලා........" මාලිංග විමසද්දී එදින සැන්දෑවේ සිටම අද දක්වා සිදු වූ සියලුම දේවල් නෙත්න මිතුරාට පැවසීය. මාලිංග ඒ කථාව අසා උන්නේ සුරංගනා කථාවක් මෙනි........

"ඕ........නෝ........ඕ........මයි ගෝඩ්........ එතකොට උඹ බේරිලා තියෙන්නේ අනූ නවයයි දශම නවෙන්........ අර කෙල්ල නිසා........ ඒ කෙල්ල නොදැක්කා නම්........ ඕ........ නෝ........" මාලිංග තිගෙව ගතද හිරිවැටී යද්දීය.

"උඹ දන්නවද උඹ මැරුණා නම්........ මේ ගෙදර තව කී දෙනෙක් මැරෙයිද?" මාලිංග කියද්දී නෙත්න සිනාසුණේය.

"ඔව්........ තාත්ති මැරිලා යාවි........"

"ඒ විතරක් නෙවි........ තවත් අය දුක් විඳිනවා"

“මම දැන් ඕවා හිතන්නෙ නෑ........ මම උපන්නේ අලුතින්. වෙද මහත්තයයි යශෝධයි මට අලුත් ජීවිතයක් දුන්නේ ඇත්තමයි මාලිංග මට දැන් හරිම ආසයි මේ සේරම අතෑරලා ගිහින් ඒ අය එක්ක ජීවත් වෙන්න........ ඒක හරිම ශාන්ත ජීවිතයක්........ මේ කලබලේ........ එහේ කොහේද නෑ........”

“මට තේරෙනවා උඹ ඒ ජීවිතේට මනසින් ගිහින් කියලා........ ඒත් උඹට වගකීම්වලින් පැනලා යන්න බෑ නෙත්ත. අංකල්ට බැරි උණා උඹේ බිස්නස් හැන්ඩ්ල් කරන්න. මේ සේරම කොහොම කරන්නද........ ඒවා හිතලා තමා අංකල් ලෙඩ උණේ........ පුතෙක් තාත්තා ළඟ ඉන්නම ඕන කාලෙ එයාට ශක්තියක් වෙන්න ඕන කාලෙ උඹ එයා දාලා ගියා........ බිස්නස් පාඩු උණා........ අංකල් මානසිකව ගොඩගන්න එක........ උඹට ඒක කරන්න වෙනවා. එහෙම නැතිව ප්‍රශ්නවලට බයේ, තමන්ට බයේ ප්‍රශ්නවලින් බේරිලා, ගිහින් මැදවච්චියට හැංගෙන්න බෑ උඹට........ මේ ගෙදර ගැන අංකල් ගැන හැඟීමක් තියේනම් හෙට පලයං ආපහු ඔෆිස්........ අනෙත් එක අකමැති උණත් මම මේ කියන එකත් අහපං........ සඳරු කරපු දේ වැරදි තමයි........ ඒත් එයා ඒකට ජීවිතෙන් වන්දි ගෙවන්න ගියේ. අද වෙනකල් මේක ගෙදර කවුරුත් දන්නේ නෑ........ ස්ලීපින් ටැබ්ලට්ස් අරගෙන........ හොඳවෙලාවට පියුමි කාමරේට යද්දි අහු උණේ........ ඒත් සෑහෙන්න බීලා........ අපි වකුගුඩු අමාරුව පිට දාගෙන එයාව හොස්පිටල් ඇඩ්මිඩ් කළා........ ඩොක්ට භාරගන්න හිට බෑ කිව්වා තත්ත්වෙ සීරියස් කියලා........ පස්සෙ අපේ ජයකොඩි අංකල් තමා ඩොක්ටට ෆෝන් කරලා කිව්වේ........ අපිට සෑහෙන්න බැන්නා ඩොක්ට........ අන්තිමට සතියක් හොස්පිටල් ඉන්දගෙන හිටියා........ මමයි පියුමියි විතරයි දන්නේ. අපි මේ වැඩ අස්සෙ එයාවත් බලාගත්තා........ ගෙදරට කිව්වා බෙහෙත් අරන් දීලා ගමේ යැව්වා කියලා........” මාලිංග කියද්දි නෙත්න සසල වුවද ඔහු ඒ බවක් නොපෙන්වීය.

“ගෑනුන්ගෙ මායම්........” ඔහු අවසන කීවේය.

“උඹේ හිතට ඇත්තටම ආවේ ඕක නෙවෙයි කියලා මම දන්නවා........ කමක් නෑ උඹේ හිත හැදෙන කල් උඹ ඔහොම ටිකක් උඹවම රවට ගනින්........ ඒක එච්චර හානියක් නෑ........” මිතුරා කියද්දි නෙත්න ඔහු දෙස බැලුවේ විමසුම් බැල්මකි.

“උඹ හිතන්නේ මම මේ එකක් හිතාගෙන තව එකක් කියනවා කියලද?”





“මම හිතන්නේ........? මම හිතනවා නෙවි බං........ මම දන්නවා........ ත්ම හරි........ යමං බලන්න ලෙඩාට කොහොමද කියලා........”

රෝහලේදී සඳරු මුල්වරට මුණ ගැසුණු නෙත්නට මේ ඇයමදැයි ප්‍රථම නොවී බැරි විය. ඇය ඒ තරමට කෙට්ටු වී ඇස් ගිලී ගොස් මලානික වී සිටියාය. සඳරු ද නෙත්න දුටු මොහොතේ නැතිගත් බව මනුට වැටහිණ. ඇය එක්වරම බිම බැලුවාය. දෙදෙනාට මේ දැනෙන අපහසුව නිතර දකිද්දී අඩු වී යා හැකි යැයි නෙත්නට හැඟිණ........ මන්ද නිතර නිතර මුහුණ දෙද්දී ඕනම දෙයක් සාමාන්‍ය දෙයක් වෙන බැවිනි........

ප්‍රියා යළි නිවසට කැඳවා ඒමෙන් පසු මවගේ කාලය පියාගේ කටයුතු වෙනුවෙන්ම වැය උණාය. දිනක් සඳරු කාමරයට කැඳවා ගත් ප්‍රියා කන්තෝරු කාමරයේ වූ ලිපිගොනු කීපයක් ඇය අතම කාමරයට ගෙන්වා ගත්තේය.

“දූ සඳී........ දැන් ඉතිං මම මේ කියන්න යන දේ හොඳට අහගන්න........ මොකක්දෝ අපල කාලයක් උදා උණා වගේ පහුගිය කාලෙ ගෙදරටයි බිස්නස්වලටයි හරියට කරදර ආවා........ ඩොක්ට මට මග දිගටම කීවේ ටික දවසකට රෙස්ට් කරන්න කියලා. ඩොක්ට නොකිවත් ඔයාගෙ නැන්දම්මාගෙන් අහන්නේ නැතිව මට දැන් ඇඟිල්ලක්වත් ගහන්නත් බෑ........” ප්‍රියා කීවේ මව දෙස සිනාසෙමින් බලමිනි. ප්‍රියන්තා මහත්මිය බොරු තරවටු බැල්මක් සැමියා දෙසට හෙලුවාය.

“දැන් ඉතිං උණු දේවල් වෙලා ඉවරයි කියලා අපි ආයෙ පුරුදු විදියට වැඩ කරන්න ඕන. දැන් ඉතිං සුදු පුතා එයාගෙ වැඩ එයාට ඕන විදියට කරගන්න නිසා මගේ වැඩ විතරයි ඉතුරු........ මේ තියෙන්නේ අපේ බිස්නස්වලට තියෙන සේරම වැදගත් තොරතුරු........ මුදල් තත්ත්ව........ ඒ හැමදේම එකින් එක මේවගෙ තියනවා. දැන් ඔයා කරන්න ඕන මේ සේරම හොඳට කියවලා බලන එක. එතනින් එහාට මැනේජ්මන්ට් එක ඔයාට භාරයි........ ඒක කරගෙන යන්නත් ඔයාට භාරයි. සම්පූර්ණ මගේ මුලු බිස්නස් එකම මම අද ඔයාට භාර දෙනවා........ මට විශ්වාසයි ඔයාගෙ දැනුමයි බුද්ධියයි දක්ෂතමයි තුනම එකතු උණාම ආයෙ අපේ බිස්නස් තිබුණා වගේ දෙගුණයක් දියුණු කරන්න ඔයාට පුළුවන් කියලා”

"ඒත් තාත්ති මම කොහොමද මෙවා භාරගන්නේ......... මම කවද......... මේ පවුලෙ දරුවො හතරදෙනෙක් ඉද්දි මට මේ මැනේජ්මන්ට් එක දුන්නම එයාලා මොනවද නොහිතන්නේ......... අනෙත් එක මේ තරම් ලොකු දෙයක් කරන්න මට ඇනුමක් නෑ........."

"ඒ ඇනුම මම ඔයාට ඇන් දුන්නා. මේ ෆයිල්......... අනෙත් එක ඇනටම ඔයා සියේට හැටක විතර කොටසක් බොහොම අපූරුවට සැහෙන කාලයක් කළා......... මට මගේ දරුවෝ තරමටම ඔයාව විශ්වාසයි. මේ බිස්නස් සේරම හොඳින් කරන්න පුළුවන් බවට ඊටත් වඩා විශ්වාසයි......... මගේ ආශිර්වාදය ඔයාට තියනවා ආ......... මෙක අරගන්න........." එසේ කියමින් විශාල යතුරු කැරැල්ලක්ද ඇය වෙත පෑවේය.

"පොඩි පන්තිවල ඉගෙන ගන්න කෙනෙක් එකපාරටම කැම්පස් එකට ගෙනිහින් දැම්මා වගේ මට හිතෙන්නෙ තාත්ති........, ඒත් මාව විශ්වාස කරලා දීපු මේ වගකීම නුවර ඉන්න ප්‍රධානම ව්‍යාපාරිකයගේ ව්‍යාපාරය තිබුණ තැනට ගේන්න මම උපරිමයෙන් උත්සාහ කරන්නම් ......... හැබැයි ඒ හැම තැනදීම තාත්ති මගේ පිටිපස්සෙ ඉන්න. තාත්ති මේ බිස්නස් එකේ මොළය වෙන්න......... මම ශක්තිය වෙන්නම්......... තාත්ති දෙයියන්ගෙ පිහිටෙන් සනීපවෙලා එනකල් මම මේක තාත්තිගෙ නියෝජිතයා විතරක් වෙලා බලාගන්නම්........."

සඳරු කියද්දී වික්‍රමසේකර මහතාට හිනා ගියේය. සඳරු ඔහු මුහුණ බැලුවේ විමතියෙනි.

"ඇයි තාත්ති?"

"ඔයා හරියට මේක කියන්නේ රාම කුමාරයා වන වාසේ ඉවරකරලා එනකල් භරත අයෝධ්‍යාව පාලනය කළා වගේ කරන්නනේ......... එහෙම එපා දුව......... තීරණ ගන්න වෙන ඕනම වෙලාවක ස්වාධීන තීරණ ගන්න. බිස්නස් කියන්නේ ක්‍රීඩාවක්......... ගේම් එකක්. ඒකෙදි අපි දිනන්න පුළුවන් වගේම පරදින්නත් පුළුවන්. ඒත් තරග වැදීම හරි අවශ්‍යයයි. අපි එක්ක ගැටෙන්න ගොඩක් කම්පැනි ඉන්නවා. ඒ අය එක්ක තරගෙදි හිත හිතා ඉන්නේ නැතිව තීරණ ගන්න වෙනවා......... කුට්ටමේ කොලයක් අදිනවා වගේ......... ඒකෙදි අපට මුලින් ප්‍රතිඵල පේන්නේ නෑ......... හරියටම කොලේ හරිපිට පේන්නේ නෑ වගේ......... ඒත් ඉව කියන එක බිස්නස්වලදි හොඳ අත් උදව් කාරයෙක්......... ඒ වගේ තීරණයක් ගන්න වෙලාවට ඔයා මේ ගෙදර ඉන්න මගෙන් ඇවිත් ඇහුවොත් තාත්ති මොකක්ද





හොඳම තීරණය කියලා මට හරියට කියන්න බැරි වේවි. ඒත් මෙතනින් එහාට සමාජය එක්ක, තරගකාරයො එක්ක ගැටෙන ඔයාට හොඳ ඉවක් තියනවා කෝකද හරිම දේ කියලා......... මොකද මෙයාර්ජ් ටාකට් එකට යාමෙ ඉඳලා අතින් හැමදේම තියෙන්නෙ ඔයාගෙ අතේ නිසා......... අන්න ඒ වෙලාවට අර ඉව අතින් දන්න, විස්තර එක්ක ඔයාට හරි තීරණය පෙන්නාවි. අනෙත් එක තමයි ලොකු නිලධාරියා වගේම කුඩා සේවකයා ගැන පූර්ණ අවධානෙන් ඉන්න එක......... මොකද උෟරු මීයො වගේම බටු මීයොත් භෝග හානි කරනවා......... ඒ වගේමයි බිම වැවෙන කොයි පැලෑටියත් ගහක් උණත්......... කොයි යම්ම ලෙඩකට හරි බෙත් ඖෂධයක්......... කවදාද කොහොමද ඕක වෙන්නෙ කියලා අපට තීරණය කරන්න බෑ......... ඔයාට තේරෙනවනේ මම කිව දේ........."

"ඔව් තාත්ති........."

"හරි දැන් යන්න......... මම අවශ්‍ය හැම තැනකටම දන්වලා තියෙන්නේ මම වෙනුවට ඔයා එන බව......... දැන් ඉතිං පටන් ගන්න........." තවත් වදනක් හෝ නොදෙඩූ සඳරු පියාටද මවටද වැඳ එතැනින් නික්ම ගියාය.

"ඔන්න බලන්න ශ්‍රියන්තා පොඩි බටු කෙල්ලක් ඉස්සරහදි කරන වැඩ" ඔහු තම බිරිඳට කීවේය.

"ඔයා වැරදි තීරණයක් ගන්නෙ නෑ කියලා මම දන්නවා......... ඒත් එයාට අත්දැකීම තියනවද?"

"ශ්‍රියන්තා......... මමත් බිස්නස් පටන් ගනිද්දී මොකුත්ම අත්දැකීම නැති කෙනෙක්........."

"හ්ම්........." ඇය හිසවනා සැමියා පිළිගත්තේය.

# 30

නුවර අහසට පසළොස්වක සඳ නැග දෙතුන් වරක් බැස යද්දී කාලය ගෙවී යමින් තිබිණ. නෙත්න කීප වරක් මැදවච්චියට ගොස් යශෝධා බලා පැමිණියේය. ඒ අතරේ නස්රිනා නෙත්න හා නිතර කතා බහ කරමින් ඔහුට බොහෝ විට කීවේ වූ දේවල් අමතක කොට සඳරු ගැන සිතන ලෙසය. එහෙත් එවදන්වලට සිත යොමන තත්ත්වයක නෙත්න නොසිටියේය.

"එයාට එපා නම් මටත් එපා නස්රිනා......... මගේ කල දවස හොඳින් ගෙවෙනවා"

"මගේ යාලුවා, නොදන්න අයට බොරු කිවට යාලුවන්ට කියන්න එපා......... තේරුණාද" මෙලෙස නස්රිනා, මාලිංග හෝ පියුමි සමග කථා බහ කරමින්ද ප්‍රියලාල් හා වැඩ කරමින්ද නෙත්න සියලු සිදුවීම අමතක කිරීමට උත්සාහ ගනිමින් සිටියේය. එහෙත් සඳරු දකින හැම විටකම කොහේදෝ නැති වේදනාවක් දුකක් ලෙසට හෝ තරහක් ලෙසට ඔහු හදට ආවේය. දුකක් ලෙස ඇය දකින විට ඔහු වේදනා වින්දේය. කාටත් රහසේ වේදනා වින්දේය. එහෙත් තරහක් වී ඇය පැමිණෙන කල ඔහු ඇයට රිදෙව්වේය.

එක් දිනක් සඳරු කාර්යාලයේ වාඩි වී චෙක් කීපයකට අත්සන් තබමින් සිටිද්දී ලිපිගොනුවක් රැගෙන එහි ආ කමල්,

"මැඩම්......... මියුනිසිපිලිටි එකේ ටෙන්ඩර් ගන්නවා කටුගස්තොට අර ලොකු පාලු ඉඩම විකුණන්න. ඒකෙ අක්කර අටදහයක් විතර මහ විශාල එකක් ගන්න ඇත්නම් හතර මහ නිධානෙ පහල උණා වගේ තමා.........මෙන්න මේකෙ සේරම විස්තර තියනවා......... හැබැයි කෝටි ගානක වැඩක්......... තව කට්ටි ගානක් මේක ගන්න පොරලු."

"කමල් මොකද කියන්නේ......... අපි මේක ගමුද?"

"ගන්න ඇත්නම්......... නම් හරි ශෝක් මැඩම......... ඒත් ඉතිං අනිත් අයත් අතාරින එකක් නෑ වැඩේ......... මැඩම් තව රහසක් තියනවා කියන්න........."



"ඒ මොකක්ද.........?"

"මනුමි මැඩම්ගෙ තාත්තා ඕක අත යටින් කවද ප්‍රයිවෙට් කොන්ත්‍රාත් කාරයෙකුට අරන් දෙන්න යනවලු"

"ඇත්තද......... ඔව් ඉතිං දමේ වැඩේ පහෙන් කරලා ඉතිරි පහ බෙදාගන්න බැරියැ........."

"මොකද මැඩම්......... අපි ආනවද අත.........නැතිනම් නිකා ඉන්නවද?"

"ට්‍රයි එකක් දීලා බලමු. කවද අපට තරගයක් දෙනවා නම් දෙන්න ඉන්නේ......... කෝදාගොඩ කම්පැනි එකයි පෙරේරා කම්පැනි එකයි නේද.........?"

"ග්ම්......... ඔව්......... අර කොන්ත්‍රාත්කාරයට අතයටින් ගියේ නැත්නම්........."

"ඒක වෙන ප්‍රශ්නයක් නේ......... අපි මේකට ට්‍රයි කරමු......... වැඩක් කරන්න ඕන කමල්......... ඔයා අල්ලගන්න ඕන මොන විදියෙන් හරි ඔය කම්පැනි දෙකේම අඳුරන දෙන්නෙක්"

"අපෝ ඉන්නවා මැඩම්......... ඕන තරම්........."

"හරි ඒ හරහා ඔෆිස් එකේ ටෙන්ඩර් එක හදන කෙනා ළඟට අත දාන්න ඕන. කොහොමද කරන්න ඕන කියලා කියන්න ඕනෙ නැනේ......... කමල් පොඩි ට්‍රයි එකක් දාන්න......... මොනවා කරත් හැමෝම ඕක අන්තිම දවස වෙනකල් රහසක් විදියට තියාගනිවි......... හරියටම අන්තිම දවස වෙනකොට ගාන දැනගන්න........."

"හොඳයි මැඩම්........."

සඳරු කමල් හා කථා කොට පිටත් කොට හැරීමෙන් පසු ඇය තනිවම කල්පනා කළාය. තමා කරන්නේ හරි දෙයක්ද......... ඒත් මේ සමාගම දෙකම නොයෙක් අවස්ථාවල නොයෙක් වංචාවල් සිදුකොට තමනට කොතෙක් නම් පාඩු කළාද......... ඒ නිසා මේ ආවේ තම වාරය විය හැක......... කෙසේ හෝ එය කළ යුතු යැයි තීරණය කරගත් ඇය ලිපිගොනු සියල්ල දෙවන වරටත් පරීක්ෂා කොට අත්සන් කිරීමෙන් අනතුරුව අදාළ අංශවලට යැවීමට කමල්ට භාරදී සරසවි යාමට පිටත් වී ගියාය.

පසුගිය දින කීපයේම ගිම්හාන සරසවි නොපැමිණියෙන් සඳරු හා සේමිනි බලා උන්නේ ඔහු එන තුරුය. ඇතදිම ඔහු එනු දුටු සඳරුට දැනුණේ සතුටකි......... මන්ද තමන් දෙදෙනා පමණක් සිටින විට පාලු දැනෙන බැවිනි.

දින රහිත නිවාඩු දාන්නේ.........?"

"මොකද මේ හිටි ගමන් දින රහිත නිවාඩු කියන්නේ මෙවට.........

"දින රහිත නෙවි......... පඩි රහිත නිවාඩු
හොඳටම උණ ගත්තා සඳරූ......... ආ සේමිනි......... මෙන්න අර ඔයාට
ඕන කීව පොත......... ඕක ගේන්න මම මාවනැල්ලෙ ගියා........."

"ආනේ එච්චර වද උණාද......... මම දන්නවා නම් කියන්නෙත්
නෑ........." එසේ කියමින් ඇය පොත අතට ගත්තාය.

"යාළුවො නම් එහෙම ඉන්න එපාය. අනෙක ඔය පොත
කියවන්න ඔයා ඕච්චරටම ආස නම්, ඒක හොයාගන්නත් බැරි උණා
නම්......... ඒක මම දන්න තැනක තියේනම්, ගෙනත් දෙන එක නේද
යුතුකම"

"හැබැයි තැන්ක්ස්......... මම මාර ආසාවෙ හිටියේ මේක කියවන්න"

"මොකක්ද සේමිනි උඹේ ඔය ශබ්දකෝෂෙ වගේ පොත.........?"

"කතා සරිත් සාගරය බං......... මට මතකයි මම මේක චූටිම
කාලෙ කියෙව්වා......... ඊට පස්සෙ මයින්"

"ආ......... ඔව් නේද......... අපේ ස්කෝල තිබ්ලා මම ඕක කියෙව්වා
......... ලස්සන දේව කතා"

"ලස්සන දේව ආදර කතා කියන්න......... නල දමයන්ති කතාව
කියවද්දි හිතෙනවා ඒ කරාව ඒ තරම් දිගද කියලා" ගිම්හාන කිවේ
සිනාසෙමිනි.

"අද කාලෙත් ඒ වගේ හංසයෙක් වත් ඉන්නවා නම් පණිවුඩ
එහාට මෙහාට ගෙනියන්න"

"අද කාලෙ මොන හංසයොටද බං......... මොබයිල් තියෙන්නේ
එලිවෙනකල් දොඩන්න........."

"සේමිනි කියන එකත් ඇත්ත සඳරූ......... කාලෙ වෙනස්
වෙනකොට ආදරේ කරන විදියත් වෙනස් වෙලා......... දූතයො වෙනස්
වෙලා"

"ඒ උණාට ආදරේ වෙනස් වෙලා නැතේ......... ඒක හැමදාම එක
වගේ.........කාට හරි ආදරේ හිතෙනවා. එක්කො එයාව ලබාගන්න
පුළුවන් උනත් අයිති කරගන්න බැරි වෙනවා. වෙලාවකට ලබා
ගන්නත් බෑ......... ළංවෙන්නත් බෑ......... ඒත් ළඟම තියනවා.........
පෙනි පෙනි තියනවා" සඳරූ කිවේ ඇයටම ආවේණික වූ
කල්පනාවලියක තනිවෙමිනි.

"ඒක ඇත්ත......... සමහරවෙලාවට අපි කාට හරි ආදරේ
කරනවා......... ඒ වෙද්දි එයා එක්කො කාට හරි අයිතිවෙලා.........



එහෙම නැත්නම් කාට හරි ආදරේ වෙලා......... ඒ උණත් ඉතිං ආදරේ
ආදරේම නිසා හැමදාම ආදරේ කරනවා මිස හිතෙන් කොහේට
වත් යන්නෙත් නෑ........." ගිම්හාන කිවේ සඳරුගේ දෙනෙත දෙස
බලමිනි......... එයින් සසල වී ගිය සඳරූ ඒ ඇස මග හැර ඉවත
බැලුවාය.

"ඔයා දන්නවද සඳරූ......... මම මේ කල්පනා කරන්නේ......... තව
කී කාලෙද අපි එකට ඉන්නේ කියලා........." ඔහු කරාව වෙනතකට
යවමින් විමසද්දි දෙදෙනාගේම අදහස් ඇහුණ සේමිනි,

"ඒක අනකට කැම්පස් කාලෙ ඉක්මනට ඉවර වෙනවනම්
හොඳයි......... ළිඳ ඇතුලෙ ඉන්න කල්ම පේන්නේ ළිඳ ගැන දේවල්මයි
......... එයින් පිටවෙලා එහාට ඇවිදගෙන යද්දි ළිඳ ගැන මතකයට
තව එක එක ඒවා එකතු වෙනකොට ලෝකය දකින්න ලේසියි........."
යනුවෙන් කීවාය.

දේශන නිම වී යළිත් බස්නැවතුමට පැමිණි සඳරූ, ගිම්හාන හා
තනිවූයේ සේමිනි පිට වී ගිය බැවිනි.

"ඒක නෙවි ගිම්හාන......... මට හරි ආසයි දවසක එහෙ ඔයාලගෙ
ගමේ යන්න"

"යමු......... නැන්දම්මා ආදරෙන් පිලිගනියි ලේලිව........." ගිම්හාන
කීවේ සිනාසෙමිනි.

"ගිම්හාන......... ඔයා නම් දැන් ටිකක් නරක් වෙලා........."

"මොනාද සඳරූ......... මම ඉතිං ඔයවගේ හීන ලෝකයක්වත්
හදාගෙන ඉන්න එපායෑ......... කොහෙද ඉදල ඉදලා කෙල්ලෙකුට
ආදරේ කළා......... ඒකිත් අනුන්ගේ........."

"ඒක තමයි කියන්නේ හොයලා බලලා වැඩ කරන්න කියලා.........
දැක්ක ගමන් ලව් කරනවා........." ඇය කිවේ සිනාසෙමිනි. ගිම්හාන
එක් වරම පාරේ ගිය ජීප් රථය දෙස බලා.

"සඳරූ ඔයාගෙ බාල මස්සිනාගේ වාහනේ නේද අර යන්නේ........."
යි කියද්දි බියපත් වූවක සේ පිටුපස හැරී බැලූ සඳරූ නොත්තාගේ
වාහනය පාරේ යනු දුටුවාය. ඇයගේ හදවත සසල වූයේ
නොදැනුවත්වමය.

"හ්ම්......... ඒක තමයි........."

"නෙත්ත කොහේද ගිහින් හිටියා කීවනේ. හැබැයි ආවට පස්සෙ
ඔයා ගෙනියන්න එක දවසක් වත් ආවේ නෑ........." ගිම්හාන කියද්දි
සඳරූ සීතල වී ගියාය.

“මෙකයි........ එයාට වැඩ........ මොකද මාස දෙකක් විතර බිස්නස් වැටිලා තිබුණේ එයා නැතිව........ ඉතිං ආ දවස් හිට වැඩ........”

“ඒක මිසක්........ මම හිතුවා දෙන්නා තරහ වෙලාවත්ද කියලා”

“අපි........? ........අපි ඇයි තරහ වෙන්නේ........”

“ඒක ඇත්ත........ නෙත්නට ඉතින් නෑනව දැක්කම තරහ වෙනවා කොහොම වෙතත් අයිති කරගන්න හිතෙන්නේ නැද්ද දන්නෑ........”

“ඔයා හිතුවෙ ඔයාට තියන පිස්සුව නෙත්නටත් තියනවා කියලද?”

“ඇත්තම කියන්නද සඳරු........ මට ඒ දවස්වල නෙත්ක දැක්කම හිතුණෙ මට වගේ ඩබල් පිස්සුවක් පොරට තියනවා කියලා........ දැන් තමා තේරෙන්නේ ඒක වැරදි බව........ ආ........ ඔන්න කා එක ආවා........ යන්න........” තමාගේ වෙනස් වූ මුහුණ ගිම්හානගෙන් සඟවා ගැනීමට එවෙලේ පැමිණි කාරෙක දෙවියන් එව්වා වැනි යැයි සඳරුට සිතිණ.

නෙත්න කෙළින්ම ගියේ ක්ලබ් එක වෙතය. එහි ගෙස් බියර් බෝතල් කීපයක් හිස් කළ ඔහු රෑ වන තුරුම එහි රැඳී සිට නිවසට ආවේය. ඔහු එද්දී නිවසේ කිසිවෙකු නොවූයෙන් ප්‍රේමාට කථා කළ නෙත්න ගෙදර අය කොහිදැයි විමසීය. ඔවුන් සාදයකට ගිය බව කියද්දී ඔහු කෑම මේසය වෙත ගියේ වතුර එකක් බීමටය. ඒ මොහොතේ පහලට ආ සඳරු ඔහු එහි සිටිනු දැක අතර මග නැවතුණාය.

“සුදු බේබි........ දැන් ඉතිං කාලම උඩට යන්න........” ප්‍රේමා කියද්දී මේසයට ගිය නෙත්නගේ පිඟානට ප්‍රේමා ඉඳිආප්ප හා කිරිමාලු බෙදන අතරේ........

“ඕන්න පුංචි නෝනා තමා කීවෙ ඉඳි ආප්ප හදන්න........ සුදු බේබිත් ආසයිනේ........ මම ඒක නිසා හැදුවා........ මම ටිකයි ඇම්මෙ දාගෙන කන්න........” යි කියද්දීම මේසයෙන් නැගිට ගත් නෙත්න.

“මට එපා ප්‍රේමක්කා........ මට බඩගිනි නෑ........” යි කියමින් අත පිසදමාගෙන ආපසු හැරිණ.

“ඒ මොකද දෙයියනේ........ මේසෙටත් වාඩිවෙලා........ ඉඳිආප්ප කන්න ආසා නිසානේ හැදුවේ........”

“ආපෝ........ ඒවා දැන් අමතක කරන්න........ ඒවාට ආසාව තිබුණ කාලෙ ගියා........ ඒවක දැන් යල් පැනපු කැමැත්තක්” නෙත්න





කීවේ සඳරු අසලින් යන අතරේ ප්‍රේමා දෙස හැරෙමිනි. නෙත්නගේ වචන ඊතල පහරවල් සේ සඳරුගේ හදවත විනිවිද ගියද ඔහු ඉවත්ව යන තෙක් සිටි තැනම සිටියා මිස ඇය නොසෙල්වුණාය. ප්‍රේමාටද නෙත්නගේ වදන් නොවැටහුණා නොවේ........ තමා එය කීම ගැන ඇය පසු තැවුණේ නෙත්න නොකාම කාමරයට ගිය බැවිනි.

වැඩ නිම වී නිවසට එමින් සිටි නියතිට නෙත්න පැවසූ වදන් ඇසී ඇය සඳරු අසල නැවතුණේ ඇයගේ ප්‍රතිචාර හොඳින් දුටු බැවිනි........ ඇය සඳරු වෙත ළංවූවාය.

“අවසානය මොකක්ද කියලා නොහිතා වැඩ කරන්න ගියාම මේ විත වෙනවා........ මතක් උණේ නැද්ද පටන් ගැනිල්ලෙදි” නියති ඇසුවේ උපේක්ෂා සහගත හඬිනි. සඳරු සිනාසුණාය.

“සනදලා දෙන්න හරි අමාරුයි ඔයාට. ඒත් කියන්න තියෙන්නෙ එක දෙයයි........ දෙයක් ඔයාට අයිති වෙන්න තිබුණානම් ඒක හැමදාම වගේ අදටත් ඔයාගෙ........ මගේ හෙමණැල්ල ඒකට වැටිලා කියලා හිතන්න එපා........ ඒත් ඔයාගෙ අදක්ෂ කමට මාව පටලාගන්න එපා........ මුල හිටම මම ඈත්වෙන්න උත්සාහ කළා........ ඒත් ඔයා........ ඔයා ළංවෙන්න උත්සාහ කළේ නෑ........ අදටත් ඔයා පරක්කු නැති වෙන්න පුළුවන්........එයාගේ ජීවිතේට වෙන කවුරු හරි ඇවිත් නැත්නම්........ නිකම්ම පරාද වෙන්න හිතන්නෙ නැතුව. මට දොස් කියන්නෙත් නැතුව ආයෙ ට්‍රයි කරන්න”

“ට්‍රයි කරන්න තිබුණා ලැබෙන වින්තිය දන්නවා නම්........ ඒත් මම දන්නේ එක දෙයයි........ එයා මගේ නෙවි........”

“වරදවා තේරුම් ගන්න එපා........ මගෙත් නෙවි........” සඳරු කියද්දී නියති සිනාසුණේ සමච්චලටය.

“ඔයා ඔයාටම වටහලා දෙන්න හදනවා ඇති ඔයාගෙ නෙවි කියලා........ඒත් ඔයාගෙ හිත දන්නවා........ ඔයත් එයාට ආදරේ බව ........ ඒ රූපෙ දකිනකොට ඔයා ගැස්සෙන හැටි. මම දැකලා තියෙන්නේ........ ඇයි ඒ........ ඔයාටම බයයි මාංචු දාලා දම්වැල් අලා තියාගෙන ඉන්න හිත ආයෙ එයා ළඟට කඩාගෙන යයි කියලා ........ නේද........ අපි හරි ලස්සනට හිටියා........ සතුටෙන් හිටියා........ ඔයයි ආවෙ අපේ ලෝකෙට........ ඔයයි විනාශ කළේ මගේ හීන........”

“ඔයා වැරදියි නියති........ අද නොතේරුණාට පස්සෙ වැටහේවි ........ ඔයා එයාට ආදරේ කළේ නෑ........ ආදරේ කළත් එයාට ඇහුණේ නෑ........ මොකද ඔයා දැනෙන්න ආදරේ කළේ නෑ........ මට පිළිගන්න

වෙනවා මගෙ වරද ගැන. ඒත් එයින් ඔයාටවත් ඔයාලගෙ කසාද ජීවිතේට වත් අංගු මාත්‍ර හානියක් වෙන විදියට එයාට ළංවෙන්න මට ඕන උණේ නෑ........ ඒත් ඔයා........ මොකද කළේ........ ළංවෙන්න ඕන උණු ඔයා ඈතින් ඈතට ගියා........ මම ළං නොවුනට එයා මට ළං උණේ ඒකයි........ අදටත් ඔයා පමා නෑ........ ඔයා උත්සා කරලා බලන්න........"

එසේ කී සඳරු පඩිපෙළ නැග උඩට යද්දී කිසිවක් සිතාගැනීමට නොහැකි වූ නියති අසල වූ පුටුව මත කඩා වැටුණාය.

නෙත්න පියා සොයා ආවේ ඉඩම ගැනීමට තීරණය කිරීම ගැන විමසීමටය. මන්ද එතරම් විශාල ටෙන්ඩරයක් ගැනීමට තමනට මෙවෙලේ හැකිද යන්නය. අනෙක් අතට එයින් තරහ කාරයින් වැඩි විය හැකි බැවිනි.

"ඔක අතැරලා දාන්න තාත්ති........ අපිට ඔක ලැබෙන්නෙ නෑ........"

"සඳරු ඒක ගන්න තීරණය කළේ හේතුවක් ඇතිව පුතා........

"සඳරු ඒක ගන්න තීරණය කළේ හේතුවක් ඇතිව පුතා........"

"සඳරු ඒක ගන්න තීරණය කළේ හේතුවක් ඇතිව පුතා........" කරන්න දෙන්න" පියා කියද්දී නෙත්න ගියේ තරහෙනි. තමාගේ ශක්තියේ පමණට කළ යුතු දෙය කරනවා මිස අනවශ්‍ය දේවල් බදාගැනීමෙන් දොඩම් ගොඩම නැති වූවා සේ විය හැක........ ඇය මෙම ටෙන්ඩරය ගැනීමට උත්සාහ දරන්නේ යෙදවිය යුතු ප්‍රාග්ධනයක් ගැන සිතීමෙන් පසුද........ එහෙත් ඒ කුමක්ද........ එවැනි දෙයක් නොමැතිව මෙවැනි විශාල කර්තව්‍යයකට අත ගැසීම ඉතාම අවදානම් බව ඔහුට වැටහිණ........ පෙරදී ඇය හොඳින් ක්‍රියා කළද මෙසේ කිරීමෙන් නම් විශාල ප්‍රශ්නයකට තමනට මුහුණ දීමට සිදුවෙතැයි ඔහු සිතුවේය.

ඔහු රථය පදවාගෙන ඇයගේ කාර්යාලයට ගියේ ප්‍රියලාල්ද කැටිවය........ කාමරයේ දොරහැර ගෙන එක්වරම සඳරුගේ වීදුරු කාමරය වෙත නෙත්න යනු සේවක සේවිකාවන් බලා සිටියේ පුදුමයෙනි. නෙත්න කෙළින්ම ගොස් සඳරුගේ මේසය ඉදිරිපිට සිට ගත්තාය. සඳරු මේ මොන පුදුමයක්දැයි බලා සිටියාය.

"මම ආවේ එක දෙයක් කියලා යන්න........ තාත්ති ලණුව දීපු පලියට ඒකෙ දිග තියනකල් යන්න එපා කියන්න. මොකද අනිත් කොන තාම ගහේ ගැටගහලා........ මේ ටෙන්ඩර් එක අරගෙන යටකරන්න අපි ළඟ සල්ලි නෑ........අලුතෙන් දේවල් කරනවට වැඩිය මේ තියන දේවල් ආරක්ෂා කරන එකයි වටින්නෙ. වැටිලා තිබුණ බිස්නස් අමාරුවෙන් හදාගෙන එද්දී මේ අලුත් විකාරයක් පටන් ගන්න හදන්නේ පිස්සුවෙන්ද........ තමන්ගෙ ප්‍රයිවෙට් ලයිෆ් එකේ ගානට කම්පැනි එක දාන්න එපා........" නෙත්න කීවේ ඇය දෙස තියුණු ලෙස බලමිනි. එහෙත් එයින් සඳරු කෝප වූවාය. ඔහු මේ කියන්නේ ශිම්හාන ගැන බව ඇයට වැටහිණ. ඒ නිසාම ඇයට ඔහු හා ඇනුණේ ඇඩි කේන්තියකි.

"මිස්ට නෙත්න........" ඇය වීදුරු කාමරයෙන් එළියට ඇසෙන තරමින් කෑ ගැසුවාය. ඒ අතරේම පුටුව මදක් එහාට කොට ඔහු වෙත ආවාය.

"මේ ලෝකේ කිසිම දෙයක් නොදන්න හරි, හැමදේම දන්න හරි කවුරුත් නෑ........ හැම දෙනාම ඔයා නොදන්න මොනවා හරි දන්නවා........ තේරුණාද........"

There is nobody in the world who knows nothing and there is nobody in the world who knows every thing. Everybody knows something which you dont know........

මෙන්න මේ ඇත්ත පිළිගන්න සූදානම් වෙන්න. එතකොට ඔය තාම ලේ පුච්චගෙන කාටවත් කඩා පනින්න ඕන වෙන්නේ නෑ........ මම කරන්න ගත්තේ මට ඕන නිසා........ කතාවක් තියනවා ලෝකෙ චක්‍රයක් කියලා........ පරණ දේම ආයෙ ආයෙ අලුත් වෙලා එන........ මමත් පරන ක්‍රම ටිකක් උපයෝගි කරගත්තා මේ වැඩේට........ යල් පැනපු දේවල් මම දන්නවා ඒක සාර්ථක වෙන බව........" සඳරු කීවේ නෙත්න දෙස අභියෝගාත්මකව ඉඟි කරමිනි........ අනතුරුව ඇය ඉවත හැරුණේ තවත් ඔහු හා කථා කරන්නට දෙයක් නැතුවා මෙනි........ එහෙත් එයින් නෙත්නගේ තරහ ඇවිස්සී එනු දුටු ප්‍රියලාල් හා කමල් ඔහුව කාමරයෙන් එළියට කැඳවා ආවේ තවත් මොහොතකින් සිදුවන පිපිරීම දරාගන්නට අපහසු බැවිනි.

සඳරු මිදුලේ ඇවිදිමින් සිටියේ කළයුතු දෙයක් ගැන කල්පනා කරමිනි. එවෙලෙහි එහි ආ රොෂාන් රථය නවතා බිමට බැස ඇය වෙත ආවේ ඇය කල්පනා කරමින් සිටිනු දැකීමෙනි.

"සඳරු........ මොකද මේ........එළියට වෙලා........දැන් රෑ එකොළහත් පහු........"

"නෑ........ම ම මේ නිදිමත නැති නිසා ආවේ........"

"යමු ඇතුළට........" ඇය රොෂාන් සමඟ කාමරයට ගොස් සුළු මොහොතකින් එක්වරම බෝතලයක් බිඳියන ශබ්දයක් ඇසුණු සඳරු

සසල වූවාය. ඇයගේ තිගැස්ම රොෂාන්ගේ නෙතින් මඟ හැරී නොගියේය. එහෙත් ඒ වගක් නොඇඟවූ රොෂාන්,

"බෝතලයක් නේද......... බිඳුණේ......... මල්ලිගේ කාමරෙන් වගේ ......... පොඩ්ඩක් බලන්න........." රොෂාන් කියද්දී,

සඳරු බියපත් ලෙස රොෂාන් දෙස බැලුවාය.

"අනේ......... ම......... මට බෑ......... ඔයා බලන්න........."

"යමු එහෙනම් දෙන්නම........." එසේ කියා රොෂාන් ඉදිරියෙන් යද්දී සඳරුට එහි නොගොස් නොහැකි විය. කාමරය දුටු රොෂාන්,

"ඕ......... මයි ගෝඩ්........." කියමින් වහ වහා දිව ගියේය. නෙත්න සිටියේ සිහියෙන් නොවේ. ඔහුගේ අත බෙහෙවින්ම කැපී ලේ ගලමින් තිබිණ......... එක්කෝ ඔහු සිතා මතාම කපාගෙන තිබිණි. නැතිනම් බෝතලයට ගසද්දී කැපී යන්නට ඇත. නෙත්නගේ විලාසය දුටු සඳරුට කෑ ගැසෙන්නට ආවද ඇය වහාම අතින් මුව තදකොට ගත්තේය.

"මේ මිනිහා මොනවා කරගෙනද......... මාරෙට ලේ යනවා......... සඳරු......... ඉක්මනට ගන්න මොනා හරි මේ අතේ ලේ නවත්තන්න ........." රොෂාන් කෑ ගසද්දී සඳරු වහාම ලාච්චුව හැර බෙහෙත් හා බැන්ඩේජ් රැගෙන දිව ආවාය. ඒ එද්දී බිම තිබූ වීදුරු කටුවක්......... ඇය කකුලේ තදින් ඇනිණ.........

"ඌ.........ය්........."

"ආ ඒ පාර ඔයත් තුවාල කරගත්තද......... කලබලේ........." රොෂාන් අසද්දී ඇය කොර ගසමින් පැමිණ වහාම ඔහු වෙත බෙහෙත් පෙට්ටිය දී නෙත්නගේ තුවාල වූ අතෙහි වූ ලේ පිසදමන්නට විය.

"මම මේක කරන්නම්......... ඔයාගෙ කකුලෙ වීදුරු කටුව බලන්න........."

"නෑ.........නෑ......... ඒක මොකුත් නෑ......... ඇනුණ විස වෙන්න ඇති......... තුවාලෙ බෙත් ටික දාන්නකෝ........." සඳරු කීවේ කලබලයෙනි. සඳරු උඩ පැන්න ප්‍රමාණයෙන් කකුලේ ඇනුණේ සුළු දෙයක් නොවන බව රොෂාන්ට වැටහිණ. මන්ද සඳරු යමක් පෙන්වන්නේද වූදේට වඩා අඩුවෙන් බව ඔහු දන්නා බැවිනි......... එහෙත් එය ගනණකට නොගෙන නෙත්න ගැන බලන්නයි ඇය කීවෙන් රොෂාන් නෙත්නගේ අතේ බෙහෙත් ගල්වා බැන්ඩේජ් කරන ලදි.........



"සඳරු ඔයා මේ බෙහෙත් ටික ලාච්චුවට දාන්න......... මම මෙයාව ඇඳට දාන්න........." පුටුව උඩ පැත්තට වැටී සිටි නෙත්න බලෙන් මෙන් වාරු කරගත් රොෂාන් සෙමුරාව රැගෙන ගොස් ඇඳට ඇළකළේය. ඔහුගේ දෙපා උඩට ගෙන හිස හරියට කොට්ටයට තබා රොෂාන් යන්නට හැරෙත්ම,

"සඳු.........??" යැයි කියමින් නෙත්න රොෂාන්ගේ අත අල්වා ගත්තේය.

සඳරුගේ දෙනෙත් යකෙක් අවතාරයක් දුටුවාසේ විහිදී ගියේ ඒ හඬ ඇසෙද්දීය. ඒත් එක්වරම නුවණ මෙහෙයා කටයුතු කළ ඇය ලාච්චුව හැරගත් ගමන්ම සිට තම වෙව්ලීම මඟ හැරගත්තාය. රොෂාන් හැරී බැලුවේය. සඳරු වගක් වත් නැතුව ඇයගේ වැඩය කරනු දුටු රොෂාන් යළිත් ගැටලුවකට මැදි විය.

.........සඳරුට මෙයා සඳු කියනවානම් නිකම් හරි එයා හැරිලා බලනවානේ......... එහෙම උණේ නෑ......... එතකොට මේ සඳු කව්ද......... ඔහු එසේ සිතමින් බිම තිබූ වීදුරු කටු එක් කරද්දී සඳරු පුටුව මත වාඩි වී කකුල බලනු දුටු රොෂාන් එහි යද්දී ඇයගේ කකුලේ වූ වීදුරු කටුව දැක,

"සඳරු මෙච්චර කටු කෑල්ලක් කකුලෙ තියාගෙන ඔයා ඇවිද්දෙ කොහොමද.........?" යි ඇසුවේය. සඳරුගේ දෙනෙතින් කඳුළු ගලමින් තිබුණේ වේදනාවට විය යුතුය.

"කකුලෙන් ලේ එනවා......... අර බෙහෙත් ටිකක් දාමු" එසේ කියා වීදුරු කටු කැබැල්ල ඇද ඇමූ රොෂාල් යළිත් ලාච්චුව හැර බෙහෙත් ගෙන සඳරුගේ කකුලට දමා ගැට ගැසීය.

"හරි......... යමු කාමරේට........." එසේ කියූ රොෂාන් සඳරු කැඳවාගෙන කාමරයට ගොස් ඇයට නිදාගන්නට සැලැස්විය.

නින්දට වැටුණද සඳරුගේ නෙතට නිදි ආවේ නොවේ......... නෙත්න සිහිසන් නැතිවන තුරු බී අත කපාගත් අයුරු ඇයට සිහිවෙයි ......... දෙවියනේ තාමත් ඔහු තමා ගැන සිටින්නේ ඒ අදහසින්මද......... ඒ ආදරය ඒ සෙනෙහස......... තමාට අහිමි වී ගිය ඒ සෙනෙහස සිහි කරමින් තමා සැමදාම හඬා වැටුණද මේ සියල්ල මෙයින් නිමා කරන්නට ඇයට ඕනෑ විය. එහෙත් නෙත්න......... තාමත් අතීතය මත්තේ වැලපෙනවාද? සඳරුට ඉකිබිඳුණේ නිතැතිනි. එහෙත් අනෙක් පස නිදියන රොෂාන්ට පිටුපා ඇඳ කොණේම තමා සිටිනත් ඔහුට

ඇසෙතැයි බියෙන් ඇය කොට්ටයේ මුහුණ ඔබාගෙන ඉකිහඬ නවතාගත්තේය.

එහෙත් තාමත් නිදි නැතිව සිටින රොෂාන් මේ සියල්ල බලා උන්නේය. සඳරු වෙතින් ඇසෙන සිහින් සුසුම් හඬ ලොකු හැඬුමක වේගය බාලකොට නැගෙන්නක් බව ඔහුට වැටහිණ......... එහෙත් තවමත් කිසිත් පැහැදිලි නැත......... සමහර විට ඇය හඬන්නේ කකුලේ වේදනාවටද විය හැක......... එසේ නම් තමාගේ සැකය සාධාරණ නැත......... සමහර විට ඇයගේ කකුල වේදනා දෙනවා විය යුතුය......... ඔහුට ඇය ගැන ඇතුණේ ඇඩි දුකකි......... එහෙත් ඇය ළංකර ගන්නට තමාට නොහැක. මේ දුරස් බව තමාට වඩාත් හොඳය......... ඇයට හොඳටම හොඳය.

සඳරු අවදි වූයේ පමා වීමෙනි. එහෙත් ඇය කොර ගසමින් වුව සූදානම් වූවාය. අද රොෂාන් ආපසු ගිය බැවින් ඔහු වෙනුවෙන් පාන්දර අවදි වූ ඇය යළිත් ටික වේලාවක් නිදාගත්තේ කකුල රිදුම් දෙන්නට වූ බැවිනි......... එනමුදු කාර්යාලයට යා යුතුය......... එහි වැඩ ගොඩ ගසාගතහොත් එය වදයක් වනු ඇත......... ඒනිසාම ඇය සූදානම් වී පහලට ආවාය. මව එපායි කියද්දීම ප්‍රේමාගේ සහයෙන් වාහනයට නැගගත් ඇය කාර්යාලයට පිටත්ව ගියාය.

මේ දිනවල කාර්යාලයේ සිටීම වඩාම වැදගත් වන්නේ තමා සොයාගත යුතු වූ ආරංචි හා හමුවිය යුතු පුද්ගලයින් සම්බන්ධයෙනි. එම නිසා ඇය මුලින්ම ලංකා බැංකුවටත් මහජන බැංකුවටත් ගොස් අදාල සියලුම කටයුතු සකස් කළාය. අනතුරුව යළිත් කාර්යාලයට ආ ඇය එහි වැඩ කරද්දී කකුල වැඩි වැඩියෙන් රිදුම් දෙන්නට වූයෙන් සරසවි නොයාමට තීරණය කළාය. තමා අසනීප නිසා නොඑන බව හිම්හානට ඇන්වූ සඳරු පියුමිටද ඇමතුමක් දී පවසා සවස නිවසට ගියාය. රාත්‍රී එන්න එන්නම ඇයට වේදනා වැඩියෙන් ඇනුණද ඒ ගැන වැඩිපුර යමක් කිසිවෙකුට නොකී ඇය උණ ගතිය තිබුනෙන පෙතාඩෝල් දෙකක් බී උඩට යන්නට ආවාය. ඒ අතරේ වැඩ නිම වී නිවසට ඇතුලු වෙමින් සිටි නෙත්න ඇය කොර ගසනු දුටුවද ඒ මන්දැයි සිතුවේය. එහෙත් ඒ ගැන වැඩිදුර නොසිතූ ඔහු ඇය යනතෙක් සිට තම කාමරයට ගොස් යළිත් පහලට පැමිණ ප්‍රේමා සොයා ගියේය.

"ප්‍රේමක්කා මොකද අර කකුල.........?"





"ඊයෙ අල්ලපු ජල්ලිය තමා......... එක්කෙනෙක් අත තුවාල කරගෙන......... අනෙත් කෙනා කකුල......... මට ඇහුණා රොෂාන් මහත්තයා උදේ ලොකු නෝනට කියනවා අත කැපිලා දෙන්නම ගියා බෙත් ආන්න. පුංචි නෝනගෙ කකුල කැපුණා කියලා තවුවකට........." එසේ කියමින් නෙත්න හාම කෑම මේසය වෙත ආවාය.

"එතකොට එයාලද ඊයෙ රෑ මගේ අතේ බෙහෙත් දාලා තියෙන්නේ......... ම......... ඇන් ජෝඩුව හරි යාලුයි වගේ නේද ප්‍රේමක්කා........."

"ඒකත් හොඳයිනේ......... එතකොටවත් පුංචි නෝනාගේ ඇස්වල කඳුළු නවතින්නෙ නැතෑ"

"ඉස්සර කඳුළු තිබුණට දැන් නෑ......... දැන් එයා අයන් ලේඩි වෙලා ඉන්නේ......... එයාට දැන් ඕන තරම් කට්ටිය ඉන්නවා......... මහත්තයා......... ගෙදර අය......... යාළුවො යෙහෙළියො"

"ඔය නම් කියන්නේ ඉරිසියාවට........." ඇය කීවේ ඔහුට කෑම බෙදමිනි.

"ප්‍රේමක්කට පේනවද ඒක?"

"ම.........ම.........ඔව්........."

"ඇත්තට නම් ඉරිසියයි තමයි. ඒත් මට දැන් එයා ගැන ගානක් නෑ......... තරහක් තමා තියෙන්නේ. මට නම් ආයෙ එපා එයාව" නෙත්න කියද්දී ප්‍රේමා සිනාසුණාය.

"මොකද හිනාවෙන්නේ.........?"

"නෑ ඉතිං ඔය තරහ තව කී කාලෙකටද......... අනෙත් එක එයා එපා නම් මොකටද බොන්නේ?"

"බොන්නේ නිකං ජොලියට"

"ජොලියට බොන්නේ ක්ලබ් ගිහින්......... යාලුවො එක්කනේ......... ගෙදර ජොලියට බොනවා......... මම අහලා නෑ........." ප්‍රේමා කියද්දී නෙත්න නිහඬව කෑම කන්නට විය.

# 31

පියුමි පැමිණ සඳරුට උණ බව දැන බෙහෙත් ගන්නට යන්නට කරා කළද ඇය පෙනඩෝල් බිවූ බව කියා එයට අඩුවෙනු ඇතැයිද පැවසුවාය.

"උඹට පිස්සුද.........එහෙන් ඔෆිස්වලත් කවුරුත් නෑ......... ඒ අස්සෙ හදාගනින් ලෙඩක්........."

"නෑ......... ඇත් හරි යාවි......... උඹ නිදියන්න පලයන්........." සඳරු පියුමිට බල කලෙන් ඇය යන්නට නැගිට්ටාය.

"උඹ උදේට ඇවිත් මාව අවදි කරන්න එපා......... මම දවල් වෙලා බෙහෙතුත් අරගෙන ඔෆිස් එන්නම්"

"එහෙනම් ශුවර් නේ.........මම යනවා........." පියුමි ගිය පසු දොරවසා ඇමූ සඳරු යළිත් ඇඳට ආවාය. වීදුරු කවුළුව අරත් දමාත් මෙය මේ තරම් ඇදුම දෙන්නේ මන්ද......... ඇය කෙතරම් ඒ මේ අත හැරුණද නින්ද ආවේ නොවේ......... හැකි තරම් නිදාගන්න හැදුවද ඇගෙහි සීතල නැග එයි......... තමාව වෙවුලනවා ඇයි ඇයට සිතුණේ දත් පවා එකවෙක ගැටෙන්නට වූ බැවිනි. ඇය රෙදි කිපයක් පොරවා ගත්තාය. එහෙත් සීතල යන්නේ නොවේ......... කෝපි ටිකක් හෝ වත් කරන්ට ප්‍රේමාට කියන්නට සිතා වෙලාව බැලුවද වෙලාව දෙකටත් ආසන්න වී ඇත......... මේ වෙලාවේ ඇය ඇත්තේ තද නින්දේය.........

සඳරු හැකි තාක් දුරට රෝගය මැඩ ගන්නට සිතා පෙනඩෝල් පෙති හතරක්ම එකවර බීවාය. එසේ බිවූ ඇය රෙදි කිපයක් පොරවාගෙන ඇඳට ගුලි වූවාය. ඇයට හැඬුම් ආවේ නිතැතිනි. තමා මේ නිවස තුළ කෙතරම් අසරණ වී ඇති දැයි ඇය් සිතුවාය. නිවසේ නම් මෙසේ ලෙඩ වෙන්නටත් ආසාය. මන්ද ලෙඩ වූ වෙලේ හිට අම්මාගෙන් ලැබෙන සාත්තු සප්පායම් වල කෙළවරක් නොමැති බැවිනි. පිරිත් කියමින් හිස අතගාමින් ඔඩිකලෝන් පෙඟවූ රෙදි කඩ නලලට එලමින් ඇය මුළු රැයම නිදි වර්ජිතව ගත කරයි.........



එහෙත් අද......... රත්තරං අම්මෙ......... අද ඔයාගෙ ලොකු දූ තනිවෙච්ච තරම ඔයා දන්නවා නම්......... අද මා ගාව කවුරුත් නෑ......... ඔයත් නෑ......... ඔයා හොයල දීපු මහත්තයත් නෑ......... අද ඔයාගෙ දූ හරියට තනිවෙලා අම්මේ......... හරියට තනිවෙලා......... සඳරු මෙසේ සිතමින් මහහඬින් හඬා වැලපුණාය. කකුලේ වේදනාව ඇයට උහුලාගන්නටත් බැරි තරමින් නැග එයි......... ඒ තරමටම ඇඟ ගැහෙමින් උණ නැගෙන බව ඇයට වැටහිණ......... ඇය යළිත් වේලාව බැලුවාය. එළිවෙන්නට ආසන්න බව කියමින් එහි අලුයම හතර සටහන්ව තිබිණ......... එළි වූවාට පසු ප්‍රේමාවද කැටුව බෙහෙත් ගෙන ඒමට යාමට ඇය තීරණය කළාය......... හිසේ සිට පොරවා ගත් ඇය වරින් වර ඔරලෝසුව දෙසට දෙනෙත් යවමින් ඉතා දීර්ඝ රැයක් එළිකොට ගත්තාය.

නෙත්හ පාන්දරම අවදි වූයේ වැදගත් වැඩ කිපයක්ම කර ගැනීමට කොළඹ යාම වෙනුවෙනි. උදේ නැගිටීමට එලාම් එක තබා නිදාගත්තෙත් ඔහු අවදිව ඉක්මනින් සූදානම් වී පහලට ආවේ තේ බීම වෙනුවෙනි. තාමත් ගෙදර අය නිදි බැවින් මුළුතැන්ගෙයට ගිය ඔහු ඇසිලින්ගෙන් ප්‍රේමා කොහිදැයි ඇසුවාය. එවෙලෙහි එහි ආ ප්‍රේමාට තේ එක හදන්ට කියූ නෙත්හ සාලයේ විදුලි පහන් දල්වා ගෙන තමා රැගෙන යන ලිපිගොනුවක වූ ලිපි පෙරලමින් බලන්නට විය.

එක්වරම පඩිපෙළ ඉහලින් ආ ශබ්දයකින් හිස ඔසවා බැලූ නෙත්හට කවුදෝ හිණිපෙළ මුදුනේ සිටිනු පෙනිණ. මතුම් ඇයි සිතත්ම ඇය අමාරුවෙන් පඩි බසිනු දුටුවෙන් ඒ සඳරු බව ඔහුට වැටහිණ......... ඔහුගේ සිත තිගැස්සිණ......... එක් පඩියක් බැස්ස ඇය ඇතින්ම ගරාදි වැට අල්ලාගෙන පහත් වනු දුටු ඔහු එක්වරම ලිපි ගොනුව තබා නැගිට්ටේය. එහෙත්......... ඔහු එන්නටත් පූර්ව සඳරු පඩි පෙළ දිගේ පෙරලී විත් පහළට වැටිණ.

නෙත්හට කෑ ගැසුණේ ඉබේටමය. ඔහු කෑ ගසමින් ඇය වෙත දිව ආවේය. වහාම ඇතින් ඇයව ඔසවා ගත් නෙත්හ ප්‍රේමාට හා මවට කථා කළේය. ඒ හඬින් මව පමණක් නොව අනෙක් කාමරයේ වූ නියති හා පියුමිද අවදිව දිව එද්දී සිහිසුන් සඳරු පුටු ඇටියේ ඇලකළ නෙත්හ මවට කෑ ගැසීය.

"අම්මි.........ඉක්මනට එන්න......... සඳරුට සිහි නෑ......... හරි අමාරු වගේ........."

"අයියෝ පුතා........ දැන් මොකද කරන්නේ........ අරන් යමු හොස්පිටල්........"

"අම්මා ඉන්න........ මම පියුමි එක්ක අරන් යන්නම්........ ප්‍රේමක්කා ජයතුංගට ටක් ගාලා වාහනේ ගන්න කියන්න........" යි පැවසූ නෙත්න පියුමි අමතා........ පියුමි........ මොකද කරන්නේ ඇඳුමක් අරන් යනවද........ අන්දන් යනවද?" යි ඇසීය.

"මොන ඇඳුමද පුතා........ මේ ළමයට සිහි නෑ........ ඔනනම් පියුමි ඇඳුමක් අරන් යන්න........" යි මව කෑ ගසද්දී පියුමි යළි උඩට දිව ගියාය. ඒ අතරේ වාහනය ගෙන විත් පෝටිකෝව යට නතර කළෙන් නෙත්න සඳරු ඇතට ගෙන ගොස් පිටුපස අසුනේ හිඳුවා ඔහු ඇයගේ හිස උකුළට ගත්තේය. ඒ අතරේ දිව ආ පියුමි ඉදිරිපසට ගොඩ වෙද්දී රථය පණ ගන්වා ජයතුංග වේගයෙන් රෝහල කරා රථය රැගෙන ගියේය.

සඳරුගේ සිරුරින් ඇනෙන රස්නයෙන් නෙත්නගේ ඇඟද පිච්චෙන්නා වැනි විය. ඔහුගේ හදවත වේගයෙන් ගැහෙමින් තිබිණ........ මාස කීපයකට පසු ඇයගේ උණුසුම තම සිරුරට දැනෙයි. එහෙත් එය කෙතරම ගිනි රස්නයක්ද........ සඳරු මොහොතකින් කෙඳිරි ගාමින් හිස සෙලවූවාය. ඇය සිහි ලද බව වැටහුණ ඔහුගේ සිතට සහනයක් දැනුණද සීතල නිසාවෙන් ඇය වෙව්ලමින් ඇඟ වකුටු කරගන්නවා දුටු නෙත්න.

"පියුමි ඔයා බෙඩ්ෂීට් එකක් ගෙනාවා වගේ දැක්කා........ ඒක දෙන්න........" යි පවසා වහාම එය රැගෙන ඇයට එය පෙරවා ඇයව තම දෑතින් තද කොට ගත්තේය.

"........ඔයාට මොනාත් වෙන්නේ නෑ........ සඳූ........ ඔයාට මොනවත් වෙන්නේ නෑ........" ඔහු හෙමිහිට පැවසුවේ ඇය වෙවුලන අයුරින් බියට පත්විය.

"ජයතුංග විගහට යං........ මෙයාට හොඳටම අමාරුයි........" එසේ කියා සුළු මොහොතකින් කැන්ඩි නර්සිං හෝම් වෙත ළඟා වූ ඔවුන් වහ වහා ලෙඩාව රෝහලට ඇතුළත් කළේය. ඇයගේ උණ අංශක එකසිය පහටත් ඉහළ තිබෙනු දුටු වෛද්‍යවරයාගේ දෙනෙත උඩ ගියේය. මෙයාට පිටි එක එන්න පුළුවන්........ උණ වැඩියි කියන්නේ උපරිමයටත් වැඩියි........ අනෙත් එක තුවාලෙ........ උණ බැස්සට පස්සෙ තුවාලෙ බලන්න වෙනවා. මොනවද උණා කීවේ"





"ඩොක්ට වීදුරු කටුවක් ඇනිලා තිබුණේ........ ඒත් මම හිතන්නේ ඒක අරගෙන තියනවා........" පියුමි කියද්දී,

"ඒ උණට කැලි ඉතිරි ඇති........ ඒකයි මෙහෙම උණ ගත්තේ........" වෛද්‍යවරයා පැවසීය.

"ඩොක්ට........ කකුල ක්ලීන් කරද්දි ලෝකල් ඇනස්තීසියා එකක් කරනවා නේද........?"

"එහෙම කරන්න ඕනද?"

"ඔව් ඩොක්ට........ ප්ලීස්........ මෙයාට බෑ එහෙම අමාරුවක් දරාගන්න........" නෙත්න වෛද්‍යවරයාට කීවේ කඳුළු පිරි දෙනෙතිනි. පියුමි මේ සියල්ල නිහඬ මුවින් දකිමින් මිතුරිය අසලටම වී සිටියාය.

"පියුමි........ ඔයා ඔහොම ඉන්න හෙලවෙන්න එපා........ මම කවුන්ටර් එකට ගිහින් ඩීටේල්ස් දීලා එන්නම්........" එසේ කිවූ නෙත්න වහා යනු බලා සිටි පියුමි මේ සියල්ල අදහන්නේදැයි සිතන්නා සේ හිස දෙපසට වැනුවාය. මෙතෙක් දින මේ ආදරය ඔහු කොහේ සඟවා ගත්තාද........ යළිත් මේ මතුව ඇත්තේ පරණ නෙත්න නොවේද........

සඳරුගේ උණ බැස ගියේ ඉන්ජෙක්ෂන් කීපයක්ම ලබා දුන් පසුවය. ඇයගේ කකුල හිරි වට්ටවා ඉන් පසු එහි තිබූ කුඩා වීදුරු කටු අරන් දමන ලදී........ අනතුරුව ඇයගේ කකුල වෙලූ වෛද්‍යවරයා ඇයව තව එක දිනක් වත් රෝහලේ තබන ලෙස නෙත්නට පැවසීය.

මේ වන විට දහවල් එකොළහ පමණ වී තිබුණෙත් නිවසෙන් ද කාර්යාලවලින් ද දෙදෙනාටම ඇමතුම් එමින් තිබිණ. නිවසට කථා කොට සියල්ල පැවසූ නෙත්න ඇය රෝහලේ නතර කරන බව පැවසීය.

"නෙත්න මොකද කරන්නේ........ මම යන්නද?"

"මට නම් මෙයා දාල යන්න හිත නෑ........ ඒත් දැන් අම්මිලා අක්කිලා මග එනවා........ අනෙක මෙයා නැගිටලා බලද්දී මම ඉන්න ඕන නෑ........ මම ගෙනාවා කියලත් දන්නෙ නැත්නම් කියන්න එපා"

"අම්මිලා කියයි"

"ඒත් මොකුත් ඔයා කියන්න එපා පියුමි........ ලෙඩට බලන්න ඕන තමයි........ එතනින් එහාට ඉවරයි"

"හ්ම........හ්ම........"

"මොකද........හ්ම........ ගාන්නේ"

"නෑ ඉතිං එච්චර ඇත්තක් කොහෙද බණේවත් කියලා මතක් උණේ........"

"ඒවා වැඩක් නෑ........ අනවශ්‍ය දේවල් කීවොත් කණ පලනවා"

"කාගෙද මෙයාගෙද?"

"නෑ මෝඩියේ. තමුසෙගෙ. හ්ම් හරි මම යනවා. වෙලාවට බෙත් ටික දෙන්න........ අහලා මොනා හරි කන්න දෙන්න........ මෙයා හොස්පිටල් ඉන්න කල් මම ආයෙ එන්නෙ නෑ........"

"ඒ කියන්නෙ මගේ ෆෝන් එකට නිවාඩු නෑ කියන එක........"

පියුමි කියද්දී නෙත්න සිනාසුණේය.

"සමහර විට........ හැබැයි ළඟ ඉඳන් උත්තර දෙන්න එපා........ එහෙනම්........ බායි........"

"ජයතුංග එක්කද යන්නේ........?"

"නෑ ජයතුංග මගෙ වාහනේ ගේන්න ඇති"

රථයට නගින අතරේ නෙත්නගේ අතේ වූ තුවාලය පැරුණෙන් ඔහු එදෙස බැලුවේය. ඔහුට පෙරදින රාත්‍රිය සිහි විය. ඒ........ කියන්නේ එයයි අයියයි කාමරේට ඇවිත්........ හරි පුදුමයි........ රොෂාන් ඉන්න තැන මගේ දේවල් කළා කිව්වාම........ වීදුරු කටුව ඇනිලා........ ඒත් ඉතිං අමාරුව දරාගෙන ඉන්න ඇති........ අයියත් ගියානේ........ දුකෙන් ඉන්න ඇත්තේ........ ඊයේ ර........ ම........නෝ........ ඒ රැත් එතකොට එයා අමාරු පිට තමා ඉන්න ඇත්තේ........ මම නිකම් වත් බැලුවෙ නෑ........ මගේ දෙයක් උණාම එයා නම් මැරෙන්න හදනවා........ ඒත් මම........ එයා ලෙඩ උණොත් මම නිසා........ මාව බලන්න ඇවිත්........ මගේ තරහ එයාගෙ ආකල්ප එක්ක මිස එයා එක්ක නෙවිනේ........ මම ඊයෙ රෑ වැඩ කරපු හැටි හරි නෑ........ නෙත්න මෙසේ තමාටම දොස් කියාගනිමින් කාර්යාලයට ගියේය. එහි ටික වේලාවක් සිටිද්දී සඳරුගේ සුවදුක් විමසූ ඔහු කල්පනාකාරිව පසුවිය.

"සර්........ මොකද පරක්කු උණේ........ ආ වෙලේ හිටන් කල්පනාව"

"සඳරු මැඩම් හොස්පිටල් ඇඩ්මිඩ් කළා ප්‍රියලාල්"

"අයියෝ........ කකුල අමාරුද?" ප්‍රියලාල් අසද්දී ඔහු පුදුමයෙන් බැලීය.

"ඇයි ප්‍රියලාල් දන්නවද........?"





"ඊයෙ මම ඔෆිස් එකට යද්දී ඔෆිස් එකේ රාධිකයි අනෝමයි තමයි මැඩම්ව වාරුකරගෙන ඔෆිස් එක ඇතුළට අරන් ගියේ........ මම හිතන්නේ මැඩම් ඊයෙ ඔෆිස් ඇවිත් තිබුණේ ගොඩක් ඇවිදලා"

"ඇවිදලා........ ඒ කොහේද........?"

"කියන්න දන්නේ නෑ........ ගමන් කීපයක් යන්න උණු කතාවක් කම්ල්ට කියනවා මම අහගෙන" ප්‍රියලාල් කියද්දී නෙත්න කල්පනා කරන්නට විය. සඳරු ගියානම්........ ඒ කොහේද........

සඳරු නින්දෙන් අවදි වූයේද කකුලෙන් නැගෙන වේදනාවෙනි. බෙහෙත් එන්නත් කිරීමෙන් පසු උණ බොහෝ සෙයින් බැස තිබුණද කකුලේ වේදනාව බොහෝ විය. ඇය ඇස හැර බලද්දී,

"සඳී දූ........ ඔහොම ඉන්න නැගිටලා දඟලන්න එපා"

"කකුල හරි කැක්කුමයි අම්මී........"

"මට පේන්නෙ........ ආයෙ පේන් කිලර් එකක් දෙන්න වේවි........"

"අම්මී........ මම ඔෆිස් එකට යන්න ඕන........ අපි බෙහෙත් අරන් ගෙදර යමු"

"අයියෝ........ ඔයාට පිස්සුද දරුවො........ මොනාද කියවන්නේ........ විකාර කියවන්න එපා........ ඔන්න ඔහොම ඉන්න........"

"අම්මී ප්ලීස්........ මට ලොකු වැඩක් තියනවා........ අම්මී ඩොක්ටට කතා කරන්න........"

"ඕය ගැන අද නම් කතා කරන්න එපා සඳී........ ඕනනම් හෙට විතර බලමු........ ඒකනෙවි........ රිද්මි අක්කි ඒවි දැන්........ එයා එළියට ගියා........ බෙහෙත් වගයක් ගන්න........ දැන් මම යන්න ඕන සඳී දූ........ තාත්තිට බෙත් දෙන්න එපායැ. පියුමි ඉන්නවනේ........"

"ඔව් අම්මී යන්න........මට දැන් අඩුයි........ පියුමිටත් යන්න කිවා නම් හරි"

"මේ අහන්න දූ........ ඔය තරමට තමා ගැන නොසලකා හරින්න එපා........ මමත් අම්මා කෙනෙක්න මමත් ගැනියක්. මට හිතෙනවා ඔයා ලොකු දුකක් හිතේ තද කරගෙන නිතරම ඔයාටම වද දෙන්න රිද්ද ගන්න හදනවා කියලා. මට දැන් හිතෙනවා........ මගේ පුතාට ඔයාව බන්දලා දීලා මම ඔයාව අමාරුවේ දැම්මා කියලා........ මේ මඟුල වරදක් නම් මමයි ඒකට වැරදිකාරයා........ අඩුගානේ මටවත් කියන්න ඔයා මේ විදියට දුකෙන් ඉන්නෙ ඇයි කියලා........ රොෂාන් ඔයාට බනිනවා ගහනවද........?"

"අනේ නෑ අම්මී........"

"ඒහෙනම්........ ඇයි මෙ තරම් දුකක්........ ඔයාගෙ දුක එන්න ඕන එන්න වැඩියි........ ඔයා ජීවත් වෙන්නෙ අපේ ගෙදර ඉන්න නිසා වගේ........ මට කියන්න දරුවෝ........ මම ඔයාගෙ අම්මා කියලා හිතලා මට කියන්න........" ශ්‍රියන්තා මහත්මිය පවසද්දී කිසිවක් නැතැයි කියන්නට මෙන් සඳරු හිස සෙලවූවාය........ එහෙත් අතොරක් නැතිව නිහඬ දෙනෙත් කොනින් ගලා යන කඳුළුවැල් කිවේ ඇය ශෝකයෙන් බවය. තමා නොදන්නා තමාට නොකියන රහසක් මේ දෙන්නා දෙමාල්ලන් අතර ඇති බව ශ්‍රියන්තා මහත්මියට වැටහිණ.

"හරි........ ඔන දෙයක්........ වැඩ ගැන නොහිතා හොඳ ළමයා වගේ සනීප වෙන්න........ මම හවස එන්නම්........" මව යන තුරු බලා සිටි සඳරු මහා බර සුසුමක් හෙළුවාය........ තමා කෙතරම් සඟවා ගන්නට හැදුවද මේ දුක තවත් කාටවත් පෙනෙන සේ පිටාර යන්නේ කිමද........

"ඒයි........ මොකද උඹේ නැන්දම්මා ගියාද........" සඳරු කල්පනාකරමින් සිටිනු දුටු කාමරයට ඇතුළු වූ පියුමි ඇසුවාය.

"ඔව්........"

"ඒක නෙවි........ දැන් උඹට කොහොමද?"

"කකුල කැක්කුමයි පියුමි........"

"සදී මම උඹට ඊයෙ රෑ අර තරම කතා කලා බේත් ගන්න........ ආවෙ නැති එකේ ප්‍රතිඵල පේනවද?"

"මොනා කරන්නද බං........ මගේ වෙලාව"

"වෙලාව නෙවි........ උඹෙ හිතුවක්කාරකම........ මිනිහා ඉන්නවා කියලා මිනිහටත් ගානක් තියෙනවයැ ලෙඩ දුකක් හැදුනාට"

"ඒ මනුස්සයා නැතෙ පියුමි"

"හරි මිනිහෙක් නම් කාට හරි කියලනේ යන්නෙ නිකමට වත් බලන්න........ ඒත් අවතාරයක් වගේ එනවා. අවතාරයක් වගේ යනවා ........ ඒ ඇරෙන්න මොකුත් නෑ........"

"මාව කවුද මෙහෙ ගෙනාවෙ........?"

"ගෙනාවෙ........ මමයි අම්මියි තමයි........ වෙන ඉතිං කවුද........?" පියුමි කිවෙ මිතුරියගේ මුහුණේ ඉරියව් දෙස බලමිනි.

"මොකද උඹ එහෙම ඇහුවෙ........ අනෙක රොෂාන් හිටියෙත් නැතෙ ගෙදර........"

"නෑ නිකං මම ඇහුවේ........" ඇය ඉවත බලාගෙන කිවාය.

"ඒක මිසක්........ මම හිතුවා නෙත්තවත් මතක් උණාද කියලා........"

"එයා මතක් කරන්නෙ මොනාටද........ මේ ළඟදි ඔෆිස් එකටත් ඇවිත් මට බැනලා ගියා"

"ඇත්තට........ එහෙනම් ඒ කියන්නේ නෙත්ත උඹ එක්ක මාර තරහෙන් ඉන්නවා ඇත්තෙ"

"මට මොකද බං........ ඔහොම ඉඳලා ඇතිවෙලා නියතිට හා කියන්නෙ නැතෑ........"

"ඒක ඇත්ත........" ඒ අතරේ පියුමිගේ මොබයිල් ෆෝනය යළි නාද වන්නට වූයෙන් පියුමි එයද රැගෙන ඉවත ගියාය. දැන් වරින් වර කිය වතාවක්ම පියුමි මෙසේ ඉවත ගිය බව සඳරුට සිහි විය.

........කාටද මෙයා මේ තරම් හොරෙන් කතා කරන්නේ........ එසේ සිතූ ඇය මිතුරිය පැමිණි පසු,

"උඹ මාලිංග එක්ක අද ගෙට පැනලා යනවද........?"

"නෑ........ඇයි?"

"නෑ........ ඉතිං ලොකු රහසක් වෙන්න ඇතිනේ මේ එළියට ගිහින් දොඩන්නෙ"

"එහෙම තමා........ ලව් කරන එවුන්ගෙ ප්‍රශ්න උඹට තේරෙන්නේ නෑ........ මොකෝ උඹ ලව් කරලයැ........" එසේ කී පියුමි සඳරුට සූප් එක බොන්නට දී භාජන සෝදා ඇඟසෝදගන්නට නාන කාමරයට ගියාය. ඒ අතරේ පියුමිගේ ෆෝනය යළි නාද වෙන්නට වූයෙන් සඳරු එය අතට ගත්තේ හෙමිහිට බනිමිනි.

"මොන මගුලක් ද මේ........ එක්ස්චේන්ජ් එක වගේ........" එහෙත් ඒ මත වූ නම දුටු සඳරු සසල විය. නෙත්ත........ ඒ නම කෙතරම් වාරයක් තම මුවින් පිට වන්නට ඇද්ද........ ඒත් අද........ තමන් දෙදෙන ප්‍රතිමල්ලවයන් වී ඇත........ ඔහු කරනා දෙය බලන්නට සිතූ ඇය එය ඔන් කළාය.

"හලෝ........" නෙත්තගේ හඬ එහා කෙළවරින් ඇසෙද්දී සඳරු එය සවනට තබා අසා සිටියාය.

"හලෝ........හලෝ........" ඔහු යළිත් කථා කළේය. එහෙත් සඳරු කථා කළේ නැත........

පියුමි කථා කරන්නේ නැත්තේ මන්දැයි නෙත්තට සිතුණෙත් ඔහු යළිත් "හලෝ" කිවේය. ඒ අතරේ සඳරු අසලට පැමිණි නෙදිය ඇය අතට බෙහෙත් පෙති කීපය දී "බේත් ටික දැන්මම බොන්න"

යි සඳරුට කියද්දී, ඇය "හොඳයි සිස්ටර්" යැයි කියනු එහා කෙළවරේ වූ නෙත්තනට ඇසුණෙන් මෙතෙක් වෙලා එය ඔන් වී තිබුණ බවත් එය ඔන් කළේ පියුමි නොවන බවත් නෙත්තනට වැටහිණ. නෙත්ත වහාම තම ඇමතුම විසන්ධි කළේය. යළිත් ෆෝනය කනට තැබුවද එහි සද්දයක් නැති තැන බලද්දී ඇමතුම විසන්ධි වී තිබෙනු සඳරුට පෙනිණ. ඇය ෆෝනයේ වූ incoming කෝල් ගනණ බැලුවාය. අද දවස තුළ නෙත්තගේ අංකය කිහිප වාරයක් එහි සටහන්ව තිබෙනු ඇයට පෙනිණ. සඳරුට සුසුමක් හෙළුණේ ඉබේටමය. ෆෝනය යළිත් ටීපෝව මත තැබූ සඳරු දෙනෙත් පියා ගත්තාය.

නෙත්තගේ හදවත අලුතින් ඇවී ගියේ සඳරු කළ ක්‍රියාවෙනි. තමාට ඇයගේ සුසුම් හඬ ඇසුණා නේදැයි ඔහුට සිතිණ......... මම බව දැන දැනත් ෆෝන් එක ඔන් කළේ......... මොකද දන්නේ නෑ හිතුණේ මගේ කටහඬ අහන්න.........

මේ අතරේ නෙත්ත යශෝධාට ඇමතුමක් දෙමින් තමා ඔවුන් නුවර කැඳවා ඒමට අදහස් කරමින් සිටින බැවින් සති අන්තය මෙහි ගත කිරීමට පියා සමග මෙහි ඒමට සූදානම් වන ලෙස පැවසීය. එය ඇසූ යශෝධා ඉමහත් සතුටට පත්විය.

රාත්‍රි නවයට පැමිණි නෙත්ත පියා සොයා ගොස් වෙදමහතා හා දියණිය දින කිපයකට තමා ගෙදර කැඳවා ගෙන එන බව පවසද්දී එයින් සතුටු වූ වික්‍රමසේකර මහතා,

"කොච්චර හොඳද පුතා.........එක්ක එන්න......... මටවත් ඒක ඔයාට කියන්න අමතක උණා......... ඔයාගේ ජීවිතේ බේරපු ඒ අයට කොහොම සැලකුවත් මදි........."

"අනිත් එක ජීවක සුදූ පුතාව තියාගෙන කන්න බොන්න දීලා ලෙඩ දුක හැමදේම තමන්ගෙ අය වගේ බැලුවෙ එයාලා......... ඒ අය තමන්ගෙ නෑදෑයොත්ටත් වැඩිය වටිනවා"

"ඒකනේ අම්මි මම එහෙන් නෑ කමකුත් හදාගත්තේ......... යශෝධා ආවාම අම්මිලා බලන්න......... ඒ කෙල්ල නිකං අපේ ගෙදර ඉපදුණේ නැතිවා විතරයි"

"කමක් නෑ......... දැන් අපි හිතමු අපිට ළමයි හතර නෙවි පහයි කියලා. නේද ශ්‍රියන්තා........." මව හා පියා සමග දිගු කාලයකට පසු සතුටු සාමිචියේ යෙදුණ නෙත්ත ඊට පසු ආ මැදවච්චිය බලා පිටත්ව ගියේය.





සඳරුගේ අසනීප බව මදක් සුවව තිබුණෙන් දින දෙකකට පසු ඇයව රෝහලෙන් කැඳවා ආවෙන් සඳරු වහ වහා කාර්යාලයට ගියේ එහි වූ වැඩ රාජකාරි වෙනුවෙනි. එහෙත් ඇයට නිතරම සිහි වූයේ නෙත්තවය. ඔහු තමා බලන්නට නිකමට හෝ නොපැමිණි බව ඇයගේ හදවතට ගෙනාවේ ඇඩි වේදනාවකි.

ඒයා ඒ තරමටම මට වෛර කරනවද......... කමක් නෑ......... ඒහෙම හරි එයාට සැනසීමක් ලැබෙනවානම්......... ඒකත් එකක්......... ඇය තනිවම සිතුවාය. ටෙන්ඩර් පත් භාරගන්නා දිනය අනිද්ධ බැවින් කමල්ට කථා කළ සඳරු කළයුතු සියලු දේවල් ගැන උපදෙස් දුන්නාය.

"මැඩම්......... දැන් අපි යනවද එතනට"

"ගියොත් හොඳයි......... ඒත් කට්ටිය ඉන්න තැනට මිස්ට ජයසිංහ අතේ ලියුම යවමු. අන්තිම මොහොතෙ තමා ගාන දැනගන්න වෙන්නේ......... අපි යන්නම ඕන......... මෙගැන කාටවත් කියන්න එපා......... ඔයයි කමලුයි යමු"

"හොඳයි මැඩම්........."

"අද මම කොහොම හරි ලෙක්චර්ස්වලට යන්න ඕන කමල්. ඒ නිසා ඔයා මේවා එකවුන්ට්ස් සෙක්ෂන් එකටයි ලීගල් වැඩ ටික ඉවර කරන්න නයෝමි මිස්ටයි දෙන්න.........මම හවස ආයෙ එනවා......... එතකොට ඉවරකරලා මට ඕන කිව්වා කියන්න."

"හොඳයි මැඩම්........."

සරසවියට ගිය සඳරුගේ අසනීප තත්ත්වය ගැනත් ඇය එසේ පැමිණීම ගැනත් ගිම්හාන ඇයට දොස් පැවරිය.

"හොස්පිට්ල් හිටියා නිකම්වත් කීවේ නෑ......... ඒ මදිවට අද කොර ගගහ මෙහෙ ඇවිත්"

"ඔයාට කීවත් මාව බලන්න එන්න බැනෙ ගිම්හාන........."

"ඒක ඇත්ත......... ඔයාගෙ අර පොලිස්කාර මස්සිනා නම් කොහොමත් අකමැතිනේ මම ඔයා එක්ක කතාකරනවාටත්. ඔයා දන්නවද පෙරේදා නෙත්තව මට මීට් උණා"

"මොනවා ඒ කොහේද?"

"මම අපේ ගෙදර ඉඳලා ටවුන් එන්න බස් එකක් ගන්න හිටියා. එකපාරටම නෙත්ත ඇවිත් මා ළඟ වාහනේ නතර කරලා නගින්න කීවා"

"ඉ.........ත්.........තිං" සඳරු ඇසුවේ හිරි වැටෙමිනි.

මම ඇහුවා ඔයා

“මාත් එක්ක දිගටම කතා කර කර ආවා........ හොඳට

ලෙඩ වෙලා නේද කියලා........ පොර දන්නේ නෑ කිවා........

ඉන්නවා දැක්කා කිවා කලින් දවසෙත්”

........හරිනේ ඊට කලින් දවසේ මට මොකුත් තිබුණේ නැනේ........

ඒක වෙන්න ඇති කලින් දවස ගැන කිව්වේ........

“ඉතිං මගෙන් අහනවා මටයි සේමිනිටයි ගොඩක් පාලු වගේ නේද කියලා ඔයා නැති උණාම........ මට ඉතිං කියන්න හිතුනා සේමිනිට වඩා මට පාලු කියලා........ ඒත් ඉතිං කොහෙද හස්බන්ඩ්ගේ මල්ලිනේ........”

........හස්බන්ඩ්ට කිවා නම් ඊට හොඳයි........ මේ විකාරෙට

කියනවට වැඩිය........ සඳරූ තනිව සිතුවාය.

“සමහරවිට නෙත්න දන්නෙත් නැතුව ඇති ගිම්හාන. එයා ඉතිං ගෙදර ඉන්න කෙනෙක්යැ........”

“ඒ උණාට ඔයාලා දෙන්නා හිටි හැටියට ඇත් ඔයාගෙ මෙච්චර අසනීපයක් ගැන දන්නේ නෑ කිවම හරි පුදුමයි. මට නම් හිතුණෙ පොර ඇනගෙන මට බොරු කියනවා කියලා”

“ඇයි ඒ එයා ඔයාට බොරු කියන්නේ” සඳරූ රතුවෙමින් ඇසුවාය.

“කව්ද දන්නේ ඉරිසියාවද කියලා” ගිම්හාන කීවේ සඳරූ දෙස ද තියුණු ලෙස බලමිනි.

“එයා මම ගැන ඊර්ෂ්‍යා කරන්න ඕන නෑ........ එයාට ඉන්නවා මැරි කරන්න ලස්සන නෑනෙක්”

“ඒත් ඉතිං මේ නෑනට වැඩිය ඔය කොයි නෑනවත් ලස්සන නැතුව ඇතිනේ........ කෙනෙකුගේ හිතේ කාටහරි ආදරයක් ඇති උණාම ඒකට නෑකම්........ සීමා බලපාන්නෙ නෑ සඳරූ........ එයෙත් ඉතිං හිතේ මොනා තියන් ඉන්නවද දන්නෙ නැනේ පුරංගනාවියක් වගේ ඉන්න නෑනා ගැන” ගිම්හාන සිනාවක් පවා නැතිව කියද්දී,

“ගිම්හාන ඔයාට පිස්සුද........ අද මොකද මේ ඔයා කවදාවත් නැතිව අමුතු කථා කියන්නේ........” යයි සඳරූ ඇසුවේ පුදුමයෙනි. එක්වරම ඇය දෙස බැලූ ගිම්හාන,

“කියන්නෙද........? ඔයා ගැන මගේ හිතේ අදහසක් තියනවා නම් ඒක අත්හැරගන්න කියලා එයා මට කියපු නිසා” යි කියද්දී සඳරූ වෙව්ලි ගියාය.

“එ........ එයා........ කි........යන්න ඇත්තේ මම එයාගෙ........ අයියගෙ වයිෆ් නිසා........ වෙ........ වෙන්න ඇති” සඳරූ අමාරුවෙන් කියා ගත්තාය.



“හිත රවටගන්න එපා සඳූ........ නෙත්න ඔයාට ආදරේ බව ඔයා දන්නවා නේද........?” ගිම්හාන බිඳුණු හඬින් අසද්දී සඳරුට දැනුණේ තමා අහසින් පොළවට වැටුණා වැනි හැඟීමකි........ දෙයියනේ........ මේ වෙන්නෙ මොනවද........ තව දුරටත් කථා කළ ගිම්හාන,

“මට තේරෙනවා ඔයා මගේ ආදරේ ප්‍රතික්ෂේප කළේ ඇයි කියලා........ ඇත්තටම මට එදා තේරුණා නෙත්න කොයි තරම් ආදරේ කරනවද කියලා ඔයාට........ එයා මට කියපු හැම වචනෙකින්ම මම තේරුම් ගත්තේ ඔයාව එයාට ඕන තරම........”

“ගිම්........හාන........ ප්ලීස් ඕක නවත්තන්න........ ඕක ඇති........ මට බෑ කාටවත් ආදරේ කරන්න........ මම බැඳපු කෙනෙක්........”

“ඒත් ඔයා ඔයාගෙ ෆැමිලි ලයිෆ් එක ගැන එක වචනයක් වත් නොකියන්නේ........ ඒ ලයිෆ් එක ගැන එක්කො තරහෙන්........ එක්කො කියන්න දෙයක් නැති නිසා........ ඒ කියන්නේ ඔයා ඉන්නේ සතුටෙන් නෙවී කියලා කාට උණත් තේරෙනවා........ සමහරවිට ඔයාගේ පවුල් ජීවිතේ ඔයාට සතුටක් උණානම් ඔයා කැම්පස් වත් එන්නෙ නෑ කියලා මට හිතෙනවා. ඒත් ඔයා ගෙදරින් නැති සතුට නිදහස ගන්න තමා ඉගෙන ගන්නෙ කියලා මම කීවොත්, ඔයාගේ හිතේ තියන දුක අමතක කරන්න ඔයා වැඩ කරනවා කියලා මම කීවොත්........ ඔයාට නැහැයි කියන්න බැරි වේවි කියලා මට හිතෙනවා ........ ගිම්හාන කීවේ සඳරූගේ ඇස දෙස බලමිනි. සඳරූ හැඬුවාය. ඒ තමා ගැනද ගිම්හාන ගැනද නෙත්න ගැනදැයි සිතාගත නොහැකි වුව ආත්මානුකම්පාව නම් ඕනෑවටත් වඩා ඇය සිත වෙලාගෙන තිබිණ.

තමාගේ අසරණ බව භාහිර ලෝකයාට මෙතරම් හොඳින් පෙනේද ........ නෙත්න කර ඇත්තේ හොඳ දෙයක් නොවේ. ගිම්හාන වුව මෙවැන්නක් පැවසීමෙන් සිදු වූයේ තමා මෙතෙක් රැකගෙන ආ යමක් හෙළිදරව් වීමය. එකක් නෙත්නගේ රහසය. අනෙක තම පවුල් ජීවිතයේ අසාර්ථකකමය. ඒ ගැන සිතද්දී සඳරූට නෙත්න ගැන දැනුණේ දැඩි කේන්තියකි.

ඔහු තමාගෙන් පලිගන්නට සිතා ගිම්හානට එය කීවා විය යුතුය. එසේ සිතත්ම ඇයට නෙත්න ගැන දැඩි තරහකි

“මම දන්නවා දැන් ඔයා නෙත්න ගැන කේන්තියෙ ඉන්නේ........ ඒත් නෙත්න මේකට වැරදිකාරයා නෙවී සඳරූ........ කෙනෙක්ගෙ හිතක ආදරයක් ඉපදුනාම ඒක අමතක කරන එක හරි අමාරු දෙයක්

මට ......... මම දන්නවා ආදරයක් නොලැබුණාම තියන දුක......... මට හිතෙන්නේ ඔයා නිසා නෙත්න ගොඩක් දුක් විඳලා තියෙන පාටයි ......... නෙත්න මාස දෙකක් නැතිවෙලා හිටියා......... ඒත් ඒ ඔයා නිසා කියලා මට දැන් හිතෙනවා......... මට නම් ඔයාව මිට වෙන්නේ ලෙක්චර්ස්වලදී, ඒත් එයාට ඔයාව නිතර දැක දැක ඔහොම ඉන්න එක කොච්චර වදයක්ද කියලා හිතලා බලන්න......... කොහොම උණත් මට කියන්න බෑ තීරණ ගන්න......... ඒත් මම දන්න එකම දේ ......... නෙත්න ඉන්නේ ලොකු දුකකින්. ලොකුම දුකකින්. මිනිහා මට ඒක කෙළින්ම කිවේ නෑ......... ඒත් එයාගෙ කට හඬ එකම විදියකට තියාගෙන කථා කරන්න එයාට බැරුව ගියා......... ඒ කටහඬ මගදි බිඳුණා........." එසේ කී ගිම්හාන සඳරු දෙස බලා "කෙල්ලෙක් කෙල්ලක් ළඟදි අසරණ වෙනවා වගේ නෙවි සඳරු කොල්ලෙක් කොල්ලෙක් ළඟ අසරණ උණාම......... අනෙක ආදරය වගේ ප්‍රශ්නයකදී......... අපි දෙන්නම එකම කෙල්ලෙකුට ආදරය කළත් මට තේරුණා මම ඉන්නෙ නෙත්නට වඩා පහළින් කියලා ආදරේ අතින් බැලුවම......... මොකද නෙත්නගේ ආදරේ උමතුවක් නම් මගේ ආදරේ සිතිවිල්ලක් විතරයි. ඒ තරමට පරස්පරයි......... මම ඔයා නැතිව හිටියට නෙත්න කවදාවත් ඔයා නැතිව ජීවත් වෙනකන් නෑ......... ඔයාට පුළුවන්කමක් තියේනම් ඔයා නෙත්න ළඟට යන්න ........." ගිම්හාන කිවේ තම ඇතේ ඇඟිලි, නැඟෙන ආවේග දරා ගැනීමට මෙන් තදින් මිට මොලවා ගෙනය.

"දැන් ඉතිං ඔයා කතාව දන්නවනේ ගිම්හාන......... ඒත් අහගන්න ......... මට යන්න බෑ එයා ළඟට. මම යන්නෙ නෑ මගේ කසාදෙ කඩාගෙන කා ළඟටවත්......... ඒ නිසා අපි ඕවා අමතක කරමු"

"එතකොට ඔයා හැමදාම මේ ලැබිච්ච දෛවය පිළිගන්නවද?"

"ඔ.........ව්........." ඇය බිම බලාගෙන කිවාය.

"හරි පුදුමයි......... සඳරු........." ගිම්හාන කිවේ එපමණය.

නෙත්නගේ පියාද මවද සෙනෙවිරත්න වෙදමහතා හා යශෝධා උණුසුම් ලෙස පිළිගත්තේ තම පුතා වෙනුවෙන් ඔවුන් කළ කී දේ ගිනිකිරීමෙනි. ආ මොහොතේ සිටම යශෝධා නම් මෙම නිවසේ විශාලත්වයෙන් පුදුම වෙමින් සිටියාය. තම පියා නිවසේ අය හා කථා බහ කරද්දී යශෝධා මිදුලට බැස එහි අසිරිය විඳිමින් ඇවිද්දාය. ඒ අතරේ එහි ආ නෙත්න.





"නංගි බබා......... මොකද ආ ගමන් එළියට වෙලා........."

"ඔයාලගේ ගාඩ්න් එක හරි ලස්සනයි නෙත්නයියේ......... මල් පිපිලා......... අපේ පැත්තෙ නම් ඉතිං මේ වගේ මල් දකින්න නැහේ"

"මය ඔයා අඳුනන එක්කෙනෙක්ගෙ ගාඩ්න් එකක්......... අපේ නෙවි........." නෙත්න කිවේ සිනාසෙමිනි.

"සඳරු අක්කිගෙද......... ෂා......... එයා වගේම තමා ගාඩ්න් එකත් ......... ඒක නෙවි......... එයා දන්නවද අද අපි එන බව"

"නෑ......... මම කතා කරන්නේ නැහේ එයා එක්ක. අනෙක ඔයා නවද කියන්න දන්නෙත් නෑ......... ඔයාට තමා රෑට ආවාම ගිහින් යාලු වෙන්න වෙන්නේ........."

"ආපෝ මම ඒක කරන්නම්......... හැබැයි මම කියනවා සේරම" යශෝධා ඉඟි කරමින් කීවාය.

"ශූටි......... ශූටි කන්න එපා කියලා එහෙම"

"අයියෝ මොනාද......... තාම තරහද......... මම හිතුවේ දැන් යාලුයි කියලා........."

"සඳු අක්කා ලෙඩ වෙලා ඉන්නේ බෝතල් කටුවකට කකුල කපාගෙන"

"මුවර් එකටම ඔයා බිඳපු බෝතලේක වෙන්න ඇති........." යශෝධා කියද්දී නෙත්න හයියෙන් සිනාසුණේය.

"ඔයා දන්නෙ කොහොමද?"

"මට හිතාගන්න හැකි අයියගෙ තරම......... සඳු අක්කාට නොපෙනි බෝතල් තුනක් බිව්වා නම් එයාට පලිගහන්න, ඕන දෙයක් කරාවි........."

"ඔයා නම් මාර මිටරයක් තමයි........."

"මේ ඒක නෙවි......... මාගාව ඔයාට දෙන්න ලව් ලෙටර් 3 - 4 ක්ම තියනවා........."

"ඒ කාගෙන්ද?"

"වෙන කාගෙන්ද......... අපේ පන්තියෙ එවුන්ගෙන් තමා......... මගදි කඩලා බලන්න එපා කියලා නොවඳිනා වැඳුම් වැඳලා දුන්නේ ......... මමත් ඉතිං පොරොන්දු විදියටම කළා......... දෙන්නත් එක්කම බලන්න පුළුවන් නිසා........." යශෝධාගේ කථාවට දෙදෙනාම සිනාසුණහ.

ඔවුන් මෙසේ කතාකරමින් සිටිද්දී වාහනයෙන් එහි ආ මනුෂී බිමට බැස්සේ නෙත්න සමග ඉන්නේ කවුදැයි බලමිනි. ඇයගේ කුතුහලය වඩා බලවත් වූ නිසාම ඇය නෙත්නලා සිටි තැනට ගියාය.

"මම මේ බැලුවෙ නෙත්න එක්ක කතා කරන ගෑනු ළමයා කවුද කියලා"

"මනූෂි අක්කි........ මේ මැදවච්චියෙ වෙද මහත්තයගෙ දූ........ යශෝධා........ එයාලා දවස් දෙක තුනක් මෙහෙ ඉන්න ආවේ........" නෙත්න කියද්දී මනූෂි පිළිකුලෙන් මෙන් ඇය දෙස බැලුවේ කළු වී ගිය මුහුණිනි.

"මට පේන්නේ නෙත්න හරි කැමතියි වගේ පිටිසර බද පැත්තට ........ නෙත්නගේ හිත යන්නෙම ටිකක් ගොඩකරේට තමයි නේද?" මනූෂි ඇසුවේ සෝපාසයෙනි. එයින් නෙත්නගේ සිතට ඇඩි කෝපයක් ඇතිණ.

"අනේ ඔව් මනූෂි අක්කා........ මෙහෙ ඉන්න කෙරාටික තොරොම්බල් බඩු ඇක්කම තමා ගොඩකරේ ඒවගෙ වටිනාකම පේන්නේ........ මෙකනේ නැති ඒවා පෙන්නන්න මෙකප් දාන මුහුණු වලට වඩා ගොඩකරේ ඒවා ඇක්කම නිකං පිස්සු ඩබල් වෙනවා........" නෙත්න කිවේ රැවුරු මදහසක් මුව රඳවාගෙනය. එය ඇසූ මනූෂිගේ දෙනෙත් විසල් වූයේ ඉබේටමය. ඇය එවැන්නක් ඔහු වෙතින් බලාපොරොත්තු නොවන්නට ඇත........ ඇය කෝපයෙන් කළු පැහැව ගිය මුහුණින් යන්නට ගියාය. නෙත්න යශෝධා දෙස බලද්දී ඇයගේ මුහුණ මැලවී තිබෙනු ඔහුට පෙනිණ.

"ඔය තමයි අපේ ගෙදර ඉන්න එකම ඇණේ........ මන්ත්‍රීගෙ දූ නිසා [illegible] ඉන්නේ පුළුවන්නම් අපිවත් වැඩකාර කමට ගන්න........ එයා ස[illegible]ටත් ඔයාට හොඳින් කතා කරන එකකුත් නෑ........ මම කලිනුත් කිවේ........ මෙයාගෙ තාලේ ඒක නිසා ඔය කහල ගොඩ අතැරලා අපි අපේ වැඩක් බලා ගමු"

"අයියා [illegible] නිසා කතාවට පැටළුණා අපරාදේ"

"සතියක් ඉ[illegible] බලන්න........ ඔය විදියට තමා අපි එයා එක්ක නිතරම කතා කරන්නේ........ ඒක නිසා නංගි බබා ඕවා ගනන් ගන්න එපා. එයා ඇරුණම අපි මුළු පවුලම ඉන්නෙ ඔයාට"

"ඒක නෙවි........ අපි මාලිගාවේ යන්නෙ කවදද........?"

"ඔයාට ඕන වෙලාවක නෙත්නයියා රෙඩි........ මැඩමට තියෙන්නේ අණ කරන්න විතරයි"

"අයියා එච්චරම ආදරේද මට"

"ආදරේ නිසානේ මෝඩියේ එක්ක ආවේ........ රට වටේ එක්ක යන්න........" ඔහු කීවේ ඇයගේ හිස අත ගාමිනි, මනූෂිගේ සැහැසි





කතාවලින් යශෝධාගේ සිත රිදුණ බවත් එය ඇය තමාට එතරම් නො ඇඟවූ බවත් නෙත්නට වැටහිණ. ඒ නිසාම ඇයව කොහේ හෝ කැඳවා යන්නට නෙත්නට ඕනෑ විය.

"අපි යමු කොහේ හරි........"

"අපි යමු සඳු අක්කා එක්ක එන්න........"

"අනෙ අම්මෝ මට බෑ........ මම කියන්නද මම ඔයාව කැම්පස් එක ළඟට එක්ක යන්නම්........ ජයතුංග යනවා එතනට........ ඔය දෙන්නාට ඊට පස්සේ කාර් එකේ එන්න හැකි."

"Not bad"

රාත්‍රී නිවසට එන විටම යශෝධා සඳරු හා හොඳින් කුළුපග වී තිබිණ. අවසානයේ රාත්‍රියේ නිදා ගැනීමට ඇය යශෝධාට තම කාමරයට එන්න කීවේ රොෂාන්ද නිවසේ නැති බැවිනි........ ඔවුන් දෙදෙනාට කතා කරන්නට දෙදෙනාම දන්නා මාතෘකා බොහෝ විය. පියුමිද මැදියම් රැයක් වන තුරුම යශෝධා හා විහිලු තහලු කරමින් සිට සමුගත්තේ ඇය පාන්දරම වැඩට යා යුතු බැවිනි. පියුමි ගිය පසු යශෝධා ඇමතු සඳරු,

"නංගී ඇත්ම නිදාගන්නවද........?" යි ඇසුවේ කකුලේ වූ බැන්ඩේජ් පටිය ලිහන අතරේය.

"නෑ සඳු අක්කා........ නිදිමත නෑ........ කෝ බලන්න ඔයාගෙ කකුල........" එසේ කියමින් සඳරුගේ කකුල පිරික්සා බැලූ ඇය, "ප්ලාස්ටර් එක නිසා පේන්නෙ නෑ. අක්කා කැමති නම් අප්පච්චිට කියලා බෙහෙතක් අහගන්න........ මෙවට වඩා ඉක්මනට හොඳ වෙයි"

"ඔව්........ මෙක හරි වදේ........ වතුර තැවරෙන්න බෑ........ අනෙක මට ඕන ඉක්මනට හොඳ වෙන්න........ කිසිම වැඩක් කරගන්න බෑ මේ නිසා"

"හරි........ ඇනට එන්න මම කැක්කුම යන්න ටිකක් අතගාන්න........"

"අනේ එපා නංගි........ ඔයා ඇයි මගෙ කකුල අතගාන්නෙ"

"ඔයා මගේ අක්කි නිසා........" යශෝධා කියද්දී සඳරු එක්වරම ඇය දෙස බැලුවාය.

"ඇයි නෙත්නයියා මගේ අයියා නම්........ ඔයා මගේ අක්කා නෙවිද........" ඇය විමසද්දී සඳරු ගොළු වූවාය. මේ පුංචි කෙල්ලට නෙත්න සියල්ල පවසා ඇතුවා විය හැක........

"අක්කා හිතන්නේ අයියා ඉන්නේ සතුටෙන් කියලද.........නෑ......... එයා ඉන්නේ හරි දුකෙන්"

"කොච්චර දුක හිතුණත් අපි හිත හදාගන්න ඕන නංගි........."

"මම හිතන්නේ නෑ කටින් කියන දේ හිතින් කෙරෙනවා කියලා ........." ඇය සඳරුට කීවේ සිනාසෙමිනි.

kathapothak·blogspot·com



## 32

සඳරු කමල් සමග ටෙන්ඩර් කැඳවන ස්ථානයට ගියද වාහනයට වී සිටියාය. අවසාන මොහොතේ ඉතාම පරිශ්‍රමයකින් ඔවුන් විසින් අනෙක් තරඟකාරී සමාගම් දෙකේම මුදල ගැන දැනගෙන තිබිණ. ඊට රුපියල් විසි පන්දාහක් අඩුකොට මුදල සටහන් කළ සඳරු ලිහිය ජයසිංහ වෙත භාරදී බලා සිටියාය. මුලින්ම දිව ආවේ කමල්ය. තමන් ජයගත් බව, ටෙන්ඩරය තමාට ලැබුණු බව කියද්දී සඳරුට දැනුණේ අධික ප්‍රීතියකි. ඇය රථයෙන් බැස එළියට ආවාය. තරඟකාරී සමාගම් දෙකේම සිටි වගකිව යුතු නිලධාරීන් කනස්සල්ලෙන් යුතුව තම වාහනවලට නගින අතරේ ව්‍යාපාරික ලෝකයට අලුතෙන් පැහැව් ඇති මේ ගිනිසිළුව දෙස අවධානයෙන් හා පුදුමයෙන් බැලූහ......... කීප දෙනෙක්ම පැමිණ සඳරුට අතට අතදී පිටව යද්දී නගරාධිපතිවරයාගේ විශේෂ නිලධරයා හමුවීමට සඳරු ඇතුළට ගියේ හද පුරවා ගත් සතුටෙනි.

වික්‍රමසේකර සමාගම ටෙන්ඩරය ලද පුවත සුළු මොහොතකින් බොහෝ අය දැන ගත්හ. එය ඇසූ මනුෂිගේ අයියාට දැනුණේ ඇඩි කෝපයකි. ඔහු මනුෂිට කථා කළේය.

"මේකි කළේ නයාගෙ හුඹහට අතදාලා බිත්තරේ ගත්තා වගේ වැඩක්......... මගෙ බිල්ඩර්ට නොලැබුණ එකේ මුන්ට නොලැබී වෙන කාට හරි ලැබුණා නම් ඒකත් එකක්......... මට පේන්නේ මේකි ආමය නටාගෙන එනවා වැඩී කියලා......... අහන්න හිතෙනවා කෝල් කරලා රැට සුදු කොඩි පේනවද කියලා"

"අයියා කලබල වෙන්න එපා......... දැන් ඉතිං උණු දේ උණානේ ......... කලින් දේවලුත් අපි කළා කියලා දැන් හැමෝම දන්න එකේ කලබල වෙලා බෑ......... හෙමිහිට බලමු" එසේ කියා කොයුරා අස්වැසුවද සඳරුගේ ජයග්‍රහණය මනුෂිගේ හදවතට ගෙනාවේ ඇඩි ඊර්ෂ්‍යාවකි.........

"මෙකි දැන් තව ටිකක් උඩ පනිවි......... තාත්තිත් ඉතිං සේරම බිස්නස්ටික අතට දුන්නනේ......... ආ......... ටෙන්ඩර් එක ගත්තා වගෙ නෙවි......... ඕකි ඔය කෝටි හතර පහක් කොහෙන් හොයන්නද......... බලමුකෝ කරන හැටි......... හොම්බ බිම ඇනුණම තමා තේරෙන්නේ" ඇය සොයුරාට කියද්දී,

"ඔයා ඔහොම කිව්වට ඔය කෙල්ල හරි කපටියි. දක්ෂයි. පුවර් එකටම සල්ලි හොයලා ඇති. ටිකක් හොයලා බලන්න මම කියන්නේ බොරුද කියලා" සොයුරා කියද්දී මනුෂිට එය වැටහුණේ සඳරු සිතා නොබලා වැඩ නොකරන බව දන්නා බැවිනි.

තම ටෙන්ඩරය පාස් වූ බව ඇසූ නෙත්නට පුදුම නොවී බැරි විය. මන්ද ඔහු එය කිසිලෙසක නොසිතූ බැවිනි.

"පුදුමයි ප්‍රියලාල්......... මෙක ලැබුණා කීවාම"

"සර් මෙකයි......... තරහ වෙන්න එපා කියනවට......... පිරිමින්ට කරන්න බැරි ගොඩක් වැඩ ලස්සන ගෑනියෙකුට කරන්න පුළුවන්. මෙ වගෙ ලස්සනකට මොළේ එකතු උණාම ලෝකෙ උණත් කනපිට ගහන එක ඒ හැටි දෙයක් නෙවි......... කාටවත් මැඩම් මොනාහරි කියද්දී නොකර ඉන්න බැරි වෙනවා ඇති........." ප්‍රියලාල් කීවේ සිනාසෙමිනි.

"ඒ උණත් ප්‍රියලාල්......... මිනිස්සු මී කඩන්නේ අත ලෙවකන්න නෙවි......... මෙයා මේ කරන වැඩ එයාගෙ ජීවිතේට ලොකු තර්ජනයක්......... එයාව අමාරුවෙ වට්ටන්න පුළුවන් ඔය පිරිමි"

"සඳරු මැඩම් ගැන එච්චර අඩුවෙන් හිතන්න එපා. මෙච්චර ලස්සන සර්ට තාම හා කීවේ නැති මැඩම් ඊට වඩා පහළ තියෙන දේවල් ගැන ඇහැ ඇරලා බලන්නේ නෑ........."

"ඒක වෙන්න පුළුවන්......... ඒත් ගෑනියෙක් අමාරුවෙ දාන්න කැමැත්ත විතරක් නෙවි බලහත්කාරකම කියලා දෙයක් තියනවා. ඇත්එක කට්ටියක් මෙයාව දෙපාරක් පැහැර ගන්න හැදුවා. ඒත් මට්ටු නැතිව මේ වගේ දෙයක් කළානේ........."

"උඩට යන කොට තල්ලුවක් දෙන්න සර්......... දැන් කකුලෙන් ඇදලා වැඩක් නෑ. මොකද සඳරු මැඩම් ආයෙ බිමට බහින ජාතියෙ නෙවි......... මොනවා උණත් ඒ සර්ගේ......... නෝ........."

"නෑ ප්‍රියලාල්......... ඒ මගේ නෑනා........." ඔහු කීවේ කල්පනාකාරීවය.





"ඉස්සරහදි වෙනස් වෙන්න පුළුවන් සර්......... කාලය හරි මැජික් වැඩ කරනවා........."

"ඒත් මගේ කාලය ගෙවිලා යන්නේ මම ඉන්න බව අමතක කරලා......... තමුසෙගෙ මැඩම් වෙනස් වෙන්නෙ නෑ. බිස්නස්වලදි නම් යක්ෂ තීරණ ගන්නවා යකඩෙන් හදලා වගේ......... ප්‍රයිවෙට් ලයිෆ් එකේදි තමා අඬ අඬා මැරෙන්න හදන්නේ දෛවය කියලා"

"හරිනේ සර්......... මිනිස්සුන්ට දෛවය තිබුණට බිස්නස්වලට දෛවයක් නෑ......... ඒක නිසා බිස්නස් තීරණ ගන්න ලේසියි ජීවිත තීරණවලට වැඩිය." ප්‍රියලාල් සිනාසෙමින් කියද්දී මෙ කිසිවක් තමාට සිතා ගත නොහැකිවා සේ නෙත්න හිස වැනුවේය.

රාත්‍රි වික්‍රමසේකර මහතා වෙත ගිය සඳරු ටෙන්ඩරය ලැබුණ බැවින් දැන් සිටම වැඩ පටන් ගත යුතු බව පවසද්දී රසාංග විමසුවේ ඇය එය කෙසේ කරන්නේද යන්නය.

"තාත්ති......... අද උදේ අපිට සල්ලි ලැබුණා. මම මෙච්චර දවස් නොකීවේ සේරම පිළිවෙළක් උණාම කියන්න කියලා......... බැංකු දෙකකින්ම මම ලෝන් ඇප්ලයි කළා......... අපේ පහුගිය සමරි එක බලලා බැංකු දෙකෙන්ම ණය අනුමත කළා"

පියා පුදුමයෙන් බලා සිටියේය.

"කොච්චර මුදලක්ද.........?"

"කෝටි දහයක්........."

"Wh.........a.........!" සැමදෙනම කියද්දී නෙත්න දෙනෙත හකුළුවා ගත්තේ මැය කියන්නේ කුමක්ද යන්න වටහා ගන්නට මෙනි.

"එච්චර මුදලක් දෙන්න......... කැමති උණාද.........?"

"ඔව් මම හෙඩ් ඔෆිස් ගියා. මගේ නෑයෙකුත් මට උදව් කළා......... එයාගෙ රෙකමන්ඩ් එකයි, අපේ කම්පැනිස්වල ආදායම් ඒ සේරම බලලා ණය අනුම කළා........."

"amazing......... well done සඳරු well done good work" රසාංග සිටි තැනින් නැගිට පැමිණ ඇයට අතට අත දුන්නේ සතුටෙනි. සැම මුහුණකම සිනාව පිරී යද්දී වික්‍රමසේකර මහතා සඳරු තමා අසල වාඩි කරවා ගත්තේය.

"දූ සඳී, ඔයා කරලා තියෙන්නෙ ඔයාගේ වයසට කරන්න බැරි වැඩක්......... මම මේ වගේ දෙයක් කරගන්න ලැබේවි කියලා හිතුවේම නෑ......... පහුගිය කාලෙ අපේ බිස්නස් වැටිච්ච හැටියට. නැමැයි එක

දෙයක් මතක තියාගන්න පුතා........ ඔයාට දැන් හතුරො වැඩි උණා........ ඒක නිසා කරන හැම දේම පරෙස්සමෙන්......... ඔයා එක තැනක ඉන්න තලතුනා කෙනෙක් නෙවි......... එහෙම කෙනෙකුට කරදරයක් කරන එක අමාරුයි ඒ තැනටම ඇවිත් කරන්න ඕන නිසා. ඒත් ඔයා .........? ඔයා ඔෆිස් යනවා......... පන්ති යනවා, කැම්පස් යනවා......... ඒ විතරක් නෙවි පොඩි ගෑනු ළමයෙක් විදියට ඔයාගෙ තරුණ වයසෙ එන්ජෝයි කරන විදියෙ දේවල්......... ඒ කියන්නේ ටවුන් යනවා......... ෂොපින් යනවා......... වගේ දේවල් කරන නිසා කෙනෙකුට ඔයාට කරදරයක් කරන්න තියන ඉඩ වැඩියි. ඔයා දැනටමත් එක කොටසකගෙ ඉලක්කයක්........." පියා ඇයට වටහා දෙද්දී අත් අයද එය අනුමත කරමින් නොයෙක් දේ පැවසුවෝය. නෙත්න තොල පිට පෙරලා ගත්තේය. දැන් ඉතිං ඇයගේ ආරක්ෂාව ගැන මීටත් වඩා අවධානයෙන් සිටීමට සිදුවනු ඇත.........

එදින ඉරිදා දිනයක් වූයෙන් යශෝධා හා පියා සමග සෑම දෙනම දළදා වැඳීමට ගියෝය. නිවසට ආ අමුත්තනට හැකි ඉහලම අයුරින් සත්කාර සම්මාන කිරීම වික්‍රමසේකර පවුලේ එදා සිටම පුරුද්ද නිසා එම ගමනට ජීවක මහතා මැතිනිය රිද්මි ආදීන්ද එකතුවූහ. නියති, යශෝධා, සඳරු, පියුමි, මාලිංග හා නෙත්න මාලිගාවට පියමැන්නේ බැතිබර සිතිනි.

ඇමරිකාවේ සිට ආවාටවත් පසු දෙවන වතාවට මාළිගාවට ආ නියති පෙර දිනයේ මෙන් නොව සත්පුත් මනසින් සියල්ල නැරඹුවාය. නෙත්න ඇය අසලට පැමිණියේ ඒ මොහොතේය.

"අද මොකද බොහොම උවමනාවෙන් හැමදේම බලන්නේ"

"මගහැරිච්ච දේවල් වගයක් තියනවා එදා ඇවිත්......... ඒවා බැලුවේ"

"දේවල් වගයක් නෙවි......... මුළු මාලිගාවම එදා ඔයාට මග හැරුණා. මම පෙන්නුවට බැලුවා මිස එදා ඔයාගෙ ඔළුවෙ කිසි දෙයක් රැඳුණෙ නෑ........."

"අපි යමු නෙත්නයියා දළදා වහන්සේ ඉන්න තැනට" ඇය ඔහුගේ අතගෙන කීවාය.

"ඔන්න මම පෙන්නන්නම් වෙනස. එදා ඔයාට ඒක බුදුසාදුගෙ ටූත් එක. අද තමයි දළදා වහන්සේ උණේ......... පේනවද ඔයාට, ඔයා කොච්චර වෙනසකද ඉන්නේ කියලා......... ඒ කියලා ඉසෙඩ්



කියන්න බෑ......... මැද අකුරු විසිහතරක් හෙම්හිට කියවගෙන එන්න ......... ඇල්ෆබට් එකම තේරේවි එතකොට......... එතකෙට වැටහේවි ජීවිතේ කියන්නේ ඔයා දැකපු විදිය නෙවි කියලා........."

"අද බණ කියලා දෙන්නද මාව ඇදගෙන ආවේ.........?"

"නෑ බබා......... මට හරි ආසයි අර ඉස්සරහ යන කෙල්ල වගේ කෙල්ලක් ඔයා තුළිනුත් දකින්න." ඔහු යශෝධා පෙන්වමින් කීවාය.

"ඇයි අර සුදු ඇඳුම ඇඳලා යන කෙනා වගේ කෙල්ලක් නෙවිද?" ඇය සඳරු පෙන්වා ඇසුවාය.

"එච්චර මහන්සි වෙන්න එපා......... මේ ලෝකෙ සඳරුලා ඉන්න පුළුවන් එක්කෙනයි. ඒ තමයි එයා. ඒත් යශෝධා වගේ අයට පුළුවන් පොළවෙ පයගහලා ජීවත් වෙන්න. ඔයත් ඒ වගේ කෙනෙක් වෙන්න."

"ඔයා හිතන්නේ මට සඳරු වෙන්න බෑ කියලද......... ඔයාට ඒ වගේ ආදරය කරන්න බෑ කියලද?"

"කවදාවත් එයින් කාලක් වත් ඔයාට එයා වගේ වෙන්න බෑ බබා ......... එයා අතාරින්න. එයා අමුතු නිර්මාණයක්. තමන්ට කරන්න පුළුවන් සීමාවෙ ඉඳලා දකින්න. එතකෙට හරි චූටි දේකින් පවා සතුටු වෙන්න පුළුවන්......... පේනවනේ යශෝධා......... මම එයාගෙ පොකට සල්ලි දාලා ආවා ඕන කරන ඕනම දෙයක් ගන්න කියලා එයින් රුපියල් දෙදහස් පන්සියක් අරගෙන ඒ සල්ලිවලින් ගනිපුවා කරපුවා නුවරට එනකල් කිය කියා ආවා......... යාළුවො එක්ක රුපියල් තුන්සියක බතල රෝල්ස් කාලා තිබුණා. ඒක කාපු එක ගැන කියන්න එයාට ලොකු කථාවක් තිබුණා......... කට්ටිය එක්ක ගිය හැටි......... අරලිය ගස්වල දෙබල් උඩ නැගලා කාපු හැටි......... භාගෙ භාගෙ බෙදාගත්ත හැටි......... බලන්න අපිට නම් ඒක කියන කොට වදයක් වගේ. ඒත් එයාට එහෙම නෙවි හරි ලස්සන අත්දැකීමක්......... මොකද එයා මාව විකුණලා හැමදාම කෙල්ලන්ගෙන් කනවා. එදා තමා යාළුවෙක්ට රුපියල් තුන්සීයක් වියදම් කරලා ෆස්ට් ටයිම ට්‍රීට් එකක් දීලා තියෙන්නේ......... පව් නේද......... ඒත් සරලකම එතන......... ජීවිතේ එතන......... ඔයත් ඒ වගේ ජීවිතේ සරල වෙන්න......... ඒකට මැදවච්චියට යන්න ඕන නෑ. ඔයා ඉන්න තැන ඉඳලා පුළුවන්........."

නෙත්න ඇයගේ දෙනෙතට එබී පවසද්දී නියතිගේ ඇසේ දිළුළන කඳුළ දැක ඔහු ඇය දෙසට හැරී ඇයගේ දෙවුරහිස අල්ලා ගත්තේය.

"ඔය කඳුළු වට්ටන්න එපා......... ඔවා හරි වටිනවා......... මොකද මට හිතෙනවා මාත් එක්ක එකට එක කියාගෙන එන්න බැරි තරමට ඔයා දැන් ටික දවසක හිට ඉඳලා ඇනුම් තේරුම් වෙලා කියලා"

"කැලේ ඉන්න සතෙක් ගෙදර ගෙනාවම අතමං වේවි නේද?"

"නෑ බබා ගේන කෙනා ගේන්නේ බලාගන්න පුළුවන් නිසානේ. ඒ වගේ කලබලකාරී ජීවිතෙන් මිදිලා මමත් ඔයාට තැන්පත් වෙන්න කියන්නේ ඔයාව එලොවට මෙලොවට නැතිව කරකවලා අතාරින්න නෙවි. හරි ආදරෙන් ජීවිතේට අරන් යන්න......... අපි ඔයාව් අතරමං කරනවද......... ඔයාගෙ නැන්දා, ඔයාගෙ සුදු අයියා, මාමා......... සේරම ඔයාගෙ අය......... ඔයා අඩිය තියන කොට අපි වටේට ඉන්නවා......... ඒක නිසා ඔය සංකර සමාජෙ, සංකර ජීවිතේ ඈත් කරන්න......... අපි අවුරුදු ගාණක් ඇමරිකාවෙ ඉඳලා කරපුවායින් අපට මොනවද මතක. ඒත් හොඳට මතක් කරන්න ගිය අවුරුද්දෙ ඔයයි මමයි අනුරාධපුරේ ඉඳලා එන අතරේ පාරේ පොඩි කඩයකින් තේ බීපු එක, බඩ ඉරිඟු කාපු එක......... ඒවා හොඳට මතකයි නේද........."

නෙත්න අසද්දී නියති "ඔව්" යයි කියන්නට මෙන් හිස වැනුවාය.

"ඔයා ඇඳන් ඉන්නෙ ඇමරිකාවෙන් ගෙනාපු ඇඳුමක්......... ඒත් යශෝධා ඇඳන් ඉන්නෙ අනුරාධපුරෙන් ගනිපු ඇඳුමක්......... ඒත් යශෝධා අවලස්සන වෙලා නෑ ඒ ඇඳුමෙන්......... එයාට ඒ ඇඳුම හරිම ලස්සනයි......... ඒක නිසා ඇමරිකාවෙ ඒවා වගේම මෙහෙ ඒවත් අඳින්න පුරුදු වෙන්න........."

"මට ඔය කිසි දෙයක් අලුතෙන් පටන් අරන් කරන්න තරම් අලුත් බලාපොරොත්තුවක් නෑ........."

"ඒ ඔයාට හිතෙන හැටි......... අද මට ඒකට දෙන්න හොඳම උත්තරයක් නෑ......... ඒත් අලුත් බලාපොරොත්තුවක් ඒවි......... ඒ ගැන හිතලා ජීවත් වෙන්න......... දැන් අපි යමු අරහෙට......... අම්මිලා දැන් කීපාරක්ද හැරිලා බැලුවා අපි දෙන්නා දිහා"

"වැරදිලා හිතනවා ඇති ලව් කරනවා කියලා......... බලාගෙන යනකොට මම වගේම නැන්දිලත් රැවටිලා"

"අද එහෙම කිව්ට ඔයා නම් පස්සෙ සතුටු වේවි......... යමු යමු"

සැම දෙනම උඩමලුවට ගියේ මල් පුදන අටියෙනි.

"නෙත්නයියා මොකද අද මම ඉන්න නිසාවත් නැද්ද දෙන්නා එක්ක මල් තියන්නේ........."





"හිතේ බැඳීමක් නැතිව මල් තියලා විතරක් මොනාටද නංගි බබා"

"එහෙම නෙවි......... එහෙනම් යමු මා එක්ක වත්......... අඩුගානෙ අපි දෙන්නම ප්‍රාර්ථනා කරමු සඳරු අක්කිව ලැබෙන්න කියලා........."

යශෝධා කියද්දී නෙත්න සුසුමක් හෙළුවේය.

"මම මේ දළදා මාලිගාවෙම එයා එක්ක ඇවිල්ලා මල් පූජා කරලා ඒකම පැතුවා මීට ටික කාලෙකට ඉස්සර. ඒ උණත් මගේ අවාසනාවට දළදා හාමුදුරුවන්ට කරන්න දෙයක් නෑ"

"ඇයි නැත්තේ......... අනිවාර්යයෙන්ම පුළුවන්......... අදත් අපි දෙන්නා ඉල්ලමු......... බුදුන් දෙවියන් විශ්වාස කරගෙන ඉන්න අයියා......... එතකොට අපිට වරදින්නෙ නෑ........." යශෝධා කියද්දී තියන්න පිලිගත් නෙත්න ඇය හා ගොස් මල් පුදා යශෝධා සමගම එළියට ආවේ අන් අයට එකතු වීමටය.

"නෙත්නයියා සඳු අක්කි තාම වඳිනවා......... අනික් අය ගිහින්......... එයාගෙ කකුල එක්ක තනියම එන්න අමාරුයි"

"එහෙනම් ඔයා එන්න එයා එක්ක......... මම යනවා" එසේ කියූ නෙත්න යන්නට ගියෙන් යශෝධා සඳරු වෙත යළි ආවාය. ඒ එද්දී ඇය දුටුවේ පුදුම දෙයකි......... සඳරු දළදා සමිඳුන් දෙසට වැඳගෙන සිටියද ඇය ගේ දෙනෙතින් කඳුළු ගලා යමින් තිබිණ. ඒත් ඇය ඉකි නොබින්දාය. මොනවාදෝ වැඳගෙන කිවා මිස ඇය බාහිර ලොව ගැන දැන සිටියේ නැත. යශෝධා හෙමිහිට වාඩිවෙද්දී සඳරු හැරී බැලුවාය.

"සඳු අක්කා......... ඇයි මේ......... ඔයා අඬනවා"

"නෑ නංගි......... මම අඬන්නේ නෑ........."

"මට පේනවා......... ඒක අතැරලා දාන්න......... එන්න අපි යන්න........."

එසේ කියා සඳරුව නැගිට වූ යශෝධා ඇය තාම හෙමි හෙමිට පඩි පෙළ බසිමින් පහත් වැට වෙතට ගියාය.

"අක්කා......... ඔයා මෙතනින් ඉන්න මම පියුමි අක්කාට කතා කරන්නම්........." එසේ කියූ යශෝධා ගොස් පියුමි කැඳවා ආවෙන් දෙදෙනාම එකතුව සඳරුව පහත් වැට වෙත කැටුව ගියේ ඇයගේ ඇතට දෙදෙනා වාරුවෙමිනි.

"මේවා කරන්න ඕන අපි නෙවි ඉතිං......... නේද පියුමි අක්කා"

"කරන්න ඕන කෙනා අද ඊ තමා ලංකාවට එන්නේ යශෝධා නංගී......... ඒක නිසා පූටි උදව්වක් දෙන්න පාහන් පස්තු කරන්න........."

සඳරු පහන් වැට වෙත කැඳවා යනුද පහන් පත්තු කරනුද බලා සිටි නෙත්න සුසුමක් හෙළුවේය. පෙරඅ තමන් දෙදෙනා පැමිණ පහන් දැල්වූයේ කෙතරම් සතුටෙන්ද......... මෙසේ සිතමින් ඔවුන් දෙස බලා සිටි නෙත්න එකවරම දුටු දසුනින් ඔහුගේ සිහිය විකල් උණා වැනි විය. සඳරු දිගු ගවුමක් හැඳ තිබුණේ එයට දිගු ශෝල් එකක්ද පළඳමිනි. ඇය දමා සිටි ෂෝල් එකේ එක් කොනකට ගිනි ඇවිලෙනු දුටු ඔහු වහා අන් අය අතරින් දිව ආවේය. දිවවිත් එක් වරම පියුමි එහාට තල්ලු කළ නෙත්න ඇයව තමා දෙසට අදින්නට හදද්දී ඒවන විට යම් කිසි රස්නයක් ඇති තිබුණෙන් ඇය හැරී පිටුපස බැලුවාය. දුටු දෙයින් බියපත් වූ ඇය හිස හරවත්ම වහා ඇයව තමා වෙත ඇදගත් නෙත්න ඇය ගෙලවටා වටයක් කරකවා එක් කොනක් ඉදිරිපසටත් අනෙක් කොන පිටුපසටත් දමා තිබූ ෂෝල් එකේ ගිනි නොගත් කොනෙන් අල්ලා ගලවා විසි කළේය. එක් කකුලක් තිබි ලෙස බිම නොගැසිය හැකි නිසාම නෙත්නගේ ඇඟට ඇල වී ගිය සඳරු වහාම ඔහුගේ අත වැරෙන් බදාගත්තේ වැටෙන්නට ගිය බැවිනි. ෂෝල් එක එහාට විසි කරන අතරේම සඳරුගේ බඳ වටා අත යැවූ නෙත්න ඇයව වැටෙන්න නොදී තම සිරුරට තද කොට ගත්තේය. අසුරු සැනින් සිදු වූ මේ සිදුවීම් කිපය සිදුවන්නට මෙය ලියන්නට ගිය වෙලාව වත් ගියේ නොවේ......... අනෙක් සියලු දෙනාම ඇය සිටි දෙසට වහාම දිව ආවේ සිදුවූ දෙය දැකීමෙනි.

"අයියෝ ඇඳුමත් යන්තම් කළු වෙලා නේද......... අනූ නමෙන් ඇඳුම ගිනි නොගත්තේ"

"ෂෝල් එක සිල්ක් නේ......... ඒකයි එක පාරටම ගින්නක් ඇවිළුණේ
........."

"සඳී......... ඔයාට මොකුත් නෑ නේද......... මගෙ නම් පණ ගියා" රිදුම් කියද්දී නෙත්න සඳරු අතින් අතහැර, පියුමි වෙත භාර දුන්නේය. සඳරුට නෙත්න දෙස බැළුණේ නිරායාසයෙනි. ඒ සිව් නෙත් යාවුණ මොහොතේ ඒ හදවත්වල වූයේ මොනවාදැයි කියන්නට දන්නේ ඔවුන් දෙදෙනා පමණි. ඉක්මනින්ම නෙතු බිමට යොමා ගත් සඳරු පියුමි හා යශෝධා සමග මදක් එහාට ගියාය.

"ඒයි සඳී......... උඹට මොකුත් නෑ නේද.........?"

"නෑ.........නෑ......... තුවාලෙ ටිකක් පෑරුණා විතරයි........."

"දෙයියනේ නෙත්නයියා දැක්කෙ නැත්නම් ඇඳුමටත් ගිනි ගන්නවා......... එහෙම උණානම් මෙහෙම ඉන්න වෙන්නෙ නෑ......... සඳරු අක්කිත් පිච්චෙනවා" යශෝධා කීවේ තාමත් බියපත්වය.





"සමහර අය විශ්වාස කරේ නැතුවට යශෝධා ඕවට තමා කියන්නේ "දේශයේ මුර දේවතා එළි ඒ පුරා ඇල්වී කියේ කියලා" පියුමි කීවේ යශෝධාට ඉඟි කරමිනි. එය දුටු සඳරු පියුමි දෙස බැලුවේ තරහෙනි.

"නෙත්නගේ ඔළුවෙ නිතරම සුනාමි ඇලට් එක හයි වෙලානේ තියෙන්නේ......... ඒක නින්දෑ ඉතිං ගානකුත් නෑ........."

"පියුමි උඹ ආවෙ පන්සල් ද, එක එක්කෙනාට ආවඩන්නද?"

"උඹනම් හරිම ආත්මාර්ථකාමී නපුරියක්......... අර කොල්ල උඹේ ඔය ලස්සන ඇඳුම......... ලස්ස ඇඟ නෙවි ආ, පිච්චෙන්න නොදී බේරගත්තට අඩුගානෙ තැන්ක්ස් කරන්නෙ වත් නැද්ද?"

"මොකෝ මගේ ඇඟ ලී වලින් හදලයැ පරක්කු වෙලා රස්නෙ දැනෙන්න. මට දැනුණා රස්නෙ. මම හැරිලා බලද්දිනේ පැනලා ආවේ"

"ආපෝ උඹ නොන්ඩි ගගහා කර වටේ එතිච්ච ෂෝල් එකේ උතුර දකුණ හොයලා ගැලෙව්වා නම් ළඟ ඉන්න අපිත් පිච්චෙනවා ......... උඹෙක් උද්දච්ච කම ප්‍රමාණෙට වැඩියි."

"කට වහගෙන යමන්......... අපරාදෙ මගෙ ෂෝල් එක"

"ඒක විසි කළේ නෑ වෙන්ට බෑ. මම දැක්කා නිවලා අතේ එතනවා"

"ඇයි පියුමි අක්කා......... නෙත්නයියගෙ අත ටිකක් පිච්චුනා රස්නෙට........."

"අන්න කළගුණ සැලකීමට අවස්ථාව......... ගිහින් තෙල් ටිකක් ගාපන්"

"මම මේ උඹෙන් උපදෙස් ටිකක් ගන්නමයි හිටියේ හදිසි අවස්ථාවකදී ප්‍රථමාධාර ගැන රචනයක් ලියන්න"

"දෙන්නම් ගමකට......... මදි උණොත් වෙද මහත්තයා අංකල් ඉන්නවා......... උඹට කොපි පොතක්ම උණත් ලියාගන්න උපදෙස් මම දෙන්නම්" මිතුරියන් දෙදෙනාගේ රංඩුව අසමින් යශෝධා මහ සද්දෙන් සිනාසුණාය.

පසුදින යශෝධා හා පියා කැටුව පේරාදෙණිය උද්භිද උද්‍යානය බලන්න යාමට නිවසේ සියලු දෙනා සූදානම් වූයේ කාලෙකින් ඔවුන්ද එහා නොගිය බැවිනි. එදින පෝය දිනයක් වූයෙන් කඩ සාප්පු හා කාර්යාලවලටද නිවාඩු වූයෙන් නෙත්න මාලිංගටද එන ලෙස දන්වා නස්රිනාට ඇමතුමක් ගෙන ඇයට එහි ආ හැකිදැයි

ඇසුවේය. ඇය එනවා නම් තමා ඇය ගන්නට එළියට එන බව පැවසුවෙන් නස්රිනාද මෙම මිතුරු හමුවට කැමති වූවාය.

නස්රිනාගේ පැමිණීම ගැන නෙත්න උදක්ම සතුටු වූයේ මොවුන් දෙදෙනාගේ සමාන කම සැම දෙනාටම හෙට දින පෙනෙන බැවිනි. එහෙත් කකුලේ අමාරුවත් රොෂාන් නිවසට එන බවත් පවසා තමා ගමනට සහභාගි නොවන බව සඳරු පියුමිට පවසා තිබිණ. ඇය නොඑන්නේ තමා නිසා බව දන්නා නමුත් කල හැකි දෙයක් නොවූ නෙත්න නිහඬ විය.

පසු දින උදයේ සැම දෙනම කෑම බීම සකසා ගෙන, ක්‍රීඩා කිරීමට ඇවසි සියලු දේ ද රැගෙන යාමට සූදානම් වෙද්දී රොෂාන් පිබිද පහලට ආවේ නිවසේ මේ කලබලය කුමක්දැයි සිතමිනි. කාමරයේ සිට එළියට එන පියා දුටු රොෂාන්,

"තාත්ති........ මොකද මේ........ කොහේද යන්නේ........" යනුවෙන් ඇසුවේ ප්‍රේමා පාර්සල් රැගෙන එළියට යනුද බලමිනි.

"පොඩි පික්නික් පාරක් දාන්න පුතා........ මතක ඇති කාලෙක ගියේ නැනේ මෙච්චර ළඟ තියෙන ගාඩ්න් එකට........, ඉතිං මේ වෙදමහත්තයාලත් ආ එකේ යන්න හිතුවේ"

"ගාඩ්න්........? කට්ටියම යනවද........?"

"ඔව්........ ඇයි සඳරු යන්නැද්ද........?"

"නෑ වෙන්නැති........ එයා අර උඩ පත්තරේ බල බලා හිටියේ"

"අයියෝ මම හිතුවෙ යනවා කියලා........ ගෙදර සේරම යනවා........ කතා කරන්න සඳරුට........" එසේ කිවූ පියා උඩුමහලට ගියේ සඳරුට කතා කරමිනි. පියාගේ හඬ ඇසුණු ඇය එළියට එද්දී,

"මොකද අද පාක් යන්නෙ නැද්ද?"

"නෑ තාත්ති කකුලත් රිදෙනවා නේ........ අපි ඉන්නවා"

"ඔයා දෙන්නා විතරක් ගෙදර ඉන්න........ කෑම වත් නැතුව........ යමු යමු........ රොෂාන්........ මම මේ ඔයාගෙන් අහන්නේ........ අවුරුදු කීයකින් විතර ගාඩ්න් ගියේ නැත්ද........?"

"හය හතකින්........"

"එහෙනම් ලැස්ති වෙන්න........ ඉක්මනට දෙන්නම ඇඳුමක් දාගෙන යමු........ ගෙදර සේරම යද්දී........ මොකද මෙ........?" පියා කියද්දී සඳරු රොෂාන්ගේ මුහුණ බැලුවාය.

"අදහස හොඳයි වාගේ........ අද මොකුත් කරන්නත් බෑ........ පෝය නිසා........ හැමතැනම වහලනේ........ යමු අපිත්........ කාලෙකින්





මයත් කොහේවත් ගියේ නැනේ........" රොෂාන් කියද්දී හිස වැනූ සඳරු සූදානම් වීමට ගෙතුලට ගියාය. සැම සියලු දෙනම සූදානම් වී එළියට එද්දී සඳරු ද රොෂාන්ගේ අතේ එල්ලී ගමන යාමට එනු නෙත්න බලා සිටියේ ඇඩි පුදුමයෙනි. සඳරු යාමටත් වඩා ඇඩි ලෙස ඔහු පුදුමයෙන් පුදුමයට පත් වූයේ රොෂාන් යනු ඇකිමෙනි. පවුලේ අය හා රොෂාන් ගමනක් යනු වසර හය හතකට පසු මේ නෙත්න දුටුවාමය. එයම ඔහුගේ විමතිය උච්චතම තත්වයට ගෙනාවේය.

මාලිංග පොරොන්දු වූ ලෙසම මල්වත්ත දොරටුව අසලට පැමිණ සිටියේය. ඒ අතරේ නස්රිනාද පැමිණියෙන් නෙත්න ගොස් ඇයව කැඳවා ආවේය.

"අමඩ........ අද කුඩ ගෙනාවේ නැද්ද........ රොෂාන් අයියා ඇවිත්නේ"

"මේ මාලිංග සවුත්තුව එපා........ ඒක නෙවි........ හොටි මොනවා හරි ගෙනාවෙ නැද්ද........?"

"ගෙනාවා ගෙනාවා ගමකට........ හැබැයි ඔයා බොන ඒවා නෙවි........ අපි බොන එවා"

"උන්නා හැටියට මලා මදැයි කිව්වලු. ඒත් ඇති. යමුනේද එහෙනම්........ ආ........ ටිකට්........?"

"අර අවන්තයියා ගියේ ගන්න........"

සඳරු, පියුමි, යශෝධා, නස්රිනා හා නියති සමග එක එක ළඟින් කථා කරමින් ගමන් කළාය. එහෙත් උද්‍යානයේ දිගින් දිගටම ඇවිද යාම සඳරුට අසීරු වූයෙන් ඇය යශෝධා හා පියුමි සමග අසල වූ බංකුවක වාඩි වූයේ අන් අයට යන ලෙස කියමිනි. විද්‍යා අක්කාගේ ලොකු පුතා වගීෂ පැමිණ ඔවුන් සිටි බංකුවේම වාඩිවූයේ නැන්දි සමග එන බව කියමිනි. අනෙත් අය ඈතට යනු බලා සිටි පියුමි,

"උඹට අපි නොවදිනා වැදුම් වැන්දා එන්න කියලා බැරි උණා........ රොෂාන් එක පාර කියන කොට ඔළුව හෙළ උණා නේද........?" යි ඇසුවේ හරහෙනි.

"මට එන්න ඕන කමක් තිබුණෙ නෑ බං........ මොන පුදුම හෙතෙන් එකක්ද මන්දා රොෂාන්ට අද පික්නික් යන්න හිතිලනේ"

"සැනෙන්න දියුණුවක්........ අනේ හොඳයි........ දෙන්නා දෙමාල්ලෝ උණාම බොහොම එපැයි"

"කොහොමද?"

"හරියට උඹලා දෙන්නා වගේ......... කුරුල්ලයි කිරිල්ලියි වගේ........."

"ඒ වගේ තමා"

"ඔව් පියාඹන්නෙ නැති ටික විතරයි අඩු"

"උඹ ඉතිං තාම පුප්පන්නේ මොටද......... කොහොම හරි දැන් ආවනේ......... ආ......... අන්න මාලිංග ආයෙ එනවා"

"ඒ මොකද ඒ?"

ඔවුන් වෙත පැමිණි මාලිංග,

"පියුමි......... මම අරහෙ ඔයා හොයනවා ඔයාලා මෙතනද තාම" යනුවෙන් අසා "ඒයි නංගි බබා ඔයාට අයිස්ක්‍රීම ඕනද?" යි ඇසුවේ වගීෂව වඩා ගනිමිනි.

"හරි හරි බැච් එකේ ඉන්න පොඩ්ඩුන් දෙන්නව අරන් ගිහින් අරන් දීලා එන්න......... අපි හෙමිහිට යන්නම්........." පියුමි කියද්දී සඳරු සුසුමක් හෙළුවාය.

"මොකද එකට අරන් දෙකට දීලා වගේ"

"මොකක්.........? උඹ හිතලා ඇහුවද වැරදිලා ඇහුවද?"

"නෑ මම ඇහුවේ වැරදිලා නෙවි. එකට අරන් දෙකට දුන්නාම ලොකු ලාභයක් නැනේ......... එකයිනේ ලාභ."

"ඒකෙන් කියන්නේ එකට එකක් ලාභයි කියලා......... ලද දෙයින් සැනසියන්"

"හරියට උඹ කරනවා වගේද?"

"ඔව්........."

"ඇයි උඹ බොරු කියන්නේ......... ලද දෙයින් උඹ සැනසිලා නෑනේ........."

"ඇයි නැත්තේ.........?"

"සැනසිලා නම් උඹ අද මෙහෙම ඉන්නෙ නෑ......... මෙතන ඉන්නෙ රොෂාන්......... මම නෙවි. උඹේ ඇස් දෙකේ ඔය දුක, ඔය තුනී තෙත නෑ.........තමන්ගෙ මිනිහගේ අතේ එල්ලිලා කියෝ කියෝ යන්න උඹත් ආසයි......... අයිස්ක්‍රීම් එකක් අරන් මාරුවෙන් මාරුවට අතේ එල්ලිලා ඇගේ දැවටි දැවටි ඇවිදින ගමන් කන්න උඹත් ආසයි......... කොහේ හරි පාලු තැනකට වෙලා මිනිහගේ උරේට හේත්තු වෙලා කියවන්න උඹත් ආසයි......... මේ වගේ ගමනක් ආවාම හරි මිනිහගෙ අත උඹ වටේ නිතරම තියෙනවට උඹත් ආසයි......... තව......... ගිතට"





"ඇති.........ඇති"

"ඇයි බයද......... බොරුව එළිවෙනවට......... මේ සැනසීම උඹට නෑ......... ඒක නිසා මේ නිවාඩු දවසෙ මේ පාක් එකේ අර යන කපල්ස් දැක්කම උඹට සුසුමක් හෙලෙනවා......... ඇහැට එන කඳුළ මගෙන් වහන් කරන්න බැරි වෙනවා......... හරිද මැඩම් මම කිව්වා" පියුමි අසද්දී සඳරු ගොළු වූවාය.

"ඇයි බං රොෂාන් මට මෙහෙම කරන්නේ......... මට එන්න බෑ කිවෙත් ඒකයි. ලෙඩ කකුලක් තියාගෙන අනිත් අය එක්ක මාව එක්ක යන්න......... එයාට මතකවත් තිබුණාද අද මම ආපු බව......... පාටියකට ගියත් ඔහොමයි"

"ඉතිං උඹ හරි ආසයිනේ එහෙම ඉන්න. ඒකනෙ වෙන දෙයක් ගැන නොහිතන්නේ. උඹේ ආගාවල් ගැන රොෂාන් දන්නවා. බිරිඳගෙ ආශාව ඒ විදියට සම්පූර්ණ කරන හොඳ ස්වාමිපුරුෂයෙක්"

"රිදෙන බව දැනත් රිද්දන්න එපා පියුමි........."

"රිද්දලා හරි මට උඹට ඔප්පු කරන්න ඕන දෙයක් තියනවා......... උඹ උඹේ ජීවිතේ ආගාධයකට අරන් යනවා කියලා. උඹේ ලස්සනම වයස......... ආදරේ කරන්න, දඟලන්න, කොල්ලෙක් ළඟ හුරතල් වෙන්න, උඹට අයිති වෙච්ච කාලය වයස උඹ අර බිත්ති හතර මැද්දට උඹ විහින්ම හිර කරගෙන තියලා......... කවදා හරි උඹ ඔහොම උන්නොත් උඹේ ඉදිච්ච සුදු කෙස් ගහක් කන්නාඩියෙන් උඹම දැක්ක දවසට උඹ උඹටම දොස් කියා ගනිවි උඹව අමාරුවේ දා ගත්තේ උඹමයි කියලා......... අහපං සඳී......... මේ ලෝකෙ මොහොතින් මොහොත වෙනස් වෙනවා. සමහර දේවල් තියනවා අපිට වෙනස් කරන්න බැරි......... ඒත් අනිත් හැමදේම වෙනස් කරගෙන ජීවිතේ අලුත් කරගන්න ඕන අපි......... 'නව සිතුවිලි... නව අදහස්'......... අපේ කම්පැනි එකේ තේමා පාඨය අපිටත් ගැලපෙනවා.........ඒක එහෙම නුනොත් අපි මග ඉද්දි ලෝකෙ යනවා......... ඇනටත් උඹ ටිකක් දුර පහුවෙලා......... ලෝකෙ යනවා......... අපි තාමත් පිටිපස්සට අතකුයි කකුලකුයි අලා උඹව ඇදලා ගන්න හදනවා වර්තමානෙට. ඒත් උඹ එන්න බයේ දඟලනවා......... තව ටිකක් දුරට යනකොට අපිටත් උඹව ඇදලා ගන්න බැරි තරමට උඹයි අපියි දුරස් වේවි......... මොකද අපි ඉන්න තැනිනුත් ලෝකෙ ඉස්සරහට යන නිසා. අන්න එදාට උඹ ළඟ අද ඉන්න අපිත් නැති වේවි......... ඒක නිසා ලිඳ ඇතුළෙ ඉඳගෙන ලෝකෙ බලන්නෙ නැතුව ළිඳෙන් එළියට ඇවිත් බලපං" පියුමි කියද්දී සඳරුට සිහි වූයේ සේමිනිගේ වදන්ය.

# 33

හෙමින් හෙමින් කොර ගසමින් මෙදෙසට එන සඳරු දෙස රොෂාන් බලා උන්නේය. තමාට ඇය කැටුව එන්නට ඕනෑ කම වෙතත් ඔහු එය නොකළේය. ඇයට රිදෙන්නට, රිදවන්නට ඕනෑ නිසාම ඔහු ඇයව මග දමා ආවේය. අද දවසේ ඇයද සොයුරාවද හොඳින් නිරීක්ෂණය කළ යුතු යැයි ඔහු සිතුවේය. ඔහු බොහෝ දුර දිග සිතුවේය.........

ප්‍රේමා රිද්මිගේ කුඩා දියණිය වඩාගෙන පැමිණ සඳරුට දුන්නේ ඇය එක තැන වාඩිවී සිටි බැවිනි. සඳරු ඇයව සුරතල් කරනු දුටු රිද්මි රොෂාන් දෙස බලමින්

"රොෂාන්........ දැන් ඉතිං කාලෙ හරි ඔයාටත් තාත්තෙක් වෙන්න ......... දැන් මගේ බබා නලවලාම සඳරු හොඳ හැටි එක්ස්පීරියන්ස් අරන් තියෙන්නේ" යි කිවාය.

"කොහෙද මම මෙයාට කියනවා අක්කි......... තාම ඉතිං කැම්පස් යන ගින්දා බෑ කියනවනේ බබාලා හදන්න......... නේද සඳරු?" යි රොෂාන් අසද්දී සඳරු රතු පැහැ ගැන්වුණේ එතැන සිටි සැම දෙනාටම පෙනෙන පරිදිය. පියුමි නෙත්නගේ මුහුණ බැලුවාය. නෙත්නගේ මුහුණද වෙනස් වී ගියේ ක්ෂණයකිනි.

.......එසේ නම් ඔවුන් මෙසේ සිටින්නේ සරසවි ප්‍රශ්න නිසාද......... නෙත්න පත්වූයේ විසඳාගත නොහැකි ගැටලුවකටය. ඔහුගේ තොලකට පවා වෙලී ගියා බඳුවිය.

"මොනාද රිද්මි ඔයා පොඩි නෑනට කියන්නේ......... ඔය ලොකු නෑනා ඉන්නේ.........එයාට කියන්නකෝ"

"එයා නම් ඉතිං බබාලා හදන්න කැමති නෑ කියනවනේ......... ඒක නිසා ඉතිං අපිට සඳරු තමා ඉන්නේ ඇනට ගෙදරට අමුත්තෙක් ගේන්න"

"ඇනට ඉතිං ඔයාගෙ දෙන්නා ඉන්නේ අක්කි......... ඔය මැඳැයි. නේද සඳරු........." රොෂාන් යළි කීවේ අසල සිටි සඳරුගේ උරහිස මත අත තබමිනි. මේ කිසිත් ඇසීමවත් බැලීමවත් නොරිසි වූ නෙත්න



එතැනින් නැගිට්ටේය. නෙත්නගේ ප්‍රතිචාර සඳරුට නොවැටහුණා නොවේ. ඇය ඔහු දෙස හොරැහින් බලද්දී ඔහු නැගිට යනු පෙනිණ. රොෂාන් මේ දෙදෙනා ගැනම බලා සිටියේ තියුණු නෙතිනි. එහෙත් ඒ බවක් ඔහු කිසි ලෙසකත් දෙදෙනාටම නොඇඟවිය.

යශෝධා කට්ටිය හා කෙලිදෙලෙන් ගත කරනු දුටු නෙත්න හැම දෙනාගෙන්ම මිදී උද්‍යානයේ ඈතින් ඈතට ඇවිද ගියේය. මහවැලි ගං ඇලේ පිපෙන කුඩා කහපාට මල් කිපයක් කඩාගත් ඔහු ඒවායේ පියලි කඩා එකින් එක සුළඟට ඇමුවේය. උණ පඳුරු නඟන සිලි සිලියද මේ චමත්කාර ජනක පරිසරය ඔහුගේ පෙම්සිත ආදරණීය අනුස්මරණවලින් පුරවා දැමීය.

......... සඳරු නොයිඳුල් යුවතියක් බව දැනගත් මොහොතේ තමා තුළ ඇතිවූ සතුට......... ඒත් දැන් එයින් පසු බොහෝ දිගු කාලයක් ගතව තිබේ......... ඒ අතර කාලයේ සිදු වූ වෙනසක් වේද......... රොෂාන් අයියා ටිකෙන් ටික සඳරුට ළංවෙනවා යැයි තමාට සිතෙන්නේ මන්ද......... ඔහු වෙනදා නම් සිටියේ ඇය ඉන්නවාද නැද්ද යන්නද නොදන්නවා මෙනි. ඒත් දැන් දැන් සිදුවන වෙනස කුමක්ද.........

කෙතරම් අමතක කරන්න හැදුවද සඳරු අමතක කළ හැකි නොවේ ......... ඇය ගැන තම අවධානය නිරන්තරයෙන්ම පවතින බවට රියේ පවා වූ සිදුවීම සාක්ෂියක් නේද.........

සිත නිරතුරුවම, ඔබ ගැන මතකය
රැගෙන එන නිසා
දුරස්ව යන්නට සිතුවද නොහැකිය
මගේ නෙතු වසා
සිත සිර කර ඇති, මොහොතක් පමණිය
දුවයි සැම අතේ
ඔබගේ මතකය අමතක කරනට
කළයුතු කිමැයි සිතේ.........

හඬාගන්න මට ඕනෑ වුව අද
කඳුළු ගලනු බැරී
ඔබ අන්සතු බව අඟවමි සිතටම
දුක් ආගාධයෙ එරී
රන්මසු කහවනු උපයා හෙටටද
කලත් දිවි සරි

ඔබ නැතිවම මම හෙට දවසකටද
දෙනෙත් යුග අරී

කියාගන්න ඇති දහසක් හැඟුමක්
සුසුම් බවට පත් වී
කිමද සොඳුරියේ ඉවතට යන්නේ
මේ ඉරණම අත්වී
ගෙවුණු දිනේදිද ලබනා හෙටටද
කඳුළ උරුමයක් වී
ඉන්නට වෙද මට, ඔබ නැතිවම මගෙ
හදවත තැවි තැවී.........

එපා යන්නට කඳුලෙ උරුමය
මෙමට දී කිසිදා
මගේ නෙතුමත සිහිනයක් වී
ඉන්න ඔබ හැමදා
අතින් අත ගෙන සිනාසුණ
හැටි මතකයිද පෙරදා
එවන් මතකය ළඟ රැඳෙන්නයි
උදාවන මතුදා

නිල නෙතු යුග පාන මදහස
සිහිනයක් විලසේ
ඇල ගංතෙර පිපුන නෙළුමන්
විලස සිත ගැවසේ
නිතර දකිනා ඔබව අමතක කරනු
කිම කෙලෙසේ
මගේ අරමුණ ඔබ දිනීමයි
උදාවන අවසේ

.........මගේ සඳ......... ඔයා මගේ නොවීත් මගේම උණේ දෛවයේ මොන තීරණය නිසාද......... සිහිවටන විතරක් ඉතිරි කරන්න නම් මේ ආදරේ මගේ හිතේ ඇති උණේ ඇයි......... නෙත්න මෙසේ කල්පනා කරමින් තණබිස්සේ ඇලවී සිටිද්දී එහි ආ නියති ඔහු අසල බිම හිඳ ගත්තාය.





"සුදු අයියා......... මොකද මේ......... සේරම කට්ටිය අරහෙ සෙල්ලම් කරනවා"

"ඉතිං ඇයි ඔයා ආවේ.........?"

"ආවෙ ඔයා පේන්නෙ හිටියෙ නැති නිසා"

"මට හරි ආස හිතුණා......... මේ පරිසරේට ලස්සනට......... ඒකයි ආවෙ"

"ඒකද......... හිතේ අමාරුවටද.........?"

"ඇයි ඉතිං හිතේ අමාරුවක් අමුතුවෙන්"

"රොෂාන් අයියා ආපු නිසා......... ඒක අලුත් වෙනසක් නිසා"

"ඒක ඉතිං අලුත් දෙයක් වෙන්නෙ කොහොමද......... ඒ දෙන්නා කපල් එකනේ......... අනෙක ඒ දෙන්නා එකට නෙවිද කොහොමත් ඉන්නේ"

"ඒ එකට ඉන්නෙ ඉතිං නිල වෙච්ච නිසානේ. මම නම් මේ දැක්කා ඔයි රොෂාන් අයියා කට්ටිය එක්ක ගමනක් ඇවිත් තියෙනවා"

"ඔයාට ඔහ ඇත්ත දැනගන්නනේ......... ඔව් මාත් මේ කල්පනා කළේ ඒ වෙනස තමා"

"හොඳයි ඒ දෙන්නා හොඳින් සතුටෙන් ඉන්න පටන් අරන් නම් ......... ජීවිතේ අලුතෙන් පටන් ගන්න තීරණය කරලා නම්......... ඔයා මොකද කරන්නේ.........?"

"මොනවා කරන්නද......... මට විරුද්ධ වෙන්න බැහැනේ......... මම එයාට වදයක් නොවී ඉන්නවා"

"ඒත් ඔය හිතේ තියන දේවල් සැරින් සැරේ එළියට එන එක නවත්තන්න ඔයාට බැරි වේවි. ඔයා සමහර වෙලාවට එයාලගෙ දේවලට මැදිහත් වෙන්න ගියොත් ඒක සඳරුට ප්‍රශ්නයක් නොවේවි කියලද හිතන්නේ"

"ඔයා කියන්නේ ඇත්ත......... මගේ හිත මට වත් විශ්වාස කරන්න බැහැ......... ඒක එහෙම නොවෙයි කියලා කියන්න හරියටම බෑ........."

නෙත්න කිවේ නියති දෙස බලමිනි.

"ඒක නිසා අපි ආපහු යමු ඇමරිකා......... එතකොට ඔයාගෙ හිත හදාගන්න ලේසියි. මම බලා ඉන්නම් ඔයාගෙ හිත හැදෙන කල්"

"නියති බබා......... මේ අහන්න......... ඔය අනම් මනම් නොහිතා ඔයාගෙ ඉස්සරහ ගැන හිතන්න"

"ඔයා නැතිව මට ඉස්සරහ ගැන හිතන්න තේරෙන්නේ නෑ"

"කාගෙවත් වාරුවෙන් යන ගමනක් නෙවි තමන් යන ගමනක් විදියට හිතන්න"

"ඉතිං මමත් ඒකම ඔයාට කිව්වොත්"

"මට දෙන්න උත්තරයක් තියනවා........ මම නැතිව ඔයාට ඉස්සරහ ගැන හිතන්න බැරි උණාට සඳරූ නැති උණොත් කරන දේ මම තීරණය කරලා ඉවරයි. මම හැමදාම තනියම ඉන්නවා"

"මම හිතන්නේ නෑ ඔයාට එහෙම ඉන්න ගෙදරින් ඉඩ හම්බවෙවි කියලා" නියති කිවේ ඔහු අසල බිම මුනින් තලා වී දෙවැලමිට බිම ගසා ඇත කම්මුලේ තබමිනි.

"ඒ කියන්නේ මට ඔයාව මැරි කරන්න වේවි කියලා"

"හ්ම........" නියති කියද්දී නෙත්න හිස වැනුවේ එය විය නොහැක්කක් බව කියන්නට මෙනි.

කට්ටිය කණ්ඩායම් ගැසී නොයෙක් නොයෙක් තැන වාඩි වී හෝ සෙල්ලම් කරමින් සිටියහ. බැඩ්මින්ටන් රැකට් රැගෙන ගිය බැවින් මාරුවෙන් මාරුවට සෙල්ලම් කළ ඔවුන් දෙස සඳරූ බලා සිටියේ සිනාසෙමිනි. රැගෙන ගිය බියර් කෑන් බොමින් නොයෙක් දේ සාකච්ඡා කරමින් සිටි පිරිමි කට්ටිය බොහෝ විට කලේ වෙද මහතාගේ කථාවලට සවන් දීමය. යශෝධා නම් කාලය ගතකළේ අත්තටු ලැබුණු අයුරකිනි. ඇය බැඩ්මින්ටන් ගසමින්ද වෙනත් කණ්ඩායමක් සමග වොලිබෝල් ගසමින්ද සිටිනු දුටු සඳරූට සිහි වූයේ ඇයගේ පාසල් කාලයයි. ඒ අතරේ රිද්මිගේ කුඩා දියණිය පුලාරා වඩාගෙන පැමිණි රොෂාන් බැඩ්මින්ටන් ගසමින් සිටි නෙත්න වෙත ගියේය.

"හරි හරි........ දැන් ඇති ගැහුවා........ නස්රිනා එන්න ඔයයි මමයි ගහන්න. ඔයා එක්ක සෙල්ලම් කරද්දී සඳරූ එක්ක සෙල්ලම් කරනවා වගේ තමා. නෙත්න........බබාව සඳරූට දෙන්න. අක්කි කිවා බෑග් එකේ කිරි ඇති කියලා" එසේ කියා නෙත්න යමක් කියන්නට පෙර,

"ඔයා චූටි මාමා ළඟට යන්න බබා" යි කියමින් නෙත්න අතට බබා දුන් රොෂාන් ඔහු අත තිබූ රැකට් එක ගෙන ඉක්මනින්ම නස්රිනා හා ක්‍රීඩා කරන්නට විය. නෙත්නට වූයේ නොසිතූ දෙයකි........ බබා වඩාගෙන ඉන්නට ඇත්නම් හොඳය. ඒත් කිරි පොවන්නට තමාට නොහැක. ඔහු වටපිට බැලුවේය. අම්මිවත්



අක්කිවත් පෙනෙන්නට නැත........ ඔහුගේ සිත කලබලයට පත් වූයේ බබාද හඬන්නට වූ බැවිනි........ ඇය හඬන්නේ බඩගිනි නිසා විය යුතුය. කළ හැකි අන් යමක් නැත බබාගේ කිරි තිබුණේද සඳරූ සිටිනා තැන බෑගයේය. ඒනිසාම නෙත්න බබා නලවමින්ම එහි ගියේය. බබා හඬනු දුටු සඳරූ එදෙස බැලුවේ කිරි එක තමා ළඟ බව සිහිවීමෙනි. නෙත්නට තමාවෙතට එන්නට කීමටද නොහැක. එහෙත් දරුවා හඬන නිසා කිරිටික පෙවිය යුතුය.

නෙත්න හෙමිහිට ඇය වෙත ගියේය.

"බබාට බඩගිනි වෙලා........ මම හිතන්නේ........" ඔහු බොහෝ කාලයකට පසු ඇය දෙස බලා පැවසීය.

"මට කිරි එක දෙන්න ඕන........ ඒත් මගේ කකුල කැක්කුම නිසා තියාගන්න බෑ........ උකුලෙන් තියාගන්න........ මම කිරි එක පොවන්නම්........" ඇය හෙමිහිට කීවාය.

"මට පොවන්න දැනෙන්නෙ නෑ........" ඇය දෙස බලමින් පැවසූ නෙත්න ඉක්මනින්ම ඉවත බැලීය. බෝතලය අතට ගත් සඳරූ හෙමිහිට නැගිට ඔහු පසට හැරී පුටුව ඔහු අසලට ගෙන වාඩි වූවාය. නෙත්න බබා තබාගෙන උන්නේ හරියට කෙළින් උරහිස මත තිඳිකරවාගෙනය.

"ඔහොම බෑ........ හරහට අරගෙන අත උඩ තියාගන්න" නෙත්න එය කළද ඔහුගේ නොදැනුවත්කම නිසාම එය නිවැරදිව නොකලෙන් බබා මදක් කිහිලි දෙකෙන් ඔසවා ඔහුගේ අතේ වැලමිට හරියට හිස කෙලින් කළාය. එසේ කරද්දී දෙදෙනාගේම අත් එකිනෙක ගැටෙද්දී දැනුණු නුහුරු හැඟුමින් දෙදෙනාම එකිනෙකා දෙස බැලීය. සඳරූ හෙමිහිට බිම බලා ගත්තාය.

"ඔයා ඔහොම අල්ලගෙන ඉන්න, මම පොවන්නම්" එසේ කියමින් බෝතලය අතට ගත් සඳරූ මදක් නෙත්න දෙසට ඇලවී බබාට කිරි බෝතලය දුන්නාය. එසේ කිරීමේදී ඇය වූයේ නෙත්නගේ මුහුණ ළඟම වූයෙන් නෙත්නට දැනුණේ ඇඩි අපහසුවකි. නෙත්න හෙමිහිට හිස හරවා සඳරූ දෙස බැලුවේය. ඇයගේ මුහුණේ දඟ කරන කෙස් රොදක් ඔහුගේ මුහුණේද පැමිණ වදියි. ඔහුට හුරු පුරුදු ඇයගේ සුවඳ දැනෙද්දී හදවත දරාගන්නට බැරි වේදනාවකින් රිද්මකින් වෙලී යනු ඔහුට වැටහිණ. සඳරූද නෙත්න අසලට වී සිටියේ පියවි ගතියෙන් නොවේ. පුංචි දියණිය කිරි එක බොන අතරේ සඳරූගේ අත හා සෙල්ලම් කළෙන් ඇයට හැඟුණේ සිනාවකි. නෙත්න ඇය සිනාසෙන අයුරු බලා උන්නේය.

සෙල්ලම කරන අතරේ මෙදෙස බැලූ රොෂාන් මේ සියල්ල රහසේ බලා උන්නේය. වෙනදා නම් දෙදෙනා කෙතරම් කථා කරන්නේද......... අද දෙදෙනාම නිහඬය. එහෙත් කථා නොකරන්න හේතුවක් තිබිය යුතුය. තරහ සාමාන්‍ය එකක් නම් නෙත්න ඇය අසලට නොයන්නේ. ඔහු තමාටම ඒ ගැන කියා නොගිහින් සිටිනු ඇත......... ඒත් මේ තරහා ඊට බොහෝ වෙනස් ලෙසකි.

දහවල් කෑම සඳහා නෙත්න සෙවූවද ඔහු සොයන්නට නැති බැවින් මාලිංග ඔහු සොයා එහාට ගියේය. බොහෝ ඈත තැනක උණ පඳුරක් යටට වී ඔහු නිදා උන්නේය.

"ඒයි උඹ මෙතන නිදි......... අන්න කට්ටිය කෑමට උඹව හොයනවා ......... යමු"

"ඇත්තටම මට බඩගිනි නෑ......... උඹ පලයං"

"ගෙදර සේරම ඉස්සරහ අනාගනින් පුළුවන්නම්......... අනෙක රොෂානුත් ඉන්නවා......... මොකද උණේ? බබාට කිරි පොවද්දී කිරිල්ලි මොනාද කිව්වේ?"

"ඒ විකාරෙ කියයි මොකුත්ම......... බබයි එයයි මා ළඟ ඉද්දි මාව හොල්මන් උණා බං........."

"ඇයි උඹටත් හිතුණද බබෙක් ඇත්නම් හොඳයි කියලා"

"ඇයි නැත්තේ......... මට තාම අමතක කරන්න බෑ ඒ වෙලාවෙ තිබ්බච ෆීල් එක"

"මට හරි පුදුමයි මචං......... උඹට තාමත් අවුරුදු විසි දෙකයි......... අච්චර පිස්සු නට නටා ඇමරිකාවේ හිටපු උඹට වෙච්ච දේ හිතද්දී. සඳරුගේ ලස්සන දැක්කම ඕන කොල්ලෙක් එයාට ආසා කරනවා......... ආදරේ කරනවා......... ඒක ඇත්ත......... ඒත් උඹ.........?......... උඹට ඒකිව නැතිව හුස්මවත් ගන්න බැරි වෙලානේ......... මචං ඔක සිද්ධ නොවුණොත් ඔහොම ගිහින් උඹට පිස්සු හැදෙයි" මාලිංග කීවේ මිතුරාට අනතුරක් හඟවන ස්වරයෙනි. නෙත්නගේ ඇසට කඳුළු උණා ආවේය.

"ඒක වෙනවා නම් හොඳයි......... එයා නොලැබෙනවා නම්........."

"උඹ ඔය තරම් කල කිරෙන්න එපා......... අපි තව බලමු........."

"කොච්චර කල් බලා හිටියද බං දැන්......... එයා නම් මා එක්ක එන්නෙ නෑ......... විඳව විඳව හරි අයියා එක්කම ඉන්නවා මිස"





"වැඩෙයි කියන්නෙ රොෂාන් අයියාගෙන් අහන්නයැ. ඒත් දැන් දවස් ගානක්ම මට හිතුණා පොරට හොඳට ඩ්‍රින්ක් එක දම්මවලා ෆැමිලි ලයිෆ් එක ගැන එහෙන් මෙහෙන් අහන්න........." මාලිංග කියද්දී නෙත්න මිතුරාගේ මුහුණ බැලුවේ අමුතු යමක් කියවුනු පරිද්දෙනි.

"මොකද උඹ හිතන්නේ......... පොර කියයිද?"

"සැක හිතුණොත් උඹට හොඳට පොවලා බොනවා වගේ රඟපාලා නිකම් ඉඳී, මම දන්නවනෙ මිනිහගෙ හැටි.........?"

"මට මෙහෙම හිතෙනවා. දැන් උඹලා ඉන්නෙ කතා නැතිවනේ ......... උඹත් ඉතිං බලා ඉන්නෙ හරියට සඳරු ඇවිත් පිටට තට්ටු කරලා යමු කියලා අඬගහයි වගේනේ......... මෙහෙම උණොත්......... උඹේ හිතේ තියෙන දේ අයියට දැනුණොත්?"

"උඹට පිස්සුද?"

"නෑ බං......... එක්කෝ ඒක එයා ඉවසනවා......... නැත්නම් එයාගෙ ක්‍රමේ හැටියට මල පැනලා උඹ එක්ක වලියට හරි එයිනේ......... ඒ ආවත් කමක් නෑ. ප්‍රශ්නෙ ගෙදරනේ කැරකෙන්නේ......... උඹ ඔහොම දුක් විඳිනවට වඩා හොඳයි. මොකද මේ ප්‍රශ්නෙදි සඳරුත් දන්න දෙයක් නෑ......... එයා දන්නේ රොෂාන් එයාව පැත්තකට කරලම තිබ්බ එක විතරයි. ඒකට හේතුව දන්නේ රොෂාන්......... අඩුම ගාණේ එයාට එහෙම කරන්න සාධාරණ හේතුවක් ඇති......... එක්කො එයාට වෙන කෙල්ලක් ඇති. එහෙම නැතිනම් පවුලක් ඇති පිට රටක හරි ......... එහෙම නැත්නම් අද කාලෙ අහන දේවල් අනුව පොර වෙන දේකට හුරු වෙච්ච කෙනෙක් වෙන්න ඕන......... ඔය මොන හේතුව තිබුණත් එයාට සඳරු එපා නම් ඒ කෙල්ලව කසාදෙක හිර කරගෙන ෂෝ එකට තියන් ඉන්න එක හරි අසාධාරණයි. ගෙදර බඩු, කෑලි කඩන, ගේ දෙවනත් වෙන්න යුද්ධ කරන, එයාට බැරි කරමක් නෑ දැන් උණත් එයාට එපා නම් සඳරු එපා කියන්න අම්මලා, තාත්තලා මොනා කිවත්......... මොකද එයාලා කියනවට මූ බැන්දා......... දැන් මූ කියන එකත් එයාලා අහන්න එපැයි. රොෂාන්ට ගැනි එපා නම් ඩිවෝස් වෙන්න ඕන......... ඒකට අම්මලා ඉඩ දෙන්න ඕන......... හැබැයි රොෂාන්ට සඳරුව මෙහෙම තමට තියාගෙන එයාට ඕන ඒවා කරන්න, එයාගෙ ලයිෆ් එක ගෙනියන්න ඉන්නවා නම් ඒක ලෙඩක්......... මේ කොයි එකත් දැනගන්න පුළුවන් උඹ බුයි එකෙන් ඇම්මොත්........."

මෙතෙක් කාලයකට තමාට සිහිපත් නොවූ දෙයක් මාලිංග මතක් කළ බව නෙත්නට වැටහිණ. ඔහු කියන්නේ ඇත්තකි. ඔහු සඳරු එපානම් ඩිවෝස් කළ යුතුය. ගෙදරට බයේ ඇය තියාගෙන ඉන්නවා කීම විහිළුවකි. ඔහුගෙන් පිට මුළු මහත් ලෝකයටම සඳරු ඕනෑය. එපා ඔහුට පමණි. එසේ නම් වරද ඇත්තේ ඔහු ළඟ විය යුතුය......... මෙසේ සිතමින් නෙත්න කල්පනාකාරීව හිස වැනුවේය.

"උඹ කරහ වෙන්න එපා මෙහෙම කියනවට. කවුද දන්නෙ උඹේ අයියා ලස්සන කෙල්ලෙකුට වැඩිය ලස්සන කොල්ලෙකුට කැමතිද කියලා. මොකද පොර නිතරම ඉන්නේ ගෙදර නෙවි පිට. කථාව ඒක නම්, හදන්න බැරි උඹේ අයියට අවවාද දිදී පවුල් සංස්ථාව ශක්තිමත් කරන්න යනවට වඩා හොඳයි සඳරු පැත්තකට කරගන්න එක......... මොකද උඹ කියන්නේ?" මාලිංග අසද්දී හිස වැනූ නෙත්න,

"උඹ හරි........." කීවේ අලුත් උද්යෝගයකිනි.

"මම හරි කියලා අත්දෙක බැඳන් හිටියට වැඩක් නෑ......... සඳරුට කිව්වු වෙයන්......... රොෂාන්ට පේන්න කිව්වු වෙයන්......... හැබැයි කෙලින්ම නෙවි......... බොහොම ස්මූත් එකේ කරපං......... දන්නපං උඹේ හිතේ තියන දේ......... ගෑනි ඕන නම් උඹට කථා කරලා කියයි. අනවශ්‍ය දේවල් කරන්න එපා කියලා......... නැතිනම්.........? පොර තොදැක්කා වගේ ඉඳියි. දිගටම නොදැක්කා වගේ ඉන්න බෑනේ. අන්න එහෙම දැකලත් නොදැක්කා වගේ ඉන්න වෙලාවක් බලලා අපි අහමු කෙලින්ම ඇයි ඔහොම ඉන්න හේතුව කියලා........."

"ම......... Not bad ........." නෙත්න කීවේ පළමු වරට සිනාසෙමිනි.

"උඹේ කසාදෙ කරන්න මටයි දැන් එළිවෙනකල් කල්පනා කරන්න වෙලා තියෙන්නේ........."

"කල්පනා කරලා හරි කර දුන්නොත් උඹේ ඔලුව නිදහසේ තියාගත හැකි........."

"කාලෙකින් කියපු ඇත්තක්......... වරෙන් යන්න කන්න........."

බියර් මතත්, සුවදායක පරිසරයත් නිසා බොහෝ දෙන කැමෙන් පසු පැදුරු එලාගෙන ඒ මත ඇලවී සිටියේය. නෙත්න, නියති, නස්රිනා, යශෝධා පියුමි හා මාලිංග සඳරු ද කැටුව ගඟ පැත්තට ගියේ ඡායාරූප ගැනීමටත් සමගය. යශෝධා හා නියති කුඩා වූන් මෙන් ගස් උඩ නගිමින් සිනාසෙමින් යන අතරේ මාලිංග හා





නස්රිනා ඔවුන් වෙත ගියේ පියුමිට ඉඟි කරමිනි......... අසල වූ බංකුවක් මත සිටි සඳරු අසල වාඩි වූ පියුමි කුඩා පිහියක් රැගෙන ඇඹරැල්ලා ගෙඩියක් කපන්නට ගත්තේ ලුණු සමග කන අටියෙනි. ඒ අතරේ එහා සිටි මාලිංග පියුමිට කථා කළෙන් එතැන සිටගෙන සිටි නෙත්නට පිහිය හා ගෙඩිය දුන් පියුමි,

"නෙත්න ප්ලීස් මේක කපලා දෙන්න......... මම ටාර් ගාලා එනවා" යි කියමින් මාලිංග සිටි දෙසට දිව යද්දී නෙත්න එය අතට ගෙන කපන්නට යද්දී නියකනුව අසල කුඩා පරාසයක්ම කැපී යනසේ ඇඟිල්ල කැපිණ.

"ආ.........වූව" ඔහු එක්වරම ගෙඩිය බිම දමා ඇඟිල්ල අල්ලා ගත්තේ ඇඹරැල්ලා ගෙඩියේ ඉස්ම තැවරී එය ඇවිල්ල දෙන්නටද වූ බැවිනි. ඇඟිල්ලේ ලේ එනු දුටු සඳරුට දැනුණේ තරහකි. නිතරම ලේ සොලවා ගන්නට ඔහු කුමක් හෝ කරයි......... වම් අතේ තුවාලය වේළුණා පමණය. ඇයට නැගිටවුණේ ඉබේටමය. එක්වරම ඔහු වෙත ගිය ඇය ඔහුගේ අත ගත්තාය.

"මොනා කරගන්නවද මන්දා......... නිතරෝම මොනා හරි කර ගන්නවා......... ලේ හොල්ලගෙන......... මගේ හිත ගිනි තියන්න........." ඇයට කියවුණේ ඉබේටමය. ඒ හාම නෙත්නගේ අතට ඇයගේ අත මදක් තදවී ගියෙන් ඇයට ඔහු දෙස බලන්නට සිදු විය......... ඒ නෙතු බලා සිටියේ තමාව පටලා ගන්නට බව ඇයට වැටහෙද්දී ඇය පමා වී තිබිණ......... ඒ ආදරණීය බැල්මේ, සිනාවේ, මදහසේ ඇය එක මොහොතකට සැඟවී ගියාය.

"මගේ ලේ බලන්න අමාරුද......... ගානක් නෑ......... බලා ඉන්න......... එකම රතු පාට" නෙත්න කීවේ ලේ එන අත තදකරමිනි. එසේ කරද්දී එයින් තවත් වැඩියෙන් ලේ එනු දුටු සඳරු,

"ඔයාගෙ ඔළුව හොඳ නැද්ද......... යමු බංකුවට......... ලේන්සුව වත් බඳින්න........." එසේ කියූ ඇය ඔහු අත අතනොහැරම පැමිණ ඔහු හා බංකුවේ වාඩි වූවාය. සඳරු තම අත වූ ලේන්සුව ගෙන ඇඟිල්ල ඔතන්නට හදද්දී,

"ලේන්සුව දැක්කම හස්බන්ඩ් සැක හිතයි........." යි පැටලුනේ ඇය දෙස තියුණු ලෙසින් බලමිනි.

"ඒක කරන්නනෙ අත කපා ගත්තේ"

"කවුද කපා ගත්තේ......... කැපුණා මිස........."

"සේරම කරගන්න ඒවා ඉබේනේ උණේ......... අත හොඳ වෙලා දවස් දෙකක් නෑ කපා ගත්තා........."

"කොච්චර කපා ගත්තත් වැඩිය ලේ යන්න දෙන්නෙ නෑ කියලා මම දන්නවානේ........."

"ඒකද එදා ඊ බෝතල් බිඳ ගත්තේ......... මෙවා බලාගෙන මටත් ඉන්න වෙලානේ........." ඇය දෙනෙතේ කඳුළු පුරවාගෙන කීවාය.

"ඔය අඬන්නෙ මම නිසාද.........?" නෙත්න අසද්දී සඳරු පුදුම වූවා සේ ඔහු දෙස බැලුවාය. "තව අඬන්න උණේ නෑ......... ලැස්ති වෙලා ඉන්න......... කාමරේම දවසක රතුපාටින්ම නාවලා තියන්නම්........." ඔහු ඇත බලමින් පැවසුවේය.

"දෙයියනේ ඔච්චර නපුරු වෙන්න එපා"

"මමද නපුරු......... මාව පිස්සු වට්ටලා......... මට බලාපොරොත්තු දීලා......... ලස්සනට ඉන්නවා මහත්තයාගේ තුරුළට වෙලා........."

"මහත්තයගෙ තුරුලෙ කවුද.........?" ඇය කියාගෙන ගියදේ නතර කලේ සඳරු එක්වරම බියපත් නෙතින් ඔහු දෙස බැලුවාය.

"ඇයි නැවතුවෙ කියාගෙන යන්න......... කොච්චර කල් කියනවද මගෙ තුරුළට එන්න......... මේ අත්දෙක ඇතුලෙ ලෝකෙ ඔයාගෙ......... අර උදේ වගේ පැටියෙක් ළඟ තියාගෙන........." නෙත්න කියද්දී සඳරුගේ අත නෙත්නගේ මුව වෙත ගියේ නොසිතාමය. ඇය හඬමින් සිටියාය.

"ප්.........ලී.........ස්......... ඔක තවත්තන්න"

"දැන් පරක්කු වැඩියි බබෝ......... ඔක කියන්න තිබුණේ අපි මිට වෙච්ච කාලෙ......... ඔය ඇස් දෙක ළඟ මම නතරම උණේ ඒ කාලෙ........."

"ඔයාට පේන්නෙ නැද්ද......... මම බැඳපු කෙනෙක්......... අපි හොඳින් ඉන්නවා........."

"හ්ම් සැහෙන හොඳින් ඉන්නවා......... දැන් එන්න එන්න හොඳ වැඩියි. හොඳයි මම ඔයා කියන එක අහලා තියති මැරි කරන්නම්" නෙත්න කියද්දී සඳරු හිස ඔසවා ඔහු දෙස බැලුවාය. නෙත්න ඇයගේ කඳුලක් ඇඟිල්ලට ගත්තේය.

"හැබැයි ඔයා මට එක දෙයක් කරලා පෙන්නුවට පස්සේ. ඔයා බබෙක් හදන්න ඕන" නෙත්න කියද්දී සඳරුගේ මුහුණේ ලේ සිඳී ගියේ නෙත්න බලා ඉද්දීමය. ඇය මොහොතින් සුදුමැලි වූවාය. දෙනෙත් විසල් කරගත් ඇය බියපත් යමක් වූවාසේ ඔහු දෙස බලා උන්නාය.





"මොකද......... ඇයි ඔච්චර බය වෙලා......... මොකෝ......... මම මොනාහරි වැරදි කතාවක් කිව්ද......... ජෝඩුවක් කසාද බැන්දම ඊට පස්සෙ ළමයි ඇතිවෙනවා......... ඒක ඉතිං ලෝකෙම දන්න දෙයක්නේ......... ඔයා විතරක් කරන දෙයක්යැ........."

"ඒත් ඉතිං මගේ ළමයි හැදිල්ලෙන් ඔයාට මොකක්ද ඇති වැඩේ?"

"ඒක ඇත්ත......... ඔයා එයා එක්ක එකතු වෙලා ළමයි හැදුවට මට වැඩක් නෑ......... ඔන්න මාත් එක්ක නම්........." නෙත්න කියද්දී සඳරු ඉවත බැලුවාය.

"ඇයි ලැජ්ජ හිතුණද......... ගණන් ගන්න එපා......... ඒක නෙවි, මම එහෙම කීවේ ඇයි දන්නවද, එතකොට මම දන්නවා මට ඔප්පු වෙනවා ඔයා මා ගැන ආදරයක් නෑ කියලා......... ඔන්න එතකොට මට හිත හදාගන්න පුළුවන්......... මම දන්නවනේ එච්චර ලොකු දෙයක් කලේ මා ගැන හැඟීමක් නැති නිසා කියලා........." ඉවත බලා සිටි සඳරුගේ මුහුණ නෙත්න තමා දෙසට පිහියේ පැතලි පැත්තෙන් හරවමින් කීවේය. සඳරු සිටියේ යටිතොල වැරයේ සපා ගනිමිනි. ඒ දෙනෙතත් කඳුළු පිරී තිබිණ.

"ඇයි......... ගොළු වෙලා......... මම බොරුද කීවේ......... වරදක්ද කීවේ.........?"

"මා ගැන හිතන්න එපා......... ඔයා බඳින්න"

"බඳින්නම්......... මම කී විදියට. දැන් හැමෝම මුණුපුරෙක් ඉල්ල ඉල්ලනේ ඉන්නේ. වක් ගාලා හදන්න. එතකොට මම ටක්ගාලා බඳින්නම්......... මොකද කියන්නේ........."

"මගේ හිතට වද දෙන්නෙ ඇයි මෙච්චර?"

"උත්තරේ සරලයි......... ඔයා මට වද දෙන නිසා......... මහකනේ ඉතිං පහුගිය කාලෙ යන්නම් යශෝධා නිසා මරණෙන් බේරුණා......... අඩුගාණේ එදා කුරියා ගැහුවා නම් අද වෙනකොට ඔයාලට සුදු ඇඳුම් ගලවන්නත් කාලෙ හරි" නෙත්න කියද්දී සඳරු මුහුණ දෑතිසේ ඔබා ගත්තාය.

"ඒ දවස්වල බලා ඉන්න ඇත්තෙත් මරණෙ ආරංචිය කවදා ලැබෙද කියලා වෙන්න ඇතිනේ........." නෙත්න කියද්දී එක්වරම කෙළින් වූ සඳරු ඇඩී ආවේගයකින් මෙන්.

"ඔව්......... ඒකම තමා මම බලා උන්නේ......... මම හිතාගත්තේ ඊට කලින් මැරෙන්න......... කොහෙද අර මෝඩයො දැක්කා මාව ඒකෙනුත් වැළකුවා. ඔයා කොහොම දන්නවද මම විඳපු වින්දර ඒක ඔයාට හිතාගන්නවත් බෑ........."

"ඔව් බෑ තමයි......... බැරි වෙන්නනේ ගහලා පැන්නුවෙ........."

නෙත්න ඇයගේ හද තව තවත් පැරුවේය. ඇය දෑතින් මුහුණ වසා ගත්තාය.

"බට බනින්න......... ගහන්න......... ඒ කරලා හරි මාව අතාරින්න"

"මම ඔයා අතාරින්නෙ නෑ......... රොෂාන් අයියාගෙන් කෙලින්ම ගිහින් අහන්න කලින් ඔයා තීරණයක් ගන්න........."

"මේක පුදුම අසාධාරණ කතාවක්......... කසාද බැඳලා ආව මිනිහා අතෑරලා ඔයා ගාවට එන්න කියනවා"

"ඔව්......... ඒක ඇත්තනේ......... වැරදිලා රොෂාන් ළඟට ගියාට ඔයා මගේනේ......... අනෙක රොෂාන් ආදරේද ඔයාට......... නෑ......... ඒත් මගේ ආදරේ ඔයාගෙ හදවතට දැනෙන දෙයක්......... ඒකනේ ඔයත් තාම අඬන්නේ........."

"මට හැමදාම වෙන්නේ අඬන්න තමයි........."

"ඒ ඉතිං ඔයා අඬන්න ආස නිසානේ........." ඔහු කීවේ ඇයගේ මුහුණ ඔසවමිනි. ඒ මුහුණ ඔසවා තමා වෙත හරවා ගත් නෙත්න හැඬීමෙන් රතු වී ගිය ඒ මුහුණ දෙස බලා උන්නේය. ඒ කඳුළු තැට පිසදමා ඇයව තම ලයට තදකොට ගන්නට ඔහුට උවමනා විය. ඒත් ඒ ඔනෑකම මැද විශාල හිඩසක් දුරක් ඇති බව ඔහුට අවබෝධ විය.

දෙවනුව තමා හපමින් සිටි ඇඹරැල්ලා ගෙඩියෙන් කැබැල්ලක් කපා ගත් ඔහු එයින් මදක් කා අනෙක් කැබැල්ල බලෙන්ම මෙන් ඇයගේ මුවට දැමුවේ ඔවුනගේ දුක්බර හැඟීම් ඉවතලන්නට මෙනි.

"මොනාද කරන්නේ......... කවුරු හරි ආවොත්........."

"මේ ගාඩ්න් එක හරි ලොකුයි......... ඒයාලට හොයාගන්න බෑ එකපාරටම අපි ඉන්න තැන........."

"ඒක වෙන්න ඇතිනේ කට්ට කමට මෙතනට ගෙනාවේ........." සඳරු කියද්දී නෙත්න දැස් පුංචි කොට සිනාසී ඇය දෙස බැලුවේය.

"අද ශ්‍රේෂ්ට දවසක්. අයියත් එක්ක පාක් ඇවිත් එයාට හොරෙන් ඔයාව මෙතනට අරන් ආවා කියන්නේ සෙලිබ්‍රේට් කරන්න ඕන වැඩක්........."

"ඔයාට ඕන මාව කාත් කවුරුත් නැති කෙනෙක් වගේ අනාථ කරන්නද......... මේ ජේරම නිසා රොෂාන් මාව අලා යයි"

"ඉතිං ෂෝක් නේ......... අනේ යනවා නම් මාරයි"





"එයාගෙ හිත නම් මාර දරුණුයි"

"ඔයාව අයිති කරගන්න ඕන නිසා ඔයිටත් දරුණු වෙන්න වෙයි. එතකොට නම් මට අයියා නෙවී ඔයාට උණත් රිද්දන්න පුළුවන්"

"ඇයි ඉතිං දැනුත් කරන්නේ ඊට අඩු දේවල් නෙවිනේ. අනෙත් එක හිටියේ රොකෝඩ් තියලා"

"හිටියට ලෙඩ උණාම ළඟට ගන්න උණා........."

"මම දැනගන්නා කවුරුත් නොකිවට මම අරන් යන්න ඇත්තේ කවුද කියලා"

"හයි ෆීවර් නිසා තිබුණු බය මිස, නයිට්ඩ්‍රෙස් එකයි ඔවර් කෝට් එකයි පිටින් වෙන වෙලාවක අහු උණා නම්" එසේ කියූ නෙත්න ඇයට ඉඟිකොට ඇසක් වැසුවේය. සඳරු සුසුමක් හෙළුවාය.

"ඔයා හිතන දේවල් වෙන්න ලෝකෙ අලුතෙන් ලියන්න ඕන........."

"හොලියා කරගන්න බලමු. බැරි උණොත් ලියමු........." ඔහු යළිත් ඇඹරැල්ලා කැබැල්ලක් ඇයගේ කටට දමද්දී ඇය කට ඇඹුල් කළාය.

"තමේ ලස්සන......... මට මැව්ලා පේනවා පැටියෙක් ආවොත් එහෙම ඇඹුල් කන අපූරුව"

"මම පැටව් හදන්නේ නෑ........."

"මගේ පැටියෙක් හදන්න වේවි........." ඔහු කීවේ රහසෙනි. සඳරු ඔහු දෙස බැලුවේ සසල සිතිනි.

"අපි යන්න ඕන. පියුමිලා එනවා" සඳරු ඈත බලමින් කීවාය.

"අද මගෙන් බේරුණාට උත්තර දෙන්න වේවි........."

මේ අතරේ ඔවුන් වෙත අන් අය පැමිණියෙන් ඔවුන් දෙදෙනාද යන්නට නැගිට ගත්හ. ඒ අතරේ සඳරු වෙත ආ නස්රීනා, "එන්න සඳරු මම ඔයාව අල්ල ගන්න......... දැන් නෙත්නට මහන්සි ඇතිනේ........." යි කීවේ සිනාසෙමිනි. එය ඇසූ නෙත්න නස්රීනාගේ අතට පහරක් හෙමින් ගැසුවේ සිනාසෙමිනි. නිවුන් සොයුරියන් වැනි මොවුන් දෙදෙනාගේ ඡායාරූප ගනාණාවක් උදේ සිට මේ වන විට මාලිංග ගත්තද යළිත් වතාවක් ඔවුන් දෙදෙන දෙසට කැමරාව යොමු කොට නෙත්න ඇසින් ඉඟි කරද්දී නෙත්න සඳරු අසලට වී ඇයගේ ගාව ඇයට එහායින් සිටි නස්රීනාගේ උරහිසට අත තැබීය.

"මාලිංග ඔයින් ෆොටෝ එකක් මට එවන්න නෙත්න අනේ........."

"එකට දහයක් දෙන්නම් නස්රීනා......... ඔයා අද ආපු එකේ වටිනාකම කියන්න ෆොටෝ දහයක් දුන්නත් මදි" යැයි කීවේ අනෙක් අයට සිනාවක් කැඳවමිනි.

මල්වත්ත නැරඹීමට ගිය ගමනින් පසු නෙත්න හා සඳරු යන දෙදෙනාම වෙනස් විය. සඳරුට වඩා ඒ වෙනස නෙත්නගෙන් දැකිය හැකි විය. ඔහු නිවසෙන් ඈත් වී සිටි කාලයට පසුව යළි නිවසට ආවද ඔහු ව්‍යාපාර කටයුතු කළේ එය කළ යුතු නිසාවෙනි. එසේ නැතිව කිසිදු උනන්දුවක්, විශේෂ උනන්දුවක් ඔහු තුළ නොවිය.

එහෙත් මල්වත්තට ගිය ගමනින් පසු ඔහු සතුටකින් නොවේ නම් ඉලක්කයකින් වැඩ කරනා බවක් පෙනෙන්නට තිබිණ. සඳරු හා ඔහු කථා නොකළද එදා කථා කළ දේවලින් පසු ඔහු යම් කිසි තීරණයකට එළඹුණා සේ පෙනෙන්නට තිබිණ. ඇයගේ කැමැත්ත විමසා හෝ නොවිමසා ඔහු කරන්නක් කිරීමට තීරණය කළා සේ විය. මේ අතරේ රොෂාන්ද සඳරුට ඊනැවටත් වඩා වැඩිපුර ළංවූයේ ඇයගේ සිත පරීක්ෂා කරන අතරේම සොයුරාගේ සිතද පරීක්ෂා කරන්නට මෙනි.

දිනක් රාත්‍රී මදක් පමා වී රොෂාන් නිවසට එද්දී අනෙක් අය ආහාර ගෙන තිබුණි. සඳරු ඔහු එනතෙක් නොකා සිටියේ පුරුද්දටය. ඔහු මෙසයට වාඩිවෙද්දී සඳරු ඔහු අසල සිටගෙන ඔහුට කෑම බෙදුවාය. පෙරදී නම් ඔහු කෑම කනවා මිස ඇය කෑවාද යන්න විමසන්නේ නොවේ. එහෙත් අද එම පිළිවෙත ඔහු වෙනස් කළේය. ඇය දෙස බැලූ ඔහු,

"ඔයා කෑවද?" යි අසද්දී සඳරු පුදුම විය.

"නෑ......... මම පස්සෙ කන්නම්"

"මම එනකල් ඉන්න ඇත්තේ මා එක්ක කන්නනේ. වාඩිවෙන්න මෙතනින්........"

"නෑ......... නෑ........ඔයා"

"කිව්වාම වාඩිවෙන්න........" එසේ කියූ රොෂාන් තව පිඟානක් ගෙන ඇයටද කෑම බෙදුවේය. ඇය වෙත පිඟාන ළංකළ ඔහු,

"කන්න" යයි කියද්දී සඳරුට අදහා ගත නොහැකි වුවද ඇය බත් එක අනන්නට වූවාය. ඔහු අසලට වී සිටියද ඇයට දැනුණේ බියපත් බවකි. ඇය සිතූ දේම සිදුවිය. දිය නා පැමිණි නෙත්න කෑම මේසය වෙත එන්නට එද්දී ඔවුන් දෙදෙනා එකට වාඩි වී ආහාර ගනු දැක සාලයේ නැවතුණේය.

"පුංචි මල්ලි, කන්නෙ නැද්ද......... එන්න එන්න ඉක්මනට........ පස්සෙ කියන්න එපා කන්න කැමති ඒවා නෑ කියලා" රොෂාන් කියද්දී කිසිවක් කියාගත නොහැකි වූ නෙත්න ඔවුන් දෙදෙනා අසලම ඉදිරිපස වූ පුටුවේ වාඩි වුණේය.





"සඳරු......... නෙත්නට බෙදන්න"

"න්......... නෑ.........නෑ......... මම බෙදා ගන්නම්" එසේ කියූ නෙත්න ඉක්මනින්ම පිඟානට බත් බෙදා ගත්තේය.

"නෙත්න, අද අර මෙන්ඩිස් මාව මීට් වෙන්න ආවා......... මම හිතන්නේ මිනිහට දැන් අපි කියපු ගාන උණක් කමක් නෑ......... ඒක නිසා ඔයාම හෙට ගිහින් රබර් තොගේ බලලා එන්න" එසේ කියූ රොෂාන් ඒ අතරේ සඳරු දෙස බලද්දී ඇය බත් එක අනමින් කල්පනා කරන බව රොෂාන්ට පෙනුණෙන්,

"ආ......... මොකද මේ බත් අන අන ඉන්නේ......... මොකද අතින් කන්න කම්මැලිද......... කෝ එන්න මම කවන්න එහෙනම්........." එසේ කියමින් රොෂාන් බත් අනුරක් පිඟානෙන් ගන්නට උත්සාහ කරනු දුටු සඳරුගේ දෙනෙත් විසල් විය.

"එපා........එපා......... ම......... ම........යා .........ක.........කන්.........නා......... මම......... ක......... කන්නම්" සඳරු කියද්දී නෙත්නගේ ද හදවතේ ඇති වූයේ සුවිශාල වෙනසකි. ඔහු ද කරකියාගත හැකි දෙයක් නැතිව බලා සිටියේය. සඳරුගේ විරුද්ධත්වය නොපිළිගත් රොෂාන් හිතුවක්කාර ආදරවන්තයකු සේ සඳරුගේ උරහිස වටා අත යවා ඇය තමා වෙත ළංකොට ගෙන අත වූ බත් පිඩ ඇය මුව වෙත ළංකරද්දී සඳරු මොහොතකට වෙව්ලා ගියාය. දෙනෙත් විසල් වී ගියේ ඇයටම නොදැනිය. ඇය මොහොතකට දෙනෙත් හරවා නෙත්න දෙස බැලුවාය. ඒ දෙනෙත්වල වූ පුදුමය සේම වේදනාවද ඇයට පොතක් සේ කියවිය හැකි විය.

"කාපං......... හොර කෙල්ල........." රොෂාන් එසේ කියමින් බත් පිඩ ඇය මුවට ළං කරද්දී එය කනවා මිස ඇයට කළ හැකි යමක් නොවිය. ඇය එය කටට ගත්තද ගිල ගැනීමට පවා අපහසු වූයෙන් ඇයට කැස්ස ආවේය. රොෂාන් වහාම ඇයගේ මුවට වතුර වීදුරුව ළංකරද්දී සඳරු ඉක්මනින් එය අතට ගෙන බීවේය.

නෙත්නගේ හිස පහතට හැරුණේ නිරායාසයෙනි. එයින් අනතුරුව රොෂාන් මොන මොනවාදෝ කීවද ඒ කිසිවක්ම නෙත්නට ඇසුණේ නැත. ඔහුගේ මුහුණ ඊනැවටත් වඩා පිඟානට යොමු වී තිබිණ. රොෂාන් තියුණු දෙනෙතින් නෙත්න දෙස බැලුවේය.

"මොකද ඒ පාර ඔයත් කෑම එක අනගාන්නේ. මොකද මේ දෙන්නටම වෙලා තියෙන්නේ......... දෙන්නාම මුලින් කාලාද හිටියේ .........?"

"න්......... න්.........නෑ......... පොඩි අයි.........යා.........උගුර ටිකක්.........
රිදෙනවා වගේ......... කෙළ ගිලින්න අමාරුයි"

"සෙම ගෙඩි එන්න වෙන්නැති හදන්නේ......... සඳරු......... ඔයා කාලා නෙත්නට ස්ටීම් කරන්න වතුර එකක් ගිහින් දෙන්න"

"නෑ.........නෑ.........එපා.........එපා......... මේක හරියාවි" එසේ කියූ නෙත්න ඒ මොහොතේම අත සෝදාගෙන නැගිට ගියේය. ඔහු යන දෙස බලා සිටි රොෂාන් කිසිවක් සිදු නොවූ ලෙස බත් ටික කෑවේය. සඳරු ද පිඟානේ වූ බත් කටක් දෙකක් අසීරුවෙන් ගිලගත්තේ දෙදෙනාම නොකද්දී රොෂාන් අමුතුවට සිනාවී යයි සිතමිනි. සාලයේ සිට මේ සිදුවීම බලා හුන් මනූෂිගේ මුවගේ නැගුණේ පෙනෙන නොපෙනෙන සිනාවකි.

කාමරයට ගිය නෙත්න දොර වසා විදුලි පහනද නිවා දමා ඇඳට වැටුණේය. දිනකදී සිත හදා ගතහොත් දෙවන දින තම සිත රුඳුරු ලෙස පෑරෙන්නේ මන්දැයි ඔහු සිතුවේය. රොෂාන් අයියාගේ මේ නව වෙනස කුමක්දැයි ඔහුට සිතාගත නොහැකි විය.

සිනාමල් පුදින්නට සිතා
ප්‍රේමයේ කෙත වගා කල මුත්
අස්වැන්න ලෙස ලැබුණු කඳුළු පලදාව
ජීවිත ගබඩාව පුරාම අඩුක්කු කරන්නට
මෙමට සිදුවුණේ කිමද.........

සතුටු වැස්සක් පතා
ඇයගේ නෙතු අද්දරට වී
සෙනෙහසේ අහස දෙස බලා සිටි සඳ
අසිනි වැස්සක් වෙලා කඩා වැටුණු දුක් මහෝඝය
දිවි මගේ ගං ඉවුරු දෙදරවා ගලාගෙන යන සඳ
සිතක් ඇතියකු විලස මා
කෙලෙස නම් බලා ඉන්නද.........

ගිස්ව තිබූ හද ගී පොතේ
එකම රතු ලේ පොදින් ලියා ගත් ආදර ගීතය
අන්සතු තනුවකට ලියූවක් බව
ලෝකයම මොරගා කියද්දී
රිදෙන සිත වාරු කරගන්නට මෙලොව මට
කවුරුන් පිළිසරණට ඒද.........



නිදියන්නට හිතයි මට
යලිත් නොඇහැරෙන ඒ නින්ද.........
ඒත් හරි දුකයි මට
ඒ සිත හැරදා යන්ට
කවදාකම හෝ මට හිමිවෙතැයි සිතූ
මගේ හුස්ම පොද නික්මෙන්නට පුරම

kathapothak·blogspot·com

# 34

පසුගිය දින කිපයේම මනුෂි පසු වූයේ ඇඩි කලබලකාරී ගතියකින් බව සඳරුට වැටහුණේ ඇය දකින හැම විටකම වාගේ ඇය දුරකතනයෙන් කථා කළ හෙයිනි. ඒ කථා බහෙන් පල වූයේ කිසිවෙකුට යමක් පහදනා බවකි......... එලෙසම ඇය ඉමහත් බියකින් මෙන් ඒ දවස දෙක ගත කළාය. එක්දිනක් සඳරු කාර්යාලයට ගොස් ආපසු පැමිණ ආහාර ගෙන උඩට එන්නට ආවාය. මනුෂිලාගේ කාමරයම තිබුණේ අඳුරේ වුවද එතුළ කවුරුන් හෝ කථා කරන කටහඬ ඇසී ඇය මදක් එයට ඇහුමකන් දුන්නේ මේ අඳුරේ ඇය කතා කරන්නේ කා සමගදැයි සිතමිනි. එහෙත් ටික වේලාවකින්ම එය දුරකතන කථා බහක් බව ඇනුණෙන් ඇය එතැනින් යන්නට අඩිය ඉදිරියට තබන්නම ඇසුණු එක් වදනකින් ඇය එතැනම නතර වූවාය.

"හැබැයි ඔහේ අවන්නට මොනවා හරි කළොත් බලාගන්න පුළුවන්" ඇය කියනු ඇසුණු සඳරු අඳුරට මුවා වූවාය.

"මේ අහනවා අජිත්......... සල්ලි ගත්තෙ මම......... මගේ අයියා......... ඒකට මගේ හස්බන්ඩ් පළි නෑ........."

"හරි ඒක ඇත්ත......... ඒ උණත් එකපාරටම මට ලක්ෂ පණහක් දෙන්න සල්ලි නෑ. මෙක මට මගෙ මහත්තයට කියන්න බෑ"

"කිව්වනේ මගේ තාත්තා ළඟත් මේ වෙලාවෙ ලක්ෂ 50 ක් දෙන්න නෑ......... අනෙක අනිද්දා වෙනකොට කොහොමත් බෑ......... අනෙක මම පැනලා යන්නෙ නෑ......... තමුසෙගෙන් ගත්ත සල්ලි මම දෙනවා......... හැබැයි අවන්තව මේකට ගාවගන්න බෑ"

"මේ අජිත්......... මම ඔහේට කිව්වා මගේ හස්බන්ඩ් උස්සනවා නෙවි එයාට අතක් වත් තියලා තිබුණොත් මම නරක ගෑනි කියන්න එපා......... තමුසෙගෙ සල්ලි දෙන්නම් මම. හරි හෙට උදේ 9 ට මම තමුසෙගෙ ගෙදරට එනවා........."



එසේ කියූ මනුෂි කථා බහ නිම කළ බව ඇනුණු සඳරු වහ වහා එතැනින් ඉවත්ව ගියාය. උදෑසනම සූදානම් වූ සඳරු ජයතුංග ද සූදානම් කරවාගෙන බලා සිටිද්දී කඩිමුඩියේ කාමරයෙන් පිටව යන මනුෂි දුටුවෙන් වහාම ජයතුංග වෙත ගිය සඳරු,

"ජයතුංග, මනුෂි නෝනාගෙ වාහනේ පස්සෙන් යමු......... හැබැයි මොනම විදියකට වත් පේන්න යන්න එපා" පැවසුවෙන් ජයතුංගද සඳරුගේ අණ අනුව මනුෂි අත නොහැරම වාහන අතරේ ඇය පසු පස ගියේය. වාහනය අකුරණ දක්වාම ගියේය. අකුරණ දී එක්තරා අතුරු මාවතකට හැරී මනුෂි යනු දුටු සඳරු එතැන හංදියේ බැස ත්‍රීවීලරයක නැගී රියදුරාට ජීප් රථය පිටුපස යන්නට කීවේ මෙම පාරේ වාහන නැති කමින් මනුෂි තිවගේ රථය හඳුනාගන්නා බැවිනි. කෙටි දුරක් එසේ ගිය ඇය පටු පාරකින් නැවත හැරෙද්දී සඳරු රියදුරු ඇමතුවේය.

"ඩ්‍රයිවර් මහත්තයා මේ හරියෙ ඉන්නවද අජිත් කියලා කවුරු හරි"

"අ.........ජිත්.........? බුදු අම්මෝ ඔව් නෝනා......... නුවරටම ඉන්න පාතාල නායකයා......... ඔතනින් පොඩ්ඩක් එහා ඉන්නේ. ඇ......... ඇයි නෝනා"

"ඩ්‍රයිවර් මහත්තයා අර යන වාහනේ යන්නේ එහෙට......... අපි එයා එනකල් මේ කොහෙන් හරි ඉන්න ඕන. ඊට පස්සෙ ඔයා මාව බස්සල යන්න. හන්දියේ කොහේ හරි අපේ කාරෙක ඇති ඒක එවන්න........."

"නෑ නෝනා......... ඒකට ප්‍රශ්නයක් නෑ......... මම ඉන්නම් නෝනා එනකල්"

"ඩ්‍රයිවර් මහත්තයා බයයි වගේ නිසා කීවේ"

"බය නැද්ද නෝනා......... පළාතම බයයි......... මම දන්නෙ නෑ නෝනා යන්නෙ ඇයි කියලා......... ඒත් බයවෙන්න එපා......... අජිත්ගේ අයුක්තියට වැඩ නෑ........."

"මම යන්නෙ අර නෝනා ගිය හේතුව හොයාගන්න........."

"ඒ කවුද නෝනාගෙ.........?"

"ඒ මගේ නෑනා"

"ඔ.........එහෙනම් නෝනා බය නැතුව යන්න. මම ඉන්නම් එනකල්" රියදුරා ඇයට කීවෙන් සඳරු ත්‍රීවීලරයේ පාර පැත්තේ තිරයද දමාගෙන බලා සිටින්නට විය. ඒ අතරේ ඇය රියදුරාගෙන්

අජිත් පිළිබඳ බොහෝ දේ දැනගත්තාය. අජිත් අමරිකයකු මිනීමරුවකු වුවද ඔහු හිත හොඳ මිනිසකු බව රියදුරා වෙතින් කියවිණ. තම මස්සිනාගේ ජීවිතය අනතුරේ බව වැටහුණු සඳරු මේ ගමන ආවේ මේ ප්‍රශ්නය කුමක්දැයි දැන ගැනීමටය.

පැය භාගයකට පමණ පසු මනුෂිගේ ජීප් රථය ඇය සිටි තැනින් වේගයෙන් ඉගිල ගියේය.

"නෝනා......... අර නෝනාගේ මූණ නම් හරි නෑ වගේ........"

"ඩ්‍රයිවර් මහත්තයා ඉන්න මම ගිහින් එන්නම්........ ඒ මනුස්සයා කොහේ හරි යන්න කලින් අල්ල ගන්න ඕන........"

එය විශාල නිවසකි........ එළියේ වාඩි වී කාඩ් සෙල්ලම් කරමින් සිටි තරුණයින් කිප දෙන ඉදිරියට එන සොඳුරු යුවතිය දැක එක්වරම නැගිට ගත්තේ කථා කරගත්තා මෙනි........ ඔවුන් ඇය දෙස බැලුවේ ප්‍රශ්නාර්ථ බැල්මකි.

"ඔව්........?"

"මට අජිත් ව මුණ ගැහෙන්න ඕන"

"අජිත් අයියව එහෙම මුණ ගැහෙන්න බෑ........ මේ කවුද?"

"නම කිව්වට මාව දන්නෙ නෑ........ මගේ නම සඳරු........ මට අජිත් එක්ක කොහොම හරි කථා කරන්න ඕන" සඳරු කියද්දී ඇය දෙස බැලූ එක් අයෙකු අනෙකාට හිසින් සංඥා කළෙන් ඔහු ගෙතුළට ගියේ පණිවුඩය කියන්නට විය යුතුය.

ටික වේලාවකින් යළි පැමිණි ඒ තැනැත්තා.

"එන්න........ අජිත් අයියා කථා කළා........" යි පැවසුවෙන් ඇය ඔහු හා ගෙතුළට ගියාය. සාලයේ කාන්තාවක් හා කුඩා දැරියක පෙනෙන්නට විය.

"එන්න කාමරේට........" ඇය එහි ඇතුළු විය. තරමක් විශාල කාමරය කන්තෝරු කාමරයක් සේ සුන්දරව සකසා තිබිණ. දුරකතන කිපයක් හා ජංගම දුරකථන දෙකක් මේසය මත වූ බවද කාමරයේ අජිත් ගේ ආරක්ෂකයන් සතර දෙනෙකු සිටින බවද එකම බැල්මෙන් සඳරු දැක බලා ගත්තේය.

සඳරු දුටු අජිත් කුතුහලයෙන් මෙන් ඇය දෙස බැලුවේ කිසි දිනක ඇයව දැක නැති නිසා විය යුතුය.

"මේ........ කවුද........ මම අඳුරන්නේ නෑ........" ඔහු කිවේ සියලු විස්තර ඉල්ලන ස්වරයෙනි.





"මම සඳරු වික්‍රමසේකර......... වික්‍රමසේකර කොම්පැනියේ මිස්ට රොෂාන්ගෙ වයිෆ්........"

"ඕ........ හෝ මේ අපේ මනුෂි නෝනාගෙ නෑනා........ එහෙනම්........ ඉඳගන්න........" ඔහු පුටුව පෙන්වා කියද්දී සඳරු හිඳ ගත්තාය.

"බොහොම ස්තූතියි"

"ඉතිං මේ නෝනා ආවේ........ ආ........ දැන් මනුෂි නෝනාත් ඇවිත් ගියා"

"ඔව් මම ඒ නිසයි ආවේ. මට දැනගන්න ඕන ඇයි මනුෂි මෙහෙ ආවේ කියලා?"

"සමාවෙන්න නෝනා අපි අපේ බිස්නස් රහස් කාටවත් කියන්නේ නෑ........"

"අජිත් හිතනවා ඇති මම මේ ප්‍රශ්නෙට අමුත්තෙක් කියලා. ඊයෙ මනුෂි යි අජිත් එක්ක කතා කරනවා මම අහගෙන හිටියා. ලක්ෂ 50 ක් මනුෂිගෙන් අජිත්ට එවන බවකුත් නැත්නම් අවන්තයියාට මොනා හරි කරන්න ඉන්න බවකුත් මට ඇහුණා. මනුෂි කල් ඉල්ලනවත් මට ඇහුණා"

"ඕ........ හෝ බලනකොට නෝනා ෆුල් ස්ටෝරි එකම දන්නවනේ ........ ඒක තමයි කථාව"

"මම දැන් මෙහෙ ආවෙ අවන්තයියගෙ ජීවිතේට කරදරයක් කියලා ඇහිච්ච නිසා........ මට කියන්න මනුෂිගෙ සල්ලි ප්‍රශ්නෙ"

"මේකයි නෝනා මට මාසෙකින් දෙන්න රුපියල් ලක්ෂ 50 ක් මනුෂි නෝනා මගෙන් ගත්තා. එයාගෙ අයියා එක්ක ඇවිත් ගත්තේ........ හරියටම මාසෙකින් දෙන්න........ මාසෙ ගියා........ දෙවෙනි මාසෙ මම ෆ්‍රී දුන්නා........ දෙවෙනි මාසෙ ගෙවිලා ගියා........ ඒ දෙවෙනි මාසෙ මම වගේ අයි ආර් සී කාරයෙකුගේ කෙනෙකුට තෑග්ගක් වගේ........ මම ඒ තෑග්ගට රිබන් එකකුත් ගැට ගැහුවා ඒ කියන්නේ හෙට වෙනකොට තවත් එක්ස්ට්‍රා සතියක් දුන්නා........ ඒත් හෙටින් එහාට විනාඩියක් වත් දෙන්න මම සූදානම් නෑ. අපි වගේ මිනිස්සුන්ගේ අනුකම්පාවක් ගන්න බුරුලක් ගන්න මිනිස්සු බඩගාගෙන එනකොට මම මාසයයි සතියක් ෆ්‍රී දුන්නා මම හිතලා........ ඒත් මේ අය මාව හැන්ඩ්ල් කරන්න හදන්නේ එයාලගෙ පවර්ස්වලින්........ ඔය මන්ත්‍රීලා මම මගේ කකුල තියාගන්න වත් ගන්නෙ නෑ........ ඒ නිසා මට එයාලගෙ පවර්ස් අදාළ නෑ........

මෙච්චර දේ වෙලා හොඳින් ඉල්ලනවා නෙවි මට හයිකාරකම පෙන්නනවානම් මට සිද්ධ වෙන්නේ එයාව වැන්දඹුවක් කරන්න තමයි. ඔහොම ගෑනුන්ගේ බලය බිඳින්න හොඳම විදිය ඒක. අජිත් කියද්දී සඳරු වෙව්ලා ගියාය. ඇයට පුටුවෙන් නැගිටවුණේ ඉබේටමය.

"අනේ අයියේ......... ඒක කරන්න එපා........." සඳරු කියද්දි ඇයගේ දෙනෙතට කඳුළු පිරී ආවේය. "මගේ මහත්තයගෙ අයියා සාන්තුවරයෙක් වගේ අහිංසක වැදගත් මනුස්සයෙක්"

"මම දන්නවා නෝනා අවන්ත වික්‍රමසේකර ගැන මේ නුවර නොදන්නෙ කවුද? ඒත් ඉතිං මේ ගෑනු අපි අසරණ කරනවා......... මාන්නක්කාර කම යනවා මිනිහා මැරිලා මිනිස්සු දෙතුන් දෙන්නෙක් අතට මාරු උණාම"

"අයියේ, ප්ලීස් මේක මගේ පවුලේ ගෞරවය ගැන වගේම මගේ මස්සිනාගේ ජීවිතේ ගැන ප්‍රශ්නයක්......... අයියා මට හෙට හවස හතර වෙනකල් කල් දෙන්න ඕන......... මම ලක්ෂ පනහ අරගෙන හෙට හවස හතරට විනාඩියකට කලින් හරි මෙහෙට එනවා." සඳරු කියද්දී ඇය කියන්නේ කුමක්ද යන්න බලන්නාට මෙන් ඔහු උවමනාවෙන් ඇය දෙස බලා උන්නාය.

"නෝනා දන්නවද නෝනා පිටකළ වචනවල බරපතළ කම"

"ඔව්......... එක දවසකට මාව විශ්වාසයට ගන්න කියලා මම අයියගෙන් ඉල්ලනවා" සඳරු කියද්දී මේ පුංචි කෙල්ලගේ එඩිතර කථාව ගැන පැහැදුණු අජිත් එය අනුමත කරන්නා සේ හිස වැනුවේය.

"හොඳයි නෝනා......... මම පොරොන්දු වෙනවා"

"බොහොම ස්තුතියි......... මම ගිහින් එන්නම්........."

"නෝනා ආවේ.........?"

"මම කාරෙක් ඇවිත් ඒක මග අලා ත්‍රිවිල් එකේ ආවේ"

"දමයන්ත මේ නෝනව ත්‍රිවිල් එකට ඇරලන්න........."

"නෑ බොහොම ස්තුතියි. මට යන්න පුළුවන්........."

"වැදගත්කමට, වැදගත්කමින් සලකන්න මේ අජිත් හොඳට දන්නවා නෝනා"

අජිත් කියද්දී කිසිවක් නොකියූ සඳරු නිහඬවම එළියට ආවාය. අජිත්ගේ ගෝලයා ත්‍රිවිල් එක දක්වා ඇයව හැරලවිය.





"බොහොම ස්තුතියි" එසේ කියා ත්‍රිවිලරයට නැගගත් සඳරු දෙස බැලූ රියදුරා "නෝනට නම් බොහොම ලොකු ගෞරවයක් අජිත්ගෙන් හම්බවෙලා වගේ. අජිත් ඔහොම කෙනෙක්ට ගෝලයෙක් පසුගමන් එවන්නේ හිතට තදේට දෙයක් වැදුණම තමා"

"ඩ්‍රයිවර් මහත්තයා හෙට 3.30 ට මම මේතන හන්දියට එනවා. ගමන් දහයක් තිබුණත් යන්න එපා......... මෙන්න හෙටටත් එක්ක සල්ලි තියාගන්න........."

"එපා නෝනා......... හෙට ගන්න පුළුවන්......... මම ඉන්නම්"

"නෑ......... නෑ තියාගන්න........." එසේ කියූ සඳරු තම වාහනයේ නැගී පිටත්ව ගියාය.

කාර්යාලයට ගියද ඇයගේ හදවතේ වූයේ මහා ගින්දරකි. මේ උද්දච්ච අහංකාර ගැහැනිය නිසාවෙන් අවන්තයියාගේ ජීවිතයට අනතුරක් වුවොත්......... හරියට නම් ඔහුට තව ජීවත් වීමට ඇත්තේ පැය 30 ක 32 ක කාලයකි. එසේ නම් තමාට වැඩ කිරීමට ඇත්තේද එවන් වූ කාලයකි. දැන් මීළඟට කළ යුත්තේ කුමක්ද.........

නෙත්තට කීමට, නිවසේ අයට කීමටද නොහැක......... හිණුමෙ ඇති මුදල්වලින් ලක්ෂ පණහක් ගත්තොත්......... අයියෝ......... මීට කලින් රුපියල් 50 ක් වත් අරන් නැති මම ලක්ෂ 50 ක් ගන්න......... නෑ......... නෑ ඒක කරන්න බෑ......... එතකොට මම දීපු වචනේ......... මම කොහොමද හෙට ලක්ෂ පනහක් අර මනුස්සයට දෙන්නේ ඒක කරන්න බෑ......... ඒ මම සල්ලි අරන් නොගියොත් මොනවා නොවේවිද......... අවන්තයියගෙ ජීවිතේ......... අනේ......... කතරගම දෙයියනේ......... මට පිහිට වෙන්න......... මම මොනවද කරන්නේ......... අයියෝ දෙයියනේ.........

සඳරු ඒ මේ අත යමින් කල්පනා කලාය. කාගෙන් උපදෙසක් ගන්නද......... කාට කියන්නද......... තමාට තනිවම හිතා ගත නොහැකි තරමට ප්‍රශ්නය සංකීර්ණ යැයි ඇයට සිතිණ......... මම කාගෙන්ද අහන්නේ මම කරන්න ඕන දේ......... ඇය දෙනෙත් පියා ගත්තාය......... ගිම්හාන......... දෙයියනේ ගිම්හාන......... මට එයාටවත් කියන්න ඇත්නම්......... මම ඒත් මේක එයාට කියන එක හරිද......... මේක පවුලෙ ප්‍රශ්නයක්......... ඒත්......... ඒ වගේම ලොකු ගැටලුවක්......... තනියම හිතනවට වඩා මගෙ උදව්වට කවුරු හරි හිතන්නවත් ඉන්නවනේ......... එසේ සිතූ ඇය ගිම්හානගේ දුරකතනයට ඇමතුමක් ගත්තාය.

"ගිම්හාන ඔයා කොහේද?"

"මම මග එනවා"

"ඉක්මනට එන්න ගිම්හාන මට තනියම ඔයා එක්ක කතා කරන්න ඕන......... දැන්මම එන්න"

"ඇයි සඳරු......... ඔයා හොඳින් නේද දරුවෝ"

"ඔව්......... ඒත් මම ඇවිත් කියන්නම්........." එසේ කියූ සඳරු වහවහා තම බෑගයද ගෙන කාර්යාලයෙන් පිටවූවාය.

ඇය යද්දීද ගිම්හාන මග බලා සිටියේය. ඇය දුටු ඔහු පෙරමගට දිව ආවේය.

"සඳරු......... මොකද උණේ......... ඇයි ඔයා බයවෙලා"

"ගිම්හාන......... මම ලොකු ප්‍රශ්නෙක ඉන්නේ........."

"මොකක්ද?"

සඳරු ගෙවී ගිය රැයේ දුරකතන ඇමතුමේ සිට මේ දක්වාම විස්තර ගිම්හාන හා පැවසුවාය.

"මනුෂි හිනා ඉන්නේ අජිත් තර්ජනය කරාට අවන්තයියට මොකුත් වෙන්නෙ නෑ කියලා. මන්ත්‍රිගෙ පවර්ස් අරන් එයාට පුළුවන් කියලා අජිත් හැන්ඩ්ල් කරන්න........."

"මමත් අජිත් ගැන අහලා තියනවා......... නොම්මර එකේ පාතාල නායකයෙක්......... ඒත් මනුෂි කියන්නේ පුළුවන් නිසා වෙන්න ඇති නේද?"

"නෑ, නෑ......... අජිත් කියන්නෙ ඔය පුහු කයිවාරු ගැන අහලත් නැති මිනිහෙක් මට තේරුණ හැටියට. ඒ මිනිහා කියනවාටත් වඩා කරන මිනිහෙක්......... ඒ වගේ කෙනෙක් තමන් කියපු වචනය ස්ථිර කරන්න හරි අවන්තයියා මරලා දායි........."

"ඉතිං දැන් මොකද ඔයා කරන්නේ......... ගෙදර කාටවත් කියූවත් වැඩක් නෑ නේද?"

"ඒ ගොල්ලො බොරුවට බයවෙයි. අනෙක රොෂාන්ගෙයි තෙත්තගෙයි හැටි දන්නවනේ......... සතයක් වත් දෙන්න බෑ කියලා කියාවි. ඒකෙන් මේ කොහෙවත් යන මෝඩ යක්කු නිසා එයාලා දෙන්නත් අමාරුවෙ වැටෙනවා......... මේක රහසෙම කෙරෙන්න ඕන දෙයක්........."

"එහෙම නම් සඳරු බිල්ඩින් එකේ සල්ලිවලින් ගන්නවා මිස ඔයාට වෙන විකල්පයක් නෑ........."





"මම එහෙම කරාට කමක් නැද්ද?"

"අවන්තයියගේ ජීවිතේ ලක්ෂ පනහද වටින්නේ......... දැන් ගත්ත තීරණේ ක්‍රියාත්මක කරන්න........."

"මම වැරදි නෑ නේද ගිම්හාන........."

"නෑ සඳරු......... ඔයා වරදක් නෙවි කරන්නේ........."

දේශනවලට සහභාගි වූ සඳරු එදින ගෙදරට පැමිණියද ආහාර පවා නොගෙන උඩු මහලට ආවාය. ඇය කරන්නට යන දෙය සිතෙද්දී ඇයට කෑම නොව වතුර ටික පවා ගිලුණේ නැත.........

"සඳරු......... ඔයා එන්නේ නැද්ද කන්න යන්න" කොරිඩෝරයේ යකඩ වැටට හේත්තු වී කළුවර දෙස බලා සිටින බිරිඳගෙන් රොෂාන් ඇසීය.

"බෑ රොෂාන් මගේ බඩ රිදෙනවා......... ඔයා යන්න........." සඳරු කියද්දී රොෂාන් යන්නට ගියේය. ඒ මොහොතේ කාමරයට එමින් සිටි තෙත්තට සඳරුගේ වදන් ඇසුණද ඔහු එහෙමම කාමරයට ගියේය.

......... අද දවසම සඳරුගේ දුරකතනය වසා දමා තිබුණේ ඇයිදැයි ඔහු සිතුවේය. කාර්යාලයේ වැඩ කිපයකටම ඇයට කථා කිරීමට ඔහුට ඕනෑ වුවද ඒ කිසිත් කර ගැනීමට ඔහුට නොහැකි වූයේ ඇය මොබයිල් ෆෝනය ඕෆ් කොට තිබූ බැවිනි. රොෂාන්ට කීවේ ඇත්තක්මදැයි ඔහුට සිතුණේ මේ සියල්ල සිතද්දීය. එහෙත් තමා ඇයගෙන් පෞද්ගලික කිසිවක් නොවිමසන නිසාත් කථා නොකළ නිසාත් ඒ ගැන සිතා පලක් නැත.........

පසුදින උදයේම සූදානම් වූ සඳරු ඉක්මනින්ම නිවසින් පිටවූයේ සිටින්නට සිටින්නට ඇයගේ මනස විකාර වන බැවිනි. කාර්යාලයට ගිය ඇයගේ හදවත ගැහෙන්නට විය. තමා අද මේ ව්‍යාපාරයට තම සැමියාගේ පියාගේ ව්‍යාපාරයට කරන්නට යන්නේ කෙතරම් වංචාවක්ද......... පියා තමාට මේ ව්‍යාපාරයේ සියලුම රහස් භාර දුන්නේ කෙතරම් විශ්වාසයකින්ද......... එහෙත් පාතාල නායකයකුගේ වචනය නිකම් ඉවත දැමිය හැකිද......... ඔහුගේ දින වකවානු නිම වීමේ කාලය අද උදෑසනයි......... තමාගේ ඉල්ලීම වෙනුවෙන් ඔහු අද සවස් වන තෙක් කාලය දුන්නේය......... එහෙත් ඔහු තමාට සියයට සියයක්ම විශ්වාස කළාද.........

අවන්ත බැංකුවට ගොස් යළි පිටතට පැමිණ රථයට නැගුනේ යම් කිසි ලිපියක් බලමිනි........ ඒ අතරේ ඔහු රියදුරාට යායුතු දිහාව පැවසීය. රථය රියදුරා මහ පාරට ගනිත්ම ඒ හා සමගාමීව තවත් රථයක් පාරට වැටුණේය. එතරම් තද බද නොවන තැනකදී ඉස්සර කර නතර කළ රථයෙන් බට තිදෙනෙක් අවන්තගේ රථයට අත පෑවෝය. හොඳින් හැඳ පැළඳ සිටි තරුණයන් දුටු අවන්ත රථය නවතන ලෙස කීවේ ඔවුනගේ වාහනය කැඩී ඇතැයි සිතමිනි. වාහනය නතර කළ වහාම දොරවල් හැර අවන්ත මැදිවන සේ දෙදෙනෙකු වාඩි වූ අතර අනෙකා ඉදිරිපසින් ගොඩ විය.

"මිස්ටර් අවන්ත........ අපි මෙහෙම නැග්ගට තරහ වෙන්න එපා ........ අපේ කම්පැනි එකේ චෙයාමන් මිස්ටර් අවන්තව මීට් වෙන්න ඕන කීවා........ ඒක නිසා අපි එක්ක යමු" අවන්ත කලබලයට පත් වද්දී පැවසූ තරුණයකු ඔහු දෙස බැලුවේ එය අවධාරණය කරන බැල්මකිනි. තමා යම්කිසි උගුලකට පත්ව ඇතිබව දැනුණු අවන්ත රියදුරුට පැවසුවේ ඔවුන් කියන්නක් කරන ලෙසය.

සඳරූ කාර්යාලයේ වැඩ කඩිනමින් නිමවා චෙක් පොතද දමාගෙන කාර්යාලයෙන් පිටවිය.

"මැඩම් අද ඇයි වේලපහ?"

"මට ගමනක් යන්න තියනවා කමල්........ඕන කරන ෆයිල් මේසෙ උඩ ඇති" එසේ කියූ ඇය දහවල් එකයි තිහට පමණ කාර්යාලයෙන් පිටත් වූයේ තුනට පෙර මුදල් ගතයුතු වූ බැවිනි. මුදල් ගත්තද ඒවා ප්‍රවේශමෙන් ගෙන යාමද කළ යුතුය. තමා මුදල් ගන්නවා දකින මෙතන සිටින කවුරුත් හෝ තමා පසු පස ඒමට බැරි නැත.

සඳරූ ජයතුංග සමග නොගොස් ත්‍රී විලරයක නැගී බැංකුවට ගොස් ගිණුමෙන් මුදල් ලබා ගත්තේය. රුපියල් ලක්ෂ පණහක මුදල් දුටු ඇයගේ ගතට දහඩිය දැමිය. ඇය ලිපිකාරිණියට නොදැනෙන්නට දහඩිය පිසදමා ගත්තාය.

"මැඩම්........ මේ සල්ලි කොහොමද ගෙනියන්නේ........ බෑගයක් තියේද?"

"නෑ මා ගාව නෑ"

"මේ ගණකම කවරේ දැම්මා........ ඒත් මොනා හරි වෙන බෑග් එකක දාගන්න වෙවී"



"හොඳයි........ තැන්ක්ස්" එසේ කියා මුදල් බෑගය අතට ගත් ඇය එය බර නිසාම තම විශ්වවිද්‍යාල බෑගයේ දමා ගැනීම හොඳයයි සිතුවා. ඇතුළු කාමරයට ගොස් එය බෑගයට වඩෙන් පොරෙන් දමා ගත්තී........ ගැහෙන හදවතින් එළියට ආවාය. බෑගය පිටේ එල්ලා ගත් ඇය ෆයිල් කවර කිපය අතට ගෙන වෙලාව බැලුවාය. වෙලාව දෙකයි පනස් පහ වී ඇත. ඇය වට පිට බලද්දී කවුරුදෝ තමා දෙස උවමනාවෙන් බලා සිටින බව දුටුවා බියෙන්ම බියපත් වූවාය. ඉන්ද මේ මුදල් ඇන් කිසිවෙකු පැහැර ගතහොත්........ ඇය හෙමිහිට එම තැනැත්තා මග හැර බස් නැවතුමට පැමිණ එතැන වූ ත්‍රිවිල් රථයකට නැගුණාය. "අකුරට" යැයි කිවූ ඇය තවත් සැක කටයුතු දෙයක් තමා පසු පස ඒදැයි හැරී හැරී බැලුවාය.

හරියටම තුනයි තිහට පමණ අකුරණ හංදියේ බැස්ස ඇය තමාගේ හිතවත් රියදුරා සෙවිය. ඇය බසිනු දුටු රියදුරා ත්‍රිරෝද රථය ගෙනැත් ඇය අසල නැවැත්විය.

"නෝනා........ නගින්න........"

"ඉක්මනට යමු ඩ්‍රයිවර් මහත්තයා"

"ඇයි නෝනා කවුරු හරි පස්සෙන් ආවද........?"

"මට නිකම් එහෙම හිතුණා........"

වෙලාව තුනයි හතලිස් පහ වන විට සඳරූ පුරුදු තැනින් බැස රියදුරාට ඉන්නට පවසා අජිත්ගේ නිවසට ගියාය. ඇය දුටු තරුණයින් ඇත දීම ඇය හඳුනා එකිනෙකාගේ මුහුණ බලා ඇයට හිස නමා, "යන්න නෝනා අජිත් අයියා ඇතුළේ" යැයි පැවසුවෝය. සඳරූ තනිවම කාමරයට යද්දී පුරුදු ලෙසම ඔහු කාමරයේ විය. නතර දෙනා වෙනුවට කාමරයේ සය දෙනෙක් පමණ වූහ. ඔවුන් යම් කිසිවක් ගැන........ සමහරවිට තමා ගැන කථා උණු බව ඇයට වැටහුණේ ඔවුනගේ මුහුණු වෙනස් වූ බැවිනි. සඳරූ දුටු අජිත් සිනාමුසු විය. ඔහු අභිමානයකින් මෙන් හිස වැනුවේ ඇයව ඒ තරමටම පිළිගන්නා සුහද සිනාවක් පාමිනි.

"එන්න නෝනා........ ඉඳගන්න........"

"අජිත් අයියා........ මම සල්ලි ගෙනාවා"

"මම දැනගෙන හිටියා නෝනා........ මම දැනුත් මගේ ගෝලයන්ට කිවේ නෝනා එනවා කියලා........ මට දැන් වයස හතලිස් තුනක්........ මේ වයසට මම මිනිස්සු දහස් ගානක් දැකලා කතා කරලා ආශ්‍රය

කරලා තියනවා. මනුස්සයෙක් දැක්ක ගමන් එයාගෙ කේන්දරේ නොබලා එයා ගැන කියන්න මට පුළුවන් කම තියනවා......... ඔය නෝනා ඊයෙම මට හොඳ සහතිකයක් නෝනා ගැනම දුන්නා......... ඒ මොකුත් කියලා නෙවි. නෝනාගෙ ගතිගුණ මම එක වචනෙත් දෙකෙන් ඇනගත්තා.........

ඒත් නෝනා මට සමාවෙන්න ඕන......... මගේ මේ නාහෙට නාහන මලයා අනවශ්‍ය වැඩක් කරලා. මටත් නොකියා නෝනගේ අයියව එක තැනක නවතලා තියාගෙන. හැබැයි බය වෙන්න එපා. බොහොම හොඳ ඔෆිස් එකක ඒ. සී. කාමරේක කම්පැනියක වෙයාමන් එනකල් තමා නෝනගේ අයියා බලා ඉන්නේ. මේ කිසි දෙයක් අයියා දන්නේ නෑ......... එයා පැය තුනක් දැන් වෙයාමන් එනකල් බලා ඉන්නවා. දැන් මම නෝනා ඉස්සරහම ඔන්න අයියා රිලීස් කරනවා.........” එසේ කී අජිත් කිසිවෙකුට කථා කළේය.

“විමලෙ අවන්ත මහත්තයයි ඩ්‍රයිවරුයි කාරෙකයි රිලීස් කරන්න. මේ ගැන කාටවත් කියන්න එපා කියලා ඩ්‍රයිවර්ටයි අවන්ත මහත්තයටයි දෙන්නටම කියන්න.........” එසේ කියා ඇය දෙසට හැරුණ අජිත්,

“මම එහෙම කියන්න එපා කිව්වෙ, ගෙදර උණත් දැනගත්තොත් අවන්ත මහත්තයා ඉස්සුවා කියලා මනුෂි නෝනා ඔය නෝනව සැක කරයි අපට සම්බන්ධයි කියලා......... නිකම් වත් ආරංචි උණොත් සල්ලි දුන්නේ කවුද කියලා......... නේද?” සඳරූ ඔව් කියන්නට හිස වැනුවාය.

“මේ නෝනා ඊයෙම මට අයියෙ කියලා කථා කළා. මගේ ගෝලයොත් මට අයියා කියනවා. ඒ කියන්නේ මම අයියෙක් නිසා. ඒත් නෝනා මට අයියා කිව්වේ නංගි කෙනෙක් විදියට කියලා මම දන්නවා. අපි කාලයක් තිස්සේ මේක රස්සාවක් විදියට කරනවා. මම පිළිගන්නවා මම මිනීමරුවෙක්. දාමරිකයෙක්. පාතාල නායකයෙක් කියලා. අපි හැමදාම සල්ලි ගත්තේ නරක වැඩ කරලා......... ජීවිතේ මෙච්චර කාලෙකට කෝටි ගණන් සල්ලි අතගාපු මම පළවෙනි වතාවට තමා හරි උතුම් දේකට ගෙනත් දීපු සල්ලියක් මේ ගත්තේ. තමන්ගෙ ගෑනි අපේ වචන තුට්ටුවට අලා හයිපාට් පෙන්නද්දී මිනිහා දන්නේ නැතිව පැය තුනක් මාරයගෙ කටේ හිටියා. තමන්ගෙ මිනිහත් නෙවී......... මේ......... තමන්ගෙ මස්සිනාව බේරන්න මේ නෝනා කිව්ව වෙලාවටත් කලින් සල්ලි අරන් ආවා

......... හරි අගෙයි නෝනා. මේ අජිත් එච්චර උගතෙක් නොවුනට මේ වගේ දක්ෂ බුද්ධිමත් කම් අඳුනගන්න බැරි කෙනෙක් නෙවි. මගේ වචනෙ වචනෙම වෙනවා. අද දවසෙ මුදල් නොලැබුණානම්, එහෙනම් කුණ්ඩසාලෙ ගෙදර හෙට සුදු කොඩි. ඒත් නෝනා මාව තේරුම් ගත්තා......... වගේමයි මමත් නෝනාව තේරුම් ගත්තා. නෝනා වගේ උගත් කෙනෙකුට නංගි කියන්න වාසනාව නැති උණත් ඔය අත් දෙකෙන් වාසනාව දෙනවා කියලා හිතාගෙන ඔය සල්ලි ටික මට දෙන්න......... බොහොම පිරිසිදු හිතකින් ලැබිච්ච මුදලක් මේක......... ඒ නිසයි මේක ලක්ෂ පනහට වඩා වටින්නේ.........” අජිත් කියද්දී බෑගය පිටින්ම සඳරූ මුදල් අජිත්ට දුන්නේය. එය අතට ගත් අජිත් එය තම ගෝලයාට දුන්නේ,

“මේ සල්ලි වෙනම තියන්න......... මේ නෝනාගෙ බෑග් එක අස්කරලා දෙන්න” යි කියමිනි.

“මේ ලෝකෙ සමහරු කටින් පිටවෙනවට වචන පිටකරනවා. ඒත් තමන් කියන්න ඕන කරන්න පුළුවන් දේ......... නෝනා ඒ වගේ කිව්වා......... කරා. මම හරියට ගරු කරනවා. මට අයියා කියලා කිව නිසාමයි මේ කියන්නේ ජීවිතේ කවදා හරි නෝනට අජිත් අයියව මොනම දේකට හරි ඕන උණොත් මාව මතක් කරන්න. නොමැරී හිටියොත් මම එතන ඇති.........” ඔහු කීවේ හදවතින්ම බව සඳරූට වැටහිණ. සඳරූ හිස සලා බිම බලා ගත්තේ එය පිළිගත්තා මෙනි.

“බොහොම ස්තූතියි......... මම ගිහින් එන්නම්”

“දමයන්ත උඹ ඉඳපං......... මම යන්නම් නෝනා එක්ක එළියට”

“එපා අයියේ......... මම යන්නම්”

“යමු නෝනා. ඔය අනිත් පාතාල නායකයො වගේ මම බයේ මේකෙම ඉන්නේ නෑ. මම හැම තැනම ඇවිදිනවා” එසේ කී ඔහු සඳරූ කැටිව ත්‍රී වීල් රථය වෙත ගියේය. එහි ගිය අජිත් රියදුරා අසලට ගොස්,

“නාමල්, නෝනා කියන තැනට නෝනව බස්සන්න. ආයෙ කවදා කොහේ දැක්කත් නෝනා මෙහෙ ආ බව කටින් පිට වෙන්නත් බෑ තේරුණාද?”

“ඒවා හරි අජිත් අයියා......... දේව වාක්‍යයක් භාරගත්තා වගේ තමයි” එසේ කී රියදුරා ඔහුට ආචාර කොට රථය පණගන්වා ගත්තේය.

# 35

ධාවන තරඟයෙන් තනිවම දිව ආ තරඟකරුවන්ගේ විඩාවත්, හැඟීමත් සඳරුට විය. ඇයගේ ඇඟ කිලිපොලා ගියේ අවන්ත පැහැරගත් බව සිතද්දීය. එහෙත් ඔහුගෙන් එය අසන්නටද නොහැක. ඔහුද එය කිසිවෙකුට නොකියනු ඇත. එහෙත් දැන් ඉතිං තමා ගත් ලක්ෂ පනහක මුදලට කුමක් කරන්නද......... එය සිහිවෙද්දී ඇයගේ මොළය අවුල් වී යන්නා සේ විය. ඇය මේ ගැන කථා කිරීමට හෝ සිටියේ ගිම්හාන පමණක් නිසා ඇය දේශනවලට යාමට සිතුවද දැන් පලක් නැති බව සිතා නගරයේ බැස ගත්තාය.

ඊයෙ රාත්‍රියටද උදේද දහවලේද කිසිවක් නොකෑ ඇයගේ කුසගින්න මෙවේලෙහි නැග ආවේ ප්‍රශ්නය නිරාකරණය වූ නිසා විය හැක. ඇය යළිත් ගිම්හානට කථා කළේය.

"ගිම්හාන මම ටවුමේ......... පන්තිය කට් කරලා ඔයා එන්න මෙතනට......... අනේ වදයක් කියලා නම් හිතන්න එපා......... මාව ගැහෙනවා......... වගේ......... මට ඔයාට කියන්න දෙයක් තියනවා........."

එසේ කියා ඇය ගිම්හාන එනතෙක් සිටිය යුතු නිසා අසල වූ කඩසාප්පු පේළියේ ඇවිද ගියේ විසිතුරු බඩු බලමිනි. එහි එක් සාප්පුවෙක වූ නවීන විලාසිතාවේ කළු පැහැති මාලය දුටු ඇයට එක්වරම නෙත්නව සිහි විය. නොයෙක් විලාසිතාවල මාල බ්‍රේස්ලට් පලඳින ඔහුට එය කදිමට ගැලපේ යැයි ඇයට සිතිණ. එහෙත් තමා එය කෙසේ දෙන්නද......... එනමුදු පියුම් ගත්තක් ලෙස හෝ එය ඔහුට දීමට උවමනා බව ඇයට සිතුණේ එහි ඇති විසිතුරු බව නිසාමය. එහි මිල විමසා බලද්දී තුන්සිය පනහක් කියූවෙන් ඇය එය මුදල් දී මිලට ගත්තාය. එය තම බෑගයේ දමාගත් ඇය මුදල් ගෙවද්දී ගිම්හාන පැමිණියෙත් ඔහු ඇයද කැඳවාගෙන අසල වූ කූල් හවුස් එකට ගොස් එළියේ වූ කබානාව යට වාඩි වූවාය.

"මොකද උණේ......... මොකක්ද කථාව........."

"මම සල්ලි අරන් ගියා ගිම්හාන. ඒත් ඔයා දන්නවද අජිත්ගේ මල්ලි ඒ වෙනකොටත් අවන්තයියා උස්සලා"

"මොනවා........."

"ඔව් මගේ ඇඟ පණ නැති වෙලා ගියා......... ඒත් මම සල්ලි ගෙනිච්ච ගමන් අජිත් කෝල් කළා අවන්තයියා රිලීස් කරන්න කියලා"

"ඕ......... මයිගෝඩ්......... එහෙනම් අපි හිතුවට වැඩිය හරි දරුණු වෙලා තියනවා වැඩේ........."

"ඔව්.........ඒත් දැන් මම කොහොමද ගිම්හාන මේක ගෙදරට කියන්නේ?"

"කියන්න යන්න එපා......... සද්ද නැතිව ඉන්න........."

"ඒත් අර ගහ මේ ගහේ ගහලා වත් මට ලක්ෂ 50 ක අඩුව පුරවන්න බෑ......... ඒක හැමදාටම අඩුවක්"

"ඒක ඇත්ත......... ඒත් ප්‍රශ්නයක් ආවොත් එදාට බලන්න. දැන්ම බයවෙන්න එපා"

"කොහොමත් අනුවෙනවා......... තාත්තියි නෙත්නයි දෙන්නම බලනවනේ එකවුන්ට්ස්"

"ඒකත් ඇත්ත......... ඒත් දැන් එක පිම්මක් පැන්නනේ"

"ඒක නම් පිට නිසා හොර රහසෙ කළා. ඒත් දැන් එක්කෙනෙක් දන්නවා කියන්නේ ගෙදරම දන්නවා කියන එක"

"කූල් ඩ්‍රින්ක් එකේ කිඹුලො බලන්නෙ නැතුව ඕක බොන්න........."

ගිම්හාන කීවේ ඇයගේ අසහනය දුරුකරන්නට මෙනි.

නෙත්න රථය පදවාගෙන ආවේ කල්පනා කරමිනි. අද දිනයේද සඳරුගේ දුරකතනය ඕෆ් කොට ඇත. එය කැඩී වත්ද......... ඒ අතරේ අවන්තයියාට කථා කරද්දී ඔහු එතරම් කලබලයෙන් වගේ තතනමින් කථා කළේ ඇයි......... මෙසේ අභිරහස් දේවල් සිදුවන විට හරි දේ සිතා ගත නොහැකිව ඔළුවද විකාර වේ.

උදේ එනවිට රිද්මි අක්කා බබාට කැරියර් එකක් ගෙන ඒමට කී බව සිහි වූ නෙත්න වාහනය නගර මධ්‍යයේ නවත්තා සාප්පු සංකීර්ණයට ගොඩ වීමට ඇවිදගෙන ගියේය. ඒ යද්දී ඔහු නිකමට මෙන් බලද්දී දුටු අසුනෙන් නෙත්නගේ දෙනෙත උඩ ගියේය. සඳරු ගිම්හාන සමගින් පලතුරු බීම බොමින් සිටිනු ඔහුට දක්නට ලැබිණ. ඔහු එතැනම ගල්වූවාක් මෙන් නැවතී මද වේලාවක් බලා සිටිද්දී ඇය දුරකතනය ඕන්කොට කවුරුන් හෝ සමග කථා කරනු ඔහුට පෙනිණ.

"ඔ......... ඔය තියෙන්නේ සේරම කෙළි......... අද එහෙනම් ඔෆිස් එකෙනුත් කලින් ආවේ මෙකයි. ෆෝන් එකත් ඕෆ් කරගෙන ලව් කරලා" ඔවුන් කථා කළ දෙයකට ගිම්හාන සඳරුගේ අතින් අල්ලාගෙන යමක් පවසනුද සඳරු එය හිසවනා ප්‍රතික්ෂේප කරනුද නෙත්නට පෙනිණ.

.........මෙයා මෙච්චර කල් කළේ ඒකයි එහෙනම්......... අයියටයි මටයි දෙන්නටම කොළේ වැහුවා වගේ......... මට ගිහින් ගහන්න හිතෙනවා කන පැලෙන්න......... ඒත් ඇයි......... මට මොකද කියලා ඇහුවොත්......... ආපුදෙන්කෝ ගෙදර......... එසේ සිතූ ඔහු ගන්නට ගිය බඩුවද නොගෙන ආපසු හැරී වාහනයට ගියේය. වාහනයට ගියද ඔහුට නිවසට යාම අමිහිරි විය. එහෙත් නොගිහින්ද නොහැක

.........

සඳරු බැල්කනියට වී බලා සිටියේ රොෂාන් එනතුරුය......... අද ඔහු පුත්තලමේ ගිය නිසා එන්නට රෑ වෙනවා විය හැක......... දහවලේ සිදු වූ සියලුම සිද්ධි සිහිපත් කරමින් සිටිද්දී ඇයගේ ඇඟ කිළිපොලා ගියේ තවත් පුංචි මොහොතකින් අවන්තට සිදුවන්නට තිබූ දෙයය. සමහරවිට එය ඇත්තක් වූවා නම් මෙහි හෙට දිනයේ මොනවා වෙන්ට තිබුණේද.........

ඇය එක්වරම හැරුණේ කවුරුන් හෝ මෙදෙසට එන බව දැනුණ බැවිනි. නෙත්න කාමරයේ සිට මෙදෙසට එමින් සිටියේය. එතනට ආ ඔහු එක්වරම ඇයගේ අතින් ඇද නැගිටුවා ගත්තේය. ඇයගේ දෙවුරහිස අල්ලා ගත් ඔහු සිටියේ දැඩි කේන්තියකින් බව සඳරුට වැටහිණ.

"තමුසෙ දැන් අලුත් සෙල්ලමක් පටන් අරගෙන නේද.........?"

"ඇයි......... මොකක්ද.........?"

"මොකද ඊයෙ ඉඳලා තමුසෙගෙ මොබයිල් එක වහගෙන. මොන මඟුලක් කරාද?"

"නෙත්න......... මට රිදෙනවා......... මව අතාරින්න"

"තාම රිද්දුවෙ නෑ මම......... මට ඇත්ත කියනවා"

"මොනාද......... ඔයා හිතන දෙයක් මම කළේ නෑ"

"මොනවද මම හිතන දේ......... මොනවද තමුසෙ කළේ.........?" නෙත්න ඇසුවේ ඇයව දැඩිව අල්ලාගෙනය......... එහෙත් එයින් සඳරුගේ දෑත හොඳට රිදුනෙත් ඇය අත ගලවාගැනීමට වෙර දැරුවාය.

"ඇයි මොකද මම අල්ලනකොට අමාරුද......... රටේ එවුන් එක්ක නම් ඔන මඟුලක් නටන්න පුළුවන් නේ........."

"මම කොහෙද රටේ උන් එක්ක නැටුවේ......... ඔයාට මොකද වෙලා තියෙන්නේ.........?"

"මට වෙච්ච දේ වෙලා ගොඩක් කල්......... හැබැයි මතක තියාගන්නවා......... තමුසෙට ඔන නැටුම් මා එක්ක නටන්න වෙන්නෙ නෑ......... තමුසෙව හොඳින් හරි නරකින් හරි මම අරන් යනවා......... ඒක නිසා මෙහෙ එක එකා එක්ක නටන්න ලෑස්ති වෙන්න එපා......... තේරුණාද.........?" එසේ කියා සඳරු අතහැරිය නෙත්න අසල වූ මල් පෝච්චියටද කුඩු වී යන්නට අතින් ගසා යන්නට ගියේය. සඳරු ඇකිබිඳ හඬන්නට විය.

.........දෙයියනේ......... මොනවද මෙයා මේ කියන්නේ......... මම ඊයෙයි අදයි මොබයිල් එක වැහුවනේ......... මට ගන්න හදලා වගේ......... ගිම්හාන මිස්......... වහපු වෙලේම ගන්න ඇති......... අනෙක අද මම ඒවොලවෙ ටවුමේ එක්ක ඉඳපු එක දැකලද......... ඒත් එයා කොහෙද ......... කවුරු හරි දැකලා කියලද......... ඒ උණත් මම ගැන එයාට කියන්න කෙනෙක්......... නෑ......... නෑ......... ඒක වෙන්න විදියක් නෑ......... ඒත් එහෙනම් මොකද මේ යකෙක් වගේ ආවේශ වෙලා......... දැන් ඉතිං ඔය තරහට මොනා කරයිද දන්නෑ......... යන්නත් ඕන......... ඒත් මට බයයි යන්න......... එසේ සිතූ සඳරු නිහඬවම කාමරයට ගියාය.

කාමරයට ගියද ඇයගේ හදවතට කිසිදු ඉස්පාසුවක් සැනසීමක් තිබුණේ නැත......... තමා ප්‍රශ්න ගොඩක් අතර වල්මත් වී ඇති බවක් ඇයටම හැඟෙයි. එකම ගැටලුවක් වත් විසඳාගැනීමට නොහැකි තරම්ය. කෙතරම් සිත අමතක කරන්නට හැදුවද නෙත්න ගැන මතකය හදවත පුරාම පැතිර පවතියි. රොෂාන් පැත්තකට කළ හැක. ඔහු ගැන නොසිතා ජීවත් විය හැක......... එහෙත් නෙත්න......... ඒ කඩවසම් රුව, සිනාව, ආදරය පිරුණු නෙතු යුග අමතක කළ නොහැක. අද පවා ඔහු මේ පළිදරන්නේ තමාගේ ආදරයට නොවේද ......... තමා ඔහුගේ නොවන බව ඔහු කිසි ලෙසකින් නොසිතයි. නොපිළිගනියි. ඔහුගේ මේ සිතුවිලි නිසාම තමා විවෙක අතරමං වෙයි. තමා රොෂාන්ගේද යන්න තමාගෙන්ම සිත විමසන්නේ ඒ නිසාම නේද.........

එහෙත් අද මෙසේ සිදුවූයේ ඇයිද........ ඔහුට මෙතරම් තරහ යාමට ඔහු දන්නා දේ කුමක්ද........ තමාගේ දුරකතනය වසා තැබීම ගැන ඔහු එතරම් උරණ වේද........ ඇය මෙසේ කල්පනාවේ නිමග්නව සිටිද්දී කාමරයට ආ රොෂාන් ඇයගේ මුහුණේ වූ කඳුළු දැක ඇය වෙතට ආවේය.

"සඳරු........ මොකද මේ........ ඇයි මේ කඳුළු?"

"නෑ රොෂාන් මොකුත් නෑ........"

ඇයගේ හදවතේ කෙතරම් ගැටලු ප්‍රශ්න තිබුණද තමා කෙතරම් විමසුවද ඇය කිසි දිනක ඒවාට පිළිතුරු නොදුන් බව දන්නා රොෂාන් ඒ ගැන වැඩිදුර නොවිමසීය. විමසනවා නම් ඇය සත්‍යයම කියන තත්ත්වයට තමා පත්වී තිබිය යුතුය. ඇයට ළංවී, ඇයට ආදරයට කොට ඇයට විශ්වාසය ලබා දිය යුතුය. තමාගේ සෙවණ රැකවරණය ළඟ ඇය සුරක්ෂිත බව ඇය දත යුතුය. එහෙත් විවාහ වූ දා සිට තමා විසින්ම මේ සියලු බැඳීම් කඩා බිඳ ඇති බව සැබෑවකි........ ඒ නිසාම ඇයත් තමාත් අතර සුවිශාල දුරස් බවක් ඇතිව තියෙන බවත් එය එන්න එන්නම වැඩි වනවා මිස අඩු නොවන බවත් ඔහුට වැටහිණ. සැබවින්ම මේ දුරස් බව ඔහු අපේක්ෂා කළේය. මෙය විය යුතුය. මන්ද තමාගෙන් ඇයට සරණක් පිහිටක් නොමැති වන කල ඇය කලකිරෙන බැවිනි.

වික්‍රමසේකර මහතා දැන් හොඳින් සුවය ලබා තිබෙන නිසා ඔහුද දැන් යළි ව්‍යාපාරවලට සම්බන්ධ වී ඇත. එක තැනක නොසිටියද සෑම තැනකටම ගොස් ඒ ඒ කටයුතු අධීක්ෂණය කිරීම ඔහුගේ සිරිතය. වෙළඳ සංකීර්ණයේ වැඩ කටයුතු ආරම්භ කෙරී ඇති නිසා ඉදිකිරීම් කරුවන්ගේ උවමනා එපාකම් සොයා බැලීමට එක් දිනක් උදෑසන ඔහු ගියේය. එහිදී ඔහු මුණ ගැසුණු ඔහුගේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු ඔහුව පැවසුවේ මිලදී ගත් ඉඩමේ වැඩ ආරම්භ කළ යුතු බවය. එයට එකඟ වූ ජීවක මහතා බැංකුව වෙත ගියේ මුදල් රැගෙන එවෙලේම යළිත් ගෙනගොස් දීමේ සිතිනි. බැංකුවට ගිය ජීවක මහතා උඩට ගොස් අදාළ නිලධාරිණිය හමු වී තමාගේ අවශ්‍ය මුදල් ප්‍රමාණය පවසා ගිණුමේ දැනට ඇති මුදල් ප්‍රමාණය විමසුවද ඇය සියලුම මුදල් සාරාංශ කොට මුද්‍රිත පිටපතක් ලබා දුන්නාය. එය පරීක්ෂා කළ ජීවක මහතා දින කිපයකට පෙර ගත් ලක්ෂ පනහක මුදල දැක එය ගත්තේ කුමකටදැයි සිතුවේය. ඔහු රොෂාන් හා අවන්තට කථා කොට විමසුවේ සමහර විට ඔවුන්ගේ ව්‍යාපාර අවශ්‍යතාවයකට මුදල් ගන්නට ඇතැයි සිතමිනි. එහෙත් ඔවුන් ඒ ගැන කිසිත් නොදත්තේය. නෙත්ත මුදල් ගන්නට ඇති බව ඔහුට වැටහිණ. සමරහවිට කියන්න මතක නැති වෙන්න ඇති........ එසේ සිතූ ඔහු තමාට අවශ්‍ය මුදල් ප්‍රමාණය රැගෙන බැංකුවෙන් පිටත් විය.

අතරමගදී නෙත්ත ඔහුට කථා කළේ පියා සවස කාර්යාලයේ සිටිනවාද යන්න ඇනගැනීමටය.

"නෑ පුතා........ මම මේ දැන් සල්ලි අරන් යනවා කවුගස්තොටට ........ එහාන ටිකක් ඉන්න වේවි........ ඒ නිසා මට කියන්නත් බැහැ........"

"මම මේ ලියුම් වගයක් සයින් කරගන්න ප්‍රියලාල් එවන්න හැදුවේ ........ කමක් නෑ එහෙනම්........"

"ඒක නෙවි පුතා........ ඔයා දැන් දවස් දෙක තුනකට කලින් සල්ලි ගත්තද එකවුන්ට් එකෙන්........?"

"ම........ම........ දවස් 3-4 ක් ඇතුලත මම සල්ලි ගත්තෙ නෑ තාත්ති. ඇයි........?"

"මොනවා........ එහෙනම් සල්ලි........?"

"ඇයි මොකද........ තාත්ති?"

"ආයෙ ලක්ෂ පනහක් අඩුයි එකවුන්ට් එකේ........?"

"w........h........at?"

"මම නිකං සමරි එක අරන් බැලුවා........ අයියලගෙනුත් ඇහුවා එයාලා අරගෙනත් නෑ"

"ඕ........ මයිගෝඩ්........ එහෙනම්........"

"ආයෙත් සල්ලි එළියට ගියාවත්ද........ මේක බලාගෙන ඉන්න හොඳ දෙයක් නෙවි වගේ දැන් මොකද කරන්නේ? තාත්ති ඔයා දැන් ඔහොමම ආයෙ බැංකුවට යන්න මම පටස් ගාලා එනවා........"

නෙත්ත කියද්දී එය හොඳ බව අවබෝධ කරගත් ජීවක මහතා යළි බැංකුව බලා පිටත් විය.

ඔහු ගොස් ටික වේලාවකින් නෙත්ත කලබලයෙන් බැංකුවට ආවේය.

"තාත්ති අපි යමු ඇතුළට........ බලන්න කවුන්ටර් එකෙන් අහමු"

"කවුන්ටර් කීයක්ද ළමයා........ කී දෙනෙක්ගෙන් අහන්නද........?"

"උඩට ගිහින් මැනේජර්ට කියමු" එසේ කියූ ඔහු පියාද කැටුව බැංකු කළමනාකරු හමුවන්නට ගියේය. එහිදී අදාළ නිලධාරින්

එකිනෙකා ගෙන්වා විමසීම කරද්දී පෙරදින සඳරු මුදල් ලබා ගත් නිලධාරිනිය ආවාය. ඇයගෙන්ද විමසන ලදුව ඇය පිළිතුරු දෙමින්,

“ඔව් සර්......... සඳරු මැඩම් ආවා......... ඇවිත් ලක්ෂ පනහක් අරන් ගියා........ මමමයි දුන්නේ” යි කියද්දී පිය පුතු දෙදෙන මුහුණින් මුහුණ බලා ගත්හ. මෙම ගිණුමට සම්බන්ධ අය සෑම දෙනම බැංකුවේ සියලු දෙනම හොඳින් හඳුනන බැවින් නිලධාරිනිය කියූ දෙය සැක කරන්නට අවශ්‍ය නොවීය.

“සඳරු......... එයාට මොනවටද සල්ලි ගත්තේ?”

“කියන්න බෑ පුතා......... මට කියන්න අමතක වෙලා සල්ලි ගන්න ඇති.........”

“ඒත් මේ දවස්වල එච්චර ලොකු සල්ලි යන වැඩක් උණේ නෑනේ ......... මොනවටද ගන්න ඇත්තේ?”

“කියන්න බෑ......... අපි අහලා බලමු. මොකක් හරි උවමනාවකට මට කිය කියා ඉන්න වෙලා නැතිව.........”

“ඉතිං තාත්ති අහන්නකෝ කෝල් කරලා......... මොකද අර ගෑනි බොරු කිවද ඇත්ත කිවද කවුද දන්නේ......... මේ ඉතිං දෙවන වතාවටනේ සල්ලි ප්‍රශ්නෙ ආව.........” නෙත්න කියද්දී ජීවක මහතා,

“නෑ පුතා......... ඒක ෆෝන් එකෙන් අහන එක හරි නෑ......... ඒ ළමයා මොනවා හරි හිතුවොත්. යමු ඔෆිස් එකට ගිහිල්ලම අහමු” යි පැවසුවෙන් නෙත්නද එය අනුමත කලේය.

සඳරු ලිපිගොනුවක වූ ලිපියක් කියවමින් සිටිද්දී කාමරයට ඇතුළ වූ දෙදෙන දුටු ඇයට මහා අමුත්තක් දැනිණ. මගියා ගමනාන්තයට පැමිණ ඇති බවට ඉවක් ඇයට දැනිණ.

“තාත්ති.........” ඇය ඇසුවේ නෙත්න දෙස බලමිනි. නෙත්න දෙනෙත හකුළුවාගෙන ඇය දෙස බලා සිටිනු දැක ඇය ඉවත බලා ගත්තාය.

“ඉඳගන්න තාත්ති” ඇය කියද්දී ජීවක මහතා වාඩි වුවද නෙත්න සිටගෙනම සිටියේය.

“දූ......... සඳරු......... මම බෑන්ක් එකට ගියා සල්ලි ගන්න......... සමරි එක අරන් බැලුවේ කියක්ද තියෙන්නෙ බලන්න......... බලනකොට ලක්ෂ පනහක් අඩුවෙලා ඔයා මොනාට හරි ගත්තද.........” පියා අසද්දී සඳරු මොහොතකට වෙව්ලා ගියාය.





“තා.........තා.........ත්ති ස.........සල්ලි.........මමයි.........ගත්තේ.........” ඇය මහා බරකින් නිදහස් උණාසේ කියා දවද්දී නෙත්න තමා දෙස විමසුම් බැල්මෙන් බලා සිටිනු ඇයට පෙනිණ.

“ආ......... ඔයාද......... එහෙනම් කමක් නෑ......... ඒත් ඇයි දූ......... මොනාටද පේමන්ට් කළේ.........”

“ඒක ගත්තේ මගෙ උවමනාව......... කට තා.........ත්ති” සඳරු කීවේ බිම බලාගෙනය. එයින් ජීවක මහතා වඩා ඕනෑකමකින් ඇය දෙස බලද්දී නෙත්නගේ පුදුමය ඉහළ ගියේය.

“ම......... යාගේ......... ඒ මොකක්ද?” පියා ඇසුවේ සිනාමුසුවය. එහෙත් සඳරුගේ මුහුණ අඳුරු වී ගියේය.

“මට සමාවෙන්න තාත්ති......... මට ඒක කියන්න බැහැ.........”

“ඔයාගෙ උවමනාවක්......... ලක්ෂ පනහක......... හිටි අඩියෙම......... නෑ.........නෑ......... වෙන්න බෑ ඔයා කවුරු හරි බෙරගෙන කාගෙ හරි වරදක් ගන්නවද.........?”

“නෑ තාත්ති......... බැංකුවෙන් ගිහින් මමයි ඒ සල්ලි ගත්තේ.........” සඳරු කියද්දී නෙත්න යමක් කියන්නට මෙන් උත්සාහ කොට යළි නිහඬ වනු ඇයට පෙනිණ.

“හරි මට කියන්න ඔයා ඇයි ඒක ගත්තේ කියලා......... ඔයා කොහොමත් ඒක නාස්ති කරන්න නෙවිනේ ගන්න ඇත්තේ......... මොනවා හරි හොඳ දේකටනේ.........” පියා කීවද සඳරු නිහඬව සිටියාය. එහෙත් ඇයගේ දෙනෙතේ කඳුළු නැග ආවේ නිතැතිනි.........

“මට මොකුත් ඒ ගැන කියන්න බෑ......... මට සමාවෙන්න......... තාත්තිට ඕන නම්......... මාව ගෙදර යවන්න.........” ඇය හඬමින් කියද්දී මොහොතකට නිහඬ වුණු ජීවක මහතා,

“ඒ තරම් කලබල වෙන්න එපා......... මම ඇහුවේ එකවුන්ට් එකෙන් එක පාරටම ලක්ෂ පනහක් ගිය නිසයි......... අනෙක මෙතෙක් කල් මට නොකියා ඔයා රුපියලක් වත් නොගත් නිසයි......... එහෙම නැතිව ඔයා ඒක ගත්ත එක ගැන නෙවි. අනෙක මම දන්නවා ඔයා සල්ලි ගත්තා නම් ඒකට හේතුවකුත් ඇති......... කමක් නෑ......... මම අහන්නෙ නෑ......... ඔයා ඒ කාරණය ඔයාගෙ කැමැත්තෙ හැටියට තියාගන්න......... අනෙක මට ඔයා සල්ලි ගත්තා කියන එක ප්‍රශ්නයක් නෑ......... මට ඕන උණේ සල්ලි ගියේ කොහේද බලන්න......... ඔයා කියනවා නම් ඔයයි ගත්තේ කියලා......... එච්චරයි. දැන් හොඳ ළමයා වගේ ඔයාගෙ වැඩක් කරගන්න......... මම යනවා”

සඳරු හඬමින් පුටුවේ වාඩි වී සිටි තැනට පැමිණ හිස අත ගා පැවසූ ජීවක මහතා "යමු පුතා........." යි කියමින් පිටව යද්දී නෙත්න ඇය දෙස බැලුවේ සඳරු බියපත් කරන බැල්මකි......... එහි තරහව සැකය පිරී ඇතැයි ඇයට සිතිණ. ඇය දෙස වරක් බලා තොල සපාගත් ඔහු කලිසම් සාක්කුවල ඇත රුවාගෙන පියා හා යන්නට හැරිණ.........

සඳරු එහෙමම මේසයේ හිස ගසා ගත්තාය. පියා කොතරම් තමාගේ හිත සනසන්නට හැදුවද ඔහුගේ සිතේ මේ ගැටලුව දිගින් දිගටම පවතිනු ඇත. අනෙක දැන් හවසට මේ ගැන නිවසේද කථා වෙනු ඇත......... නෙත්නගේ සැක සහිත බැල්මෙන් බේරී සිටීම අපහසු වනවා ඇත. එපමණක් නොව මනුෂිගේ මනදොළ පුරවන්නට සිදුවූ මේ සිදුවීම නිසා ඇයගේ කථා අසා සිටින්නට බැරි තරම් කටුක වනු ඇත......... මේ සියලු ප්‍රශ්න මැද තමා මේ නිවසේ සිටින්නේ කෙසේදැයි ඇය සිතුවාය.

දහවලෙන් පසු දේශන සඳහා යායුතු වුවද එයටද සිතක් ඇයට නොවීය. එහෙත් පංති පාඩු කර ගැනීම එයට වඩා ලොකු ප්‍රශ්නයක් වීමට ඉඩ ඇත......... ඒනිසාම ඇය බෑගයද රැගෙන සරසවියට යාමට පිටත් උණාය. වෙන කවරදාකවත් නැති තරමට තමා දැන් ඉතිං ගෙදරට අමුත්තෙක් වූවා යැයි ඇයට සිතිණ. මින් පෙර කිසි දිනක තමා කාර්යාල කටයුතු කිසිදෙයක් නිවසට වසන් කළේ නැත. වසන් කරන්නට තරම් දෙයක් තමාට වූයේද නැත. ඒ නිසාම සැඟවිය යුතු දෙයක් නොතිබුණේය. එහෙත් අද......... සෑම දෙනම තමා දෙස වංචාකාරියක් දෙස බලන්නාසේ බලනු ඇත......... රොෂාන්......... අද ඔහු අසන දේට තමා දෙන්නේ කවර උත්තරයක්ද......... ඔහුට කෙසේ උත්තර දුන්නද නෙත්න තමා කියන කිසිදෙයක් නොපිළිගනු ඇත.........

දේශනවලට ගිය ඇය තමාට අද දින පමා වීමට වන බව දැන ඒ බව ජයතුංගට දැන්වූවාය. අනතුරුව ගිම්හාන එනතුරු බලා සිටි ඇය ඔහු හා සියලු විස්තර පැවසුවාය.

"දැන් ඉතිං මේ ඉස්සරහ දවස් ටිකේ තියෙන කටුක පරිසරය දරාගන්න වෙනවා......... තාත්ති ඔයාට විරුද්ධව මොකුත් නොකියන කල් අනිත් අය ලොකු ප්‍රශ්නයක් නෙවී......... ඒක නිසා බය නැතිව ඉන්න"

"මට ටික දවසකට ගෙදර යන්න හිතෙනවා........."



"ඒ මෝඩ වැඩේ කරන්න එපා......... ඔයාගෙ අහිංසක අම්මයි තාත්තයි ගැනත් ඒ අය සැක කරනවා......... මතකනේ කලින් වතාවේ ......... අනෙක ඔයා දැනටම ලොකු මෝඩ කමක් කරලා තියෙන්නේ ඒ දවස් දෙකේම ෆෝන් එක වහලා......... එයාලා හිතයි දැනට උණත් ෆෝන් එකත් වහලා ඔයා එළියට ගියේ ගෙදරින් ගෙන්වලා සල්ලි දෙන්නද කියලා........."

"ඒක ඇත්ත......... අනිත් අය කොහොම වෙතත් මනුෂි අනිවාර්යයෙන්ම කියයි......... ගිය සැරේ එයාලා ගනිපු සල්ලි වලිනුත් අපේ තාත්තට ඉඩම් අරන් දීලා තිබුණා........."

"මගෙ වෙලාව හරි නරකයි ගිම්හාන......... ඒකයි මේ හැමදේම"

"වෙලාවෙ නරක කම කියලා තේරුමක් නෑ......... ප්‍රශ්නවලට උත්තර හොයනවා මිස........." ඔවුන් දෙදෙන එසේ කථාවෙමින් සිටිද්දී සේමිනිද එහි ආවෙන් තිදෙනාම එකතුව දේශන සඳහා ගියෝය.

තිමා කොට අදම භාරදිය යුතු වූ ප්‍රායෝගික වැඩ කීපයක්ම තිබුණෙත් ඒවා නිමාකොට ඔවුන් එළියට එද්දී බොහෝ රෑ වෝ විය. සේමිනි පළමුව නික්ම ගියේ ඇයගේ බසය ඇතදීම එනු දුටු බැවිනි. සඳරු වටපිට බැලුවද ඇයගේ කාරය එහි නොවීය. එවේලෙම වාගේ බස්නැවතුමට මදක් එහායින් තිබූ කාරයේ නළාව ශබ්ද වූයෙන් ගිම්හානගෙන් සමුගත් ඈ ඉදිරියට ගොස් කාරයට නැංගාය. හාත්පස කළුවර පරිසරය නිසා කිසිවක් නොපෙනිණ......... රථයේ දොර වැසී ගිය පසු රියදුරා රථය ඉදිරියට ගත්තේය. හුරු පුරුදු මහ පාරට රථය නොදමා වෙනත් අඳුරු බර පාරක රථය යනු දුටු සඳරු පළමු වරට ඉදිරිපස බැලීය.

"ජයතුංග කොහේද මේ යන්නේ" එහෙත් පිළිතුරු නැති තැන ඇය බියපත් විය. ජයතුංගට පහර දී කවුරුන් හෝ රථය රැගෙන ගියේද......... ඝණ අඳුර නිසා කිසිවක් හොඳින් නොපෙනේ......... විදුලි ආලෝකය වාහනය තුළ දැල්වෙද්දී සඳරු නෙත්න දුටුවේය. ඔහුද කන්නාඩිය සකසා තමා දෙස බලනු ඇයට පෙනිණ.

"ප්ලීස්......... මට කියන්න මේ කොහේද අපි යන්නේ.........?"

"කනත්තට......... මහය්යාවෙ කනත්තට........." ඔහු නිවෙව රත හඬකිනි.

"කරුණාකරලා ආපහු යමු........ මට ඕන නෑ ඔයා එක්ක රංඩු වෙන්න"

"ආ........ ඒ කියන්නෙ තමුදෙ දන්නවා අද රංඩුවෙන්න දෙයක් තියන බව........ විදුලි පහන නිවා බ්රේක් ගැසූ නෙත්ත පැවසීය.

"මට ඔහොම කතා කරන්න එපා" ඇය කීවේ නැග එන තරහව මැඩ ගනිමිනි.

"කූල් හවුස් එකට වෙලා අත් අල්ලගෙන එක එකා එක්ක ලව් කරන, ගෙදර දෙයක් නැති උණාම හරියකට උත්තර නොදෙන, ඊටත් අදාරවන්තයා අහැරලා එන්න බැරි තමුසෙට එහෙනම් කොහොමද කතා කරන්න ඕන........?" ඔහු ඇසුවේ වේගයෙනි.

"නෙත්ත........" සඳරු කෑ ගැසුවාය.

"කෑ ගහනවා........ මම බය නෑ........ කඳුළුවලිනුයි, කථාවෙනුයි ලෝකෙම රවටන්න තමුසෙලා වගේ එවුන් හරි දක්ෂයි........ ඒක නිසා කෑ ගහනවා........" එසේ කියූ නෙත්ත යළිදු වාහනය පණගන්වා එම අතුරු මාවතේ වේගයෙන් රිය පදවා යන්නට විය.

"කරුණාකරලා නවත්තන්න වාහනේ........ නැතිනම් මම දොර ඇරගෙන පනිනවා"

"ඔහොම ගියොත් තමුසෙට කරන්න වෙන්නෙ ඒක තමයි........ කොහොමත්" වාහනය එතැනම නවතමින් ඔහු කීය.

"ඇයි ආවෙ මාව ගන්න........?"

"ආවෙද........? ආවෙ වෙන මගුලකට නෙවි........ තමුසෙගෙ හොර අල්ලගන්න. ගෙදර කතා කරන්න බෑ........ ඔෆිස් එකෙත් බෑ........ මගදි විතරයිනෙ පුළුවන්........ ඒ ආවත් ඉතිං බලන්න වෙන්නෙ නටන මගුල් තමා........"

"කට තිබුණ පලියට කතා කරන්න එපා........ මම මොන මගුලක් නැටුවද........?"

"ඇයි මම කීවේ........ මම දැක්කා කියලා ඇස් දෙකෙන්ම කූල් ස්පොට් එකේදි........ පනින රිලවුන්ට ඉතිමං වගේ කැම්පස් එකත් හරිගියානෙ........"

"ඇයි ඉතිං ඔයාට ඉරිසියා........ ඔයත් ඉතිං හොයාගන්න කෙනෙක් ........ ඕන තරම් කෙල්ලො ඉන්නෙ"

"ඔව්........ තමුසෙට ඇත් ඒක තමයි මට කියලා කරවන්න ඕන කම........ ඒත් ඔය මගුල්වලට නෙවි මම ආවෙ. තමුසෙ ලක්ෂ පනහ අරන් මොනාද කළේ කියලා අහගන්න........"

"ඉඩමක් ගත්තා........ ඇයි සැකද?"

"තමුසෙ ගැන සැක කළේ නැති එක තමා මගේ වැරැද්ද........ ඒත් මට බයිලා ඕන නෑ........ ඇත් කියනවා ඒ සල්ලිවලට උණු දේ ගෙදර මිනිස්සු රැවැට්ටුවට මාව රවට්ටන්නෙ නැතුව"

"මතක් කරලා බලන එකනෙ ඇත්තේ ගෙදර මිනිස්සු රවටන්න මම මොනවද කළේ කියලා........ මම කීවා, මගේ උවමනාවකට සල්ලි ගත්තා කියලා. එච්චරයි. ඉතිං හරිනේ මම ගත්තේ. මගේ දේකට........ නැතුව කම්පැනියෙ වැඩකට නෙවිනේ"

"ෆෝන් එහෙම ඔෆ් කරගෙන ගහපු ප්ලෑන් එකකට වෙන්න ඇති සල්ලි ගන්න ඇක්කෙත්........ නේද........?"

"ඔව්........ එයින් එකකට තමයි........ ඇයි ඉතිං අහන්නේ........ ඔයා ඔයාගේ වැඩක් බලාගන්න. සී. අයි. ඩී කාරයා වගේ මගේ දේවල් හොයන්නේ නැතුව" සඳරු පිටුපස සීට හරහෙන් කියද්දී නෙත්ත එක්වරම කාරයේ දොර හැර වේගයෙන් වසා එක්වරම පිටුපසට වීත් වාඩිවෙද්දී සඳරු බියගත්තේ කථාව නතර වන තැන සිතා ගත නොහැකිවය.

ඇය අසල වාඩි වූ නෙත්ත ආවේගය කේන්තිය පාලනය කරගන්නට මෙන් වාහනයේ ඉදිරිපස අසුනට වේගයෙන් ගැසුවේය. අනතුරුව ඇය දෙසට හැරුණු ඔහු,

"අද තමුසෙට ඔය සරල උත්තරවලින් බේරෙන්න බැරි වේවි........ මට ඇත්ත කියනවා........ තමුසේ ඒ සල්ලිවලට මොනවද කළේ........ කාටද ඒ සල්ලි දුන්නේ?"

"කිව්වනේ අහන්න එපා........හොඳ හිතින් කියන්නේ මට මගේ පාඩුවේ ඉන්න ඉඩ දෙන්න........ නැතිනම්"

"ඇයි........ නැතිනම් තමුසෙ මොනා කරන්නද........ තමුසෙගෙ මිනිහා තමුසෙ කරන මගුල් දැනගෙන හරි හොඳැක හරි තව පියාගෙන හිටියට මටත් ඉන්නද කියන්නේ........ ගොඩක් දේවල් කරද්දිත් මම කට පියාගෙන උන්නා........ ඒත් මේ ගමන තමුසෙ ඒ සේරම ටේක්ඕවර් කරලා ඉවරයි........ තවත් මම ඉන්නෙ නෑ........ කියනවා මට........ තමුසෙ හැමෝටම රහසෙ හැමෝගෙම ඇස් වහලා නටන මේ නැටුම මොකක්ද........ තමුසෙත විහින් නටන්නෙ නැත්නම් තමුසෙ නටවන්නෙ කවුද........ කාගෙ අතේ රූකඩයක්ද තමුසෙ........ හස්බන්ඩ්ගෙන් ලැබෙන්නෙ නැති දේවල් හොයාගෙන කොහේද තමුසෙ මේ යන්නේ" නෙත්ත අසද්දී සඳරුට ඇහුණේ

මැරෙන්නට තරම් දුකකි. ආවේගයකි......... ඇයට මේ ඔහු කියූ දෙය නිසාම ඔහු ගැන ඇය සිතේ ඇති වූයේ දැඩි කෝපයකි......... වෛරයකි.

.........

"ඔව්......... මට මිනිහෙක් ඉන්නවා......... ඒ මිනිහට තමයි මම සල්ලි දුන්නේ......... තව ටික දවසයි මම මේ ගෙදර ඉන්නෙත්......... මම යනවා ඒ ගෙදරින්......... මට ඔහෙලා කවුරුත් ඕනෙ නෑ......... විශේෂයෙන්ම ඔහේ......... ඔහේ නිසා තමයි මම මිනිහෙක් හොයා ගත්........." සඳරු කියද්දී නෙත්න අත දිගහැර සඳරුට පහර කීපයක්ම කම්මුලට ගැසුවේ ඔහුට තව දුරටත් එකම අකුරක් හෝ ඇයගේ මුවින් අසන්නට නොහැකි වූ නිසාවෙනි. එහෙත් සඳරු ඉකි නොබින්දාය. සිහින් ශබ්දයක් හෝ පිට නොකොට දෙනෙත් තදකොට පියා ගෙන වාහනයේ පිටුපස අසුනට හේත්තු වූවාය. ඔහුගෙන් මේ රහස වසන්නට නම් මේ දරාගැනීම කළ යුතුය.

"තමුසෙ......... තමුසෙ මාව කැවා......... මේ තරම් වංචාවක් මේ තරම් රැවටීමක්.........?මට හිතාගන්න බෑ......... මේ තමුසෙමද කියලා ......... මම ආදරේ කරපු......... මගෙ පණටත් වඩා මම ආදරේ කරපු ඒ අහිංසක එකිමද කියලා......... තමුසෙගෙ මේ විස කොහේද හැංගිලා තිබුණේ......... තමුසෙ කවදද මේ තරමට වෙනස් උණේ......... මේ තරම් වංචාවක් මට කරන්න තරම් මම තමුසෙට මොනවද කළේ......... මම තමුසෙට ආදරේ කරපු එක මේ තරමම ලොකු දඬුවමක් උණාද මට........." නෙත්න කුඩාවකු සේ ඉකිබින්දේය. සඳරු ඔහුගේ ඉකි හඬ අසා සිටියේ පපුව කැලිවලට කැඩී යද්දීය. එහෙත් ඔහුට තමා සාමාන්‍ය ලෙස කථා කළා නම් මුදල් ප්‍රශ්නයේ සත්‍යය පවසන තුරු ඔහු තමා අසරණ කරනු ඇත......... එයින් පසු ඔහු ගන්නා හදිසි තීරණය මත මොන මොනවා නොවේවිද? ඊට වඩා සිය ගුණයක් තමා දුක් විඳීම ඔහු දුක් විඳීම වටින්නේය. තමන් දෙදෙනාගේ ආදරය ඉත්තෙකු කොට ඔහුගේ සිතින් මුදල් ප්‍රශ්නය මෙසේ ඉවත් කර දැමීමෙන් ඔහු තමාට වෛර කරනු මිස සත්‍ය යැයි වෙන යමක් නොසිතනු ඇත. තමා මෙතෙක් කාලයක් ඔහුට වචනයක් නොදුන්නේද තමාට පෙම්වතෙකු සිටින නිසා බව අද ඔහු තීරණය කරන්නට ඇත. මේ මුදල පවා එම තැනැත්තාට දුන්නා යැයි තමා ඔහුගේ මූණටම බිය නැතිව කියද්දී එයම සත්‍යය බව ඔහු පිළිගන්නේ තමා කෙළින් කථා කරන බව ඔහු දන්නා බැවිනි.........

"මම ලොකු වරදක් කළා......... ඒ ගිය ගමන ගිහින් ආයෙ ඇවිත් වරදක් කළා......... ඒ ආවා මදිවට තමුසෙ ගැන පරණ විදියටම බලාපොරොත්තු තියලා වරදක් කළා......... අදින් පස්සෙ මගේ ජීවිතේ මොනවා උණත් තමුසෙ බලන්න එපා......... බලාගෙන ඉන්නවා......... මොනවා උණත් තමුසෙ බලන්න එපා......... මේ නෙත්න තමුසෙගෙ ඉස්සරහ හිනාවෙවී බලාගෙන ඉන්නවා......... ඇත් තමුසෙට විනාශ වෙලා යන හැටි බලාගෙන ඉන්නවා......... සතුටු වෙන්න පුළුවන්........." වේගයෙන් කී ඔහු යළිත් මිටි එක පිටුපස ඔළුව ගසාගෙන ගලාගෙන යන කඳුළුවලට ගලන්නට දුන්නේය. යළිත් තිවුණු හඬින් කටහඬ අවදි කළ ඔහු,

"මේ ආදරේ මට මේ තරම් දඬුවමක් දේවි කියලා මම කවදාවත් හිතුවෙ නෑ......... මාව රැවටීමකට අහු උණා කියලා මම කොහොම හිතන්නද......... ඔය ඇස් දෙකේ තිබුණේ ආදරේ නෙවිද......... ඔව් මට වැරදිලා, හොඳටෝම වැරදිලා........." එසේ කියූ ඔහු කෙළින් වූයේය. කිසිවක් සිදු නොවූ විලස මුහුණ පිස දමා ගත් ඔහු දොර හැරීමට අත තබත්ම සඳරු ඔහුගේ අත මත අත තබද්දී එය වේගයෙන් ගසා දැමූ නෙත්න දොර හැර ඉදිරි පසට ගොස් රිය පණගන්වා ගත්තේය. එයින් පසු නිවසට ආවේ අමුත්තන් දෙදෙනෙකි.........

kathapothak·blogspot·com

# 36

සඳරු සොයාගෙන ප්‍රියලාල් කාර්යාලයට ආවේ කලබලයෙනි.

"මැඩම්......... හරි වැඩේ නමයි........."

"ඇයි ප්‍රියලාල්........ මොකද.........?" සඳරු බියෙන් මෙන් ඇසුවාය.

"හරිම වැඩක්......... අර ඉඩමේ තියෙන ගෙවල් අයින් කරවන්න අද අපි ගියා......... සේරම බුල්ඩෝසර් බැකෝ ඇවිත්......... එතනට යනකොට ලොකු සෙනගක්......... පවුල් හතලිස් ගානක් ඉන්නවා......... අන්න උන් සේරම බෝඩ් ලියාගෙන වත්ත මැද්දෙ ඉඳගෙන ඉන්නවා........ ඒකෙ එකෙක් ඉන්නවා under world එකෙක්. උ‍ෟ තමා සේරම රන් කරවන්නේ......... අපි දැන් මොකද කරන්නේ?" ප්‍රියලාල් අසද්දී සඳරුට සිටි තැනින් නැගිටවුණේ ඉබේටමය.

, .........දෙයියනේ......... ඒ පාර මේ පැන නැගුණේ කුමන ප්‍රශ්නයක්ද ......... දැන් තමා එයට කෙසේ මුහුණ දෙන්නද......... සියල්ල විසඳාගෙන එන කල මේ ආ ප්‍රශ්නය ලේසි පහසු නොවනු ඇත......... දැන් ගෙදර අය වෙළඳ සංකීර්ණය සෑදීමේ කටයුතු ආරම්භ කිරීමට නැකැත්ද සාදවා අවසානය. පසුගිය දින කිපයේ තමා නිවසේ අයට එතරම් මූණ නොදුන්නෙන් ඒ ගැන දුරදිගට විස්තර දැනගැනීමට නොහැකි වුවද මව පෙරේදා තම කාමරයට පැමිණ කීවේ නැකැත් සාදවන්නට දුන් බවත් එය පසුදින ලැබෙන බවත්ය. ඒ අනුව එය ලැබී ඇතුවා විය හැක. එහෙම තිබියදී මේ එළඹ ඇත්තේ කුමක්ද......... පවුල් හතළිහක් පමණ සමග තමන් කෙසේ ප්‍රශ්න විසඳන්නද.........

"කෝ තෙන්න සර්.........?" ඇය හදිසියේම ඇසුවාය. මේ දින ටිකේම රාජකාරි වැඩකට පවා ඔහුගෙන් ඇමතුමක් නාවේය.

"ඇයි මැඩම් දන්නෙ නැද්ද......... තෙන්න සර් ඔෆිස් ආවේ නෑ........."

"මොනවා.........ඇයි ඒ.........?"

"දැන් දවස් තුනකට කලින් මැදවච්චියෙ ගියා......... පෙරේදා ආවේ......... ඊත් ඊයෙවත් අදවත් ඔෆිස් ආවෙ නෑ......... මම දැන් මෙක කීවාම ටෙලිෆෝන් එකෙන්ම මට බැන්නා ඕන දෙයක් කරන්න කියලා........."

"ඕන දෙයක් කරගන්න කියලා"

"ඔව් සර් කිව්වෙ නැතිවු ඉඩම ගන්න, බිල්ඩින් ගහන්න.........

ලොකු සර්ටම කියාගන්න කිව්වා"

.........ඔහු එසේ නම් නිවසේ සිට නැත......... එදා තමා හා රංඩුවෙන් පසු ඔහු යන්නට ගොස් ඇත. පුදුමයි ආයෙ ආවා......... යන්න ඇති නංගිට කේලම කියන්න......... මම මුල් වෙලා ඉඩම ගත්ත නිසා තමා තාත්තිව කරගන්න කියන්න ඇත්තේ......... දැන් අද රොෂාන් රට ඉඳලා ආවාම එහෙන් සල්ලි ප්‍රශ්නෙ අහයි. අනේ මන්දා දෙයියනේ මම මේ ප්‍රශ්නවලට කොහොම මූණ දෙන්නද කියලා......... මාව බයටම ගැහෙනවා......... ඇය මද වේලාවක් කල්පනා කරමින් සිට ප්‍රියලාල් ඇමතුවාය.

"ප්‍රියලාල් කෝ ලොකු සර්?"

"සර්රුත් යාවී එතනට........."

"යමු අපිත්......... ගිහින් බලමු" එසේ කී සඳරු ප්‍රියලාල් සමග රටයේ නැග අභිනව වැඩබිම වෙත ගියාය. ඇය යද්දී මුළු වත්තේම සිටි සෙනග තාවකාලික නිවාස කැඩීමට විරුද්ධව බෝඩ් අල්ලාගෙන නෑ ගසමින් සිටියෝය. පියා ද අවන්ත ද රසාංග ද එහි සිටිනු දුටු සඳරු එහි ගියාය.

"තාත්ති......... ඇයි මේ.........?"

"බලන්න දූ......... මේ දැන් සේරම අපේ නමට ඔප්පු හැදිලා පාස්වෙලා ආවට පස්සෙත් මේ මිනිස්සු යන්න බෑ කියනවා........."

එය ඇසුණු නායකයා වැනි මිනිසා ඉදිරියට විත්,

"ඔව් අපි යන්නෙ නෑ තමයි. අපි අවුරුදු පහළොවකටත් වැඩිය පදිංචි වෙලා හිටියේ මේ වත්තේ......... අපි මෙතෙන් යන්නේ නෑ"

"මේ අහන්න උන්නැහේ......... ඔයාලා මෙතෙ හිටියට අපිට කරන්න දෙයක් නෑ......... අපි දැන් මේකෙ අලුත් අයිතිකාරයො. අපි හදන්නේ මෙතෙ බිල්ඩින් එකක් හදන්න......... ඒකට අපිට මේ බිම සමතලා කරන්න තියනවා......... කරුණාකරලා ඔයාලා මෙතෙන් අයින් වෙන්න"

"නෑ මහත්තයා අපි එහෙම අයින් වෙන්නෙ නෑ......... මහත්තයලා අපි අයින් කරන්න ලෑස්ති වෙන්න එපා"

"එහෙනම් මේක කමුසෙලට ගිය රට......... අපි අදම මේකෙ වැඩ පටන් ගන්නවා. ප්‍රියලාල් කියනවා මිනිස්සුන්ව බෝසර් කරන්න........."

රසාංග කේන්තියෙන් කියද්දී සඳරු ඔහුගේ අත අල්ලා පසෙකට
කළාය.

"රසාංගයියා පැත්තකට වෙන්න........."

"ඒවා කොහෙද.........මෙකෙ තියෙන එක ගහකට පැලේකට
හානියක් උණොත් අපි මෙතනම මරාගෙන මැරෙනවා.........
පුළුවන්නම් ඔය ඩෝසර් ස්ටාට් කරලා පෙන්නන්න. වෙන දේ
පෙන්නන්නම්........." එසේ කියමින් කමිසයේ අත් පිටුපසට තල්ලු
කරමින් ආමරික පෙනුමින් යුත් තැනැත්තා ඉදිරියට ආවේය.

"මම තමයි මෙකෙ නායකයා......... මේ මිනිස්සු අහන්නේ මම
කියන දේ......... ඒයි වාහන ස්ටාට් කළොත් කුඩු කරපල්ලා.........
මොකද මහත්තයා........."

"මේ උන්නැහේ......... මෙක අපේ ඉඩම. අපි කෝටි ගාණක්
යටකරලා ඉඩම ගත්තේ......... මෙක හරි අසාධාරණයි. ඔහේලා මේකෙ
බලහත්කාරයෙන් පදිංචි වෙලා හිටියට අපි පලිද......... අපි යනවා
පොලිසි. ගිහින් ආනවා නඩු" සඳරු කිවේ තරහෙනි.

"අනේ යන්නකෝ නෝනා......... ගිහින් නඩු දාන්න......... අපිත්
බලන්නම් එතකොට නඩු ඇසෙද්දී බිල්ඩින් හදන හැටි........." ඔහු
කියද්දී කට්ටිය සිනාසුණහ. "එහෙම නෙවි......... අපි අයින් වෙන්න
නම් අපිට කෝටි දෙකක් දෙන්න......... අපි යන්නම්"

"කෝටි දෙකක්.........?"

"මොකද නෝනා වැඩිද......... නෝනලාට කෝටි ගාණක් දීලා
මෙක ගන්න පුළුවන්නම් කෝටි දෙකක් දීලා අපිව පැත්තකට
කරන්න බැරියැ මොකද?"

"ඕ......... අපිව බ්ලැක්මේල් කරනවද?"

"බ්ලැක් මේල් නෙවි......... එයා මේල් කරන්නත් පුළුවන් අපි
කියන දේ නොවුණොත්. ඔන්න අපි අපේ තීරණය කිව්වා......... කැමති
නම් එහෙමයි. නැතුව නම් මේ වාහනවල රෝද කරකැවෙන්නෙ
නැහැ. ඔන්න අපි ගියා" එසේ කී කට්ටිය යන්නට යද්දී පියාවෙත
ගිය අනෙක් අය කළ යුතු දේ කථා කරන්නට වූහ.

"කෝටි දෙකක්......... මේ කොහෙවත් යන හොරුන්ට........." අවන්ත
කීය.

"එහෙම නෙවී තාත්ති ලක්ෂෙ ගානෙ පවුලකට දුන්නොත්........."
සඳරු කියද්දී එම අදහස හොඳබව කාටත් වැටහිණ.

"ඒත් අර මිනිහා කවුද ඒකගෙ නම"

"ලයනල්........."

"ඒ ලයනල් කියන එකා මහ අමාරුකාරයෙක් ළඟ කැමතිවෙන
"ඒ ලයනල් කියන එකා මහ අමාරුකාරයෙක් ළඟ කැමතිවෙන
එකක් නෑ......... අනිත් අයවත් වයින් කරලා තියාවි"

"ඔව් අර ෂයිලොක්ට වගේ ඒ යකාට මස්රාත්තලම ඕන.........
කෝටි දෙකෙන් රුපියලක්වත් අඩුව බෑ කිවේ යද්දිත්........."

"කවද කෝටි දෙකක් දෙන්නේ......... ඒත් මේ ප්‍රශ්නෙ මෙහෙම
තිබුණොත් නැකතට වැඩ නම් පටන් ගන්න වෙන එකක් නෑ සඳු
දුව"

"ඔව් තාත්ති මොනවා හරි නොකර ඉඳලා බෑ. කොහොම හරි
ලක්ෂ 40 ක් දෙන්න කැමති කරවා ගත්තොත්........."

"අපි යමු දැන්......... කල්පනා කරලා බලමු........." පියා කියද්දී
වත්තේ ආරක්ෂාවට මිනිසුන් නතර කළ ඔවුන් යන්නට ගියහ.

රාත්‍රී සෑම දෙනම නිවසේ මේ ගැන කථා කරමින් සිටිද්දී නෙත්හ
ගෙට ගොඩ විය. හැමදෙනම කථාවෙන්නේ ඉඩමේ ප්‍රශ්නය වුව
එය තමාට අදාළ නැති දෙයක් ලෙස ඔහු දුටුවේය.

"සුදු පුතා......... ඔයා කොහේද මේ දවස් දෙක තුනේම ගියේ.........
බලන්න ඔෆිස් එකට ආවෙ වත් නෑ......... ඒ මදිවට මේ දරාගන්න
බැරි ප්‍රශ්නයක් ඇවිත්......... එකෙක් දෙන්නෙක්ද පවුල් හතලිහක්
කිවාම........." පියා කියද්දී මග හැර යනු නොහී නෙත්හ පැමිණ මට
අසල වාඩි උණේය.

"තාත්ති මට ඔය ගැන කියන්න එපා......... ඔය කෙහෙල්මල
ගන්නකොටම මම කිවා බැරි වැඩ නොකර ඉමු කියලා......... ඒක
නාහා ගත්ත නම් ඔයාලා කරගන්න......... මට කියන්න එපා.........
තියෙන බිස්නස්වලට සල්ලියට නොකර තව ඒවා බඳා ගත්තා........."

"එහෙත් එකවුන්ට් එකේ තිබ්බචි සල්ලිත් නෑ......... මේවා ඉතිං
මොකට හංගගෙන ඉන්නවද......... ඔයාලා මේ ලක්ෂ පනහ සඳරු
ගත්තයි කිව පමණින් කට වහ ගත්තා......... ගිය සැරේ තිබිච
ආන්දෝලනේ අද නැතේ......... ඇත්තටම මේ නැතිවෙලා ගියේ
බිස්නස් එකේ සල්ලි නේද......... සඳරු ඒක ගත්තා කිවාම ඔයාලා
ඇහුවෙ නෑ ඒක ඇයි ගත්තෙ කියලා වත්......... මේ ගෙදර වෙන
කවුරු හරි අතින් උණානම් මේ වරද තාත්ති ඉවසනවද?" ඔහුගේ
අසද්දී සෑම දෙනම යමක් කියන්නට උවමනා වූ නමුත් නොකියන්නන්
සේ නිහඬව සිටියහ.

........ තාත්ති ඇහුවෙ නෑ
"මම හිතන්නේ මනුමි අක්කි හරි........ තාත්ති ඇහුවෙ නෑ
එයාගෙන ඒ සල්ලි ගත්තෙ මොකටද කියලා?" නෙත්න කියද්දි
මනුමිට පුදුම සිතිණ. ඇය හැරී ඔහු දෙස බැලුවාය.
"මේ අහන්න නෙත්න. සඳරු කියන්නෙ මේ ගෙදර දෙවෙනි
ලේලි........ ඔයාලට මගේ සල්ලි පාවිච්චි කරන්න අවසර තියනවා
නම් එයාටත් ඒ අවසරය තියෙනවා........ අනෙක ඒ ළමයා මේ
කාලෙට මට කෝටි ගාණක් ලාබ උපයලා දුන්නා මිස මගෙන්
රුපියලක් ඉල්ලලා නෑ........ මේ සල්ලිත් එයා ඉල්ලුවෙ නැතුව
ගත්තේ මොකක් හරි හේතුවක් නිසානේ........ ඒක සමහර විට එයාගෙ
අයිතිය........ කියලා එයා හිතන්න ඇති. අනෙක එයා පිළිගත්තා
එයා සල්ලි ගත්ත බව........ ඉතිං ඒක හොරකමක් වංචාවක් නෙවි........
ඒ ළමයගෙ උවමනාව මොකක් උණත්........ සමහරවිට ගෙයක් ගන්න
........ සමහරවිට ඉඩමක් ගන්න........ සමහරවිට අලුත් බිස්නස් එකකට
දාන්න. හරියට ඔයාලා වගේ,........ එයා ගත්තා. ඒක එයාගෙ පුයිවෙට්
දෙයක්. කියන්න අකමැති දේ අහන්න මම කැමති නෑ........ එයා හරි
........ එයාගෙ දේ එයා කලා........ සද්ද නැතිව........ ඊට අමතරව
අපේ වැඩකටයුතු සාමාන්‍ය විදියට හරි විදියට කරනවා.
අනෙත් එක ඔයාලා කට්ටියම මතක තියාගන්න........ ඔයාලත්
මගේ සල්ලි ගන්නවා පාඩු වෙනවා. මම කවදාවත් ඒ ගැන ඇහුවෙ
නෑ........ සුදු පුතා උණත් මාස දෙකක් ගෙදර නැතිව ඉඳලා කෝටි
ගානක් තරමට පාඩු කරගත්තා. බිස්නස් කියන්නේ ලාභ පාඩු........
ඒ ඇර දෙයක් නෑ........ ඒත් සඳරු මට විශ්වාසයි. ඒ මුදල් වියදම්
කරන්න ඇති කවදාවත් අපිට කරන්න බැරි උණ දේකට සමහරවිට
........ කොටින්ම ඒ ළමයා ඔයාලා වගේ සල්ලි නිකම් ගත්තෙ නෑ.
මට හම්බකරලා දීලා තමා ලක්ෂ පනහ ගත්තේ........ කොටින්ම මේ
ටෙන්ඩර් එක පවා අපිට ලැබේවි කියලා මට හීනෙකින්වත් හිතුණෙ
නෑ........ ඒ ළමයා ඒක ගත්තා........ කොල්ලෙක් වගේ දුවලා පැනලා
සේරම ඔප්පු තිරප්පු ලියවිලි අපේ නමට ගත්තා........ ඔයාලා දන්නෙ
වත් නෑ නේද........ ඒ කිසි දෙයක්. මගේ දරුවෝ හතර දෙනාගෙන්
එක්කෙනෙක් වත් දන්නෙවත් නැතුව ඉද්දි සඳරු මට ඒවා කරලා
ගෙනත් දුන්නා........ ඉතිං මේ ටෙන්ඩර් එක ඔයාලා අපි සේරම
දන්නවා කෝටි ගානක ලාභ අපිට ගේනවා කියලා........ එහෙව්
එකේ සඳරු ගත්ත ලක්ෂ පනහ ගැන ආයෙ කවුරු හරි මේ ගෙදර
වත් මෙන තැනක වත් කතා කරන්න බැහැ" පියා කීවේ නෙත්නට
නොව තමාටත් බව මනුමිට මෙන්ම අනෙක් අයටද වැටහිණ.

"දැන් ඔය කතාව නෙවිනේ වැදගත්........ අපි මේ ආව ප්‍රශ්නෙට
විසඳුමක් හොයාගන්න ඕන" රසාංග කීවේ පියාට කේන්ති ගිය බව
දුටු බැවිනි.
"රසාංග පුතා ඔයාලා ඇහුවෙ නැද්ද ඒ මිනිහාගෙන් ලක්ෂෙ
ගානෙ දෙන්න........"
"අපි එන ගමන් ආයෙ ගිහින් ඇහුවා අම්මි........ ඌ නෙවි
සතේකට ගනන් ගත්තේ අපිව........ අපි නිකං හැල්ලු උණා විතරයි
........"
මේ අතරේ පියුමි සමග ගෙට ගොඩ වූ සඳරු දුටු පියා ඇයට
එතැනට කථා කළේය. ඇය නෙත්න දුටු නිසා කරබාගෙනම ඇතින්
නතර වූවාය.
"දූ........ සඳී........ ඔයා මොකද හිතන්නේ........ මේ වැඩ කරගෙන
යන්න ලැබේවිද........ අපි ආයෙ හෙට ගිහින් ඔයයි මමයි වත් කතා
කරමුද?"
"මිනිහා මහ එපා කරපු පොරක්........ ඌ මේ කතාවලට නැවෙන
එකෙක් නෙවි" අවන්ත කියද්දී නෙත්න තරහෙන් පිපිරුණේය.
"බම්බු ඉඩමක් ගත්තා. දැන් ඉතිං කොහේවත් යන එකෙක් පස්සෙ
යන්න හදනවා තිම්පු සාකච්ඡා තියන්න. ඕවා ඕනෙ නෑ. කනට
දෙකක් දීලා ඇම්මා නම් ඉවරයි නටාගෙන ආවොත්"
"සාමාන්‍ය මිනිහෙක් නම් ඒකත් කරන්න තිබුණා. මේ මිනිහට
පිරිස් බලය තියනවා........ පිරිස් බලය කියන්නේ මිනිහා වත්තෙ
උන්ව තමන්ගෙ බහට නම්මගෙන........ එහෙව් එකෙක්ට කනට
දීලා මේ ප්‍රශ්නෙ විසඳන්න බෑ නෙත්න" අවන්ත කියද්දී පියා ඔහු
අනුමත කරමින් හිස වැනීය.
"ඔයයි, පොඩි අයියයි වගේ කේන්තිකාරයො එක්ක මේ ප්‍රශ්නෙ
විසඳන්න බෑ........ඒ මිනිහා කොහොම හරි අපේ වචනෙට නම්ම
ගන්නවා මිස" පියා කියද්දී
"නව මාසයක් කිවත් ඔය යකා නම් රුපියලක් අඩු කරන්නෙ නෑ
........ අපිට වැඩ පටන් ගන්න නම් කෝටි දෙක දෙන්න වේවි"
රසාංග පැවසීය.
"කෝටි දෙකක්........ කජු ඇටද........ හෙට මම එන්නම් යන්න"
නෙත්න කීවේ කේන්තියෙනි.
"එහෙම බලනකොට නැකැත් බලපු දවසට ලණු අදින්න බැරිවේවි
........ මම බහිරව පූජාවක් තියන්නත් ලෑස්ති කලා........" මව කීවේ
බියෙනි.

"නෑ අම්මි, ඔයා බයවෙන්න එපා......... තැකැත් වෙලාවට අපි ලණු අදිනවා......... ඊට කලින්නේ අම්මි බහිරව පූජාව තියන්න හැදුවෙ?" සඳරු එක් වරම කිවාය.

"ඔව් තව දවස් දෙකකින්......... බ්‍රහස්පතින්දා........."

"ඒ කියන්නෙ ඉන් අනිද්දා. හරි අම්මි එදාට බහිරව පූජාව කරන්න ගුරුන්නාන්සේට කථා කරන්න. එදාටම අපි ඩෝසර් කරන වැඩත් කරනවා" ඇය කියද්දී,

"මාර එකක්......... ඔය කියන විදියට වත්තෙ මිනිස්සු තමයි මම හිතන්නෙ තමන් විහින්ම ගෙවල් කඩලා ටකරන් එහෙම ගෙනත් එක තැනකට ගොඩ ගහනවා ඇත්තේ" මනුෂි කීවේ සෝපහාසයෙනි. සැම දෙනම ඇය දෙස බැලුවේ ඇය කියන්නේ ඇත්තක් නොවේ පවසන බැල්මෙනි.

"සමහරවිට ඒකත් වෙන්න පුළුවන්......... කොහොම උණත් තාත්ති, අපි බ්‍රහස්පතින්දා උදේ ඩෝසර් කරනවා" සඳරු සියයට සීයක් ස්ථිර වූ කටහඬින් කියද්දී සැම දෙනම ඇය දෙස හැරී බැලුවේ ඇය දැනගෙන කතා කරනවාදැයි සිතමිනි. නෙත්න හා මනුෂි වෙන වෙනස් වූ බැල්මකින් ඇය දෙස බලද්දී මනුෂිගේ මුහුණේ වූයේ දරුණු උපහාසයයි. එහෙත් නෙත්න ඇය දෙස බලා උන්නේ ඇය ඊළඟට කුමක් කරන්නට සැරසෙන්නේදැයි සිතන්නා වැනි බැල්මකි.

සඳරු පියුමිගේ මුහුණ බලා උඩට යන බව පවසා යන්න ගියේ පවුලේ අයට අවශ්‍ය දෙයක් කථා කරගන්නට ඉඩ සලසන අටියෙනි. එහෙත් ඇය උඩට ගියේ කම්පා වූ සිතිනි. රොෂාන් තව ටිකකින් ආ පසු ආයෙමත් මුදල් ප්‍රශ්නය ගැන විමසනු ඇත......... නෙත්න සිටිනා තත්ත්වය අනුව ඔහුට බොරුවක් කිවද රොෂාන්ට එවැනි දෙයක් කිව නොහැක......... කිව හැකි එකම දෙය තිවසේ අවශ්‍යතාවයකට දුන් බවයි.

නෙත්න කාමරයට ගියේ නොයෙක් කල්පනාවල පැටලෙමිනි......... තමා එදා සඳරුට එතරම් තද පරුෂ ලෙස බනිද්දී ඇයට කම්මුල් පහර කිපයක්ම ගසද්දී ඇය එතරම් නිහඬ වූයේ මන්ද......... අනෙක තම පියා සඳරුට විරුද්ධව එකම වදනක් කථා කරන්නට ඉඩ නොදෙන්නේ මන්ද......... එතරමම ඇය ගැන පියාට ඇති විශ්වාසය කුමක්ද......... අනෙක වෙනදා නම් මෙවැනි දෙයක් තමා කළා නම් ඇය හඬමින් වැළපෙමින් කාලය ගත කරන්නීය. එහෙත් ඇය එදා සිදුවීම අමතක කළා සේ ඇයගේ සුපුරුදු කාර්යයන්හි යෙදෙයි. එසේ වෙන්නට හේතුව කුමක්ද......... තමා හා උරණ නොවන්නට ඇයට සිතුණේ ඇයිද......... තමා එතරම් රලු පරුෂ ලෙස ඇයට කෙදිනක වත් සලකා නොමැත......... එහෙත් ඇය මෙලෙස සාමාන්‍ය ලෙස හැසිරීමට හේතුව කුමක්ද......... අද වුව ඇයගේ මුහුණේ වූයේ වේදනාවට වඩා ප්‍රශ්නවලට මුහුණ දීමේ ඕනෑ කමයි......... ඒ ශක්තිය මෙතරම් ගැටලු අස්සේ ඇයට ආවේ කෙසේද.........

තමාට වැරදුණාද......... තමා දුටු දේවල් සිතූ දේවල් කොටින්ම ඇයගෙන්ම ඇසූ දේවල් පවා රැවටීමක්ද......... ඇය තමාගේ අවධානය බැරිදි තැනකට යොමු කොට කුමන හෝ ප්‍රශ්නයක් වසන් කළාද......... ඇයගේ වැඩ එසේය. තමනට දැන්වීමට නොපුදුසු යමක් වෙද්දී ඇය එලෙස ක්‍රියා කරන්නීය. බොහෝ ගැටලු......... මෙම ව්‍යාපාර කටයුතුවලට ආ බොහෝ ගැටලුවලට ඇය මුහුණ දුන්නේ තනිවමය. තමාට අවබෝධ කරගන්නට බැරි වූවාට තම පියාගේ විචක්ෂණ නුවණට ඇයගේ තියුණු බුද්ධියේ ඉව දැනී ඇත. ඒ නිසාම පියා ඇයගේ කටයුතු ඇයට රිසිසේ කරන්නට ඉඩ සලසයි. මේ වන විට තම සමූහ ව්‍යාපාරය ඉතා දියුණු මට්ටමකට පැමිණ ඇත. දැන් මේ වසර එකහමාරක පමණ කාලයේ ඇය ඒ දියුණුව උදෙසා විශාල කාර්යභාරයක් ඉටුකළ බව පියා දන්නා නිසාම......... මේ ව්‍යාපාරය නම් සුදු ක්‍රීඩාවේ නිවැරදි ඉත්තන් තෝරා ගැනීමට ගැහැනියකගේ මෘදු බව සමග යන සියලු ඉව, ප්‍රයෝජනයට ගෙන ක්‍රීඩා කිරීමට, පියා ඇයට නිදහස දී ඇතුවා මෙනි. විශ්වවිද්‍යාලයේ ඇය ලබන ව්‍යාපාර සම්බන්ධ නව දැනුම ඇය න්‍යායිකව හා ප්‍රයෝගිකව අපූරුවට යොදවන අයුරු වසර විසිපහකටත් වැඩි දීර්ඝකාලීන අත්දැකීම් ඇති පියාට තමනට වඩා වැටහෙනවා ඇත......... කෙසේ වුවද එදින රංඩුවෙන් පසු පළමු වරට ඇයට ගැසීම ගැන දුකක් වැනි හැඟීමක් නෙත්නගේ සිතේ පහළ විය.

ආහාර ගෙන කාමරයට ආ රොෂාන් සඳරු දෙස බලා යමක් විමසන්නට මෙන් හදනු දුටු සඳරු ඔහුට පෙරම කථා කළාය.

"මම දන්නවා රොෂාන් අහන්න හදන දේ......... සල්ලි මම ගත්තේ ඇයි කියන එක"

"ඇත්තටම ඔයාගේ හස්බන්ඩ් විදියට මට අහන්න අයිතියක් තිබුණත් අපේ සම්බන්ධතාවය අපි දෙන්නම දන්න නිසා මම මේක

ඔයාගෙන් අහන්නේ අයිතියෙන් නම් නෙවි. මට කියන්න කැමති නම් කියන්න ඔයාගෙ යාළුවෙක් විදියට හරි......... මොකද මේ සල්ලි ගත්තේ කියලා. ඇත්තටම මට තියෙන ලොකුම පුදුමෙ මේක විතරයි. මෙච්චර කල් අපේ මේ අල්මාරියෙ සල්ලි කුට්ටි ගහලා තියෙද්දි ඒවා ඇල්ලුවෙ නැති ඔයා ඇයි එකපාරම ලක්ෂ පනහක් ගත්තේ කියලා........."

"මට ගෙදරට සල්ලි දෙන්න ඕන උණා........." ඇය බිම බලාගෙන කීවේ ඔහු මුහුණ බලාගෙන බොරුවක් කියන්නට නොහැකි බැවිනි. එයට සිනාසුණ රොෂාන්........."

"ලක්ෂ පනහක්......... ඔයාගෙ ගෙදරට දෙන්න......... නෑ සඳරු ඒ බොරුව හරිම මෝඩ වැඩියි. ඊට ටිකක් ගැඹුරු හේතුවක් කියන්න......... මට ඒකවත් පිළිගන්න පුළුවන් බලන්න........." යි කියමින් ඇය වෙතට පැමිණ නිකටෙන් අල්ලා ඇයගේ මුහුණ තමා දෙසට හැරවීය. ඒ ඇසේ වූ ලොකු කඳුළු ගුලි ඔහුට පෙනිණ.

"ඇයි මේ අඬන්නේ......... මම බැන්නද......... ගැහුවද......... මම කීවේ කැමති නම් යාලුවෙක් විදියට කියන්න කියලා. කියපු දෙයින් පේනවා මොකක් හරි හේතුවක් නිසා මට ඒක කියන්න බැරි තරමට ඔයා අසරණයි කියලා. ඉතිං මම අහන්නේ නෑ වදකර කර......... අඬන්න එපා ඒ නිසා" රොෂාන් කියද්දී සඳරු හඬාගෙන ඔහු පාමුල වැටුණාය.

"අනේ රොෂාන්......... මාව අවිස්වාස කරන්න එපා......... මගේ වැරදි සම්බන්ධයක් නිසා වත් ඒ වගේ දෙයක් ආරක්ෂා කරගන්නවත් මම මේ සල්ලි පාවිච්චි කළේ නෑ......... කොටින්ම මගේ දේකට පාවිච්චි කළේ නෑ......... මාව විශ්වාස කරන්න......... ඒත් මම ඒ සල්ලි ගත්තා......... ඒක පාවිච්චි කළා......... ඒත් ඒ ඇයි කියලා ඔයාට කියන්න මට බෑ........." ඇය ඉකි ගසමින් කියද්දී ඇය කියන්නේ සැබෑවක් බව හොඳටම වැටහෙන රොෂාන්ගේ සිත ඇය ගැන උණු වී ගියේය. ඔහු ඇයව අතින් අල්ලා නැගිටුවා ගත්තේය.

"ඔයා මගේ ළඟ මෙහෙම දණින් වැටිලා අඬන්න ඕනෙ නෑ සඳරු. ඔයාගෙ වෙන අපෙයාර් එකක් තිබිලා ඒ වගේ කෙනෙකුට සල්ලි දුන්නත්......... ඇත්තටම මට අහන්න දෙයක් නෑ......... ඔයාගෙ හොඳ කමට ඔයා මා මත්තෙ වැටිලා හිටියට මම ඔයාට මොනවා දීලද? ආ දවසෙ ඉඳලා දැන් කී පාරක් ඔයා මගේ කකුල් දෙක ළඟ වැටිලා ඇඬුවද ඇයි මම ඔයාව මෙහෙම සලකන්නේ කියලා අහලා



......... ඒත් මම ඔයාට අද වෙනකල් උත්තර දුන්නෙ නෑ......... මම දන්නවා සමහර අවස්ථා එනවා කෙනෙකුට තව කෙනෙක්ට කොච්චර රිද්දලා උණත් රහස් ආරක්ෂා කරන්න වෙන. මූණ බලාගෙන කියන්න බැරි කමට හරි, අහන කෙනා අමාරුවේ වැටෙයි කියන බයට කියන්න බැරිව හරි තියෙන රහස් තියෙනවා. මට වෙලාවකට හිතෙනවා අපේ ගෙදරම දෙයක් වෙනුවෙන් ඔයා ඒ සල්ලි යට කළාද කියලා......... ඒත් අපේ ප්‍රතිචාර වැරදි වෙයි කියලා බයට ඔයා මේ ප්‍රශ්නෙ අපිට නොකියනවා. ඒ කොහොම උණත්......... මට මේ සල්ලි ගැන ගාණක් නෑ......... ඒක ඔයා කාට කොහොම පාවිච්චි කළත්......... ඒ ඔයාගේ කැමැත්ත......... මට දුක ඒ නිසා අද අපේ ගෙදර ඇඟිලි ආයෙ ඔයා දිහාට වැරදි විදියට දික් වෙච්ච එක ......... මම දන්නවා මහුම් දැන් හැම තැනම කියලා ඇති ඔයා සල්ලි අරන් කියලා......... ඒවා ඔයාට හොඳ නෑ........."

"කරන්න දෙයක් නෑ රොෂාන්......... මම මේ රහස රැකගන්න පොරොන්දු වෙලා තියෙන නිසා ඒ වෙනුවෙන් වෙන පාඩු මට දරාගන්න වෙනවා......... ඒත් ඔයා මා ගැන සැක කරන්න එපා" ඇය හඬමින් කීවාය.

"මම වගේ කිසිම වටිනාකමක් නැති මිනිහෙකුට මේ ලස්සන ඇස් දෙකෙන් කඳුළු හලන්න එපා......... මේවා තියා ගන්න කවදා හරි ඔයාට ඇත්තටම ආදරය කරන කෙනෙක් වෙනුවෙන් හලන්න........." එසේ කියූ රොෂාන් ඇයගේ ඇස පිසදමද්දී දුක දරාගත නොහැකි වූ සඳරු රොෂාන් වැළඳගෙන හැඬුවාය. රොෂාන්ගේ හදවත වේගයෙන් ගැහෙන්නට වූයේ මේ වැළඳගැනීමෙනි. ඇයගේ සුවඳ......... ස්පර්ශය තමා මේ තරම් ළඟින් වෙන කිසි දිනක විඳ නැත......... නැත......... නැත......... මෙය නොවිය යුත්තකි. ඇයගේ නොයිඳුල් බව තමාගේ පහසින් හෝ ඉඳුල් නොවිය යුතුය. ඔහු හෙමිහිට ඇයගේ හිස මත අත තැබීය. රොෂාන්ගේ දෙනෙතින් කඳුළු කඩා හැළුණේ බොහෝ කලකට පසුය. මේ ළඳ බොළඳ සුකොමල යුවතිය තම ආත්මයම......... තමා යකඩ සේ ශක්තිමත් කරගන්නට උත්සාහ දරන ආත්මයම හොල්ලා දමන බව රොෂාන්ට වැටහිණ. මත්පැන් බොමින් තමා නිවෙසේ පවා බඩු බිඳ දමමින් නිතර උත්සාහ කළේ යම් කිසි ප්‍රතිරූපයක් සාදා ගැනීමටය. අනෙක් අය ඉදිරියේ තමා සාදා ගත් ඒ ප්‍රතිරූපය මේ සුකොමල මුදු බව හමුවේ කැඩී බිඳී යන්නට වෙර දරන බව ඔහුට වැටහිණ. එහෙත්

තමා ඇයට ආදරේ නම් කළයුතු තමාගෙන් ඇය ඈත් කිරීමය. හැකි තමා ඇයට ආදරේ නම් කළයුතු තමාගෙන් ඇය ඈත් කිරීමය. හැකි තරම ඈත් කිරීමය. ඇය දැනටම ආදරය කරන හෝ ඇයට ආදරය කරන කිසිවෙකු මෙලොව වෙසේ නම් ඇය ඔහුට හිමි විය යුතුය......... රොෂාන්ට එක්වරම තම සොයුරා සිහිපත් විය......... ඔහු සඳරුට ආදරය කරන බව තම සිත කියන්නේ ඇයි......... එදා කෑම මේසයේදී තමා කළ දේ දුටු නෙත්න වෙනස් වූ තරම......... සඳරු වුව ඒ ආදරය දන්නවා යැයි ඔහුට සිතිණ......... දන්නවා වුව තමා නිසා ඇය සිත සිරකරගෙන සිටිනවා විය යුතුය......... එහෙත් එවන් බැඳීමක් තිබුණද ඔවුනට එය සපල කරගන්නට ඉඩ ලැබේද? නෙත්න නියති හා විවාහ වීමට සිටියි. අනෙක් අතට තමාගේ බිරිඳ නෙත්නටත් දීමට දෙමාපියන් සිතද්ද? තමා මෙය හරියටම දැනගත්තේ කෙසේද......... ඔවුන් දෙදෙනා එකිනෙකාට ආදරේ කරන බව ස්ථිර වශයෙන්ම දැනගත යුතුය.

පසුවදා උදේ ඉඩමට යාමට රොෂාන්, අවන්ත, නෙත්න ආදි සැම දෙනාම පිටත්ව ගියෙන් සඳරු පියාද සමග පසුව පිටත් වී ගියාය. අනෙක් අය එහි ගොස් ලයනල් හා කථා කිරීමට හැදුවද ඒ කිසිවක් ලයනල් මායිම් කළේ නැත. රොෂාන්ට තරහ ගොස් ලයනල්ට ගහන්නට හදද්දී සොයුරා පසෙකට කළ නෙත්න අඩුම වශයෙන් ලක්ෂ පනහක් හෝ භාරගන්නා ලෙස පැවසීය.

"කතා එපා සර්......... කෝටි දෙකෙන් රුපියල රුපියල අඩු කරන්න නිකන් දඟලන්න එපා" ඔහු කීවේය. මේ අතරේ පියාට අනෙක් අය හා ඉන්නට කී සඳරු ලයනල්ගේ නිවසට ගියාය.

"ආ......... නෝනා......... එන්න එන්න වාඩි වෙන්න"

"මම ආවෙ වාඩිවෙන්න නෙවි ලයනල්......... ලයනල් කියන දේ දැනගන්න"

"මම කියන දේ කීපාරක් කිවාද නෝනා......... මගේ ළඟ කේවෙල් නෑ......... අඩුකිරිලි නෑ......... කරුණාකරලා කෝටි දෙක දෙන්න කියන්න පවුලෙ අයට. එතකොට මම යන්නම්"

"මෙ අහන්න ලයනල්......... ඔයාලා මේකෙ පදිංචි වෙලා ඉන්නේ අනවසරයෙන්. කලින් හිට හිටියත් දැන් අපි තමා මේ ඉඩමේ අයිතිකාරයෝ. එහෙව් එකේ ඔයාලා යවන්න ඇත්තටම අපිට මේ තරම් වැඳලා කියන්න ඕන නෑ......... සල්ලි දෙන්න ඕනත් නෑ.........



පොලිසි ගියානම් නඩු ගියා නම් මේක අපිට පක්ෂව විසඳෙනවා. ඒත් එච්චර කල් අපිට ඉන්න බෑ අපේ වැඩ තියන නිසා. අන්න ඒ ගැන හිතලා තමා එක පවුලකට රුපියල් ලක්ෂෙ ගානේ දෙන්න අපි කිවේ......... ඉතිං එහෙම කියද්දිත් ලයනල් ඒක එපා කියනවා නම් අපිත් කියන්නෙ අපි මේ බුහස්පතින්දා මේක ඩෝසර් කරනවා කියලා"

"හරි නෝනෙ කරන්නකෝ. මමත් බලන්නම් කොහොමද කරන හැටි කියලා" මීට වැඩිය දොඩන්න දෙයක් නෑ නෝනා. නෝනා යන්න ගිහින් කියන්න පවුලෙ අයට මගේ තීරණය මේකයි කියලා........."

"මටත් නෑ මීට වැඩිය දෙයක් කියන්න......... හැබැයි හොඳට කල්පනා කරල බලන්න ලයනල්......... පස්සට පසු තැවෙන්න වේවි........."

"මේ ලයනල්.........??" ඔහු සිනාසුණේය. "ඒක වෙන්න බෑ නෝනා" එසේ කී ඔහු ටීපෝව මත කකුල් තබා ඔළුවේ පිටුපස අත්දෙක තබා පුටුවටම හේත්තු විය. සඳරු නැගිට්ටාය. තවත් මේ මිනිසා හා කළ යුතු කථාවක් නැති බව ඇයට වැටහිණ. ඇය එළියට බැස්සාය. කවුරුත් ඇය එන පෙර මග බලා උන්නෝය. ඇය එනතෙක් අසල සිටි අවන්ත ඇය වෙත ආවේය.

"මොකද සඳරු උණේ.........?"

"වැඩක් නෑ අයියේ......... ඒ මිනිහා එක්ක කථා කරලා........." ඇය කීවේ තොල පිට පෙරලමිනි. එහෙත් එයින් කේන්ති ආවේ එතැන සිටි නෙත්නටය. එය ලයනල් ගැන සේම සඳරු ගැන ද වූවක් විය. අනිද්දා ඩෝසර් කරන බවට ලොකු කථාවක් කී ඇය මෙතනට පැමිණ දැන් තොල පිට පෙරලන්නීය.

"ඔය බම්බු කතා ඕන නෑ. ඔය යකාගෙ කම්මුල රත්වෙන්න දෙකක් දුන්නා නම්" එසේ කියමින් නෙත්න එහි යාමට පියවරක් තබත්ම,

"මිනිස්සුන්ගේ කම්මුලට ගහලා ප්‍රශ්න විසඳන්න පුළුවන්නම් මේ ලෝකෙට වෙන කිසිම දෙයක් ඕන නෑ......... අනුන්ගෙ කම්මුල් පාර කාලා වෙන කෙනෙක් සද්ද නැතිව හිටියත් මේ වගේ කෙනෙක් එහෙම ඉන්නෙ නෑ......... මේ තුට්ටු දෙකේ මිනිහෙක් නිකම් හරි අත ඉස්සුවොත් අපේ තත්ත්වෙට මොකද වෙන්නෙ කියලා හිතලා බලලම ගියා නම් වඩා හොඳයි........." සඳරු කීවේ අණදෙන්නියක මෙනි. ඒ හඬින් නෙත්න විලංගු වූ කලක මෙන් නැවතෙද්දී අත්

අයද එය අනුමත කළෝය. විශේෂයෙන්ම පියා එය අනුමත කළේය.

"ඒක හරි......... සඳු දුව කියන්න වගේ ඒ යකා නිකම් හරි ඔයාට අත ඉස්සුවොත් මේ ප්‍රශ්නෙ මෙතනින් නෙවී නතර වෙන්නේ......... ලොකු හර්තාල් එකක් වෙලා.........ඒක නිසා අපිට මේ ප්‍රශ්නෙ ගහලා බැනලා විසඳගන්න උත්සාහ කරන්න බෑ......... ඊට වැඩිය සියුම් විදියකට ඕන විසඳන්න........" පියා කියද්දී නෙත්න යටි තොලේ කොනක් සපාගෙන ඉවත බලන අතරේම සඳරු දෙස ද බැලුවද ඇය තමා දෙසවත් හැරී නොබැලූ බව නෙත්නට වැටහිණ.

......... මේ වෙලාවෙ මට මෙයාට කියන්න උත්තර හැටක් විතර එනවා......... ඒත් කියාගන්න විදියක් නෑ.........

ආපසු කාර්යාලයට ගිය සඳරු එහි ලිපි ලේඛන කටයුතු නිමවා ජයතුංගට කියා නගරයේ ත්‍රීරෝද රථ ගාලේ ඇයව බස්සවා ගත්තාය. ඔහුට යන්න කී ඇය සවස කැම්පස් එක ළගට එන්නට පවසා එතැන වූ ත්‍රීරෝද රථයකට නැංගාය.

"අතුරණට" යි කියූ ඈ හෙමිහිට දෑස් පියා ගත්තී නෙත්නගේ තරහින් පිරී ගිය මුහුණ මනසේ මවා ගත්තාය. ......... මොන පුදුමෙකටද දන්නෙ නෑ ආවේගෙ අතුරුදන් උණේ......... කම්මුල් පාර ගැන කිව්වම මල පනින්න ඇති......... කමක් නෑ......... ඔන්න ඔහේ තරහෙන් පුපුර හරි ඔහොම ඉන්න එක හොඳයි......... දැන් බලන කොට රොෂාන් කොච්චර හොඳද......... මෙයානේ වැඩේ. ඔය මා එක්ක තියන තරහට තමා මොන මොනවා හරි කරන්නේ......... මට රිදෙන්න.........

සඳරු අජිත්ගේ නිවසට ගොස් ඔහු සිටිනවා දැයි අසද්දී එළියේ සිටියේ පෙර දිනවල දැක නොපුරුදු කොල්ලක් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනා ඇයගේ ඉහේ සිට පාදාන්තය තෙක් බලා,

"ඇයි මොකටද?" යි සැරෙන් ඇසුවේය.

"මට මූණ ගැහෙන්න ඕන......... කියන්න සඳරු ඇවිත් කියලා" එසේ කී ඇය එළියේ සිටිද්දී අජිත් වහ වහා එළියට ආවේය,

"නෝනා......... නෝනා මේ වෙලාවේ......... මගේම කෙනෙක් දැක්කා වගේ තමා......... මේ මොට්ටයො දෙන්නා නෝනව එළියෙ තිබ්බා නේද......... යමු යමු ඇතුළට. මුන් දෙන්නා නෝනව දන්නේ නෑනේ........." යි කීවේය.

"ඒකට කමක් නෑ අජිත් අයියේ......... මම ආවේ අයියගෙන් උදව්වක් ඉල්ලගෙන"





"උදව්වක්......... මේ මගෙන්......... කියන්න නෝනා........." ඔහු කියද්දී ඇය සියලුම කථාව අජිත් සමග පැවසුවාය. සියල්ල සන්සුන්ව අසා සිටි ඔහු ගෝලයකු අමතා,

"ඒයි නාමල්......... කවුද බං මේ ලයනල්......... උඹලා දන්නවද?" යි ඇසුවේ කල්පනා කරමිනි.

"නෑ අජිත් අයියා, අපේ ස්කෑන්වලට අහුවෙච්ච එකෙක් නෙවී ......... නිකං පනුවෙක් වෙන්න ඇති........."

"ඒ උණත් ඌ පනුවා උණාට ලොකු නයෙක් වගේනේ වැඩ කරලා තියෙන්නේ......... බලමු......... නෝනා මම කියන්නද මිනිහා කව්රු උණත් මම යනවා දැන් හම්බ වෙන්න. පොරගෙ උත්තරෙත් අරන් මම හෙට උදේ නෝනාගේ ඔෆිස් එකට ආවොත් මොකද ඒක නෝනාට ප්‍රශ්නයක්ද?"

"අනේ නෑ අජිත් අයියේ......... අයියා පාතාල මිනිහෙක්, මිනීමරුවෙක්, ආමරිකයෙක් වෙන්න පුළුවන්......... ඒත් අයියා මාව දැක්ක වෙලේ හිට මට සැලකුවේ මේ ලෝකෙ ගොඩක් අය ළඟ නැති ගැනු අයට ගරු කරන්න ඕන කියන හැඟීමෙන්......... ලොකු සමාජේ පුහු මිනිස්සු ළඟ නැති......... ඒත් අයියා ළඟ තියන ඒ ගති ගුණේට, අයියගෙ අවංකකමට මම හරි ආසයි. මොකද මම නිතරම හොඳ ගතිගුණ අගය කරන නිසා......... රටේ ලෝකෙට අයියා කවුරු උණත්......... මට අයියාව පේන්නේ මගේ ගෞරවය ලබන්න ඕන කෙනෙක් විදියට, වැඩිහිටියෙක් විදියට. මම තාම ලෝකය අඳුනාගන්න කෙනෙක් විදියට මට අයියගෙනුත් ගන්න ආදර්ශ ගොඩක් තියනවා......... ඒක අතකට අයියලා වගේ ආමරිකයො නගරෙට එක්කෙනා ගානෙ ඉන්නවා නම් අයුක්තිය අසාධාරණේ ස්ත්‍රී දූෂණ අපේ රටෙන් තුරන් වෙලා යාවි කියලා මම දන්නවා. ඒක නිසා අයියට ඕනම වෙලාවක හෙට උදේ වරුවෙ......... මොකද හවසට මම කැම්පස් යනවා, අයියා එන්න........."

"හොඳයි නෝනා......... එහෙනම් මම හෙට මූණ ගැහෙන්නම්........."

"බොහොම ස්තූතියි අයියා......... මම ගිහින් එන්නම්........."

"ඇත් දවස් තුනක්ම ආවා නෝනා මොකුත්ම බීවේ නෑ........."

"අයියේ මට ඇත් ලෙක්චර්ස් වලට පරක්කුයි......... ඊළඟට එන දවසේ අනිවාර්යයෙන්ම මට තේ එකක් දෙන්න......... මම ගිහින් එන්නම්"

"හොඳයි"

# 37

පසු දිනයේ එනම් බදාදා දහවල් එකොළහට පමණ නුවර නගරයම හොල්ලාගෙන සිටින පාතාල නායක අජිත් හා ගෝලයින් දෙදෙනෙකු කළු පැහැති ප්‍රාඩෝ ජීප් රථයෙන් බැස වික්‍රමසේකර සමූහ ව්‍යාපාරයේ සුවිශාල බිල්ඩිමේ ප්‍රධාන දොරටුවෙන් ඇතුල් වී විදුලි සෝපානයට යනු දුටු බොහෝ දෙනා බයෙන් ත්‍රස්තවූහ........ ඔහු එහි හයවන තට්ටුවෙන් එළියට විත් ප්‍රධාන කාර්යාලය දිගේ සඳරුගේ කාමරයට වෙත යද්දී ඔහු හඳුනාගත් බොහෝ දෙනා බියෙන් හැකිලී ගියෙන් එක්වරම නැගිට ගත්තේය. මීළඟට සිදුවන්නේ කුමක්දැයි හැමදෙනම උඩට ගත් හුස්ම පහතට නොහෙලා බලා උන්නද කිසිවක්ම සිදු නොවිණ.

සඳරුගේ මේසය ඉදිරිපස පුටුවේ අජිත් වාඩිවෙද්දී අනෙක් දෙදෙන දෙපැත්තෙන් ඔහු අසල මුරට සිටියේය.

"ඉතිං අජිත් අයියේ මොකද උණේ?"

"නෝනා මම නෝනා ගිය ගමන්ම ගියා........ ලයනල් කියන එකා හම්බ උණා........ කතා කළා........ ඒත් මූ එක්ක මේ කතා ගරියන්නේ නැති පාටයි........" ඔහු කීවේ අර්ථාන්විතව හිස වනමිනි.

"ඒ කියන්නේ........" සඳරු කුතුහලයෙන් මෙන් ප්‍රශ්න කළේය.

"ඒ කියන්නේ නෝනා........ ෆිනිෂ් කරන්න ඕන. දිව්‍යලෝකේ බිල්ඩින් එකක් ගහගන්න ඉඩ දෙන්න ඕන" අනෙකා කියද්දී බිය පත් වූ සඳරු........

"ම........ම........මරන්න........?? නෑ........නෑ........ එහෙම නෙවි" යි කීවේ ඇඩි බියකිනි.

"වෙන විදියක් නෑ මූ එක්ක" අජිත් පැවසීය.

"එහෙම නෙවී අයියේ........ අපි මෙහෙම කරමු........" එසේ කියා සඳරු ඔහුට කළයුතු සියල්ල පැවසුවාය. එයට හිස වනා කැමැත්ත පළ කොට,



"හොඳයි නෝනා කියන නිසා එහෙම කරමු........බැරි උණොත් ........?"

"නෑ නෑ........ ඔය විදිය අයියට හරි ලේසියි........ මම දැන් අයියට සල්ලි අරන් දෙන්නම්................ අයියා කවුරු හරි අතේ යවන්න මෙ චෙක් එක බැංකුවට........" කියමින් චෙක් පොත ගෙන රුපියල් ලක්ෂ හතලිහක චෙක් එකක් ලියා අත්සන් කළාය.

එය රැගත් අජිත් ලියුම් කවරය ගෝලයා අතට දී සඳරුගෙන් සමුගෙන යන්නට ගියේය. එහෙත් ඒ වනවිට පාතාල නායක අජිත් සඳරු හමුවෙන්නට ආ බව, කථා කරමින් සිටි බව සෑම තැනම කථා වෙන්නට විය. නෙත්නට ඒ කථාව ඇසීමෙන් පුදුමය යන්න අරුත් දක්වන ප්‍රතිරූපයක් ආකෘතියක් බවට පත්විය. Amazing........ under world රාජා වෙච්ච අජිත් මෙ හොටු කෙල්ලක් වැනි සඳරුගේ කාමරයේ ........ ඒ කුමකටද........ අනෙක ටික වේලාවක් කථා කරමින් සිට ගොස් ඇත........ දැන් දැන් නම් මෙයා කරනා දේවල් ඉවසා සිටිය නොහැකි යැයි ඔහු සිත පැවසුවේය.

මෙ ගැන ඇසූ පියාද පුදුමයට පත් වී සඳරුට ඒ මොහොතේම කථා කළේය.

"තාත්ති........ මේ ගැන බයවෙන්න එපා. මම හොඳට හිතලා මේ දේ කළේ........ ලයනල් කියන්නේ අපේ අණට කීකරු නැති පාතාල නායකයෙක්. අපි කියන දෙයක් මායිම් නොකරන එකෙක්. විස නසන්න ඕන විසකින්මයි. මම ඉතිං දුඹුරු පාට වහන්න කළුපාට තෝරගත්තා සේරටම වැඩිය තදපාට........ කළු පාට නිසා........ අනෙත් එක මේ කළු පාට ගැන තාත්ති හිතන්න එපා. මම සල්ලිත් ගත්තා........"

"ඔයා හරි ප්‍රවේශමෙන් සඳරු........ බොහොම ප්‍රවේශමෙන්........"

"අපිට වෙන විකල්පයක් නෑ තාත්ති........ හෙට බලමු"

"හොඳයි........"

එදින නිවසට ආ මොහොතේ සිට මනූෂිගේ ඇනුම් පදවලට ඉවරයක් නැති ලෙස මුහුණ දෙන්නට සඳරුට සිදුවිය. හෙට දිනයේ තමා ලබන පරාජය ගැන ඇය බලා සිටියේය. පවුලේ, ව්‍යාපාරයේ දියුණුවටද වඩා එයින් තමා පරාජය වන්නේ නම් ඒ සතුට වඩා වැඩි බව ඇයගේ වචනවලින් සඳරුට වැටහිණ.

"දැන් ඔය කථාව නවත්තන්න මනූෂි........ මේක සඳරුගෙ වැඩක් නෙවි. පොදුවෙ බිස්නස් වැඩක්........ ඇයි ඔයා ඔය තරම් කලබලෙන්

අදින කතා කියන්නේ......... අනෙත් එක ඒක තාත්තියි සඳරුයි බලා ගනීවි. අපිට කියපු විදියට අපි බහිරව පූජාවෙ බඩු ටික හරිද බලමු" මව කීවේ මනුෂිගේ මුව වැසීමටය.

"ඒක නෙවි මනුෂි ඔයා මුල්ගල් තියන උත්සවේට එන්න කියලා යාළුවන්ට කිව්ද?"

"නෑ රිද්මි අක්කි......... මට බෑ සවුත්තු වෙන්න......... ඕවා මෙ නැකතට නෙවි තව පෝය ගානක නැකැත්වලට කෙරෙන්නෙ නෑ ......... ඒ නිසා මම කීවේ නෑ"

"හරි හරි ඔයා නොකිවට අපි නම් අපේ අයට ඔන්න කිව්වා........."

නෙත්න හා පියුමි බැල්කනියට වී කථාවෙමින් සිටියේද හෙට දිනය පිළිබඳවය. ඒ මොහොතේ පියුමි සොයා ගෙන එහි ආ සඳරු නෙත්න එහි සිටිනු දැක යළි කාමරයට ගියාය.

"තාම තද වෙලා නේද නෙත්න.........?"

"ආපෝ කොහොමත් මා එක්ක ජීවිත කාලෙම උණත් කථා නොකර ඉන්න ගෑනි කැමතියිනේ......... මට වෙන රස්සාවක් හොයලා දෙන්න පුළුවන් නම් ඒකත් කරයි දුර පළාතකට යවන්න........."

"නෙත්න, පව් අනේ එපා ඔය තරමට බනින්න. කොච්චර දුකක් හංගගෙනද ඔය ඉන්නේ........."

"මම ඉද්දි මොනාටද ඔය දුක් හංගන්නේ......... මට කියන්න එපැයි"

"යකා වගේ කේන්ති ගන්නවනේ........."

"එහෙම තමා නොකියන කොට"

පසුදින උදෑසනම නිවසේ සියල්ලන්ම වැඩ බිමට ගියහ......... කාර්යාලවල වැඩකරන කමල්, ප්‍රියලාල් නුවන් ආදී සැහෙන දෙනෙකුද එහි විය. වැඩ ආරම්භ කිරීම සඳහා කැඳවන ලද කම්කරුවන්ද, ඩෝසර් ක්‍රියාකරවන්නන්ද එහි විය.

සඳරු කියූ විලස පියා විසින් ඩෝසර් ක්‍රියාකරවන්නන්ට උපදෙස් දුන්නෙන් එතැන වූ ඉස්කෝප්පයක් අතට ගත් ලයනල් කෑ ගසන්නට වූහ.

"එකෙක් හෙල්ලෙන්න එපා......... අපි කිව්වා කෝටි දෙකක් දෙනකල් මේකෙ එක ගහක් ගලක් ගලවන්න ඉඩ දෙන්නේ නෑ කියලා......... අපි අද මරාගෙන මැරෙනවා........." එසේ කියූ ඔහු





ඔහුගේ පිටුපස රැස්වී සිටින වත්තේ නිවාසවල වෙසෙන වැසියන් දෙස බලා.

"ඒයි උඹලා මොනවද බලා ඉන්නේ වරෙල්ලා......... ගහපල්ලා ඩෝසර් කුඩු කැලි යන්න......... පොඩිකර පල්ලා මේ වාහන" යනුවෙන් කියමින් අත පය විසිකලද කිසිවකු නොඑනු දැක, "මොකද උඹලා මූන්ට බයේද......... එකෙක් බයවෙන්න එපා......... ගහපල්ලා" යනුවෙන් යළිත් ගිරිය පුප්පාගෙන කෑ ගසන්නට විය. එහෙත් ඔහුගේ අණට කීකරු වන කිසිවෙකු එතැන නොවූයෙන් පුදුම වූ ඔහු උඹලා බලන් ඉන්නේ මම ගහනකල්ද......... වරෙල්ලා" කියමින් දිව එද්දී පිටුපස සිටි සෙනඟ අතරේ හිඳ එළියට ආ අජිත් හා ගෝලයෝ එක්වරම ඔහුගේ කමිසයෙන් අල්ලා ගත්තේය.

"උඹ කවුද, මේ බෙල්ල හිරවෙච්ච කුකුලෙක් වගේ කෑ ගහන......... දන්නවා නේද මම කවුද කියලා........."

"මම දන්නවා......... අජිත් අයියා......... මහලොකු චණ්ඩියා උණාට මට වැඩක් නෑ......... අපේ කෝටි දෙක අපට ඕන. ඒයි වරෙල්ලා......... මොකද උඹලා මෙයාට බයේද......... බයවෙන්න එපා මම ඉන්නවා වරෙල්ලා" කියමින් වටපිට බැලුවද කිසිවෙකු නොඑනු දැක පුදුම විය. ඔහු දෙනෙත් ලොකු කොට අවට බලද්දී එතැනට ඇත බැඳගෙන සඳරු හෙම්හිට ගියාය.

"මාර......... පව්......... කව්රුත් එන්නෙ නෑ වගෙයි නේද.........?" ඔහු ඇය දෙස බැලීය.

"එන්නෙ නෑ 'වගේ නෙවි' නෝනා......... එන්නෙ නෑ......... මූ දන්නේ නෑ තාම ඒක........."

"ඒක නේ අජිත් අයියේ, අපි කියමු මෙයාට......... ඔහේ දන්නවද......... ඒකත් මේ අය අපෙන් ලක්ෂෙ ලක්ෂෙ ගන්න කැමති උණා......... ඔහේට බයේ තමා මෙච්චර කල් ඉඳලා නැතිවෙන බයට......... ඔහේට බයේ තමා මෙච්චර කල් ඉඳලා තියෙන්නේ. අනෙත් එක තමුසෙ වගේ වංචාකාරයෙක් ඉන්නවද......... අපෙන් ඉල්ලුවෙ කෝටි දෙකක්......... ඒත් මේ අයට දෙන්න පොරොන්දු වෙලා තියෙන්නේ ලක්ෂෙ ගාණේ. එක්කෝටි හැට ලක්ෂයක් තමුසෙට......... ලේසි නෑ නේද අජිත් අයියේ නිකම් ඉඳන් ඇදගන්න හදපු ලොතරැයිය........."

"ඒකනේ......... මෙන්න මෙතන උඹට තියෙනවා උඹේ ලක්ෂෙ......... ඒකත් මේ සඳරු නෝනාගේ අනුකම්පාවට නැතිනම් මේක උඹට දෙන්නෙ නෑ......... ඉඳා ඕනනම් ගනින්........." අජිත් කියද්දී ඊය අතට

නොගත් ලයනල් එයට අතින් ගැසුවේය. එය දුටු අජිත් ඔහුගේ කම්මුලට එකක් ගසද්දී ගෝලයෝ දෙදෙන ඔහුව ඇද ඔහුට පහර දෙන්නට විය. සඳරු අජිත් දෙස බලා හිස වැනිය.

"ඒයි දමයන්ත ඔකට යන්න ඇරපං......... හැබැයි උඹට මේ නුවර ඉන්න බෑ.........පලයං" කියද්දී ගෙඩි ගැසුණු මුහුනින්ද තුවාල වූ අත පයින්ද යුතු වූ ලයනල් හෙමිහිට යන්නට ගියේය. එදෙස බලා හුන් අජිත් සඳරු වෙතට පැමිණ,

"එහෙනම් නෝනා අපේ වැඩේ ඉවරයි......... අපි යන්නම්" යි කීවේය. එහිදී කමල් අත වූ බෑගය ගත් සඳරු, "අජිත් අයියා......... මම දන්නෙ නෑ අයියගෙ ගාන......... ඒත් මෙතන ලක්ෂ 20 ක් තියනවා ඒක අයියට" යි කියද්දී, මද සිනාවක් පා ඇය වෙත පැමිණි අජිත් ඇයගේ හිසට අත තැබුවේ අනෙක් සියල්ලෝම පුදුමයෙන් බලා සිටිද්දීය.

"එදා මට අයියා කිව්වා නේද......... එතකොට මම මගේ නංගිගෙන් සල්ලි ගන්නවද......... අනෙත් එක නෝනා දීපු සල්ලි මම මගේ ප්‍රයිවෙට් එකවුන්ට් එකක් වෙනම ඔපන් කරලා දැම්මා........." එසේ කියා වික්‍රමසේකර මහතා අසලට ගොස්,

"සමහර විට සර් අද වෙනකලුත් දන්නෙ නැතුව ඇති කිසිදෙයක්." එසේ කී ඔහු අර්ථාන්විතව හිස වැනුවේය. "මෙච්චර කාලෙකට මගේ ගෙදරට ලක්ෂ්මි අරන් ආපු එකම කෙනා මේ සඳරු නෝනා. අනෙත් හැම කෙනෙක්ම මට ගෙනාවේ කාට හරි ගහන්න, මරන්න, පැහැරගන්න, කප්පම......... ඒත් මේ නෝනා සර්ගෙ ලොකු පුතා අවන්ත මහත්තයා මරනින් බේරන්න සල්ලි අරන් ආවා........." යි කියද්දී සැම දෙනාගේම දෙපාවලින් පටන් ගත් හිරියක් හිස්මුදුන දක්වා පැතිරී ගියේ නිරායාසයෙනි. නෙත්නද ගල් ගැසුණා සේ මේ සියල්ල අසා හුන්නේය.

"සර්ගෙ ලොකු ලේලි......... කෝ අද මෙතන නෑ නේද. ආ සමහරවිට මේක අද නොකෙරේවි කියලා නොඑන්න ඇති......... මනුමි නෝනා මගෙන් ලක්ෂ පනහක් ගත්තා මාසෙකින් දෙන්න......... ඒත් මාස දෙකයි දවස් හයකිනුත් මගේ සල්ලි දුන්නේ නෑ. තාත්තාගෙ මන්ත්‍රීකමේ උණ අරගෙන තර්ජනය කරද්දී මට තීරණය කරන්න තිබුණේ ඔහොම ගෑනියක් වැන්දඹු කරන එක විතරයි. දීපු අන්තිම සතියෙ පස්වෙනිදා රෑ මම last warning එක දුන්නා. සල්ලි හත්වෙනි දවසේ උදේ ඔනි කියලා. නැතිනම් මම හිටියෙ එයාගෙ හස්බන්ඩ





අජිත් අවන්ත දෙස බලමින් කියද්දී ජීවක අතුරුදහන් කරවන්න." මව හා විද්මි මුහුණේ දෙඅත බැඳගෙන මහතාට කෙළ ගිලින. හිල්ලුවෝය. "හයවෙනිදා උදේ මනුමි නෝනා ඇවිත් සල්ලි නොදී තව සතියකින් සල්ලි දෙන බව කියලා ලොකු කතා කියලා මට තර්ජනය කරලා ගියා. මනුමි නෝනා යනකොටම අවන්ත මහත්තයා එදා දවස ඇතුළත උස්සන්න තීරණය වෙලා ඉවර වුණා. ඒත් ඊට විනාඩි දහයකට පස්සෙ මගේ ගෙදරට තව කෙනෙක් ආවා......... සඳරු නෝනා. ඇවිත් මගෙන් වෙලාව ඉල්ල ගත්තා හත්වෙනි දවසෙ හතර වෙනකල්......... මේ නෝනාගේ ඇස් දෙක මූන දැක්ක ගමන් මේ නෝනාව මම තේරුම් ගත්තා. නෝනා කිව්වා අවන්ත මගේ මහත්තයාගේ අයියා......... එයා අහිංසක කෙනෙක්. එයාට කරදරයක් කරන්න එපා. මම හෙට සල්ලි ගේනවා කියලා......... පොඩි කෙල්ල උණාට කථාවෙ තිබ්බච විදියෙනුයි මා ගාවට එන්න තිබ්බ්ච් ධෛර්යයයෙනුයි මම හිතාගත්තා මෙයා මුවර් සල්ලි අඩිවු ගහලා හරි ගෙනෙයි කියලා......... ඊට පහුවදා හරියටම හවස 3.45 ට බෑග් එකේ ලක්ෂ පනහක් එක්ක සඳරු නෝනා මගේ ඔෆිසෙ ඉස්සරහ හිටියා. මනුමි නෝනට දවස් 66 කින් කරන්න බැරි උණු වැඩේ සඳරු නෝනා පැය තිහකින් කළා. ඒත් ඒ වෙනකොට මගේ මේ මල්ලි හදිසි වැඩක් කරලා. අවන්ත මහත්තයවයි, ඩ්‍රයිවරුයි එක්කම කාර් එක අපේ පොට් එකකට ගෙනැවිත් තිබුණා" ඔහු කියද්දී ඒ අලුත්ම ආරංචිය අජිත්ගේ මුවින් අසමින් කවුරුත් අවන්ත දෙස බලද්දී මව වහාම අවන්ත වෙත පැමිණ ඔහුගේ අතේ එල්ලුණාය.

"මම මේ කියන්නේ බොරු නම් සර්ලා අහන්න අවන්ත මහත්තයගෙනුයි එයාගෙ ඩ්‍රයිවර්ගෙනුයි එදා දවල් එකේ හිට හවස හතර වෙනකල් කම්පැනියක වෙයාමන් කෙනෙක් හම්බ වෙන්න ඔෆිස් එකක වාඩිවෙලා හිටියද නැද්ද කියලා?" අජිත් කියද්දී අවන්ත පළමු වරට එය එසේ බව හිස වනා පිළිගත්තේය. ශරාණත් හා නෙත්න යන දෙදෙනාම සොයුරා දෙස බැලුවේ පුදුමයෙනි.

"අවන්ත මහත්තයා මගේ කීමට ඒක කාටවත් කිව්වේ නෑ......... මම කියන්න එපා කීවේ අවන්ත මහත්තයට, ඒ උණු දේ ලීක් උණා නම් සඳරු නෝනාත් අපිට සම්බන්ධයි කියලා මනුමි නෝනා කතාවක් හදන්න ඉඩ තිබුණ නිසා......... කොහොම හරි මේ නෝනා එදා, සර්ගේ ලොකු පුතා අපේ අතින්......... මරණෙන් බේර ගත්තා......... ඒක සාමාන්‍ය සර්ව පින්තල ගෑනියෙකුට කරන්න අමාරුයි. මේ

ලක්ෂ පනහ ඒ නෝනාගෙ එකවුන්ට් එකෙන් නෙවෙයි ගෙනාවේ කියලා මම දන්නවා......... එතකොට මේ නෝනට එන ප්‍රශ්න චෝදනා ඒ සේරටම මුහුණ දෙන්න බලාගෙන සඳරූ නෝනා මස්සිනා බේරගත්තේ. අද මම නොකිව්වා නම් සර්ල කවදාවත් දන්න එකක් නෑ......... ඒත් හොඳ කෙනාගේ ගුණ සුවඳ පැතිරෙන්න ඕන......... එතකොටයි තව කෙනෙක් හරි ආදර්ශයක් ගන්නේ......... ඒකයි මම මේ කිව්වේ.

තමන්ගෙ මහත්තයගෙත්, තමන් ආදරේ කරන අජිත් අයගෙත් නරක නාමෙ, දුක් පීඩා, විඳගෙන සඳරූ නෝනා අද වෙනකල් ලොකු කැපවීමක් කරන්න ඇති. දැන් ඒ නෝනා ඒ කැපවීමෙන් නිදහස්......... ඉතිං මට කියන්න තියෙන්නේ මගේම සහෝදරියකට වගේ මම ගරු කරන සඳරූ නෝනගෙන් සල්ලි බලාගෙනම නෙවි මම මේක කළේ. ඒ ලස්සන මනුස්සකමට. අනෙත් එක අවන්ත මහත්තයා මම නොදැන උණත් පැය 3 ක් හිර කරන් ඉඳලා අපෙන් වෙච්ච මිස්ටේක් එකට හරියන්න මට මේකට සල්ලි ගන්න බෑ. සර්ලගෙන පැත්තෙන් බැලුවත්......... දැන් ඉතිං අපෙන් උණු වරද ඔන්න අපි අද මේක කරලා හැදුවා......... එහෙනම්......... සඳරූ නෝනා මම යන්නම් ......... ලොකු මහත්තයා මම යන්නම්.........” එසේ කියූ ඔහු වාහනයට යද්දී සඳරූ ඔහු ඇමතුවාය.

“අජිත් අයියා” ඔහු නැවතිණ. එතනට ගිය ඇය, “හැමදේටම ගොඩක්ම ස්තූතියි.........” යි පැවසුවේ කඳුළු පිරි දෙනෙතිනි.

“සතුටෙන් ඉන්න” එසේ කියූ අජිත් ඇයගේ හිසට අත තබා රථයට නැග පිටත්ව යද්දී පැතිර ගියේ විශාල අත්පොළසන් හඬකි. සැම දෙනම අත්පුඩි ගසමින් ඇය වෙත එන්නට වූහ. සතුටෙන් අහසට අත දිගු කළ කමල්,

“අපේ සඳරූ මැඩම්ට” යි කියද්දී අන් සියල්ලෝම,

“ජය වේවා” යි කීවේ සතුටෙන් සැහැල්ලුවෙන් හදවත් පිනා යද්දීය. එවෙලේ සඳරූ වෙත පැමිණි අවන්ත ඇය බදා වැළඳ ගත්තේ කඳුළු පිරී දෙනෙතිනි.

“මම වත් දැනන් උන්නේ නෑ මට මෙච්චර වටින නැනා කෙනෙක් ඉන්නවා කියලා.........” එසේ කියූ ඔහු ඇය අත දැතින්ම අල්ලාගෙන, “තැන්ක්ස් සඳරූ” යි පවසද්දී,

“එහෙම කියලා මාව පිට කෙනෙක් කරන්න එපා අයියේ.........” යි සඳරූ ද කීවාය. එතැනට පැමිණි පියා ඇයගේ දෙවුරහිස මත අත





තබා මට හරි ආඩම්බරයි ඔයා ගැන” යැයි කිවේ ඇය ගැන තම සිහිවිලිවල වූ නිවැරදි කම ගැන උපන් අභිමානයෙනි. මව විද්මි හා රසාංග පියුමි ආදී සියල්ලන්ම පැමිණ ඇයට සුභ පැතුවද රොෂාන් හෝ නෙත්න ඇය වෙත නොපැමිණ දෙතැනක සිට ඇය දෙස බලා සිටින්නට වූහ......... දෙදෙනාගේම ඇසේ වූයේ තුනී තෙතමනයකි. රොෂාන්ගේ හදවතට ඇය ගැන ඇතුණේ අපමණ ආදරයකි.........ආඩම්බරයකි. නෙත්නගේ හදවතද ඇය ගැන උපන් උණුසුම් හැඟුමින් පිරිණ......... ආදරය......... සෙනෙහස......... ඇයගේ සුන්දර බවටම ගැලපෙන ඇයගේ උතුම් ගතිගුණ දක්ෂකම සියලු දෙයෙහි ඇති ප්‍රතිභාව......... මේ සියල්ල එකම යුවතියක් තුළ......... දකිමින් ඔහු අසල වූ ගසට හේත්තු වී එක් අතක් ළයේ බැඳගෙන අනෙක් අතේ වැලමිට ඒ අත උඩ තබා අතේ වූ මහපට ඇඟිල්ල දෙතොලට තබාගෙන නිහඬව ඇය දෙස බලා උන්නේ හදවතේ සතුට එහිම සඟවා ගනිමිනි. එහෙත් රොෂාන් තම සොයුරාගේ මුහුණ දුටුවේය. එය කෙතරම් හැඟුම් පළකරන්නේද යන්න ඔහුට වැටහිණ.

ඒ අතරේ ප්‍රියලාල් කට්ටිය අමතා ඩෝසර් යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට පැවසුවේය.

පසුදින දහවලේ සඳරූට කථා කළ රොෂාන් සවස තමා සමග සාදයකට සහභාගි වන්නට යාමට සූදානම් වන ලෙස පැවසුවේ එය පවුලේ හිතවතකුගේ බැවිනි. පියා හා මවටද එයට එන්නට කියා තිබුණද පියා එයට සහභාගි වීමට අකැමැත්ත පළ කළෙන් මව නෙත්නට කථා කොට අනුපමාගේ උපන්දින සාදයට තමන් වෙනුවට යාමට ඇති බැවින් සවස ඉක්මනින් ගෙදර එන්නැයි පැවසුවේය. රොෂාන් අයියාද සමහරවිට යා හැකි බව ඇය කීවාය. රොෂාන් ගියද සඳරූ ඔහු යා යන්නට අකමැති බව දන්නා නෙත්න සොයුරා සමඟ යාම කම්මැලි දෙයක් වනු ඇතැයි සිතිණ. ඒ නිසාම ඔහු මාලිංගට තමා හා යන්නට එන ලෙස කථා කළේය.

නිවසට පැමිණි නෙත්න හැඳ පැළඳ ගෙන සූදානම් වී පිටව ගියේ, සඳරූ යන බවක් නොදැනය. එවෙලේම තාන කාමරයේ සිට පැමිණි සඳරූ රොෂාන් මැතකදී ගෙනෙන ලද කෙටි හැට්ටය හා කෙටි සාය සාදයට යාම සඳහා හැඳ ගත්තේය. එයින් ඇය සම්පූර්ණයෙන්ම වෙනස් වූවාය. දුටු කෙනෙකු ඇය තාසල් වියේ

යුවතියක් දැයි අසන තරමට උඩට ගැට ගැසූ පෝනිටේලයත් එම ඇඳුමත් ඇයට ලාබාල පෙනුමක් ගෙනාවේය. මාලිංගගේ පමාව නිසා දෙමිතුරන් එහි ගියේ මඳක් පමා වීමෙනි. ඒ වන විට එහි පැමිණ සිටි රොෂාන් හා බිරිඳ දුටු සැම දෙනම සඳරුගේ පෙනුම ගැන කථා කරන්නට වූහ. එහෙත් වැඩිපුර කථා බහට නොගිය ඇය සාදය පැවැත්වූ හෝටල් ශාලාවේ කොනක වූ මේසයේ වාඩි වී අනෙක් අය දෙස බලා සිටිද්දී එහි පැමිණි මාලිංග,

"හායි සඳරු.........මයි කන්ග්‍රැජුලේෂන්ස්" යයි කියමින් ඇයට අතට අත දෙද්දී,

"ඒ මොනවාටදැයි?" සඳරු ඇසුවේ සිනාසෙමිනි.

"ආ හා අපිට ආරංචි වුණා ටාර්සන්ගේ වීර ක්‍රියා සේරම........." යි මාලිංග කීවේ නෙත්න සමග එහි වාඩිවෙමිනි.

"ඔයාට වැරදි ආරංචි වගයක් ලැබිලා......... මම කරපු දෙයක් නෑ ......... අනෙක කරත් ඉතිං හොර වැඩක් මිස"

"හෝව්......... මැඩම්.........හෝව් ඔයා දැන් ඕක මගේ මූණ බලන් කීවට මට තෙවිනේ කියන්නේ......... අදාල කෙනාටම කියන එක තමයි හොඳ........" පැවසුවේ සිනාසෙමිනි. නෙත්න ඇය දෙස බැලුවද සඳරු ඔහු දෙස නොබලා ඉවත බැලුවාය.

"ඒක නෙවි......... කෝ රොෂාන්.........?"

"අර ඉන්නේ........." දුරකතන ඇමතුමක් ගනිමින් සිටි රොෂාන්ව පෙන්වමින් සඳරු කියද්දී මාලිංග රොෂාන්ට අත වැනිය. ඒ හාම එහි ආ රොෂාන්.........

"අම්මෝ හොඳ වෙලාවට ඔයාලාවත් ආවේ......... මම මේ කරන්න දෙයක් හිත හිතා හිටියේ........."

"ඇයි......... රොෂාන් අයියා"

"මලවදේ අද පාටි දෙකක්නේ......... ඒකෙන් මේ කතා කරනවා"

"ඒ කාගෙද?"

"ඇයි ප්‍රභාත්ගේ වෙඩින් ඇනිවසරි එක......... මේ එක නෙවි මාලිංග මම කියන්න හැදුවේ......... ඔයාලා ඉන්නවානේ. මම සඳරු මෙහෙ තියලා අරකට පොඩ්ඩක් ඔළුව දාලා එන්න යනවා......... මම පරක්කු උණොත් නෙත්න ඔයා සඳරු එක්ක යන්න. නැතිනම් මම එන්නම්........." එසේ කී රොෂාන් සඳරු දෙස බලා,

"සඳරු ඔයා පොඩ්ඩක් ඉඳලා යන්න......... නැත්තම් මූන් තරහ වෙයි........." යනුවෙන් කියා අනුපමාටද පවසා වහ වහා පිටව ගියේය.





නෙත්නට බැලුනේ සඳරු දෙසය. ඒ දෙනෙත් මොහොතකට එකිනෙක යා විය. සඳරු ඉක්මනින්ම ඉවතා බලා ගත්තේය. සියල්ලෝම වේග රිද්ම සිංහල ගීතවලට නැටීමට පටන් ගත්හ.........

මුත් සෙව්වෙමි මුහුද හමු උණා
මිනි සෙව්වෙමි මිනිද සතු උනා
රන් සෙව්වෙමි රන්ද හිමි උණා
නොලද එකම දෙය පමණකි ඔබගෙ ආදරේ,
මල් පැතුවෙමි මල් ද පිබිදුණා
පැනි පැතුවෙමි පැණිද ඉතිරුණා
රස පැතුවෙමි රසද වැටහුණා
නොලද එකම දෙය පමණකි ඔබගෙ ආදරේ,
නිලඹර සඳ පතා පල නැතේ
බැබලෙන තරු පතා පල නැතේ
කිඳුරු ලියන් පතා පල නැතේ
පතන එකම එක වස්තුව ඔබයි පියකතේ.........

ගීතය අසද්දී නෙත්න බැලුවේ සඳරු දෙසය......... ඇයගේ කොපුල් තල රෝස පැහැගෙන ඇත්තේ මේකප් එකටද වඩා තමා ඉදිරිපිට සිටීමේ ලජ්ජාවෙන් බව වැටහුණු ඔහු නැඟුණු සිනාව සඟවාගෙන ඇස කුඩාකොට ගෙන ඇය දෙස බැලුවේය. ඒ අතරේ ඔවුන් අසලට ආ වේටර්වරයා මත්පැන් බන්දේසිය ඔවුන් වෙත දිගු කරද්දී මාලිංග ඉන් එකක් අතට ගත්තේ,

"ඒයි නෙත්න උඹ ගන්නෙ නෑ නේද?" යි අසමිනි.

"Why not........."නෙත්න එසේ කියද්දී මාලිංග තවත් මත්පැන් වීදුරුවක් රැගෙන නෙත්න අසලට කළේය. සඳරුගේ සිත රිදුණද ඇය නොදුටු ලෙස ඉන්නට වෑයම් කළාය. නෙත්නට සිනා නැඟිණි. ඔහු මාලිංගට ඉඟි කළේය.

"මොකද සඳරු......... ඔයාටත් එකක් ගන්නද......... නැතිනම් නෙත්නගෙ එකෙන්ම බොන්න.........මොකද මේ යකා වෙරි වෙයි බීලා"

"අනේ මේ මාලිංග මට ඕන නෑ කාටවත් ෂෙයාර් වෙන්න......... අනෙක මම ඩ්‍රින්ක්ස් ගන්නවයැ......... ඔයාලට ඕන නම් බීගන්න" ඇය කීවේ තරහෙනි. එය ඇසුණු නෙත්න සිනාසුණේය.

"මෙකනේ මචං, ෂෙයාර් කරගන්න ඕන තරම් කට්ටිය ඉන්නවනේ ......... දැන් ඉතිං බිස්නස් වර්ල්ඩ් එකේ උණත් සෑහෙන ජනප්‍රිය චරිතයක් නේ......... පත්තරවල ෆොටෝ එකත් ගිය එකේ......... ලංකාවම උණත් ඉන්නවා ඇති ෂෙයාර් වෙන්න........."

"ඔයා ඕවා ගණන් ගන්න එපා සඳරූ......... මූට පිස්සු......... ඔයා ඔහොම ඉන්න මම ඔයාට කොක්ටේල් එකක් ගේන්නම්........." එසේ කියූ මාලිංග එහාට ගොස් ඇය වෙනුවෙන් බීම වීදුරුවක් රැගෙන ආවේය. නෙත්න හා මාලිංග කථා කරමින් මත්පැන් වීදුරුව තොල ගාද්දී සඳරූ බීම වීදුරුව බොමින් සාදයට පැමිණි අය නටන දෙස බලා උන්නාය. එකිනෙකා සිනාසෙමින් නොයෙක් ස්ප්‍රේ වර්ග ඒ මේ අත විසුරවන්නට වූයේ මේ අතරේය. ඒවායේ සැර සුවඳ නිසා සඳරූට දැණුනේ හිස බරවන බවකි.

ඇය එහෙත් ඒ බව අපහසුවෙන් දරා ගත්තාය. නෙත්න හා මාලිංග නාමත් ලොකු කථා බහකය. සඳරූ එතැනින් නැගිට ඉවත යද්දී නෙත්න ඇයගේ දඟකාර පෙනුම ගැන ඇතිවූ ආශාවෙන් ඇය දෙස බලා සිටින්නට වූවේය.

"මොකද......... උස්සගෙන යන්නද හිත........."

"ආයෙත් අහලා......... මාව හොල්මන් වෙනවා බං මෙකි දැක්කම ......... බලපං අහංකාර කම......... තාම නෑ වචනයක් කතා කළේ........."

"කොහොමද බං කතා කරන්නේ......... උඹ ඒකිට කියපු කරපුවා අමතක කරන්න ඒ කෙල්ල මැරිලා ඉපදිලායැ. අනෙක ඒකි තාමත් ඉස්සර වගේම උඹට බයයි. රොෂාන් ඒ කෙල්ලට අත උස්සලා නැති උණාට දැන් උඹ ඒකිට දවස් දෙකක් ගැහුවා......... හරියට මිනිහා වගේ......... ඒකි බයේ ඉන්නේ උඹේ නපුරු කමට........."

"මොන නපුරු කමක්ද බං මගේ......... මට මල පනින්නෙ මාව ගනන් නොගෙන අතික් මගුල් කරන නිසා. මම ගිහින් පොඩ්ඩක් බලලා එන්නම්......... එළියට ගියා"

"ඔව් පලයන්......... නැත්නම් බඹරු රොද බැඳ ගනීවි......... අන්තිමට උඹට කොල්ලො ඒක්ක වලි අගෙන බේරුමක් නැති වෙයි........."

"අයියත් මාර මිනිහෙක්......... ගෑනි මුර කරන්න මට දීලා ගියා"

"අයියා දන්නවා ඇති සමහර විට උඹේ ප්‍රියතම ජොබ් එක ගෑනු මුර කිරිල්ල කියලා"

"ගෑනු නෙවි බං......... එයාගෙ ගෑනි මුර කරන එක........." එසේ කියූ නෙත්න සඳරූ සොයමින් මදක් ඒ මේ අත ගියද ඇය ඒ





කොතැනක වත් නොවීය. අවසානයේ එළියේ වූ මල් පඳුරක් අසල බංකුවක ඇය නෙත් පියාගෙන සිටිනු පෙනිණ......... ඔහු ඇය වෙත යන්නට යද්දී හොඳින් හැඳ පැළඳගත් තරුණයෙකු කැමරාවක් අතැතිව සඳරූගේ ඡායාරූප ගනු ඔහුට පෙනිණ. ඔහු කේන්තියෙන් තරුණයා වෙත ගියේ සඳරූ මේ කිසිත් නොදැන දෙනෙත පියාගෙන සිටිනු දුටු හෙයිනි.

"එක්ස්කියුස්මි මිස්ටර්......... මොනවද ඒ කළේ........."

"ලස්සන කෙල්ලක්......... ෆොටෝස් දෙක තුනක් ගත්තා......... බලන්න ඇස්පියවෙලා ඉද්දි ලස්සන........." එසේ කියා ඔහු ඩිජිටල් කැමරාව ඔහු වෙත දුන්නේය. එය බැලූ නෙත්නට සඳරූගේ ඉතාම සුන්දර ඡායාරූප 3ක් එහි තිබෙනු දැකිය හැකි විය. ඔහු ඒ තුනම ඉරේස් කළේය. ඔහු කළ දෙය දුටු තරුණයා කලබලයෙන්.

"ආ......... ඇයි ඒක ඉරේස් කළේ......... මම දුන්නේ බලන්න......... ඔයාට මොකද ඒ ගර්ල්ගෙ ස්නැප්ස් ගත්තම" යි ඇසුවේය.

"ඒත් ඔයා එයාගෙ ෆොටෝ ගත්තේ එයාගෙන් අහලා නෙවි......... හොරෙන්......... දන්නෙ නැද්ද කෙනෙක්ගෙ ෆොටෝ එකක්......... නළුවෙක් නිළියක් හරි ප්‍රසිද්ධ කෙනෙක් හරි නොවන කෙනෙක්ගෙ ෆොටෝ එකක්......... ගන්න එක වැරදි වැඩක් කියලා"

"එයා නිළියක් නොවුනට ඊට වැඩිය ගොඩක් ලස්සනයි......... ඒකයි ගත්තේ......... අපරාදෙ ඔයා ඒක කැව්වා" ඔහු කීවේ තරහෙනි. මෙය ඇසූ නෙත්නට සිනා නැඟිණ. ඔහුට ළංවූ නෙත්න තාමත් ඇස පියා සිටින සඳරූ දෙස බලා යළිත් තරුණයා දෙස බැලුවේය.

"දන්නවද ඒ කවුද කියලා.........?"

"නෑ........."

"එයා නිළියක් නෙවි......... මගෙ වයිෆ්........." යි කියද්දී තරුණයාගේ දෙනෙත් විසල් විය.

"ඕ......... නෝ......... ෂුවර්.........? ඔයා හරි ලකී......... ඒ වගේ ලස්සන කෙල්ලක්......... ඔයාගේ වයිෆ්......... ඔයාගෙ දිහා බැලුවාම එයා ඔයාට මැච්වෙන බව පේනවා......... සොරි ආ......... නොදැන කළ දේට......... all the best යනුවෙන් පවසා හෝටලය තුළට යද්දී නෙත්න හෙමිහිට සඳරූ වෙත ගියේය......... ඔහු ආ බව සඳරූට දැනුණේ නෙත්නගේ විලවුන් සුවඳිනි. ඇය දෙනෙත් හැර හේත්තු වී සිටි බංකුවෙන් හිස ඔසවා බිම බලා ගත්තාය.

"ඇයි මේ.........?" ඔහු හෙමිහිට ඇසුවේය.

“මට ඇතුළෙ ඉන්න බෑ....... ඔළුව රිදෙනවා.......” සඳරු කියද්දී නෙත්න මාලිංගට ඇමතුමක් ගෙන අනුපමාට අපි යන බව කියන්නැයි පැවසීය.

“ඒ මොකද.......?”

“ඔළුව රිදෙනවලු....... මම හිතන්නේ ස්ප්‍රේවල ස්මෙල් එකට වෙන්නැති....... ඇයි ඉතිං මල නේ. ඒක නෙවි උඹ කියලා වරෙන්......., මට මෙයා ආලා ආයෙ ඇතුළට එන්න බෑ....... එළියෙ එකෙක් මෙයා දන්නෙත් නැතුව ෆොටෝ අරං” ඔහු කීවේ සඳරුට නෑසෙන ලෙසය. මිතුරා පැමිණි පසු සඳරු වාහනයේ පිටුපසට නැගී අතර මාලිංග රියදුරු අසුනට ගියේය. නෙත්න ඉදිරිපස වාඩි වී විදුරුව මදක් හැරියේ සඳරුට සුවයක් දැනෙන්නටය. හිර උණු වාතය ඇය ගේ අමාරුව වැඩිකරතැයි ඔහුට සිතිණ.

මද දුරක් යද්දීම වාහනයේ රෝදයක් පුපුරා ගියේ විශාල හඬක් නගමිනි. පාලු මාවතේ එම හඬ හෙණ හඬක් සේ රාව නැංවූයෙන් සඳරු උඩ විසි විය. ශබ්දය ඇසෙද්දීම නෙත්න හැරී පිටුපස බලද්දී ඇය බිය වී සිටිනු පෙනී සිනා නැගිණ.

“හරිනේ....... ඉතිං මාරු කරපංකෝ වීල් එක” එළියට ආ මාලිංග කියද්දී,

“දෙන දෙයියෝ, කොහෙන් හරි දෙනවා මල්ලි ටයිම් එක....... පුළුවන් නම් හෙට උදේ වෙනකල් දාපං....... මම පස්සට යනවා”

“ඔව් උඹ කියනකල් හිටියේ....... වොල්කනයිසිං කරනු ලැබේ කියලා බෝඩ් එකකුත් ලියාගෙන මම මෙතනම පොඩි කඩ කෑල්ලක පටන් ගන්නම්....... උඹ ලව් කරපං” මාලිංගද මිතුරාට කීවේ සඳරුට නොඇසෙන ලෙසය.

“මැයි හොඳට ඇඳගෙන පාටියකට ගියා....... දැන් ඉතිං මිකැනික් බාස් වගේ තනියම ටයර් මාරුකරන්න ඕන....... මේ....... ඇතුළට ගියාම පස්සෙ මට ඇතුළ බලන්න බැරි වේවි....... ටූල් කිට් එක කොහෙද කියලා පලයං”

“ඔන්න ඩ්‍රයිවින් සීට් එක යට....... අනෙත් එක ඇතුළ බලන්න උඹ බයවෙන්න එපා....... කළු නිසා මේ කළුවරේ සක්‍රයටවත් පේන්නෙත් නෑ....... ආ උඹට ඕනකමක් උණොත්....... ?” එසේ කියූ නෙත්න මිතුරා දෙස බලා, “මට නෙවි පාරෙ යන කාට හරි කතා කරපං” යි කියද්දී සිනා නැගූ මාලිංග,

“පලයං පලයං විදකාරයා” යි කියමින් ටූල් කිට් එක අතට ගත්තේය.





දොර හැරගත් නෙත්න පිටුපස අසුනට පැමිණ දොර වසද්දී දෙනෙත් හැර බැලූ සඳරු යළි දෙනෙත් පියා ගත්තාය. ඈ කරනා දෙය නෙත්නට පෙනෙන්නේ ඉදිරිපස විදුලිපහනේ මඳ ආලෝකය ඉදිරිපස විදුරුවට වැටෙන බැවිනි. නෙත්න මොහොතක් නිහඬව අය දෙස බලා උන්නේය. නෙත්නගේ කිසිදු හැලහොල්මනක් නැති බව වැටහුණු සඳරු ඔහු කරන්නේ කුමක්දැයි බැලීමට දෙනෙත් හැර හිස හැරවූවාය. ඇය බලද්දී ඔහු සිටියේ ඇයගේ මුහුණ අද්දරටම වන්නටය. ඇය බලනු දුටු නෙත්නට සිනා නැගිණ.......

“මොකද....... හොරෙන් බලන්නේ....... මම ඉන්නවද කියලා”

“අපෝ....... වැඩේමයි මට.......”

“කට බොරු කීවට හිත ආසයි.......නේ.......”

“ඒ මොනවටද.......?”

“මගේ දිහා බලන්න.......”

“මොකද මෙච්චර යාළුවෙන්න හිතිලා....... එදා වගේ මා එක්ක රංඩු වෙන්න එපැයි”

“හැමදාම රංඩු වෙනකොට ගතියක් නෑ....... ගැනිත් එක්ක උණත්

”....... ඉඳහිටලා යාළුවෙන්න කියලා තමා කවුද කියලා තිබුණේ.......”

“කියලා තිබුණේ ඩිවෝස් කේස් අහන නඩුකාරයෙක් වෙන්න ඇති.......” ඇය කී විට නෙත්න ඇයගේ ඇඟට හේත්තු වී දෙපා ගෙන ඉදිරිපස අසුනට ගැසුවේ ඇයව එහාට තල්ලු වී යන ලෙසය. නෙත්නගේ ඇඟේ බර දැනුණු සඳරු එහාට වූයේ “තියෙන ගාය.......” යැයි හෙමිහිට පවසමිනි. එහෙත් ඇය බනිණු ඇසූ නෙත්නට නැගුණේ ලොකු සිනාවකි....... ඔහු සිනාසෙන අතරේ ඇයව වාහනයේ එහා කොනටම තදවන සේ තල්ලු කළේය.

“මොනාද කරන්නේ මට බැහැලා යන්නද කියන්නේ?” ඇය ඇසුවේ තරහෙනි.

“පිස්සුද ඩාලිං, නෝනා යනවද එහෙම මහත්තයව දාලා” එසේ කියමින් ඔහු ඇය දෙසට හැරී ඒ මුහුණ තමා දෙසට හරවා ගත්තේය. ඒ අතරේ අනෙක් අත ඇය උරහිස වටා යවා ඇයගේ මුහුණ තමා වෙතට ළංකර ගත් ඔහු,

“තාම ඉන්නෙ තරහෙන් නේද.......” යි ඇසුවේ ඔහුගේ තොල්පලක් ඇයගේ කොපුල් තලයේ අතුල්ලමිනි. ඒ ඇනුණ පහසින් සඳරු හිරි වැටී ගියේය. කාලයකට පසු දැනෙන මේ සුවඳ, උණුසුම, තම ආත්මයම පුබුදුවන්නේ නොවේද....... සඳරු කථා නොකරනු [illegible]

නෙත්න ඇයගේ දෙකොපුල් සිපගෙන ගොස් ඇයගේ ගෙල මුල හිස හොවා ගත්තේය.........

"නිකා......... ඉන්න......... විකාර කරනවද.........?"

"නිකා ඉන්න.........? නිකා ඉනනද කියන්නේ......... අද නිකං දාසයෙ කැල්ල වගේ කොට කැල්ලක් ගහගෙන ආවේ මාව විකාර කරවන්නනේ........." ඔහු කීවේ ඇයගේ නිරුවත් දණ හිස මත අත තබමිනි. සඳරු එයින් විලි වැදී ගොස් ඉවත බලා ගත්තාය.

"ඔය විදියට ඇඳලා පාරේ ගියොත් නම් දවසකට එක්සිඩන්ට් වෙයි පනහක් විතර"

"මට ඕනවටය ඇන්දේ......... රොෂාන් ගෙනාවේ......... ඒකයි ඇන්දෙ"

"අයියත් දන්නවා එයාගෙ ගෑනි කොහොම ඉන්නවටද කියලා මම කැමති........." කියූ ඔහු සිනාසෙන්නට විය. සඳරු ඔහු පැත්තකට තල්ලු කරන්නට හදමින්.

"චික් කියන වල් කතා........."

"කොහෙද හලෝ වල් කතා වෙන්නේ......... තමුසෙ දැක්කම මාව විකාර වෙන්නේ නැද්ද........." එසේ කියමින් නෙත්න ඇයගේ උකුලට හිස තබා ගත්තේ හොඳින් හරි බැරි ගැසෙමිනි. ඔහු කළ දෙයින් සඳරුගේ තුන් සිතම වෙව්ලා ගියේය. දෙවියනේ ඔහු ඉන්නේ තමාගේ උකුලේ නේද......... එහෙත් ඔහු වලකන්නට සිත නොදෙන්නේ ඇයි......... ඇය ඔහු දෙස බලද්දී, නෙත්න හරි බැරි ගැසී ඇයගේ බඳට මුහුණ තබා ගත්තේය. ඉතා කෙටි හැට්ටය නිසාවෙන් නිරුවත් වූ බඳ පෙදෙසේ උණුසුම, සීතල ඔහුගේ කොපුලට අපූරුවට දැනුණේය.

"බඩේ සුවඳ........." එසේ කියමින් ඔහු ඇයගේ කුස පෙදෙස සිප ගනිද්දී සඳරු තම සිතුවිලි තමාටම පාලනය කරගන්නට මෙන් දෙනෙත් පියා ගත්තේය. එහෙත් ඇය ඉවත බලනු දුටු නෙත්න ඇයගේ කර වටා අත යවා ඇයව තම මුහුණ වෙත ළංකොට ගත්තේය. ඒ අයුරින් සිටීම ඔහුට පහසුවක් නොවූයෙන් ඇය වෙතින් හිස එසවූ නෙත්න වහාම ඇය වටා ඇත යවා ඇයව තම ළයට තද කොට ගත්තේ ඉමහත් වූ ආදරයෙනි. උණුසුම් වූ හැඟීමෙනි. මේ දඟකාර බව ළඟ මේ උපරිම ආදරය ළඟ නොනැමෙන ගැහැනු සිතක් පවතින්නට නොහැක. ඇය නෙත්නගේ ඇත් යුග අතර මැද ලපල්ලක් සේ තමා වැටී ගියේ එහෙයිනි. ජීවිතයේ ලබන ප්‍රථම





හාදුව.........නෙත්නගේ දෙතොල් හරි අපූරුවට ඒ රත් දෙතොල් මත වැතිරෙද්දී සඳරු අභිනව පෙම්වතියක වූවාය. ඔහුගේ ඇත මැද කෙරෙන කිසිවකට ඇයගේ විරුද්ධ බවක් නොමැති විය. නෙත්නගේ දෙතොල ඇයගේ සවන් යුග මත කිති කැවෙද්දී ඒ දැනෙන සුවය සතුට විඳ ගන්නට මෙන් සඳරු දෙනෙත පියා ගත්තාය. එහෙත් මොහොතකින් තමා කළ කී දෙය කුමක්දැයි වැටහුණා සේ නෙත්න වෙතින් මෑත් වූ සඳරු ඉවත බලා ගත්තාය. එහෙත් නෙත්න සමග මෙසේ සිටිද්දී එසේ තනිව හුදකලාව ඉන්නට සිතීමක් බොරුවක් බව ඇය දැන උන්නාය.

"ඇයි ඇත් උණේ......... ආයෙ ආවද හැබෑ ලෝකෙට........."

'ඇත්ත ඒක බව දැනගන්න ඕන අපි........."

"ඒ උණත් කොච්චර දුරස්වෙන්න හැදුවත් දුරස් වෙන්න බැහැ නේද.........?"

"දුරස් වෙලා ඉඳලා ඇයි ළංවෙන්නේ"

"මේ ඇස් දෙක, මට වෙනම කථාවක් කියන හින්දා......... ඔයාට රහසෙ මට කථා කරන හින්දා........." නෙත්න කීවේ ඒ දෙනෙත ආදරයෙන් සිපගනිමිනි.........මේ සෙනෙහස......... හදවතේ මිහිරෙන් පුරවාලන මේ සෙනෙහස අමතක කරන්නේ කෙලෙසකද......... තමා කවදාවත් අත් විඳ නැති ඒ හිතුවක්කාර හැසිරීම......... සිහින් අකා මකා දමා මැරෙන් කෙනෙකු සේ ජීවත් විය හැකිද.........

"මේ අහන්න සඳූ......... ඔයාගෙත් හිත කියනවා නේද මම ඔයාගෙ කියලා........."

"නෑ......... මගේ හිත එහෙම කියනවා නම් මේ දුක මෙතෙක් කල් මම විඳින්නෙ නැහැනේ......... මම දන්න එකම දේ නියති ඔයාගෙ කියලා විතරයි......... ඒකයි ඇත්ත......... ඒකයි උරුමය......... කාලයක් තිස්සෙ නියමයක් වෙලා ඇවිත් දැන් ඇත්තක් වෙන්න හදන ඔයාගේ අයිතිය. ඉතිං එහෙම අයිතියක් ඔයාට තියෙද්දී.........ඇයි ඒක නැති කර ගන්න හදන්නේ.........? මොකටද.........?" සඳරු ඔහු දෙසට හැරී ඇසුවාය.

"හිතන දේ......... නොවෙන්න පුළුවන්......... කාලයක් තිස්සෙ නියමයක් උණු දේ නොවෙන්න පුළුවන්......... ඒත් එක හිතින්ම පතාගෙන එන ආදරේ අයිති නොවෙන්න විදියක් නෑ......... මම ඔයාගෙ වෙන්න තියෙන දෙයක්......... ඔයාගෙම වෙන්න තියෙන

දෙයක් තියෙද්දි ඇයි ඒක නැතිකරගන්න හදන්නේ......... මොකටද .........?" නෙත්න ඇයගෙන් පෙරලා ප්‍රශ්න කරද්දී සඳරු නිහඬවම බිම බැලුවාය.

"ඔයා හිතන්නේ මම ඔයාගෙ නෙවි කියලා......... ඒ මේ කසාදෙ නිසා......... මට තවත් මේ ප්‍රශ්නය දරාගෙන ඉන්න බෑ......... ඔයා අයියත් එක්ක ඉන්නවා බලා ඉන්න බෑ......... මට අයියත් එක්ක කථා කරන්න වෙනවා........."

"නෑ එපා......... ඔයා මගේ හිතේ නෑ......... ඔයා ගොඩක් දුර ගිහින්"

"මම හිතින් කොහේවත් ගියේ නෑ සඳරු......... ඔයා ළඟමයි හිටියේ......... ඔයාගෙ ඇස්දෙකේ, ඔයාගෙ හීනවල හැංගිලා මම හිටියා ඔයා මාව මුලින්ම දැකපු ආ හිටම......... මට තාම මතකයි මාව දැකලා ඔයා ගැස්සුණු තරම......... ඔයාටත් බැරි උණා මාව ඔයාගෙ මස්සිනා කියලා පිළිගන්න......... ඒ......... ඒ වෙන කොටත් ඔයාගෙ ෆැමිලි ලයිෆ් එක ගැන ඔයා බයවෙලා හිටි නිසා......... කිසිම හැඟීමකින් තොසිටි නිසා......... මම මේවා දන්නෙ කොහොමද කියලා ඔයා හිතයි.........

ඒ කාලෙදිම ඔයාගේ ජීවිතේ ගැන ඕනම දෙයක් මට කියන්න පුළුවන්කම තිබුණා......... ඒකයි මම ඔයා නැතිව ඔයාට ඕනම දෙයක් ඒ දවස්වලම තේරුවෙ. ඔයාගේ කැමතිම පාට රෝස......... ඔයාගේ විනෝදාංශෙ මල් වවන එක......... ඔයාගෙ කැමතිම ගායකයා ජස්ටින් ටිම්බර්ලේක්. කැමතිම නළුවා වැන්ඩැම්. ඔයා යන්න කැමති නුවර එළි........." නෙත්න කිවේ එකින් එක ඇඟිලි ගනිමිනි. සඳරු උපහාසයෙන් සිනාසුණාය.

"ඕ......... මටත් වැඩිය බලනකොට ඔයානෙ මගේ ගැන දැනගෙන ඉදලා තියෙන්නේ......... ඇයි ඔය තරම් මහන්සි වෙලා මා ගැන ඇත්ත හොයාගත්තේ?"

"වැඩෙයි කියන්නෙ මම මුලින් මේවා ඇත්ත කියලා හිතුවට මම හොයාගෙන තිබුණෙ ඇත්ත නෙවි. ඒක ඔයා ඔයාගෙ අලුත් ජීවිතේට හැඩ ගැහෙන්න, ඔයාගෙ මහත්තයා ඔයාගෙ පැත්තට හරව ගන්න, හිත රවටගන්න ඔයාගෙම......... කරපු උත්සාහයක්........." නෙත්න කියද්දී භයානක යමක් ඇසූවාසේ නෙත්න දෙසට හැරුණු සඳරු ඔහු දෙස බලා සිටියාය.

"මොකද ඒකත් කියන්න කියලද කියන්නේ......... මම පටන් ගන්නම් කෝ පාටවලින්ම......... ඇත්තටම ඔයා හැබෑවටම ආස රෝස





නෙවි......... මම වගේම නිල්......... ඔයා මල් වවන්න ගත්තේ අලුතෙන් ......... මේ ගෙදරට ඇවිත් ජීවිතේ තියෙන පාළුව මකාගන්න......... මේ මහ විශාල ගෙදර පරිසරයට මිනිස්සුන්ට හුරුවෙන්න අනුගතවෙන්න පොටක් විදියට......... පාරක් විදියට......... කතා කරන්න මාතෘකාවක් ඕන නිසා......... මල් ගැන කතා කරන්න පුළුවන්නෙ. ගෙදරදි ඔයාට එතකොට ඉල්ලන්න පුළුවන් පොලට ගියත්, ගමන් ගියත්......... මල් පැල......... එතකොට ගෙදර අය අනිවාර්යයෙන් ඒ ගැන මතක තියාගන්නවා ඔයා මල්වලට ආසා කෙනෙක් විදියට......... ඒත් ඇත්ත නම් ඔයා ආසා ගස් නගින්න......... බයිසිකල් පදින්න......... වැවේ බැහැලා පීනන්න......... ඔන්න ඔවට......... ඒත් ඒ එකක්වත් මේ හයිෆයි ගෙදර කරන්න පුළුවන් දේවල් නෙවි......... මේ ගෙදරට අනුගත වෙන්න නම් ඒ වගේ දැඟලිලිකාර විනෝදාංශ අත හැරලා තැන්පත් වෙන්න ඕන උණා......... ඒකට ගැලපෙන වැදගත් විනෝදාංශයක් තමා මල් වැවීම.........

ඔයාගෙ කැමතිම ගායකා ජස්ටින් ටිම්බර්ලේක් නෙවි......... ඩාමර වීරසිංහයි......... මිල්ටනුයි......... ඒත් කොහෙද ඒ වගේ දෙයක් කියන්නෙ. නාගන්න හිතුණත් ටවල් එක අරගෙන වෙන රටකට යන ඔයාගෙ ඉංග්‍රීසිකාර මහත්තයා කැමති ජස්ටින්ට නේද......... ඉතිං හොඳ බිරිඳක් උණාම මහත්තයගෙ කැමැත්ත තමන්ගෙ කැමැත්ත කරගන්න බැලුවා ......... ඒත් කොහෙද......... ඔයා වෙනස් උණාට මහත්තයා ඇහැ ඇරලාවත් බැලුවෙ නෑ......... නේද බබෝ.........?" එසේ කී නෙත්න හිස පිටුපස අත බැඳගෙන ආසනයේ පිටුපසට හේත්තු වී,

"හා......... ඒ වගේ තමා......... නළුවත්.........මොන ඉංග්ලිෂ් ද නේ......... ජෝන් ඒබ්‍රහම් දැක්කම පිස්සු වැටිච්ච ඔයා එයා ගැන කියන්න විදියක් නැතිව වැන්ඩැම් ගැන කිව්වා......... මොකද හස්බන්ඩ් එක්ක එකතු වෙලා රෑට බලන්න උණේ ඉංග්ලිෂ් මූවි නේ......... හස්බන්ඩ් කියන ඒවට හූමිටි තියන්න ඒ වගේ මෝඩ කැමැත්තක් ගැන කියන්න ඕන උණා......... ඒකනේ මොබයිල් එකේ මගේ පින්තූරෙ ළඟට ජෝන්ගෙ එකක් තියෙන්නෙ......... ඇයි මමයි ජෝනුයි එක වගේම කොණ්ඩෙ වවපු නිසාද........." නෙත්න ඇසුවේ ඇයගේ ආත්මයම හිරිවට්ටමිනි......... මේ තරම් අපූරුවට තමාගේ ආත්මයේ හදවතේ පියවි බව, සජීවී සැබෑ බව......... කොටින්ම කියතොත් ආත්මයේ නිරුවත......... මේ දඩබ්බර කොල්ලා දැනගත්තේ කෙසේද......... ඇයට හිල්ලුනේ මහා ශබ්දයෙනි. මන්ද ඔහුගේ කථාවෙන් ඇය ඒ තරමටම

බිය වූ බැවිනි. මෙ තරම තාර්කික ලෙස සත්‍ය ලෙස තම ආත්මය ගවේෂනය කරන්නට ඔහු උගත්තේ කොහොමද......... කවදා සිටද......... ගෙවී ගිය වසර එක හමාරක කාලය ඔහු ව්‍යාපාර දියුණුවට, තමාට ආදරය කිරීමට සේම, තමාගේ ඇතුලාන්තය හාරා පාරා කැණීම කොට පුරා විද්‍යා සමීක්ෂණයක්, ගවේෂණයක් කිරීමටද යොදාගෙන ඇත......... එහි වාර්තාවේ සියයට සියයක් සත්‍ය පිටපතක් මේ ලෙස තර්කානුකූලව තමාට ඔප්පු කරන්නට ඔහුට හැකි වූයේ ඒ නිසාය.

"ඒ විතරක් නෙවි මැඩම්, රොෂාන් අයියා ආස නිසා ඔයා හීතල කඳුකරේට......... නුවර එළියට ආසයි කිව්ත් ළපන්දා ඉඳලා රස්නෙත් එක්ක හැදුණු ඔයා ඒ සීතලට ආස නෑ......... දවස් දෙකක් ඔයාව නුවර එළියෙ තියන් ඉඳලා මම වින්ද දේවලින් මම ඒක දන්නවා......... පුංචි සීතලටත් කෑ ගහගෙන මගේ පපුවට තුරුල් වෙච්ච ඔය ආසා නුවර එළියට නෙවි......... අනුරාධපුරේටමයි......... ඒ වැවක, වෙහෙරක, ලස්සනට, පිපිච්ච නෙලුම් මලක ලස්සනට, ළඳු කැලෑවල, හේන්වල තියන ශුෂ්ක වියලි බවටයි ඔයා ආදරේ කරන්නේ. ඒකටයි හදවතින්ම බැඳිලා ඉන්නේ......... එක යායට පේන කොළ පාට තේ යායකට වඩා ඒ තේ යායක වාඩිවෙලා ඉන්නවට වඩා ඔයා කැමති ගෙවල් අද්දර තියන කැලෑ රොදේ බඩ වැටීයෙ රිංගන්න. ඒවයෙ පෙරලි පෙරලි නිදහසේ හිනාවෙන්න......... ගඩාගෙඩි කඩාගෙන කන්න......... ඇති තරම් කෑ ගහලා හිනාවෙන්න.........

ඒත් මේ මොකුත් කරන්න වත්......... ඒ මිඩ්ල් ක්ලාස් දේවල් ගැන කතා කරන්නවත් මේ කෝටිපති ගෙදර ඔයාට ඉඩක් නෑ......... ඒක හින්දා ඔයාට සිද්ධ වෙලා තියෙන්නේ ඔයා විදියට ඔයාගෙ ලයිෆ් එක ගෙවන්න නෙවි......... වෙන කෙනෙක් වෙලා ආටෝප ජීවිතයක් ......... ගෙවන්න......... ඔයා වෙනුවට ඔයාවත් දන්නෙ නැති සඳරු කෙනෙක් වෙන්න......... ඒත් ඒ කරලා......... වෙනස් වෙලා......... මොනවද ඔයාට ජීවිතෙන් ලැබුණේ.........." නෙත්න එසේ ඇසුවේ පාරේ ඉදිරිපස බලාගෙන ඇයගේ කරවටා අත යවන අතරේය. ඉන්පසු හෙමිහිට තමාදෙසට ඒ මුහුණ හරවා ගත් ඔහු,

"මොකුත් නෑ නේද.........මොකුත්ම නෑ......... හිස්......... එම්ප්ටි ජීවිතේමයි තාම Audio, Vedio දෙකම නැති හිස් CD එකක් වගේ නේද........." යි ඇසුවේ අහොරක් නැතිව ගලන දෙනෙත් පිරි කඳුළු දෙතොලින් ගනිමිනි.........



"මට දෙන්න රත්තරං ඔය Empty CD එක......... ජීවිතේ ලස්සනම පාට වලින්......... ඔයා ආසාම දේවල්වලින් Audio, Vedio දෙකම කරලා ඔයාට දෙන්නම් මම.........

ඔයාගෙම ආදරයක්......... ඔයාටම විතරක්ම අයිති ආදරයක්......... ඔයාගෙ නෙත්න......... ඔයාගෙම ගෙදරක්......... ටික දවසකින් ඒකට පැටව්......... සතුට, හිනාව, අපි දෙන්නට විතරක් දරාගන්න වෙන දුක......... ආයිමත් සතුට සැහැල්ලුව......... මේ සේරම දාලා දෙන්නම් ආපහු ඔයාටම ඒ හිස් CD එක......... ජීවිතේ පුරාවටම ළඟ තියාගන්න ලස්සන කතාවක් දාලා දෙන්නම් මම........." නෙත්න කියද්දී කෑ ගසා හඬමින් සඳරු නෙත්නගේ ගෙල වැළඳා ගත්තාය.

"මාව කෙලින්ම මරලා දාන්න......... මේ නොවෙන දේවල් කියලා මාව මානසිකව ලෙඩෙක් නොකර......... මට බෑ දෙයියනේ මට බෑ මෙහෙම ජීවත් වෙන්න........." එසේ කියමින් සඳරු නෙත්නගේ ළයේ මුහුණ හොවා ගත්තාය.

"මම දන්නවා......... ගිම්හාන ගැන......... ගිම්හානට ඔයා ලංවෙන තරම ඇකලා මගේ හිතට හරියට ඉරිසියා හිතුණා......... මට නැති දෙයක් ගිම්හානට ලැබෙනවා කියලා......... එයා දවස ගානෙ ඔයා ළඟට වෙලා හිනාවෙවී කතා කරනකොට මට ගිම්හානට ගහන්න තරම් හිතුණා......... දවස් ගානක්ම......... ඒත් මට ගිම්හාන මිටි උණා......... මම දැනගත්තා ඔයා ගිම්හානට ආදරේ නැති වග, ඒත් මම දන්නවා ගිම්හානත් ඔයාට පුදුම විදියට ආදරෙයි......... අන්න ඒ නිසාම මම බයේ හිටියා ඔයාට අයියගෙන් ලැබෙන නොසැලකිල්ල නිසා ඔයා ගිම්හාන ළඟට ඇදිලා යයි කියලා......... කවදා කොයි වෙලේ හරි......... මම ඈත් වෙනකොට ඒක වෙන්න ඉඩකඩ වැඩි කියලා මට හිතුණා ......... එදත් කුල් ස්පොට් එකේදී ඔයාලා දැක්කමත් මට පිස්සු හැදුණේ ඒකයි......... ගිම්හානගේ ආදරේ හරි අහිංසකයි......... ඔයා එයාට ආදරේ කරන්නෙ නැත්තෙ ඇයි කියලා මම එයාගෙන් ඇහුවා......... ඔයා දන්නවද ගිම්හාන මට දිපු උත්තරේ......... ඒකට හේතුව මමයි කිව්වා" නෙත්න කියද්දී සඳරු එක්වරම හිස ඔසවා නෙත්න දෙස බැලුවාය.

"ඔව් එයා දැනන් ඉඳලා......... එයාට තේරිලා ඔයා මට ආදරේ කරන වග......... ඉතිං රත්තරං ඒ තරමට ඔයා මට ආදරේ නම් ඇයි මා ගාවට එන්නෙ නැත්තේ?"

"මට බෑ එන්න......... මගෙන් ඇයි අහන්නේ......... පේන්නෙ නැද්ද මගේ ජීවිතේ නතර වෙච්ච තැන. මට රොෂාන් දාලා කොහේවත්

යන්න බෑ......... මට ඕන එයාව හදාගෙන ජීවත් වෙන්න......... එයා එයාගෙ හිත හංගගෙන ඉන්නවා කියලා මට තේරෙනවා......... එයාට ඕන මට ළංවෙන්න......... ඒත් හිතා මතා මට වෙනස්කම් කරනවා. මාව නොසලකා හරිනවා......... ඇයි ඒ......... මට ඕන ඒක දැනගන්න ........."

"එතකොට ඔයාට ඕන මට ආදරේ කරන ගමන් අයියා එක්ක ජීවත් වෙන්න"

"මටවත් ඔයාටවත් වැඩක් නැති මේ ආදරේ අපි අමතක කරමු......... හිත හදාගමු. වෙන වෙනම ජීවිත අපිට තියනවා අපටම කියලා වෙන් උණු........."

"නෑ......... රත්තරං......... මම මේ කිසිදෙයක් වෙන්න දෙන්නෙ නෑ......... ඔයා බලන්න අදින් පස්සෙ මේ ගොඩක් දේවල් වෙනස් වේවි......... මම මට අවාසියට තියන හැමදේම වෙනස් කරනවා......... ඔයා මගේ......... ඔයා මගේ විතරයි මැණික........." එසේ කියූ නෙත්න සඳරු ඇඹිව් වැළඳ ගත්තේ ඔහුගේ දෙනෙතින් කඳුළු බිඳු කිපයක් සඳරුගේ උරහිසට වැටෙද්දීය.

මෙතැන් සිට.................... **පෙම්වන්තියේ 3**

kathapothak·blogspot·com














# පෙම්වන්තියේ 2

සෙවන ඩාබි
මා සදා සෙවූ.......



දෙවියන්ගේ නාමින් ඔහු නමා
හඬා සිටින්නේ ඒ අදහසින්ම ද?
ඒ ආදරය, ඒ සෙනෙහස........
නමාට අහිමි වී ගිය ඒ සෙනෙහස
සිහි කරමින් ඈ හැඬුවා
නමා වැටුණා ය.
මේ සියල්ල මෙයින් නිමා
කරන්නට සඳුරුට සිතෑ විය.



ISBN 978-955-8556-21-1

මිල රු. 480/-

kathapothak·blogspot·com

kathapothak·blogspot·com

# පෙම්වන්තියේ 3

සොවන ඔබයි මා සදා සොවූ......



සුරංගි අතුකෝරල